# ශ්‍රී ලංකාව:
# මානව හිමිකම් තත්ත්වය
# 2004



නීතිය හා සමාජ භාරය

REFERENCE
ONLY
LIBRARY
L S T

# ශ්‍රී ලංකාව:
# මානව හිමිකම් තත්ත්වය
# 2004

මෙම වාර්තාව 2003 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ වූ ඉංග්‍රීසි වාර්තාවේ 2005 වසරේ කරන ලද විස්තරාත්මක පරිවර්තනයකි.

**නීතිය හා සමාජ භාරය**
3, කින්සි ටෙරසය
කොළඹ 08
ශ්‍රී ලංකාව

343.4 (058)

© නීතිය හා සමාජ භාරය
2004 ඔක්තෝබර්

ISBN 955-9062-96-4

# පටුන


| | | |
|---|---|---|
| I. | සමාලෝචනය | 1 |
| 1. | හැඳින්වීම | 1 |
| 2. | උතුරු සහ නැගෙනහිර මානව හිමිකම් තත්ත්වය | 3 |
| 3. | 2003 වර්ෂයේ සාම සාකච්ඡා සහ සාම ක්‍රියාදාමය වෙතින් එල්.ටී.ටී.ඊ. සංවිධානය ඉවත් වීම | 8 |
| 4. | ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සිදු වූ සංවර්ධනයන් | 12 |
| 5. | අපරාධ, මානව හිමිකම් සහ දඬුවමින් හෝ භාතියෙන් බේරී සිටීමේ නිදහස | 14 |
| 6. | නව නීති හා වෙනත් මානව හිමිකම් ගැටලු | 18 |
| 7. | අන්තර්ජාතික වර්ධනයන් | 20 |
| II. | ළමා අයිතිවාසිකම් | 29 |
| 1. | හැඳින්වීම-එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ නිරීක්ෂණ | 29 |
| 2. | සිවිල් නීතිය හා ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ අවශ්‍යතාවයන් අතර පවතින අනුකූලතාවයන් | 31 |
| 3. | අධිකරණ පද්ධතිය තුළ ළමයින්ට ඇති සැලකිල්ල | 35 |
| 4. | අප්‍රමාණවත් මානව සහ භෞතික සම්පත් වෙන් කිරීම | 36 |
| 5. | අපරාධ නීති ක්ෂේත්‍රය තුළ කළයුතු නෛතික ප්‍රතිසංස්කරණ | 37 |
| 6. | අධීක්ෂණ අධිකාරීන් | 40 |
| 7. | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාකාරකම් | 42 |
| 8. | ළමා ශ්‍රමය | 44 |
| 9. | අපහරණය/සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් බඳවා ගැනීම | 47 |
| 10. | නිගමනය - ළමුන්ගේ අදහස් | 49 |
| III. | නීති විරෝධී සංක්‍රමණ: මානව තිරුරහෝනය සහ පුද්ගල වෙළඳාම | 56 |
| 1. | හැඳින්වීම | 56 |
| 2. | මානව තිරුරහෝනය | 58 |
| 2.1 | නිර්වචනය | 58 |
| 2.2 | තිරුරහෝනයේ ඵල විපාක | 59 |
| 2.3 | අන්තර්ජාතික සම්මතයන් හා නීති | 61 |

2.4 ශ්‍රී ලාංකීය අණ පනත් 63
2.5 වර්ෂ 2003 දී ශ්‍රී ලංකාවෙන් හා ශ්‍රී ලංකාව හරහා සිදු වූ මානව තිරුරහෝනයන් 66
2.6 නිගමන - තිරුරහෝනය 75
3. පුද්ගලයින් වෙළඳම් කිරීම 77
3.1 නිර්වචනය 77
3.2 පුද්ගල වෙළඳමේ ඵල විපාක 80
3.3 අන්තර්ජාතික සම්මතයන් 82
3.4 ශ්‍රී ලංකාවේ නීති 84
3.5 වර්ෂ 2003 දී ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටතට පුද්ගල වෙළඳම 86
3.6 නිගමන - පුද්ගල වෙළඳම 92
4. සමාප්තිය 93

IV. කම්කරු අයිතිවාසිකම් 95
1. හැඳින්වීම 95
2. සමාගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීම 96
3. කම්කරු සහා පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආයෝජන මණ්ඩලයේ උපදෙස් මාලාව 100
4. 2003 වසර තුළ සිදු වූ වැදගත් සිදුවීම් 102
4.1 වෘත්තීය සමිති ක්‍රියාමාර්ග 102
4.2 ජාතික වෘත්තීය සමිති සම්මේලනය සහ සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති පෙරමුණු පිහිටුවීම 108
5. කම්කරු නීතිය සඳහා සංශෝධන 109
6. නිගමනය 110

V. මානව හිමිකම් සඳහා වූ අධිකරණමය රැකවරණය 113
1. හැඳින්වීම 113
2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් විෂයෙහි ලා අධිකරණමය ප්‍රතිචාරයන් 115
3. සමාජ - ආර්ථික අයිතිවාසිකම් විෂයෙහි ලා අධිකරණමය ප්‍රතිචාරයන් 140
4. ඡන්දය දීමේ අයිතිය තහවුරු කිරීම 152
5. නිගමනය 154

VI. ජාතික පොලිස් කොමිෂන් සභාව 156
1. හැඳින්වීම 156
2. ව්‍යවස්ථාමය ඉතිහාසය 156
2.1 බස්නායක කොමිසම - 1970 156
2.2 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - 1987 157
2.3 1990 පොලිස් කොමිෂන් සභා පනත 158
2.4 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සහ පොලිස් කොමිෂන් සභාව 158
2.5 වෙන් වෙන් වූ ජාතික පොලිස් කොමිෂන් සභා - ව්‍යාකූලතාවයන් 160
3. ජාතික පොලිස් කොමිෂන් සභාවේ විශේෂ ලක්ෂණ 162
3.1 ස්වාධීනත්වය 162
3.2 ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල 164
3.3 පාර්ලිමේන්තුවට වගකිව යුතු වීම 166
3.4 බලතල අභිනියෝජනය 167
3.5 නීති කෘත්‍ය වලින් මුක්ත වීම 167
4. 2003 දී වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාවට එරෙහිව පවතින ප්‍රධාන විවේචන 168
4.1 සාමාජිකයෙකුගේ ඉල්ලා අස්වීම 168
4.2 බලතල පැවරීම හා සම්බන්ධ කාරණා හා වර්තමාන තත්ත්වය 168
5. පොලිස්පතිවරයා පත්කිරීම 171
6. ජාතික පොලිස් කොමිෂන් සභාවේ ජයග්‍රහණ 173
6.1 මහා පරිමාණ දේශපාලනික පෙළඹවීම් මත සිදුවන ස්ථාන මාරුකිරීම් අත්හිටුවීම 173
6.2 මහජන පැමිණිලි සලකා බැලීම සඳහා වූ යාන්ත්‍රණය 174
6.3 පොලිසියේ අවංකභාවය 176
7. ජාතික පොලිස් කොමිෂන් සභාවේ ව්‍යුහමය සීමාවන් 176
7.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලදී සීමාවන් 176
7.2 කැඳවීම් නියෝග සඳහා බලතල නොවීම 177
8. නිගමන 178

VII. විදුණුවැව: යුක්තිය ඉටු වූයේ ද? 180
1. හැඳින්වීම 180
2. ප්‍රහාරය 185
3. කඳවුර සහ රැඳවියෝ 189
4. කොමිසමේ නිගමන 199
4.1 ඔක්තෝබර් 24 ද සිද්ධීන් 199
4.2 ඔක්තෝබර් 25 ද සිද්ධීන් 203
5. ත්‍රි පුද්ගල නඩු විභාගයː 2002 මාර්තු 25 - 2003 ජුලි 01 වැනිද 211
5.1 අධිචෝදනය 211
6. තීන්දුව 216
7. පිළිතුරු නොදුන් ප්‍රශ්න 222
7.1 කරුණු සම්බන්ධ ප්‍රශ්න 223
7.2 නීතිය, පටිපාටිය සහ සාධාරණත්වය පිළිබඳ ගැටලු 229
8. දේශපාලන ආදීනව සහ පාඩම් 232
9. ඉදිරි පියවරයන්? 235

VIII. මානව හිමිකම් හා බුද්ධිමය දේපල අයිතිවාසිකම් 239
1. හැඳින්වීම 239
2. මානව හිමිකම් කෙරෙහි බුද්ධිමය දේපල අයිතිවාසිකම් හි බලපෑම 240
2.1 ඖෂධ කර්මාන්තය හා සෞඛ්‍යයට ඇති අයිතිය 242
2.2 ප්‍රකාශන අයිතිය ආරක්ෂා කිරීම සහ අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම් සහ සංවර්ධනය 248
2.3 කුසගින්නෙන් තොරව ජීවත්වීමේ නිදහස හා පේටන්ට් ආරක්ෂා කිරීම 253
3. බුද්ධිමය දේපල අයිතිවාසිකම් වලට එරෙහිව මානව හිමිකම් සමබරතාවයන් ගොඩ නැංවීමේ අවශ්‍යතාවය 255
3.1 බුද්ධිමය දේපල අයිතිවාසිකම් තුළ ඇති සහනයන් 256
3.2 ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ උත්තරීතරභාවය 265
4. නිගමන 267

REFERENCE ONLY LIBRARY T


| | | |
|---|---|---|
| **IX.** | **ශ්‍රී ලංකාව තුළ මුදල් විශෝධනය පිටුදැකීම** | **268** |
| 1. | හැදින්වීම | 268 |
| 2. | මුදල් විශෝධනය යනු කුමක්ද? | 268 |
| | 2.1 මුදල් විශෝධනය පිළිබඳ ඇතැම් නිර්වචනයන් | 269 |
| | 2.2 මුදල් විශෝධනයේ පියවරයන් | 270 |
| 3. | ශ්‍රී ලංකාවේ තත්ත්වය | 271 |
| 4. | සාපරාධී ක්‍රියාවක් වන මුදල් විශෝධනය මානව හිමිකම් දෘෂ්ටිකෝණයෙන් | 272 |
| 5. | බැංකු සහ මූල්‍ය ආයතන | 273 |
| | 5.1 ඔබේ ගණුදෙනුකරුවා හඳුනා ගැනීම සහ ගනුදෙනුකරුවා කෙරෙහි නිසි උද්යෝගිමත් වීම | 274 |
| | 5.2 සැක සහිත ගනුදෙනු රපෝර්තු කිරීම | 276 |
| 6. | මුදල් විශෝධන ක්‍රමෝපායන් | 277 |
| | 6.1 මුදල් තැන්පතු ව්‍යුහගතකරණය | 277 |
| | 6.2 දෙරටුපල්ලන් භාවිතය | 277 |
| | 6.3 අක් වෙරළ මූල්‍ය මධ්‍යස්ථානය | 278 |
| | 6.4 වෙනත් ක්‍රම | 279 |
| 7. | මුදල් විශෝධනයට එරෙහි ක්‍රමවේදය | 280 |
| | 7.1 මූල්‍ය බුද්ධි අංශය | 282 |
| 8. | ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින මුදල් විශෝධනයට එරෙහි නීති කෙටුම්පත | 284 |
| 9. | වත්මන් තත්ත්වය | 285 |
| 10. | මුදල් විශෝධනයට එරෙහි අන්තර්ජාතික වැඩසටහන් | 288 |
| 11. | සමාප්තිය | 290 |
| **I.** | **උපලේඛනය** - ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද මානව හිමිකම් ලේඛන (2003 දෙසැම්බර්) | 291 |
| **II.** | **උපලේඛනය** - ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර නොමැති ඇතැම් මානව හිමිකම් ලේඛන | 299 |
| **III.** | **උපලේඛනය** - 2003 වර්ෂයේදී තීන්දු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් නඩු තීන්දු | 301 |
| | **නඩු ලැයිස්තුව** | **307** |

# දායකත්වය

**සමාලෝචනය**
*එලිසබෙත් නිසාන්*

**ළමා අයිතිවාසිකම්**
*රුවනා රාජපක්ෂ*

**නීති විරෝධී සංක්‍රමණ: මානව තිරුරහෝනය සහ පුද්ගල වෙළඳම**
*ටොම් ජිල්බ්මන්*

**කම්කරු අයිතිවාසිකම්**
*මනෝරි විතාරණ*

**මානව අයිතිවාසිකම් සඳහා වූ අධිකරණමය රැකවරණය**
*ආචාර්ය ජයන්ත ද අල්මේද ගුණරත්න*

**ජාතික පොලිස් කොමිසම**
*ජේ. සී. වැලිඅමුණ*

**බිඳුණුවැව: යුක්තිය ඉටු වූයේද?**
*ආචාර්ය ඇලන් කීනන්*

**මානව හිමිකම් හා බුද්ධිමය දේපල අයිතිවාසිකම්**
*අවන්ති ගුණතිලක*

**ශ්‍රී ලංකාව තුළ මුදල් විශෝධනය පිටුදැකීම**
*දප්පුල ද ලිවේරා*

**සම්බන්ධීකරණය**

ජානකී ධර්මසේන

**සිංහල පරිවර්තනය හා සෝදුපත් කියවීම**

චරිතා උණවටුන, තාරානාථ් පල්ලියගුරු, තිලංක නානායක්කාර, චාමලී වික්‍රමරත්න, ශාන්ත ජයවර්ධන, ඒ. ඩබ්ලිව්. වක්කුඹුර, චතුරානි අබේවික්‍රම, ලක්ෂිත ජයවර්ධන, ජානකී ධර්මසේන

**කවරය**

ප්‍රියන්ත ප්‍රනාන්දු

**මුද්‍රණය**

කරුණාරත්න සහ පුත්‍රයෝ
අංක 67, කාර්මික ජනපදය
කටුවාන පාර,
හෝමාගම.

# සංක්ෂිප්ත යෙදුම්

| | |
|---|---|
| ACFFTU | - සමස්ත ලංකා නිදහස් වෘත්තීය සමිති සම්මේලනය |
| APNR | - ජාතික සම්පත් සහ මානව හිමිකම් සුරැකීමේ පෙරමුණ |
| ASNAHR | - ජාතික වත්කම් සහ මානව හිමිකම් සුරැකීමේ පෙරමුණ |
| ASP | - සහකාර පොලිස් අධිකාරි |
| BOI | - ආයෝජන මණ්ඩලය |
| CEB | - ලංකා විදුලිබල මණ්ඩලය |
| CID | - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| CMU | - ලංකා වෙළඳ, කර්මාන්ත හා සාමාන්‍ය සේවක සංගමය |
| CPC | - ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව |
| CRC | - ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| DIG | - නියෝජ්‍ය පොලිස්පති |
| EPF | - සේවක අර්ථසාධක අරමුදල |
| ER | - හදිසි රෙගුලාසි |
| ETF | - සේවක භාරකාර අරමුදල |
| EU | - යුරෝපා සංගමය |
| FTZ | - නිදහස් වෙළඳ කලාපය |
| FTZWU | - නිදහස් වෙළඳ කලාප සේවක සංගමය |
| GMOA | - රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය |
| GOSL | - ශ්‍රී ලංකා රජය |
| HRC | - මානව හිමිකම් කොමිසම |
| HQI | - මූලස්ථාන පරීක්ෂක |
| HSTUA | - සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති පෙරමුණ |
| ICCPR | - සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| ICESCR | - ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| IED | - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව |
| IGP | - සාමාන්‍ය පොලිස් පරීක්ෂක |

| | |
|---|---|
| IFI | - ජාත්‍යන්තර මූල්‍ය ආයතන |
| ILO | - ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| IOM | - සංක්‍රමණය සඳහා ජාත්‍යන්තර සංවිධානය |
| IPA | - බුද්ධිමය දේපල පනත |
| IPR | - බුද්ධිමය දේපල අයිතිවාසිකම් |
| ISGA | - අන්තර්වාර ස්වයංපාලන අධිකාරිය |
| ITGLWF | - රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් කර්මාන්ත සේවක සම්මේලනය |
| JJPA | - ළමා අධිකරණ විධිවිධාන පනත |
| JSC | - අධිකරණ සේවා කොමිසම |
| JSS | - ජාතික සේවක සංගමය |
| JTUF | - ජාතික ගුරු වෘත්තීය සම්මේලනය |
| JVP | - ජනතා විමුක්ති පෙරමුණ |
| LDC | - ඌණ සංවර්ධිත රටවල් |
| LHRD | - මානව හිමිකම් සහ සංවර්ධනය වෙනුවෙන් නීතිඥයින් |
| LJEWU | - ලංකා ජාතික වතු සේවක සංගමය |
| LTTE | - දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය |
| NCPA | - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| NERF | - උතුරු නැගෙනහිර ප්‍රතිසංස්කරණ අරමුදල |
| NESU | - ජාතික වතු මාණ්ඩලික නිලධාරී සංගමය |
| NLAC | - ජාතික කම්කරු උපදේශක සභාව |
| NMC | - ජාතික මෙහෙයුම් කමිටුව |
| NPC | - ජාතික පොලිස් කොමිසම |
| NTUF | - ජාතික වෘත්තීය සමිති සම්මේලනය |
| NYSC | - ජාතික තරුණ සේවා සභාව |
| OIC | - ස්ථානභාර නිලධාරී |
| PA | - පොදු ජන එක්සත් පෙරමුණ |
| PSNTUF | - රාජ්‍ය සේවා ජාතික වෘත්තීය සමිති සම්මේලනය |
| PTA | - ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත |
| SAARC | - කලාපීය සහයෝගීතාවය සඳහා වූ දකුණු ආසියානු සංගමය |
| SDN | - යථා තත්ත්වයට පත් කිරීමේ උප කමිටුව |

SIHRN - හදිසි ප්‍රජා පුනරුත්ථාපන අවශ්‍යතා සඳහා වූ උප කමිටුව
SLBFE - ශ්‍රී ලංකා විදේශ රැකියා මණ්ඩලය
SLMM - ශ්‍රී ලංකා විමර්ශන මෙහෙයුම
SSP - ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි
TRO - ද්‍රවිඩ පුනරුත්ථාපන සංවිධානය
TULF - ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ
UDHR - මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
UGC - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම
UN - එක්සත් ජාතීන්
UNC - එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය
UNHCR - සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමසාරිස්
UNICEF - එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
USGSP - එක්සත් ජනපද පොදු ප්‍රමුඛතා පද්ධතිය
WHO - ලෝක සෞඛ්‍ය සංවිධානය
WPC - කාන්තා පොලිස් කොස්තාපල්
WSI - කාන්තා උප පොලිස් පරීක්ෂක

# පෙරවදන

ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම්වල වර්තමාන තත්ත්වය සහ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම්, ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වන ලෙස ආරක්ෂා කිරීමේ වගකීම ශ්‍රී ලංකාව විසින් කොතෙක් දුරට ඉටු කර ඇත්ද යන්න තක්සේරු කිරීම මෙම වාර්තාවේ අරමුණ වේ. මෙය ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් සම්බන්ධ වැදගත් අනාවරණයක් නියෝජනය කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගකීම්, ව්‍යවස්ථා සහ මූලික අයිතිවාසිකම්වල වර්තමාන ක්‍රියාකාරීත්වය සහ එය බලාත්මක වී ඇති ප්‍රමාණය මෙමගින් පරීක්ෂා වී ඇති අතර ඒවායේ අන්තර්ගත සීමාවන්හි බලපෑම් ද සාකච්ඡා වී ඇත. මෙම වාර්තාව, ළමා අයිතිවාසිකම්, නීති විරෝධී සංක්‍රමණ: මානව තිරුරහෝනය සහ පුද්ගල වෙළඳාම, කම්කරු අයිතිවාසිකම්, මානව හිමිකම් සඳහා වූ අධිකරණමය රැකවරණය, ජාතික පොලිස් කොමිසම, බිඳුණුවැව: යුක්තිය ඉටු වූයේද?, මානව හිමිකම් හා බුද්ධිමය දේපල අයිතිවාසිකම් මෙන්ම ශ්‍රී ලංකාව තුළ මුදල් විශෝධනය පිටුදැකීමද ආවරණය කරයි.

නීතිය හා සමාජ භාරය විසින් මෙම වාර්තාව සම්බන්ධීකරණය කරන ලදී. එහි පරිච්ඡේදයන් අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂ නිපුණත්වයක් ඇති පුද්ගලයින්හට බාරදෙනු ලැබිණි. ඉන්පසුව දළ පිටපත්, නිවැරදි, විෂයානුකූල සහ පැහැදිලි ඉදිරිපත් කිරීමක් වෙනුවෙන් විමර්ශනයට භාජනය කෙරිණි. ඉන්පසුව වාර්තාව දළ ආකාරයට එකතු කර සකස් කෙරුණු අතර එය ප්‍රායෝගිකව තේරුම් ගත හැකි වනු පරිදි හා සමාජ රටාව තහවුරු වන පරිදි සවිස්තරාත්මකව සංස්කරණය කෙරිණි. කෙසේ වුවද, අනිවාර්යෙන්ම, ඇතැම් පරිච්ඡේද අතර සමාන බවක් තිබිය හැකි අතර ඇතැම් මාතෘකා අනෙක් ඒවාට වඩා සවිස්තරාත්මක ලෙස විග්‍රහ වී තිබිය හැක. තවද වාර්තාවෙහි ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති නමුත් අපරානුමත කිරීමට නියමිතව ඇති ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිවල ලැයිස්තුවක් ද අන්තර්ගතය. 2003 වසරෙහි ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විනිශ්චිත මූලික අයිතිවාසිකම් නඩුවල ලැයිස්තුවක් ද උපලේඛනයක් ලෙස වාර්තාවට අමුණා ඇත.

මෙම වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් වඩාත් කාර්යක්ෂම ලෙස ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම තහවුරු කිරීම උදෙසා රජය

සිවිල් සමාජීය ආයතන අතර කතිකාවකට පහසුකම් සැලසීම නොනවත්වා සිදුකරගෙන යාම බලාපොරොත්තු වේ.

ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව "ව්‍යවස්ථාව මගින් ප්‍රකාශ කළ සහ පිළිගත් මූලික අයිතිවාසිකම් වලට රජයේ සියලුම ආයතන ගරු කළ යුතු බව, ආරක්ෂා කළ යුතු බව සහ වැඩි දියුණු කළ යුතු බව"ට නියම කරයි. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් පිළිබඳ සම්මුති කිහිපයකටම අත්සන් තබා ඇති අතර දේශීය නීති, ප්‍රතිපත්ති සහ චාරිත්‍ර එහි ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල බව තහවුරු කළ යුතුය. මෙම වාර්තාව, රජය, (සහ මෙම වාර්තාවෙහි නීත්‍යනුකූල ලෙස පරීක්ෂාවට ලක් වූ රජයේ නොවන චරිත) එහි ජාත්‍යන්තර සහ ව්‍යවස්ථාමය බැඳීම් වලට ගරු කරන බව හා මානව හිමිකම් ආරක්ෂා කරන බව තහවුරු කිරීම උදෙසා නොනවතින අරගලයක් ගෙන යෑමට ගත් කාලීන පියවරකි.

**නීතිය හා සමාජ භාරය**
**කොළඹ**

**2004 ඔක්තෝබර්**

# I

# සමාලෝචනය

*එලිසබෙත් නිසාන්**

## 1. හැඳින්වීම

මීට පෙර ප්‍රකාශිත "ශ්‍රී ලංකා මානව හිමිකම් තත්ත්වය" හි කිසිම වාර්තාවක සාකච්ඡා නොකෙරුණු ගැටලු පිළිබඳව සාකච්ඡා කෙරෙන පරිච්ඡේද ගණනාවක් ද ඇතුළත් වූ මෙම වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක පැතිර පවත්නා මානව හිමිකම් ගැටලු රාශියක් ආවරණය කරනු ලැබේ. මේ නව තේමාවන්ට නීති විරෝධී සංක්‍රමණ, බුද්ධිමය දේපල අයිතිවාසිකම්, ජාතික පොලිස් කොමිසම සහ මුදල් විශෝධනය යනාදියෙහි විවිධාකාර පැති අඩංගු වේ. ළමා අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම්, මානව හිමිකම් සඳහා වූ අධිකරණමය රැකවරණය සහ 2000 ඔක්තෝබර් මස සිදුවූ බිඳුණුවැව සමූල ඝාතනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස වරදකරුවන්ට නියම කරන ලද දණ්ඩනයන් පිළිබඳ සිදු කරන ලද පරීක්ෂණ වලින් පැන නැගුණු ගැටලු විමසීම තුළින්, දඬුවමින් බේරී සිටීමේ නිදහස යනාදී තේමාවන් යටතේ ද පරිච්ඡේදයන් අඩංගු වී ඇත.

ශ්‍රී ලංකා රජය හා ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ.) සංවිධානය අතර ඇති කරගත් සටන් විරාමය හා සිදුකරන ලද සාම සාකච්ඡා මගින් සමහර වැදගත් අංශවල දියුණුවක් ඇතිවූ නිසාම ගිය වර්ෂයේ ශ්‍රී ලංකාවෑ

---

* මානව හිමිකම් උපදේශක

මානව හිමිකම් තත්ත්වය 2003 වාර්තාවේදී, 2002 වසර පිළිබඳ විපරම්කාරී වූ සර්වශුභවාදී හැඟීමකින් වාර්තා කිරීමට හැකි වී තිබේ. එවැනි වාතාවරණයක් තුළ රටේ, සහ විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පැවති මානව හිමිකම් තත්ත්වය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වන බවක් දක්නට ලැබුණි. 2002 වර්ෂයේ එලෙස නිරීක්ෂණය කෙරුණු සමහර වර්ධනය වීම් 2003 වර්ෂය දක්වාත් නොකඩවා පැවතිණි: දෙපාර්ශවයම විසින් සිදුකරන ලද ගිවිසුම් කඩකිරීම් සහිතව වුවත්, සටන් විරාම ගිවිසුම මුළු වර්ෂය පුරාවටම ක්‍රියාත්මක විණි; සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වන ආකාරය නිරීක්ෂණය කිරීම පිණිස සටන් විරාම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව (SLMM) විසින් එකී නිරීක්ෂණය කිරීමේ කටයුතු නොකඩවා පවත්වාගෙන යන ලදී; වන්නිය හරහා පවත්වාගෙන යන ලද උතුරු හා නැගෙනහිර අතර පැවති සන්නිවේදනයන් තවදුරටත් වර්ධනය විණි.

2001[1] වර්ෂයේදී රටේ පැවති හදිසි වාතාවරණ තත්ත්වය අවලංගු කිරීමෙන් පසුව, හමුදාව විසින් අත්අඩංගුවට ගන්නා සංඛ්‍යාව අඩු වූ අතර, එලෙස අත්අඩංගුවට ගත් පුද්ගලයින්[2] හමුද කඳවුරු වල රඳවා තබා ගන්නවා වෙනුවට ඉක්මණින්ම පොලිසිය භාරයට පත්කිරීමද සිදුවිය. හදිසි නීතිය යටතේ රඳවා තබාගත් පුද්ගලයින් නිදහස් කෙරුණු අතර, 2003 වර්ෂය අවසාන වන විට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ රඳවාගෙන සිටින පුද්ගලයින් සංඛ්‍යාව 65 ක් පමණ විය.[3] 2002 වර්ෂයේ පෙබරවාරි මස, අත්සන් තැබුණු සටන් විරාම ගිවිසුමෙන් පසු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දීර්ඝ වූ කාල වකවානු පුරා රඳවා තබාගෙන සිටි සිරකරුවන් 1,000 කට අධික ප්‍රමාණයක් නිදහස් කරන ලදී. ඒ කෙසේ වුවත්, දේශපාලන රැඳවියන්ගේ සංඛ්‍යාව විශාල වශයෙන් අඩුවීම සතුටුදායක

1. හදිසි නීති ප්‍රතිපාදනවල පිහිට පැතීමට නොහැකි වූ රජය ඒ වෙනුවෙට ඔවුන්ට "සමහර හදිසි නීති රෙගුලාසි වලට සමාන තත්ත්වයන්ම බලපවත්වාගෙන යා හැකි" ආකාරයේ ප්‍රතිපාදන ඇති, මහජන ආරක්ෂක ආඥපනත සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇති විකල්ප ප්‍රතිපාදන වල පිහිට පතන්නට විය. කොළඹ, තඩේසන් කේන්ද්‍රයේ සාලිය එදිරිසිංහ විසින් මේ සමාලෝචනයට ලියන ලද අතිරේකයෙහි මේ පිළිබඳව කරුණු සවිස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

2. "ශ්‍රී ලංකා", *මානව හිමිකම් ප්‍රතිපත්ති පිළිබඳ රටවල්වල වාර්තා-2003,* ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව. http://www.state.gov/g/drl/rls/hrrpt/2003/27951.htm

3. "ශ්‍රී ලංකා", ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ වාර්තාව - 2004, වෙබ් අඩවි ප්‍රවේශය - http://web.amnesty.org/report 2004/lka-summary-eng

REFERENCE ONLY
LIBRARY
LST

කරුණක් වන අතරම, එම වර්ෂය අවසානයේදීවත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල කරවීම සඳහා එහි ප්‍රතිපාදන අවලංගු කිරීමටවත් හෝ සංශෝධනය කිරීමටවත් අවශ්‍ය පියවර ගැනීමට රජය අපොහොසත් විය. කෙසේ වෙතත්, 2003 වර්ෂයේ මාර්තු[4] මස ලබා දී තිබෙන වැදගත් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවකින් ප්‍රකාශ කර තිබුණේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පනවා ඇති රෙගුලාසි මගින් මූලික අයිතිවාසිකම් මත සීමාවන් පැනවිය නොහැකි බවයි. මේ තීන්දුව ලබා දී ඇත්තේ මූලික අයිතිවාසිකම් මත සීමාවන් පැනවීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉඩ සලසා ඇත්තේ, නීතිය (ආඥපනත්) මගින් හා විශේෂිත අවස්ථාවල දී හදිසි නීති ප්‍රතිපාදන මගින් පමණක් බවත්, එසේ නොමැතිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ රෙගුලාසි මගින් නොවන බවත් යන තර්කය මතය.

## 2. උතුරු සහ නැගෙනහිර මානව හිමිකම් තත්ත්වය

උතුරු සහ නැගෙනහිර පැවති මානව හිමිකම් තත්ත්වය, 2003 වර්ෂය තුළ විශේෂිතව, බලවත් සැලකිල්ලට භාජනයව පැවති කරුණක් විය. පසුගිය වසර ගණනාව තුළම මානව හිමිකම් තත්ත්වය කෙරෙහි උතුරු නැගෙනහිර පැවති යුධ ගැටුමෙහි බලපෑම කෙරෙහි මානව හිමිකම් ක්‍රියාකාරකයින් ගේ මූලික අවධානය යොමුවීම පුදුමයට කරුණක් නොවිය. දීර්ඝ කාලීනව තම නිවාස වලින් අවතැන් වීමත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඔබින නිවසකට, සෞඛ්‍ය සේවා වලට අධ්‍යාපනයට සහ රැකියාවකට යාමට ඇති ඔවුන්ගේ අයිතීන් ප්‍රතික්ෂේප වුණු විශාල ජන සමූහයකගේ ප්‍රබල බලපෑම, 2003 වර්ෂයේ අප්‍රේල් මස එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් තාවකාලිකව අත්හිටුවන තුරු පැවති සාම සාකච්ඡාවන් පවා පාලනය කිරීම සැලකිල්ලට භාජනය වුණු එක් ප්‍රධාන කරුණක් විය. වසරේ මුල් මාස කිහිපය තුළම අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ සැලසුම් සාම ක්‍රියාදාමය හරහා වැඩි දියුණු කරන ලදී. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ (UNHCR) සංඛ්‍යාලේඛන අනුව 2002 වසරේ ජනවාරි මස සහ 2003 වසරේ ජූනි මස අතර කාලය තුළදී එලෙස අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයින්ගෙන් 311,202 සංඛ්‍යාවක්

---

4. ශ්‍රේෂ්ඨාධිකරණ අංක 20/2002 (මූලික අයිතිවාසිකම්), සෝතිලිංගම් තවනීදන් එ. *දයානන්ද දිසානායක, මැතිවරණ කොමසාරිස්වරයා හා තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ* වාර්තා 2003.03.25.

නැවත ඔවුන්ගේ නිවාස කරා ගොස් ඇත. මෙලෙස අවතැන් වූ අයගෙන් වැඩි සංඛ්‍යාවක් කාන්තාවන් හා ළමයින් වන අතර මෙම පීඩාවෙන් වැඩි වශයෙන් වේදනා විඳින්නේ ද ඔවුන්මය. 2002 වසරේ දී කාන්තා සංවිධාන විසින් ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට පුද්ගලයින් කැමති කරවා ගැනීමට දරන ලද මහත් පරිශ්‍රමයන් හේතුවෙන්, ලිංගිකත්වය පිළිබඳව සැලකිල්ලක් සාම ක්‍රියාදාමයේ සෑම පැතිකඩකටම අන්තර්ගත කළ යුතුයි යන්න හඳුනා ගත් අතරම 2002 වසරේ අවසානයේ දී සාම ක්‍රියාදාමයට සම්බන්ධ ලිංගිකත්වය පිළිබඳ ගැටලු පිළිබඳ ප්‍රතිපත්ති සැකසීම සඳහා ලිංගිකත්ව ගැටලු සම්බන්ධ උප කමිටුවක් ද පිහිටුවන ලදී. සාම සාකච්ඡා තාවකාලිකව අත්හිටුවීමට පෙර 2003 වර්ෂයේදී මෙම උප කමිටුව දෙවතාවක් රැස්විණි.

ඊට අමතරව, හමුදා පාලනය යටතේ ඇති ප්‍රදේශ ලෙස පෙනුමට පමණක් ඇති ප්‍රදේශවල ජීවත් වන ජනතාව ද ඇතුළත්ව, උතුරු හා නැගෙනහිර ජනගහණය කෙරේ සටන් විරාම ගිවිසුමේ කොන්දේසි නොකඩවා භාවිතා කරමින් එල්.ටී.ටී.ඊ. ය තම පාලනය තවදුරටත් දීර්ඝ කරමින් පවත්වාගෙන ගිය ආකාරය කෙරෙහි 2003 වර්ෂයේ දී බරපතල ලෙස අවධානය යොමු විය. සැබැවින්ම, ජාත්‍යන්තර ක්ෂමා ආයතනය සහ මානව හිමිකම් විමසුම (Human Rights Watch) එකතු වී 2003 අගෝස්තු මස නිකුත් කළ ප්‍රකාශය මගින් "ශ්‍රී ලංකා රජය හා ඇතිකරගත් සටන් විරාම ගිවිසුම, තමන්ගේ දේශපාලන විරුද්ධවාදීන් මරා දැමීම සඳහා ප්‍රයෝජනයට ගැනීම"[5] පිළිබඳව එල්.ටී.ටී.ඊ. සංවිධානයට චෝදනා නගා තිබුණි. සටන් විරාම ගිවිසුමේ කොන්දේසි මගින් එල්.ටී.ටී.ඊ. භටයින් වෙත, රජයේ පාලනයට නතුවූ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල නිදහසේ එහා මෙහා යාම සඳහා ලබා දී ඇති අවසරය නිසා, ඔවුන්ට එම ප්‍රදේශවල වාසය කරන ජනතාව කෙරෙහි ඍජු ප්‍රවේශයක් හිමිවී ඇත. එබැවින් එම සංවිධානයේ පැවැත්ම එම ප්‍රදේශවල ව්‍යාප්ත වීමත් සමඟම, ඔවුන් පාලනය කිරීමටත්, ප්‍රවෘත්ති සම්බන්ධව සීමා පැනවීමටත්, බිය ඇතිකර බලපෑම් කිරීම්, පැහැර ගැනීම් හා සැලසුම් සහගතව සිදුකරන ඝාතන යොදගන්නා ලදී. ඔවුන්ගේ ඉලක්කය ලෙස පෙනෙන්නේ, ශක්ති සම්පන්න විවේචකයන් හා විකල්ප මතධාරී කණ්ඩායම්

5. "ශ්‍රී ලංකාව: දඬුවමින් බේරී සිටීමේ නිදහස ඇති බැවින් එල්.ටී.ටී.ඊ. ය සම්බන්ධිත වූ ඝාතන තවදුරටත් සිදුවන බව හිමිකම් සංවිධාන ප්‍රකාශ කරයි". ජාත්‍යන්තර ක්ෂමා ආයතන විසින් නිකුත් කළ මාධ්‍ය ප්‍රකාශය, ඒ.අයි. පටුන: ASA 37 / 003/ 2003 - වෙබ් අඩවි ප්‍රවේශය: http://web.ainnesty.org/library/index/ENGASA370032003?open&of=ENG-LKA

වල නියෝජිතයන් නිහඬ කරවීමයි. "මේ කෙටි කාලයට පමණක්"[6] සාම සාකච්ඡා වලින් ඉවත් වීමට එල්.ටී.ටී.ඊ. ය ගත් තීරණයත් සමඟම 2003 අප්‍රේල් මාසයෙන් පසුව සැබවින්ම, වාතාවරණය ශීඝ්‍රයෙන් පරිහානියට පත්විය. එල්.ටී.ටී.ඊ. යට විරුද්ධ පක්ෂවල සාමාජිකයන් සහ ඔවුන්ගේ නෑදෑයින් ඉලක්ක කර ගනිමින් එල්.ටී.ටී.ඊ.ය විසින් උතුරු සහ නැගෙනහිර සිදු කරන ලද දේශපාලන ඝාතන සහ පැහැර ගැනීම් සංඛ්‍යාව වැඩිවීම පිළිබඳව දේශීය මෙන්ම ජාත්‍යන්තර මානව හිමිකම් කණ්ඩායම් අතර බලවත් අවධානයක් වැඩෙන්නට විය. එවැනි ඝාතනවල උග්‍රම අවස්ථාව වූයේ 2003 වසරේ අප්‍රේල් සහ අගෝස්තු[7] අතර කාලය වුවත්, එවැනි ඝාතන වසරේ වෙනත් කාල වලදී ද සිදුවූ අතරම, තම විරුද්ධවාදීන් කොළඹ දී ඝාතනය කරන තරමටම එම ඝාතන දරුණු ලෙස ව්‍යාප්ත විය. ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවට අනුව[8] මුළු වර්ෂය තුළ එල්.ටී.ටී.ඊ. ය විසින් එල්.ටී.ටී.ඊ.යට විරුද්ධ දමිළ දේශපාලන කණ්ඩායම්වල සාමාජිකයන් සහ ඔත්තුකරුවන් (තොරතුරු සපයන්නන්) යැයි සලකනු ලබන පුද්ගලයින් 36 කට වඩා වැඩි ප්‍රමාණයක් ඝාතනය කරන ලදී. වර්ෂය තුළදී එල්.ටී.ටී.ඊ. සංවිධානයේ බිහිසුණු යුධ ක්‍රමයන්ගේ තවත් ඉලක්කයක් වූයේ නැගෙනහිර වාසය කළ මුස්ලිම් ජනතාවයි. මානව හිමිකම් සඳහා වූ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය (යාපනය) විසින් 2003 වසරේ ඔක්තෝබර් සිට දෙසැම්බර් කාලය තුළ මුතූර් සහ කින්නියා ප්‍රදේශවල සිදුවූ එවැනි සිද්ධීන් ගණනාවක් වාර්තා කරන ලදී. උදහරණයක් ලෙස එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් නැගෙනහිර ප්‍රදේශ කෙරෙහි ඇති ඔවුන්ගේ ප්‍රාදේශික හා දේශපාලනික ග්‍රහණය පුළුල් කිරීමට ගන්නා උත්සාහයේ දී, මුස්ලිම් සිවිල් ජනයා එම ප්‍රදේශ වලින් බලාත්කාරයෙන් ඉවත් කෙරුණු ආකාරයත්, දමිළ සහ මුස්ලිම් ජන සමාජයන් අතර පවතින ඉඩම් ආරවුල් වල දී, සාහසික ක්‍රියාවන්ට පිදුරු දමන්නට එල්.ටී.ටී.ඊ.ය විසින් එම ආරවුල් වලට මැදිහත් වී වංචා කිරීම් කළ ආකාරයත් දක්විය හැක. සාම සාකච්ඡාවන් වර්ධනය

---

6. එල්.ටී.ටී.ඊ. මූලස්ථානය විසින් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමා වෙත එවන ලද 2003.04.21 දිනැති ලිපිය - එහි අන්තර්ගත කරුණු දැන ගැනීමට එල්.ටී.ටී.ඊ. සාම ලේකම් කාර්යාල වෙබ් අඩවියට යා හැක. http://www.lttepeacesecretariat.com/mainpages/releases/PR210403.pdf
7. "ශ්‍රී ලංකා", ජාත්‍යන්තර ක්ෂමා ආයතන වාර්තාව 2004, වෙබ් අඩවි ප්‍රවේශය http://web.amnesty.org/report2004/lka-summary-eng
8. "ශ්‍රී ලංකා", මානව හිමිකම් ප්‍රතිපත්ති පිළිබඳ රටවල්වල වාර්තා - 2003, ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව, වෙබ් අඩවි ප්‍රවේශය - http://www.state.gov/g/drl/rls/hrrpt/2003/27951.htm

විමත් සමගම, මුස්ලිම් පක්ෂ විසින් රටේ එල්.ටී.ටී.ඊ. පාලනයට යටත්ව පවතින සමහර ප්‍රදේශවල, මුස්ලිම් ජනතාව වෙත වැඩි ස්වාධීනත්වයක් ලබා ගැනීම පිණිස නැඟු හඬ තවත් වර්ධනය කරන්නට විය. ඊට අමතරව, ළමයින්ගේ ජීවිතයට සාමාන්‍ය තත්ත්වයක් ආපසු ලබාදීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් යටතේ යුනිසෙෆ් ආයතනයත් සමඟ කටයුතු කරන බවට 2002 වසරේ දෙසැම්බර් මස එල්.ටී.ටී.ඊ. ය එකඟ වූ ගිවිසුම නොසලකා හරිමින්, තවදුරටත් එල්.ටී.ටී.ඊ. ය විසින් ඔවුන්ගේ හමුද වලට ළමයින් බඳවා ගැනීම සිදු කරන ලදී.

2003 වසරේ මුල් කාලය වනවිට, විශේෂයෙන්ම යාපනයේ අධිආරක්ෂිත කලාපවල තත්ත්වය පිළිබඳව සහ සාමාන්‍ය ජනතාවට එම ප්‍රදේශවල නැවත පදිංචි වීමට ඉඩ සැලසීම පිණිස යුධ හමුද එම කලාප වලින් ඉවත්විය යුතුය යන එල්.ටී.ටී.ඊ. අභිලාෂය පිළිබඳවත් එල්.ටී.ටී.ඊ. ය සහ රජයේ සාම නියෝජිතයින් අතර වර්ධනය වෙමින් පැවති අවිනිශ්චිතභාවය පැහැදිලිවම දක්නට තිබුණි. යුධ හමුද විසින් එම යෝජනාව ප්‍රතික්ෂේප කරනු ලැබුවේ, ඔවුන් එලෙස ඉවත් වන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානය නිරායුධ වන්නේ නම් පමණක් බව ප්‍රකාශ කරමිනි. එයද නැවතත් එල්.ටී.ටී.ඊ. ය විසින් ප්‍රතික්ෂේප වුණු අතර, අත්පත් කරගත් ප්‍රදේශ නැවත භාරදීම සහ ඒවා සාමාන්‍යය තත්ත්වයට පත්කිරීම පිළිබඳ උප කමිටුවෙහි (Sub Committee on De-Escalation and Nornalization) අනාගතය පිළිබඳව කිසිම එකඟතාවයක් ළඟාකර ගැනීමට දෙපාර්ශවයට නොහැකි වූ බැවින් 2003 ජනවාරි මස තායිලන්තයේ පැවති සාම සාකච්ඡාවල සිව්වන වටයේදී එම උප කමිටුවේ ක්‍රියාකාරීත්වය ඇණ හිටිණි. පෙබරවාරි සහ මාර්තු මාසවල දී ශ්‍රී ලංකා නාවික හමුදවේ සහ එල්.ටී.ටී.ඊ. යේ නෞකා අතර මුහුදේ දී සිදු වූ සිද්ධීන් මගින් මෙම අවිනිශ්චිතභාවය තවදුරටත් තීව්‍ර කරවීය.

2002 වසර තුළදී, සාම ක්‍රියාවලියට වෙනත් බලවේගයක් තුළින් පැන නැඟිය හැකි බාධාවන් පෙර සිටම දැන ගැනීමට හැකියාව ලැබුණි: එනම්, දකුණේ විපක්ෂයන් සහ ආණ්ඩුව අතර ඒකමතිකභාවයක් නොමැතිකම සහ විශේෂයෙන්ම සාම සාකච්ඡා ඒ වනවිට යොමු වී තිබූ මාර්ගය පිළිබඳව විධායක ජනාධිපතිතුමියගෙන් නැඟුණු විරෝධයයි. අග්‍රාමාත්‍යවරයා සහ විධායක ජනාධිපතිවරිය විරුද්ධ දේශපාලන පක්ෂ දෙකක් නියෝජනය කරන්නන් වූ බැවින්, ඔවුන් අතර නොරිස්සුම් සහගත බවක් ඇතිවීමට ඇති හැකියාව ඉහළ විය. එය උපරිම තත්ත්වයට පත්වූයේ, වසර 2003 දී විධායක ජනාධිපතිනි, චන්ද්‍රිකා කුමාරතුංග විසින් නොවැම්බර් 4 වන දින පාර්ලිමේන්තුව තාවකාලිකව විසුරුවා හැර, කැබිනට් ඇමතිවරුන් තිදෙනෙකු

නිලයෙන් පහකොට ඔවුන්ගේ නිලතල ඇය වෙත පවරාගත් අවස්ථාවේදීය. ජනාධිපතිනිය, මෙම පියවර ගත්තේ එල්.ටී.ටී.ඊ. ය විසින් (ISGA) අන්තර් ස්වයංපාලන අධිකාරියක් නිර්මාණය කිරීම සඳහා ඔවුන්ගේ යෝජනාවලිය ඉදිරිපත් කර දින කීපයකට පසුවයි. මෙම අධිකාරිය, වෙනම දමිළ රාජ්‍යයක් බිහිකිරීමේ මුල් පියවර ලෙස විපක්ෂයන් සලකන ලදී. මෙම අධිකාරිය සතුව (ISGA) නැවත ස්ථාපනය කිරීම, පුනරුත්ථාපනය, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය, ආදායම් බදු අයකිරීම, නීතිය හා සාමය සහ ඉඩම් සම්බන්ධ බලතල ඇතුළුව උතුරු සහ නැගෙනහිර පාලනය කිරීම සඳහා අවශ්‍ය සීමාරහිත බලතල හිමිවිය යුතුය.[9] මෙම ජනවාර්ගික අර්බුදයට අවසන් විසඳුමක් ක්‍රියාත්මක කරන කාලය වනතුරු මෙම යෝජනාවලිය එලෙසම පවතිනු ඇත. ඇත්ත වශයෙන්ම, මෙම අධිකාරිය මගින් උතුරු සහ නැගෙනහිර පාලනය සම්බන්ධව පිළිගත් අධිකාරිය ලෙස එල්.ටී.ටී.ඊ. සංවිධානය ස්ථාපනය කරන අතර කිසිදු ඡන්ද විමසීමේ ක්‍රියාවලියක පිහිටකින් තොරව එහි පාලනය එම ප්‍රදේශවල පිහිටුවනු ඇත.

2003 වසරේ අගභාගය වන විට, සාම සාකච්ඡා වල අනාගතය ඉතාමත් අවිනිශ්චිත තත්ත්වයක පැවතිණි. 2004 වසරේ මැද කාලය වනතුරු මැතිවරණයක් නොපැවැත්වෙන අතර, පොදුජන එක්සත් පෙරමුණේ (PA) මුල් පාලන කාලය තුළ ඇතිවූ අත්දැකීම් මත පදනම් වූ ගැඹුරු, අන්‍යෝන්‍ය අවිශ්වාසයක් සහිත ඉතිහාසයක් ජනාධිපතිනි කුමාරතුංග සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර විය. සාම ක්‍රියාදාමය වත්මන සමන්විත වී ඇති ආකාරයට, සියලුම පුද්ගලයින්ට ප්‍රජාතන්ත්‍රවාදය, යුක්තිය සහ සමානාත්මතාවය ලබාදෙන විසඳුමක් කරා එළඹිය හැකිද යන්න පිළිබඳ ප්‍රශ්න රාශියක් පැන නැගිණි. මෙම කතාබහට සම්බන්ධ වූයේ එල්.ටී.ටී.ඊ.ය සහ රජයේ නියෝජිතයන් පමණක් වූ අතර, සමහර අවස්ථාවල දී තම ජනවර්ගයාගේ අයිතීන් ආරක්ෂා කිරීම පිණිස මුස්ලිම් නියෝජිතයන්ට මෙම කතාබහට සහභාගී වීමට ආරාධනා ලැබිණි. එවන් අවස්ථාවක, විකල්ප මතවාදයක් ඉදිරිපත් කිරීමට හෝ ඒ පිළිබඳ තර්ක කිරීමටවත් හිමිවූයේ ඉතා කුඩා ඉඩ ප්‍රස්ථාවක් පමණි. එම වසර තුළදී මානව හිමිකම් පිළිබඳ වූ සාකච්ඡා වලදී පාර්ශවකරුවන් විසින් කුමන ආකාරයක විධිමත් ප්‍රකාශයක් නිකුත් කර තිබුණත්, තවදුරටත් එල්.ටී.ටී.ඊ. ය විසින් භය කිරීමේ උපක්‍රම මගින්

9. අන්තර් ස්වයංපාලන අධිකාරිය (ISGA) පිළිබඳ යෝජනාවලියේ සම්පූර්ණ අන්තර්ගතය පරිශීලනය කළ හැකි වෙබ් අඩවිය: http://www.lttepeacesecretariat.com/mainpages/releases/proposal.pdf

සහ තම පාලනයට විරෝධය පාමින් සිදුකරන කථාබහ යටපත් කිරීමේ උත්සාහයන් මගින් තවදුරටත් උතුරු සහ නැගෙනහිර ජනතාව කෙරෙහි තම පාලනය පතුරුවමින් සිටි නිසා උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල මානව හිමිකම් පිළිබඳ "බලාපොරොත්තුවක්", ක්‍රියාත්මක වීම අතින්, ඉතා අඳුරු තත්ත්වයක පැවතිණි.

## 3. 2003 වර්ෂයේ සාම සාකච්ඡා සහ සාම ක්‍රියාදාමය වෙතින් එල්.ටී.ටී.ඊ. සංවිධානය ඉවත් වීම

"තම සහභාගීත්වය තාවකාලිකව අත්හිටවන" බවට අප්‍රේල් මස පැවති සාම සාකච්ඡා වලදී එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රකාශ කරන විට, මුල්වටයේ සාම සාකච්ඡා වාර 6ක් පවත්වා තිබුණු අතර එයින් තුනක්ම 2003 වසරේදී පැවැත් විය.[10] මෙම සාකච්ඡා වාරවල ප්‍රධාන අවධානය යොමුවූ කරුණ වූයේ, යුද්ධය හේතුවෙන් තම නිවාස වලින් අවතැන් වූ ලක්ෂ සංඛ්‍යාත ජනතාව නැවත ස්ථාපනය කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ ප්‍රජා වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමේ හදිසි අවශ්‍යතාවයයි.

සිව්වන සාකච්ඡා වාරය 2004 වසරේ ජනවාරි මස තායිලන්තයේ පැවැත්විණි. මෙම සමුළුවේ අවධානය හදිසි ප්‍රජා මානුෂික ප්‍රමුඛතාවයන් (අවශ්‍යතා) කෙරේ යොමු වූ අතර, විශේෂයෙන්ම, අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයින් සඳහා නැවත ස්ථාපනය හා පුනරුත්ථාපනය සැපයීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමුවිය. මේ කාලය දක්වා, යාපනය දිස්ත්‍රික්කය වෙනුවෙන් වේගවත්ව නැවත ස්ථාපනය කිරීමේ වැඩසටහනක් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව එකඟතාවයක් විය. මීට ඉහත දී සාකච්ඡා කළ පරිදිම, අත්පත් කරගත් ප්‍රදේශ නැවත බාරදීම සහ ඒවා සාමාන්‍ය තත්ත්වයට පත් කිරීම පිළිබඳ උප කමිටුවේ (SDN) අනාගත කාර්යභාරය පිළිබඳව කිසිදු එකඟතාවයකට එළඹීමට නොහැකි වූ අතර එම උප කමිටුව ඉන්පසු රැස්වූයේ නැත. අවතැන්වූ පුද්ගලයින් නැවත ස්ථාපනය කිරීම සංවිධානය කරනු පිණිස, පොදු ජනයාට ප්‍රවේශ විය නොහැකි අධි ආරක්ෂිත කලාප සහ වෙනත් ප්‍රදේශ වලට අදාළ ගැටලු

10. 2002 වසරේ පැවති මුල් සාකච්ඡා වාර 3 කදී සාකච්ඡා කෙරුණු ප්‍රධාන කරුණු සියල්ල *ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වය 2003* (නීතිය හා සමාජ භාරය, කොළඹ, 2003) "සමාලෝචනය" හි සාරාංශ කොට දක්වා ඇත. සියලුම සාකච්ඡා වල සහ විවිධ උප කමිටු රැස්වීම්වල සාකච්ඡා වුණු කරුණු සවිස්තරාත්මක දැන ගැනීමට නැරඹිය යුතු වෙබ් අඩවිය නම්, http://peaceinsrilanka.com

පිළිබඳ පාර්ශවයන් අතර කථාබහ ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස මෙම උප කමිටුව සංස්ථාපනය කරන ලදී. සිව්වන සාකච්ඡා වාරයේදී, අධිආරක්ෂිත කලාප අයත් නොවන ප්‍රදේශවල වේගවත්ව නැවත ස්ථාපනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට එකඟ වූ අතර, එහිදී එකඟ වූ තවත් කරුණක් වූයේ, "මෙම නැවත ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ දී අවතැන් වූ මුස්ලිම් ජනගහණයේ විශේෂ අවශ්‍යතා නියමිත ලෙස සපුරාලන බව" යන්නයි. තවදුරටත් එහිදී එකඟ වූ කරුණක් වූයේ උතුරු හා නැගෙනහිර නැවත ස්ථාපනය කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සඳහා වූ දීමනා අරමුදල්, උතුරු හා නැගෙනහිර ප්‍රතිසංස්කරණ අරමුදල (NERF) මඟින් පරිපාලනය කිරීමත් එම කටයුතු උතුරු සහ නැගෙනහිර සඳහා හදිසි ප්‍රජා සහ පුනරුත්ථාපන අවශ්‍යතා සඳහා වූ උප කමිටුව (SIHRN) සමඟ එක්වී කිරීමටත්ය. එම උප කමිටුව මෙවැනි කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රධාන තීරණ ගැනීමේ ආයතනය ලෙස කටයුතු කිරීමටත් එකඟ විය.

උතුරු හා නැගෙනහිර ප්‍රතිසංස්කරණ අරමුදලේ (NERF) භාරකරු ලෙස ලෝක බැංකුව කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව (SLMM) විසින් ළමයින් එල්.ටී.ටී.ඊ. හමුදාවට බඳවා ගැනීම සහ මානව හිමිකම් සම්බන්ධව නිකුත් කරන ලද වාර්තාවෙන් පැන නැඟුණු ගැටලුත් සිව්වන සාකච්ඡා වාරයේදී කථාබහට ලක් වූ අතර "අවසාන ප්‍රකාශනයෙහි මානව හිමිකම් ඉතා වැදගත් මූල ධර්මයක් ලෙස අඩංගු වන බව"[11] එහිදී තිබූ තවත් එකඟතාවයක් විය.

පෙබරවාරි මස ජර්මනියේ පැවති පස්වැනි සාකච්ඡා වාරයේදී, ප්‍රජා මානුෂික සහ පුනරුත්ථාපන අවශ්‍යතා පිළිබඳ කථාබහ නැවතත් ප්‍රමුඛස්ථානය ගත්තා ලදී. යාපනය සඳහා වූ වේගවත් නැවත ස්ථාපනය කිරීමේ වැඩසටහන, සැලසුම් කිරීම අතින් නියමිත කාලයටත් වඩා ඉදිරියෙන් සිටි බව වාර්තා වුණු අතර, නැගෙනහිර මුස්ලිම් ජනගහණය තුළ ඔවුන්ගේ ආරක්ෂාව හා ඉඩම් සම්බන්ධයෙන් ඇති වී තිබෙන බිය හා ඒ සම්බන්ධ ගැටලු විසඳීම සඳහා මුස්ලිම් හා එල්.ටී.ටී.ඊ. නියෝජිතයන් සමාන සංඛ්‍යාවකින් සමන්විත වන කමිටු සංස්ථාපනය කරනු ඇත. සාම ක්‍රියාදාමය තුළට නිශ්චිත මානව හිමිකම් රාමුවක් සංයුක්ත කරවීම තුළින් තවදුරටත් ඇතිවූ දියුණුවේ ලකුණු පස්වැනි සාකච්ඡා වාරයේදී දක්නට ලැබිණි. මෙම

---

11. රාජකීය නෝර්වීජියානු රජයේ, විදේශ කටයුතු පිළිබඳ රාජකීය අමාත්‍යංශය විසින් 2003 ජනවාරි 9 වන දින නිකුත් කළ ප්‍රකාශය.

සාකච්ඡාවේදී, සාම ක්‍රියාවලියේදී දෙපාර්ශවයටම මානව හිමිකම් පිළිබඳ උපදේශකවරයා ලෙස කටයුතු කළ ඉයන් මාර්ටින් විසින්, සයවැනි සාකච්ඡා වාරයේදී සාකච්ඡාවට භාජනය කිරීම පිණිස මානව හිමිකම් "මාර්ග සිතියම", සැකසීමට කටයුතු කිරීම පිළිබඳව එකඟ වන ලදී. එම "මාර්ග සිතියමට", සාම ක්‍රියාවලිය තුළදී ක්‍රියාවෙහි යෙදවිය යුතු මානව හිමිකම් ක්‍රියාකාරී කටයුතු සහ වගකීම්: මානව හිමිකම් නිරීක්ෂණය කිරීමට යොදා ගත යුතු ප්‍රබල උපක්‍රම: ප්‍රජා නීතිය හා මානව හිමිකම් සම්බන්ධව රජයේ හා එල්.ටී.ටී.ඊ. යේ නිලධාරීන් පුහුණු කිරීම සහ පොලිස් සහ බන්ධනාගාර නිලධාරීන් පුහුණු කිරීම යනාදිය ඇතුළත් වේ. ඊට අමතරව, මෙම අරගලයේ බලපෑම් වලින් වැඩිපුරම පීඩාවට පත්වූයේ ළමයින් බව දෙපාර්ශවයම විසින් පිළිගත් අතර, තවදුරටත් එල්.ටී.ටී.ඊ.ය විසින් ළමයින් සොල්දාදුවන් ලෙස බඳවා ගැනීම නැවැත්වීමට වගකීම භාරගන්නා ලදී.[12] ප්‍රතිපත්තියක් වශයෙන් 2002 වර්ෂයේ දෙසැම්බර් මස එල්.ටී.ටී.ඊ.ය හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) අතර ඇති වූ එකඟතාවයක් වූ, උතුරු හා නැගෙනහිර යුද්ධයෙන් බලපෑමට ලක්වූ ළමයින් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීම පිළිබඳව ද තවදුරටත් සඳහන් කිරීමක් විය.

මාර්තු මස ජපානයේ පැවති සයවැනි සාකච්ඡා වාරය වන විට උතුරු සහ නැගෙනහිර ආරක්ෂිත තත්ත්වය පිරිහීමට ලක්වී තිබුණු අතර නාවික නෞකාවක් විසින් එල්.ටී.ටී.ඊ. නැවක් මුහුදේ ගිල්වීමේ සිද්ධියට පසුව සාම සාකච්ඡා වලින් ඉවත්වන බවට එල්.ටී.ටී.ඊ.ය තර්ජනය කර තිබුණි. නෞකාව ගිල්වීමේ සිදුවීම වටා සැලකිය යුතු ආකාරයේ මතභේද තිබූ නමුත් සාකච්ඡා ඒ ආකාරයෙන්ම පවත්වාගෙන ගිය අතර, ඉදිරියේදී මෙවැනි සිද්ධීන් වැළැක්වීමේ පියවර පිළිබඳ සාකච්ඡා කරන ලදී. ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම ඒ අතර විය. එක්සත් ශ්‍රී ලංකාවක් තුළ අන්තර් ස්වයං-පාලනයක් ඇති කිරීමේ පදනම මත මෙම අරගලයට අනාගත විසඳුමක් ලබා දිය හැකි ෆෙඩරල් ප්‍රතිපත්තීන් පිළිබඳවද සාකච්ඡා සිදුකළ අතර, "එක්සත්, ෆෙඩරල් ශ්‍රී ලංකාවක් තුළ අන්තර් ස්වයංපාලනයක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාවලියට පදනම සකස් කිරීම පිණිස"[13] අවශ්‍යය, ෆෙඩරල් පාලනයන් සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමට හා පුළුල්ව ව්‍යාප්ත වුණු උපදෙස් ලබා ගැනීමේ සාකච්ඡාවල නිරත

---

12. *ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වය, 2003* ප්‍රකාශනයේ "සමාලෝචනය" බලන්න. (නීතිය හා සමාජ භාරය, කොළඹ, 2003).
13. විදේශ කටයුතු පිළිබඳ රාජකීය නෝර්වීජියානු අමාත්‍යංශය විසින් 2003 මාර්තු මස 21 වෙනි දින නිකුත් කළ මාධ්‍ය ප්‍රකාශය.

වීම පිණිස දේශපාලන කටයුතු පිළිබඳ කමිටුවක් නිර්මාණය කළ බව, එල්.ටී.ටී.ඊ.ය විසින් ප්‍රකාශ කරන ලදී. එල්.ටී.ටී.ඊ. ය සහ නැගෙනහිර මුස්ලිම් නියෝජිතයින් සමඟ සාකච්ඡාවන් පැවැත්වීම පිළිබඳව නැවතත් කථාබහ කළ අතර, මානව හිමිකම් සඳහා වූ මාර්ග සිතියමේ කරුණු 3 ක් තවදුරටත් වර්ධනය කරන ලෙස මානව හිමිකම් උපදේශක ඉයන් මාර්ටින් ගෙන් ඉල්ලා සිටින ලදී. එම කරුණු 3 නම්: අවසාන ව්‍යවස්ථාමය වැඩපිළිවෙළක් තුළට මානව හිමිකම් නිශ්චිතව ඇතුළත් කරන තුරු දෙපාර්ශවයටම පිළිගත හැකි මානව හිමිකම් හා ප්‍රජා මානුෂික ප්‍රතිපත්තීන් සහිත ප්‍රඥප්තියක් කෙටුම්පත් කිරීම; මානව හිමිකම් පිළිබඳ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම; සහ මානව හිමිකම් කොමිසමේ නිරීක්ෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කළ හැකි ආකාරයන් පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම. 2003 වසරේ පැවති අවසාන සාකච්ඡාව මෙය වූයේ ඊට පසු මාසයේ දී එල්.ටී.ටී.ඊ. ය විසින් සාම ක්‍රියාවලියෙන් "ස්වකීය සහභාගීත්වය තාවකාලිකව අත්හිටුවීම" නිසාය.

සාම සාකච්ඡා වලින් ඉවත් වීමට ඔවුන් ගත් තීරණය දන්වමින්, එල්.ටී.ටී.ඊ. ය විසින් පුන පුනා කියා සිටියේ "ජාතිවාදී ගැටළුවට සාකච්ඡාමය දේශපාලන විසඳුමක් සෙවීමට ඔවුන් අඛණ්ඩව බැඳී සිටින බවයි." තවද එම වර්ෂයේ ඉතිරි කාලයෙන් සෑම අවස්ථාවකදීම වාගේ සටන් විරාමය ක්‍රියාත්මකව පැවතිණි. ඔවුන්ගේ ප්‍රකාශයට අනුව එල්.ටී.ටී.ඊ. හි තීරණය පදනම් වී ඇත්තේ ප්‍රධානම, එකිනෙකට සම්බන්ධ වූ කරුණු දෙකක් මතයි. එනම්: 2003 වර්ෂයේ අප්‍රේල් මස වොෂින්ටන් නගරයේ පැවති ආධාර දෙන රටවල්වල සමුළුවෙන් එල්.ටී.ටී.ඊ. ය ඉවත් කිරීම සහ විශේෂයෙන්ම අවතැන් වූ පුද්ගලයින් ශීඝ්‍රයෙන් නැවත ස්ථාපනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම ඇතුළත්ව උතුරු සහ නැගෙනහිර "සාමාන්‍ය තත්ත්වය නැවත ඇති කිරීම" උදෙසා වූ සටන් විරාම ගිවිසුමේ සමහර කරුණු ක්‍රියාවෙහි යෙදවීම රජය විසින් එළිපිටම පැහැර හැරීම අනෙකුත් කරුණ විය. සාම සාකච්ඡා ක්‍රියාවලියේදී මේ වනතුරුම මෙම අරගලයට යොදගත හැකි දේශපාලන විසඳුම් කිසිවක් සවිස්තරාත්මකව සාකච්ඡා වී නැත: (අනාගත විසඳුමක් සඳහා පදනම ලෙස ෆෙඩරල් ප්‍රතිපත්තීන් යොදගත යුතුය යන එකඟතාවය හැරෙන්නට) මහත් සේ විවාදශීලී වූ ගැටලු රාශියක් ඉදිරිපත් කළ යුතුව පැවතේ. නමුත් ඒ වෙනුවට විශේෂ අවධාරණය යොමු වූයේ යුද්ධයෙන් පීඩා විඳි උතුරු නැගෙනහිර ජනතාවට "සාමාන්‍ය තත්ත්වය නැවත ඇති කරලීම" සඳහා වූ උත්සාහයන් වෙතයි. මෙසේ, එල්.ටී.ටී.ඊ. හි මතය වූයේ, සාකච්ඡා මාර්ගයෙන් නැතැයි කියා කිව නොහැකි ආකාරයේ දියුණුවක් ඇති කරගෙන තිබෙන නමුත්, රජය විසින් "සටන් විරාම ගිවිසුමේ සාමාන්‍ය තත්ත්වය නැවත ඇති කිරීම සඳහා වූ ඇතැම් කරුණු ක්‍රියාවෙහි යෙදවීම

ප්‍රතික්ෂේප කිරීම" නිසා, සාම ක්‍රියාවලිය මගින් උතුරු හා නැගෙනහිර දෙමළ ජනතාවගේ, විශේෂයෙන්ම අවතැන් වූවන්ගේ වේදනාව අඩු කිරීමක් සිදු නොවන බවට හැඟීමක් ඇති කර තිබේ. එල්.ටී.ටී.ඊ. හි මතය අනුව, රජයේ දූෂ්පත්කම මර්දනය කිරීමේ ප්‍රතිපත්තීන් මගින් දශක ගණනාවක යුද්ධයෙහි ප්‍රතිඵලයක් ලෙස උතුරු හා නැගෙනහිර දනට පවත්නා විශේෂිත වූ තත්ත්වයන්ට සැලකීමක් කිරීමට රජය අසමත් වූ අතර, ඒ වෙනුවට මුළු රටම එකම, වෙනස්කම් වලින් තොරවූ රාමුවක් තුළට ගෙන සැලකීම ද සිදුවිය.

## 4. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සිදුවූ සංවර්ධනයන්

2002 වර්ෂයේ අගභාගයේ දී ප්‍රතිපත්තියක් වශයෙන් එකඟ වූ පරිදි, යුද්ධයෙන් පීඩාවට පත් ළමයින්ගේ අවශ්‍යතා සොයා බැලීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් වර්ධනය කිරීම සඳහා 2003 වර්ෂයේ අප්‍රේල් මස කිලිනොච්චියේ දී යුනිසෙෆ් (UNICEF) ආයතනය මගින් සංවිධානය කරන ලද වැඩමුළුවට එල්.ටී.ටී.ඊ.ය, ශ්‍රී ලංකා රජයේ සහ දේශීය මෙන්ම අන්තර්ජාතික සංවිධාන වලද නියෝජිතවරු සහභාගී වූහ. මෙම ක්‍රියාකාරී සැලැස්ම මගින් පහත කරුණු සියල්ල ආවරණය විය. එල්.ටී.ටී.ඊ.ය, රජයේ හමුදා සහ ජන සමූහ වෙත ළමා අයිතිවාසිකම් පිළිබඳ පුහුණුවීම් පැවැත්වීම: උතුරු සහ නැගෙනහිර යුද්ධය නිසා බලපෑමට ලක්වූ ළමා අයිතිවාසිකම් නිරීක්ෂණය කිරීමට යුනිසෙෆ් (UNICEF) ආයතනයේ පරිපාලනය යටතේ වූ උපාය මාර්ගයක් යොදගැනීම: ළමා සොල්දදුවන් නිදහස් කිරීමට සහ නැවත සමාජයට ඇතුළත් කර ගැනීම සඳහා දෙමළ පුනරුත්ථාපන සංවිධානය හා යුනිසෙෆ් (UNICEF) ආයතනය මගින් පවත්වාගෙන යා යුතු හුවමාරු මධ්‍යස්ථාන ඇති කිරීම: සුළු ණය පහසුකම් සහ ආදයම් උපදවන ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම: වෘත්තීය පුහුණු වීම් ලබා දීම: අවිධිමත් අධ්‍යාපනය හා සාක්ෂරතාවය ලබා දීම: සෞඛ්‍ය ආරක්ෂාව සහ පෝෂණ සේවාවන් මෙන්ම මනෝ-සාමාජීය සුරක්ෂාව ද සැපයීම. එහිදී, ක්‍රියාකාරී කමිටුවක් මගින් මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක වන ආකාරය නිරීක්ෂණය කිරීමටත්, එහි දියුණුව පිළිබඳ නවතම තොරතුරු හදිසි ප්‍රජා සහ පුනරුත්ථාපන කටයුතු සඳහා වූ උප කමිටුවට[14] දන්වීමටත් එකඟවන ලදී.

14. "ළමයින් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මකට රජය හා එල්.ටී.ටී.ඊ. ය එකඟ වෙයි." යුනිසෙෆ් (UNICEF) ආයතනයේ 2003 අප්‍රේල් 11 වන දිනැති ප්‍රවෘත්ති වාර්තාව, වෙබ් අඩවි ප්‍රවේශය: http://www.unicef.org/media/media-7159.html

ඔක්තෝබර් මස මුල් කාලයේ දී නිදහස් කළ ළමා සොල්දදුවන් වෙනුවෙන් වූ ප්‍රථම හුවමාරු මධ්‍යස්ථානය කිලිනොච්චියේ දී විවෘත කළ අතර, තවත් හුවමාරු මධ්‍යස්ථාන දෙකක් මඩකලපුවේ හා ත්‍රිකුණාමලයේ ආරම්භ කිරීමට සැලසුම් සකස් කර තිබුණි. කිලිනොච්චියේ හුවමාරු මධ්‍යස්ථානය ආරම්භ කළ විටම හිටපු ළමා සොල්දදුවන් 49 දෙනෙකු භාරගත් අතර, එයින් 27 ගැහැණු ළමයින් විය. මෙම මධ්‍යස්ථාන වල ළමයින්ට මාස 3 ක් දක්වා රැඳී සිටිය හැකි අතර, ඔවුන් නැවත පවුල් වෙත භාරදීමෙන් අනතුරුව ළමයින් සුරක්ෂිත කිරීමේ සමාජ සේවකයින්[15] විසින් ඔවුන්ගේ අභිවෘද්ධිය නිරීක්ෂණය කරනු ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති පරිදිම, මෙවැනි ආකාරයේ සංවර්ධනයන් පැවතියත් එල්.ටී.ටී.ඊ.ය විසින් ළමයින් සොල්දදුවන් ලෙස බඳවා ගැනීමේ තත්ත්වය මුළු වසර පුරාම ඉතා දැඩි අවධානයකට, ලක්වී පැවතිණි. එල්.ටී.ටී.ඊ. ය විසින් විරුද්ධත්වය දක්වමින් කෙතරම් ප්‍රකාශ කර තිබුණත්, තවමත් එල්.ටී.ටී.ඊ. ය විසින් ළමයින් සොල්දදුවන් ලෙස බඳවා ගැනීම සිදුකරන බවට තිබූ වාර්තාවන් හා මෙම හුවමාරු මධ්‍යස්ථානවල පරිපාලනය සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් ඇති වී තිබුණි. ඇත්ත වශයෙන්ම, ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ වාර්තාවන්ට අනුව, ප්‍රථම හුවමාරු මධ්‍යස්ථානය විවෘත කළ දිනට පසුදින "එල්.ටී.ටී.ඊ. ය විසින් බලාත්කාරයෙන් ළමයින් 23 දෙනෙකු සොල්දදුවන් ලෙස බඳවා ගත් බවට වාර්තාවන් තිබුණි."[16] වසරේ අගභාගයේදීත් ළමයින් සොල්දදුවන් ලෙස බඳවා ගත් බවට වාර්තා අඛණ්ඩව පළ වුවත්, ඒවා ඉතා අඩු වශයෙන් කළ බඳවා ගැනීම් විය. යුනිසෙෆ් (UNICEF) වාර්තාවන්ට අනුව, එල්.ටී.ටී.ඊ.ය සමඟ සිටි ළමයින් 1,155 න් 385 දෙනෙකු නිදහස් කර තිබුණි.[17]

පොදුවේ ගත් කල, ළමා අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය යටතේ ළමා අයිතිවාසිකම් වලට අදළ සංවර්ධනයන් සහ වෙනත් සැලකිල්ල දක්විය යුතු විෂය කාරණා පරාසයක් සාකච්ඡාවට බඳුන් වේ. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ රජය විසින් නිකුත් කළ දෙවන කාලීන වාර්තාවේ සඳහන් වූ කරුණු සම්බන්ධයෙන් ළමා අයිතිවාසිකම් සඳහා වූ

---

15. "යුනිසෙෆ් (UNICEF) ආයතනය විසින් නිදහස් කළ ළමා සොල්දදුවන් සඳහා හුවමාරු මධ්‍යස්ථානයක් අරඹයි," 2003 ඔක්තෝබර් 6 වැනි දිනැති ප්‍රවෘත්ති වාර්තාව, වෙබ් අඩවි ප්‍රවේශය, http://www.unicef.org.uk/press/newsdetail/.asp?news id=185
16. "ශ්‍රී ලංකාව", ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ වාර්තාව 2004, වෙබ් අඩවි ප්‍රවේශය, http://web.amnesty.org/report 2004/lka-summary-eng
17. එම.

එක්සත් ජාතීන්ගේ කමිටුව මගින් සිදුකළ විවේචනය නිසා ශ්‍රී ලංකාවේ ළමයින් සම්බන්ධව පවතින නීතිය නැවත විචාරණයට ලක් කිරීමටත්, එම නීති ජාත්‍යන්තර නියමයන්ට අනුරූපීදැයි සලකා බැලීමටත් අවස්ථාවක් සැපයිණි. අපරාධ හා සිවිල් නීතියට සම්බන්ධව පැන නගින ගැටලු හා අධිකරණ ක්‍රමය විසින් ළමයින්ට සලකන ආකාරය පිළිබඳව ළමා අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ සාරාංශකරණය කර ඇති අතර එහිදී, ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව විසින් ඉහත කරුණු වලට අදාළව කළ යුතු ප්‍රතිසංස්කරණ සම්බන්ධ වැදගත් යෝජනාවන් ද දක්නට හැක. මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ අඛණ්ඩව පැතිරී පවතින ළමයින් කම්කරුවන් සේ යොදා ගැනීම පිළිබඳවත් මෙම පරිච්ඡේදයේ සැලකිල්ල යොමු වන අතර, ළමයින් වෙළඳම හා අන්තර්ජාලය හරහා ළමයින් සමඟ කාම ක්‍රියාවන්හි යෙදෙන්නන් විසින් සිදුවන ළමයින් ලිංගික සූරා කෑමට ලක්වීම යන කරුණු දෙකම වැළැක්වීම අරමුණු කරගනිමින් සිදුකරන සංවර්ධනයන් පිළිබඳව ද එහිදී සාකච්ඡා කෙරේ.

## 5. අපරාධ, මානව හිමිකම් සහ දඬුවමින් හෝ හානියෙන් බේරී සිටීමේ නිදහස

මෙම වාර්තාවෙහි අපරාධ ක්‍රියාකාරකම් වල පැති 2ක් පිළිබඳව සාකච්ඡා කෙරේ. නීති විරෝධී සංක්‍රමණය හා මුදල් විශෝධනය පිළිබඳව සාකච්ඡාවක් පරිච්ඡේදයට ඇතුළත් කර ඇත්තේ, මෙම සංසිද්ධියට විරුද්ධව සටන් කිරීම සඳහා ව්‍යවස්ථා කෙටුම්පත් සූදනම් කරමින් පැවති වකවානුවකදී ය. මෙම පරිච්ඡේදයේ දී මුදල් විශෝධනයේ විවිධ ක්‍රම සහ ඒවායේ බලපෑම මෙන්ම ඒවාට විරුද්ධව සටන් කළ හැකි ක්‍රම පිළිබඳවත් සාකච්ඡා කෙරේ. මුදල් විශෝධනය රටක මූල්‍ය අවංකත්වයට තර්ජනයක් වන අතර, සෑම දෙනාටම නීතියේ සමානාත්මතාවය හිමිවේ යන න්‍යාය පවා ප්‍රතික්ෂේප කරයි. එමගින් රටක මූල්‍ය ක්‍රමය වෙත දක්වන බලපෑම නිසා රටක් සතුව සංවර්ධනය වීමට ඇති හැකියාව දුර්වල කරවයි.

*ශ්‍රී ලංකාව: මානව හිමිකම් තත්ත්වයේ* පෙර වාර්තා රාශියකම, ශ්‍රී ලංකාවේ සංක්‍රමණික කම්කරුවන්ගේ අයිතීන් සාකච්ඡා කර තිබුණත්, නීති විරෝධී සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳව මීට පෙර සාකච්ඡා කර නොමැත. මෙම වාර්තාවෙහි, ශ්‍රී ලංකාව වෙතින් හා තුළ, වැඩිපුරම පැතිර පවත්නා නීති විරෝධී සංක්‍රමණික ක්‍රම දෙක වූ මිනිසුන් හොරෙන් පිටරට ගෙනයාම සහ විකිණීම යන සීමාව ඉක්මවූ ගැටලු පිළිබඳව නීති විරෝධී සංක්‍රමණිකයන් පිළිබඳ පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ. මෙම සංසිද්ධිය ශ්‍රී ලාංකීය හා

ජාත්‍යන්තර නීතීන්ට අනුකූලව නිර්වචනය හා සාකච්ඡා කොට, මානව හිමිකම් රාමුවක් තුළට ඇතුළත් කර ඇත. මිනිසුන් හොරෙන් පිටරට ගෙනයාම සහ පුද්ගලයින් වශයෙන් මිනිසුන් විකිණීම (මානව තිරුරහෝනය සහ පුද්ගල වෙළඳාම), රටක් විසින් නිරාකරණය කිරීම වැදගත් වූ ජාත්‍යන්තර පරිමාණයකින් යුත් අපරාධ ක්‍රියා වන අතර, මෙම පරිච්ඡේදයේ අවධාරණය ප්‍රබල ලෙස යොමුකර ඇත්තේ, මෙම අපරාධවල ප්‍රජා මානුෂික හා මානව හිමිකම් පැතිකඩ වෙතට සහ මෙවැනි සංක්‍රමණිකයන්ට හිමිවන මානව හිමිකම් වල ආරක්ෂාව වර්ධනය කරන්නේ කෙසේද යන කාරණාවටයි. පරිච්ඡේදයේ අවසාන වශයෙන් කර්තෘ තර්ක කරන්නේ, මානව හිමිකම් වර්ධනය කිරීම සඳහා බලය ලබා දෙන ලියවිලි වශයෙන් ජාත්‍යන්තරව නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රම වේදය යොදා ගැනීමට හැකි බවයි. එනම් ජාතීන් අතර සංවිධානාත්මක අපරාධ වලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ මිනිසුන් විකිණීම හා හොරෙන් ගෙන යාම පිළිබඳ වූ ගිවිසුමයි.

වෙනත් මානව හිමිකම් කඩකිරීම් මෙන්ම ඉහත සඳහන් පරිච්ඡේද දෙකෙන්ම සාකච්ඡාවන, පැතිරී පවත්නා වූ අපරාධ වලට සම්බන්ධිත මූලිකාංගයක් වනුයේ නිලධාරී මට්ටමෙන් සිදුවන දූෂණය වන අතර එයට පොලිසිය දේශපාලනීකරණය වීම සහ එමඟින් සිදුවන දූෂණ ක්‍රියා ද ඇතුළත් වේ. 2002 වර්ෂයේ නොවැම්බර් මස ජාතික පොලිස් කොමිසම පිහිටුවීම මඟින් පොලිස් පරිපාලනයේ සැලකිය යුතු ප්‍රතිසංස්කරණයක් ක්‍රියාත්මක විණි. ස්වාධීන පොලිස් කොමිසමක් පිහිටුවීමේ දීර්ඝ කාලීන අවශ්‍යතාවයක් පැවති අතර, ජාතික පොලිස් කොමිසම පිළිබඳ පරිච්ඡේදයෙන් එය පිහිටුවීමට හේතු වූ පසුබිම, එහි බලයන් සහ එය ක්‍රියාත්මක වුණු පළමු වසර තුළදී සපුරාලූ කාර්යභාරයන් පිළිබඳව සාකච්ඡා කෙරේ. ජාතික පොලිස් කොමිසම, තවදුරටත් ප්‍රබල කිරීමට සහ ස්වාධීන කිරීමට අවශ්‍ය යෝජනා මාලාවකින්, එම පරිච්ඡේදය අවසන් වේ.

ජාතික පොලිස් කොමිසම මුලින්ම ගත් පියවරක් වූයේ, කාලාන්තරයක් තිස්සේ පවත්නා වූ දූෂණකාරී ගැටලුවක් වූ පොලිසියේ දේශපාලන මාරු කිරීම් පිළිබඳ ගැටලුව නිරාකරණය කිරීමට ආරම්භ කිරීමයි. අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමතිවරයාගේ මඟ පෙන්වීම යටතේ පොලිස් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබූ පොලිසියේ සහායක අධ්‍යක්ෂකවරුන් සහ ස්ථාන භාර නිලධාරීන් 60 දෙනෙකුගේ මාරු කිරීමේ නියෝග, 2002 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී කොමිසම විසින් ප්‍රතික්ෂේප කරන ලදී. පොලිසියේ වගකීම නිවැරදිව ඉෂ්ට කිරීමෙහි ලා පොලිස් කොමිසම විසින් සිදු කළහැකි බලපෑම මැනීමට වසරකට වඩා වැඩි කාලයක් ගත වනු ඇත. පොලිසිය තුළ මුල් බැසගත් ගැටලුවක් වී ඇති පොලිසියේ දේශපාලන සංස්කෘතිය

සහ පොලිස් සේවය දූෂණකාරී යන මහජන හැඟීම වෙනස් කිරීමට පොලිස් කොමිසමට හැකි වෙතොත්, එවිට අනිවාර්යයෙන්ම, ශ්‍රී ලංකාවේ මානව හිමිකම්වල සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමට එයට සිදුවනු ඇත.

ඉතා කුඩා සංඛ්‍යාවකට නඩු පවරා තිබුණත්, මානව හිමිකම් කඩ කිරීමේ වරද සඳහා දඬුවමින් බේරී සිටීමේ නිදහස, ශ්‍රී ලංකාවේ බරපතල ගැටලුවක් බවට පත් වී තිබේ. 2000 වර්ෂයේ ඔක්තෝබර් මස බිඳුණුවැව "පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ" රැඳවියන්ව සිටි දෙමළ පුද්ගලයින් සහ ළමයින් 27 දෙනෙකු මරා දැමීම සම්බන්ධයෙන් 2003 වර්ෂයේ ජූලි මස පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඇතුළු පුද්ගලයින් පස් දෙනෙකු වරදකරුවන් කරන ලදී. බිඳුණුවැව සමූල ඝාතන සිද්ධියත් ඒ හා සමඟම එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ජාතික මෙන්ම ජාත්‍යන්තර විරෝධයත් හේතුවෙන්, මෙම සිද්ධිය සම්බන්ධව විමර්ශන මාලාවක් පවත්වන බවට රජය විසින් ප්‍රකාශ නිකුත් කරන ලදී. මේ පිළිබඳව කරුණු විභාග කිරීමේ කොමිසමක් පිහිටුවන ලද අතර, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේන්තුව විසින් වෙන වෙනම ඔවුන්ගේ විමර්ශන කටයුතු පවත්වන ලදී. 2002 වර්ෂයේ මාර්තු 25 වන දින සැකකරුවන් 41 දෙනෙකුට විරුද්ධව අධිචෝදනා නඟන ලද අතර එයින් 10 ක්ම පාහේ පොලිස් නිලධාරීන් විය. ජූලි මස 1 වන දින පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව සැකකරුවන් 5 දෙනෙකු වරදකරුවන් කර ඔවුන්ට මරණීය දණ්ඩනය නියම කරන ලදී. වසර අවසාන කාලය වන විට මෙම වරදකරුවන් අභියාචන ඉදිරිපත් කර තිබුණි.

මෙම දඬුවම් නියම කිරීම පිළිබඳව දක්වූ ප්‍රතිචාර දෙයාකාර විය. සමහරු එය යුක්තිය ඉෂ්ට කිරීමක් ලෙස පිළිගන්නා ලද අතර, තවත් සමහරු එය පිළිබඳ වික්ෂිප්තභාවය පළ කළහ. මහාධිකරණයේ පැවැත්වූ බිඳුණුවැව නඩු විභාගය අවසානයේ දී මානව හිමිකම්වල අනාගතය පිළිබඳ තීර්ණායක කරුණු වූ ශ්‍රී ලංකාවේ යුක්තිය හා දඬුවමින් බේරී සිටීමේ නිදහසෙහි ස්වභාවය පිළිබඳ කල්පනා කර බැලීම සඳහා වැදගත් ඉඩ ප්‍රස්ථාවක් සපයා දෙයි. කතුවරයා විමර්ශන කාර්යපටිපාටිය, සාක්ෂි සහ ඒවායේ නොපැහැදිලිතා පිළිබඳ ප්‍රකාශයටපත් සහ ප්‍රකාශයටපත් නොකළ තොරතුරු සහ සම්මුඛ සාකච්ඡා සවිස්තරාත්මක නිරීක්ෂණයකට ලක් කිරීම මඟින් සිද්ධිමය ගැටලු, නීතිමය ගැටලු, කාර්ය පටිපාටිය සහ සාධාරණත්වය යන කරුණු පිළිබඳ වැදගත් ප්‍රශ්න මාලාවක් නඟයි.

"මෙම නඩු තීන්දුවේ ඇති ප්‍රධානතම නොපැහැදිලිතාවය සහ ලබාදුන් දඬුවම් වල බරපතල ස්වභාවය මෙන්ම තීන්දුව එමගින්ම අසාධාරණ යැයි පුළුල්ව පැවති හැඟීම මගින්, පවතින සියලුම සාක්ෂිවල සම්පූර්ණ සහ නිවැරදි එළි දැක්වීමක් සහතික කිරීම සඳහා අවශ්‍ය විමර්ශනාත්මක, අධිකරණමය හෝ සිවිල් සාමාජීය උපක්‍රම නොමැතිව මානව හිමිකම් කඩ කිරීම සම්බන්ධව නඩු පැවරීමට ඉල්ලා සිටීම තුළ ඇති දේශපාලන අවදානම පෙන්නුම් කරයි" යනුවෙන් ඔහු පරිච්ඡේදය අවසන් කර ඇත.

ඔහු තවදුරටත් තර්ක කර සිටින්නේ,

". . . මේ [නඩුව] මගින් දඬුවමින් බේරී සිටීමේ නිදහස පිළිබඳ දෙන අපැහැදිලි අදහස - එනම් දේශපාලන හේතූන් මත ඇතැම් පුද්ගලයින් මේ සඳහා වගකීමෙන් බැඳ තැබිය යුතු නමුත් වෙනත් ආකාරයක වූ දේශපාලන හේතූන් මත මෙම වගකීමෙන් බැදෙන පුද්ගලයින් එම සිද්ධියට සම්බන්ධ ඉහළ පෙළේ අය නොවීම- ජන වර්ග අතර යුක්තිය පිළිබඳ වූ යම් ආකාරයක හෝ යහපත් පණිවිඩයක් ලබා දීම යටපත් කරයි. බිඳුණුවැව නඩුවෙන් ඔප්පුවන යම් දෙයක් ඇත්නම් ඒ හුදෙක් නඩු විභාගයක් පැවැත්විය යුතුය යන අරමුණින් නඩු විභාගයක් පැවැත්වීම නොසෑහෙන බව පමණක් නොව එය අනතුරුදායක ද විය හැකි බවයි."

බරපතල මානව හිමිකම් කඩකිරීම් වලදී ප්‍රමාණවත් සාක්ෂි ඇත්නම් ක්‍රියාමාර්ගයක් ලෙස විමර්ශනය කිරීමේ සහ පැමිණිලි කිරීමේ කොමිසමක් කැඳවීම අවශ්‍ය යැයි සිතන දේශීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් ක්‍රියාකාරකයින් තුළ මෙම පරිච්ඡේදය අපහසුකාරී හැඟීම් ඇති කරනු ඇත. කතුවරයා තර්ක කරන ආකාරයට එවැනි ක්‍රියා මාර්ගයක් සඵල වීමට නම් යම් යම් අවශ්‍යතා සම්පූර්ණ වී තිබිය යුතුයි.

"ඇත්තෙන්ම, බිඳුණුවැව නඩුව ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර සිවිල් සමාජය තුළ අඛණ්ඩව පවතින දුර්වලතාවය විශේෂිතවම පෙන්නුම් කරයි: බිඳුණුවැව වැනි නඩු සම්බන්ධව අඛණ්ඩව හා ප්‍රබලව සොයා බැලිය හැකි ක්‍රමෝපායන් ඇති කිරීම අවශ්‍යයය. සාධාරණ හේතු ඥහිත අවස්ථාවක මූලික සාමාජීය විරෝධතා මගින් ස්වාධීන කොමිසමේ ද පූර්ණ පරීක්ෂණ හා නඩු විභාගයන් පැවැත්වීමට ඉල්ලා සිටී. එහෙත්, මාධ්‍ය, දේශපාලන පක්ෂ, සිවිල් සාමාජීය සංවිධාන හෝ "ජාත්‍යන්තර ප්‍රජාව" විසින් මෙම නඩුවේ පූර්ණ හෙළිදරව් කිරීමකට සහ මෙම නඩුව නිවැරදිව පවත්වාගෙන යන බව, නිවැරදි තොරතුරු ඔස්සේ

විමර්ශන කටයුතු සිදුකරන බව, නිවැරදි පුද්ගලයින්ට අධිචෝදනා ඉදිරිපත් කරන බව, සියලුම සාක්ෂි ඉදිරිපත් වන බව සහ හිංසනයට භාජනය වූ තැනැත්තන්ට ගෞරවයෙන් සැලකීම සිදුවන බව යනාදිය සහතික කිරීමට අවශ්‍ය බලපෑම පවත්වාගෙන යාම සඳහා කිසිදු සාමූහික ප්‍රයත්නයක් නොදක්වන ලදී."

කිසිදු සැකයකින් තොරව, සමාජයේ අවධානයට ලක්වූ වෙනත් වැදගත් නඩු සම්බන්ධයෙන්ද මෙම කරුණුම ප්‍රකාශ කළ හැක.

## 6. නව නීති හා වෙනත් මානව හිමිකම් ගැටලු

බුද්ධිමය දේපල හිමිකම් වල දියුණුව නිසා පැන නගින විවිධාකාර වූ මානව හිමිකම් ගැටලු පිළිබඳව සංක්ෂිප්ත සාකච්ඡාවක් සපයමින් බුද්ධිමය දේපල හිමිකම් පිළිබඳ පරිච්ඡේදය මානව හිමිකම් රාමුවක් තුළ මෙම ගැටලුව ස්ථිරවම ස්ථාපනය කරයි. මෙම පරිච්ඡේදය විශේෂයෙන් දියුණු වෙමින් පවතින රටවල විවිධ සමාජ ආර්ථික අයිතීන් මත බුද්ධිමය දේපල හිමිකම් වලින් සිදුවන බලපෑම සහ ලංකාවේ බුද්ධිමය දේපල අධිකාරිය පිළිබඳ අවධානය යොමු කරයි. විශේෂම අවධානය යොමු වී ඇත්තේ, ඖෂධ සමාගම් වලට බුද්ධිමය දේපල හිමිකම් ලෙස ඖෂධ සඳහා වූ පේටන්ට් බලපත්‍ර මගින් ලැබී ඇති අයිතිය නිසා සෞඛ්‍ය අයිතීන් සම්බන්ධව සිදුවන බලපෑම; මුද්‍රිත හා විද්‍යුත් තොරතුරුවල ප්‍රකාශන අයිතීන් ලබා ගැනීමට සිදු කරන හිමිකම් පෑම් සහ අධ්‍යාපනය හා සංවර්ධනය සඳහා ඇති අයිතිවාසිකම් අතර ඇති ගැටුම; සාගින්නෙන් තොරව සිටීම සඳහා ඇති අයිතිය මත ජෛව තාක්ෂණය සඳහා වූ පේටන්ට් බලපත්‍ර වලින් ඇති බලපෑම; යනාදියටයි. කතුවරයා තර්ක කරන ආකාරයට බුද්ධිමය දේපල නීතිය ඕනෑම රටක අත්‍යවශ්‍ය නෛතික ප්‍රතිපාදනයක් වන අතර, "අභියෝගාත්මක කාර්යය වන්නේ මෙම නීති මගින් අවදානමට ලක්වන මානව හිමිකම් සමඟ අඩුම තරමින් මූලික මට්ටමේ එකඟතාවයක්වත් තිබීම සහතික කිරීමයි". ඇය තර්ක කරන ආකාරයට මෙම කාර්යය සාක්ෂාත් කර ගත හැක්කේ එම නීතිවල ප්‍රබලත්වය අඩු කරන ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වී ඇති සාමාජීය, ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම් වැනි රජයන් මත වගකීම් පනවන මූලික සම්මුතීන් වල පිහිට ලබා ගැනීම මගිනි.

මෙම වාර්තාවේ වෙනත් කිසිම ස්ථානයක සාකච්ඡා නොකෙරෙන[18] පුරවැසිභාවය පිළිබඳ වැදගත් නෛතික වර්ධනයක් වන්නේ, ඉන්දියානු සම්භවය ඇති 1964 ඔක්තෝබර් 30 වන දින සිට ලංකාවේ ස්ථිර පදිංචිකරුවකුව සිටි හෝ එවැනි පුද්ගලයෙකුගෙන් පැවත එන පුද්ගලයින්ට ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබා ගැනීමේ අයිතිවාසිකම හිමිවීමයි. ඉන්දියානු සම්භවයක් ඇති දමිළ ජනතාව අතර කාලාන්තරයක් තිස්සේ පවතින ගැටලුවක් වූ ආණ්ඩුවක් නොමැතිකම අවසන් කිරීමට මෙම නෛතික ප්‍රතිපාදනය සහය වනු ඇත. 2003 අංක 16 දරණ පුරවැසිභාවය (සංශෝධන) පනත මගින් පුරවැසිභාවය පිළිබඳ නීතියට තවදුරටත් සිදුකරන ලද සංශෝධන මගින් ශ්‍රී ලාංකික පුරවැසිභාවය හිමි මව්වරුන්ට තම දරුවන් වෙත තමාගේ පුරවැසිභාවය උරුම කර දීමේ හැකියාව හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලාංකීය පුරවැසිභාවය උරුම කර දිය හැක්කේ පියාට පමණක්ය යන පෙර පැවති, පනත වෙනස්කොට සැලකීමේ ප්‍රතිපාදනය මෙම සංශෝධන පනත මගින් ඉවත් කොට තිබේ. මෙම සංශෝධන පනත අතීතයට බලපාන පරිදි බලාත්මක වේ.

පුරවැසිභාවය පිළිබඳ නීතියට සිදුකරන ලද සංශෝධන මානව හිමිකම් දෘෂ්ටි කෝණයෙන් යහපත් වූවත්, කම්කරු අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති පරිදි 2003 වර්ෂයේ කම්කරු අයිතිවාසිකම් පිළිබඳ පැනවූ නෛතික ප්‍රතිපාදන ඉතාමත් අහිතකර ප්‍රතිපාදන වේ. 2003 අංක 11 දරණ කම්කරු ආරාවුල් (සංශෝධන) පනත 2003 අංක 12 දරණ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත සහ 2003 අංක 13 දරණ කම්කරු ආරාවුල් (විමසීමේ සහ තීන්දු කිරීමේ කාර්ය පටිපාටිය) (විශේෂ විධිවිධාන) පනත යන පනත් අන්තර්ජාතික මූල්‍ය ආයතනවල යෝජනා ප්‍රකාරව හඳුන්වා දී ඇති අතර එම සංශෝධන අතරින් කම්කරුවන්ගේ අයිතිවාසිකම් සහ රැකියාවේ සුරක්ෂිතභාවය පිළිබඳ අයිතීන් සෝදා පාළුවට ලක්කරන සංශෝධන ක්‍රියාත්මක කිරීමට පැහැදිලිවම බලාපොරොත්තු වෙයි. මෙම පසුබිමට පරස්පර වූවත්, නිදහස් වෙළඳ කලාප තුළ සාමූහික රැස්වීමේ නිදහස සම්බන්ධව සිදුවූ යහපත් වර්ධනයන් ද මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

---

18. 2003 අංක 35 දරණ, ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයින්ට පුරවැසිභාවය ලබාදීමේ පනත.

## 7. අන්තර්ජාතික වර්ධනයන්

2003 වසරේ මැයි මස, ශ්‍රී ලංකා රජය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 44 වන වගන්තියට අනුකූලව සිය දෙවන කාලීන වාර්තාව ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව කල් ඉකුත් වී තිබූ අතර එමගින් 1994 සිට 1998 දක්වා වූ කාලය ආවරණය විය. එහෙත්, සාකච්ඡා සිදුවන අවස්ථාවේදී මේ පිළිබඳව නවතම තොරතුරු සැපයීමට ශ්‍රී ලාංකීය දූත මණ්ඩලය ඉදිරිපත් වූහ. මෙම කමිටුවේ තීරණය ළමා අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ සවිස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

සංක්‍රමණික කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ වූ අන්තර්ජාතික ප්‍රඥප්තිය 2003 වර්ෂයේ ජූලි 01 වන දින බලාත්මක විය. මෙම ප්‍රඥප්තිය මඟින් වැළැක්වීමට බලාපොරොත්තු වූ කරුණු නම්, සම්පූර්ණ සංක්‍රමණික ක්‍රියාවලිය තුළදීම සංක්‍රමණික කම්කරුවන් සූරාකෑමට ලක්වීම වැළැක්වීම, නීති විරෝධී ලෙස සේවයට බඳවා ගැනීම් සහ සංක්‍රමණික කම්කරුවන් හොරෙන් පිටරට ගෙන යාම වැළැක්වීම මෙන්ම විෂම වාතාවරණයන් යටතේ සංක්‍රමණික කම්කරුවන් රැකියාවේ නියුක්ත වීම අධෛර්යමත් කිරීම, ආදියයි. මෙම ප්‍රඥප්තියට අත්සන් කළ පාර්ශවකරුවෙකු ලෙස, එය බලාත්මක වී වසරක් ඇතුළත ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර පිළිබඳ වාර්තා කිරීමට ශ්‍රී ලංකාව වගකීමෙන් බැඳී සිටින අතර ඉන් අනතුරුව සෑම වර්ෂ පහකටම වරක් ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමට බැඳී සිටියි. මෙම වාර්තාවල ප්‍රඥප්තියට ඇති අනුකූලතාවය, එහි වගන්ති යටතේ ස්ථාපිත කමිටුවක් මගින් නිරීක්ෂණය කිරීමට නියමිත අතර, එම කමිටුවේ ප්‍රථම රැස්වීම 2005 ජූලි මස[19] පැවැත්වීමට කටයුතු යොදා ඇත.

සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුමේ (ICCPR) 40 වන වගන්තියට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ සිව්වන සහ පස්වන කාලීන වාර්තා මානව හිමිකම් පිළිබඳ කොමිසම මගින් 2003 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වලදී පරීක්ෂාවට ලක් කරන ලදී. මානව හිමිකම් කොමිසම සිය අවසාන නිරීක්ෂණයේ දී ස්වකීය විවේචනය තුළින් පැන නගින්නා වූ යහපත් සංකල්ප 6 ක් දක්වා ඇති

---

19. "සංක්‍රමණික කම්කරුවන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ වූ ප්‍රඥප්තිය ලබන ජූලි මාසයේ දී බලාත්මක කිරීමට නියමිතය" යන මැයෙන් වූ 2003.03.19 දිනැති එක්සත් ජාතීන්ගේ මාධ්‍ය ප්‍රකාශය. වෙබ් අඩවි ප්‍රවේශය, http://www.unhchr.ch

නමුත් සැලකිල්ල සහ යෝජනා හිමිවිය යුතු ප්‍රධාන විෂයයන් 14 ක් ද දක්වා සිටී. එහි වූ යහපත් කරුණු ලෙස 2002 වර්ෂයේ පෙබරවාරි මස ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. ය අතර අත්සන් කළ සටන් විරාම ගිවිසුම, 1997 වර්ෂයේ මාර්තු මස ජාතික මානව හිමිකම් කොමිසම සංස්ථාපනය කිරීම, ජාතික පොලිස් කොමිසම පිහිටුවීමත් සමඟම රජයේ නිලධාරීන්ගේ සහ යුධ හමුද සාමාජිකයන් අතර මානව හිමිකම් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමට ගෙන ඇති පියවර සහ සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුමට වූ, අත්සන් කිරීම අනිවාර්ය නොවූ මුල් කෙටුම්පත 1997 ඔක්තෝබර් මස වලංගු කරවා ගැනීම යන කරුණු පිළිගන්නා ලදී. සැලකිල්ල දක්විය යුතු මූලික විෂයන් පහත සාරාංශකරණය කර ඇත.

- ගිවිසුම යටතේ හඳුනාගත් අයිතිවාසිකම් වලට ස්වකීය නෛතික ප්‍රතිපාදන මඟින් පූර්ණ බලතල හිමිවන බව සහතික කරන ලෙසට මානව හිමිකම් කොමිසම විසින් රජයට දන්වා සිටින ලදී. වර්තමානයේ දී ගිවිසුමේ දක්වා ඇති සීමාවන්ට වඩා අයිතිවාසිකම් සීමා කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය ආරක්ෂිත උපක්‍රම හෝ සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුමේ දක්වා ඇති වැදගත් අයිතිවාසිකම් සියල්ලම ආවරණය වන්නා වූ නෛතික ප්‍රතිපාදන ශ්‍රී ලංකා නීති ව්‍යුහය තුළ අන්තර්ගත වී නැත. විශේෂයෙන්ම, ජීවත්වීමේ නිදහස මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිතවම දක්වා නැත: ගිවිසුමේ සමහර අයිතිවාසිකම් පුරවැසිභාවය නොමැති අයට ප්‍රතික්ෂේප වී ඇත: මූලික අයිතිවාසිකම් සඳහා වූ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සමඟ පරස්පර විරෝධීතාවයන් පැවතියත්, එසේ තිබියදීත් දනට පවත්නා නීති වලංගුව පවතී. ගිවිසුම හා පරස්පර විරෝධී වූ නෛතික ප්‍රතිපාදන අභියෝගයට ලක් කළ නොහැකි අතර "පරිපාලන හෝ විධායක ක්‍රියාවක" වලංගුතාවය පිළිබඳ වූ අභියෝගයන් මත එක් මසක කාල සීමාව පැනවීම මානව හිමිකම් වලංගු කරවීම අනතුරේ හෙළා ඇත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු වී ඇති ප්‍රතිපාදන මඟින් මූලික අයිතිවාසිකම් භුක්ති විඳීම මත ගිවිසුම මඟින් අවසර ලැබ දී ඇති සීමාවන්ටත් වඩා වැඩි සීමාවන් පැනවීමට අවසර දෙයි. එවැනි ප්‍රතිපාදන, ගිවිසුම හා සමාන තත්ත්වයට ගෙන ආ යුතු වේ.
- වධහිංසා පිළිබඳ අඛණ්ඩ වාර්තා තවදුරටත් නිකුත්වීම පිළිබඳව අවධානය යොමුකරමින්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ යුධහමුද සාමාජිකයින් වෙතින් රැඳවියන්ට සිදුකරන වධහිංසා සහ වෙනත් කෲර, අමානුෂික හෝ පහත් තත්ත්වයේ සැලකීම් හෝ

දඬුවම් වැළැක්වීම පිණිස, මානව හිමිකම් කොමිසම විසින් ව්‍යවස්ථාදයකමය සහ වෙනත් ආකාරයේ වැඩ පිළිවෙළවල් රාශියක් යෝජනා කරන ලදී.

- යුද්ධය පැවති කාලය තුළ පුද්ගලයින් අතුරුදන් වීම සම්බන්ධව ඇති නඩු වලින් නොවිසඳුණු විශාල නඩු සංඛ්‍යාව පිළිබඳව මානව හිමිකම් කොමිසම සිය අවධානය යොමුකරන අතර, දඬුවමින් බේරී සිටීමේ නිදහස් සංස්කෘතියක් ඇති කිරීමට ඒවා දයක වූ බව කොමිසමේ හැඟීම විය. කොමිසම විසින් සියලුම පුද්ගලයින්ට ජීවත්වීමේ නිදහස සහ පුද්ගල සුරක්ෂිතභාවය ඇති නිදහස පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන ලෙස යෝජනා කළ අතර, බලාත්කාරයෙන් හෝ අකමැත්තෙන් සිදු කරන ලද අතුරුදන්වීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම සහ බලාත්කාරයෙන් හෝ අකමැත්තෙන් සිදුකරන ලද අතුරුදන්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරි කණ්ඩායම විසින් මීට පෙර මේ සම්බන්ධව සිදුකරන ලද යෝජනා ක්‍රියාත්මක කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.
- ශාරීරික දණ්ඩනය සම්බන්ධයෙන්, මානව හිමිකම් කොමිසම විසින්, සියලුම ආකාරයේ වූ ශාරීරික දණ්ඩනයන් නීතියක් වශයෙන් අවලංගු කරන ලෙසත්, එම තහනම සියලුම පාසල් සහ බන්ධනාගාර තුළ බලාත්මක කරන ලෙසටත් රජයට බලකර සිටින ලදී.
- ගබ්සා කිරීම සාපරාධී වරදක් ලෙස (මවගේ ජීවිතය බේරා ගැනීම පිණිස එය සිදුකරන අවස්ථාවක හැර) පැවතීම නිසා අනාරක්ෂිත තත්ත්වයන් යටතේ ඉතා විශාල සංඛ්‍යාවකින් සිදුකරන ගබ්සා කිරීම් පිළිබඳව සිය සංවේගය ප්‍රකාශ කරමින් මානව හිමිකම් කොමිසම බලකර සිටියේ, ගබ්සා කිරීම සාපරාධී ක්‍රියාවක් බවට පත්කරන නෛතික ප්‍රතිපාදන අවලංගු කළ යුතු බවටයි.
- ගිවිසුම හා පරස්පර විරෝධී වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන හඳුනාගත් අතර, මානව හිමිකම් කොමිසම බලකර සිටියේ ත්‍රස්තවාදයට විරුද්ධව සටන් කිරීම සඳහා යොද ගන්නා සියලුම ව්‍යවස්ථාමය හා වෙනත් ආකාරයේ ක්‍රම සියල්ලම ගිවිසුමේ ප්‍රතිපාදන වලට අනුකූල විය යුතු බවටයි. විශේෂයෙන්ම, කොමිසම කියා සිටියේ ගිවිසුම සමඟ පරස්පර විරෝධී වන තරමටම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ ව්‍යවස්ථා කෙටුම්පත තුළට ඇතුළත් නොකළ යුතු බවයි.

- ළමා ශ්‍රමය සූරා කෑමේ සහ ලිංගික සූරා කෑමට ලක්කිරීම පිණිස ළමයින් විකිණීමට එරෙහිව සටන් කිරීම සඳහා රජය විසින් ගත හැකි උපරිම ක්‍රියා මාර්ග ගත යුතු බවට මානව හිමිකම් කොමිසම රජයට බලකර සිටියි.
- විකල්ප දඬුවම් දීමේ ක්‍රම භාවිතා කිරීම වැනි දේ මගින් බන්ධනාගාර අධික ලෙස සිරකරුවන්ගෙන් ගහන වීම අඩු කිරීමට ඔබින පියවර ගන්නා ලෙසට මානව හිමිකම් කොමිසම බලකර සිටියි.
- අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම ප්‍රකාශ කර සිටියේ, වර්තමානයේ පවතින පාර්ලිමේන්තුව මගින් සිදු කරන පරිපාලනය වෙනුවට අධිකරණ පරිපාලනය සඳහා සහ අධිකරණයේ කල් ක්‍රියාව විනයානුකූල කිරීම මගින් මෙම ස්වාධීනත්වය තවත් ශක්තිමත් කිරීම අවශ්‍ය වී ඇති බවයි.
- සාපරාධී අපහාසය හා සම්බන්ධ ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන අවලංගු කිරීම යහපත් සේ පිළිගනිමින්, රාජ්‍ය මාධ්‍ය තවදුරටත් අග්‍රස්ථානයේ සිටීම පිළිබඳව මානව හිමිකම් කොමිසම සිය අවධානය යොමු කරමින් බලකර සිටියේ, බහු-මාධ්‍ය ආයතන ක්‍රමය ආරක්ෂා කළ යුතු බවත් මාධ්‍ය පැමිණිලි කොමිසමේ අපක්ෂපාතීත්වය සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු බවත්ය.
- මානව හිමිකම් කොමිසම තවදුරටත් බලකර සිටියේ, මාධ්‍යවේදීන්ට සහ පත්තර කලාවේදීන්ට සිදුකරන හිරිහැරයන් වැළැක්විය යුතු බවත්, එවැනි අවස්ථා වලදී වගකිව යුතු පුද්ගලයින්ට නඩු පැවරීමට හැකිවන සේ මඟ පෙන්වීම සඳහා ඉක්මන් සහ පූර්ණ විමර්ශනයන් පැවැත්විය යුතු බවත්ය.
- මානව හිමිකම් කොමිසම යෝජනා කර සිටියේ කාන්තාවන්ට එරෙහිව වෙනස් ලෙස සැලකීම් කරන පුද්ගලික නීතින්, ගිවිසුමේ ඇති අදාළ ප්‍රතිපාදන හා සම තත්ත්වයට ගෙන ආ යුතු බවයි.
- ගෘහස්ථ හිංසනය සහ වෛවාහක ස්ත්‍රී දූෂණය ඇතුළුව කාන්තාවන්ට එරෙහිව සිදු කරන සාහසික ක්‍රියා වැඩි ප්‍රමාණයක් සිදුවීමේ අනුපාතය පිළිබඳව සිය සංවේගය ප්‍රකාශ කරමින්, මානව හිමිකම් කොමිසම යෝජනා කර සිටින්නේ, ඒවා වැළැක්වීමට ගිවිසුමට අනුකූල වන සුදුසු ව්‍යවස්ථා නීතිගත කළ යුතු බවත්, එයට

විවාහය තුළ සිදුකරන දූෂණය සාපරාධී වරදක් බවට පත් කිරීම ඇතුළත් කළ යුතු බවත්ය.

ඊට අමතරව, ශ්‍රී ලංකාව පිළිබඳ මීට පෙර නිකුත් කළ වාර්තාවේ කමිටුව විසින් දක්වූ අවසාන නිරීක්ෂණයන් ඔස්සේ ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සම්පූර්ණ තොරතුරු, රජයේ වාර්තා මගින් දක්වා නොතිබීම පිළිබඳව මානව හිමිකම් කොමිසම සිය අවධානය ප්‍රකාශිතවම දක්වන ලදී. කොමිසම ප්‍රකාශ කර සිටියේ 2007 නොවැම්බර් මස 1 වන දින වන විට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති මීළඟ කාලීන වාර්තාවේදී, ඉහත අවසාන නිරීක්ෂණයන් ඔස්සේ ගත් ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු සැපයීමට විශේෂ අවධානයක් යොමු කළ යුතු බවයි.

වෙනත් සම්මුති ගණනාවක් යටතේම වාර්තා ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකාව ප්‍රමාද විය. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ වෙබ් අඩවිය තුළ අන්තර්ගත කර ඇති සම්මුති පිළිබඳ දත්ත ගබඩාවේ, වර්ෂ 2003 අවසානය වන විට කල් ඉකුත් වූ ශ්‍රී ලංකාව විසින් ලබාදිය යුතු කාලීන වාර්තා පහක් ලැයිස්තුගත කර ඇත. 2003 වසරේ අවසානය වන විට ද කාන්තාවන් ට එරෙහි සියලුම ආකාරයේ හිරිහැර සහමුලින්ම ඉවත් කිරීම පිළිබඳ වූ ගිවිසුම යටතේ ඉදිරිපත් කළයුතු වූ පස්වන හෝ සයවන කාලීන වාර්තා, ඉදිරිපත් කර නොතිබූ අතර; එහි සයවන වාර්තාව නියමිතව තිබුණේ 2002 වසරේ නොවැම්බර් 04 වන දිනටය. ඒ හා සමානව, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ වූ අන්තර්ජාතික ගිවිසුම යටතේ ඉදිරිපත් කළ යුතු වූ තුන්වන කාලීන වාර්තාව 2000 වසරේ ජූනි මස 30 වන දිනට නියමිතව තිබුණත් එය 2003 වසර අවසාන වන විට පවා ඉදිරිපත් කර නොතිබුණි. ඒවාගේම, කල් ඉකුත් වූ ශ්‍රී ලංකා වාර්තා නම්, 2003 මාර්තු මසට නියමිතව තිබූ සියලුම ආකාරයේ වාර්ගික හිරිහැරයන් සහමුලින්ම ඉවත් කිරීම පිළිබඳව වූ අන්තර්ජාතික ප්‍රඥප්තිය යටතේ වූ වාර්තාව ද, 2003 වසරේ පෙබරවාරි 01 වන දිනට නියමිතව තිබූ, වධහිංසා සහ වෙනත් කෲර අමානුෂික හෝ පහත් තත්ත්වයේ සැලකීම් හෝ දඬුවම් වලට එරෙහි ප්‍රඥප්තිය යටතේ වූ වාර්තාව ද වේ.

# අතිරේකය

## හදිසි නීතිය අවලංගු වීම සහ වෙනත් උපාය මාර්ගවල පිහිට පැතීම.

(සාලිය එදිරිසිංහ නීති නිලධාරී, නීතිය මගින් මානව අයිතිවාසිකම් සඳහා වන නඩේසන් කේන්ද්‍රය, කොළඹ.)

කුඩා කාල සීමාවන් කිහිපයක් හැර, ශ්‍රී ලංකාව වසර 25 කට වඩා වැඩි කාලයක් හදිසි නීතිය යටතේ පැවතිණි. කෙසේ වුවත්, 2001 වසරේ ජූලි මස හදිසි නීතිය අවලංගු වීමට ඉඩහැරීමෙන් මෙම තත්ත්වය අවසන් වූ අතර, එසේ වූයේ හදිසි නීතිය[20] සම්මත කර ගැනීමට අවශ්‍ය පාර්ලිමේන්තු බහුතරයක් ලබා ගැනීමට රජයට වූ නොහැකියාවේ ප්‍රතිඵලයක් ලෙස යැයි පුළුල්ව පැතිරී ගිය අනුමානයක් විය.

2001 ජූලි මාසයේදී හදිසි නීතිය අවලංගු වීමත් සමඟම, රජය 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥපනතේ III[21] කොටසේ සපයා ඇති බලතලවල සහ 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික ප්‍රතිපාදන) පනතේ 27[22] වන වගන්තියේ ඇති ව්‍යවස්ථා සම්පාදන බලය යනාදියේ පිහිට පැතූ අතර එසේ කළේ, හදිසි නීති බලතල (මහජන ආරක්ෂක ආඥපනතෙහි II කොටස යටතේ) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී සම්පාදිත සමහර හදිසි නීති රෙගුලාසිවල අන්තර්ගතය තවදුරටත් බලාත්මකව පවත්වා ගැනීමටයි.

---

20. ජනාධිපති විසින් හදිසි නීති රෙගුලාසි සම්පාදනය කිරීමේ බලය ක්‍රියාත්මක කිරීම, 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥාපනත. එම ආඥපනතේ II වන කොටස බලාත්මක කරමින් (හදිසි නීති රෙගුලාසි සම්පාදනයට බලය ලැබෙන්නේ එමගිනි) ජනාධිපති විසින් සිදුකළ, හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමටත්, එම නිවේදනය අඛණ්ඩව බලාත්මකව පවතින්නේ එය සෑම මසකම නිකුත් කළ පසු පාර්ලිමේන්තුව මගින් සම්මත වූ විටය.

21. හදිසි නීතිය ප්‍රකාශයට පත්කරමින් කළ නිවේදනයක් පැවතීම මත රඳා නොපවතින සමහර නියෝග (මහජන සාමය එලෙසම පවත්වාගෙන යාම සඳහා යුධ හමුදා කැඳවීම, ඇඳිරි නීතිය පැනවීම, සමහර සේවාවන් අත්‍යවශ්‍ය සේවා බවට පත් කරමින් ප්‍රකාශයක් නිකුත් කිරීම යනාදිය ඇතුළත්ව) නිකුත් කිරීම සඳහා 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥපනතේ මෙම කොටස, ජනාධිපතිට බලය පවරා දෙයි.

22. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 27 වැනි වගන්තිය සපයන්නේ: "මෙම පනතේ නියමයන්ට සහ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ හෝ ඒවාට බලය ලබා දීමේ කාර්යය සඳහා මෙම පනත යටතේ අමාත්‍යවරයාට රෙගුලාසි සම්පාදනය කළ හැක" යන්නයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2001 වසරේ ජූලි මස 6 වන දින[23] සම්පාදිත මෙම කුතුහලය දනවන රෙගුලාසිය මගින් පුද්ගලයින්ව රඳවා තබා ගැනීමට ඉඩ සලසා දෙන මෙම හදිසි නීති රෙගුලාසි වල අන්තර්ගතය සජීවීව පවත්වා ගැනීමට උත්සාහ දරයි. මෙම රෙගුලාසිය නිදහස අහිමි වූ පුද්ගලයින් දෙවර්ගයක් සම්බන්ධයෙන් ක්‍රියා කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නොව වෙනත් වරදක් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයකු විසින් රිමාන්ඩ් භාරයට පත්කළ පුද්ගලයින් සම්බන්ධව, එම වරද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ "නීති විරෝධී ක්‍රියාකාරකම්"[24] (unlawful activity) යන පදයට ලබා දී ඇති නිර්වචනය යටතට වැටෙන්නේ නම්, ඔවුන්[5] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන යටතේ රිමාන්ඩ් භාරයට පත් කළා සේ සැලකිය යුතු පුද්ගලයින් බවට ප්‍රකාශ කළ අතර, ඔවුන් සම්බන්ධයෙන් එය ප්‍රථමයෙන් ක්‍රියා කරන ලදී. දෙවනුව, මෙම රෙගුලාසියට අනුව අවලංගු වූ හදිසි නීති රෙගුලාසියක් යටතේ රඳවා තබාගත් රැඳවියෙකු (අධිකරණය භාරය යටතේ සිටින අය හැර) එම හදිසි නීති රෙගුලාසි අවලංගු වී දින 15 ක් ගතවන තක් නිදහස් නොකළ යුතු අතර එම කාල සීමාව තුළ රැඳවියෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත[26] යටතේ රඳවා තබා ගැනීමේ නියෝගයකට යටත් කළ හැකි වීම හෝ මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ II වන කොටස[27] යටතේ හෝ වෙනත් නීතියක් යටතේ රිමාන්ඩ් භාරයට පත්කිරීම සිදුකළ හැක.

---

23. 2001 අංක 2 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ රෙගුලාසි.

24. මෙම වරදවල් වලට සමහර උදහරණ වන්නේ, රජයේ ආයතනවල, බැංකුවල, විවිධ සේවා සමුපකාර සමිති යනාදියෙහි දේපළ සොරකම් කිරීම, රජයේ හෝ පොදු දේපල වලට අලාභ සිදුකිරීම, පොදු ස්ථානවල සිටුවා ඇති නිවේදන ඵලකයන්හි දක්වෙන වචන මකා දැමීම, කොටසක් කපා දැමීම යනාදියයි.

25. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් භාරයට පත්කළ පුද්ගලයින්ට (ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රිමාන්ඩ්භාරයට පත්කළ පුද්ගලයින්ගෙන් වෙන්කර දක්වන ආකාරයට) නඩු විභාගය අවසන් වනතුරු ඇප හිමිවන්නේ නැත.

26. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 9 වන වගන්තිය යටතේ කුමන හෝ නීති විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් සැකකරුවෙකු වූ පුද්ගලයෙකුට අදාලව එක් වරකට මාස 3 ක කාලයක් සඳහා වූ රඳවා තබා ගැනීමේ නියෝගයක් නිකුත් කිරීමට අමාත්‍යවරයාට බලය පවරා දෙන අතර, එලෙස රඳවා තබා ගන්නා කාලයේ එකතුව මාස 18 ක් නොඉක්ම විය යුතුය.

27. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයකු අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කළ අවස්ථාවක නොව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ වරදක් සිදුකිරීම සම්බන්ධව සැකකරුවකු වූ පුද්ගලයකු උසාවියට ඉදිරිපත් කළවිට හෝ ඔහු ඉදිරිපත් වූ අවස්ථාවකදී II කොටසේ 7(2) වගන්තිය ප්‍රකාරව එම නඩු විභාගය අවසන් වන තුරු එම පුද්ගලයා රිමාන්ඩ් භාරයට පත්කළ හැකිය.

ඉහත සඳහන් කළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසියෙන් නීතිමය ගැටලු කිහිපයක් උපදී. ඒවා නම් මහජන ආරක්ෂක ආඥාපනතේ ඇති ආරක්ෂාකාරී වගන්තියේ එනම්, 4 වන වගන්තියේ[28] ඇති වලංගුතාවය, එනම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසි වලට වෙනත් නීති වල ප්‍රතිපාදන ක්‍රියාත්මක වීම යටපත් කිරීමට හෝ අවලංගු කිරීමට ඇති නෛතික හැකියාව (ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව මෙම පනතේ ප්‍රතිපාදන හා වෙනත් නීති අතර ගැටුම් හෝ නොගැලපීම් ඇති වූ අවස්ථාවක, මෙම පනතේ ප්‍රතිපාදන පිළිගත යුතුයි යන කරුණට අවධානය යොමුකරමින්); සහ මූලික අයිතිවාසිකම් මත සීමාවන් පැනවීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසි සතුව ඇති නීතිමය හැකියාවයි. අවසාන කරුණ සම්බන්ධයෙන්, 2003 මාර්තු මස තීන්දුව ලබාදුන් මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු තීන්දුවකදී[29] දී ශ්‍රේෂ්ඨාධිකරණය දරූ මතය වූයේ, **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සම්පාදිත රෙගුලාසි මගින් මූලික අයිතිවාසිකම් මත සීමාවන් පැනවිය නොහැකිය යන්නයි.** මෙම තීන්දුව ලබා දුන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් මත සීමාවන් පැනවීමට බලය ලබා දී ඇත්තේ නීති (ව්‍යවස්ථා) සහ විශේෂිත අවස්ථාවල දී හදිසි නීති රෙගුලාසි යනාදියට පමණක් බවත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ රෙගුලාසි වලට නොවන බවත් යන තර්කය මතයි.

මූලික අයිතිවාසිකම් මත සීමාවන් පැනවෙන ලෙස පෙනෙන්නට ඇති 2003 වසරේ බලාත්මකව පැවති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අදාළ රෙගුලාසි වලට පහත රෙගුලාසි ඇතුළත්ය: අධිආරක්ෂිත කලාප පිළිබඳ රෙගුලාසි[30] (සංසරණයට ඇති නිදහස[31] සහ නීත්‍යානුකූල රක්ෂාවක හෝ ව්‍යාපාරයක

---

28. 4වන වගන්තිය දක්වන්නේ: "යම් නිවේදනයක් කල් ඉකුත්වීම හෝ අවලංගු කිරීම නිසා . . . (b) මෙම කොටස (II කොටස) ක්‍රියාත්මකව පවතින අතර සිදුකරන ලද ඕනෑම වරදක් හෝ උපයා ගත් හෝ දැරීමට සිදුවූ ඕනෑම අයිතිවාසිකම්, නිදහසක් හෝ දඩයක් (c) මෙම කොටස (II කොටස) යටතේ ඕනෑම වරදක්, අයිතිවාසිකමක්, නිදහසක් හෝ දඩයක් සම්බන්ධයෙන් යම් නඩුවක්, ක්‍රියාපටිපාටියක් හෝ පිළියමක්, ආරම්භ කිරීම පවත්වාගෙන යාම හෝ බලාත්මක කිරීමට බලපෑමක් හෝ බලපාන ලදයි හැඟවීමක් නොකරයි. . . "
29. ශ්‍රේෂ්ඨාධිකරණ අංක 20/2002 (FR), *සෝතිලිංගම් තවනීදන් එරෙහිව දයානන්ද දිසානායක, මැතිවරණ කොමසාරිස්වරයා සහ තවත් අය.* 2003 මාර්තු 25 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන්.
30. 2001 අංක 3 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසිය මගින් කොළඹ අධි ආරක්ෂිත කලාපයක් බවට ප්‍රකාශ කළ අතර, බලපත්‍රයක් නොමැතිව අධිආරක්ෂිත කලාපය තුළට ලොරි සහ ට්‍රේලර් ඇතුළුවීම හෝ නවතා තැබීම තහනම් කරන ලදී.
31. 14(1)(ඌ) වගන්තිය.

නිරත වීමට ඇති නිදහසට[32] බලපායි. (රියදුරෙකු වශයෙන් හෝ ප්‍රවාහනය සඳහා ලොරි සැපයීමේ ව්‍යාපාරයක් රක්ෂාව ලෙස සිදු කරන) පිටතින් සවිකර ඇති මෝටර් සහිත බෝට්ටු සම්බන්ධ ප්‍රතිපාදන.[33] **එය වර්ෂ 2003 මැයි 31 වන දින අවලංගු කර ඇත.** (නීත්‍යානුකූල රක්ෂාවක/ව්‍යාපාරයක නිරත වීමට ඇති නිදහසට බලපායි)[34] සීමා කරන ලද කලාප පිළිබඳ රෙගුලාසිය[35] (නීත්‍යානුකූල රක්ෂාවක/ව්‍යාපාරයක නිරත වීමට ඇති නිදහසට බලපායි. උදා: මසුන් ඇල්ලීම); තහනම් කලාප පිළිබඳ රෙගුලාසි[36] (නීත්‍යානුකූල රක්ෂාවක/ව්‍යාපාරයක නිරතවීමට ඇති නිදහසට බලපායි. උදා: මසුන් ඇල්ලීම); සීමා කරන ලද අයිතමයන් පිළිබඳ රෙගුලාසිය[37] (සමානාත්මතාවයට[38] සහ නීත්‍යානුකූල රක්ෂාවක/ව්‍යාපාරයක නිරත වීමට ඇති නිදහසට බලපායි); යටත්වන පුද්ගලයින් භාරයට ගැනීම පිළිබඳ රෙගුලාසිය[39] (හිතුවක්කාර ලෙස රඳවා තබා ගැනීමෙන් නිදහස් වීමට ඇති අයිතිවාසිකමට බලපායි)[40] අවධානය යොමු කළ යුතු කරුණක් වූයේ, මූලික අයිතිවාසිකම් මත සීමාවන් පැනවීමට නෛතික බලයක් හිමි නොවූ නමුත් එලෙස පැනවෙන ආකාරයට සම්පාදිත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වූ රෙගුලාසි මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) දරණ ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති සමානාත්මතාවය පිළිබඳ වගන්තිය ද කඩ කිරීමට ලක්විමයි.

---

32. 14(1)(උ) වගන්තිය.
33. 2001 අංක 6 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසිය මගින් වෙනත් දේ අතර පිටතින් සවිකර ඇති මෝටර් සහිත බෝට්ටුවල එක්තරා අශ්වබල ප්‍රමාණයක් සහිත මෝටර් භාවිතය තහනම් කරන ලදී.
34. 14(1)(උ) දරණ වගන්තිය.
35. 2001 අංක 7 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසිය (යම් යම් ප්‍රදේශ වලට අදාළ වේ).
36. 2001 අංක 8 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසිය (යම් යම් ප්‍රදේශ වලට අදාළ වේ).
37. 2001 අංක 9 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසිය (රටේ සමහර ප්‍රදේශ වලට, ඩීසල්, පෙට්‍රල්, සිමෙන්ති වැනි අයිතමයන් ගෙන යාම සීමා කරයි).
38. 12(1) සහ 12(2) වගන්තිය.
39. 2001 අංක 11 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසිය.
40 13(2) වගන්තිය.

# II

# ළමා අයිතිවාසිකම්

*රුවනා රාජපක්ෂ**

## 1. හැඳින්වීම - එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ නිරීක්ෂණ

වර්ෂ 2003 දී ළමා අයිතිවාසිකම් විෂය ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනයන්ට මේ පරිච්ඡේදයේ අවධානය යොමු කරනු ලබයි.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 44 වැනි වගන්තියේ ප්‍රකාර ශ්‍රී ලංකා ආණ්ඩුව වර්ෂ 2003 මැයි මාසයේදී සිය දෙවන වාරික වාර්තාව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරන්නට යෙදුණි. ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද මෙම වාර්තාව මගින් 1994-1998 කාල පරිච්ඡේදය ආවරණය වූ නමුත් ඊට අදාළ වර්තමාන තත්ත්වය පිළිබඳ ශ්‍රී ලාංකික නියෝජිත පිරිස සංවාද අවස්ථාවේදී තොරතුරු සපයන ලදී. එක්සත් ජාතීන්ගේ කමිටුව මේ සම්බන්ධයෙන් සතුටුදයක ප්‍රකාශ කිහිපයක් ඉදිරිපත් කරන්නට යෙදුණු නමුත් ඇතැම් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.

ක්‍රියාත්මකව පවතින සාම ක්‍රියාදාමය ද එහි ප්‍රතිඵලයක් ලෙස ඉවත් කරනු ලැබූ හදිසි නීතියද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අත්හිටුවීමද කමිටුව

---

* එල්.එල්.බී. (ලන්ඩන්), බැරිස්ටර් (ඉනර් ටෙම්පල්), නීතිඥ සහ නීති උපදේශක.

විසින් ඉතා උණුසුම් ලෙස පිළිගැනිණ. තවද කමිටුව විසින් සාම ක්‍රියාවලියට ඇතුළත් කරන්නට යෙදුණු මානව හිමිකම් කරුණුද සාදරයෙන් පිළිගැනිණ.[1]

සන්නද්ධ අර්බුදයට මැදි වූ ළමුන් පිළිබඳ අඩංගු ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ විකල්ප මූලපත්‍රය වර්ෂ 2000 දී ශ්‍රී ලංකාව විසින් අත්සන් කිරීම ප්‍රශංසාවට ලක්විය.

කෙසේ හෝ තව දුරටත් සලකා බලන කරුණු අතර පහත ඒවාද වේ.

1.1 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුකූල වන පරිදි විවිධ පුද්ගල නීති ඇතුළු පවත්නා නීති සකස් කිරීමට අවශ්‍ය සම්පූර්ණ හා ක්‍රමාණුකූල විමසුමක් නොමැති වීම.

1.2 ජීවත්වීමේ අයිතිය, වෙනස්කමකට භාජනය නොවීමේ මූලික සිද්ධාන්තය, ළමුන්ගේ සුභසිද්ධිය සහ ළමුන්ගේ මත වලට ගරු කිරීම ආදී ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පැහැදිලිව දක්වා ඇති නිශ්චිත, වැදගත්, පොදු මූල ධර්ම අනුගමනය කිරීමට නීතිය අසමත් වීම.

1.3 ළමා අයිතිවාසිකම් සම්මුතිය ප්‍රකාර අවුරුදු 18 ට පහළ සියලුම ළමුන් ආවරණය විය යුතු වුවත් වෙන් වෙන්වූ නීති වල ඇති ළමයා පිළිබඳ අර්ථ දක්වීම් ඒ හා සමගාමී කිරීමට අසමත් වීම.

1.4 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමේදී ජාතික අධීක්ෂණ කමිටුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව අතර කාර්යක්ෂම සම්බන්ධීකරණයක් සිදු නොවීම.

1.5 අන්තර්ජාතික සම්මතයන්ට අනුව බලන කල කමිටුව විසින්ද අවධානය යොමු කළ පරිදි අවම සාපරාධී වගකීම පවරන වයස අවුරුදු 8 ක් වැනි ඉතා අඩු වයසක් වීම.

1.6 ළමා අධිකරණයන්හි ප්‍රමිතීන් ප්‍රමාණවත් නොවීම.

1.7 ශාරීරික දඬුවම් තහනම් කිරීමට අපොහොසත් වීම.

---

1. ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. ය අත්සන් කළ සටන් විරාම ගිවිසුමේ හෝ අවබෝධතා ගිවිසුමෙහි වැඩිහිටියන්ගේ හෝ ළමුන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ පැහැදිලි සටහනක් නොමැති වුවද.

1.8 විදේශ රැකියාවන්හි නියුක්ත අයගේ දරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමට අසමත් වීම.

1.9 ළමුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය, පෝෂණය, පිරිසිදු ජලය හා සනීපාරක්ෂක ඇතුළු සමාජ-ආර්ථික අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් ලෙස සම්පත් වෙන් නොකිරීම. දනට පවතින අසතුටුදායක ළමා අයිතිවාසිකම් තත්ත්වය සැලකිල්ලට ගෙන රජය එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හා එක්ව ළමුන් සඳහා වන දෙවන ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ඇති කිරීමට මූලික විය.[2] මෙම සැලැස්ම 2004 වසරේ සිට 2008 දක්වා දිව යන අතර එහි මූලික සැලසුම් 2003 දී ඇති කරන ලදී. එමගින් ළමා අයිතිවාසිකම් පිළිබඳ බලපෑමක් ඇති සෑම අංශයක් ම ක්‍රියාකාරී සැලැස්මක් සහ අය වැය ද ලබා දීම අවශ්‍ය විය.[3]

## 2. සිවිල් නීතිය හා ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ අවශ්‍යතාවයන් අතර පවතින අනුකූලතාවයන්

එක්සත් ජාතීන්ගේ කමිටුව පැහැදිලි අවධානය යොමු කරන්නට යෙදුණේ "විවිධාකාර වූ පුද්ගල නීති ඇතුළු පවතින්නා වූ නීති සම්බන්ධයෙන් සම්පූර්ණ හා ක්‍රමානුකූල සමාලෝචනයක් කිරීම තුළින් ඒවා සම්මුතියට අනුකූල වන ලෙසට පමුණුවීම සඳහා කිසිදු විධිමත් වැඩපිළිවෙළක් නොතිබීමයි". සම්මුතියට අනුකූල වන පරිදි පවත්නා සියලු නීති ක්‍රමානුකූලව සමාලෝචනය කිරීම සහ "විවිධ ජන වර්ග වල පුද්ගල නීති අදළ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට ඇතුළත් කිරීම පිළිබඳ ඔවුන්ගේ උපදෙස් ලබා ගැනීම" රාජ්‍ය පාර්ශවය බාර ගත යුතු බව කමිටුව නිර්දේශ කරන ලදී.

කමිටුව සිය වාර්තාවේ වෙනත් තැන්වල අපරාධ නීතියට අදළ ක්ෂේත්‍ර පිළිබඳ සිය විමසිල්ල යොමුකර ඇතත්, ප්‍රධාන වශයෙන් සිය නිරීක්ෂණයන් සිවිල් සහ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ නීතිය කෙරෙහි යොමු කර ඇත. එමෙන්ම විවිධ ජන වර්ග පාලනය වන පුද්ගල නීති පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර ඇත.

---

2. පළමු සැලැස්ම 1991-1995.

3. ඇතුළත් වූ අංශ වන්නේ අධිකරණ, ආරක්ෂාව (සමාජ සුභසාධන අමාත්‍යංශය සමඟ කටයුතු කිරීම) අධ්‍යාපනය, සෞඛ්‍යය, ජලය සහ සනීපාරක්ෂාවයි.

මේ යටතේ දැඩි අවධානයක් යොමු කර ඇත්තේ සිය විවාහයන් සඳහා නියමිත අවම වයසක් නොමැති මුස්ලිම් ජනතාවගේ නීති සම්බන්ධවයි. 1951 අංක 13 දරණ පනතින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ 23 වන වගන්තිය හුදෙක් දක්වා සිටින්නේ "අවුරුදු දොළහ සම්පූර්ණ නොවූ මුස්ලිම් ගැහැණු දරුවෙකුගේ විවාහ ගිවිසුමක්, අදාළ ගැහැණු දරුවා වාසය කරන ප්‍රදේශයට අයත් ක්වාසිවරයා අවශ්‍ය විමසීමකින් පසු දෙන අවසර ලබා දීමකින් තොරව මිස මෙම පනත ප්‍රකාර ලියාපදිංචි කළ නොහැකි බවයි."

නමුත් මීට අසමාන තත්ත්වයක් අවම විවාහ වයස සම්බන්ධයෙන් 1995 අංක 18 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ හා 1995 අංක 19 දරණ උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනතේ දක්වේ. එනම් අවම විවාහ වන වයස අවුරුදු 18 කි. මීට අමතරව මුස්ලිම් නීතිය යටතේ අවජාතක දරුවන්ට සිය පියාගේ හෝ මවගේ කිසිදු උරුමයක් හිමි නොවන අතර (එහෙත් මෙය සාමාන්‍ය නීතියෙන් වෙනස් වන්නේ සාමාන්‍ය නීතිය යටතේ අවජාතක දරුවන්ට සිය මවගේ උරුමය හිමිවන බැවිනි.) සාමාන්‍ය නීතියට පටහැනි ලෙස දරුකමට හදා ගත් ළමුන්ට ද කිසිදු උරුමයක් හිමි නොවේ.

මෙකී පියවර ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු වාර්තාවට සමගාමීව එක්සත් ජාතීන් ගේ කමිටුවට ඉදිරිපත් කෙරුණු රාජ්‍ය නොවන සංවිධාන වාර්තාවේ දැඩි ලෙස විවේචනය කර තිබුණි.[4]

එමෙන්ම 1970 අංක 3 දරණ සුජාතභාවය පිළිබඳ පනත මගින් අවිවාහක දෙමාපියන්ට දාව උපන් දරුවන් දෙමාපියන්ගේ පසුකාලීන විවාහය නිසා සුජාතභාවයට පත් කරන නමුත් (එම දරුවන් අනාචාරයෙන් උපන් අය වුවත්) එම තත්ත්වය මුස්ලිම් හෝ උඩරට නීති වලට බල නොපාන බව පෙන්වා දිය යුතුය.[5]

කෙසේ නමුත්, මෙම කරුණු දේශපාලන වශයෙන් සංවේදී මාතෘකාවක් වීමත්, විවිධ ජන වර්ග පාලනය වන නීති වීමත් නිසා එම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් ලැබීමට නම් අදාළ ජන වර්ගවල එකඟතාවය

---

4. 2003. 01. 23 දින සේව් ද චිල්ඩ්රන් ආයතනය පිළියෙල කළ රාජ්‍ය නොවන සංවිධාන වාර්තාවේ 6 වන පිටුව.

5. මෙම ජන කණ්ඩායම් දෙක ප්‍රකාශිතවම එම පනතේ 2 වන වගන්තිය මගින් ඉවත් කොට ඇත.

අවශ්‍ය වේ. මෙම තත්ත්වය එක්සත් ජාතීන්ගේ කමිටුව හඳුනාගත් බැවින් "විවිධ ජන වර්ගවල පුද්ගල නීති අදාළ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට ඇතුළත් කිරීම පිළිබඳ ඔවුනගේ උපදෙස් ලබා ගැනීම"[6] රජය විසින් සිදු කළ යුතු බව දක්වා ඇත.

ළමුන් සඳහා රාජ්‍ය කාර්යභාරය පැහැදිලිව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වෙනි පරිච්ඡේදයේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූල ධර්ම හා මූලික යුතුකම් පරිච්ඡේදයේ දක්වා ඇත. එහි 27(13) වන ව්‍යාවස්ථාවට අනුව "ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සමාජීය වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම් වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ සුභසිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කළ යුත්තේය". නමුත් මෙකී රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීමේ මූල ධර්මය නීතිමය වශයෙන් සැලකිල්ලට භාජනය කළ නොහැකි වූවත්, එයින් බලාපොරොත්තු වන්නේ ධර්මිෂ්ඨ නිවහල් සමාජයක් ඇති කිරීම සඳහා නීති පැනවීමෙහිදී ද ශ්‍රී ලංකාවහේ රාජ්‍යානුශාසනයෙහිදී ද පාර්ලිමේන්තුව, ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් ගුරුකොට සැලකිය යුතු බවයි".[7]

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III සහ IV වන පරිච්ඡේදවල අඩංගු මූලික හා භාෂාමය අයිතිවාසිකම් ළමුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද අදාළ වේ.[8] මෙයට අමතරව 12(4) ව්‍යවස්ථාව තුළින්, 12(1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය නොවන ලෙස "කාන්තාවන්ගේ, ළමුන්ගේ හෝ ආබාධිත පුද්ගලයන්ගේ" වැඩි දියුණුව සඳහා වූ විශේෂ පියවර ගැනීමට අවශ්‍ය නීතිමය ඉඩ ප්‍රස්ථා වැදගත් අනු නීති මගින් හෝ විධායක ක්‍රියාමාර්ග මගින් ඇති කිරීමට ඉඩ සලසා ඇත. මේ සමඟ කියවිය යුතු ඉහත දැක්වූ 27(13) ව්‍යවස්ථාවෙන් විස්තර වන්නේ ළමුන් සඳහා වඩා හොඳ සුරක්ෂිත භාවයක් සහතික කිරීමට අවසර දිය හැකිවාක් පමණක් නොව එය අනිවාර්යය බවයි.

6. වාර්තාවේ 12 වන පරිච්ඡේදය.

7. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(1) වගන්තිය.

8. ළමුන් වෙනුවෙන් මූලික අයිතිවාසිකම් අයදුම්පත් ඔවුනගේ නීතිඥයන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(2) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කර ඇති අතර, සිවිල් නීතිය ප්‍රකාර ළමුන්ගේ දෙමාපියන් "සහාය මිත්‍රයා" ලෙස ළමුන් වෙනුවෙන් නඩු පවරනු ලබයි.

එසේ වුවත් අපරාධ නීතියේ විෂය ක්ෂේත්‍රයට පිටතින් සංශෝධන සිදු කොට ඇත්තේ ඉතාම අවම වශයෙනි. එක්සත් ජාතීන්ගේ කමිටුව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 2,3,6 සහ 12 යන එකී ව්‍යවස්ථාවන්ගේ අන්තර්ගතය නීතියට ඇතුළත් කිරීමට ප්‍රමාණවත් පියවර නොගැනීම සම්බන්ධයෙන් කමිටුවේ දැඩි අවධානය යොමු විය. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි එකී ව්‍යවස්ථා 4 න් පිළිවෙළින් අවශ්‍ය වන්නේ, රජය විසින් සියලු ආකාර වෙනස්කම් වලින් ළමුන් ආරක්ෂා කිරීම සහතික කිරීම, ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට ධනාත්මක ක්‍රියාමාර්ග ගැනීම, සියලුම ක්‍රියාමාර්ග වලින් දරුවන් කෙරෙහි වැඩි වාසියක් සහ සැලකිල්ලක් ඇති කිරීම, රජය විසින් ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයා ගත නොහැකි ළමුන්ට ඒ සඳහා පහසුකම් සැපයීම, සියලුම ළමුන් සඳහා නෛසර්ගික ජීවත්වීමේ අයිතිය, ළමුන්ගේ පැවැත්ම සහ සංවර්ධනය සඳහා වූ රජයේ වගකීම සහතික කිරීම හා ළමුන් කෙරෙහි බලපාන්නා වූ කාරණයකදී හෝ ක්‍රියාදමයකදී ඒ සඳහා භාජනය වන ළමුන්ගේ අදහස් සැලකිල්ලට ගැනීමයි.

2003 සම්මත වූ අංක 16 දරණ පුරවැසිභාවය (සංශෝධන) පනත මෙකී සංදර්භය තුළ ඇතිවූ වැදගත් ජයග්‍රහණයකි. මෙකී පනත තුළින් දරුවන්ට ඔවුන්ගේ මවගේ හෝ පියාගේ උරුමය මගින් පුරවැසිභාවය ලබා ගැනීමට සමාන අයිතියක් ලබාදී ඇත. මෙම පනතට පෙර පුරවැසිභාවය පියාගේ පෙළපත අනුව ලැබිණි. දෙමව්පියන් රටවල් දෙකක පුරවැසියෝ නම් ළමයා වැඩිවියට පත්වූ පසුව කුමන පුරවැසිභාවයක් ලබා ගන්නේද යන්න තෝරා ගත යුතුය.

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත තුළින් ස්ථාපනය කළ මානව හිමිකම් කොමිසමද "අන්තර් ජාතික මානව හිමිකම් සම්මතයන් හා ප්‍රමිතීන්ට අනුව ජාතික නීතින් සහ පරිපාලන ක්‍රියා දමයන් සැකසිය යුතු බවට නිර්දේශ ඉදිරිපත් කිරීමට බැඳී සිටී".[9] මානව හිමිකම් කොමිෂන් සභාව වර්තමානයේ කාර්යය සඳහා බැඳී සිටියත් විශේෂයෙන්ම ළමුන් සඳහා නොවන ඒ ක්‍රියාදමයන් තුළින් ළමුන්ට ද යහපත් ප්‍රතිඵල අත්විය හැක.

---

9. පනතේ 10 (ඩී) වගන්තිය.

## 3. අධිකරණ පද්ධතිය තුළ ළමයින්ට ඇති සැලකිල්ල

1995 සිට ළමුන්ගේ වැඩි ආරක්ෂාව සඳහා අධිකරණ ක්ෂේත්‍රයේ සිදුකර ඇති සැලකිය යුතු ප්‍රතිසංස්කරණ තිබියදීත් ළමුන් පිළිබඳ තත්ත්වය අයහපත් බවට පොදු මතයක් ඇත. 1995 දී ළමුන්ට එරෙහි අපරාධ සම්බන්ධව හඳුන්වා දුන් දඬි දඬුවම් පවා එම අපරාධ වළක්වන ස්වභාවයක් දක්නට නැත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති මහාචාර්ය හරේන්ද්‍ර ද සිල්වාට අනුව වර්ෂ 2001 දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වූ ළමා අපචාර ගණන 276 කි. මේ සංඛ්‍යාව වර්ෂ 2002 දී 366 දක්වා වර්ධනය විය. තවදුරටත් වර්ෂ 2003 පළමු මාස 6 සඳහා සිද්ධීන් 179 ක් වාර්තා විය.[10] ළමයින්ට එරෙහිව සිදු වූ සමස්ථ අපරාධ අතරින් කුඩා ප්‍රතිශතයක් පමණක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වේ. පොලිසිය විසින් නිකුත් කළ සංඛ්‍යා දත්තයන්ට අනුව ළමයින්ට එරෙහිව සිදුවූ වැරදි සම්බන්ධයෙන් දිවයින පුරා වාර්තා වූ වැරදි ප්‍රමාණය 2003 ජනවාරි සිට ජූනි දක්වා 1579 කි. එක් පොලිස් කොට්ඨාසයකින් වාර්තාගත වූ වැඩිම සිදුවීම් ගණන රත්නපුරයෙන් වාර්තා වූ අතර එය 120 කි. 116 ක් මාතරින් සහ 94 ක් නුගේගොඩින් වාර්තා විය. අවම සිදුවීම් ගණනක් වාර්තා වූයේ කන්තලෙන් වන අතර එය 9 කි. එසේම හැටන්වල 10කි.

අපරාධ වර්ග අනුව වෙන් කිරීමේදී මාතර දිස්ත්‍රික්කය ලැයිස්තුවේ මුල් තැන ගත් අතර ඊට මිනීමැරුම් 7 ක්ද, ලිංගික හිරිහැර 34ක් සහ ස්ත්‍රී දූෂණ 49 කි. දිවයින පුරා වාර්තා වූ සමස්ථ සිදුවීම් ගණනාවෙන් වැඩිම ප්‍රමාණයක් ස්ත්‍රී දූෂණ වන අතර එය 458 කි. ලිංගික හිරිහැර 308 ක්ද, බරපතල ලිංගික අපචාර 300 ක් සහ අපහරණය සිදුකිරීම් 253කි. වාර්තා වූ ළමා ශ්‍රමය පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව 80කි.

අධිකරණ පද්ධතිය විසින් ළමයින්ට සලකන ආකාරය පිළිබඳ අඛණ්ඩව අවධානය යොමු වී ඇත. මේ අතුරින් විශේෂ අවධානයක් යොමු වී ඇත්තේ ළමුන්ගේ භාරකාරත්වය ගැන නියම කිරීම සම්බන්ධව පවතින මිනුම් දඬු ද, ළමුන් රඳවා තබා ඇති තත්ත්වයන් ද, රඳවා තබා ඇති විට ලබා දෙන, අධ්‍යාපනික හා වෘත්තීමය පුහුණු වීම් මඳ බව සහ ළමුන් අධිකරණයට ගෙන එන සහ අධිකරණයෙන් ගෙන යන ස්වභාවය යනාදී කරුණුය.

---

10. 2003 සැප්තැම්බර් 28 දින *සන්ඬේ ඔබ්සර්වර්*, පුවත්පත සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාව.

## 4. අප්‍රමාණවත් මානව සහ භෞතික සම්පත් වෙන් කිරීම

අධිකරණ පද්ධතිය සමඟ පිළිගැටෙන ළමුන් වෙනුවෙන් වෙන් කරන ප්‍රමාණවත් නොවන මානව සහ භෞතික සම්පත් සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැක. රජය පවත්වාගෙන යන ළමා ආරක්ෂණ ආයතන තුළ ප්‍රමාණය ඉක්මවා ළමුන් සිටීම, රටේ බොහෝමයක් ප්‍රදේශ වල මෙවැනි ආයතන නොමැති බව, උසාවි වලට ළමුන් ප්‍රවාහනය කිරීමට ප්‍රමාණවත් තරම් ප්‍රවාහන පහසුකම් නොමැති වීම, මෙකී ආකාරයන්ගෙන් සමහරකි. රජයෙන් අමතර සම්පත් සොයන අතරතුර ජාත්‍යන්තර ආයතන, රාජ්‍ය නොවන සංවිධාන විසින් මූලිකව නීතිමය සහ ක්‍රියාමය වශයෙන් නීතිය ප්‍රතිසංස්කරණය තුළින් නීති කෘත්‍යයන් නොවැළැක්විය හැකි අවස්ථා වලදී හැකි තරම් ප්‍රායෝගික ලෙස ළමුන් අධිකරණයෙන් ඈත් කර තැබීමටත්, උසාවියේ ගත කරන කාලය පිළිබඳව හා ළමුන් උසාවියට ඉදිරිපත් කරන වාර ගණන හැකි තරම් අවම කිරීම පිළිබඳවත් අවධානය යොමු කළ යුතුය. කෙසේ වෙතත්, සඳහන් කළ යුතු වන්නේ අධිකරණය සමඟ පිළිගැටෙන ළමුන්ව අධිකරණ පද්ධතියෙන් වෙනත් මඟකට යොමු කිරීමට මානව සහ භෞතික සම්පත් අවශ්‍ය වන්නේ ප්‍රජා සේවා සහ ළමා පරිවාස වැනි නිවැරදි කිරීම් සහ අධීක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට ය. දිවයින පුරා ළමා අධිකරණ ගොඩනැංවීම සඳහා අරමුදල් සොයා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවයකි.[11] මෙම අධිකරණ වලින් බලාපොරොත්තු වන්නේ නීතිය සමඟ ගැටුම් ඇතිකර ගන්නා ළමුන් සහ යෞවනයන්ගේ[12] නඩු ඇසීමයි. ළමුන් වින්දිතයන් සහ බොහෝ විට ප්‍රධාන සාක්ෂිකරුවන් වන අපරාධ නඩු වලදී ඒවා විභාග කෙරෙන වැඩිහිටියන් සඳහා වූ උසාවි වල ද ළමුන්ට හිතකර තත්ත්වයක් ඇති කිරීමට ඉහත කරුණු වලට සමගාමීව සම්පත් වෙන් කිරීම සිදුවිය යුතුය. ළමුන්ගේ සාක්ෂි පටිගත කිරීම සඳහා සංගෘහිත රූපවාහිනී හෝ වීඩියෝ පහසුකම් ලබාදීම මෙන්ම ඔවුන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය පහසුකම් සහිත වෙන්කළ නැවතීමේ කාමර ගොඩනැඟීම ද මීට ඇතුළත් විය යුතුය.

---

11. වර්තමානයේ එක් ළමා අධිකරණයක් පමණක් ඇති අතර එය කොළඹ පිහිටා ඇත.

12. වයස අවුරුදු 18 ට අඩු සියලු පුද්ගලයන් ළමුන් ලෙස සැලකෙන අතර ඔවුනගේ ආරක්ෂාව සම්බන්ධව වැඩි ප්‍රමුඛතාවයකට හිමිකම් කියනු ලබයි. වයස අවුරුදු 14 ට අඩු ළමුන් සහ වයස අවුරුදු 14 සහ 18 (මුලින් මෙය 16 ක් විය) අතර යෞවනයන් ලෙස නීතිය ළමුන් තවත් අනුවර්ගීකරණයකට ලක් කරන්නේ සැලකිල්ල සහ රැකවරණය වැනි කටයුතු වලදී මෙම දෙපිරිසෙහි අවශ්‍යතාවයන් වෙනස් වන හෙයිනි.

රජය විසින් පවත්වා ගෙන යනු ලබන ළමා ආරක්ෂණ ආයතන දිවයින පුරා ස්ථාපිත කිරීමට සම්පත් වෙන් කිරීමක් අවශ්‍ය වේ. වර්තමානයේ මෙවැනි ආයතන බොහෝ විට බස්නාහිර සහ දකුණු පළාත් වල ස්ථාන ගත වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස නියමිත ප්‍රමාණයට වඩා වැඩි පිරිසක් බොහෝ ආයතන වල රඳවා ඇති අතර අදාළ පළාත් වලට අයත් නොවන රැඳවියන් අධිකරණයට ඉදිරිපත් කළ යුතු අවස්ථා වලදී ඔවුනට ඉතා විශාල දුරක් ගමන් කිරීමට සිදු වෙයි. වෙනත් පළාත් වල ළමුන්ට රැකවරණය සැපයීමට වැය වන මුදල් දැරීමට පළාත්සභා නිලධාරීන් වැඩි වැඩියෙන් අකමැත්ත පළ කරන අතර එවැනි වියදම් පළාත්සභා අතර බෙද ගැනීමේ නීතිමය ප්‍රතිපාදන ද සපයා නැත.

## 5. අපරාධ නීති ක්ෂේත්‍රය තුළ කළයුතු නෛතික ප්‍රතිසංස්කරණ

වර්ෂ 2002 ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් අධිකරණ අමාත්‍යංශයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ, පරිවාස කොමසාරිස්ගේ නියෝජිතයන් සහ ළමා ආරක්ෂාව පිළිබඳ ස්වාධීන නීති විශේෂඥයින්ගෙන් සැදුම්ලත් නීති උපදෙස් කමිටුවක් ස්ථාපිත කළේ ප්‍රථමයෙන් වියයුතු නීති ප්‍රතිසංස්කරණ හාරදීම සඳහායි. මේ කමිටුව වර්ෂ 2003 පුරා කටයුතු කළේය. මෙම කමිටුව අසභ්‍ය ප්‍රකාශන සම්බන්ධව සහ සාක්ෂි ආඥාපනතට සංශෝධනයන් සම්බන්ධව නීති කෙටුම්පත් කළේය. එමෙන්ම රැකවරණය හා ආරක්ෂාව අවශ්‍ය පුද්ගලයන් ලෙස හෝ නීතිය සමග ගැටෙන පුද්ගලයන් ලෙස අධිකරණ ක්‍රියාවලිය සමග කටයුතු කිරීමට සිදු වන්නන්ට අදාළ ළමා සහ යෞවනයන් පිළිබඳ ආඥාපනතෙහි විධිවිධාන වෙනුවට ළමා අධිකරණ විධිවිධාන පනත් 2 ක් කෙටුම්පත් කෙරුණි. මෙම ළමා අධිකරණ විධිවිධාන පනත් කෙටුම්පත මගින් නීතිය තුළ ළමුන්ට සැලකීම පිළිබඳ ව වන එක්සත් ජාතීන්ගේ කමිටුවේ අදහස් ආවරණය කිරීමට උත්සාහ දරා ඇත.

ළමා අධිකරණ විධිවිධාන පනත කෙටුම්පත් කළ අයගේ අදහස් වනුයේ පවත්නා නීති තුළින් පද්ධතිය තුළ සිටින සියලුම සහභාගි වන්නන්ට අදාළව පැහැදිලි මූල ධර්ම පද්ධතියක් නොතිබෙන බවයි. ළමා හා යෞවනයන්ගේ ආඥාපනතේ 21 වෙනි වගන්තිය තුළින් එකී ආඥාපනතට නතුවන ළමුන් පිළිබඳව මූලික මග පෙන්වීම් 3 ක් දක්වයි. ඒවානම්,

(1) උසාවිය ළමුන්ගේ සුභසිද්ධිය ගැන සැලකිය යුතු බව

(2) උසාවිය අවශ්‍ය අවස්ථාවන්හිදී අනුප්තිමත් ස්ථාන වලින් ළමුන්ව ඉවත් කළ යුතු බව සහ

(3) ළමුන්ට නිසි අධ්‍යාපනයක් සහ පුහුණුවක් පිළිබඳව පන්ති ඇති කිරීම ගැන උසාවිය සහතික විය යුතු බවයි.

කෙසේ නමුත්, මෙම වගන්තිය පනතේ ආරම්භය වෙනුවට මැද ස්ථානගත කිරීමෙන් පෙනී යන්නේ මූල ධර්ම අඩංගු ප්‍රකාශයක් ලෙස එහි බලාත්මක බව ඉවත් කිරීමක් ලෙසය. කෙසේ නමුත්, ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සමඟ බැලීමේදී පෙනී යන්නේ එය ප්‍රමාණවත් නොවන බවයි. එමනිසා ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙහි නීති උපදෙස් කමිටුව සලකනුයේ කුමන මූලික ව්‍යවස්ථාවක් වුවද ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවෙකු වන මෙම සම්මුතියේ මූල ධර්ම ප්‍රකාශය ආරම්භයේදීම ඇතුළත් කළ යුතු බවයි. එමනිසා යෝජිත කෙටුම්පත ආරම්භ වන්නේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙන් ගන්නා ලද සම්පූර්ණ මූල ධර්ම ප්‍රකාශයකිනි.

"නීතිය සමඟ ගැටුමක් ඇති හෝ ඇත්ත වශයෙන්ම අරක්ෂාව හා රැකවරණය අවශ්‍ය ළමුන් පිළිබඳ කටයුතු කිරීමේදී අධිකරණ මෙන්ම වෙනත් ආයතන සහ අධිකාරීන් තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් පහත දක්වෙන මූල ධර්ම වලට අනුව ක්‍රියා කළ යුතුයි.

(අ) ළමුන්ගේ සුභසාධනය ප්‍රධාන ලෙස සැලකිය යුතුය.

(ආ) අදාළ නීති සහ විධිවිධානයන්ට යටත්ව අධිකරණමය අධීක්ෂණය යටතේ දරුවෙකුගේ වැඩි යහපත සඳහා ඔහු දෙමාපියන්ගෙන් වෙන් කිරීම මිස එසේ නොවන විට දරුවාගේ අභිමතයට පටහැනිව ඔහු දෙමාපියන්ගෙන් වෙන් නොකළ යුතුය.

(ඇ) හැකි සෑම අවස්ථාවන්හි දී අධිකරණ ක්‍රියාවලින් හා ආයතනික ගත කිරීම් වලින් ළමුන්ව වැළැක්විය යුතුය.

(ඈ) ළමුන්ගේ ආරක්ෂාව රැකවරණය හෝ සැලකීම පිණිස රජය විසින් ඔවුන්ව යම් ස්ථානයක තැබුවහොත් එහි නොකඩවා රැඳීමේ අයිතියක් ඇත.

(ඉ) ළමුන් නීතියත් සමඟ පිළිගැටෙන අවස්ථාවන්හි දී එම ළමුන්ගේ ගෞරවය වර්ධනය වන පරිදි සහ යළි සමාජය සමඟ එක් වීමට හැකිවන ලෙස ඔවුන්ට සැලකිය යුතුය.

(ඒ) සෑම අවස්ථාවලදීම ළමුන්ගේ අධ්‍යාපනය හා පුහුණුව වෙනුවෙන් සුදුසු වගන්ති ඇතුළත් කළ යුතුය.

(උ) කිසිම ළමයෙකු ශාරීරික දඬුවම් ඇතුළු වධහිංසා වලට අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතුය.

(ඌ) නිදහස සීමා කරනු ලැබූ දරුවෙකු වැඩිහිටියන්ගෙන් වෙන් කොට තැබිය යුතු වුවත් දරුවාගේ වැඩි යහපත සලකා එසේ නොකර සිටීමට ද හැකිය.

(එ) රඳවා තබා ඇති ළමුන්ට නීති ආධාර ලැබීමට මෙන්ම පවුලේ අය සමඟ කතා කිරීමටද හැකියාව තිබිය යුතුය".[13]

අපරාධ වගකීමෙහිලා අවම වයස් මට්ටම වන අවුරුදු 8 අන්තර් ජාතිකව පිළිගත් මට්ටම දක්වා වැඩිකරන ලෙසට එක්සත් ජාතීන්ගේ කමිටුව ඉල්ලීමක් කර ඇත. නමුත් කමිටුවවත් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි (40 වන වගන්තිය) වත් අවම වයස නිශ්චිතව දක්වා නැත. අවුරුදු 10-14 ළමුන් සඳහා අධිකරණයට අභිමතයක් ලබා දෙමින් අවරුදු 8 සිට 10 දක්වා අපරාධ වගකීමෙහිලා වයස වැඩිකළ යුතුයැයි පුළුල් අදහස් විමසීමකින් යෝජනා වී ඇත. කෙටුම්පත් වගන්තිය පහත පරිදි වේ.

"**11.** (1) අවුරුදු 10 ට අඩු ළමයෙකුට විරුද්ධව කිසිදු අපරාධ අධිකරණ කටයුත්තක් ස්ථාපිත නොකළ යුතුය.

(2) එකී අවස්ථාවේ එකී ක්‍රියාවේ ස්වභාවය සහ ඵලවිපාක විනිශ්චය කිරීමට තරම් ප්‍රමාණවත් වැඩුණු තේරුම් ගැනීමේ හැකියාවක් පැවති බවට අධිකරණය සෑහීමකට පත්වන්නේ නම් මිස අවුරුදු 10 ත් 14 ත් අතර ළමයෙකුට විරුද්ධව කිසිදු අධිකරණ කටයුත්තක් ස්ථාපිත නොකළ යුතුය".

යෝජිත ළමා අධිකරණ විධිවිධාන පනත තුළ වෙනත් ප්‍රතිපාදන අතර පරිවාස වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ කාල සීමා (වර්තමානයේ ළමුන් සම්බන්ධ නඩු කටයුතු ප්‍රමාද වීමට මුල්වන එක් හේතුවකි) සහ නීතිය සමඟ පිළිගැටුමක් ඇති ළමුන්ව රඳවා තබා නොගැනීමේ පිළිවෙත්

---

13. 2003 කෙටුම්පතේ 3 වන වගන්තිය.

පැනවීමට විනිසුරුට හැකියාවක් ඇත. අවුරුදු 14 ට අඩු කිසිදු ළමයෙකු සිරභාරයට ගැනීමට නොහැකිවන්නා සේම[14] දඬයක් නොගෙවීමේ හේතුව නිසා කිසිදු ළමයෙකු හෝ තරුණ අයෙකුට බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් නොකළ යුතුය. ඇත්ත වශයෙන්ම ළමයෙකු වෙනුවෙන් වැඩිහිටියෙකු පැමිණ දඩ ගෙවීමේ වගකීම බාර නොගතහොත් ළමුන්ට දඩ නියම කිරීමට අධිකරණ බලය නැත. පිරිමින් ගැහැණු අයගෙන් ද ළමුන් වැඩිහිටියන්ගෙන් ද වරදකරුවන් එසේ නොකළ අයගෙන් ද වෙන් කර තැබීමට බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන සලසා ඇති අතර එම විධිවිධාන ළමා අධිකරණ විධිවිධාන පනතට ද ඇතුළත් කර ඇත.

කෙසේ වුව ද, පුළුල් ව සාකච්ඡාවට බඳුන් වූ මෙම කෙටුම්පතට තවමත් කැබිනට් අනුමැතිය ලැබී නොමැති බව සැලකිය යුතුය.

## 6. අධීක්ෂණ අධිකාරීන්

එක්සත් ජාතීන්ගේ වාර්තාව නිරීක්ෂණය කළ පරිදි ළමා අයිතිවාසිකම් අධීක්ෂණයෙහි ලා ආයතන 2 ක් පවතී. එනම්, ජාතික නිරීක්ෂණ කමිටුව සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියයි.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට බොහෝදුරට සමීප ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය ලියවිල්ල වන 1992 ළමා ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කළ ජාතික නිරීක්ෂණ කමිටුව වඩාත් පැරණි ආයතනයයි.[15] එය ජනාධිපති පත් කරන පුද්ගලයන් 6 දෙනෙක්ගෙන් ද නිල බලයෙන් පත්වන 10 දෙනෙක්ගෙන් ද අදාළ අමාත්‍යංශ නියෝජිතයන්ගෙන් හා පරිවාස හා ළමා ආරක්ෂක කොමසාරිස්ගෙන් සමන්විතය. එහි කාර්යභාරය වනුයේ-

(අ) එයට යොමුවන ඕනෑම කාරණයකට උපදෙස් සැපයීම;

(ආ) ප්‍රඥප්තියේ ප්‍රතිපාදන වලට අනුව දැනුවත් කිරීම් නිර්මාණය කිරීම;

---

14. යොවුන් පුද්ගලයෙකු ඔහු හෝ ඇය කරන ලද වරදෙහි බරපතලකම හෝ, මෙල්ල කර ගැනීමේ අපහසුව හෝ දරුණුකම යන අති විශේෂ අවස්ථා වලදී පමණක් ළමා ආරක්ෂණ ආයතනයකට නොයවා රැඳවුම් ආයතනයකට යැවීමට හැකියාව ඇත.

15. ළමා ප්‍රඥප්තිය පාර්ලිමේන්තු පනතක් නොවන නිසා එය බලාත්මක නීතියක් බවට පත් නොවේ, එහෙත් එය කැබිනට් අමාත්‍යවරුන් විසින් විධිමත්ව පිළිගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බැවින් රාජ්‍ය ප්‍රතිපත්තීන් වල බලධාරී ප්‍රකාශයක් බවට පත් වී ඇත.

(ඇ) නීති ප්‍රතිසංස්කරණයන් වර්ධනය කිරීම සහ ප්‍රඥප්තියේ විස්තර කර ඇති පරිදි නිර්දේශ ඉදිරිපත් කිරීම:

(ඇ) ප්‍රඥප්තියේ ප්‍රතිපාදන ක්‍රියාත්මක වීම් වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.

ජාතික නිරීක්ෂණ කමිටුවේ වාර්තා වලට අනුව මෙම කමිටුව මුලින්ම අදහස් කළේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ඉතා උසස් ආයතනයක් ලෙස කටයුතු කිරීමටයි. පසුව 1996 දී විවිධ කාර්ය ජනාධිපති කාර්ය බලකායක් ළමා අපචාර නැවැත්වීමට ස්ථාපිත කරන ලදී. මෙහි සමහර සාමාජිකයෝ ජාතික නිරීක්ෂණ කමිටුවේ අය වූහ. මෙම තත්ත්වය තුළ එහි කාර්යයන් පිළිබඳ අපැහැදිලි තත්ත්වයක් මතුවිය.

විශේෂ බලකාය ඉදිරිපත් කළ එක් ප්‍රධාන නිර්දේශයක් වූයේ ළමා අපචාර සහ ළමා අපයෝජනයන්ට විරුද්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරන මූලික ආයතනය වශයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කිරීමයි. එහි කාර්යභාරයන් තුළට අන්තර්ගත වූයේ[16]

- ළමා අපචාර සහ ළමා වින්දිතයන් අපචාරයට ලක්වීම වැළැක්වීමට ජාතික ප්‍රතිපත්ති සහ නිවාරණ පිළිවෙත් පිළිබඳ රජයට උපදෙස් දීම.
- අපචාර වලින් ළමුන් ආරක්ෂා වීමේ අයිතිය සහ අපචාර වැළැක්වීමේ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම.
- ළමා අපචාර වැළැක්වීමට සහ ළමා වින්දිතයන් ආරක්ෂා කිරීමට අදාළ අමාත්‍යාංශ, පළාත් සභා සහ අනෙකුත් පොදු අධිකාරීන් සමඟ මෙන්ම පෞද්ගලික අංශයේ ආයතන වලටද උපදෙස් දීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නීති සහ පරිපාලන ප්‍රතිසංස්කරණයන් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ළමා අපචාර වලට බලපාන සියලුම නීති ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීම.

---

16. ජාතික ළමා ආරක්ෂණ අධිකාරි පනතේ 14 වන වගන්තියෙහි මූලික විධිවිධානයන්හි සාරාංශයකි.

- සන්නද්ධ ගැටුමට මැදිවූ ළමුන්ගේ මානුෂිකත්වය සලකා නිවාරණ පිළිවෙත් නිර්දේශ කිරීම.
- ළමා අපචාර වලට විරුද්ධ ව්‍යාපාර වලට, අදාළ අධිකාරීන්ට සහ ආයතන වලට සහාය වීම.
- ළමා අපචාර පිළිබඳව ජාතික දත්ත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. මෙම මූලික පරමාර්ථ මුල් කරගෙන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිය නීති ප්‍රතිසංස්කරණ කටයුතු මෙන්ම ආරක්ෂාව සැලසීම සහ බලාත්මක කිරීම යන කරුණු සඳහා ආරම්භයේ සිට වැඩි අවධානයක් යොමු කළේය. එමනිසා එහි කටයුතු අපරාධ නීතිය සමග බොහෝ සේ එක් වී පවතියි.

ඒ අනුව ජාතික නිරීක්ෂණ කමිටුවේ තොරතුරු මත බොහෝ විට ඉහත කී කරුණු පිළිබඳව කටයුතු කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ළමුන්ගේ අධ්‍යාපනය සහ අනෙකුත් සිවිල් කටයුතු පිළිබඳ සොයා බැලීමට ජාතික නිරීක්ෂණ කමිටුවට සිදු විය.

එක්සත් ජාතීන්ගේ කමිටුවෙහි අවධානයට යොමු වූ තවත් කරුණක් වූයේ, ජාතික නිරීක්ෂණ කමිටුව සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එකම කටයුතු සිදු කිරීමෙන් ඇති විය හැකි ගැටලුවයි. ඒ අනුව ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට ගැලපෙන ලෙස සිවිල් නීති ක්‍රමානුකූල විචාරයකට ලක් කිරීමට වඩාත් සුදුසු ආයතනය ජාතික නිරීක්ෂණ කමිටුව බව පෙනී යන ලදී.

## 7. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාකාරකම්

වර්ෂ 2002/2003 ජාතික ළමා ආරක්ෂක වාර්තාවට අනුව, එම අධිකාරිය විසින් දිස්ත්‍රික්ක 12ක ළමා ආරක්ෂණ කමිටු ස්ථාපිත කර සම්බන්ධීකරණය කොට ඇත. මේවා සමාජයේ විවිධ ආයතන ඇතුළත්ව සැදුනු කමිටු වේ. එනම් එකී කමිටු ප්‍රාදේශීය නිලධාරීන්, ළමා රෝග විශේෂඥයින්, පොලිස් නිලධාරීන්, ජාතික සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂණ සේවාවන්හි නියෝජිතයින්, රාජ්‍ය නොවන සංවිධාන සහ සමාජ නායකයන්ගෙන් සමන්විතය. මෙකී කමිටු මගින් ළමා අපචාර පැමිණිලි භාරගෙන වින්දිතයන් අදාළ ආයතන වලට යොමුකරයි. තවද දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ද සංවිධානය කරයි.

එසේම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින්ද අඛණ්ඩව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එකී දැනුවත් කිරීමේ වැඩසටහන් තුළ එක්සත්

ජාතීන්ගේ ළමා අරමුදලේ ආධාර මත ළමා අපචාරයන්ට විරුද්ධව දැවැන්ත පෝස්ටර් ව්‍යාපාරයක්ද අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අරමුදල් මගින් ළමා ශ්‍රමයට විරුද්ධ දැවැන්ත පෝස්ටර් ව්‍යාපාරයක් ද ගෙන යන ලදී. අධිකරණ නිලධාරීන් ළමුන් සම්බන්ධව සැලකීමට හෝ සහන සැලසීමට කෙරෙන රඳවා ගැනීමට හෝ රඳවා නොගැනීමට කෙරෙන නියෝග වලදී අවශ්‍ය සිය බලතල පිළිබඳ වඩා හොඳ දැනුවත් කිරීමකට අවශ්‍ය පොත් පිංචක් නිර්මාණය කිරීම ද සිදු කෙරේ.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්තා වලට අනුව, බලාධිකාරිය යටතේ විශේෂ ජාතික ළමා ආරක්ෂක පොලිස් ඒකකයක් ස්ථාපිත කළ අතර පොලිස් නිලධාරීන් 2 සිට 16 දක්වා වැඩිකර ඔවුන්ව අධිකාරියට අනුයුක්ත කොට ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිය නියෝගයන්ට අනුව යමින් ළමා අපයෝජන සිද්ධීන් වලට අදාළ විමර්ශන සහ අපරාධ නඩු කාර්ය පටිපාටිය නිරීක්ෂණය කරන බව පැවසෙයි. මහජනතාවගෙන් පැමිණිලි සෘජුවම භාරගන්නවාට අමතරව එහි පොලිස් ඒකකය අන්තර්ජාතික පොලිසිය හා අදාළ තනාපති කාර්යාල මගින් ළමා අපචාර වලට සම්බන්ධ විදේශිකයන් සම්බන්ධයෙන් කටයුතු කරයි.

මේ අතරම පොලිස් දෙපාර්තමේන්තුව දක්වන්නේ ඔවුන් විසින් 1990 දී "කාන්තා හා ළමා කාර්යාංශය" යනුවෙන් විශේෂ ඒකකයක් ස්ථාපිත කොට එය දන් දිවයින පුරා ව්‍යාප්ත කොට ඇති බවත් ය. ජ්‍යෙෂ්ඨ පොලිස් ආරංචි මාර්ග වලට අනුව[17] මෙම ක්‍රියාවලිය යාපනය ඇතුළු පොලිස් ස්ථාන 354 ක ක්‍රියාත්මක වෙයි. ප්‍රධාන පොලිස් ස්ථානවල මෙකී අංශවල කාර්යභාර නිලධාරි කාන්තා උප පොලිස් පරීක්ෂකවරියක් වන අතර අනෙකුත් පොලිසිවල කාර්යභාර නිළධාරි කාන්තා පොලිස් කොස්තාපල්වරියක් වන නමුත් මොවුන් පොලිස් ස්ථානාධිපතිගේ අධීක්ෂණයට යටත් ය. පොලිසියට අනුව මේවායේ කටයුතු කරන නිලධාරීන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් අදාළ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ දේශන වලින් සහ පුහුණු කිරීම් වලින් මනා අවබෝධයක් ලබා ඇති බවයි. ළමා අපචාර වලදී අවශ්‍ය වන ජාන පර්යේෂණ සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ අනුග්‍රහය ඇතිව ජාන සලකුණු විශ්ලේෂණය සඳහා ඒකකයක් රාගම වෛද්‍ය පීඨය තුළ ස්ථාපිත කරන ලදී.

17. 2003 දී මෙම ලේඛකයා සමඟුව සාකච්ඡා කරන ලදී.

## 8. ළමා ශ්‍රමය

ළමුන්ව නිවෙස්වල මෙහෙකාරකමට යොදගැනීම නොකඩවා පුළුල්ව ව්‍යාප්ත වෙමින් පවතී.[18] ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් රටේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක සිදුකරන්නට යෙදුණු ළමා ශ්‍රමයේ ව්‍යාප්තිය පිළිබඳ සමීක්ෂණයකින් දනගත හැකි වූයේ වතු ආශ්‍රිත ප්‍රදේශ වලින් මෙහෙකාරකමට ළමුන් වැඩි සංඛ්‍යාවක් සපයන බවයි. අනෙකුත් ප්‍රදේශ වූයේ ගැටුම් පවතින ප්‍රදේශ, ග්‍රාමීය ප්‍රදේශ සහ නගර අභ්‍යන්තරයේ මුඩුක්කුවල ජීවත්වන ළමුන්ය. වැඩිම ළමා මෙහෙකාර සේවයක් බස්නාහිර පළාතේ නිවෙස් තුළ දක්නට ලැබිණි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ ප්‍රධාන වතු වෘත්තීය සමිති[19] පිළිගෙන ඇති ආකාරයට මැනවින් සංවිධානය වූ ජාලයක් තුළින්, ඉල්ලුමක් ඇති ප්‍රදේශ සහ සම්පත් ඇති ප්‍රදේශ අතර සම්බන්ධීකරණයක් පවතී.

ළමුන්ව මෙහෙකාර සේවයට යොද ගන්නා වැඩිහිටියන්ව කොළඹ බාලාපරාධ උසාවියට ගෙන ඒමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. වැඩිහිටි වරදකරුට දඩුවම් පැනවීමට මූලාසන ගන්නා විනිසුරුතුමාට බලයක් නොමැති නමුත් එම වින්දිත ළමයාට වන්දි මුදලක් ගෙවීමට වැඩිහිටි වරදකරු පෙළඹවීමට බොහෝ විට හැකි වී ඇත. නීතිය බලාත්මක කිරීමේ දෘෂ්ටිකෝණයෙන් සලකා බලන කල මෙහි පරිචය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැක. එසේවුවත් වන්දි ගෙවීමේ වගන්තිය ජනප්‍රිය පිළිවෙතයි.

මෙකී ගැටලුව දන් 2003 අංක 08 දරණ කාන්තා, තරුණ හා ළමා සේවක (සංශෝධන) පනතින් සලකා බලා ඇත. මෙකී සංශෝධනයෙන් වැරදි සහගත සේවා යෝජකයාට රු. 10,000 ක දඩයක් හෝ මාස 12 කට නොවැඩි සිරගත කිරීමකින් හෝ මේ දෙකින්ම දඩුවම් කිරීම තුළින් දණ්ඩනීය පිළිවෙත් වැඩිකර ඇත. මීට අමතරව එකී මහේස්ත්‍රාත් උසාවිය

---

18. ජාතික ළමා ආරක්ෂණ අධිකාරියෙහි සභාපති මහාචාර්ය හරේන්ද්‍ර ද සිල්වා මහතාට අනුව 2002 වසරේ වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමුන් 222 ක් සහ පිරිමි ළමුන් 154 ක් ගෘහ කම්කරු සේවයේ යොදවා සිටි බව අනාවරණය කර ගෙන ඇත. සත්‍ය අගයන් මෙම අගයන්ට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි බව විශ්වාස කෙරේ.
19. ලංකා කම්කරු කොන්ග්‍රසය, ජාතික කම්කරු කොන්ග්‍රසය සහ ජාතික වතු කම්කරු සංගමය ජාත්‍යන්තර කම්කරු සංවිධානය/ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ අන්තර්ජාතික වැඩසටහන සමඟ එක්ව මෙම ප්‍රශ්නය අවසන් කිරීමට මාර්ග සොයමින් සිටී.

සෑහීමකට පත්වන්නේ නම් වින්දිතයාට වන්දි මුදලක් ලබාදෙන ලෙසට නියෝග කිරීමේ බලයක් ඇත.

වර්ෂ 2001 දී ශ්‍රී ලංකාව ස්ථිර කළ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 182 වන ප්‍රඥප්තියට අනුව රජය "හදිසි කටයුත්තක් ලෙස සලකා ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය සූරාකෑම මුලිනුපුටා දැමීමට හා තහනම් කිරීම සඳහා වූ ක්ෂණික සහ ඵලදායී ක්‍රම" ක්‍රියාවේ යෙදවිය යුතුය. මෙකී සම්මුතියෙහි 3 වන වගන්තියට අනුව ඉතාමත් නරක ස්වරූපයේ ළමා ශ්‍රමය ලෙස සලකනුයේ -

(අ) සියලුම ආකාරයේ වහල්භාවය හෝ වහල්භාවයට සමාන ආකාරයේ ක්‍රියාකාරකම්, එනම් සන්නද්ධ ගැටුම් සඳහා අනිවාර්ය බඳවා ගැනීම ඇතුළු ළමුන්ව විකිණීම සහ ළමුන්ව වෙළඳාම් කිරීම, ණය බැඳුම්කර, දාසභාවය, බලහත්කාරය, අනිවාර්ය ශ්‍රමය ගැනීම.

(ආ) ළමුන්ව ගණිකාවක් ලෙස භාවිතා කිරීම හෝ ලබාදීම, කාමෝද්දීපන නිෂ්පාදන වලට හෝ කාමෝද්දීපන ක්‍රියාකාරකම් වලට ළමුන් ලබාදීම.

(ඇ) ළමුන්ව අයුතු ක්‍රියාකාරකම් වලට යොදා ගැනීම හෝ එසේ කිරීමට ලබාදීම. විශේෂයෙන් අන්තර්ජාතික සන්ධානවල නිර්වචනය වන ආකාරයට ළමුන්ව මත්ද්‍රව්‍ය වෙළඳාමට යොදා ගැනීම.

(ඈ) ස්වභාවය සහ පරිවේෂණීය තත්ත්වයක් අනුව ළමුන්ගේ සෞඛ්‍යයට අහිතකර ආරක්ෂාවට අහිතකර ආචාර ධර්ම වලට විරුද්ධ කාර්යයන්හි නියුක්ත කිරීම.

දැනටමත් ශ්‍රී ලංකාවේ නීතිය තුළ නීත්‍යානුකූල නොවන බොහොමයක් කාරණා ඉහත (අ) (ආ) සහ (ඇ) යන උප ඡේදයන්ට යටත් වේ. අධිකරණ අමාත්‍යංශය වසර 2004-2008 සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළින් නිර්මාණය කර ඇත්තේ වර්තමානයේ දණ්ඩ නීති සංග්‍රහය තුළින් ආවරණය නොවන මෙම උප පරිච්ඡේද මඟින් දක්වා ඇති කරුණු දණ්ඩ නීති සංග්‍රහයට ගෙන ඒමට අවශ්‍ය සංශෝධන ගෙන ඒමටයි. මීට 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනතෙහි 360(ඇ) හි දක්වන "විකිණීම සඳහා" යන්න පිළිබඳ නිර්වචනයට වඩා සම්පූර්ණ නිර්වචනයක් ඇතුළත් කිරීම අවශ්‍ය වන්නේ දැනට ඉන් දරුවන් හදා වඩා ගැනීම සඳහා වන විකිණීමක් අර්ථවත් කෙරෙන බැවිනි. විකිණීමට මිනිසුන් රැගෙන යාම

ජාත්‍යන්තර නීතියේ දක්වා ඇත්තේ රාජ්‍ය සම්බන්ධතා චාරිත්‍ර වලට අනුව ආරක්ෂා කිරීම, මිනිසුන් විකිණීමේ යෙදෙන පුද්ගලයන් මැඩ පැවැත්වීම හා දඬුවම් කිරීමටත් විශේෂ වශයෙන් ස්ත්‍රීන් සහ දරුවන් සම්බන්ධයෙන් ජාතීන් අතර සිදුවන සංවිධානාත්මක අපරාධ පිළිබඳ වර්ෂ 2000 එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි (පලෙර්මෝ ප්‍රඥප්තිය) 3 වන වගන්තිය හා අදාළ මූලපත්‍රයෙහි "මිනිසුන් විකිණීම" අර්ථ නිරූපණය කර ඇත්තේ පහත දක්වෙන ආකාරයටය.

> "පුද්ගලයෙක්ව විකිණීම යන්නෙහි අර්ථය වන්නේ පුද්ගලයන්ව අපයෝජනය කිරීමේ අදහසින් අලුතෙන් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කිරීම, රඳවා ගැනීම හෝ තර්ජනය කර හෝ බලය පාවිච්චි කර හෝ වෙනත් ආකාරයකින් බලෙන් ලබා ගැනීම, අපහරණය කිරීමෙන්, වංචාවෙන්, රැවටීමෙන්, බලය අනිසි ලෙස භාවිතා කිරීමෙන් අවදානම් සහිත තත්ත්වයන් ඇති කිරීමෙන්, ගෙවීම් හෝ වරප්‍රසාද ලබා දීමෙන් හෝ ලබා ගැනීමෙන් වෙන අයෙකුගේ පාලනයේ සිටින පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීමේ අරමුණෙන් කිසියම් ගෙවීමක් හෝ වරප්‍රසාදයක් ලබාදීම හෝ ලබා ගැනීමයි".

කෙසේ වෙතත්, පැවසිය යුත්තක් වන්නේ මේ සම්බන්ධ නීතිය විධිමත් කිරීම හා අදාළ මිනිසුන් විකිණීම පිළිබඳ විවිධ පියවර මූලික මට්ටමෙන් ගත යුතුව ඇති බවයි. රැකියාවන් සඳහා ළමුන් අපයෝජනයට ලක් කිරීමට විරුද්ධව ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සැලැස්මක් නිර්මාණය කිරීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානය, රජය, ළමා අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාකාරී රාජ්‍ය නොවන සංවිධාන එක්ව ජාතික කාර්ය බලකායක් ස්ථාපිත කළහ. මෙකී දස අවුරුදු සැලැස්ම නීති ප්‍රතිසංස්කරණ, නීති බලාත්මක කිරීම, ආයතන ශක්තිමත් කිරීම, පර්යේෂණ කිරීම, වැළැක්වීම්, බේරා ගැනීම්, පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංකලනය යන අංග වලින් සමන්විතය. අධිකරණ අමාත්‍යංශය විසින්ම සිය ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් කැපවී ක්‍රියා කරනුයේ පුද්ගලයන් විකිණීම සම්බන්ධව දණ්ඩ නීති සංග්‍රහයට අවශ්‍ය වගන්ති හඳුන්වා දීමටය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි ආධාර ඇතිව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මිනිසුන් විකිණීමට එරෙහිව සහ සෝදිසි කිරීමේ ඒකකයක් ස්ථාපිත කර ඇත. මෙකී බහුකාර්ය කණ්ඩායම නීති බලාත්මක කරන ආයතන හා සම්බන්ධව ළමා ජාවාරම් සිද්ධීන් අවම කිරීමට කැපවී කටයුතු කරයි. මෙහි වෙනත් ක්‍රියාකාරකම් අතර "සයිබර් වොච්" වැඩසටහන මගින් වෙබ් අඩවි අධීක්ෂණයට ලක් කරනුයේ අන්තර්ජාලය හරහා සම්බන්ධකම්

පවත්වන ළමුන් සමඟ කාමයෙහි යෙදෙන්නවුන් ගෙන් ශ්‍රී ලංකාවේ ළමුන් මුදවා ගැනීමේ අරමුණිනි. "සේව් ද චිල්ඩ්රන්" (නෝර්වේ) ආයතනයෙන් අනුග්‍රහය ලබන මෙකී ඒකකයට වර්ෂ 2002 දී පැමිණිලි 465 ක් ලැබිණි.

මේ අතරතුර 182 සම්මුතියේ 3(ඩී) ට (ළමා ශ්‍රමයේ අන්තරාදයක ස්වරූපය) අනුව සේවායෝජක ආයතන හා සේවකයන්ගේ ද උපදෙස් විමසීමෙන් පසු ජාතික නීතින් සහ රෙගුලාසි තීරණය කළ යුතු අතර එහිලා අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගත යුතුය.

වර්ෂ 2001 දී ජාතික නියාමක කමිටුව මේ අරමුණ සඳහා කමිටුවක් පත් කළේය. මෙම කමිටුව 2003.8.22 දින, අන්තරායකාරි රැකියාවන් අඩංගු 50 ක පමණ ලැයිස්තුවක් එක් එක් රැකියාවට නිර්දේශ සමඟ ඉදිරිපත් කරන්නට යෙදුණි. රාජ්‍ය නියෝජිතයන්, සේවා යෝජකයන් සහ වෘත්තීය සමිති යන කොටස් තුන එක්ව සැදුම්ලත් ජාතික කම්කරු උපදේශන කමිටුව මෙම නිර්දේශ ආදේශ කර ගන්නා ලද්දේය.[20]

දැනට ඉතිරිව ඇත්තේ මෙම නිර්දේශ බලාත්මක කිරීමය. කම්කරු දෙපාර්තමේන්තුව විසින් වර්තමානයේ වැඩි අවධානයක් යොමුකොට ඇති ක්‍රමවේදයන් සකස් කොට ඇත්තේ කාන්තා, යොවුන් හා ළමා සේවක පනත යටතේය.

## 9. අපහරණය/සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් බඳවා ගැනීම

යුද්ධය පැවති ප්‍රදේශවල සිටින ළමුන්ට සටන් විරාම ගිවිසුමේ ප්‍රතිලාභ හිමි වූ බවට කිසිදු සැකයක් නැත. අවතැන් වූවන් යථා තත්ත්වයට පත්වීමද, විනාශ වූ සහ අබලන් වූ පාසල් ක්‍රමයෙන් පුනරුත්ථාපනය ද මේ අතර සිදු වූ ක්‍රියාකාරකම් කිහිපයකි. එනමුත් එල්.ටී.ටී.ඊ. ය විසින් සිදු කරනු ලබන ළමා අපහරණයන් සහ සන්නද්ධ ගැටුම් සඳහා ළමුන් බඳවා ගැනීම තවමත් පවතින බවට සැලකිය යුතු සාක්ෂි පවතී.

එල්.ටී.ටී.ඊ. ය අන්තර්ජාතික ප්‍රජාවට ළමුන් සන්නද්ධ අර්බුදයට බඳවා නොගන්නා බවට නිරන්තරව ප්‍රතිඥා දෙන අතර තව දුරටත් එම බඳවා ගැනීම් සිදු කිරීම ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර අර්බුදයේ පාලනය කිරීමට අපහසු ප්‍රශ්නයක් වී තිබේ.

20. ලේඛකයා අතිරේක කොමසාරිස් ඒ.ඩී.එල්.සී.චන්ද්‍රසිරි සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව.

ස්ථාවර සාමයක් අපේක්ෂාවෙන් වර්ෂ 2 කට පෙර අත්සන් කරනු ලැබූ සටන් විරාම ගිවිසුමත් සමඟම මූලික අවධානය යොමු වූ ප්‍රශ්නයක් වන්නේ එල්.ටී.ටී.ඊ. අණසක යටතේ සිටින ළමා සොල්දාදුවන් මුදා හැරීම සහ පුනරුත්ථාපනය කිරීමයි.

විවාදපන්න පියවරක් ලෙස එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, දෙමළ පුනරුත්ථාපන ආයතනය (මෙය එල්.ටී.ටී.ඊ. යට අනුබද්ධිත යැයි පුළුල් විශ්වාසයක් ඇත.) හා එක්ව මුදා හැරීමට නියමිත ළමා සෙබළුන් සිය පවුල් වෙත යැවීමට පෙර මාස තුනක කාලයක් සංක්‍රාන්ති නිවාස වල රැඳවීමට එකඟතාවයක් ඇති කර ගැනුණි. 2003 අගෝස්තු සහ 2005 අප්‍රේල් අතර කාලය තුළ මෙකී වැඩසටහනකින් වැය කිරීමට වෙන් කර තිබූ මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 1.15 කි. (රුපියල් බිලියන 1.18) මෙකී එක් මධ්‍යස්ථානයක් ආහාර අවශ්‍යතා නොමැතිව ගොඩනැගීමේ වියදම් ලෙස[21] රුපියල් මිලියන 9 ක් වැය වන බව දෙමළ පුනරුත්ථාපන සංවිධානය තක්සේරු කර ඇත. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ වාර්තා තහවුරු කරන පරිදි 2003 ඔක්තෝබර්හි කිලිනොච්චියේදී මෙකී ප්‍රථම මධ්‍යස්ථානය ආරම්භ කළ අතර තවත් මධ්‍යස්ථාන 2 ක් පිළිවෙළින් ත්‍රිකුණාමලය සහ මඩකලපුවේ ඇති කිරීමට සහ ඒවාට අවශ්‍ය කාර්ය මණ්ඩලයක් ද සේවයේ පිහිටුවීමට මුදල් ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය එකඟ වූ යෝජනා ආරක්ෂා කිරීම රිසියෙන් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ නියෝජිත ටෙඩ් චායිබාන් පැවසුවේ පූර්ව ආදර්ශ නොමැති ළමා සොල්දාදුවන් නිදහස් කිරීම ස්ථිර වන බවත් ඒ තුළින් ඔවුන් සිය පවුල් වලට යන බවත්ය. ඔහු අවධාරණය කළ පරිදි මෙම ළමුන් එකී මධ්‍යස්ථානවල තබා ගත හැකි උපරිම කාලය මාස 3 ක් වන අතර ඒ අතරින් බොහොමයක් ඉක්මණින් ආපසු යැවිය හැකි බවය.[22] මෙකී සංක්‍රාන්ති කාලය තුළින් බලාපොරොත්තු වන්නේ එක් එක් ළමයාගේ අවශ්‍යතා තක්සේරු කිරීමටත් අවස්ථාවක් ලබාදීමත් සිය නිවෙස් වලට යාමට පෙර ළමුන්ට සන්නද්ධ වාතාවරණයෙන් මිදීමට අවස්ථාවක් ලබා දීමත්ය.

මේ සම්බන්ධව පවතින විවේචනය වන්නේ කෙළින්ම ළමුන්ව ඔවුන්ගේ පවුල් වලට යොමු කිරීම වාසි සහගත බවයි. එසේම තවත් ප්‍රශ්නයක්

21. 2003 අගෝස්තු 17 සන්ඩේ ලීඩර්.

22. 2003 සැප්තැම්බර් 28 සන්ඩේ ලීඩර් හි පළවූ ටෙඩ් චායිබාන් එවූ ලිපිය.

වන්නේ මෙකී ක්‍රියාවලිය තුළ දෙමළ පුනරුත්ථාපන සංවිධානය සැලකිය යුතු ප්‍රමාණයකින් දයක වුවත් අනෙකුත් ළමා ආරක්ෂණ සංවිධානවල අඩු දයකත්වයයි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ නියෝජිතයන් සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශකයන් මාධ්‍ය වලට ප්‍රකාශ කරන්නේ ළමුන් නැවතත් එල්.ටී.ටී.ඊ. සංවිධානය වෙතට නොයෑම සම්බන්ධයෙන් වගකීමක් නොමැති බවයි.[23] ළමුන්ව සිය පවුල් වලට සෘජුවම බාරදීමට කලින් ඔවුන් එල්.ටී.ටී.ඊ. සංවිධානයට නොයෑම සම්බන්ධයෙන් සහතිකයක් ලබා දිය නොහැකි බවයි. 2003 මැයි මස දී ජාත්‍යන්තර ක්ෂමා ආයතනය ළමා සොල්දදුවන් බඳවා ගැනීම පිළිබඳව එල්.ටී.ටී.ඊ. සංවිධානයට චෝදනා කරන ලදී. සමහරක් අවුරුදු 10 ක පමණ කුඩා දරුවන්ය. ස්කැන්ඩිනේවියානු තාවකාලික සටන් විරාම නිරීක්ෂකයින් වාර්තා කළේ 300 ට වඩා අධික ප්‍රමාණයක් 2002 පෙබරවාරි සිට 2003 සැප්තැම්බර්[24] දක්වා කාලය තුළ අළුතින් බඳවාගෙන ඇති බවයි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සඳහන් කරන්නේ සාම ක්‍රියාවලිය ආරම්භයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය ළමුන් 350 ක් නිදහස් කර තිබුණත් ළමුන් 700 කට අධික ප්‍රමාණයක් බඳවාගෙන ඇති බවයි.[25]

මේ අනුව තර්ක කළ හැක්කේ එල්.ටී.ටී.ඊ. සංවිධානය වර්තමානයේ භුක්ති විඳින නිදහස තුළින් ඔවුන් රජයේ පාලන ප්‍රදේශ වලට ගමන් කරන්නේ ඇත්ත වශයෙන් ම නව බඳවා ගැනීම තුළින් තම ජයග්‍රහණය වැඩිකර ගැනීමට බවයි. අපහරණයන්ගෙන් ගැලවී ආ ළමුන්ගේ, චාරිකා වාර්තා සහ තැනින් තැන දෙමාපියන්ගෙන් එල්ලවන ප්‍රතිරෝධීය බලපෑම් වලින් දිස්වන්නේ ළමා බඳවා ගැනීම සම්බන්ධයෙන් සාමාන්‍ය මහජනයා පොදුවේ අකමැති බවයි.

මේවායින් පෙනී යන්නේ මෙවැනි ළමුන්ගේ වගකීම් සම්බන්ධයෙන් පැහැදිලි හිඩසක් ඇති බවයි.

## 10. නිගමනය - ළමුන්ගේ අදහස්

යම් පද්ධතියක් ක්‍රියාත්මක වීම පිළිබඳව හොඳම විනිසුරන් වන්නේ එහි අවසාන ප්‍රතිඵලය භුක්ති විඳින්නන් බවට තර්ක කළ හැක. මේ සන්දර්භය

23. 2003 අගෝස්තු 17 සන්ඩේ ලීඩර් හි වෙඩි චායිබාන් සහ ජෝන් ගුණරත්න ගේ සම්මුඛ සාකච්ඡාව.

24. 2003 සැප්තැම්බර් 30 ඩේලි නිව්ස් හි පළවූ ඒ.එෆ්.පී. වාර්තාව.

25. ඉහත පරිදි.

තුළ වර්ෂ 2003 කාලයේ දී ළමුන් වෙනුවෙන් වූ ජාතික ක්‍රියාකාරී සැලසුමේ මූලික කටයුතු වල කොටසක් ලෙස එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සමඟ සේව් ද චිල්ඩ්‍රන් සහ සර්වෝදය එක්ව රටේ විවිධ ප්‍රදේශවල[26] ළමුන් සමඟ උපදේශන මාලාවක් සංවිධානය කළහ. 2003 අගෝස්තු 18 දින කොළඹදී පැවති රටේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි ළමා කණ්ඩායම් නියෝජිතයන් සහ විවිධ අමාත්‍යංශවල නිලධාරීන් සහ ළමා ආරක්ෂක අධිකාරියෙහි විවිධ පාර්ශවයන් හි රාජකාරි කරන උපදේශකයන් සමඟ පැවති ක්‍රියාකාරී පිළිසඳරකින් ද සමන්විත වූ වැඩමුළුවකින් මේ සැසිවාරය අවසානයට පත්විය. පහතින් දක්වෙනුයේ ඔවුන් විසින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ කාරණාවන්හි සාරාංශයකි.

අපරාධ වලට වින්දිතයන් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සලකා බැලීමේදී ළමුන් විසින් පැහැදිලි වශයෙන් අවධානය යොමු කරන්නට යෙදුණේ නඩු පමාවීම, ළමා අපචාර නඩු උසාවියේ සිටින පිටස්තර පුද්ගලයන් ඉදිරියේ ඇසීම,[27] චූදිතයන් ඇප මත මුදා ඇති විටෙක වින්දිත ළමුන්ට අඩු ආරක්ෂාවක් හිමිවීම ආදියයි. සමහරක් පෙන්වා දුන්නේ චූදිතයා ඇප පිට මුදාහැර ඇති විටක රැඳවීම් ආයතනවල සිටින වින්දිත ළමුන්ට සිදුවන විෂමතා ගැනය. තවදුරටත් කලකිරීමට හේතු වන්නේ නීති පද්ධතිය තුළ ඔවුන් නිරීක්ෂණය කර ඇති අයුක්ති සහගත බවත් ඔවුන්ගේ අදහසට අනුව යහමින් මුදල් ඇති වරදකරුවන් නිදහස් විය හැකි බවත්ය.

එමනිසා කඩිනම් උසාවි කාර්යාවලියක අවශ්‍යතාවය මතුවී ඇත්තේ නඩුවත් සමඟම ඔහුගේ, ඇයගේ වර්ධනය නො සිදුවීමටත් වඩා හොඳ නීතිය බලාත්මක කිරීමකුත්; ළමයින්ට හිතවත් උසාවි ක්‍රියාවලීන්; සහ විශේෂයෙන් චූදිතයන්ට ඇප ලබාදීමේදී[28] වැරදි වලට භාජනය වූ වින්දිතයන්ට වඩා

---

26. මෙම සාකච්ඡාවට ළමුන් යාපනය, මන්නාරම, මුලතිව්, පුත්තලම, අනුරාධපුරය, වැලිමඩ, අම්පාර, නුවර යන ප්‍රදේශ වලින් පැමිණියේය.

27. එවැනි අවස්ථාවන්හිදී පිටස්තරයන්ව උසාවි භූමියෙන් ඉවත් කිරීමට උසාවියට බලය ඇත.

28. 1997 අංක 30 දරණ ඇප පනත යටතේ ඇප නියම කිරීම ව්‍යතිරේඛයකට වඩා නීතියක් විය යුතු අතර සැකකරු නඩු විභාගයට ඉදිරිපත් නොවන බවට පිළිගත හැකි හේතු ඇත්නම් හෝ, යුක්තිය පසිඳලීමේ කාර්යයට බාධා සිදු වේ නම් හෝ, ඇප මත සිටියදී වරදක් සිදු කිරීමට ඉඩ ඇත්නම් හෝ, සිදුවී ඇති වරදේ බරපතලකම අනුව ඇප දීම මගින් මහජන කැළඹීමක් හෝ නොසන්සුන් කමක් ඇති කරවයි නම් ඇප දීම ප්‍රතික්ෂේප කිරීමට උසාවියට බලය ඇත.

හොඳ ආරක්ෂාව සැපයීමත් සඳහාය. ඔවුන් තවදුරටත් ඉල්ලා සිටියේ පළාත් 9 සඳහාම ළමා අධිකරණ අවශ්‍ය බවය. මේවා නීතිය සමග ගැටුම් ඇති කරගන්නා ළමුන් සඳහා ද නැතහොත් ළමුන්ට එරෙහිව කරන ලද අපරාධ පිළිබඳ කටයුතු කරන උසාවි ද යන්න පිළිබඳ අපැහැදිලි තත්ත්වයක් පෙනුණි.

තවත් ළමුන් අතර විවාදයට තුඩුදුන් කරුණක් වන්නේ අවුරුදු 14 දක්වා අධ්‍යාපනය අනිවාර්ය වුවත් ඉන්පසුව ළමුන්ට පාසල් යාමට අවශ්‍ය වුවත් දෙමව්පියන්ට නීතියෙන් ඒ සඳහා බල කළ නොහැකි වීමයි. මෙකී සාකච්ඡාව තුළ ප්‍රකටව පෙනෙන්නට තිබුණේ ළමුන් තුළ පැවති සහන ලබා ගැනීමේ සහ යළි සකස් කර නිවැරදි කිරීම සම්බන්ධව පැවති අඩු දැනුම හෝ කිසිම දැනුමක් නොමැති බවයි. දිස්ත්‍රික් නියෝජනය කළ ළමුන් අතර ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ කිසිදු දැනුවත්භාවයක් නොතිබුණි.[29]

ළමුන් විසින් පෙන්වාදුන් කාරණා සම්බන්ධව මේ වන විටත් අදාළ අධිකාරීන් විසින් සලකා බැලූ බව පෙනෙන්නට ඇත. කෙසේ වුවත්, තරුණ පරම්පරාවේ පාර්ශවයක් තුළ (විශේෂයෙන් වඩාත් දුෂ්කර ප්‍රදේශ වල සිටින) සමස්ථ පද්ධතිය පිළිබඳ බරපතල විශ්වාස භංගත්වයක් ඇති විය හැක්කේ පෙනෙන්නට තිබෙන සෑහීමකට පත් නොවීමේ හා අනාරක්ෂිත බවේ ප්‍රමාණය හේතුවෙනි. ළමුන්ට හිතවත් සහ අධිකරණ ක්‍රියා මාර්ග තුළින් දුරස්ථ ප්‍රදේශවල සිටින ළමුන් කරා අධිකරණ පද්ධතිය ළඟා කරවීම කඩිනම් අවශ්‍යතාවයකි.[30] ළමා දූෂණ නඩු සම්බන්ධව කාලය ක්ෂය කරන සහ අවාසනාත්මක නොවන මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවත්වන ලසු නොවන නඩුකාර්ය පටිපාටිය මේ වන විටත් සංශෝධනය කර ඇත්තේ අපරාධ නඩු ඉක්මනින් අවසාන කිරීමට පවතින අවශ්‍යතාවය නිසාය. එසේම, අනෙකුත් නඩු සම්බන්ධයෙන්ද මහාධිකරණයෙන් කෙළින්ම අධි චෝදනා ගොනු කිරීමට නීතිපතිට අභිමතයක් පවතී. ඇප පනතේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සලකා බැලීමේදී ඇප ලබා ගැනීමට අමාරු වන ආකාරයෙන් ඇප පනත සංශෝධනය විය යුතු බවත් 2003 පනත සමාලෝචනය කිරීමට පත් කළ කමිටුව යෝජනා කළේය. මෙකී ආරම්භය විශේෂයෙන් ළමුන් සඳහා නොවූවත් ළමා අපචාර කරන්නන්ටද එය අදාළ කරගත හැක. කෙසේ නමුත්, ළමුන් දැනුවත් කළ යුතු කාරණයක් වන්නේ, අහිංසක බවේ පූර්ව නිගමනය සහ සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය

29. ළමුන් පැමිණි දිස්ත්‍රික් ලැයිස්තුවේ 26 වන පාද සටහන බලන්න.

30. ළමුන්ගේ ප්‍රතික්‍රියා නිරායාසයෙන් සිදුවන ඒවා මිස කිසිම ආකාරයකට පුහුණු කරන ලද ඒවා නොවන්නේ ය යන උපකල්පනය මත මෙම නිරීක්ෂණ සිදු කර ඇත.

චූදිත පුද්ගලයෙකුට වුවද හිමි බවයි. මේ සන්දර්භය තුළ ළමුන් විසින් යෝජනා කරන්නට යෙදුණු කරුණක් වන්නේ, අධ්‍යාපන ක්‍රමයෙන් ඔවුන්ට නීතිය පිළිබඳ මූලික දැනුමක් ලබාදිය යුතු බවයි. මෙය සිදු කළ යුත්තේ ළමා අයිතිවාසිකම් පිළිබඳ අවධානයෙන් පමණක් නොව සමාජයේ සමස්ථ කොටස් වල අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ සමබරතාවක් ඇති වන පරිදිය. මේ සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන් ද දැනුවත් කළ යුතුය.[31]

ළමුන්ගේ විවේචනයේ තවත් ඉලක්කයක් වූයේ ජනමාධ්‍ය විසින් ළමා අපචාර සිද්ධීන් පිළිබඳව කටයුතු කරන ආකාරයයි. පුවත් වාර්තාකරණයේ දී නීතිමය පදනම කුමක් වුවද පරිවේශණාත්මක කරුණු වලදී සෘජුව හෝ වක්‍රව ළමා වින්දිතයාගේ අනන්‍යතාව නිතරම හෙළි කරන බව ළමුන්ගේ නිරීක්ෂණය වූයේ ය. එක් ළමා නියෝජිතයෙක් දක්වූ පරිදි එසේ අනාවරණය කිරීම නිසා ළමයෙකු සිය දිවිනසා ගත් අවස්ථාවක්ද ඇත.

ළමයින් ප්‍රචාරණය සඳහා යොද ගැනීම සහ ළමා වැඩසටහන් වල මඳ බව පිළිබඳව විශේෂයෙන් අඩු විවේචන තිබුණ ද සැබෑ ජීවිතයේ අපරාධ ප්‍රතිනිර්මාණය කොට දක්වන සමහර රූපවාහිනී වැඩසටහන් පිළිබඳව ළමෝ සිය අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.[32]

වර්ෂ 2003 කාලයේදී එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සහ අනෙකුත් ළමා අයිතිවාසිකම් පිළිබඳව වූ රාජ්‍ය නොවන සංවිධාන විසින් ළමුන් පිළිබඳ එකඟ විය හැකි ප්‍රමිතීන් පද්ධතියක් ඇති කර ගැනීමට වැඩමුළු පවත්වන ලදී. ස්වයං පාලනය පිළිබඳ පොදු එකඟතාවය නීතිමය ගැටලු කරා දිව යන පාලනයක් ඇති කිරීමට වඩා ඵලදායක බව පෙනී යයි. අපක්ෂපාතී ආයතනයක් මගින් විශේෂයෙන් එකඟතාවයකට පැමිණි ප්‍රමිතීන් පද්ධතියක් බලාත්මක කරන ලද වෙනත් රටවල පවත්නා ආකෘතියක් අධ්‍යයනය කළ යුතුය.[33]

---

31. බාල අපයෝජනයන් සිදු කළ පුද්ගලයන් වෙනුවෙන් නීතිඥවරුන් පෙනී නොසිටිය යුතු යැයි ඉල්ලමින් මෑතකදී රටේ තැනින් තැන ඇති වූ පෙළපාළි දරුවන්ට වැරදි ඉඟි සපයන හැසිරීම් ලෙස දක්විය හැකිය.
32. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන සංවිධානය සහ කැළණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශය මගින් මෑතකදී කරන ලද සමීක්ෂණයක් පිළිබඳ 1997 ජූලි 20 දින සන්ඩේ ඔබ්සර්වර් පත්‍රයේ පළ වූ තොරතුරු වලට අනුව පෙනී යන්නේ බහුතරයක් ළමුන් රූපවාහිනිය නරඹන අවස්ථාවන් වලදී ඔවුනට නැරඹීමට සිදුවන්නේ වැඩිහිටියන්ට උචිත වැඩසටහන් බවයි.
33. උදහරණ ලෙස, එක්සත් රාජධානියේ වෙළඳ දැන්වීම් පිළිබඳ ප්‍රමිති අධිකාරිය.

කෙසේ හෝ ළමා අපචාරවලට නතුවන ළමා වින්දිතයන් සම්බන්ධයෙන් පවතින සැබෑ සහනය වනුයේ 1995 අංක 22 දරණ දණ්ඩනීති සංග්‍රහය (සංශෝධන) පනතෙහි 365ඇ වගන්තියයි. ඒ අනුව ළමා අපචාර අපරාධයක් ලෙස සලකන අතර දඩයක් හෝ අවුරුදු 2 ක් දක්වා බන්ධනාගාරගත කිරීම කළ හැක, එසේම එකී වරද කළ අයගේ නම හෝ ඔහුව හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු මුද්‍රණය කිරීම, ප්‍රසිද්ධ කිරීම කළ හැක. එම වගන්තියටම අනුව අධිකරණය පූර්ව අනුමැතිය ලබා නොලැබ අධිකරණ ක්‍රියාවලියේ කුමන හෝ කොටසක් ප්‍රසිද්ධ කිරීම වරදක් වේ. (ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ නියෝග මීට අදාළ නොවේ.) අවසානයේදී මේ කී වගන්ති බලාත්මක නොකළහොත් ඒවායේ විශ්වාසනීයත්වය නැති වනු ඇත. එබැවින් අනතුරු ඇඟවීම් නොසලකා හැරිය හොත් පැමිණිලි පාර්ශවය අනුගමනය කළ යුතු ව්‍යුහමය අනතුරු ඇඟැවීමේ පද්ධතියක් ඇති කළ යුතුය.

වර්ෂ 2003 මැද භාගයේ දී පරිවාස සහ ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අධිකරණ අමාත්‍යංශයේ උපදෙස් පරිදි රැඳවීම් ආයතනවල හෝ අර්ධ රැඳවීම් ආයතනවල සිටින ළමුන්ගේ තත්ත්වය පිළිබඳ නිශ්චය කිරීමට සංගණනයක් පවත්වන ලද්දේය. මේ කී සමීක්ෂණය තුළ වාචික ප්‍රශ්නාවලියක් ළමුන්ට, ළමා සුභසාධන නිලධාරීන්ට ලබාදී ඒවාට ඔවුන්ගෙන් ලැබුණු පිළිතුරු වාර්තා කරන ලදී. මෙහිදී රාජ්‍ය සහ ලියාපදිංචි රාජ්‍ය නොවූ ආයතනවල සිටි ළමුන් සහ යෞවනයන් 541 ක ගෙන් ප්‍රශ්න කරන ලදී. මෙම ළමුන්ගෙන් බහුතරය 12-15 වයස් කණ්ඩායමට අයත් වුවද 15-18 වයස් කණ්ඩායමට අයත් 170 දෙනෙක් සහ අවුරුදු 12 ට අඩු 50 ක් පමණ ළමයින් කණ්ඩායම් 2 ක් ඇතුළත් විය.

මේ කී ළමුන්ගෙන් වැඩි බහුතරයක් අදළ ආයතනවල එක්කෝ අවුරුද්දට අඩු කාලයක් හෝ නැත්නම් අවුරුදු 1-3 ත් අතර කාලයක් රැඳී සිටියේ ය. බොහෝ දෙනෙකු රඳවා සිටියේ උසාවි නියෝග මතය. මේවායේ සිටින ළමයින් වර්ගීකරණය කළ හැක්කේ අපරාධවල වින්දිතයන්, වෙනත් යෑමට තැනක් නොමැති සහ නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් ළමුන් ලෙසය. බොහෝමයක් ළමුන්ට තව කොපමණ කාලයක් ආයතනවල ආරක්ෂාව යටතේ සිටිය යුතුද යන්න සම්බන්ධයෙන් දැනුමක් නැත.

ළමෝ 294 දෙනෙක් පාසල් නොගිය බව පැවසූහ. කෙසේ වෙතත්, සැහෙන ප්‍රමාණයක් වෙනත් ආකාරයක පුහුණුවක් ලබා සිටිය බව දකින්නට තිබුණි. මක් නිසාදයත් "ඔබ පාසල් යන්න සතුටුද / ඔබ ලබන පුහුණුව පිළිබඳ

සතුටුද" යන ප්‍රශ්නයට "ඔව්" යනුවෙන් 400 කට අධික ප්‍රමාණයක් පිළිතුරු සපයා තිබුණි. 200 කට අධික ප්‍රමාණයක් ඔවුන් විවිධාකාර ක්‍රීඩා සහ සෙල්ලම් ඉගෙනගත් බව පැවසූ අතර 80% කට අධික ප්‍රමාණයක් සඳහන් කළේ ඔවුන්ට අනෙකුත් ළමයින් සමඟ සෙල්ලම් කිරීමට අවස්ථාව ලැබුණු බවය. (අත් හැරුණු 50 දෙනෙක් කිසිවකට සහභාගී නොවූ බව පැවසීය) සැලකිය යුතු ප්‍රමාණයක් සඳහන් කළේ ඔවුන් අසනීප වූ විට වෛද්‍යවරයෙක් වෙතට යොමුකළ බවය. නමුත් කුඩා සුළුතරයක් ඊට විරුද්ධ මතයක් දැරීය.

ළමුන් 450 ක් පමණ මේ කී ආයතන වලට පැමිණීමට පෙර ඔවුන් තම දෙමව්පියන් සමඟ හෝ ඥාතීන්ගේ ආරක්ෂාව යටතේ සිට ඇත. 260 කට අධික ප්‍රමාණයක් පැවසුවේ ඔවුන් ආයතනගත වීමෙන් පසුව ඔවුන්ව කලින් රැකබලා ගත් අය ඔවුන්ව බැලීමට නොපැමිණි බවයි. 450 ක් පමණ සඳහන් කළේ ඔවුන්ව උසාවියට ගෙනයාම සහ උසාවියෙන් ගෙන ඒම එකම වාහනයක වැඩිහිටියන් මෙන් සිදුකරන බවත් ඉන් අඩක් පමණ ප්‍රකාශ කළේ එම ගමන් වලින් ඔවුන් බියට පත්වන බවත්ය.

උසාවියේදී ඔවුන්ට නරක ලෙස කතා කළාද යන්න ඇසූ විට උසාවියට ගිය 497 කින් 69 ක් එසේය යැයි පැවසූහ. එම ලැයිස්තුවෙහි නරක ලෙස ළමුන්ට කතා කළ බව දැනුණු අය අතර මුල් තැන ගෙන තිබුණේ බන්ධනාගාර හා පොලිස් නිලධාරීන් ය.

සංඛ්‍යා දත්ත වලින් පමණක් සම්පූර්ණ රූපයක් ඉදිරිපත් කළ නොහැක. විශේෂ වශයෙන් ගැටලු සහගත අංශ දෙකක් මෙම විශ්ලේෂණයේදී ඉස්මතු විය. එයින් පළමුවැන්න වන්නේ ළමයින්ගෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් පාසල් අධ්‍යාපනයක් නොලැබූ බව පැවසීමයි. එවැනි ආයතනයන් හිදී ලැබෙන ලෙස සැලකෙන වඩු කර්මාන්තය හා මේසන් වැඩ පිළිබඳ දැනුම පාසල් අධ්‍යාපනයට විකල්පයක් නොවේ. මේ කී ළමුන් සතු අධ්‍යාපනයට ඇති අයිතිය වඩා අර්ථවත් ආකාරයෙන් ඔවුන්ට ලබාදිය යුතු අතර එය අවධානය යොමු කළයුතු කඨිනම් තත්ත්වයකි.

අවධානයට යොමු විය යුතු දෙවන කරුණ වන්නේ මෙම ළමුන් ගෙන් වැඩි බහුතරයක් ආයතනික ගතවීමට පෙර ඔවුන්ගේ දෙමව්පියන් හෝ වෙනත් ඥාතීන් සමඟ සිටියත් ආයතන ගත වීමෙන් පසු මින් අඩකට වැඩි පිරිසක් බැලීමට එවැනි අමුත්තන් නොපැමිණි බව පෙනේ. මෙවැනි තත්ත්වයක් තුළ ඔවුන්ගේ කලින් පැවති සම්බන්ධකම් බිඳ වැටීමක් සිදුවේ. ළමයා සහ ඔහුගේ / ඇයගේ කලින් පරිසරය සමග ඇති සම්බන්ධය වෙන් කිරීම ඇතැම්

අවස්ථා වලදී හිතකර වුවත් රාජ්‍ය රැඳවුම් ආයතන හුදෙක් දෙමාපියන් ගේ හා අනෙකුත් අය තම වගකීම් පැහැර හැරීමට යොදා ගැනීම වැළැක්වීමට අවධානය යොමු කළ යුතුය. අවධාරණය කළ යුතු කරුණක් වන්නේ රජයේ පමණක් නොව අන් සෑම පුද්ගලයෙකුගේම යුතුකම සහ වගකීම වන්නේ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කර වර්ධනය කිරීමයි.

# III

# නීති විරෝධී සංක්‍රමණ: මානව තිරුරහෝනය සහ පුද්ගල වෙළඳම

*ටොම් ජිල්බ්මන්**

## 1. හැඳින්වීම

කාරණා ගණනාවක් නිසා, සංක්‍රමණය ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයකට බලපෑම් සිදු කරයි. පළමුව, සෑම වසරකම ශ්‍රී ලංකාවට විශාල ආගන්තුකයන් සංඛ්‍යාවක් පැමිණීම: වර්ෂ 2003 දී මිලියන භාගයකට අධික සංචාරකයින් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට පැමිණියේය.[1] ඊට පුළුල්ව පැතුරුණු විශ්වාසය වූයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අත්සන් කරන්නට යෙදුණු සටන් විරාම ගිවිසුම තුළින් විශාල ආර්ථික වර්ධනයක් ලැබුනා සේම සැලකිය යුතු ප්‍රමාණයකින් ශ්‍රී ලාංකිකයන් ආපසු සිය රටට පැමිණීම වැඩි වීම, සංචාරකයින් සහ ව්‍යාපාරික ප්‍රජාවද ශ්‍රී ලංකාවට පැමිණීම ඉහළ යාමයි. දෙවනුව, ශ්‍රී ලංකාව ශ්‍රමය අපනයනය කරන රටක් වීමයි. සෑම වසරකම ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමණිකයන් 150,000 කට අධික ප්‍රමාණයක් විදේශ රැකියා සඳහා නිවෙස් අතහැර යයි. 970,000 කට ආසන්න ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් විදේශයන්හි රැකියාවල නියුක්ත වේ. එයින්

---

* නීති ශිෂ්‍ය, ඔටාවා විශ්ව විද්‍යාලය.

1. 2003 දෙසැම්බර් 31 වන දිනැති ලක්නෙට් (LAC NET) හි හුසේන් ඇලඩින් විසින් රචිත “2003 වසර: සංචාරකයින් පැමිණීමේ හොඳම වසරයි” අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි වෙබ් අඩවිය <http://www.theacademic.org>.

බොහොමයක් නුපුහුණු කාන්තාවන් බටහිර ආසියාවේ ගෘහ ශ්‍රමිකයන් ලෙස සේවය කරයි. තුන්වෙනුව, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය නිසා සංක්‍රමණිකයන් ගණන විශාල ලෙස ඉහළ යාමයි: වාර්ගික මර්දනයෙන් යුද්ධයෙන් සහ දුප්පත්කමෙන් පලා යන සරණාගතයින්ද: තම පවුල් වලට සුභදායි අනාගතයක් ලබා දෙන්නට විගමනය කරන්නක්ද විය. එසේම බොහෝ ශ්‍රී ලාංකිකයන් අධ්‍යාපන කටයුතු සහ පෞද්ගලික හේතූන් මතද තාවකාලිකව සංක්‍රමණය කරයි.

'සංක්‍රමණය' ලෙස පොදුවේ නිර්වචනය වන්නේ රැකියාවක් ලබා ගැනීම, වාසස්ථාන ස්ථාපිත කර ගැනීම හෝ හිංසා වලින් මිදීමට සරණාගත භාවය මුල් කරගෙන මිනිසුන් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට යෑමයි. නීති විරෝධී සංක්‍රමණ ලෙස සැලකෙන්නේ නීති විරෝධීව ඇතුළු වීම හෝ නියමිත කාලය ඉක්මවා රැඳී සිටීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතුළු වන්නාවූ රටේ නෛතික තත්ත්වයන් නොමැති සංක්‍රමණිකයන්ය. මෙකී සංක්‍රමණිකයන් සතුව අදාළ රටේ සිටීමට අවසරය ලබා දෙන නිසි ලියවිලි නොමැත. (වලංගු වීසා හෝ ගමන් බලපත්‍රය) මෙකී තත්ත්වය 'අක්‍රමවත් සංක්‍රමණිකයන්ගෙන්' වෙන් කොට හඳුනා ගැනීම වැදගත්ය. එනම් තමන්ගේ පාලනයෙන් තොර හේතු නිසා සරණාගතයින් ලෙස සංක්‍රමණය වීමට බල කෙරුණු අයය. නීති විරෝධී සංක්‍රමණ වැඩිවීමට බලපෑ විශේෂිත හේතු දෙකක් ඇති බව ලෝ පුරා පුළුල්ව විශ්වාස කරයි. එනම් සමහර ඇතුල් වෙන රටවල් හි පවතින සීමාකාරී ඇතුල්වීමේ ප්‍රතිපත්ති සහ සීතල යුද්ධයෙන් පසු[2] වසර වල විගමන පාලනයන් ලිහිල් වීමත්ය. නීති විරෝධී සංක්‍රමණ යන්නට මානව තීරුරහෝනය සහ පුද්ගල වෙළඳම ඇතුළත් වෙයි. නමුත් ඒ සංසිද්ධීන් වෙන වෙනම තේරුම් ගත යුතුය. එකී අවස්ථා දෙකේදීම සමාජ, ආර්ථික නීතිය හා නීතිය ක්‍රියාත්මක කිරීම, පිළිබඳ සංකීර්ණ ගැටලු ඉදිරිපත් කර ඇති අතර ඒවා මානව හිමිකම් දෘෂ්ටියකින් සියුම්ව නිරීක්ෂණය කළ යුතු වේ.

මෙම පරිච්ඡේදය ප්‍රධාන කොටස් දෙකකට බෙදෙයි. එනම්, මානව තීරුරහෝනය සහ පුද්ගලයින් නීති විරෝධී ලෙස විකිණීමයි. එකී කාරණා දෙකම නිර්වචනය වන්නේ හා පරීක්ෂා වන්නේ ශ්‍රී ලංකාවට ඒවායේ ඇති

2. ආර්ථික හා සමාජීය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ, ජනගහණ අංශයෙහි, "ජාත්‍යන්තර සංක්‍රමණික වාර්තාව 2002", ST/ESA/SER.A/220, නිව්යෝර්ක් 2002 හි 28 පිටුව (මින්පසු එක්සත් ජාතීන්ගේ සංක්‍රමණික වාර්තාව 2002 යනුවෙන් හඳුන්වනු ලැබේ.) අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළහැකි වෙබ් අඩවිය: <www.un.org/esa/population/publications/ittmig 2002/2002 ITTMIGTEXT 22-11.pdf>.

සම්බන්ධතාවය අනුව, ජාත්‍යන්තර සම්මතයන් වලට අනුව, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා වලට අනුව සහ 2003 වසරේ ප්‍රවණතා සහ ජාත්‍යන්තර සම්බන්ධයන්ට අනුව වන අතර සෑම කොටසක්ම එනම් "ආණ්ඩුව සහ සිවිල් සමාජය සංක්‍රමණිකයන්ගේ මූලික අයිතිවාසිකම් වර්ධනය කිරීමට කටයුතු කළ හැකි වන්නේ කුමන ආකාරයෙන්ද" යන නිර්දේශ වලින් අවසාන වේ. සමාප්තියේදී, මානව තිරුරහෝනය හා පුද්ගලයින් නීති විරෝධී ලෙස විකිණීම යන කරුණු දෙක අතර එකිනෙකා මත පතිත වන ක්ෂේත්‍රයන් පරීක්ෂා කරන අතර, ශ්‍රී ලංකාව 2004 දී හා ඉන් ඔබ්බට සංක්‍රමණිකයන් පිළිබඳ ගැටලු විසඳීමට උත්සාහ කරද්දී මුහුණ දීමට බලාපොරොත්තු විය හැකි මානව හිමිකම් අභියෝග මොනවාදැයි සලකා බැලේ.

නීති විරෝධී සංක්‍රමණිකයන්ගේ මාතෘකාව මෙම වාර්තාව මගින් සාකච්ඡාවට බඳුන් කරන ප්‍රථම අවස්ථාව මෙය වන අතර ඊට අමතරව ඒහිලා පසුබිමද දක්වා ඇත. හැකි සෑම විටම අන්තර්ජාලයෙන් ලබාගත් වෙබ් අඩවි ලිපිනයන් පාද සටහන් තුළ දක්වා ඇත්තේ පාඨකයන්ට දිරිමත් කර මානව තිරුරහෝනය සහ පුද්ගලයින් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් වඩා පුළුල් දැනුමක් ලබාදීමටය.

## 2. මානව තිරුරහෝනය

### 2.1 නිර්වචනය

අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ වලට එරෙහිවූ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අතිරේකයක් ලෙස ඉදිරිපත් වූ ගොඩබිමෙන්, මුහුදෙන් සහ ගුවනින් සංක්‍රමණිකයන් තිරුරහෝනය කිරීමට,[3] එරෙහි වූ මූලපත්‍රයට අනුව සංක්‍රමණිකයන් තිරුරහෝනය කිරීම නිර්වචනය කර ඇත්තේ:

---

3. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ පනස් පස් වැනි සැසිවාරයේදී යෝජනා සම්මුතියක් මගින්, A/RES/55/25 දරණ 2000 නොවැම්බර් මස 15 වන දිනැති *තිරුරහෝන මූලපත්‍රය* (The *Smuggling Protocol*) (UN Doc. A/55/383) සහා සම්මත කරගන්නා ලදී. එය 22 වැනි වගන්තියට අනුකූලව බලාත්මක වූයේ 2004 ජනවාරි මස 28 වන දිනය. *තිරුරහෝන මූලපත්‍රයට* මේ වන විට අත්සන් තැබූවන් 112 ක් සහ පාර්ශවකරුවන් 40 දෙනෙක් සිටියි. (මින් පසු *තිරුරහෝන මූලපත්‍රය* යනුවෙන් හඳුන්වනු ලැබේ) අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි වෙබ් අඩවිය: <http://www.undoc.org/unodc/en/crime cicp signatures.html>.

*"අදාළ රාජ්‍යයේ ජාතිකයෙකු හෝ ස්ථිර පදිංචිකරුවකු නොවන පුද්ගලයෙකුව නීති විරෝධී ලෙස එම රටට ඇතුළත් කිරීම වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව ආර්ථිකමය හෝ වෙනත් ද්‍රව්‍යමය වාසියක් හිමිකර ගැනීම."*[4]

'නීති විරෝධී ඇතුළු වීම' ලෙස 3(ආ) වගන්තිය දක්වන්නේ, "ඇතුල් වන්නාවූ රටට නීත්‍යානුකූලව ඇතුළු වීම සඳහා නිසි අවශ්‍යතා ඉටු නොකළ දේශ සීමා මාරු කිරීමයි." දේශ සීමා මාරු කිරීමට අ) එක් රටකින් පිටවීම සහ ආ) තවත් රටකට ඇතුල් වීම යන කරුණු දෙකම අවශ්‍ය වන බැවින් පුද්ගලයකු ශාරීරිකව ඇතුල් වන්නා වූ රටට ඇතුල් වීමට පෙර මානව තිරුරහෝනය ආරම්භ වේ.

මානව තිරුරහෝනය සඳහා අවම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකු හෝ සම්බන්ධ වෙයි. එනම්, මානව තිරුරහෝනය සිදු කරන්නා හා සංක්‍රමණිකයාය. මානව තිරුරහෝනය සිදු කරන්නන් ලෙස සලකන්නේ, සංක්‍රමණිකායට නීති විරෝධී ඇතුල්වීමක් සඳහා අවශ්‍ය සැලසුම් සකස්කර, සම්බන්ධීකරණය සිදු කරන පුද්ගලයන්ය. ගුවනින් හෝ මුහුදෙන් පුද්ගලයන් ප්‍රවාහනය කිරීම, පුද්ගලයින්ට ප්‍රවාහන පහසුකම් සලසා දීම, බලය නොලත් තොටුපළවල් භාවිතා කිරීමට පහසුකම් සැලසීම, ගමන් කිරීමේ ලේඛන අනිසි ලෙස භාවිතා කිරීමට උපදෙස් දීම, ව්‍යාජ හෝ කූඨ ලේඛන නිර්වචනය කිරීම හෝ ලබා දීම ඇතුළත්ව නීති විරෝධී ලෙස ගමන් කිරීමට පහසුකම් සැලසීම සඳහා විවිධාකාර වූ ක්‍රම රාශියක් උපයෝගී කර ගනී. අනෙක් අතට සංක්‍රමණිකයන් වූකලී තිරුරහෝනයට පාත්‍ර වූ අයය. සාමාන්‍යයෙන් සංක්‍රමණිකයා විසින් ස්වේච්ඡාවෙන්ම ගාස්තුවක් ගෙවීමේ පොරොන්දුව මත තිරුරහෝනය සිදු කරන්නා බඳවා ගන්නේ, ඔහුට හෝ ඇයට අවශ්‍ය රටට නීති විරෝධී ලෙස ඇතුළු වීමට උදව් ලබා ගැනීමටයි. තිරුරහෝනය කිරීමෙහිදී මුහුණ දීමට සිදුවන කටුක අත්දැකීම් පිළිබඳ සමහර සංක්‍රමණිකයන්ට අවබෝධයක් නැති නමුත් ඔවුන් එය නීති විරෝධී සහ රහසිගත ක්‍රියාවලියක් බව සාමාන්‍යයෙන් අවබෝධ කරගෙන සිටී.

## 2.2 තිරුරහෝනයේ ඵලවිපාක

මානව තිරුරහෝනය රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් බව රාජ්‍යයන් පොදුවේ සහ මූලිකව පිළිගෙන ඇත. රාජ්‍යයන්ගේ දැනුමෙන් තොරව පුද්ගලයන් තම

4. තිරුරහෝන මූලපත්‍රය 3(අ) ව්‍යවස්ථාව.

රටට ඇතුළු වීම හෝ රටින් පිටවීම තුළින් හැඟෙන්නේ රටේ දේශ සීමා පිළිබඳ සම්පූර්ණ පාලනයක් රාජ්‍ය සතු නොවන බව සහ අනාවරණය නොවී අපරාධ කල්ලි වලට ක්‍රියාත්මක වීමට හැකියාවක් ඇති බවයි. තිරුරහෝන ක්‍රියාවලින් ජාත්‍යන්තර අපරාධ හවුල තුළ ප්‍රධාන ලෙස හෝ කොටසක් ලෙස ක්‍රියාත්මක වන අතර ඒවා පුද්ගල වෙළඳම සහ ත්‍රස්තවාදයද ඇතුළත් වූ සාපරාධී අරමුණු ඉටුකර ගැනීම සඳහා බාරගනු ලබයි. එම නිසා තිරුරහෝනය රාජ්‍යයන් තුළ මෙන්ම ඉන් පිටතද සාපරාධී ක්‍රියාකාරකම් සඳහා දයක වන අතර එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන්නාසේ ම රාජ්‍ය පුරවැසියන්ගේ සෞඛ්‍යයට සහ ආරක්ෂාවට ද තර්ජනයකි. ශ්‍රී ලංකාවේ අත්දැකීම් අනුව, පුද්ගල වෙළඳම, 'පාතාල ලෝකයට', රාජ්‍ය නිලධාරීන්ගේ දූෂිතභාවයට සහ රටතුළ සහ ඉන් පිටත පුද්ගල වෙළඳම පාලනය කිරීමට අදළ වූ ආරක්ෂක අභියෝග වලට සම්බන්ධ බවට සාක්ෂි තිබේ. මානව තිරුරහෝනයේ තවත් පැතිකඩක් වන්නේ, එය වැළැක්වීමට හා නීති බලාත්මක කිරීමට රාජ්‍ය සම්පත් ආයෝජනය කළ යුතු වීමයි.

මානුෂීය දෘෂ්ටියකින් බලන කල මානව තිරුරහෝනය මගින් සංක්‍රමණිකයන්ට නොමනා කටුක අත්දැකීම් සහ මරණය පවා පැමිණවිය හැකි වීම සුළු කොට තැකිය නොහැක. මුහුදු මාර්ගයෙන් තිරුරහෝනය කරන පුද්ගලයින්ට බොහෝවිට නිසි සනීපාරක්ෂාවක්, පෝෂණයක් හෝ වෛද්‍ය පහසුකම් නොමැති වූ අධික ලෙස මගීන් පටවා ගත් නෞකාවල අනතුරුදයක හා දීර්ඝ කාලයක් ගතවන ගමනකට මුහුණ දීමට සිදු වේ. මෙකී සංක්‍රමණිකයන්ගෙන් හඳුනා නොගත් ප්‍රමාණයකගේ ජීවිත මුහුදේ දී විනාශ වේ. බොහොමයක් පුද්ගලයන්ට මෙම ගමනේ ස්වභාවය ගැන අවබෝධයක් නොමැත. තිරුරහෝන සංක්‍රමණිකයන්ව බොහෝවිට අමානුෂික තත්ත්වයන් යටතේ ගොඩබිමේ දී මෙන්ම මුහුදේදී ද ප්‍රවාහනය කරයි. නිදසුනක් ලෙස, 2003 නොවැම්බර් මාසයේදී, අපරාධ විමර්ශන දෙපාර්තුමේන්තුව (CID) අත්අඩංගුවට ගන්නා ලද තරුණ නීති විරෝධී සංක්‍රමණිකයන් ඒ වන විට ප්‍රවාහනය කරමින් සිටියේ ශීතකරණ ඒකකයක් තුළය.[5] පුද්ගලයින් ඔවුන්ගේ කැමැත්ත ඇතිව සහ එම සේවයට ඔවුන් කරන ගෙවීමත් මත වුවත් ඔවුන්ට මෙවැනි අන්තරායන්ට භාජනය කිරීම ඔවුන්ගේ ජීවත් වීමට සහ, ආරක්ෂාවට ඇති මූලික මිනිස් අයිතිවාසිකම් කඩ කිරීමකි.

---

5. "ඉතාලිය බලා ගමන් ගත් තරුණයින් පිරිසක් සීතලෙන් මිදීම නිසා මරණාසන්න වේ." යන මැයෙන් 2003 වසරේ නොවැම්බර් මස 25 වන දිනැති ඩේලි මිරර්, පුවත් පතට සුජිත් හේවාජුලිගේ සහ ඩබ්ලිව්. හියුබට් ප්‍රනාන්දු විසින් වාර්තා කළ සිදුවීම.

## 2.3 අන්තර්ජාතික සම්මතයන් හා නීති

*තිරුරහෝන මූලපත්‍රය* බලාත්මක කිරීම සඳහා ඉදිරිපත් කිරීම තුළින් නියෝජනය වූයේ, තිරුරහෝනයට අදාළ ගැටලු වලට ඇති ප්‍රමාණාත්මක සහ බරපතලභාවය ජාත්‍යන්තර ප්‍රජාව විසින් පිළිගන්නා ලද බවත්, ඒ වෙනුවෙන් යොදා ගන්නා වූ ඕනෑම විසඳුමක් සඳහා සම්පූර්ණ සහ සම්බන්ධීකරණය වූ ජාත්‍යන්තර උත්සාහයන් අවශ්‍ය වන බව හඳුනාගෙන ඇති බවත්ය. මානව තිරුරහෝනය මානව හිමිකම් වලට සහ රාජ්‍යයන්ගේ ආරක්ෂාවට තර්ජනයක් නම්, *තිරුරහෝන මූලපත්‍රය* රාජ්‍යයන්ගේ ආරක්ෂාව සහ සංක්‍රමණිකයන්ගේ මානව අයිතිවාසිකම් අතර තුලනයක් ඇති කිරීමට ගත් උත්සාහයන් සේම, පොදු අන්තර්ජාතික ප්‍රශ්නයක් සේ සලකා එයට විසඳුමක් ලෙස සහයෝගිතාවය වර්ධනය කිරීමටද හේතු විය. *තිරුරහෝන මූලපත්‍රයේ* 2 වන වගන්තියේ දැක්වෙන පරිදි එහි අරමුණ වනුයේ:

> *"සංක්‍රමණිකයන් තිරුරහෝනය කිරීම වැළැක්වීම සහ එයට එරෙහිව සටන් කිරීමට මෙන්ම තිරුරහෝන සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම රාජ්‍ය පාර්ශ්වයන් අතර තිරුරහෝනය වැළැක්වීමට හෝ නතර කිරීමට සහයෝගීත්වය වර්ධනය කිරීමයි."*[6]

*තිරුරහෝන මූලපත්‍ර* ලියවිල්ල ප්‍රධාන කොටස් 3 කට බෙදිය හැක. එනම්: ව්‍යාවස්ථා සහ නීති බලාත්මක කිරීමේ ක්‍රමෝපායන් දේශීය මෙන්ම අන් රාජ්‍යයන් සමග සහයෝගයෙන් යුතුව මානව තිරුරහෝනයට එරෙහිව සටන් කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියා පටිපාටිමය පියවර සහ සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි. ව්‍යවස්ථාමය ක්‍රමෝපායන් සම්බන්ධයෙන්, "සිතා මතාම සහ සෘජුව හෝ වක්‍රව මූල්‍යමය හෝ ද්‍රව්‍යමය වරප්‍රසාදයක් ලබා ගැනීම සඳහා මානව තිරුරහෝනය සිදු කිරීම"[7] සාපරාධී වරදක් බව ජාතික ව්‍යවස්ථාවන් මගින් පිළිගැනීමට රාජ්‍යය පාර්ශවයන් කටයුතු කිරීම *මානව තිරුරහෝන මූලපත්‍රය* මගින් බලාපොරොත්තු වේ. මේ තුළට තිරුරහෝනයට සම්බන්ධ ක්‍රියාවන් ගණනාවක් හෝ කිරීමට තැත් කිරීම, එනම්, සංක්‍රමණිකයන් තිරුරහෝනය කිරීමේ අරමුණින් වංචනික ගමන් බලපත්‍ර හෝ හඳුනා ගැනීමේ ලියවිලි සැකසීම, සැපයීම සහ සන්තකයේ තබා ගැනීමද, යම් විටක ජාතිකයන් නොවෙන හෝ පදිංචිකරුවන් නොවෙන අයට එම රටේද ඉෂ්ට කළ යුතු නෛතික අවශ්‍යතා සපුරාලීමෙන් තොරව

6. *තිරුරහෝන මූලපත්‍රය*, 2 වන වගන්තිය.
7. *තිරුරහෝන මූලපත්‍රය*, 6 වන වගන්තිය.

එම රටේ වාසය කිරීමට අවස්ථාව සැලැස්වීම යනාදිය ඇතුළත් වෙයි. *තිරුරහෝන මූලපත්‍රයට* අනුව රජයන් එකී අපරාධ වලට ආධාර දීමද වරදක් බවට පත් කළ යුතුය. එසේම විශේෂයෙන්ම රජයන් විසින් තිරුරහෝනයට සම්බන්ධ අපරාධ සිදු කිරීමේදී ඇති බරපතල වාතාවරණයන් සැලකිල්ලට ගන්නා ව්‍යවස්ථාමය පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. එවැනි කරුණු යටතට, සංක්‍රමණිකයන්ගේ ජීවිත හෝ ආරක්ෂාව අනතුරේ හෙළීම සහ ඔවුන්ට කෲර ලෙස සහ පහත්කොට සැලකීම යනාදිය ඇතුළත් වේ.[8]

මානව තිරුරහෝනයට විරුද්ධව කරන සටනේ පටිපාටිමය පියවර ක්ෂේත්‍රය තුළ, පහත දක්වෙන ද අඩංගු වූ උපක්‍රම ක්‍රියාවේ යෙදවීමට, *තිරුරහෝන මූලපත්‍රය* විසින් රාජ්‍යයන් වගකීමෙන් බැඳ තබයි. ඒවානම්, වෙනත් ද අතර, දේශ සීමා වල ආරක්ෂිත පියවර වර්ධනය කිරීම; ගමන් කිරීමට යොදු ගන්නා ලේඛනවල ආරක්ෂාකාරී අංග වැඩි දියුණු කිරීම; පොදු මහජනතාව අතර තිරුරහෝනයේ ඇති අවදානම් පිළිබඳ දනුවත් කිරීම් සිදු කිරීම; සහ සමාජීය සහ ආර්ථිකමය වශයෙන් දුෂ්කරතා වලින් යුත් ප්‍රදේශවල නීති විරෝධී සංක්‍රමණ සඳහා හේතුවන මූලික ගැටලු විසඳීමේ අරමුණ ඇතිව නොයෙකුත් පියවර ගැනීමට බාරගැනීම යනාදිය වේ. රාජ්‍යයන් අතර සහයෝගීතාවය සහ සම්බන්ධීකරණයට අනුබල දීමේ අරමුණ ඇතිව, *තිරුරහෝන මූලපත්‍රය* විසින්, ව්‍යවස්ථාමය සහ නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ තොරතුරු බෙදහද ගැනීම සහ බුද්ධිමය තොරතුරු එක් රැස් කිරීම, පුහුණුව සහ ක්‍රියාත්මක කිරීම යන අංශ වලදී සහයෝගයෙන් කටයුතු කිරීම වැනි පියවරයන් ක්‍රියාත්මක කිරීම භාරගැනීමට රාජ්‍යයන් දිරිමත් කරයි. ගැටලුව ව්‍යවස්ථාගත කරනවා වෙනුවට මානව තිරුරහෝනයට හේතු වූ මූලික කාරණා වලට විසඳුම් සෙවීමට සහය දෙන වැළැක්වීමේ ක්‍රියාමාර්ග (Preventive activities) ක්‍රියාවේ යෙදවීමේ වගකීම බාර ගැනීමට රාජ්‍යයන් දිරිමත් කරනවා මෙන්ම එය තිරුරහෝන මූලපත්‍රයේ අවශ්‍යතාවයක්ද වෙයි.

සංක්‍රමණිකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට *තිරුරහෝන මූලපත්‍රය* පහත නියමයන් ප්‍රකාශිතව දක්වා ඇත.

> *"මේ මූලපත්‍රයේ 6 වන ව්‍යවස්ථාව (එනම් මානව තිරුරහෝනය) යටතේ ගමන් ඇරඹීමේ ක්‍රියාව කරන සංක්‍රමණිකයකු අපරාධ නඩුවකට යටත් කළ නොහැක."*[9]

---

8. *තිරුරහෝන මූලපත්‍රය*, 6(3) වන වගන්තිය.
9. *තිරුරහෝන මූලපත්‍රය*, 5 වන වගන්තිය.

මෙම *තිරුරහෝන්න මූලපත්‍රයේ* සැලකිය යුතු මූලිකාංගයක් වන අතර, එමගින් මානව තිරුරහෝන්න නඩු වලදී තිරුරහෝනය සිදු කරන්නා ප්‍රධාන වරදකරු ලෙස ප්‍රබලව හඳුනා ගන්නා අතරම සංක්‍රමණිකයා අපරාධ වගකීමෙන් නිදහස් කරන ජාත්‍යන්තර සම්මතයක් ඉදිරිපත් කරයි.

අනිකුත් ආරක්ෂාවන් මූලපත්‍රයේ 16 වන වගන්තියේ ලැයිස්තුගත කර අත. ඒ අනුව රාජ්‍ය පාර්ශ්වයන් විසින් අයිතිවාසිකම් උල්ලංඝනය වූ අයට විශේෂ අවධාරණයකින් යුතුව තිරුරහෝනයට භාජනය වූ පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා ගතහැකි "සෑම සුදුසු පියවරක්ම" ගැනීම අත්‍යවශ්‍ය වේ. 16 වන ව්‍යවස්ථාව විශේෂයෙන්ම අවධානය යොමු කරන්නේ ජීවත්වීමේ අයිතිය සහ වධහිංසා වලින්, කුරිරු අමානුෂික අවමන් සහගත සැලකිල්ලෙන් හා දඬුවම් වලින් මිදීමේ අයිතිය සම්බන්ධවයි.[10] විශේෂයෙන් කාන්තාවන් හා ළමුන් ගේ විශේෂ අවශ්‍යතා හඳුනා ගන්නා අතරම මෙකී පුද්ගලයන්ව හිංසා වලින් සහ ඔවුන්ගේ ආරක්ෂාවට ඇති තර්ජනයන්ගෙන් ආරක්ෂා කිරීමට රාජ්‍යයයන් බැඳී සිටී.[11] වෙනත් වචන වලින් පැවසුවොත්, තිරුරහෝනයට භාජනය වීම යන පදනම මත සංක්‍රමණිකයෙකු අයහපත් ලෙස සැලකීමට රාජ්‍යයකට අයිතියක් නොමැත යන්න *තිරුරහෝන්න මූලපත්‍රයේ* පැහැදිලිව දක්වා ඇත.

ශ්‍රී ලංකාව 2000 දෙසැම්බර් මාසයේ දී අන්තර්ජාතික අපරාධයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට හා *තිරුරහෝන්න මූලපත්‍රයට* අත්සන් තැබුවද, මේවා මේවන තෙක් අපරානුමත කොට නොමැත.

## 2.4 ශ්‍රී ලාංකීය අණ පනත්

ශ්‍රී ලංකාව තුළ මානව තිරුරහෝනය නිශ්චිතව සාපරාධී වරදක් ලෙස නොසැලකේ. එනමුත්, පුද්ගලයකු ශ්‍රී ලංකාවට ඇතුළුවීම සහ පිටවීම සම්බන්ධයෙන් ප්‍රධාන ලෙස පාලනයක් කරන 1948 අංක 28 දරණ ආගමන හා විගමන (සංශෝධිත පරිදි) පනතෙහි,[12] (මින්මතු ආගමන හා

---

10. *තිරුරහෝන්න මූලපත්‍රය*, 16(1) වගන්තිය.
11. *තිරුරහෝන්න මූලපත්‍රය*, 16(2), (3) සහ (4) වගන්තිය.
12. පනතේ, දීර්ඝ නාමයෙහි සඳහන් වන්නේ: ශ්‍රී ලංකාව තුළට පුරවැසියන් නොවන පුද්ගලයින්ගේ ඇතුල්වීම පාලනය කිරීමටත්, ශ්‍රී ලංකාව තුළින් පුරවැසියන් සහ පුරවැසියන් නොවන පුද්ගලයින්ගේ පිටවීම විධිමත් කිරීමටත්, ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන නුසුදුසු පුද්ගලයින් ශ්‍රී ලංකාව තුළින් ඉවත් කිරීමටත් සහ ඉහත කරුණු වලට ආනුශංගික වූ වෙනත් කරුණු හෝ සම්බන්ධිත වූ වෙනත් කරුණු පිළිබඳ වූ පනත, යනුවෙනි.

විගමන පනත ලෙස හඳුන්වන) මානව තිරුරහෝනය සම්බන්ධයෙන් වන අපරාධ පිළිබඳ ප්‍රතිපාදන අඩංගු වේ.

එහි විශේෂිතව දක්වා ඇති පරිදි, පුද්ගලයින් - විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන අය - රටකට ඇතුළුවීම හෝ පිටවීම කළ යුත්තේ[13] අනුමැතිය ලත් ඇතුල්වීමේ ස්ථානයකින් වන අතර ඒ සඳහා අදළ වූ ලේඛන මෙන්ම අවශ්‍ය වූ විටක ඇතුල්වීමේ වීසා සහිත ගමන් බලපත්‍රයක් තිබිය යුතුය.[14] එයට අමුණා ඇති උපලේඛනයේ සඳහන් පරිදි ඇතුළු වීමට හෝ පිටවීමට අනුමත වරායන් වන්නේ, කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ තලෙයිමන්නාරම් ජෙටි වන අතර, ගුවන් තොටුපළවල් වන්නේ රත්මලාන, මීගමුව, කන්කසන්තුරෙයි සහ කොග්ගල යි. එමනිසා ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන්නෙකු නිසි ලියකියවිලි නොමැතිව නිල නොවන තොටුපළක් හරහා ශ්‍රී ලංකාවට පැමිණීම හෝ පිටවීම වරදකි. ඊට සමානවම ශ්‍රී ලාංකිකයනුත් ශ්‍රී ලංකාවට පැමිණීමේදී හා පිටවීමේදී වලංගු ගමන් බලපත්‍රයක්[15] සහිතව පිළිගත් තොටුපළක් හරහා ගමන් කළ යුතුය.[16]

ගමන් ලියවිලි සම්බන්ධයෙන් ආගමන හා විගමන පනතේ 45 වන වගන්තියට අනුව පහත දක්වෙන ප්‍රාරම්භක වැරදි සිදුකිරීම හෝ ඊට ආධාර සහ අනුබල දීමද වරදකි.

- නිකුත් කළ ස්ථානය කුමක් වුවත්, කුමන ගමන් බලපත්‍රයක හෝ වීසා පිටසත් ලාංඡනයක් වංචනික ලෙස යෙදීම, වෙනස් කිරීම හෝ ඇහිලි ගැසීම;[17]
- ඕනෑම සහතිකයක් වංචනිකව පිටපත් කිරීම, වෙනස් කිරීම හෝ ඇහිලි ගැසීම;[18] සහ
- වංචනික හෝ වෙනස්කළ හෝ විෂම ගමන් බලපත්‍රයක්, වීසා පිටසත් ලාංඡනයක් හෝ සහතිකයක් භාවිතා කිරීම හෝ සන්තකයේ තබා ගැනීම.[19]

---

13. 9 වන වගන්තිය - ආගමන හා විගමන පනත.
14. ආගමන හා විගමන පනත, 10 වන ඡේදය.
15. ආගමන හා විගමන පනත, 35 වන ඡේදය.
16. ආගමන හා විගමන පනත, 34 වන ඡේදය.
17. ආගමන හා විගමන පනත, 45(ඇ) වන ඡේදය.
18. ආගමන හා විගමන පනත, 45(ඉ) වන ඡේදය.
19. ආගමන හා විගමන පනත, 45(ඊ), (උ) වන ඡේදය.

වර්තමාන පනතට අනුව ප්‍රධාන වැරදිකරු සංක්‍රමණිකයා වීම අවධානය යොමු විය යුතුය. මෙම තත්ත්වය, තිරුරහෝනය සිදු කරන්නා ප්‍රධාන වරදකරු ලෙස හඳුනා ගැනීමට රාජ්‍ය පාර්ශවයන්ට බල කරන තිරුරහෝන මූලපත්‍රයේ දක්වා ඇති ජාත්‍යන්තර සම්මතයට පරස්පර විරෝධීව නැගී සිටී. ශ්‍රී ලංකාව තුළදී අත්අඩංගුවට ගත් තිරුරහෝනය සිදු කරන්නෙකු නිතැතින්ම, සංක්‍රමණිකයාට නීතිය කඩ කිරීම සඳහා සහය වූ හෝ අනුබල දුන් තැනැත්තා ලෙසට නිර්වචනය වේ. පවතින නෛතික ප්‍රතිපාදන යටතේ තිරුරහෝනය සිදු කරන්නාට චෝදනා එල්ල කළ හැකි වුවත්, එම චෝදනා, සංක්‍රමණිකයාට එරෙහිව ඇති චෝදනාව හා සලකන කල ඉතා දුබල චෝදනාවක් වන අතර, තිරුරහෝනය සිදු කරන්නා වරදකරුවෙකු වීම, සංක්‍රමණිකයා විසින් ඔහු තමාට සහාය දුන් බව සනාථ කිරීම යන කරුණ මත රඳා පවතියි. මෙය විශේෂිතවම ගැටලුකාරී වන්නේ ජාත්‍යන්තර අපරාධ හවුල් හා බොහෝවිට තිරුරහෝනය සිදු කරන්නාගේ සම්බන්ධතා ඇතිහෙයින්, ඔවුන්ගේ පළිගැනීම් වලට ලක් වේ යැයි සාධාරණ බියක් සංක්‍රමණිකයන්ට ඇතිවිය හැකි හෙයිනි. සංක්‍රමණිකයාට සහ තිරුරහෝනය සිදු කරන්නා යන දෙදෙනාටම, මෙම වරද ඇපදිය නොහැකි[20] වරදක් ලෙස වර්ග කර ඇති අතර, එමගින් දැක්වෙන්නේ ශ්‍රී ලංකා රජයේ දෘෂ්ටි කෝණයට අනුව එය කෙතරම් බරපතල වරදක් ද යන්න වන අතර විශේෂයෙන්ම සංක්‍රමණිකයා ඇතුළුව වූදිතයන්ගේ නිදහසට පනවා ඇති සීමාවන් සාධාරණීකරණය කිරීම පිළිබඳ වැදගත් ගැටලු රාශියක් එමගින් නංවයි. ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන අයෙකුව කුමන හෝ ආකාරයකින් ශ්‍රී ලංකාවට ගෙන ඒම, රහසේ තබා ගැනීම, රැකවරණය සැපයීම තහනම් කිරීම තුළින් ආගමන හා විගමන පනතේ 45අ(1) වගන්තිය, මානව තිරුරහෝනය සාපරාධී ක්‍රියාවක් බවට පත් කරයි. කෙසේ නමුත්, ශ්‍රී ලංකාවෙන් පිටතට සිදුකරන මානව තිරුරහෝනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ප්‍රතිපාදන සලසා නොතිබීම එහි පවතින අඩුපාඩුවකි.

ජාත්‍යන්තර නෛතික සම්මතයන් හා අනුකූල වීමට අසමත් වීම යන කරුණු හා මානව තිරුරහෝනය යන ගැටලුව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට වත්මන් නෛතික ප්‍රතිපාදන වල ඇති අඩුපාඩු සම්බන්ධයෙන් රජය දැනුවත්ව සිටී. ආගමන හා විගමන නීති ප්‍රතිපාදන සමාලෝචනය කිරීමට පත් කළ කමිටුව විසින් සංශෝධිත ආගමන හා විගමන පනත කෙටුම්පත් කර ඇති අතර එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. 2000 වර්ෂයේ දී ආරක්ෂක අමාත්‍යංශය විසින් මෙම කමිටුව පත් කළේ, මූලිකවම

20. ආගමන හා විගමන පනත, 47 වන ඡේදය.

මානව තිරුරහෝනයට විසඳුම් සෙවීම සඳහායි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති - නව නීති කෙටුම්පත මගින් - 2000 වර්ෂයේ *තිරුරහෝන මූලපත්‍රය*[21] සැලකිල්ලට භාජනය කරයි. යෝජිත කෙටුම්පතින් තිරුරහෝන මූලපත්‍රය අනුවම තිරුරහෝනය සිදු කරන්නා නිර්වචනය කෙරෙන අතර, පුද්ගලයෙකුව ද්‍රව්‍යමය වාසියක් හිමිකර ගැනීම සඳහා තිරුරහෝනය කිරීමේ ක්‍රියාව වරදක් බවට පත් කරයි. තවදුරටත්, දූෂණය මුලිනුපුටා දැමීමේ අරමුණින් යුතුව තිරුරහෝනය සිදු කිරීමට පහසුකම් සැලසීමට සම්බන්ධ වන රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම සඳහා විශේෂ ප්‍රතිපාදන මෙමගින් යෝජිතයි. ඇත්ත වශයෙන්ම, නව නීති ප්‍රතිපාදන වල අරමුණ වී ඇත්තේ තිරුරහෝන අපරාධයේ අවධානය සංක්‍රමණිකයා වෙතින්, තිරුරහෝනය සිදු කරන්නා වෙත හා තිරුරහෝනය සංවිධානය කිරීමට හා එයට පහසුකම් සැලසීමට සම්බන්ධ වූ ආධිපත්‍යය හිමි පුද්ගලයින් වෙතට හුවමාරු කිරීමයි. මෙලෙස යෝජිත වෙනස්කම් බලාත්මක වුවහොත්, තිරුරහෝනය සම්බන්ධයෙන් වූ ශ්‍රී ලාංකීය ප්‍රතිපාදන, *තිරුරහෝන මූලපත්‍රයේ*[22] ප්‍රතිපාදන වලට බොහෝ සේ ළඟා කරවනු ඇත. එවිට පාර්ලිමේන්තු සභිකයන්ට මෙන්ම සිවිල් සමාජ කණ්ඩායම් වලටද ව්‍යවස්ථාව මගින් සියලුම සංක්‍රමණිකයන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳව සහතික වීමට සිදු වේ. 2003 වර්ෂයේ දී ව්‍යවස්ථාදායකයාට වෙනස්කම් සිදුවෙතැයි පෙනෙන්නට තිබුණත්, වත්මන් ව්‍යවස්ථාදායකය යටතේ සංක්‍රමණිකයන් අත්අඩංගුවට ගැනීමත් ඔවුන් චූදිතයන් කර නඩු පැවරීම දිගටම පැවතුණ අතර, ඒවාට සම්බන්ධිත තිරුරහෝනය සිදු කරන්නන් අත්අඩංගුවට ගැනීමත් ඔවුන් චූදිතයන් ලෙස නඩු පැවරීමත් සිදු කිරීම ඉතාමත්ම අසීරු කාර්යයක්ව පැවතිණි.

## 2.5 වර්ෂ 2003 දී ශ්‍රී ලංකාවෙන් හා ශ්‍රී ලංකාව හරහා සිදු වූ මානව තිරුරහෝනයන්

වර්ෂ 2003 දී, නෞකා සහ මාළු ඇල්ලීමට යොදා ගන්නා බෝට්ටු නීති විරෝධීව පටවාගත් මිනිස් තොග රැගෙන ශ්‍රී ලාංකීය වෙරළෙන් පිටත් වීම

---

21. 2004 ජනවාරි 26 වන දින ජ්‍යෙෂ්ඨ නීති කෙටුම්පත්කරු, ජී.එස්.ජී. ද සිල්වා, සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව.

22. තවමත් පරිවර්තනය කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැති බැවින් යෝජිත නව නීති කෙටුම්පත පිළිබඳ මේ අවස්ථාවේදී විවේචනය කිරීම නුසුදුසුය. එසේ ඉදිරිපත් කළ පසු යෝජිත නීති කෙටුම්පත සම්පූර්ණ විචාරයක්, සංක්‍රමණිකයන්ගේ මානව හිමිකම් වලට අදාළව සිදුකළ යුතුය.

නොකඩවා සිදුවිය. සෑම මසකම ශ්‍රී ලාංකිකයන් 50 දෙනෙකු මුහුද හරහා ඉතාලියට පමණක් තිරුරහෝනය කරන බවට තක්සේරු කර ඇත.[23] තවත් බොහෝ නීති විරෝධී සංක්‍රමණිකයන්, කූට හෝ වෙනස් කරන ලද ගමන් ලියවිලි භාවිතා කරමින් ගුවන් මගින් ගමන් කිරීමට උත්සාහ දරයි. වර්ෂ 2003 දී තිරුරහෝනයට සම්බන්ධ දේශ සීමා පාලන කටයුතු වල ප්‍රධාන ප්‍රවණතා 5 ක් දැකිය හැකිවිය. එනම්, වැඩිදියුණු කළ ආරක්ෂක උපක්‍රම ක්‍රියාත්මක කිරීම: පවතින්නා වූ නීති දැඩිව බලාත්මක කිරීම: තිරුරහෝන මෙහෙයුම් වලට සම්බන්ධිත නිලධාරීන් සොයා ගැනීම: ගමනේ යෙදෙන විදේශීය නීති විරෝධී සංක්‍රමණියන් සඳහා හුවමාරු කේන්ද්‍රයක් ලෙස ශ්‍රී ලංකාව මතුවී පෙනීම: ආරක්ෂක උපක්‍රමයක් ලෙස ජීව මැහුම් දත්ත එක්රැස් කිරීම ආරම්භ කිරීම. මේ එක් එක් කරුණක්ම කෙටියෙන් සාකච්ඡා කරනු ලැබේ.

## වැඩි දියුණු කළ ආරක්ෂක උපක්‍රම

නීති විරෝධී සංක්‍රමණ වලට එරෙහිව සටන් කිරීම සඳහා රජය විසින් දේශ සීමා පාලන උපක්‍රම වැඩි දියුණු කිරීමට පියවර ගන්නා ලදී. මෙම වැඩිදියුණු කිරීම් ඇති වූයේ, නීති විරෝධී සංක්‍රමණය යනු ජාත්‍යන්තර ගැටලුවක් යන මතය නිසාම සහ නීති විරෝධී සංක්‍රමණය වැළැක්වීමෙහි ලා වගකීම් ඉටු කරන බවට අනික් රාජ්‍යයන්ට සහතික කිරීමට ශ්‍රී ලංකාව වගකීමෙන් බැඳී සිටීමයි. වඩා අපවාදාත්මක තර්කය වනුයේ, දිවයින තුළින් නීති විරෝධී ලෙස සිදුකරන පිටත්වීම් වැළැක්වීමට ශ්‍රී ලංකාවේ නිලධාරීන් වෙත දැඩි ජාත්‍යන්තර පීඩනයක් ඇති වීමයි. නිර්වචනයන් දෙකෙහිම යම්කිසි සත්‍යතාවයක් පවතී. මෙයින් කුමන නිර්වචනය පිළිගත්තත්, රජය විසින් 2003 වර්ෂයේ දී තිරුරහෝනය සම්බන්ධයෙන් කටයුතු කිරීමට නව නෛතික ප්‍රතිපාදන (ඉහත සාකච්ඡා කළ පරිදි) කෙටුම්පත් කළ අතර, ස්වාධීනව මෙන්ම අන් රාජ්‍යයන් හා සහයෝගයෙන් යුතුව, ලේඛන, ක්‍රියා පටිපාටි හා උපකරණ වැඩි දියුණු කිරීමට පියවර ගන්නා ලදී.

ලේඛන සම්බන්ධයෙන්, අභ්‍යන්තර කටයුතු ඇමතිවරයා විසින් නීති විරෝධී සංක්‍රමණ හා ලේඛනවල සිදුකරන වංචාවන් වැළැක්වීමට රාජ්‍ය දූත සේනා, සහ ගුවන් සේවාවන් සමඟ මාසික සංවාද ආරම්භ කළේය. මෙමගින්, සාමූහික ප්‍රයත්නයක් සඳහාත් තොරතුරු බෙදාහදා ගැනීමටත් ගමන් ලියවිලි

---

23. ජයම්පති ජයසිංහ විසින් "ශ්‍රී ලංකාව හරහා පුද්ගලයින් හොරෙන් පිටරට යැවීම" යන මැයෙන් 2003 ජූලි 6 වැනි දින සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතට ලියන ලද ලිපිය.

අනිසි ලෙස භාවිතා කිරීමට එරෙහිව සැලසුම් සහගත ප්‍රයත්නයක් යෙදවීමට ඉඩ ප්‍රස්ථා ඇතිවිය. ප්‍රධාන වැඩිදියුණු කිරීමක් ලෙස, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව (IED) විසින් අගෝස්තු 1 වැනි ද සිට, කූට හා වංචනික ක්‍රියා වැළැක්වීමට සහයක් දෙන අලුත් ආරක්ෂක උපක්‍රමයන් සහිත "N වර්ගයේ" ගමන් බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කරන ලදී.[24] විදේශීය සමාගම් විසින් අති විශාල වියදමක් දරා වැඩි දියුණු කළ මෙම නව ගමන් බලපත්‍රයේ, ඩිජිටල් සහ පුද්ගලීකරණය කළ ආරක්ෂක උපක්‍රම අන්තර්ගත වේ.

නව විද්‍යුත් ආරක්ෂක උපකරණ සවිකිරීම හා ආගමන හා විගමන ක්‍රියා පටිපාටියක් තුළ වගකිවයුත්තන් පරීක්ෂා කිරීමේ අවස්ථා ඇති කිරීම මඟින් තම නිලධාරීන් සාපරාධී කල්පි හා සහයෝගයෙන් ක්‍රියා කිරීම වැළැක්වීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව (IED) පියවර ගන්නා ලදී. එසේම නිලධාරීන්ට වංචාසහගත ලියවිලි අනාවරණය කර ගැනීමටත් වැඩි දියුණු කළ ආගමන හා විගමන ක්‍රියාදාමයන් පිළිබඳවත් ඔවුන්ට උසස් පුහුණුවක් ලබා දී ඇත.

සහයෝගීතාව දක්වීමක් වශයෙන් වර්ෂ 2003 ජූලි මසදී ශ්‍රී ලංකා රජය හා ඕස්ට්‍රේලියානු රජය විසින් අමාත්‍යංශමය මට්ටමෙන්, නීති විරෝධී සංක්‍රමණ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයක් කරන ලදී. එම ප්‍රකාශය මඟින් නීති විරෝධී සංක්‍රමණයට එරෙහිව සටන් කිරීම සඳහා සහයෝගීතාවය දක්වීමට දෙරටම බැඳී සිටින බව යළි අවධාරණය කළ අතර ඒ සම්බන්ධව වැළැක්වීමේ පියවර රාශියක් භාර ගන්නා ලදී.[25] වඩාත් තාක්ෂණික මට්ටමින්, නව උපකරණ මිළදී ගැනීම සහ සවිකිරීමත්, ආගමන නිලධාරීන් සඳහා නවීනතම ආකාරයේ වූ පුහුණු ආයතනයක් විවෘත කිරීම ඇතුළත්ව, සංක්‍රමණ කළමනාකරණය කිරීමේ හැකියාව වැඩි කිරීමට සහය දීමක් ලෙස වූ එවැනි මූල පිරිමි රාශියක්ම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

---

24. "හොරෙන් සහ වංචාවෙන් මුළිනුපුටා දැමීම සඳහා නව ගමන් බලපත්‍රයක්" යන මැයෙන් 2003 ජූලි 29 වන දින ඩේලි නිවුස් පුවත්පතට සරත් මලලසේකර විසින් රචිත ලිපිය: "සල්ලි මිටි සහ කපටි නිලධාරීන්ගේ තෙල් මානව හිරුරහෝන ව්‍යාපාරය (පුද්ගලයින් හොරෙන් පිටරට පැටවීමේ ව්‍යාපාරය)' යන මැයෙන් 2003 ජූලි 27 වන දින සන්ඩේ අයිලන්ඩ් පුවත් පතට නාමිනි විජේදස විසින් රචිත ලිපිය.

25. 2003 ජූලි 20 වන දින සන්ඩේ ලීඩර් පුවත්පතේ, "මානව හිරුරහෝනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ඕස්ට්‍රේලියානු ඇමතිවරයෙක් ලංකාවට පැමිණෙයි" යන මැයෙන් පළවූ ලිපිය: "මානව හිරුරහෝනය සහ සරණාගත ගැටලුව පිළිබඳ ඕස්ට්‍රේලියානු ඇමතිවරයා හා අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමති අතර සාකච්ඡා" යන මැයෙන් 2003 ජූලි 24 වන දින ඩේලි නිවුස් පුවත්පතේ පළවූ ලිපිය.

විසින් සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) එක්ව ආරම්භ කරන ලදී. නීති විරෝධී සංක්‍රමණ වැළැක්වීමට හා මුළිනුපුටා දැමීමට සහයෝගය දක්වීම පිණිස රජය එක්සත් රාජධානිය හා පකිස්ථානය සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී.[26] දෙවන අවස්ථාවේදී, ශ්‍රී ලංකා රජය පකිස්ථානු රජය හා සමඟ අවබෝධතා ගිවිසුමකට පවා අත්සන් තබන ලදී.

## ශ්‍රී ලංකාව කලාපීය හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස

යුරෝපය හා ඕස්ට්‍රේලියාව බලා ගමනේ යෙදීමට බලාපොරොත්තු වන විදේශිකයන්ට, ශ්‍රී ලංකාව ප්‍රධාන හුවමාරු මධ්‍යස්ථානයක් බවට පත්ව ඇති බව වර්ෂ 2003 දී දකගත හැකි විය. වර්ෂ 2003 නොවැම්බර් මස වන විට අත්අඩංගුවට ගත් විදේශ ජාතිකයින් ගණන 693 කට ආසන්න වූ අතර එම අත්අඩංගුවට ගැනීම් විසින් සැලකිය යුතු අන්දමේ මාධ්‍ය අවධානයක් ඇද ගත්තා ලදී. ඔවුන් තම මව් රටවල් වලට යවනවා වෙනුවට ඔවුන් ශ්‍රී ලංකාව තුළ රඳවා ගෙන නඩු පැවරීමට රජය තීරණය කළේය.

සාර්ක් කලාපයේ පුද්ගලයින් මෙසේ ශ්‍රී ලංකාව කලාපීය හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කරයි. ගුවනින් පැමිණෙන මොවුනට ඇතුළු වීමට වීසා සතුවන අතර ඔවුන් වෙළඳ කටයුත්තක් හෝ විවේකය සඳහා නීත්‍යානුකූලව ශ්‍රී ලංකාවට පැමිණීමට පුළුවන. පසුව ශ්‍රී ලංකාවේ සිටින පහසුකම් සලසන්නා යුරෝපයට හෝ කලාතුරකින් ඕස්ට්‍රේලියාවට ගමන් කිරීමට සම්බන්ධීකරණයන් සිදු කරයි. ටික කාලයක් සිටීමෙන් පසුව, මෙම පුද්ගලයන්ව ධීවර බෝට්ටු වලට පටවා මුහුදෙන් පිටත් කරයි. පසුව ඒවා ගමනාන්තය දක්වා ගමන් කරන ගමනාන්තයට කිට්ටු විශාල යාත්‍රා මුණගැසෙන තැනකට ගොස් මොවුන්ව ලබා දෙයි. බොහෝවිට තවත් හුවමාරු මධ්‍යස්ථානයක් පවතිනුයේ, කුඩා බෝට්ටු වලින් සංක්‍රමණිකයන් ගමනාන්ත රටේ වෙරළට ගෙන යාමටය. මෙම අරමුණ සඳහා බංග්ලාදේශ, ඉන්දියානු සහ පකිස්ථානු ජාතික සංක්‍රමණිකයන් හොරෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන අතර මේ සඳහා පහසුකම් සලස්වන්නන් සහ තිරුරහෝතකයන් වන්නේ ශ්‍රී ලාංකිකයන් සේම ඉන්දියානු, රුසියානු සහ යුක්රේනුවානු

---

26. "මානව තිරුරහෝනයට විරුද්ධව සටන් කිරීම සඳහා ශ්‍රී ලංකාව හා පකිස්ථානය අතර ගිවිසුමක්". යන මැයෙන් 2003 අගෝස්තු 2 වන දින ඩේලි නිව්ස් පුවත්පතට සරත් මලලසේකර විසින් රචිත ලිපිය: "මානව තිරුරහෝනය මැඩලීමට උපාය මාර්ග සෙවීමට පකිස්ථානු සහ ලංකා අභ්‍යන්තර කටයුතු ඇමතිවරු" යන මැයෙන් 2003 ජූලි 31 වන දින අයිලන්ඩ් පුවත්පතට ඔහු විසින් රචිත ලිපිය: "මිනිසුන් නැව් ගත කිරීම මැඩලීමට පියවර" යන මැයෙන් ෂම්ස් ෂෙස්තා විසින් 2003 අගෝස්තු 17 වන දින සන්ඩේ ලීඩර් පුවත්පතට රචිත ලිපිය.

විදේශිකයන්ගෙන් සමන්විත අන්තර්ජාතික ජාලයකි. විදේශීය පහසුකම් සපයන්නෝ බොහෝ විට රටින් පිටත සිටිති. නමුත් ඔවුන්ට ශ්‍රී ලංකාව තුළ වැඩ කටයුතු කිරීමේ දනුමක් පවතී. මේ අනුව 'ඇතුළුවීමේ වීසා' මේ ප්‍රවණතාවයට දයකත්වයක් කරන බවට තර්ක කළ හැක.

අනිකුත් රාජ්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතරම රජය අතිරේක බලාත්මක කිරීමේ පිළිවෙත් රට තුළ යොද ඇත. දකුණු ආසියාතික පැමිණීම් සම්බන්ධයෙන්[27] සුපරික්ෂාකාරීව බලන ලෙස ආගමන හා විගමන පාලක සිය නිලධාරීන්ට ජූලි මසදී නියෝග කළේය. සංචාරක ව්‍යාපාරය සහ වෙළඳ ගමන් වර්ධනය කිරීමේ රිසියෙන් පවතින ශ්‍රී ලාංකීය වීසා ක්‍රමය අයථා පරිදි භාවිතා කරන බව රජය විශ්වාස කරයි. රට තුළට පැමිණෙන නීති විරෝධී සංක්‍රමණිකයන් වැළැක්වීමට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි බුද්ධි අංශයේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කර ඇත.

නීති විරෝධීව ගමන් කිරීමට තැත්කර අසු වූ සංක්‍රමණිකයන්ට දඩි දඬුවම් විඳීමට සිදු වේ. නිදසුනක් ලෙස, තංගල්ලෙන් අල්ලා ගන්නා ලද පාකිස්ථානු ජාතික සංක්‍රමණිකයන්ට වසරක බරපතල සිරදඬුවමක් සහ රුපියල් 50,000ක දඩයක් බැගින් නියම කෙරුණු[28] අතර එම දඩය ගෙවීමට නොහැකි නම් තවත් මාස 2 ක් බන්ධනාගාර ගත විය යුතුය. මුදල් නැතිවී අමාරුවෙන් දරා සිටින මෙම සංක්‍රමණිකයන්ට අතිරේක දඬුවම් ලබා දීම ප්‍රමාණය ඉක්මවා යාමකි. ඒ තත්ත්වය *තිරරුහෝන මූලපත්‍රයේ* 5 වන වගන්තියට පටහැනි වනවා පමණක් නොව තිරුරහෝනකයන්ගේ වෙළඳම ශක්තිමත් වන අතර ගොදුරු වූ පාර්ශවයට පමණක් දඬුවම් කිරීමකි.

එසේම සංක්‍රමණිකයන් ශ්‍රී ලංකා බන්ධනාගාර තුළ රැඳවියන් ලෙස සලකන ආකාරය සලකා බැලිය යුතුය. 2003 දී, සාමාන්‍ය විදේශිකයන් ප්‍රමාණය ඉක්මවා බන්ධනාගාර තුළ රැඳවියන් ලෙස සිටීම නිසා රජය විශාල විදේශීය රැඳවියන් ප්‍රමාණයක් පිටුවහල් කිරීමට තීරණය කරන ලදී. මෙම පුද්ගලයන් බන්ධනාගාර පද්ධතියට බරක් විය. එසේම ඔවුන් සිය රට වලට ප්‍රධාන

---

27. "පහසු වීසා බලපත්‍ර සම්බන්ධ අක්‍රමිකතා: ආගමන දෙපාර්තමේන්තුව දැඩි පියවර ගැනීමට සූදනම්", යන මැයෙන් දීපාල් වී. පෙරේරා සහ ගගනි වීරකෝන් විසින් 2003 ජූලි 20 වන දින *ටයිම්ස්* පුවත්පතට වාර්තා කළ පුවත; "බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ බුද්ධි අංශයේ ශක්තිය වැඩි කරයි" යන මැයෙන් 2003 ජූලි 20 වන දින ඩේලි මිරර් පුවත්පතේ පළවූ වාර්තාව.

28. 2003 අගෝස්තු 14 වන දින ලංකාදීප පුවත්පත.

වශයෙන් ඉන්දියාව, පාකිස්ථානය, බංග්ලාදේශයට ගිය පසු නඩු කටයුතු වලට භාජනය වෙයි.[29]

**විශාල අත්අඩංගුවට ගැනීම්**

වර්ෂ 2003 දී, තිරුරහෝනයට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව නීති බලාත්මක කිරීමේ ක්‍රියාවන්හි දී පෙර නොවූ විරූ සාර්ථකත්වයක් ලබා ගත්තේය. ත්‍රිකුණාමලය වෙරළේ දී[30] ස්වල්පයක් අත්අඩංගුවට ගැනීම් සිදු වෙද්දී බොහොමයක් අත්අඩංගුවට ගැනීම් දකුණු සහ බටහිර වෙරළ වලදී සිදු විය. ජනමාධ්‍ය වාර්තා කළ පරිදි විශේෂයෙන්ම බොහොමයක් විදේශීය සංක්‍රමණිකයන් අත්අඩංගුවට ගනු ලැබීය.

ශ්‍රී ලංකාව හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරිම වැළැක්වීමට අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශය දැඩි ප්‍රයත්නයක් දරිය.[31] බලාත්මක වගකීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට පැවරෙද්දී එය 2002 දී අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට මාරු කිරීම තුළින් වඩා හොඳින් මෙම වගකීම් ඉටු කළ හැකි විය. *තිරුරහෝන මූලපත්‍ර දිසාවට දිරිගැන්වීම් කරන* අතරතුර රාජ්‍ය උපාය මාර්ගයේ කොටසක් වන්නේ තිරුරහෝනය වෙනුවෙන් පවතින ජාත්‍යන්තර අපරාධ හවුල සුණු විසුණු කිරීමේ ඉලක්කයයි. ශ්‍රී ලාංකීය තිරුරහෝන කවයේ නැතිවම බැරි ශ්‍රී ලාංකික ප්‍රධාන පෙළේ පුද්ගලයන් 3 දෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ජූලි මසදී අත්අඩංගුවට ගනු ලැබිණි.[32] එසේම විශාල මානව තිරුරහෝන මෙහෙයුම් තුළ දෙවැනියා

---

29. "රජය විසින් විදේශීය සිරකරුවන් රටින් පිට කිරීමට පියවර' යන මැයෙන් 2003 සැප්තැම්බර් 07 වන දින සන්ඩේ අයිලන්ඩ්, පුවත්පතට ශමින්ද්‍රා ෆර්ඩිනැන්ඩු විසින් රචිත වාර්තාව. "සිර කඳවුරු අර්බුදයන්ට මුහුණපායි: තවත් සංක්‍රමණිකයන් රැසක් හසුවේ", යන මැයෙන් 2003 අගෝස්තු 2 වන දින ඩේලි නිව්ස් පුවත්පතට අසංග වර්ණකුලසූරිය විසින් කළ වාර්තාව. මෙම තැනැත්තන් ඔවුන්ගේ මව්බිම් වෙත නැවත යාමෙන් පසු, එම රටවල රජයන් ඔවුන් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය කෙසේ දැයි නොදන්නා අතර එය එසේ බාරගන්නා රටවල දේශීය ව්‍යවස්ථාවන්ට අනුව සිදුකළ යුතු කාර්යයක් වන අතර, එම කාර්යය එක් රටකින් තවත් රටකට වෙනස් වේ.
30. "නීති විරෝධීව මෙරටට පැමිණි සංක්‍රමණිකයන් රැසක් ත්‍රිකුණාමලයේදී අත් අඩංගුවට" යන මැයෙන් 2003 අගෝස්තු 16 වන දින ඩේලි නිව්ස් පුවත්පතේ පළවූ වාර්තාව.
31. "ශ්‍රී ලංකාව: මිනිසුන් හොරෙන් පිටරට පටවන ව්‍යාපාරික සමූහයා බිඳ වැට්ටවීමට ක්‍රියා කරයි" යන මැයෙන් ඔස්ට්‍රේලියානු ගුවන් විදුලි සංස්ථාවේ ආසියා ශාන්තිකර වැඩසටහන් යටතේ 2003 ජූලි 28 දින 20:43:59 විකාශය වූ වැඩසටහන.
32. "පොලිසිය විසින් මිනිසුන් හොරෙන් පිටරට පටවන කල්ලියක් වටලයි" යන මැයෙන් 2003 ජූලි 20 වන දින සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතේ පළවූ වාර්තාව.

ලෙස සැලකෙන ඉන්දියානු ජාතිකයෙක්වද ජූලි මස අත්අඩංගුවට ගනු ලැබුණි.[33]

## නිලධාරීන්ගේ සහභාගීත්වය

වර්ෂ 2003 දී, ශ්‍රී ලංකාවේ තිරුරහෝන කටයුතු වල නිල සහභාගිත්වයේ ඉහළ යාමක් දක ගත හැක. ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව මෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යන ද්විත්වයම තිරුරහෝන ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය නිලධාරීන් හවුල් වීම පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීමේදී සාර්ථකත්වයක් පෙන්නුම් කරයි.

නීති විරෝධීව ඉතාලියට ඇතුල් වීමට, නිලංක II නෞකාවට ආධාර සහ අනුබල දීම සම්බන්ධයෙන් නාවික හමුද පුද්ගලයන් 12 දෙනෙකු ජනවාරියේ දී චෝදනා ලැබීය.[34] ආගමන නිලධාරීන් සමඟ හවුල්ව වංචාසහගත ගමන් බලපත්‍ර භාවිතා කළ ශ්‍රී ලාංකිකයන් 6 දෙනෙකු ජූනි මස අත්අඩංගුවට ගනු ලැබිණි.[35] එසේම ජූලි මසදී තංගල්ලේ දී[36] අත්අඩංගුවට ගත් තිරුරහෝන කවයට නිලධාරීන්ගේ මැදිහත්වීමක් ද සම්බන්ධ බවට චෝදනා ඇත. ජූලි මසදී අවලංගු ගමන් බලපත්‍රයක් ගෙන රටින් පිටවීමට සහාය දුන් ආගමන නිලධාරියෙකු සේවයෙන් ඉවත් කරනු ලැබිණි. මෙකී පුද්ගලයාව අබුඩාබි හිදී අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට නැවත එවූ අතර, දන් ඔහු සිරභාරයේ පසුවෙයි.[37] සැප්තැම්බර් මසදී, ගමන් බලපත්‍ර වංචාවන් සඳහා තිරුරහෝනකයන්ට

33. "මිනිසුන් හොරෙන් පිටරට පටවන ඉන්දියානු මානව තිරුරහෝනකයා අත් අඩංගුවට" යන මැයෙන් සේනක ද සිල්වා සහ කුරුළු කාරියකරවන විසින් 2003 ජූලි 30 වන දින *ඩේලි මිරර්* පුවත්පතට කළ වාර්තාව: "මිනිසුන් හොරෙන් පිටරට පැටවූ මානව තිරුරහෝන මොළකාරයා අපරාධ විමර්ශන අංශය විසින් අල්ලා ගනී" යන මැයෙන් සරත් මලලසේකර විසින් 2003 අගොස්තු 01 වන දින *ඩේලි නිව්ස්* පුවත්පතට කළ වාර්තාව.

34. "නාවික හමුද නිලධාරියාට ඇප නියම වේ" යන මැයෙන් ලියරි බීක්මෙයර් විසින් 2003 මාර්තු 06 වන දින *ඩේලි මිරර්*, පුවත්පතට කළ වාර්තාව.

35. "මහා පරිමාණ ලෙස සිදු කළ විදේශ ගමන් බලපත්‍ර වංචාවක් විමර්ශනය යටතට" යන මැයෙන් නාමිනි විජේදස විසින් 2003 ජූනි 23 වන දින *ද අයිලන්ඩ්* පුවත්පතට කළ වාර්තාව.

36. "ගොඩ බැසීමෙන් පසු වීසා නිකුත් කිරීමේ ක්‍රමය නීති විරෝධී පුද්ගලයින්ට ශ්‍රී ලංකාව හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට හේතුවේ" යන මැයෙන් ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩු විසින් 2003 ජූලි 3 *ද අයිලන්ඩ්* පුවත්පතට කළ වාර්තාව.

37. "මානව තිරුරහෝනය කළ තවත් එක් ආගමන නිලධාරියකු සේවයෙන් පහ කරයි" යන මැයෙන් නාමිනි විජේදස විසින් 2003 ජූලි 27 වන දින *සන්ඩේ අයිලන්ඩ්* පුවත්පතට වාර්තා කළ පුවත.

සහාය දක්වූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පුද්ගලයන් 6 දෙනෙකුට විරුද්ධව අධිචෝදනා පත්‍ර භාරදෙන ලදී.[38] මහා පරිමාණයේ ගමන් බලපත්‍ර වංචාවකට සම්බන්ධ පුද්ගලයන් 9 දෙනෙකු ඔක්තෝබර් හිදී අත්අඩංගුවට ගනු ලැබීය. මෙකී චූදිතයන් තුළ සාමදාන විනිශ්චයකරුවෙකු, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පුද්ගලයකු හා ගමන් බලපත්‍ර කාර්යාංශයේ එක් නිලධාරියෙකු ද විය.[39]

2003 අග භාගයේදී අනාවරණය වූ ප්‍රධාන සිද්ධිය වනුයේ දූෂණයට හා නීති විරෝධී සංක්‍රමණයට හවුල් වූ ඇමරිකානු තානාපති කාර්යාලයේ නිලධරයන් සිටින බවයි. ඇතුළු වීමේ වීසාවන් විකිණීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඇමරිකානු[40] තානාපති කාර්යාලයේ ඇමරිකානුවන් දෙදෙනෙකු ඇතුළු 9 දෙනෙකු අත්අඩංගුවට ගනු ලැබුණි.

### ජීව මෙට්‍රික් දත්ත රැස් කිරීම

ත්‍රස්තවාදයට හා නීති විරෝධී සංක්‍රමණයන්ට විරුද්ධව විදේශීය රටවල් තම දේශ සීමා පාලනයට ආරක්ෂාකාරී පියවර වැඩි දියුණු කර ඇත. ශ්‍රී ලාංකිකයන් එක්සත් රාජධානියට වීසා ඉල්ලුම් කරන විට ඔවුන් ඇඟිලි සලකුණු ලබා දිය යුතුය.[41] එක්සත් රාජධානියේ බලාත්මක නියෝජිත ආයතන සමඟ බෙදාගන්නා වූ එකතු කළ එකී ඇඟිලි සළකුණු දත්ත සුරක්ෂිතව තබා ගනියි. ව්‍යාජ හැඳුනුම්පත් භාවිතය ඇතුළු ශ්‍රී ලාංකිකයන්ගෙන් සිදුවන වංචාසහගත රැකවරණය සහ ආගමන අයදුම්පත් සීමා කිරීමේ පිළිවෙතක් ලෙස මෙම ක්‍රමය භාවිතා කරන බව බ්‍රිතාන්‍ය ආණ්ඩුව ප්‍රකාශ කරන

38. "විදේශ ගමන් බලපත්‍ර නිලධාරීන්ගේ වැඩ තහනම් කෙරේ" යන මැයෙන් 2003 සැප්තැම්බර් 12 වන දින ඩේලි මිරර් පුවත්පතේ පළවූ වාර්තාව: "ආගමන නිලධාරීන් සය දෙනෙකු අත්අඩංගුවට" යන මැයෙන් 2003 සැප්තැම්බර් 15 වන දින ද අයිලන්ඩ් පුවත්පතට නාමිනි විජේදස විසින් වාර්තා කළ පුවත.

39. "විදේශ ගමන් බලපත්‍ර වංචාව සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් 9 අතරේ සාමදාන විනිශ්චයකාරවරයෙක්" යන මැයෙන් 2003 ඔක්තෝබර් 11 වන දින ද අයිලන්ඩ් පුවත්පතට කාලිංග වීරක්කොඩි විසින් වාර්තා කළ පුවත.

40. "වීසා අපචාරය ඇමරිකානු තානාපති කාර්යාලය කළඹයි" යන මැයෙන් 2003 මැයි 3 වන දින ඩේලි මිරර් පුවත්පතේ පළවූ වාර්තාව.

41. "එක්සත් රාජධානිය ශ්‍රී ලාංකිකයන් දැඩි ලෙස පරීක්ෂාවට භාජනය කරයි", යන මැයෙන් 2003 ජූලි 10 වන දින ඩේලි මිරර් පුවත්පතේ පළවූ වාර්තාව: "එක්සත් රාජධානියට වීසා බලපත්‍ර ලබා ගැනීම සඳහා කොළඹින් වූ සියලුම අයදුම්කරුවන්ගේ ඇඟිලි සටහන් ලබා ගැනේ" යන මැයෙන් 2003 ජූලි 10 වන දින ද අයිලන්ඩ් පුවත්පතට ශමින්ද්‍ර පර්ඩිනැන්ඩු විසින් කළ වාර්තාව.

අතර, විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයට පැමිණීමෙන් පසු ගමන් ලියකියවිලි විනාශ කර වැරදි නම් වලින් රැකවරණය අයදින අයගේ ක්‍රියාපටිපාටිය සඳහාය. වාර්තා වී ඇති පරිදි ජාත්‍යන්තර ක්ෂමා ආයතනය පෙන්වා දෙන්නේ මේ තත්ත්වය මානව හිමිකම් උල්ලංඝනයක් බවයි.[42]

මෙකී ඇඟිලි සලකුණු ලබා ගැනීම පිළිබඳ කරුණ වඩා විත්ත වේගී ලෙස මාධ්‍ය අවධානය යොමු වූ අතර විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයන් ඉලක්ක වීම නිසා සසල වීමක්ද සිදුවිය. දැක්විය යුතු කරුණක් වන්නේ ගමන් කරන ඊට ජීව මෙට්රික් දත්ත එකතු කිරීම අසාමාන්‍ය පිළිවෙතක් නොවන බවයි. බ්‍රසීලය, ප්‍රංශය සහ ඇමරිකාව ඇතුළු බොහොමයක් රටවල් මීට සමාන පිළිවෙත් හඳුන්වා දී ඇත.[43] යුරෝපයේ වසර ගණනාවක් ක්‍රියාත්මක වන යූරෝඩැක් පද්ධතියට අනුව යුරෝපා සංගමයේ ප්‍රතිපත්තියෙන් කොටසක් ලෙස එහි රැකවරණය අයදුම් කරන සියලුම අය ඇඟිලි සලකුණු ලබා දිය යුතුය. මෙය යුරෝපා සංගමයෙන් පිට අනිකුත් රටවල් වලටද පැතිර වීමට අදහස් කරයි.[44] අනිකුත් රටවල් ද මීට සමාන පිළිවෙත් පිළියෙල කරමින් පවතී. ජීව මෙට්රික් දත්ත අඩංගු හැඳුනුම්පතක්[45] ආරම්භ කිරීම ශ්‍රී ලංකාව තුළ ද පෙනෙන්නට විය. මේ පිළිවෙත් තුළින් පෞද්ගලිකත්වයේ අයිතිය කොතෙක් දුරට සීමා වේදැයි වඩා පරීක්ෂාකාරී විය යුතුය. කෙසේ වෙතත්, පැහැදිලි වන අනාගත ප්‍රවණතාවය වන්නේ, ගමන් ලියවිලි තුළ ජීව මෙට්රික් දත්ත ඇතුළත් වීමයි. එසේම එම පිළිවෙත් තුළින් සංක්‍රමණිකයන්ගේ සහ නිරන්තර ව්‍යාපාර සහ විවේකය සඳහා ගමන් කරන්නා වූ අයගේ අයිතීන් රැකිය යුතුය.

---

42. "ශ්‍රී ලාංකිකයන්ගේ ඇඟිලි සටහන් ලබාගැනීම පිළිබඳව ක්ෂමා ආයතනය එක්සත් රාජධානියෙන් ප්‍රශ්න කිරීමට යයි" යන මැයෙන් 2003 ජූලි 27 වන දින සන්ඩේ ටයිම්ස් පුවත්පතට ෂෙලානි පෙරේරා විසින් වාර්තා කළ පුවත. 4 වන පිටුව.
43. "ස්කෑන් කිරීමට භාජනය වීම සඳහා සූදානම් වන්න" යන මැයෙන් 2003 දෙසැම්බර් 6 සිට 12 දක්වා වූ ද ඉකොනොමිස්ට් සඟරාවේ වාර්තා විශේෂාංග යටතේ වූ ලිපිය. 15-17 තෙක් වූ පිටු.
44. 2002 හි "එක්සත් ජාතීන්ගේ සංක්‍රමණිකයින් පිළිබඳ වූ වාර්තාව" 29 වන පිටුව.
45. "ජාතික හැඳුනුම්පත් සඳහා ඇඟිලි සලකුණු ඇතුළත් කිරීම පිළිබඳව රජය සලකා බලයි" යන මැයෙන් 2003 නොවැම්බර් 14 වන දින ඩේලි මිරර් පුවත්පතට සජීවන් විජේවර්ධන විසින් වාර්තා කළ පුවත.

## 2.6 නිගමන - තිරුරහෝනය

වර්ෂ 2003 දී, මානව තිරුරහෝනයට විරුද්ධව රජය ගත්තා වූ දවැන්ත ප්‍රයත්නයට ඕස්ට්‍රේලියානු සහ ඇමරිකානු රජයන් ගේ ප්‍රශංසාව හිමිවිය. ඉහත පැහැදිලිව සාකච්ඡා කළ පරිදි, තිරුරහෝනයට සම්බන්ධ පුද්ගලයන් සහ ආයතන අනාවරණය කිරීම අත්අඩංගුවට ගැනීම සහ ඔවුන්ට විරුද්ධව නඩු කටයුතු පැවරීම වර්ධනය කිරීම තුළින් රජය විසින් 'ආරක්ෂාකාරී ප්‍රවේශයන්' ගත් බව පැහැදිලිය. පෙර පිළිවෙත් සංවර්ධනය වීම තුළින් මානව තිරුරහෝනයේ පසුබෑමක් දක්නට ඇති අතර වැදගත් කරුණක් වන්නේ රජය තිරුරහෝන වැටලීම් කිරීමේදී සිය අවධානය මානුෂීය සාධක සම්බන්ධයෙන්ද යොමු කළ යුතු බවය. මානව තිරුරහෝනය සම්බන්ධයෙන් රජය ගෙන ඇති දැඩි මතයට ගැලපෙන පහත නිර්දේශ 6 තුළින් සියලුම සංක්‍රමණිකයන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා වීමක්ද සිදු වෙයි.

පළමුව, තිරුරහෝනයට සම්බන්ධ නිලධාරීන්ගේ සහභාගිත්වයන් නතර කළ යුතුය. ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව සිය නිලධාරීන් මෙම ක්‍රියාවන්ට සම්බන්ධ වීම වැළැක්වීමට කටයුතු කරයි. නමුත් රාජ්‍ය ව්‍යාප්තිය තුළ අතිශය බරපතල හා සංකීර්ණ අපචාරයන් පවතී. වර්තමාන නීතිය තුළ නීති විරෝධී සංක්‍රමණිකයා රේගු නිලධාරියා සම්බන්ධ බව අනාවරණය නොකොළහොත් නිලධාරියාගේ නොසැලකිල්ල මත ඔහුට චෝදනා එල්ල කළ නොහැක.[46] යෝජිත නව ව්‍යවස්ථාව සම්මත වුවහොත් මෙම ප්‍රශ්නය නිරාකරණය වේ. එසේම රජය විසින් අතිරේක පිළිවෙත් අනුගමනය කළ යුත්තේ විනිවිදභාවය වැඩි කිරීමට, වගකිවයුතු බව වැඩි කිරීමට සහ ආගමන නිලධාරීන්ට දී ඇති අභිමතයන් සීමා කිරීමටය.

දෙවනුව, සංක්‍රමණිකයන්ට හා තිරුරහෝනයට විදේශිකයන්ගේ සම්බන්ධතාවයක් පවතින බවට මාධ්‍ය පෙන්වා දීමේ ප්‍රවණතාවයන් දැකිය හැක. සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන් තිරුරහෝනකයන්, වෙළඳාම් කරන්නන් සහ පහසුකම් සලසන්නන් මෙන්ම වින්දිතයන් සහ සංක්‍රමණිකයන් වීමද සමානව සිදුවන බව ප්‍රසිද්ධ කිරීම වැදගත් වේ. එම තොරතුරු තුළින් සංක්‍රමණිකයන් නීති විරෝධී සංක්‍රමණයේ ආදීනව තේරුම් ගන්නා අතර ඒ තුළින් ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන මෙන්ම ශාරීරික ආරක්ෂාව ගැනද අවධානය යොමු කරනු ඇත.

---

46. "සල්ලි මිටි සහ කපටි නිලධාරීන්ගේ කෙල් - මානව තිරුරහෝන ව්‍යාපාරය" යන මැයෙන් 2003 ජූලි 24 වන දින සන්ඩේ අයිලන්ඩ් පුවත්පතට නාමිනි විජේදස විසින් රචිත ලිපිය.

තුන්වෙනුව, සියලුම සංක්‍රමණිකයන්ගේ මානව අයිතිවාසිකම් වලට ගරු කළ යුතු බවයි. නීති විරෝධී සංක්‍රමණයන්ට විරුද්ධව ආරක්ෂක ප්‍රයත්නයන් සූදනම්ව තැබීම ආවරණය වුවද මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරිම, නිවාරණ පිළිවෙත් සහ දනුම් වර්ධන ප්‍රයත්නයන්ද අත්හැරිය නොහැක. තවද එයින් අදහස් වන්නේ, නීතිය ක්‍රියාත්මක කිරීමේදී දරුණු දඬුවම් නියම කිරීමෙන් වැළකී සිටිය යුතු අතර සංක්‍රමණිකයන් ගේ අයිතිවාසිකම් වලටද ගරු කළ යුතු බවයි. එසේම සංක්‍රමණිකයන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ගේ පෞද්ගලික තත්ත්වයන්ද සැලකිල්ලට ගෙන ඊට සමානුපාතික නොවන අන්දමින් දඬුවම් නොකිරීමට වග බලා ගත යුතුයි. තවදුරටත් කිසිදු පරිවේෂණීය තත්ත්වයක් තුළ වින්දිතයන් දඬුවමකට යටත් නොකළ යුතුවා සේම ජාත්‍යන්තර මානවවේදී සම්මතයන්ට සහ සාමාන්‍ය මූල ධර්මයන්ට අනුකූලව ඔවුන්ව ආරක්ෂා කළ යුතුයි. වර්තමානයේ පවතින නීති විරෝධී පිටත්වීම් සඳහා පවතින දරුණු දඬුවම් සහ එය ඇප දිය නොහැකි වරදක් ලෙස සැලකීම ඒ වන විටත් පරාජිතව සිටින සංක්‍රමණිකයන්ට පමණ ඉක්මවා යෑමක් ලෙස සැලකීමට සිදුවේ.

හතරවැන්න, භාෂා පරිවර්තන විධිවිධාන, ප්‍රමාණවත් රැඳවීම් පහසුකම් සහ ආරක්ෂාකාරී පිටමන් කිරීමේ පිළිවෙත් ඇතුළු ශ්‍රී ලංකාවේ දී අත්අඩංගුවට ගනු ලැබූ විදේශිකයන්ගේ අත්‍යවශ්‍ය අයිතීන්ට ගරු කළ යුතු අතර ඔවුන් නිලධාරීන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ට යහපත්ව සැලකිය යුතුය. තවදුරටත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සැමවිටම වඩා සුපරික්ෂාකාරීව ගමන් කරන්නන්ගේ සංක්‍රමණ අයිතිවාසිකම් දෙස අවධානය යොමු කරයි. හුදෙක් නීති විරෝධී සංක්‍රමණ වෙනුවෙන් විදේශීය චූදිතයන් අත්අඩංගුවට ගෙන නඩු පැවරීම (තිරුරහෝනයට එරෙහිව) වෙනුවට ඔවුන්ව වඩා ඉක්මනින් තම මව් රටවලට යැවීම උචිතය.

පස්වනුව, නව ආගමන හා විගමන පනත ව්‍යවස්ථාමය ක්‍රියාපටිපාටියට හැසිරවීම සඳහා නීතිඥයින් සහ සිවිල් සමාජ කණ්ඩායම් අවධානයෙන් සිටිය යුතුය.

වැදගත්කොටම එම නීතිය තුළින් ජාත්‍යන්තර සම්මතයන් තහවුරු කළ යුතු අතර ඒ තුළින් වින්දිතයන් ආරක්ෂා කිරීමක් මෙන්ම ඔවුන්ගේ දඬුවම් සමානුපාතික ලෙස සීමාව ඉක්මවා නොයා යුතුය. මේ නීතිය විදේශිකයන්ට වඩා බොහෝ ශ්‍රී ලාංකිකයන්ට බලපෑම් කරයි. ජාත්‍යන්තර සංක්‍රමණ ශ්‍රී ලංකාවට සැලකිය යුතු වැදගත්කමකින් යුක්ත වන අතර නව නීතිය තුළින් රටේ අවශ්‍යතාවන් සෑහෙන පරිදි ආවරණය වීමක්ද සිදු වෙයි. සියලුම

අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමට මේ කාලය තුළ මෙම නීතියෙන් හැකි වනුයේ එය යෝජිත කෙටුම්පත් අදියරේ පසුවන නිසාත් එය නීතිගත වීමට පෙර අවශ්‍ය සංශෝධන කළ හැකි නිසාත්ය.

අවසාන වශයෙන්, තිරුරහෝනයේ වින්දිතයන්ට උපකාර වන ලෙස සහ නීති විරෝධී සංක්‍රමණයන්ට හේතුවන කාරණා පරිද්දෙන් ශ්‍රී ලංකාව *තිරුරහෝන* මූලපත්‍රය අපරානුමත කර එහි පිළිවෙත් ක්‍රියාවට නැංවිය යුතුය. ඒ තුළින් මානව තිරුරහෝනය කෙටි කලකින් මුලිනුපුටා නොදැමිය හැකි මුත් වඩා අවදානමින් හා පිරිවැයක් දරා බලාපොරොත්තු සුන්වී ඇති පුද්ගලයන්ට එය ආරක්ෂාවකි. වැළැක්වීම් ක්‍රියාත්මක කරන නීති බලාත්මක කරන පිළිවෙත් සහ ආරක්ෂක පිළිවෙත් වලට වඩා මානවවාදී මෙන්ම අඩු වියදම් සහගත ද වේ.

## 3. පුද්ගලයින් වෙළඳම් කිරීම

### 3.1 නිර්වචනය

"පුද්ගලයින් වෙළඳම් කිරීම" යන පදයේ නිශ්චිත අර්ථය සම්බන්ධයෙන් විවාදයක් පවතී. පුද්ගලයින් වෙළඳම් කිරීම බොහෝ කාරණා හා සම්බන්ධකම් පවත්වයි. ඒ අතරින් ස්වල්පයක් වනුයේ සෞඛ්‍ය, සංක්‍රමණය, අපරාධ යුක්තිය, මානව අයිතිවාසිකම්, ශ්‍රමය සහ ගණිකා වෘත්තියයි.[47] මේ කී ප්‍රශ්නකාරී පුද්ගලයින් වෙළඳම් කිරීමට ප්‍රතිචාර ලෙස ඉතා කල්පනාකාරීව සැලසුම් සකස් කළ යුතු වන්නාසේම ඒට විරුද්ධ අන්තර්ජාතිකව සහයෝගිතාවය ඇති කරන, පහසුකම් සලසන පුද්ගලයන් තීරණය කළ යුතුය.[48] වෙනත් ප්‍රවේශයක් නොසලකා අන්තර්ජාතික ප්‍රජාව අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට අතිරේකව ඉදිරිපත් වූ *විශේෂයෙන්* කාන්තාවන් සහ ළමුන් ඇතුළු පුද්ගලයන්, වෙළඳම්

47. "අග්නිදිග ආසියාවේ පුද්ගල වෙළඳමට එරෙහිව සටන් කිරීම: ප්‍රතිපත්ති සහ වැඩ සටහන් වලට වූ ප්‍රතිචාර පිළිබඳ විවරණය, සංක්‍රමණිකයින් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය, ජිනීවා, 2000 හි පිටු අංක 10 හි වූ අනුෂ්කා ඩර්ක්ස් විසින් ඉහත මැයෙන් පළකළ ලිපිය. අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි මඟ: <http://www.imadr.org/project/petw/combattingtraffickingsoutheastasia.pdf>.

48. එම., 9 වන පිටුව.

කිරීමට එරෙහි මූලපත්‍රයට[49] එකඟ විය යුතුය. මෙකී මූලපත්‍රය වෙළඳාම් කිරීමට එරෙහිව ජාත්‍යන්තර උත්සාහයක් දරා ඇති අතර, "පුද්ගලයින් වෙළඳාම් කිරීම" අර්ථ නිරූපණයෙන්ද යම් වර්ධනයක් ඇති කර තිබේ.

> *"පුද්ගලයින් වෙළඳාම් කිරීම" යන්නෙහි ඇතුළත් වන්නේ, පුද්ගලයකුව උපයෝජනය කිරීමේ අදහසින් අලුතින් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු කිරීම, රඳවා ගැනීම හෝ තර්ජනය කර හෝ බලය පාවිච්චි කර හෝ වෙනත් ආකාරයෙන් බලෙන් ලබා ගැනීම, අපහරණය කිරීමෙන්, වංචාවෙන්, රැවටීමෙන්, බලය අනිසි ලෙස භාවිතා කිරීමෙන්, අවදානම් සහිත තත්ත්වයන් ඇති කිරීමෙන්, ගෙවීම් හෝ වරප්‍රසාද ලබා දීමෙන් හෝ ලබා ගැනීමෙන් තමන්ගේ හෝ වෙන අයෙකුගේ පාලනයේ සිටින පුද්ගලයාගේ කැමැත්ත ලබා ගැනීමේ අරමුණින් කිසියම් ගෙවීමක් ලබා ගැනීම හෝ ලබා දීමයි.*[50]

මේ කී සංකීර්ණ නිර්වචනය කොටස් කිහිපයක් ආවරණය කරයි. මෙහි අදහස් කරන පළමු මූලිකාංගය වන්නේ බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම, රැකවරණය සැපයීම හෝ පුද්ගලයන් ලබා ගැනීමයි. මෙහි විස්තර කළ සියලුම ක්‍රියාවන් හි අවශ්‍යතාවය වන්නේ පුද්ගලයෙකු එක ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කිරීමය. දෙවන මූලිකාංගය වන්නේ එම ක්‍රියාව කරනු ලබන්නා වූ ආකාරයයි. එනම් වෙළඳාම් කරනු ලබන වින්දිතයාව පාලනය කරන ආකාරයයි. එමනිසා වෙළඳාම් කරන්නා බලය යොදන බවට තර්ජනය කර, බලෙන් පොළඹවාගෙන අපහරණය කර, වංචාවෙන්, මුලා කිරීමෙන්, බලය අනිසි ලෙස භාවිතයෙන් හෝ වින්දිතයාගේ තත්ත්වය අපචාරයට ගොදුරු විය හැකි තත්ත්වයට පමුණුවා ඔහුව මෙහෙයවයි. පුද්ගලයින් වෙළඳාම් කිරීම පිළිබඳ මූලපත්‍රයට අනුව නියම කර ඇත්තේ වින්දිතයාගේ 'කැමැත්ත' අනවශ්‍ය බවත් ඔප්පු කළ යුත්තේ කුමන ආකාරයක බලය යෙදීම හෝ බලෙන් පොළඹවාගෙන රැකියාවක යෙදවීමයි.[51] එමනිසා මූලිකාංග දෙකක් එක් කළ විට ගනුදෙනු කිරීම ලෙස

---

49. මින් පසු මෙය පුද්ගල වෙළඳාම පිළිබඳ මූලපත්‍රය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම පුද්ගල වෙළඳාම පිළිබඳ මූලපත්‍රය (UN Doc. A/55/383) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ පනස් පස් වැනි සැසි වාරයේදී A/RES/55/25 දරණ 2000 නොවැම්බර් 15 වන දිනැති යෝජනා සම්මුතියකින් සම්මත කර ගන්නා ලදී. එය 17 වැනි වගන්තියට අනුකූලව බලාත්මක වූයේ 2003 දෙසැම්බර් 25 වන දිනය. පුද්ගල වෙළඳම පිළිබඳ මූලපත්‍රයට මේ වන විට අත්සන් තැබූවන් 117 ක් සහ පාර්ශවකරුවන් 45 දෙනෙක් සිටියි. මේ මූලපත්‍රයේ අන්තර්ගතය අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි මඟ: <http://www.unodc.org/unodc/en/crime cicp signatures.html>.
50. පුද්ගල වෙළඳම පිළිබඳ මූලපත්‍රයේ 3(අ) වගන්තිය.
51. පුද්ගල වෙළඳම පිළිබඳ මූලපත්‍රයේ 3(ආ) වගන්තිය.

අදහස් වන්නේ, බලය යොද හෝ මුලා කිරීමෙන් එක ස්ථානයක සිට තවත් ස්ථානයකට රැගෙන යාමයි.

තුන් වන මූලිකාංගය වන්නේ අපයෝජනයයි: මේ කී ක්‍රියාවන් චිත්දිතයාව අපයෝජනය කිරීමේ අදහසින් සිදු කිරීමයි. ඉහත නිර්වචනය විස්තර කළ පරිදි අපයෝජනයේ බලෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම, වහල්භාවය හෝ ඊට සමාන ක්‍රියාකාරකම් හෝ ඉන්ද්‍රියයන් ඉවත් කිරිම ඇතුළත් ය. එමනිසා පෙර කී මූලිකාංග දෙකක් එකතු කළ විට පුද්ගලයින් වෙළඳාම් කිරිම ස්ථාපිත කිරීමට පුද්ගලයෙකු එක ස්ථානයක සිට තවත් ස්ථානයකට බලෙන් හෝ මුලා කිරීමෙන් හෝ අපයෝජනය කිරීමේ අදහසින් යන ක්‍රියා සම්බන්ධ විය යුතුය. මේ කී ක්‍රියාදාමයේ කුමන හෝ අවස්ථාවක් සිදු කිරීම, ගනුදෙනු කිරීමට සම්බන්ධ ලෙස සැලකිය යුතුය.

තිරුරහෝනය කිරීම සහ පුද්ගලයින් වෙළඳාම් කිරීම අතර සමානකම් පැවතියද අඩුම තරමින් පැහැදිලිව දක්විය හැකි වෙනස්කම් දෙකක්වත් පවතී. පළමු වෙනස වන්නේ වෙළඳාමේදී අනිවාර්යයෙන් සිදුවන අපයෝජනයයි. නමුත් තිරුරහෝනයේදී පුද්ගලයා අපයෝජනය කිරීමේ අදහස අවශ්‍ය නොවේ. ඒ අනුව සැලකිය හැක්කේ තිරුරහෝනයේදී නීති විරෝධී ඇතුළු වීම හා පිටවීම සිදු වීමත් පුද්ගලයින් වෙළඳාම් කිරීමේදී නීති විරෝධී ඇතුල්වීමට අමතරව නීති විරෝධී ඇතුල්වීම ආරම්භ වීමත් සමග චින්දිතයාව අපයෝජනයට ලක් කරයි. දෙවනුව, තිරුරහෝන සංක්‍රමිකයා සාමාන්‍ය ගමනේ ස්වභාවය දන්නා අතර ඊට ස්වේච්ඡාවෙන් බැදේ. අනෙක් අතට පුද්ගලයන් වෙළඳාමේදී චින්දිතයන් කලාතුරකින් තමන් කුමකට භාජනය වේද යන්න දන්නා අතර, මුලා කිරීමෙන්, පොළඹවා ගෙන, කෲරත්වයෙන් සැලකීම හා වෙනත් පාර්ශවයක් අපයෝජනයට ලක් කිරීම මෙහිදී සිදු වේ.

පුද්ගලයින් වෙළඳාම් කිරීම යන්නෙහි අර්ථය පැහැදිලි කර ගැනීමට ඉවහල් වන පොදු උදාහරණ කිහිපයක්:

- තම ගම ආසන්නයේ විශාල නගරයක ගෘහ සේවිකාවක් ලෙස තරුණ කාන්තාවක් බඳවා ගත් නියෝජිතයෙක් ඇය පැමිණි පසු ගණිකා වෘත්තිය සඳහා බල කිරීම.
- අපහරණය කළ හෝ සිය පවුල විසින් විකුණූ තරුණ පිරිමි ළමයෙකු මැද පෙරදිග ඔටුවන් පදවන්නෙකු ලෙස යොද ගැනීම.

- රටකට නීති විරෝධීව ඇතුළු වූ සංක්‍රමණිකයකුට (එමනිසා පහසුවෙන් හානි විය හැකි ස්ථාවරයක සිටි) බලය යොදා කුඩා වැටුපක් හෝ වැටුපක් ලබා නොදී අන්තරාදායී හෝ අවමන් සහගත රැකියාවක නියුක්ත කර ගැනීම.

මෙකී නිදසුන් වලින් පැහැදිලි වන්නේ තැනැත්තන් වෙළඳාම් කිරීම් හි වින්දිතයන් පිරිමින් සහ ගැහැණුන්, තරුණ සහ මහළු අය ඇතුළත් බවයි. කෙසේ නමුත්, මෙම වින්දිතයන් අතර කාන්තාවන් සහ ළමුන් අඩු වැඩි වශයෙන් සිටින බව වැදගත් කොට දක්විය හැකි කරුණක් වේ. එසේම අවධානයට ලක් කළ යුතු වන්නේ තැනැත්තන් වෙළඳාම් කිරීම අන්තර්ජාතික දේශ සීමා මාරුවෙන් හෝ සිය රට තුළම සිදු විය හැකි බවයි. එසේම මෙහිදී වින්දිතයන් නොයෙක් ආකාරයේ අවමන් සහගත සැලකීම් වලට සහ ජීවිත තර්ජනීය තත්ත්වයන්ට මුහුණදිය හැක. තිරුරහෝන්න අවස්ථාවේදී බලයේ සබැඳිකම් ඇතුළත් වේ. එනම්, තිරුරහෝනකරු සිය බලය වින්දිතයා අභිබවා පතුරුවයි.

## 3.2 පුද්ගල වෙළඳාමේ ඵලවිපාක

පුද්ගල වෙළඳාම ජාත්‍යන්තර ප්‍රශ්නයකි. එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව තක්සේරු කර ඇති පරිදි ආසන්න වශයෙන් පුද්ගලයන් 800,000 ක් - 900,000 ක් අතර ප්‍රමාණයක් වාර්ෂිකව ජාත්‍යන්තර දේශ සීමා හරහා ලොව පුරා වෙළඳාම් කිරීමට ලක් වේ.[52] එක්සත් ජනපදය තක්සේරු කර ඇති පරිදි වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 7-10 මුදලක්, ගනුදෙනුකරුවන් අතට පත් වේ. එමනිසා මෙය හුදෙක් ඵල ප්‍රයෝජන ගන්නා වූ පුද්ගලයන් විවේචනයට ලක් විය හැකි කරුණක් පමණක් නොව විශාල ප්‍රතිපත්ති රහිත පුද්ගලයන්ට වරප්‍රසාද සලසන ඩොලර් බිලියන ගණනේ 'කර්මාන්තයකි'. පුද්ගල වෙළඳාම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාරය රඳා පවතින්නේ රජයට එල්ල වන අභියෝගය මතය. පුද්ගල වෙළඳාම සංකීර්ණ, බහු මුහුණුවරින් යුක්ත ජාත්‍යන්තර ප්‍රශ්නයක් වන අතර, එය ඒ ආකාරයෙන්ම සලකා කටයුතු කළ යුතුය.

---

52. පුද්ගල වෙළඳාම පිළිබඳ වාර්තාව, 2003 ජූනි-විශ්ව කටයුතු පිළිබඳ භාර ලේකම්වරයාගේ කාර්යාලය, ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ - ප්‍රකාශන අංක 11057, වොෂින්ටන්, ඩී.සී. 2003 හි 9 වන පිටුව (මින් මතු ඇමරිකා එක්සත් ජනපදයේ පුද්ගල වෙළඳාම පිළිබඳ වාර්තාව ලෙස හඳුන්වනු ලැබේ) අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි මඟ: <http://www.state.gov/g/tip/rls/tiprpt/2003>.

OSCE විසින්, පුද්ගල වෙළඳම අංශ තුනකින් සලකා බලයි. එනම් මානව, දේශපාලනඥයන් - හමුදමය සහ ආර්ථිකමය[53] වශයෙනි. පළමුව, ගනුදෙනු කිරීම් තුළින් අතිශය බරපතල ලෙස මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම, පුද්ගලයන්ගේ නිදහසේ අයිතිය, ගරුත්වය, ආරක්ෂාව සහ සෞඛ්‍යය එසේම ඒ තුළින් කුරිරු සහ අමානුෂික සැලකීම් වලින්, වහල්භාවයෙන් නිදහස් වීමේ අයිතීන්ද උල්ලංඝනය වේ. මේවා විවිධ ජාත්‍යන්තර මූලපත්‍ර වලින් එසේ නොවේ නම් බොහෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වලින් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම්ය. වෙළඳම් කිරීම තුළින් මෙකී අයිතිවාසිකම් උල්ලංඝනය වනවාත් සමගම වින්දිතයන් කුරිරු, අවමන් සහගත තත්ත්වයකට දමන අතර ඔවුන්ව ආරක්ෂා කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග ද සීමා කරයි.

දෙවනුව, ඉහත සාකච්ඡා කළ පරිදි තිරුරහෝතය සහ පුද්ගලයින් වෙළඳම් කිරීම ආරක්ෂාවටද තර්ජනයකි. එය ලෝකයේ බොහෝ රටවල සාපරාධී වරදක් වන අතර බොහෝ විට ඍජුවම අන්තර්ජාතික අපරාධයන්ටද සම්බන්ධ වේ. පුද්ගලයින් වෙළඳම් කිරීම හා බද්ධ කළ බරපතලකම සහ පුද්ගලයන් ගොදුරු වියහැකි අත්හැරිය නොහැකි මානව පිරිවැය ද ඍජුවම පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල වේදනා විඳීමට හේතු වීමද ඇත.

තුන්වැන්න වූ, වෙළඳම් කරන්නවුන් සාපේක්ෂව වැඩි වශයෙන් ගොදුරු කර ගන්නේ දුප්පත් සහ පහසුවෙන් හානි විය හැකි ජනතාවයි. වෙළඳම් කිරීමේදී කාන්තාවන් සහ ළමුන් පහසුවෙන් ගොදුරු විය හැක. මන්ද සමාජ පරිසරය තුළ ඔවුන්ගේ දිවි පෙවත ආරක්ෂාකාරී වීමට උපකාරී වන තත්ත්වයක් නොමැති වීමය. බොහෝවිට වින්දිතයින් වඩා සංවර්ධිත රටවල් හෝ ප්‍රදේශවල සේවය කිරීම සඳහා අඩු සංවර්ධිත රටවල් හෝ ප්‍රදේශ වලින් ගෙන්වා ගැනේ. මන්ද, ඔවුන් විශ්වාස කරන්නේ හෝ විශ්වාස කරවීමට සලස්වන්නේ වඩා හොඳ ජීවිතයක් එය තුළින් ලබා ගත හැකි බවයි. ඔවුන්ව ලාභදායී ශ්‍රම හමුදව ලෙස භාවිතා කරන අතර නොහොබිනා, අන්තරාදයි හෝ අවමන් සහගත ක්‍රියාකාරකම් වල යොදවයි. වෙනත් වචන වලින් කියතොත් ප්‍රධාන කරුණු 2 ක් හේතුවෙන් පුද්ගලයින් වෙළඳම් කිරීම

53. "පුද්ගල වෙළඳම: OSCE ය සඳහා වූ යෝජනා," - ආරක්ෂාව සහ සහයෝගීතාවය සඳහා වූ යුරෝපීය සංවිධානයේ විචාරක සම්මන්ත්‍රණය, 1999 සැප්තැම්බර් මස ODIHR පසුබිම් ලිපිය 1999/3 (ප්‍රජාතාන්ත්‍රික ආයතන සහ මානව හිමිකම් සඳහා වූ කාර්යාලය) හි 3 වන වගන්තිය. අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි මගඃ <http://www.osce.org/odihr/1999/09/1503en.html/documents>.

සඳහා යොමු වේ. (අ) පුද්ගලයන්ට ඔවුන්ගේ දුප්පත්කම තුළින් ගොදුරු විය හැකි තත්ත්වයට පත් වීම සහ (ආ) ලෝකයේ බොහෝ ආර්ථිකමය සංවර්ධිත ප්‍රදේශ ලාභ ශ්‍රමය ඉල්ලුම් කිරීම. එමනිසා වෙළඳම් කිරීම් වලට එරෙහිව වඩා පුළුල් ආකාරයෙන් මෙකී ආර්ථික සාධක සලකා බැලිය යුතු වනවාසේම දුප්පත්කම, ලිංග භේදය, සමාජ සහ ආර්ථික සංවර්ධනයන්ද පුළුල්ව සලකා බැලිය යුතුය.

## 3.3 අන්තර්ජාතික සම්මතයන්

2000 දෙසැම්බර් හිදී, ශ්‍රී ලංකාව *විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්, පුද්ගල වෙළඳම පිළිබඳ මූලපත්‍රයට* එරෙහිව අත්සන් කළද මේ දක්වා එම මූලපත්‍රය අපරානුමත කර නොමැත. පුද්ගලයන් ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් 'සියලුම අංගයන්ට' අවධානය යොමු කළ පළමු නීතිමය ලියවිල්ල වන්නේ *පුද්ගල වෙළඳම් මූලපත්‍රයයි. පුද්ගලයන් වෙළඳම් කිරීමේ මූලපත්‍රයේ* අරමුණු වනුයේ පුද්ගලයන් වෙළඳම් කිරීම් වැළැක්වීම සහ එරෙහි වීම, වෙළඳම් කිරීමෙහි වින්දිතයන් ආරක්ෂා කිරීම සහ උදව් කිරීම, ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සැලකිල්ලට ගැනීම සහ මේ සම්බන්ධයෙන් රාජ්‍යයන් අතර සහයෝගිතාවය වර්ධනය කිරීමයි.[54] මූලපත්‍රයේ නම, ප්‍රස්ථාවනාව සහ නොයෙකුත් වගන්ති නැවත නැවතත් කාන්තාවන් සහ ළමුන් ආරක්ෂා කිරීම අවධාරණය කරයි.

*තිරුරරහෝන මූලපත්‍රයට* සමානව *පුද්ගලයින් වෙළඳම් කිරීමෙහි මූලපත්‍රය* පුද්ගලයින් වෙළඳම් කිරීමෙහි ස්වභාවයන් පවතින අභියෝගයන්ට ප්‍රවේශයක් ආදේශ කරයි. එය ප්‍රධාන අංග 3 කින් සමන්විතය. එනම් නීති පැනවීම සහ නීති ක්‍රියාත්මක පිළිවෙත්, පුද්ගලයින් වෙළඳම් කිරීම් වලට එරෙහි පටිපාටිමය පියවරයන්, දේශීය සහ විදේශීය සම්බන්ධීකරණයෙන් වින්දිතයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමය.

නීති සම්පාදන පිළිවෙත් සම්බන්ධයෙන්, *පුද්ගල වෙළඳම පිළිබඳ මූලපත්‍රය* වගකීම් පවරනුයේ ඉහත නිර්වචනය උපුටා ගෙන පුද්ගල වෙළඳම සාපරාධී වරදක් වන ලෙස රාජ්‍ය පාර්ශ්වයන් නීති පැනවිය යුතු බවයි. විශේෂයෙන්ම 5 වන වගන්තිය තියම කරන්නේ පුද්ගලයින් වෙළඳම් කිරීම පිළිබඳ වැරදි සිදු කිරීමේදී ඊට සම්බන්ධ මහපෙන්වන, සංවිධානය කරන

54. පුද්ගල වෙළඳම පිළිබඳ මූලපත්‍රයේ 2 වන වගන්තිය.

සහ උදව් කර වෙළඳම් කිරීමේ වරද සිදු කරනවුන් පිළිබඳ වගකීම අපරාධ පවරන දේශීය නීති සම්පාදනය කළ යුතු බවයි.[55]

වින්දිතයන්ගේ අනන්‍යතාවය, පෞද්ගලිකත්වය සහ ශාරීරික ආරක්ෂාව තහවුරු කිරීම සහ වින්දු වූ පාඩු වලට වන්දි ලබා ගැනීමේ නීතිමය අයිතිය තහවුරු කිරීම වැනි ව්‍යවස්ථාමය හා පටිපාටිමය පිළිවෙත් ගැනීමට රාජ්‍ය පාර්ශ්වයන් දිරිමත් කිරීමක් පුද්ගලයන් වෙළඳම් කිරීමේ මූලපත්‍ර යේ 6 වන වගන්තියෙන් දක්වේ.[56] පුද්ගලයන් වෙළඳම් කිරීමේ මූලපත්‍රය තව දුරටත් අපේක්ෂා කරන්නේ වින්දිතයන්ට සම්පූර්ණ පටිපාටිමය අයිතීන් පිළිබඳ තොරතුරු සපයන්නන් නීති ක්‍රියාදමයන්ට සහභාගි කරවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍යයන් විසින් ප්‍රමාණවත් පිළිවෙත් ගත යුතු බවය.[57] එසේම රාජ්‍යයන් 'සලකා බැලිය යුතු' වන්නේ වින්දිතයන් යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියේ දී ඔවුන්ගේ සමාජීය, ශාරීරික සහ මනෝ විද්‍යාත්මක අවශ්‍යතාවයන් සහ නිවාස, අධ්‍යාපන සහ පුහුණුවීම් අවස්ථා සඳහා ද්‍රව්‍යමය උපකාරයන් සැපයීමට දිරිමත් කිරීමත්ය.[58] අවසාන වශයෙන්, වෙළඳම් කිරීමේ වින්දිතයන් සමඟ රාජ්‍යයන් කටයුතු කිරීමේදී අවශ්‍ය වන්නේ වින්දිතයාගේ වයස, ලිංගය සහ විශේෂ අවශ්‍යතා සඳහා සංවේදී වීමය.[59]

පුද්ගල වෙළඳමට එරෙහිව ක්‍රියා කිරීමේදී තිරුරහෝත මූලපත්‍රයේ තිරුරහෝතයට විරුද්ධ ක්‍රියාකලාපයන්ට සමානව පුළුල් පිළිවෙත් අනුගමනය කිරීම රාජ්‍යයන් විසින් කළ යුතුය.[60] එසේම වලංගු ගමන් ලියවිලි සම්බන්ධයෙන් සුදුසු ආරක්ෂාවන් කළ යුතුය.[61]

ආරක්ෂා කිරීම් සම්බන්ධයෙන් පුද්ගලයන් වෙළඳම් කිරීමේ මූලපත්‍රය දක්වන්නේ වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙස ඔවුන්ට ප්‍රවේසම සහ උපකාර සැලසිය යුතු වනවාසේම ඔවුන් වෙළඳම් කිරීම් පිළිබඳ චූදිත අපරාධයට දඬුවම් විඳිය යුතු නොවේ. බලෙන් පොළඹවා ගැනීම හෝ බල කිරීම යන මූලිකාංග නිසා වින්දිතයාට වගකීම භාරගත නොහැක. විශේෂයෙන්ම ඔවුන්ට වේදනාව ඉවසා දරා සිටීමට සිදු වේ.

---

55. එම., 5 වන වගන්තිය.
56. එම., 6(6) වන වගන්තිය.
57. එම., 6(2)(අ)(ආ) වන වගන්තිය.
58. එම., 6(3) (අ),(ආ),(ඇ),(ඈ) යන වගන්ති.
59. එම., 6(4) වන වගන්තිය.
60. එම., 11 වන වගන්තිය.
61. එම., 12 සහ 13 වන වගන්ති.

නිදසුනක් ලෙස, වෙළඳම්කරු කාන්තාවක බලෙන් වාණිජමය ලිංගික කර්මාන්තයකට යෙදවුවහොත් ඇයව ගණිකා වෘත්තිය යටතේ අත්අඩංගුවට ගත නොහැකිය.

පුද්ගලයින් වෙළඳම් කිරීම් සහ වෙළඳම් කිරීම් වලට එරෙහිව ක්‍රියා කිරීමට සහ වෙළඳම් කිරීම්හි වින්දිතයන් ආරක්ෂා කිරීමට රාජ්‍ය පාර්ශ්වයන් "සම්පූර්ණ ප්‍රතිපත්ති, වැඩ සටහන් සහ වෙනත් පිළිවෙත්" ඇතිකර ගත යුතුය.[62] එකී පිළිවෙත් තුළ පරීක්ෂා කිරීම්, තොරතුරු ව්‍යාපාර සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගිත්වය සහ ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික වේදිකාවන් ඇතුළත් වේ. එසේම රාජ්‍යයන් දිරිමත් කරනුයේ පුද්ගලයින් වෙළඳම් කිරීම් වලට එරෙහි වීම සහ අදළ අනෙකුත් තොරතුරු හුවමාරුවට සහභාගී කරවීමට සහ වෙළඳම් කිරීමේ නීති සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශ්වයන් අතර ශිල්පීය පුහුණුව ලබාදීමටය.[63]

## 3.4 ශ්‍රී ලංකාවේ නීති

දණ්ඩ නීති සංග්‍රහයට අනුව ශ්‍රී ලංකාවේ, පුද්ගලයින් වෙළඳම් කිරීම සාපරාධී අපරාධයකි.[64] පුද්ගලයින් වෙළඳම් කිරීම පිළිබඳ මූලපත්‍රයට පෙර සම්මත කළ දණ්ඩ නීති සංග්‍රහයේ 360 වන වගන්තියට අනුව ප්‍රකාශිතවම රට තුළ හෝ රටින් පිටත සිදුවන පුද්ගල වෙළඳම අපරාධයකි.

දණ්ඩ නීති සංග්‍රහය පැහැදිලිවම සියලු ආකාරයේ පුද්ගල වෙළඳම් කිරීම් සාපරාධී වරදක් කර ඇත. 360(අ)(1) වගන්තියට අනුව ගණිකා වෘත්තියට බලෙන් පොළඹවා ගැනීම තහනම් කර ඇති අතර 360(ඇ) වගන්තියට අනුව "මුදලට හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවන් සඳහා හෝ යම් තැනැත්තකු මිලට ගැනීම හෝ විකිණීම හෝ වෙනත් යම් දෙයකට මාරු කිරීම" තහනම් කර ඇත.

දණ්ඩ නීති සංග්‍රහයේ සෘජුවම සඳහන් කර ඇත්තේ ගණිකා වෘත්තිය, ගණිකා වෘත්තියට ගැහැණුන් ලබා දීම සම්බන්ධ ක්‍රියා සඳහා ජාත්‍යන්තර දේශ සීමා හරහා යෑම[65] රට තුළ ගමන් කිරීම මෙන්ම අපරාධයක් වන

---

62. එම., 9 වන වගන්තිය.

63. එම., 10 වන වගන්තිය.

64. *දණ්ඩ නීති සංග්‍රහය, (1995 අංක 22 දරණ (සංශෝධිත) පනත) මින්මතු දණ්ඩ නීති සංග්‍රහය ලෙස හඳුන්වනු ලැබේ.*

65. *දණ්ඩ නීති සංග්‍රහයේ - 360 (අ) (2)* යන වගන්තිය.

බවය.[66] ළමුන්ගේ ආරක්ෂාව සඳහා විශේෂ අවධානයක් 360(අ)(4) වගන්තියේ දක්වන අතර ඒ අනුව ළමයකු අයුතු ලිංගික සංසර්ගය සඳහා රට තුළට ගෙන ඒම තහනම් කර ඇති අතර, 360(අ) වගන්තියේ විස්තර වන්නේ ළමුන් අයුතු ලිංගික සංසර්ගයට යොදා ගැනීම සම්බන්ධයෙන් විවිධාකාර වූ අපරාධයන්ය.

ශ්‍රී ලංකා නීතියේ පුද්ගල වෙළඳාම සම්බන්ධයෙන් දී ඇති නිර්වචනය පුද්ගල වෙළඳාම සම්බන්ධ මූලපත්‍රයේ දී ඇති නිර්වචනයට වඩා අඩු නම්‍යශීලීත්වයක් පෙන්නුම් කරයි. මෙය සුභවාදී වර්ධනයක් වන්නේ, මූලපත්‍රයේ පුද්ගලයින් වෙළඳාම් කිරීමට දී ඇති නිර්වචනය තුළ බොහෝ අංග පැවතීමත් මානව අයිතිවාසිකම් ක්‍රියාකාරකම් තුළ බොහෝ රටවලට එහි අංග ඔප්පු කිරීමට අසීරු තත්ත්වයක් පවතින බව පුළුල්ව විශ්වාස කරයි.[67] තවදුරටත් දණ්ඩ නීති සංග්‍රහය වරදකරුවන් වන අයට දැඩි දඬුවම් නියම කරයි: එනම් අවම අවුරුදු 2ක් සහ උපරිම අවුරුදු 20 වන සිරගත කිරීමක් සහ බොහෝ විට දඩයක්ය.[68] ළමයකු වරද තුළ සම්බන්ධ නම් අවම දණ්ඩනය අවුරුදු 5 දක්වා වැඩි කර ඇත.[69]

කලින් සාකච්ඡා කළ පරිදි නීති විරෝධී සංක්‍රමණ පිළිබඳ වන දේශ සීමා හා ලියකියවිලි පිළිවෙත් සම්බන්ධයෙන් රජය දැඩි පිළිවෙතක් අනුගමනය කරයි. මෙකී පිළිවෙත් නීතිගත කර නොමැති වුවද ඒවා ක්‍රියාත්මක කිරීම ප්‍රශ්නය වැළැක්වීමට හා ඊට එරෙහිව සටන් කිරීමට උපකාරී වෙයි. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව පසුගිය වසර කිහිපය තුළම පුද්ගල වෙළඳාම් කරන්නන්ගේ රැකියා පිළිබඳ බොහෝ අවධානයෙන් සිටින ලදී. ඉහත සාකච්ඡා කළ පරිදි මෙකී ක්‍රියාකාරකම් වල මූලික අවධානය යොමු වූයේ, නීති විරෝධී ගමන් වැළැක්වීමටයි. මෙයින් අදහස් වන්නේ අභ්‍යන්තර පුද්ගල වෙළඳාම් කිරීම අනාවරණය කර ගැනීමට හා වින්දිතයන් ආරක්ෂා කිරීමට ස්වල්ප සම්පත් ප්‍රමාණයක් ආයෝජනය කළ බවයි. තවදුරටත් එහිදී

66. *එම., 360 (අ) (5)* යන වගන්තිය.

67. ඈන් ඩී ජෝර්දන් විසින් "එක්සත් ජාතීන්ගේ පුද්ගල වෙළඳාම පිළිබඳ වූ සම්පූර්ණ මූල පත්‍රයට රචිත සවිස්තරාත්මක මගපෙන්වීම" (වොෂිංටන්, ඩී.සී: ජාත්‍යන්තර මානව හිමිකම් නීති පිළිබඳ කණ්ඩායම, 2002) හි 7 වන පිටුව. අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි මඟ: http://www.hrea.org/erc/library/display.php:doc id=818 & category id=12&category type=3&group=>.

68. දණ්ඩ නීති සංග්‍රහය 360(1) (ආ) යන වගන්තිය.

69. එම.

නීත්‍යානුකූල මාර්ග භාවිතයෙන් පුද්ගලයින් වෙළඳාම් කිරීමෙහි වින්දිතයන් වන අයව නොසලකා හැර ඇත.

එසේම සැලකිල්ලට ගත යුතු කරුණක් වන්නේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත[70] පුද්ගලයන් වෙළඳාම් කිරීමට එරෙහිව විධිවිධාන නියම කර ඇත. එකී පනතට අනුව විදේශ රැකියා සඳහා බලය නොලත් අය පුද්ගලයන් රඳවා ගැනීම තහනම් කර ඇත.[71] එසේම ඉහත අරමුණු වලට ව්‍යාජ ලියවිලි සම්බන්ධ කර ගැනීමද වරදකි.[72] එකී පනතේ මෙවැනි ප්‍රයෝජනවත් ආරක්ෂාවන් පැවතියද එම වගන්තීන් බලාත්මක කරනු නොලබයි. රජය පෙන්නුම් කර ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහය තුළින් පුද්ගල වෙළඳාම් කරන්නාට නඩු පැවරීම සහ දඬි දඬුවම් ලබා දීම වඩා කාර්යක්ෂම ක්‍රමය බවයි.[73]

## 3.5 වර්ෂ 2003 දී ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටතට පුද්ගල වෙළඳාම

ශ්‍රී ලංකාවේ පුද්ගල වෙළඳාම පිළිබඳ තත්ත්වය තක්සේරු කිරීම අසීරුය. නිකුත්ව ඇති බොහෝ වාර්තා මගින් ගැටලුවෙහි ඇතැම් පැතිකඩ පමණක් ආවරණය කොට ඇති බව පිළිගෙන ඇති අතර, එහෙයින් පුද්ගල වෙළඳාම සම්බන්ධයෙන් සම්පූර්ණ අධ්‍යයනයක් කිරීමේ පැහැදිලි අවශ්‍යතාවයක් පවතී.[74] සමහර ඇස්තමේන්තු තක්සේරු කර ඇති පරිදි වාණිජමය ලිංගික වෙළඳාමෙන් වින්දිතයන් වූ ළමයි සිටියි. පහත දක්වෙනුයේ වර්තමාන තක්සේරුවල සමාලෝචනයන්ගෙන් සමහරකි:

- ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානයට අනුව අවුරුදු 16 ත් පහළ ළමුන් 1000,000 ක් පමණ අභ්‍යන්තර තැනැත්තන් වෙළඳාම් කිරීමෙන් බලපෑමට ලක් වී ඇති අතර ඔවුන් වාණිජමය ලිංගික

70. 1985 අංක 21 දරණ පනත.
71. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 62 වගන්තිය.
72. එම., - 63(අ) වගන්තිය.
73. නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ විජිත කේ. මලල්ගොඩ මහතා සමඟ 2004 ජනවාරි 21 වන දින පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව.
74. "පුද්ගල වෙළඳාම විශේෂයෙන්ම කාන්තාවන් හා ළමයින් වෙළඳාම පිළිබඳව මානව හිමිකම් වාර්තාව: ශ්‍රී ලංකාව", ආරක්ෂණ ව්‍යාපෘතිය, 2002 මාර්තු: "තවමත් ශ්‍රී ලංකාවේ බොහෝ ළමයින් අපචාරයට සහ නොසැලකිල්ලට ලක්වේ" යන මැයෙන් 2003 ඔක්තෝබර් 8 වන දින ඩේලි මිරර් පුවත්පතට දමිත හේමචන්ද්‍ර විසින් වාර්තා කළ පුවත.

ක්‍රියාකාරකම් වලට ගෘහ මෙහෙකාරකම් වලට යොදගෙන හෝ හමුද සේවයට බලකර ඇත. තක්සේරු කර ඇති පරිදි 2000-3000 අතර ප්‍රමාණයක් විදේශීයව ගෘහ සේවයන්ට හෝ වාණිජමය ලිංගික ක්‍රියාකාරකම් වලට යොදගෙන ඇත.[75]

- UNIFEM සංවිධානය තක්සේරු කර ඇති පරිදි 20,000-30,000 අතර ළමා ගණිකාවන් ශ්‍රී ලංකාවේ සිටින අතර අන්තර්ජාතික තැනැත්තන් වෙළඳම් කිරීම් හා සැලකීමේදී අනෙකුත් දකුණු ආසියානු රට වලට වඩා අඩු තත්ත්වයකි.[76]

  එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව දළ වශයෙන් ශ්‍රී ලංකාවේ ළමා ගණිකාවන් 40,000ක් පමණ සිටියි.[77]

- ඇමරිකානු රාජ්‍ය දෙපාර්තුමේන්තුව තක්සේරු පෙන්නුම් කරන්නේ 10,000-15,000 ක ළමුන් වාර්ෂිකව වෙළඳම් වන බවත් 500 ක් පිටරටට යවන බවත් ය.[78]

- මානව අයිතිවාසිකම් හා සංවර්ධනය සඳහා වූ නීතිඥයින්ගේ සංවිධානය තක්සේරු කර ඇත්තේ තැනැත්තන් වෙළඳම් කිරීම නිසා වාර්ෂිකව 3000 ක් පමණ අතුරුදහන් වන බවත් ඔවුන් අතරින් වැඩි දෙනෙක් කාන්තාවන් හා ළමුන් බවත්ය.[79]

වර්තමානයේ මෙකී සංඛ්‍යා දත්ත සනාථ කිරීමට සැබෑ මාර්ගයක් නොවූවද ඉතා සම්ප්‍රදයික ඇස්තමේන්තු අනුවද පුද්ගලයන් වෙළඳම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් වේදනා විඳිත බවට පැහැදිලි සාක්ෂි ඇත.

---

75. "සංක්‍රමණික වෙළඳම" ත්‍රෛමාසික ප්‍රකාශය - විශේෂ කලාපය, සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය, අංක: 23, 2001 අප්‍රේල්.

76. යුනිෆෙම් සංවිධානයේ ශ්‍රී ලංකා වාර්තාව, 1998

77. "තවමත් ශ්‍රී ලංකාවේ බොහෝ ළමයින් අපචාරයට සහ නොසැලකිල්ලට ලක්වේ" යන මැයෙන් 2003 ඔක්තෝබර් 08 වන දින ඩේලි මිරර් පුවත්පතට දමිත හේමචන්ද්‍ර විසින් වාර්තා කළ පුවත.

78. එක්සත් ජනපදයේ පුද්ගල වෙළඳම පිළිබඳ වාර්තාව, 141 පිටුව.

79. "පුද්ගල වෙළඳම මර්දනය කිරීමට ගන්නා පියවර වලට සහය දීමට එක්සත් ජනපදය සූදනම්" යන මැයෙන් 2003 මැයි 30 වන දින ඩේලි නිව්ස් පුවත්පතට නදීරා ගුණතිලක විසින් වාර්තා කළ පුවත.

ශ්‍රී ලංකාව තුළ රැකියා ලබා දීමේ පොරොන්දුව තුළින් කාන්තාවන් හා ළමුන් පොළඹවා ගැනීමෙන් වානිජමය ලිංගික ක්‍රියාකාරකම් වලට, ගෘහ සේවයට හෝ ධීවර කර්මාන්තයට බල කරයි. බොහෝදෙනා දන්නා පරිදි රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ වලින් ළමුන් අපහරණය සිදුකර ඔවුන්ව සොල්දාදුවන් ලෙස යොදවයි.[80] තවත් විශේෂ ප්‍රශ්නයක් වන්නේ යුරෝපීය සංචාරකයින් තරුණ පිරිමි සහ ගැහැණු ළමයින්ට වාණිජ ලිංගික ක්‍රියාකාරකම් සඳහා යෙදවීමයි. මෙයින් වැඩි කොටසක් ග්‍රාමීය ප්‍රදේශ වලින් පැමිණෙන ළමුන්ය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව තවත් ප්‍රශ්නයක් වන්නේ ළමුන්ව ග්‍රාමීය ප්‍රදේශ වල ධීවර කර්මාන්තයේ 'වාඩිවල' තබාගෙන වහලුන්ගේ තත්ත්වයෙන් තැබීමයි. අවසාන වශයෙන් දක්විය හැක්කේ, වාර්තා වී ඇති පරිදි කුඩා ප්‍රමාණයෙන් විදේශීය කාන්තාවන් ලංකාවේ ගණිකා වෘත්තියේ යෙදෙන අතර ඉන් සමහරක් පුද්ගලයින් වෙළඳාම් කිරීමේ වින්දිතයන් ලෙස විශ්වාස කළ හැක.[81]

වර්ෂ 2003 දී, ජන මාධ්‍ය විසින් පුද්ගල වෙළඳාම පිළිබඳ කාරණා වැදගත් ආකාරයෙන් වාර්තා නොකරන ලදී. සිද්ධීන් කිහිපයක් වාර්තා වූ නමුත් ඔවුන් පුද්ගලයින් වෙළඳාම් කිරීමේ වංචාවන් ආවරණය කළ පරාසය සමාලෝචනය කිරීම වැදගත් වන්නේ සියලු දෙනාම වාගේ තැනැත්තන් වෙළඳාම් කිරීමේ වින්දිතයෙකු විය හැකි බැවිනි. සිදුවූන් වලින්ද පැහැදිලි වන්නේ වඩා හොඳ නීතින්, ක්‍රියාවන් දැනුම වර්ධනය කිරීම් සහ ජාත්‍යන්තර සහයෝගීතාවය පුද්ගලයන් වෙළඳාම් කිරීමට එරෙහිව අවශ්‍ය බවයි.

- වඩා ප්‍රසිද්ධියට පත් සිද්ධියක් වූයේ සෝමලතා සතරසිංහ ගේ සිද්ධියයි. ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක් වන ඇය කුවේටයට ගියේ ගෘහ සේවිකාවක් ලෙස සේවය කිරීමට මැයි මාසයේදී ය. එහි ගොස් සති කිහිපයකට පසු ඇය මරණයට පත් වූ නමුත් එසේ වූයේ කෙසේද යන්න අපැහැදිලිය. වකුගඩු, අක්ෂි කර්ණිකාවන් සහ මුත්‍රාශය ඇතුළු ඇයගේ ඉන්ද්‍රියයන් කිහිපයක් ඇයගේ මරණය සිදු වූ

80. ළමයින් සොල්දාදුවන් ලෙස බඳවා ගැනීම සංකීර්ණ සහ සංවේදී ගැටලුවකි. මෙය පුද්ගල වෙළඳාමට සම්බන්ධ වුවත්, පුද්ගල වෙළඳාම යන තේමාවෙන් ඔබ්බට යන ආකාරයේ අද්විතීය අවධානයක් මේ සම්බන්ධව ජාත්‍යන්තර ප්‍රජාවෙන් ලැබී ඇත. මේ කරුණ නිසාම, ළමයින් සොල්දාදුවන් ලෙස බඳවා ගැනීම පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරෙන්නේ නැත.

81. "රටකට ප්‍රවේශ වීමේදී ලබාදෙන වීසා බලපත්‍ර වලින් ගණිකාවන් උපරිම ප්‍රයෝජන ලබා ගනී" යන මැයෙන් 2003 ජූනි 8 වන දින සන්ඩේ අයිලන්ඩ් පුවත්පතේ පළවූ පුවත.

වහාම ගලවාගෙ තිබිණි.[82] කුවේට් බලධාරීන් නිදහසට කරුණු ලෙස දක්වූයේ, ඇය මරණයට පෙර සිය අවයව පරිත්‍යාග කිරීමට ආශාවෙන් සිටි බවයි. ඇයගේ පවුල චෝදනා කරනුයේ, ඇය ශරීර අවයව විකිණීමේ වංචාවේ වින්දිතයකු වී ඇති බවයි.

- ඔක්තෝබර් හිදී, වාර්තා වූ පරිදි ජර්මනියට යවා රැකියාවන් ලබා දෙන බවට පොරොන්දු වූ නියෝජිතයෙකුට පුද්ගලයකු රු. 1,200,000 ගෙවා තිබිණි. නියෝජිතයා ලබා දුන් ව්‍යාජ වීසාවන් උපයෝගී කරගෙන ජර්මනියට යෑමට තැත්කළ ඔහුව මාලදිවයිනේ රඳවාගෙන ආපසු ශ්‍රී ලංකාවට එවන ලදී. වින්දිතයා දින 113 ක් රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටියේ නීති විරෝධීව මාලදිවයිනට ගමන් කිරීමේ චෝදනාව යටතේය.[83]

- නොවැම්බර්හි දී, විදේශ ජාතිකයන් හතර දෙනෙකු අත්අඩංගුවට ගත්තේ තරුණ ශ්‍රී ලාංකික ළමයින් (පිරිමි 2 ගැහැණු 3) කිහිපදෙනෙකු ව්‍යාජ ගමන් බලපත්‍ර භාවිතයෙන් රටින් පිටතට ගෙන යාමට තැත් කිරීමේදී ය. තවද ළමයින් ලිංගික අතවරයන්ට ලක්වී ඇති බවට ද දෝෂාරෝපණ විය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මැදිහත් වී ළමුන්ට උදව් කළ අතර විදේශීය ජාතිකයන් අත්අඩංගුවට ගන්නා ලදී[84]

- තවද නොවැම්බර්හිදී වාර්තා වූ පරිදි, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ නීති විරෝධී නියෝජිත ආයතනයන් ඉදිරිපත් කළේ සයිප්‍රසයේ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලැබීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන බවයි. ළමුන් 300 ගෙන් මුදල් අය කළ එම ආයතනය ව්‍යාජ වීසා ලබා දී ඔවුන්ව සයිප්‍රසයට ප්‍රවාහනය කළේය. එහි ගිය පසු ශිෂ්‍යයන් දැන ගත්තේ එවැනි විශ්ව විද්‍යාලයක් එහි නොමැති බවයි. ගෙදර ඒමට නොහැකි වූ ශිෂ්‍යයෝ සයිප්‍රසයේ අතරමං වූහ.[85]

---

82. "මිය ගිය කම්කරුවා පිළිබඳ නැඟුණු මහත් කෝපය, සංක්‍රමණිකයන් මුහුණපාන අවදනම් පෙන්නුම් කරයි" යන මැයෙන් ෆයිසාල් සමත් විසින් *IPS අන්තර්මාධ්‍ය සේවයට* 2003 වර්ෂයේදී වාර්තා කළ පුවත.

83. ඔක්තෝබර් මස 2 වන දින ලංකාදීප පුවත්පත.

84. "චීන ජාතික ජෝඩු 2 ක් සහ ලංකාවේ ළමයින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දී රඳවා ගැනේ." යන මැයෙන් 2003 නොවැම්බර් 11 වන දින ඩේලි නිව්ස් පුවත්පතට අන්ජන ගමගේ විසින් කළ වාර්තාව.

85. 2003 නොවැම්බර් මස 3 වන දින ලංකාදීප පුවත්පත.

## ක්‍රියාත්මක වීම

පුද්ගල වෙළඳාම සම්බන්ධයෙන් රජයේ ක්‍රියාකාරිත්වය සලකා බැලීමේදී වර්ධනය විය යුතු අංශ කිහිපයක් හඳුනා ගත හැක. වර්ෂ 2003 එක්සත් ජනපද පුද්ගල වෙළඳාම පිළිබඳ වාර්තාව දක්වූයේ "වින්දිතයන්ට දීර්ඝ කාලීන උපකාරයන් කිරීමේ රජයේ හැකියාව සීමිත බවයි."[86] එම වාර්තාව තවදුරටත් නිගමනය කළේ ශ්‍රී ලංකා රජය පුද්ගල වෙළඳාම වැළැක්වීමට අවම සම්මතයන් වත් සපුරා නොමැති නමුත් "එසේ කිරීමට වැදගත් ප්‍රයත්න දරා ඇති බවයි."[87] තැනැත්තන් වෙළඳාම් කිරීමට විරුද්ධව වර්ධනය කළ යුතු පිළිවෙත් වාර්තාව පහත පරිදි පෙළ ගැස්විය.

අ) ලිංගිකත්වය සඳහා සංචාරකයන්ට විරුද්ධව නීති ක්‍රියාත්මක කිරීම් දැඩි කිරීම;

ආ) ළමා සොල්දාදුවන් ලෙස එල්.ටී.ටී.ඊ. ය කරන බඳවා ගැනීම් වලින් ළමයින් ආරක්ෂා කිරීම සහතික වීම; සහ

ඇ) අත්අඩංගුවට ගනු නොලැබූ ශ්‍රී ලංකාවට වෙළඳාම් කරනු ලැබූ විදේශීය කාන්තාවන් පිළිබඳ සහතික වීම.[88]

## අන්තර්ජාතික සහයෝගිතාව

ජාත්‍යන්තර, පුද්ගල වෙළඳාම සහ පුද්ගල තිරුරහෝනය කිරීමට විරුද්ධව ශ්‍රී ලංකාව අනිකුත් රටවල් සමඟ ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කරයි. පුද්ගල තිරුරහෝනය, පුද්ගල වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර අපරාධ පිළිබඳ බාලි සම්මන්ත්‍රණයෙන්[89] පසු මාර්තු 13-14 විශේෂ කමිටු රැස්වීමක් කොළඹ දී පැවැත්විණි. ශ්‍රී ලංකා රජය IOM හි මූල්‍ය ආධාර ඇතිව සමීපව සම්බන්ධීකරණය කර සංවිධානය කළ විශේෂඥ කණ්ඩායම්

86. එක්සත් ජනපදයේ පුද්ගල වෙළඳාම පිළිබඳ වාර්තාව, 141 පිටුව.
87. එම.
88. එම.
89. "මානව තිරුරහෝනය සහ අපරාධ පිළිබඳ සාකච්ඡා කිරීමට රටවල් 38 ක්" යන මැයෙන් 2003 වර්ෂයේ මාර්තු 12 වන දින ඩේලි නිව්ස් පුවත්පතේ පළ වූ වාර්තාව: "පුද්ගල වෙළඳාම පිළිබඳව රටවල් 38 ක නියෝජිතයින්ගේ මිත්‍ර සාකච්ඡාවක් මෙරටදී" යන මැයෙන් 2003 වර්ෂයේ මාර්තු 12 වන දින අයිලන්ඩ් පුවත්පතේ පළවූ වාර්තාව: "මානව තිරුරහෝනය පිළිබඳ සාකච්ඡා කිරීමට විශේෂඥයින් කොළඹදී හමුවේ" යන මැයෙන් 2003 වර්ෂයේ මාර්තු 13 වන දින ඩේලි මිරර් පුවත්පතේ පළවූ වාර්තාව.

රැස්වීමට රටවල් 38 ක ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහභාගී වූහ. මෙම විශේෂඥ කමිටුව රැස්වූයේ, මෙහි කාරණා පිළිබඳව දැනුම් වර්ධනය කර ගැනීමට හා මේ අන්තර්ජාතික අපරාධයන්ට විරුද්ධව පවතින දේශීය ප්‍රයත්න හඳුනා ගැනීම තුළින් කලාපීය හා අන්තර්ජාතිකව මානව තිරුරහෝනයට සහ පුද්ගල වෙළඳාමට එරෙහිව උපාය මාර්ග ශක්තිමත් කිරීමටය.[90]

ශ්‍රී ලංකා රජය ඉතාලිය සමග ඇති කර ගත් වැදගත් ද්විපාර්ශ්වික ගිවිසුම තුළින් මුල පිරිමක් කර ඇත. ඊළඟ අවුරුදු 2 ක් තුළ ශ්‍රී ලාංකිකයන්ට තාවකාලික රැකියා වීසා 1500 ක් ලබා දීමේ වැඩසටහනක් ඉතාලි රජය ස්ථාපිත කළේය.[91] සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අදාළ රැකියාව සඳහා කොළඹදී පුහුණුවක් ලැබිය යුත්තේය. ශ්‍රී ලාංකිකයන්ට නීතිමය අවස්ථා ලබා දීම තුළින් ඉතාලි රජය බලාපොරොත්තු වන්නේ, ශ්‍රී ලාංකිකයන් නීති විරෝධීව ඉතාලියට පැමිණීම වැළැක්වීමත් ඔවුන්ට සේවායෝජකයන්ගේ හා අපරාධකරුවන්ගේ අපචාර වලින් ගැලවීමටත්ය.

අවසාන වශයෙන්, 2003 පුරාම, රජය පියවර ගත්තේ යුරෝපීය ප්‍රජාවන් සමඟ 'රිඩ් මිෂන්' ගිවිසුම තීන්දු කිරීමටය.[92] එම ගිවිසුමේ පරමාර්ථය වූයේ සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයෙන් නීති විරෝධී සංක්‍රමණයන්ට එරෙහි වීමය. වර්ෂ 2004 දී අවසන් කළ මෙම ගිවිසුමේ අරමුණු අතර වූයේ: "හඳුනා ගැනීමත් පුද්ගලයන්ව ආපසු සියරටට යැවීමත්, ඇතුල්වීමේ දී කොන්දේසි සපුරාලීමත්, සහයෝගයෙන් පුද්ගලයන් ප්‍රවාහනය කිරීමත් සඳහා ඉක්මන් හා ප්‍රතිඵලදායක පියවර අන්තර්ගත වීමත්ය."

---

90. මානව තිරුරහෝනය, පුද්ගල වෙළඳම සහ ඒවාට සම්බන්ධ ජාත්‍යන්තර අපරාධ පිළිබඳ ප්‍රථම බාලි සමුළුව, 2002 වර්ෂයේ පෙබරවාරි 27-28 දිනයන්හි ඉන්දුනීසියාවේ බාලි හිදී පැවැත්විණි. මානව තිරුරහෝනය, පුද්ගල වෙළඳාම සහ ඒවාට සම්බන්ධ ජාත්‍යන්තර අපරාධ වලට එරෙහිව සටන් කිරීම සඳහා නව සැලසුම් සකස් කිරීමටත් තොරතුරු හුවමාරු කර ගැනීමටත්, ඇමතිවරුන්ට සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මෙම සමුළුව අගනා අවස්ථාවක් විය. වඩා දියුණු කළ සහයෝගීත්වය හා ඒකාබද්ධතාවය තුළින් ප්‍රායෝගික විසඳුම් සොයා ගැනීමට වූ මණ්ඩලයක් ලෙසත්, පොදුවේ අවධානය යොමුවන ගැටලු සාකච්ඡා කිරීම සඳහා වූ වේදිකාවක් ලෙසත් මෙම සමුළුව අඛණ්ඩව සේවය කරනු ඇත. මෙහි දෙවන සමුළුව 2003 වර්ෂයේ අප්‍රේල් මස 28-30 වන දිනයන් හි බාලි හිදී පැවැත්විණි.
91. "ඉතාලිය විසින් ශ්‍රී ලාංකිකයින්ට නව රැකියා 500 ක් ලබා දෙයි" යන මැයෙන් ආනන්ද කන්නන්ගර විසින් 2003 වර්ෂයේ ජූලි මස 23 වන දින ඩේලි නිව්ස් පුවත් පතට වාර්තා කළ පුවත.
92. ශ්‍රී ලංකා රිඩ්මිෂන් ගිවිසුම (Readmission Agreement); පරිශීලනය කළ හැකි වෙබ් අඩවිය: <statewatch.org/news/2003/feb/srilanka.pdf>.

## 3.6 නිගමන - පුද්ගල වෙළඳාම

පුද්ගල වෙළඳාම සම්බන්ධ වරදකරුවන්ට නඩු පැවරීමට ප්‍රමාණවත් රාමුවක් ශ්‍රී ලංකා නීතිය තුළ නිර්මාණය කර ඇත. කෙසේ නමුත්, මෙකී නීති ක්‍රියාත්මක කිරීමට සහ පුද්ගල වෙළඳාම් කිරීමෙහි වින්දිතයන්ට ආරක්ෂාව සැපයීමට ශ්‍රී ලංකා රජය සතුව ප්‍රමාණවත් සම්පත් නැත. පුද්ගල තිරුරහෝනය සම්බන්ධයෙන් සාකච්ඡා කළ පරිදි ශ්‍රී ලංකා රජය නීති විරෝධී සංක්‍රමණයන්ට එරෙහිව විශාල මෙහෙයුම් දියත් කළත් එය තැනැත්තන් වෙළඳාම් කිරීමට එරෙහි වීමට ප්‍රමාණවත් නැත.

මේ ප්‍රවණතාව නොකඩවා ක්‍රියාත්මක වුවහොත් "පුද්ගල වෙළඳාම සංසිද්ධිය තුළ මානුෂික ප්‍රතිවිපාක නොසලකා හැරීමට සිදුවේ", යන අවධානයට ශ්‍රී ලංකා රජය මුහුණ දෙයි.[93] ශ්‍රී ලංකාවේ පුද්ගල වෙළඳාමට එරෙහිව මූලිකව අනුගමනය කළ හැකි නිර්දේශ කිහිපයක් මතු දක්වේ.

පළමුව, පුද්ගල වෙළඳාම පිළිබඳ ප්‍රශ්නය මනාව අවබෝධ කර ගත යුතුය. ප්‍රශ්නයේ ස්වභාවය අනුව එය වැළැක්වීමට සහ අවසන් කිරීමට සම්පත් යෙදවිය යුතුය. මෙහිදී සිවිල් සමාජය ඇතුළු රජයේ සියලුම දෙපාර්තමේන්තු සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.

දෙවනුව, අනිවාර්යයෙන්ම රජය පුද්ගල විකිණීමට එරෙහිව පුළුල් ප්‍රවේශයක් ගත යුතුය. පුද්ගල වෙළඳාම, සමාජ, දේශපාලනික සහ ආර්ථිකමය කාරණාවක් වන අතර, එයට බොහොමයක් දුර්වල පුද්ගලයන් ගොදුරුවෙයි. මානව අයිතිවාසිකම් ප්‍රවේශයන් පුද්ගල වෙළඳාමට ස්ථාපනය කළහොත් එහිදී පුද්ගලයන් සහ ඔවුන්ගේ අයිතීන් සම්බන්ධව විශ්වමය සම්මතයන් පිළිගැනීමට සිදු වේ. පුද්ගල වෙළඳාම අන්තර්ජාතික කාරණයක් වන අතරම, බලවත් රටවල් ගණනාවක් පුද්ගල වෙළඳාමට එරෙහිව ප්‍රකාශිත සහයෝගය ලබා දී ඇත. පරමාදර්ශීව ශ්‍රී ලංකාවට නීති විරෝධීව ඇතුළුවීම සහ ශ්‍රී ලංකාවෙන් නීති විරෝධීව පිටවීම සම්බන්ධයෙන් ගත් ප්‍රයත්න සහ සම්පත් අභ්‍යන්තර සහ බාහිර පුද්ගල වෙළඳාමට එරෙහිවද ගත යුතුය.

---

93. මානව හිමිකම් විමසුම, "සංක්‍රමණිකයන් පිළිබඳ වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) සහ එම ක්ෂේත්‍රයේ මානව හිමිකම් සඳහා ඇති ආරක්ෂාව: වර්තමාන ගැටලු" යන මැයෙන් සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ පාලක කවුන්සිලයේ සැසිවාරයේදී මානව හිමිකම් විමසුම විසින් ඉදිරිපත් කළ වාර්තාව (ජිනීවා 2003 නොවැම්බර් 18-21) 12 වන පිටුව.

තුන්වෙනුව, සාපරාධී ක්‍රියාකාරකමකට බලහත්කාරයෙන් පොළඹවා ගන්නා පුද්ගලයෙකුට ඔහු පුරවැසියකු වුවද පුරවැසියෙකු නොවූවද රජය විසින් දඬුවම් නොකළ යුතුය. සියලු ප්‍රයත්න දරිය යුත්තේ පුද්ගලයා වින්දිතයා ද නැද්ද යන්න තීරණය කිරීමටය. වින්දිතයාට දඬුවම් ලබා නොදීමේ එක් මාර්ගයක් වන්නේ නීති විරෝධී පිටවීම, 'ඇප දිය නොහැකි' ලෙස නීතිය තුළ දක්වා තිබීම භාවිතා නොකිරීමට සහතික වීමයි.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාව පුද්ගල වෙළඳම පිළිබඳ මූලපත්‍රය අපරානුමත කළ යුතු අතර, නීතිමය ප්‍රතිපාදන මගින් සහතික කළ යුත්තේ:

අ) වින්දිතයන්ගේ අනන්‍යතාවය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම:

ආ) පුද්ගල වෙළඳම් කරන්නන්ට එරෙහිව අපරාධ නඩු රහසිගත විය යුතුය:

ඇ). වින්දිතයන් වින්ද වූ දුකට වන්දි ලබා ගැනීමට නීතිමය අයිතියක් තිබිය යුතුය:

ඈ) පවත්නා ක්‍රියාපටිපාටිමය අයිතීන් ගැන වින්දිතයා දන ගත යුතු අතර නීති කටයුතු වලට සහභාගී වීම සහතික කළ යුතුය:

ඉ) පුරවැසියන් නොවන අයටද පුරවැසියන් හා සමාන රැකවරණ ලබාදිය යුතුය. මෙම පිළිවෙත් සම්පූර්ණයෙන්ම ක්‍රියාවේ යෙදවීමට රජය සහතික විය යුතුය.

## 4. සමාප්තිය

අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සහ පුද්ගල වෙළඳමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ තිරුරහෝන මූලපත්‍ර මානව හිමිකම් පිළිබඳ විධිමත් ලිඛිතයන් ලෙස නොසැලකෙන බව අවධාරණය කිරීම වැදගත්ය. ඒවා එක්සත් ජාතීන්ගේ අපරාධ කොමිසමේ අධීක්ෂණය යටතේ සැලකෙන නීති බලාත්මක කරන ලේඛනයන්ය. ඒ තුළින් මානව හිමිකම් ඉදිරියට පමුණුවීම නොකරන්නේ යැයි අදහස් නොකරන අතර, මේ පරිච්ඡේදය තුළ ඒවා බලධාරී ලියවිලි යන්න විග්‍රහ කරයි. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ සිවිල් සමාජය සතු එක් අභියෝගයක් වන්නේ මෙකී අන්තර් ජාතික පත්‍රයන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා වන පරිද්දෙන් පරිවර්තනය කිරීමයි.

ශ්‍රී ලංකාව සතු දෙවන අභියෝගය වන්නේ, විදෙස් වලට යන්නාවූ සහ ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ආරක්ෂා කර ගැනීමයි. ශ්‍රී ලංකාව මුහුණ දෙන උභතෝකෝටිකයක් වන්නේ මානව තිරුරහෝනයේ සහ පුද්ගල වෙළඳාමේ කොටසක් ලෙස විදේශයන්හි දී ශ්‍රී ලාංකිකයන්ට තම නීතියෙන් බලාත්මක භාවයෙන් පිටත සහ ආධාර කණ්ඩායම් වලින් පිටත සිදුවන මානව හිමිකම් අපචාරයන් සම්බන්ධයෙන් පවතින ගැටලුවයි. මිලියනයකට ආසන්න පුද්ගලයන් නිල වශයෙන් විදෙස් රටවල සේවය කරන අතර නිසි ලියකියවිලි නොමැතිව නොදන්නා ප්‍රමාණයක් විදෙස් රටවල ජීවත් වෙයි. මෙකී පුද්ගලයන්ගෙන් බොහෝමයක් තම සේවායෝජකයාගෙන් හා අපරාධකරුවන්ගෙන් අපචාරයට ලක්වෙයි. තවදුරටත් ප්‍රමාණවත් නොවන හා යල්පැන ගිය නීතින් ක්‍රියාත්මක වන බටහිර ආසියා රටවල් තුළ සංක්‍රමණික ශ්‍රමිකයන් බොහෝ සිටින බවට බහුලව වාර්තා වේ.[94] නීති උල්ලංඝනය කිරීම තුළ තවත් රටවල් දඩි ක්‍ෂුර පිළිවෙත් අනුගමනය කිරීම දකිය හැක.[95] කොතැනක සිටියත් ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ අන්තර්ජාතිකව පිළිගත් අයිතීන් ස්ථාපිත කිරීමට රජයන් සහ සිවිල් සමාජය සහයෝගයෙන් වැඩ කළ යුතුය.

94. එක්සත් ජාතීන්ගේ සංක්‍රමණික වාර්තාව, 23 වන පිටුව.

95. "එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී අත්අඩංගුවට ගත් 40,000 අතර ශ්‍රී ලාංකික කම්කරුවන් සිටීද?" යන මැයෙන් 2003 ජූලි මස 6 වන දින සන්ඩේ ටයිම්ස් පුවත්පතට තිලිකා කස්තුරිසිංහ විසින් වාර්තා කළ පුවත.

# IV

# කම්කරු අයිතිවාසිකම්

මනෝරි විතාරණ*

## 1. හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් සහ කම්කරු අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රඥප්ති සියල්ලම සහ 1998 හි මූලික අයිතිවාසිකම් සහ සේවක අයිතිවාසිකම් ප්‍රකාශනයෙහි (1 ඇමුණුම බලන්න) පිළිබිඹු වන අන්තර්ජාතික කම්කරු සංවිධානයේ මූලික ප්‍රඥප්ති 8 ද ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇත.

මෙම පරිච්ඡේදය, ශ්‍රී ලංකාවේ කම්කරු අයිතීන් පිළිබඳ තත්ත්වය, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති සහ මූලික අයිතිවාසිකම්[1] හා

* නීතිඥ, ව්‍යාපෘති නිලධාරිනි,(එල්.එල්.බී.) -ජාත්‍යන්තර කම්කරු සම්බන්ධතා පිළිබඳ අමෙරිකානු ආයතනය.

1. 1998 ජූනි මාසයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථාමය අංශය වන ජාත්‍යන්තර කම්කරු මන්ත්‍රණ සභාව මගින් මූලික මූල ධර්ම හා සේවා ස්ථානයේ දී ඇති අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශය සහ ඊට සම්බන්ධ අනෙකුත් ද පිළිගනු ලැබ ඇත. මෙම ප්‍රකාශනය සේවක හා සේව්‍යයන්ගේ සංගමයේ නිදහස හා සාමූහික කේවල් කිරීමට ඇති කාර්යක්ෂම අයිතිවාසිකම් වලට ගරු කිරීම වැඩි දියුණු කිරීම සහ යහපත් විශ්වාසයෙන් යුතුව අවබෝධ කර ගැනීමට ජාත්‍යන්තර ප්‍රජාවෙහි ඇති කැපවීම තහවුරු කරයි. සියලුම ආකාරයේ බලහත්කාරයන් සහ අනිවාර්යයෙන් සිදුකරන සේවයේ යෙදවීම පිටුදැකීමට කටයුතු කිරීම ළමා කම්කරු සේවය එලදායී ලෙස තහනම් කිරීම සහ සේවය සහ රැකියා සඳහා ඇති වෙනස් කොට සැලකීම පිටුදැකීමද ඊට අයත්ය. අදාළ ප්‍රඥප්තිය ස්ථිර කොට තිබුණ ද නොතිබුණ ද සියලුම සාමාජික රටවලට අදාළ ප්‍රඥප්තීන් හි මූලික සිද්ධාන්ත වලට ගරු කිරීමට බැඳීමක් ඇති බව ප්‍රකාශනය විශේෂයෙන් දක්වා ඇත.

සේවක අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි පිළිබිඹු වන ජාත්‍යන්තර කම්කරු අයිතිවාසිකම් ප්‍රමිතීන් පසුබිම් කොට සාකච්ඡා කර ඇති අතර මෙහිදී එක්රැස් වීමේ නිදහස හා සංවිධානය වීමේ නිදහස සලකා බැලෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 1948, අංක 87 දරණ සම්මුතිය සහ සංවිධානය වීමේ අයිතිවාසිකම පිළිබඳ මූල ධර්ම යොදා ගැනීම හා සාමූහික කේවල් කිරීම පිළිබඳ 1949, අංක 98 දරණ සම්මුතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

දළ වශයෙන් මිලියන 6.1 ක් වන ශ්‍රී ලංකාවේ කම්කරු බලකායෙන් 20% ක ප්‍රතිශතයක් (උතුරු හා නැගෙනහිර පළාත් හැර) විශාල වෘත්තීය සමිති සාමාජිකයෝ වෙති. ඔව්හු දේශපාලන පක්ෂ හා අනුබද්ධ වී ඇති අතර දේශපාලන ක්‍රියාදාමයෙහි ප්‍රධාන භූමිකාවක් රඟ දක්වනු ලැබේ. වෘත්තීය සමිති 1600 ක් පමණ ලියාපදිංචි වී තිබුණද ඉන් ක්‍රියාත්මක වන්නේ 500 ට අඩු ප්‍රමාණයකි.

ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති සාමාජිකත්වය සම්බන්ධයෙන් කලාපයෙහි අනෙක් රටවලට වඩා ඉහළ ප්‍රතිශතයක් තිබුණද වෘත්තීය සමිතිවල සාමාජිකත්වය දරන කම්කරුවන් ප්‍රතිශතය සමස්ථයක් ලෙස ගත් කල එහි ක්‍රමික අඩු වීමක් දක්නට ලැබේ.

දවැන්ත පුද්ගලික ආයතන වල සිටින සේවකයින්ගෙන් වැඩි ප්‍රමාණයක් වෘත්තීය සමිති වලට බැඳී ඇත. කෙසේ වුවද, කුඩා පරිමාණයේ කෘෂිකාර්මික කටයුතු සහ කුඩා ව්‍යාපාර වලට අයත් කම්කරුවන් සාමාන්‍යයෙන් වෘත්තීය සමිති වලට අයත් නොවේ.[2] වැවිලි කර්මාන්ත අංශයෙහි විවිධ වෘත්තීය සමිති 68 ක් පමණ ඇති අතර දළ වශයෙන් 70% ක පමණ වැවිලි සේවක පිරිසක් වෘත්තීය සමිතිවල සාමාජිකත්වය දරති. රජයේ සේවයෙහි නියුතු සේවකයින් විශාල වශයෙන් වෘත්තීය සමිති වලට බැඳී ඇත.

## 2. සමාගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීම

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 87 දරණ සම්මුතිය අනුව සමාගම් පැවැත්වීමේ නිදහස යනු පූර්ව අනුමැතියෙන් තොරව සේවකයින්ගේ සහ සේව්‍යයින්ගේ ස්වකැමැත්තෙන් සංවිධාන පිහිටුවීමේ සහ ඊට සම්බන්ධ වීමේ

---

2. ක්‍රිස් ස්ළි. "ශ්‍රී ලංකා අයිතිවාසිකම් උදෙසා දමිළ වැවිලි ක්ෂේත්‍රයේ සේවකයින්ගේ සටන" ග්‍රීන් ලෙෆ්ට් වීක්ලි, 2003 මැයි 28.

අයිතිය (2 වගන්තිය) තම ව්‍යවස්ථා සහ නීති සකස් කිරීම, තම නියෝජිතයින් තෝරා පත්කර ගැනීම සහ ඔවුන්ගේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම (3 වන වගන්තිය), සන්ධාන ගතවීම සහ ජාත්‍යන්තර සංවිධාන වලට බැඳීම (5 වගන්තිය), සහ පරිපාලන අධිකාරි මගින් විසුරුවා හැරීම හා තහනම් කිරීමෙන් ආරක්ෂා වීම (4 වගන්තිය), යන අයිතීන්ය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 98 දරණ සම්මුතියේ 4 වන වගන්තිය සාමූහික කේවල් කිරීම, සාමූහික ගිවිසුම් මගින් නීති හා කොන්දේසි හැසිරවීමේ අරමුණින් සේව්‍ය හෝ සේව්‍ය සංවිධාන හා සේවක සංවිධාන අ``ර ස්වේච්ඡාවෙන් සිදුකරන සාකච්ඡාව ලෙස අර්ථ දක්වයි.

සාමාන්‍යයෙන්, සමාගමෙහි නිදහස සහ සංවිධානය වීමේ නිදහස හා සාමූහික කේවල් කිරීම අතර ඇති වෙනස වනාහි, සමාගමෙහි නිදහස සලකා බලනුයේ රජය හා වෘත්තීය සමිති අතර පවත්නා සබඳතා වන අතර සංවිධානය වීමේ හා සාමූහික කේවල් කිරීමේ නිදහස සැලකිලිමත් වනුයේ වෘත්තීය සමිති හා සේවකයින්[3] අතර පවත්නා සබඳතාය.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 87 හා 98[4] දරණ සම්මුති දෙකම ශ්‍රී ලංකාව විසින් ස්ථිර කර ඇති අතර අංක 87 දරණ සම්මුතියේ ඇති මූල ධර්මය 1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන වගන්තියෙහි අන්තර්ගත කර ඇත. එම වගන්තිය සෑම පුරවැසියෙකුගේම සමාගමෙහි නිදහස හා වෘත්තීය සමිතියක් පිහිටුවීමේ හා ඊට සම්බන්ධවීමේ නිදහස තහවුරු කරයි. කෙසේවුවද, ශ්‍රී ලංකාවේ කම්කරුවන් හා සම්බන්ධ ව්‍යවස්ථාවන්හි සමාගමෙහි නිදහස, සංවිධානය වීමේ නිදහස, සහ සාමූහික කේවල් කිරීම සම්බන්ධයෙන් බරපතල අඩුපාඩු වලින් යුක්ත වේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්ති ආදේශ කිරීමට සහ නිර්දේශ කිරීමට ඇති විශේෂඥයන්ගෙන් යුත් කමිටුව පෙන්වා දෙන්නේ පාලනයක් නොමැති බන්ධනාගාර සේවකයින්, උසාවියේ සේවකයින් සහ කෘෂිකාර්මික සේවකයින් සියලු දෙනා වෘත්තීය සමිති පිහිටුවීමේ අයිතිවාසිකමින් බැහැරකොට ඇති බවයි.

---

3. සැමට සාධාරණය - ගෝලීය ආර්ථිකය තුළ සේවක අයිතිවාසිකම් සඳහා මාර්ගෝපදේශනය. අන්තර්ජාතික කම්කරු සංවිධානය සඳහා වූ අමෙරිකානු මධ්‍යස්ථානය, AFL-CIO 2003 මැයි.

4. 1992 දී 87 වන ප්‍රඥප්තිය ස්ථිර කෙරුණු අතර 98 වන ප්‍රඥප්තිය 1995 දී ස්ථිර කෙරිණ.

1999 දෙසැම්බර් මස, පාර්ලිමේන්තුව විසින්, 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත සඳහා සංශෝධන පනතක් සම්මත කරන ලදී. එහි අරමුණ වූයේ, සේවා ස්ථානයෙහි සාමාජිකයන්ගෙන් 40% කින් සමන්විත වෘත්තීය සමිති, කේවල් කිරීමේ ඒජන්තවරුන් ලෙස සේව්‍යයන් විසින් පිළිගැනීම සහතික කිරීමයි.

එලෙස නීතිය, වෘත්තීය සමිති විරෝධී ඒවාට අසාධාරණ ලෙස සැලකීම තහනම් කරයි. 1999 අංක 56 දරණ කාර්මික ආරවුල් (සංශෝධන) පනත දන්වන්නේ, "යම් වෘත්තීය සමිතියක් එය කේවල් කිරීමට අරමුණු කර ගන්නා සේවකයින්ගෙන් සියයට හතළිහක ප්‍රතිශතයකින් සමන්විත වේ නම්, එවැනි වෘත්තීය සමිතියක් හා කේවල් කිරීම කිසිදු සේව්‍යයෙකුට ප්‍රතික්ෂේප කළ නොහැකි බවයි." එය තවදුරටත් දක්වන්නේ "මෙම පරිච්ඡේදයෙහි අරමුණ පරිදි සේව්‍යයා හා කේවල් කිරීමට බලාපොරොත්තු වන වෘත්තීය සමිතිය, එය ඉලක්ක කරගන්නා සේවකයින්ගෙන් අවම වශයෙන් 40% ක සාමාජිකත්වයෙන් යුක්ත ද යන්න සෙවීම සඳහා එම සේවා ස්ථානයෙහි ඡන්දයක් පැවැත්වීමට කම්කරු කොමසාරිස් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකුට හැකියාවක් ඇත.

ශ්‍රී ලංකාවේ පවතින කම්කරුවන්ට අදාළ ව්‍යවස්ථා පුද්ගලික අංශය බැහැර නොකළද ප්‍රායෝගිකව එය නිදහස් වෙළඳ කලාපය තුළ සමාගමයෙහි නිදහසට ඉඩ නොදේ. නිදහස් වෙළඳ කලාපය තුළ එක්සත් වීම වළකන නීති නොවූවද ඇත්ත වශයෙන්ම අලිඛිත ප්‍රතිපත්තියක් ලෙස සංවිධානය වීමේ ප්‍රයත්නයන්ට විරෝධතාව දක්වනු ලැබේ. නිදහස් වෙළඳ කලාපය තුළ වෘත්තීය සමිති පිහිටුවීමේ ප්‍රතිශතය 0.2% ක් පමණ වේ. වර්තමානයේ නිදහස් වෙළඳ කලාපය තුළ 450,000 කට වැඩි පිරිසක් සේවය කරති. ඉන් 70% කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් වේ.

නිදහස් වෙළඳ කලාපය තුළ සේවකයින්ගේ සංගමයෙහි නිදහස හා සංවිධානය වීමේ අයිතිවාසිකම් සම්බන්ධ ගැටලුව වර්තමානයෙහි අර්බුදකාරී සංධිස්ථානයකට පැමිණ ඇත. එහිදී විශේෂ අවධානයක් දක්වා ඇත්තේ වෘත්තීය සමිති සඳහා සංවිධානය වීමේ හා ක්‍රියාත්මක වීමේ අවසරය ලබා දී ඇති කම්කරු නීති ක්‍රියාත්මක කිරීමේ පැහැදිලි පසුබට වීම කෙරෙහිය.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය, යුරෝපා සංගමය හා එක්සත් ජනපද ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කර ඇත. එමගින් ශ්‍රී ලංකා රජයට හා තරමක් දුරට ව්‍යාපාරික ප්‍රජාවට, කම්කරු ප්‍රමිතීන් දඩිව

ක්‍රියාත්මක කිරීමට බල කෙරේ. මෙයට 2003 ජූලි මස විනිශ්චිත ජැකලංකා කර්මාන්ත ශාලාවේ ආරවුල සාක්ෂි සපයයි.

ජාත්‍යන්තර[5] නිරීක්ෂකයෙකුගේ වාර්තාවකට[6] අනුව මෙහිදී, කටුනායක ජැකලංකා කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි නියුතු වූ නිදහස් වෙළඳ කලාප සේවක සංගමයේ සාමාජිකයන්හට පාලකයින්ගේ තර්ජන වලට මුහුණ පෑමට සිදුවිය. එය සිදුවූයේ වෘත්තීය සමිතිය 40%ක සාමාජිකත්වයෙන් යුතු ද හා එසේ නම් එය සාමූහික කේවල් කිරීමේ නියෝජනයක් ලෙස පිළිගත හැකිද යන්න තීරණය කිරීමට ජනමත විචාරණයක් පැවැත්වීමට යාමේදී ය. ඡන්ද විමසීම 2003 ජූලි මස පැවැත්විණ. එහෙත් වාර්තාවට අනුව පාලකයන්ගේ උපක්‍රම හේතු කොටගෙන ඡන්දය පාවිච්චි කරනු ලැබුවේ සේවකයින්ගෙන් අතළොස්සක් පමණි. එක්සත් ජනපද පොදු ප්‍රමුඛතා පද්ධතිය පෙත්සමින්[7] පසු නිදහස් වෙළඳ කලාපය තුළ පැවැත්වෙන ප්‍රථම ජනමත විචාරණය වූ බැවින් ජාත්‍යන්තර මතද මෙම නඩුව කෙරෙහි යොමු විය. ශ්‍රී ලංකාවට G.S.P. පහසුකම් සැපයීම දීර්ඝ කිරීමට යුරෝපා සංගමය මගින් ගනු ලැබූ තීරණය ප්‍රමාද කිරීමටද ඉහත සඳහන් ආයතනයේ ක්‍රියාකාරකම් හා දර්ශනය බලපෑ අතර මෙහිදී තත්ත්වය සමහන් කරන ලෙස එල්ල වූ ජාත්‍යන්තර බලපෑම් වලට මුහුණ දීමට ශ්‍රී ලංකා රජයට සිදුවිය. දේශීය හා විදේශීය විරෝධතා ව්‍යාපාර දිගටම පැවතිණ.

2003 ඔක්තෝබර් මස ජැකලංකා කර්මාන්ත ශාලාවේ පරිපාලනයට[8] සාධාරණ කම්කරු සංගමය මැදිහත් වුණු අතර ඒ අනුව නිදහස් වෙළඳ කලාප සේවක සංගමයේ ජැකලංකා ආරවුල විසඳිණ. මෙය නිදහස් වෙළඳ කලාප සේවක සංගමය ලද ඉතා වැදගත් ජයග්‍රහණයක් විය. ජැකලංකා නඩුවේ ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර නිරීක්ෂණය යටතේ එක්සත් ලංකා නිදහස් වෘත්තීය සමිති, කොග්ගල පොලිටෙක්ස් ඇඟලුම් කර්මාන්ත ශාලාවේ (දකුණු පළාත) පැවති ජනමත විචාරණය ජයග්‍රහණය කිරීමට

5. TIE ආසියා වෙබ් අඩවිය : http://www.tieasia.org/jaqalankaobserversreport.htm.
6. අර්ල් බ්‍රවුන් - කම්කරු නීති උපදේශක අමෙරිකානු කම්කරු සංවිධානය කාර්මික සංවිධාන කොංග්‍රසය (AFL - CEO).
7. AFL-CIO එක්සත් ජනපද වෙළඳ නියෝජිත කාර්යාලයට ඉදිරිපත් කරන ලද GSP යටතේ ප්‍රතිලාභ සංවර්ධනය වෙමින් පවතින ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කිරීමට ඉදිරිපත් කළ පෙත්සම.
8. නිදහස් වෘත්තීය සමිති ජාත්‍යන්තර සංවිධානය මගින් කළ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පැමිණිල්ල බලන්න. ශ්‍රී ලංකා: ජැකලංකා සමාගමේ තිබෙන වෘත්තීය සමිති විරෝධී උපක්‍රම. (EPZ) 2003 ජූලි 21 - http://www.icftu.org/.

සමත් විය. එම වෘත්තීය සමිතිය පිළිගනු ලැබූ අතර එය පරිපාලනය සමග සාමූහිකව කේවල් කිරීමේ ක්‍රියාදාමයට ඇතුළු විය.

ශ්‍රී ලංකාවේ නීතිය, සාමූහික කේවල් කිරීමේ අයිතිය පිළිගත්තද එය පුළුල් ලෙස ක්‍රියාත්මක නොවේ. වෘත්තීය සමිති පිළිබඳ හුදු පිළිගැනීම සේවක අයිතිවාසිකම් තහවුරු කරන්නක් නොවේ. සාමූහික කේවල් කිරීමේ ක්‍රියාදාමයේ ප්‍රතිඵලය සාමූහික ගිවිසුමයි. සියලුම ව්‍යාපාර හා ලියාපදිංචි වෘත්තීය සමිති ප්‍රමාණය සසඳා බැලූවිට වර්තමාන පුද්ගලික අංශයේ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම දැකිය හැක්කේ සුළු ප්‍රමාණයකි.

මෙය වෘත්තීය සමිති පද්ධතියේ නියත දුර්වලතාවයක් ලෙස දැකිය හැකි වන්නේ ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ආඥපනත[9] ඕනෑම පුද්ගලයින් සත් දෙනෙකුට එකතු වී වෘත්තීය සමිතියක් පිහිටුවීමට හා එය ලියාපදිංචි කිරීමට අවසර දී ඇති බැවිනි. මෙහි අර්ථය වන්නේ කිසිදු සාමූහික කේවල් කිරීමේ ගිවිසුමක ක්‍රියාත්මක වීමෙන් තොරව ඕනෑම සේවා ස්ථානයක, වෘත්තීය සමිති විශාල ප්‍රමාණයක් තිබිය හැකි බවයි. සත්‍ය වශයෙන්ම තනි, විශාල ආයතනයක් තුළ වෘත්තීය සමිති 50-60 ක් වැනි ප්‍රමාණයකට ක්‍රියාත්මක විය හැක.

## 3. කම්කරු සභා පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආයෝජන මණ්ඩලයේ උපදෙස් මාලාව

නිදහස් වෙළඳ කලාපයෙහි එයට මග පෙන්වන අධිකාරිය වන ආයෝජන මණ්ඩලය විසින් 2002[10] ඔක්තෝබර් මස කම්කරු සභා පිහිටුවීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය[11] උපදෙස් මාලාවක් නිකුත් කරන ලදී. ආයෝජන මණ්ඩලය ඒ පිළිබඳ සිය හැඳින්වීමේ මෙසේ සඳහන් කරයි. *'සේවකයින් හා ඔවුන්ට බලපාන ගැටලු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී එයට සහභාගී වීම මෙන්ම කම්කරු පරිපාලන උපදේශකත්වය සහ ව්‍යාපාරික මට්ටමේ අන්‍යෝන්‍ය සැලකිල්ල පිළිබඳ ගැටලු වලදී සහයෝගය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාර*

---

9. 1935 අංක 14.
10. 2002 ඔක්තෝබර් (සංශෝධනය සහ කාලායත්ත හා ක්‍රියාත්මක කිරීම කරන ලදී).
11. ආයෝජන මණ්ඩලයේ සේවක ක්‍රියා කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාව 2002 ඔක්තෝබර් 01 - පිටුව 01.

ආයතන තුළින් තෝරාගත් නියෝජිතයින්ගෙන් සමන්විත සේවක සභා පිහිටුවීමට ආධාර කරයි.'

කෙසේ වුවද, කම්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කරන නීතිඥයින් පෙන්වා දෙන්නේ මෙම උපදෙස් මාලාවේ වගන්ති බොහොමයක් සංගමයේ නිදහසට හා සාමූහිකව කේවල් කිරීමට ඇති අයිතිවාසිකම් නිර්දය ලෙස පීඩාවට පත් කරන බවයි. ඔවුන් තවදුරටත් පවසනුයේ උපදෙස් මාලාව සම්පූර්ණයෙන්ම පාහේ ක්‍රියාත්මක කරනුයේ ආයෝජනය වැඩි දියුණු කිරීමේ වගකීම දරන ආයෝජන මණ්ඩලය වන බැවින් පැහැදිලිවම එය වෘත්තීය සමිති ආඥාපනත යටතේ වෘත්තීය සමිති ලබන අවම ආරක්ෂාව අවතක්සේරු කරන බවයි. මීට අමතරව උපදෙස් මාලාවේ තව බොහෝ වගන්ති ප්‍රමාණයක් තෝරාපත් කර ගත් සභාවල ස්වාධීනත්වය අවතක්සේරු කරයි.

වර්ෂ 2003 මාර්තු මස, ලංකා වෙළඳ කාර්මික සහ සාමාන්‍ය කම්කරු සමිතිය වෙනුවෙන් රෙදිපිළි, ඇඟළුම් සහ සම් කර්මාන්ත කම්කරු සංවිධානය, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සමාගමයේ නිදහස කමිටුවට පැමිණිලි කර සිටියේ සේවක සභා පිහිටුවීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් නිකුත් කළ උපදෙස් මාලාව නිදහස් සහ ස්වාධීන වෘත්තීය සමිති නිර්මාණය කිරීම අවහිර කරන අතර ඔවුන්ගේ සාමූහිකව කේවල් කිරීමේ අයිතිවාසිකම් කරුණු 5 ක් හේතුවෙන් වළක්වන බවයි. එනම්,

> *(අ) ඔවුන්ට වෘත්තීය සමිති සහ සේවක සභා අතර සාමූහික කේවල් කිරීමේ අයිතිවාසිකම් සඳහා තරඟයක් ඇති කිරීමට අවශ්‍ය වීම: (ආ) කම්කරු සභා සඳහා නිදහස් ඡන්දයක් සහතික නොවීම: (ඇ) සේව්‍යයන් ඉදිරියෙහි සේවක සභාවල ස්වාධීනත්වය ආරක්ෂා නොකිරීම: (ඈ)තමන් කුමන සංවිධානයක් මගින් නියෝජනය කෙරෙන්නේද යන තීරණයකට කම්කරුවන් පෙළඹවීම සඳහා ඔවුහු සේවාදයක සංගමයට වාසිදයක ක්‍රියාමාර්ග සලසති: (ඉ) ඔවුන් තරඟකාරී කම්කරු අධිකාරී වෙනුවට ආයෝජන මණ්ඩලයේ අධිකාරිය යටතේ කාර්මික ආරවුල් විසඳීමෙහි ආධිපත්‍යයක් පිහිටුවාගෙන තිබීම.*[12]

12. නඩු වාර්තා අංක. 332 (ශ්‍රී ලංකා) හි නඩු අංකය. 2255 බලන්න. ශ්‍රී ලංකා රජයට විරුද්ධව ජාත්‍යන්තර රෙදිපිළි, ඇඟලුම් සහ සම්භාණ්ඩ වෘත්තිකයන්ගේ ඒකාබද්ධ සංගමය (ITGLWF) ලංකා වාණිජ හා කර්මාන්ත වෘත්තීය සංගමය (CMU) වෙනුවෙන් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සමාගමයෙහි නිදහස පිළිබඳ කමිටුව පැමිණිලිවල සඳහන් විවිධාකාර චෝදනා සහ රජයේ පිළිතුරු විභාග කර බැලීමෙන් අනතුරුව, ආයෝජන මණ්ඩලයේ උපදෙස් මාලාවේ යම් නිශ්චිත වගන්ති, අංක 87, 98 හා අංක 135 දරණ ප්‍රඥප්ති යන නිදහස් හා ස්වේච්ඡා සාමූහික කේවල් කිරීමේ මූල ධර්ම වලට පටහැනි බව පෙන්වා දී ඇත. මේ අනුව කමිටුව ආයෝජන මණ්ඩල උපදෙස් මාලාවේ එම නිශ්චිත වගන්ති සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට රජයෙන් ඉල්ලීමක් කරන ලදී. ඒ ආයෝජන මණ්ඩල උපදෙස් මාලාවේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ[13] අදාළ ප්‍රඥප්ති හා අනුකූල වන බව තහවුරු කරනු පිණිසයි.

# 4. 2003 වසර තුළ සිදුවූ වැදගත් සිදුවීම්

## 4.1 වෘත්තීය සමිති ක්‍රියාමාර්ග

වැඩ වර්ජනය කිරීමේ අයිතිවාසිකම් මූලික අයිතිවාසිකමක්[14] නොවූවද එය නීතිය විසින් පිළිගත් වෘත්තීය සමිති ක්‍රියාදාමයකි. ශ්‍රී ලංකාවේ නීතිය අත්‍යවශ්‍ය නොවන සේවාවල වැඩ වර්ජන වලට එරෙහිව ක්‍රියාකිරීම තහනම් කරයි. වැඩ වර්ජනයක් ශ්‍රී ලංකාව තුළ නීති විරෝධී වන්නේ එය කාර්මික ආරවුල් පනත මහජන ආරක්ෂක ආඥාපනත[15] සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යන පනත් උල්ලංඝනය කරන අවස්ථා වලදී පමණි.

වර්තමානයෙහි පිකටින් යන්න ශ්‍රී ලංකා නීතියෙහි අර්ථ දක්වා ඇත. කෙසේ වුවද, එය රැස්වීම් පැවැත්වීමේ නිදහස හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යන මූලික අයිතිවාසිකම් පිළිබඳ වැදගත් ගැටලුවක් මතු කරයි. පිකටින් කිරීම අන්තර්ගත වන පරිදි අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අර්ථ දක්විය හැක. සෙමින් වැඩ කිරීම, වර්ජනය සහ කාර්යාල අඩස්සියේ තබා ගැනීම වැරදි[16] ක්‍රියා ලෙස සැලකේ.

13. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ රැස්වීමේ නිදහස සඳහා වූ සංගම් කමිටුවේ නිර්දේශයන් බලන්න. නඩු අංකය. 2255 (ශ්‍රී ලංකා නඩු වාර්තා අංක. 332) ශ්‍රී ලංකා රජයට විරුද්ධව ජාත්‍යන්තර රෙදිපිළි, ඇඟලුම් සහ සම්භාණ්ඩ වෘත්තිකයන්ගේ ඒකාබද්ධ සංගමය, ලංකා වාණිජ හා කර්මාන්ත වෘත්තිකයන්ගේ ඒකාබද්ධ සංගමය, ලංකා වාණිජ හා කර්මාන්ත වෘත්තීය සංගමය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල.

14. FRD වෙළුම අංක 01 පිටුව 143, 161-163.

15. ගෝඨාභය දසනායක - ශ්‍රී ලංකාවේ රැස්වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම. නීතිය සහ එහි ක්‍රියාකාරීත්වය - සේවාදායකයාගේ යථාදර්ශය, ලංකා හාම්පුතුන්ගේ සංගමය - (අප්‍රකාශිත).

16. කම්කරු සම්බන්ධතා පිළිබඳ අත්පොත, ෆෙඩ්රික් ඊබට් ස්ටිෆ්ටන්ග් (FES), 1997.

2003 වසර තුළදී ශ්‍රී ලංකාවේ රජයේ සහ පෞද්ගලික අංශ යන දෙකෙහිම ශ්‍රමිකයෝ වැඩ නැවැත්වීම හා පිකටින් කිරීම සිදු කළහ. ඒ විවිධාකාර හේතු සහ ඉල්ලීම් මත වුවද මූලිකවම සැලකිලිමත් වූයේ ගෙවීම් සඳහා වන ඉල්ලීම් හා වැටුප් විෂමතා කෙරෙහිය. ඉන් ඇතැම් ආරවුල් තවමත් නොවිසඳී පවතින අතර, ඇතැම් ගැටලු මෙම වාර්තාව ලියවෙන මොහොතේද ක්‍රියාත්මක වෙමින් පවතී.

ජූනි මස තුළ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට අයත් වෛද්‍යවරු සහ දන්ත වෛද්‍යවරු දහසකට වැඩි ප්‍රමාණයක් වැඩ වර්ජනයකට එළඹුණහ. ඊට හේතු වූයේ වැටුප් විෂමතා සහ යුධමය වාතාවරණයක් ඇති උතුරු-නැගෙනහිර පළාත්වල සේවයේ නියුතු වෛද්‍යවරුන්ට අවදානම වෙනුවෙන් ගෙවිය යුතු දීමනාව පවත්වාගෙන යාම වෙනුවෙනි. එහි ප්‍රතිඵලය වූයේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය 44% ක ප්‍රතිශතයක වැටුප් වැඩිවීමක් උපාධිධාරී වෛද්‍ය නිලධාරීන්ට ලබාදීමයි. කෙසේ වුවද, මෙම ජයග්‍රහණයෙන් පසුව, සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති සන්ධානය අනෙකුත් රෝහල් සේවකයින්ට වැටුප් වැඩිවීමක් උදෙසා ව්‍යාපාරයක් දියත් කළහ. ඒ ඔවුන් හා වෛද්‍ය නිලධාරීන් අතර වූ විෂමතා පිටුදැකීමටයි. මෙම සංගමයට සාත්තු සේවක සේවිකාවන්, ලිපිකරුවන්, රියදුරන්, අතුරු වෛද්‍ය නිලධාරීන්, සෞඛ්‍ය පරීක්ෂකවරු, වින්නඹුමාතාවන් සහ උපස්ථායකවරු අයත් වූහ. සැප්තැම්බර් මස තුළ 80,000 ට වැඩි සෞඛ්‍ය සේවක පිරිසක් දිවයින පුරා පැවති වැඩ වර්ජනයකට සහභාගී වූ අතර එය දින 13 ක් පුරා පැවතිණ. එය කිසිදු වෘත්තීය සමිති ඉල්ලීමක් ඉටු නොකරමින් අවසන් විය. මෙම ආරවුල දිගටම පැවති අතර මෙම වාර්තාව ලියවෙන විටද එය සමථයකට පත් නොවී පවතී.

තවදුරටත් සැප්තැම්බර් මාසයේදී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සේවකයින් දිවා ආහාර පැය තුළදී පිකටින් ව්‍යාපාරයක් කලාප කාර්යාලවල දී පැවැත්වූ අතර ඔවුන්ගේ ඉල්ලීම් වූයේ වැටුප් වැඩිවීමක් සහ වැටුප් විෂමතා විසඳුලීමයි. මෙම කාල වකවානුවේදීම, රජයේ ඉංජිනේරු සංස්ථාවේ සේවකයෝ කොළඹ පිහිටි සංස්ථා කාර්යාලය පිටතදී විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූහ. ඔවුන්ගේ අරමුණ වූයේ වැටුප සහ සංස්ථාව වසා දැමීමට ඇති පරිපාලනයේ සැලසුම් වලට ඔවුන්ගේ විරෝධතාව දැක්වීමයි.

මාර්තු මස ලංකා විදුලිබල මණ්ඩලයේ 800 ක පමණ විදුලි කාර්මික හා සිවිල් අධිකාරිවරුන් පිරිසක් වැටුප් සංශෝධනයක් සහ ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම වෙනස් කරන ලෙස ඉල්ලා වැඩ වර්ජනයක්

කරා එළඹිණ. විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා වෘත්තීය සමිතිවල ඉල්ලීම ප්‍රායෝගික නොවන බව පැවසීය. තවදුරටත් ජූනි මස වෘත්තීය සමිති 25 න් 10,000 ට වැඩි බල ශක්ති සේවකයින් පිරිසක් වැඩ වර්ජනය කළහ. ඔවුන්ගෙන් වැඩි පිරිසක් විදුලිබල මණ්ඩලයේ නිලධාරීහු වූහ. ඔවුන්ගේ ඉල්ලීම වූයේ 2000 වසරේ සිට ගෙවීමට නියමිත වූ වැටුප් වැඩිවීමක හිඟ වැටුප් ගෙවන ලෙසයි.

දත්ත ඇතුළු කිරීමේ නිලධාරීන්, ලිපිකරුවන්, කාර්මිකයින්, මීටර් කියවන්නන් සහ කාර්යාල සහායකයින් වැනි විවිධ කාණ්ඩ වලට අයත් බලශක්ති සේවකයින් 800 ට වැඩි ප්‍රමාණයක් ඔවුහු රැකියා ස්ථිර කරන ලෙස සහ හිඟ වැටුප් ගෙවන ලෙස ඉල්ලා නොවැම්බර් මස වැඩ වර්ජනයක් කරා ගියහ. ඔවුන් තවදුරටත් පැවසුවේ රජයේ විදුලිබල මණ්ඩලයේ පුද්ගලීකරණය කිරීමේ සැලසුම, 1997 සේවයට බඳවා ගත්තද තවම ස්ථිර නොකළ සේවකයන්ගේ රැකියා වලට තර්ජනයක් බවයි.

ඔක්තෝබර් මාසයේදී, රජයේ සේවකයෝ උද්ධමනයට සාපේක්ෂ වැටුප් වැඩිවීමක් ඉල්ලා වැඩ වර්ජනය කළහ. මෙයට දූරකථන සේවා, අධ්‍යාපන, සෞඛ්‍ය, පළාත් සභා, විදුලි, ඛණිජතෙල් නීතිගත සංස්ථාව, රජයේ මුද්‍රණ හා නීතිගත සංස්ථාව, බදු, රේගු, විගණකාධිපති සහ විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල වලින් 50,000 කට වැඩි පිරිසක් සහභාගී වූහ. රජයේ සේවකයෝද රජයට එහි පුද්ගලීකරණ වැඩපිළිවෙළ සහ බලහත්කාර මාරුකිරීම් නැවැත්වීමට ඉල්ලා සිටියහ.

විශ්ව විද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයෝද, ශ්‍රී ලංකාවේ අනිකුත් සේවකයින් හා සමව වැටුප් වැඩිවීම් උදෙසා වැඩ වර්ජන කරා එළඹුණහ. රු. 2000 ක වැටුප් වැඩිවීමක් (දළ වශයෙන් ඇමරිකානු ඩොලර් 20) ඉල්ලා නොවැම්බර් මස සංකේත වැඩ වර්ජනයක් ආරම්භ කෙරිණි. අනෙකුත් ඉල්ලීම් වූයේ වැටුප් විෂමතා විසඳීම, ණය සඳහා මුදල් වෙන් කිරීම සහ විශ්ව විද්‍යාල පුද්ගලීකරණය කිරීමේ සැලසුම් නැවැත්වීමයි.

දෙසැම්බර් මස ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් සිය ගණනක් කොළොන්නාව ප්‍රධාන ගබඩා සංකීර්ණයේදී වැඩ වර්ජනයක් පැවැත්විය. ඔවුන්ගේ ඉල්ලීම වූයේ වසර 2 ක් පුරා නොගෙවූ අතිකාල දීමනා, හිඟ මුදල් ද සමඟින් වහා ගෙවන ලෙසයි. බලධාරීන් විසින් හිඟ මුදල් ගෙවීමට පොරොන්දු වූ අතර වැඩ වර්ජනය පැය කිහිපයක් අතරතුරදී නිමාවිය.

2003 වසර තුළ පුද්ගලීකරණයට එරෙහිව පැවති කාර්මික ක්‍රියාමාර්ග ඉතා වැදගත් වේ.

අන්තර් සමාගම් සේවක සමිතිවල බලවත් සාමාජිකයෝ 80000 ක් රජය විදේශාධාර ලබාගනිතැයි බලාපොරොත්තු වූ ආර්ථික ප්‍රතිසංස්කරණය අවහිර කිරීමේ අරගලය දිගටම පවත්වාගෙන ගියහ. වෘත්තීය සමිති, කම්කරු වෙළඳපොළවල් විවෘත කිරීම හා රජයේ ආයතන පුද්ගලීකරණය කිරීම යන පියවර 2 ටම එරෙහි විය. ඒවා රැකියා කප්පාදු කිරීම සහ වෘත්තීය සමිති වල බලපෑම අඩු කිරීමට හේතු විය හැක.

රජයේ පාලනයට යටත් කර්මාන්ත පුද්ගලීකරණයට විරුද්ධ වූ අනෙකුත් සේවකයින් අතර දුම්රිය සේවකයෝද වූහ.

ජූලි මස 24 වන දින රත්මලාන දුම්රිය වැඩපළෙහි (බස්නාහිර පළාත) සේවකයෝ සිය ගණනක් සිය උපකරණ බිම තැබූහ. එසේම ජූලි 30 වන දින දුම්රිය සේවකයෝ 5000 ක් පමණ දුම්රිය ප්‍රධාන කාර්යාලය පිටත පිකටින් ව්‍යාපාරයක නිරත වූහ. ජූලි 31 වෘත්තීය සමිති නායකයෝ ප්‍රවාහන අමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡාවට පසුව ජාතික මට්ටමේ වැඩ වර්ජනයක් ප්‍රකාශයට පත් කළහ.

ජූලි මස ගැසට් නිවේදනයක් මගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යයන් අලුතින් පිහිට වූ ශ්‍රී ලංකා දුම්රිය අධිකාරියට පැවරීම දුම්රිය පද්ධතිය පුද්ගලීකරණය කිරීමේ පියවරක් යැයි දුම්රිය සේවකයෝ බියවූහ. තවදුරටත් ඔක්තෝබර් මස දළ වශයෙන් 10000 පමණ එන්ජින් රියදුරන්, පාලකයින්, නියාමකවරුන් සහ ස්ථානාධිපතිවරුන් ඇතුළත් දුම්රිය සේවකයින් විසින් වෘත්තීය සමිති අයිතිවාසිකම් සහ රැකියා සුරක්ෂිතභාවය වෙනුවෙන් දින 2 ක වැඩ වර්ජනයක් ආරම්භ කරන ලදී. සේවකයින්, රජයේ සේවකයින්ට සාපේක්ෂව 75% ක ප්‍රතිශතයක වැටුප් වැඩිවීමක් සහ වරප්‍රසාද පිළිබඳව විමසීය. වෘත්තීය සමිති 60 කින් යුත් ඒකාබද්ධ දුම්රිය සංවිධානය ප්‍රවාහන අමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡාව ආරවුල විසඳීමට අසමත් වූ බැවින් වැඩ වර්ජනයක් සංවිධානය කළහ. වෘත්තීය සමිති ප්‍රකාශ කර සිටියේ වැඩ වර්ජන පවත්වනුයේ නව දුම්රිය අධිකාරිය පිහිටුවීමත් සමඟ වැඩි වූ රැකියා අවිනිශ්චිතතාව නිසා රැකියා සුරක්ෂිතතාවයක් ඇති කිරීම වෙනුවෙන් බවයි.

වාර්තා වන අන්දමට 1993 දී පැවති දුම්රිය රැකියා 25,000 න්, 2003 වන විට 17,000 දක්වා කප්පාදු කර තිබේ. සේවකයින් විශ්වාස කරනුයේ මෙම කප්පාදුව දුම්රිය පුද්ගලීකරණය තහවුරු කරන බවයි.

2003 දෙසැම්බර් 11 වන දින ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සේවකයින් පැය 14 ක ජාතික වැඩ වර්ජනයක් පැවැත්වීය. ඔවුන්ගේ ඉල්ලීම වූයේ වැටුප් වැඩි කරන ලෙස හා පාරිභෝගිකයින්ගේ වියදම ඉහළ දමන හා බිය ඇති කරන ජල සම්පාදන පද්ධතිය පුද්ගලීකරණය කිරීමේ රජයේ ප්‍රතිපත්තියට විරෝධය දක්වීමයි. 6000 කට වැඩි සේවක පිරිසක් මෙම ක්‍රියාමාර්ගයට සම්බන්ධ විය. එම සේවකයෝ නැවතත් එම ප්‍රශ්නය මත ඔක්තෝබර් මාසයේ දී වැඩ නැවැත්වූහ. නැවතත් දෙසැම්බර් 17 වන දින රු. 4000ක (ඇමරිකානු ඩොලර් 41) අවම වැටුපක් හා හිඟ වැටුප් ගෙවීම් ඉල්ලා පැය 4 ක වැඩ වර්ජනයක් සංවිධානය කළහ. මේ අතර මාර්තු මාසයේදී බැංකු, රෝහල්, දුම්රිය, රජයේ මුද්‍රණ, වරාය සහ නගර සභා සේවකයින් ඇතුළත්ව දහසකට වැඩි රජයේ සේවකයෝ පුද්ගලීකරණයට විරුද්ධතාව දක්වීම, විශ්‍රාම ක්‍රමය සහ කම්කරු ආරක්ෂක නීති වෙනස් කිරීම යන ඉල්ලීම් මත වැඩ වර්ජනය කළහ. මෙය වැටුප් වැඩිවීමක් ලබා ගැනීමට, රජයේ වෘත්තීය සමිති 52 කින් සමන්විත රාජ්‍ය සේවා කමිටුව සහ වෘත්තීය සමිති හා රාජ්‍ය නොවන සංවිධානවල එකතුවක් වන ජාතික සම්පත් හා මානව අයිතිවාසිකම් සුරකීමේ පෙරමුණ ඒකාබද්ධව සංවිධානය කරන ලදී. පුද්ගලික අංශයේ සේවකයෝ ද සිය ගණනක් උද්ධමනයට පිළියම් වශයෙන් වැටුප් වැඩිවීමක් ඉල්ලා මෙම වැඩ වර්ජනයට සම්බන්ධ වූහ.

තවදුරටත් මාර්තු මස, ලංකා විදුලිබල මණ්ඩලයේ සිවිල්, විදුලි හා කාර්මික අධිකාරිවරු, අයපත් සේවකයින් සහ ඉංජිනේරුවරුන්ගේ සහයෝගය ඇතිව කාර්මික කාර්යාල සේවක මණ්ඩලය, විදුලිබල මණ්ඩලයේ රැකියා හා වැඩ කිරීමේ කොන්දේසි වලට බරපතල ප්‍රහාරයක් සිදු කරතැයි බියෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේ පනත් කෙටුම්පත අස්කර ගැනීමට ඉල්ලා වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් සංවිධානය කළහ.

පසුව අප්‍රේල් සහ දෙසැම්බර් ආදායම් දෙපාර්තමේන්තුවේ සේවකයෝ, ශ්‍රී ලංකා රේගුව හා බදු දෙපාර්තමේන්තුව දෙපාර්තමේන්තු 3 ක් සම්බන්ධ කරමින් නව ආදායම් අධිකාරියක් පිහිටුවීමට ඉඩ තිබූ රජයේ යෝජිත ආදායම් පනතට එරෙහිව ලෙඩ නිවාඩු ව්‍යාපාරයක් මත වැඩ කිරීම නැවැත්වූහ.

තැපැල් සේවය සුරැකීමේ වෘත්තීය සමිති පෙරමුණට අයත් තැපැල් සේවකයින්, තැපැල් සේවය පුද්ගලීකරණය නොකරන බවට සහතිකයක් ඉල්ලා කම්කරු අරගලයක් සංවිධානය කළහ. ඔවුන්ටත්, වැඩිදියුණු කළ කාර්ය වාතාවරණයක්, ජීවන වියදම් දීමනාවේ වැඩි කිරීමක්, නියමිත වේලාවට කාර්යාල පුරප්පාඩු පිරවීම සහ රැකියා උසස්වීම් වැඩි කිරීම අවශ්‍ය විය.

2003 වර්ෂය ඇතුළත, වෘත්තීය සමිති කම්කරු නීති සහ යෝජිත පනත් වලට ගෙන ආ සේවක අයිතිවාසිකම් අඩු කිරීමට ඉඩ ඇති සංශෝධන වලට එරෙහිව විවිධ ක්‍රියාමාර්ග සංවිධානය කළහ. ඒවායින් කැපී පෙනෙන ඒවා වන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ තාක්ෂණික සේවකයින්, ආදායම් දෙපාර්තමේන්තුවේ සේවකයින්, ලංකා රේගු හා බදු දෙපාර්තමේන්තු සහ ලංකා වෘත්තීය සමිති කොංග්‍රසය සංවිධානය කළ ක්‍රියා මාර්ගයි.

වෘත්තීය සමිති කර්මාන්ත ශාලා වසා දැමීම, රැකියා සුරක්ෂිතතාව සහ යහපත් රැකියා වාතාවරණය වැනි හේතු සඳහාද වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගත්හ. 2002 ජනවාරි සිට වසා තිබුණු කර්මාන්තශාලා වලින් පහකළ සේවකයින් සිය ගණනක් 2003 ජූලි මස ආයෝජන මණ්ඩලයේ කාර්යාලය ඉදිරිපිට පිකටින් ව්‍යාපාරයක් දියත් කළේ රැකියා ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලමිනි. අන්තර් සේවක සමිතියේ ප්‍රකාශයකට අනුව 2002 ජනවාරි සිට ගතවූ මාස 18 තුළ කර්මාන්තශාලා 50 ක් වසා දමා ඇති අතර සේවකයෝ 22,534 ක් රැකියා වලින් පහකර ඇත. දෙසැම්බර් මස රෙකිට් බෙන්කිසර් (ලංකා) සමාගම එහි හදිසි වසා දැමීමට විරෝධය පාමින් එහි සේවකයෝ 150 ක් පමණ කර්මාන්තශාලාව පිටතදී විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූහ. ලංකා වෙළඳ කර්මාන්ත හා සාමාන්‍ය සේවක සමිතිය ඔවුන් සමඟ තිබූ සාමූහික ගිවිසුම උල්ලංඝනය කිරීම පිළිබඳව රෙකිට් බෙන්කිසර් (ලංකා) සමාගම මත වරද පැවරූහ.

නොවැම්බර් මස, ලංකාවේ තාක්ෂණික විද්‍යාලවල ගුරුවරුන් විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කළේ වසරකට සති 36 ක් පැවති කාර්යය සටහන් සති 48 දක්වා දීර්ඝ කිරීමට එරෙහිවය. ඔවුහු තවදුරටත් මාරු වීම් සඳහා ඇති උපදෙස් මාලාව සංශෝධනය කිරීම, තාක්ෂණික අධ්‍යාපන නිලධාරීන්ට ඇති පුරප්පාඩු පිරවීම සහ නියමාකාර ශිෂ්‍යත්ව ක්‍රමයක් පිහිටුවීම යන ඉල්ලීම් ඉදිරිපත් කළහ.

මෙම දේශීය ගැටලු වලට එරෙහි විරෝධතා වලට අමතරව ලාංකික කම්කරුවන් අන්තර්ජාතික මතවලට එරෙහිවද විරෝධතා දක්වූහ. ශ්‍රී ලාංකික සේවකයෝ ඉරාකයට එරෙහිව යුද්ධ කිරීමේ ඇමරිකානු සැලසුම් වලට එරෙහිව පැය 2 ක පිකටින් ව්‍යාපාරයක් කොළඹදී පැවැත්වූහ. විරෝධතා සංවිධානය කරනු ලැබුවේ ස්වාධීන වෘත්තීය සමිති, රාජ්‍ය නොවන සංවිධාන සහ විරෝධතා කණ්ඩායම් ඒකාබද්ධ වී සැදුම්ලත් ජාතික සම්පත් සහ මානව අයිතිවාසිකම් සුරැකීමේ පෙරමුණ මගිනි. සෑම අංශයක්ම නියෝජනය කරමින් විවිධාකාර වෘත්තීය සමිති වලට අයත් සේවකයෝ සිය ගණනක් මෙයට සහභාගී වූහ. 2003 වසර තුළදී වැවිලි ක්ෂේත්‍රයද ඔවුන්ගේ සාමාජිකයින්ගේ අයිතිවාසිකම් වැඩිදියුණු කිරිම සහ ආරක්ෂා කිරීම සඳහා වෘත්තීය සමිති ක්‍රියාමාර්ග දියත් කරනු ලැබූහ. පෙබරවාරි මාසයේදී හැටන් හි වතුයායක සියයකට වැඩි සේවකයෝ ප්‍රමාණයක් නීතියේ ඉල්ලීම පරිදි තම වැටුපෙන් මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදල සඳහා පරිපාලනය සිදු කරන තැන්පතු අඩු කිරීම ඉල්ලා වැඩ වර්ජනයක් කරා ගියහ. මුදල් අඩු කරනු ලැබ තිබුණ ද වසර 15 ක් පුරා කිසිදු අරමුදලක් තැන්පත් කර නොතිබුණි. නොවැම්බර් මස කම්කරු ජාතික කොංග්‍රසය, එක්සත් වැවිලි සේවක සමිතිය සහ එක්සත් ලංකා ප්‍රජාතාන්ත්‍රික පෙරමුණ ඇතුළත් විවිධ වැවිලි සේවක සංගම්, පුද්ගලික අංශය සඳහා වැටුප් වැඩි කිරීමට වෙනම කමිටුවක් පත්කරන ලෙස රජයට බලකර සිටියහ. වෘත්තීය සමිතිවල පුද්ගලයන් පෙන්වා දෙනු ලබන්නේ පුද්ගලික අංශයේ 80 ට වැඩි සේවක ප්‍රතිශතයක් සඳහා රජයේ අනුමත වැටුප් සහ දීමනා[17] ප්‍රතික්ෂේප වී ඇති බවයි.

## 4.2 ජාතික වෘත්තීය සමිති සම්මේලනය සහ සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති පෙරමුණු පිහිටුවීම.

ජාතික වෘත්තීය සමිති පදනම පිහිටවනු ලැබුවේ 2003 අග භාගයේදීය. එය ප්‍රධාන වෘත්තීය සමිති 5 කින් යුක්තය. ඒවා නම්: ලංකා ජාතික වැවිලි සේවක සංගමය, ජාතික සේවක සංගමය, ජාතික වතු සේවක සංගමය, ජාතික ගුරු සේවක සංගමය, මහජන සේවා ජාතික වෘත්තීය සමිති පදනමයි. ජාතික වෘත්තීය සමිති සංවිධානයේ සාමාජිකත්වය වැවිලි, රජයේ සහ පුද්ගලික අංශ සහ රජයේ ආයතන වල සේවකයින්ගෙන් සමන්විතය.

17. 2003 නොවැම්බර් මස 03 වන සඳුද දින, Colombo Page News Desk, Sri Lanka.

ඒ හා සමානව සෞඛ්‍ය අංශයේ ඇති රාජ්‍ය අංශයේ වෘත්තීය සමිති 52 ක්ද, එකට ඒකාබද්ධව සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති සංවිධානය නමින් නව සංවිධානයක් නිර්මාණය කළහ. මේ දෙකම ශ්‍රී ලංකා වෘත්තීය සමිතිවල ප්‍රථම පියවර වන එක්සත් වීම හා එක්ව වැඩ කිරීම දක්වයි. මේ වන විට කම්කරු ක්‍රියාකාරකම් ආර්ථික, දේශපාලන, පුද්ගල සහ ප්‍රාදේශීය වශයෙන් බෙදී බරපතල ලෙස කැඩීගොස් ඇත.

## 5. කම්කරු නීතිය සඳහා සංශෝධන

2003 වසර තුළදී කම්කරු නීතියෙහි විවිධ ව්‍යවස්ථාපිත විධිවිධාන සංශෝධනය කිරීමට කෙටුම්පත් කිහිපයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණි. 2003 අංක 11 දරණ කාර්මික ආරවුල් සංශෝධන පනත, රැකියා අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) සංශෝධන පනත, 2003 අංක 13 දරණ කාර්මික ආරවුල් (ඇසීමේ හා තීරණය කිරීමේ ක්‍රියාපටිපාටිය) විශේෂ විධිවිධාන පනත, යන පනත් 2003[18] වසරේදී අනුමත විය. මෙම කෙටුම්පත් වලින් සමහරක් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයෙහි නිර්දේශ පිළිබිඹු කරන අතර පැහැදිලිවම සේවක අයිතිවාසිකම් සහ රැකියා සුරක්ෂිතභාවය සෝදාපාළුවන ආකාරයේ වෙනස්කම් ඇති කිරීමට උත්සාහ කරන ලදී. වෘත්තීය සමිති, ඔවුනට මෙම යෝජිත ව්‍යවස්ථාමය වෙනස්කම් අධ්‍යනය කිරීමට සහ ඒවාට පිළිතුරු සැපයීමට ප්‍රමාණවත් කාලයක් නොදුන් බවට පැමිණිලි කළේ නියමාකාර විවාදයකින් හෝ සාකච්ඡාවකින් තොරව එය ක්‍රියාවට නැංවීමට යන බව සහතික කරමිනි. වෘත්තීය සමිති නියෝජිතයින් ඔවුන්ට ජාතික කම්කරු උපදේශක කවුන්සලයෙන්[19] ඉවත් වීමට සිදුවෙතැයි ප්‍රකාශ කර සිටියේ කවුන්සලයේ උපදෙස් ලබා නොගෙන අසත්‍ය ව්‍යවස්ථා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව රජයට චෝදනා කරමිනි.

2002 වසරේ අගෝස්තු මාසයේ සිට සමහරක් වෘත්තීය සමිති ජාතික කම්කරු උපදේශක සභාවේ රැස්වීම් වර්ජනය කළේ සේවකයින්ට[20] වඩා සේව්‍යයන් වාසි ලබන ආකාරය රජය විසින් ව්‍යවස්ථා හරහා ඉදිරිපත් කළ

18. 2003 මැයි 14 වන දින අංක. 1288/14 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය.

19. ශ්‍රී ලංකා රජයේ ප්‍රධානත්වයෙන් හාම්පුතුන් සේවකයන් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ කම්කරු කටයුතු පිළිබඳ උපදේශක සභාව.

20. "ශ්‍රී ලංකාවේ 'කම්කරු ප්‍රතිසංස්කරණය' සේවක හිංසනය", අන්තර් මුද්‍රණ සේවය, 2003 පෙබරවාරි 14.

විටය. කම්කරු නීති විශේෂඥයින් සහ වෘත්තීය සමිති පහකින් පෙන්වා දෙන්නේ රැකියා අවසන් කිරීමේ පනත යටතේ රැකියා අවසන් කිරීම සහ රැකියා විරහිතයන්ට වාසි ලබාදෙන වැඩපිළිවෙළ යටතේ හඳුන්වාදුන් ව්‍යවස්ථාමය වන්දිය සේවකයන්ට අවාසිදායක බවයි.

2003 මාර්තු මස කැබිනට් මණ්ඩලය අංක 12/2003 රැකියා අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) සංශෝධන පනත සහ 2003 අංක 11 දරණ කාර්මික ආරවුල් සංශෝධන පනත යටතේ රැකියා විරහිතයින්ට වාසි ලබාදෙන රක්ෂිත ක්‍රමයක් අනුමත කළහ. වෘත්තීය සමිති නිලධාරීන් පෙන්වා දෙන්නේ පුද්ගලික අංශයේ පුද්ගලයන්ගේ රැකියා මිලියන 6.2ට වැඩි ප්‍රමාණයක් රජය විසින් 2003 දෙසැම්බර් 31 ගැසට් පත්‍රය[21] මගින් හඳුන්වාදුන් නව වන්දි සූත්‍රය ඉවත් නොකළහොත් අනතුරට පත්වන බවයි. ගැසට් නිවේදනයට පෙරාතුව සේවකයින් සඳහා ආරක්ෂතා ජාලයක් හඳුන්වා දීමට නියමිතව තිබුණද එය ක්‍රියාත්මක නොවිණ. මෙම ගැසට් නිවේදනයත් සමඟම කම්කරු කොමසාරිස් ගේ තීරණය මත සේවකයෙකුගේ රැකියාව අවසන් කිරීමට සමාගමට හැකියාව ලැබේ.

රජය වන්දි සූත්‍රය ක්‍රියාත්මක කිරීමට හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වෙනුවෙන් එහි කැපවීමෙහි අංශයක් ලෙස කාලය ගතවන ආරවුල් විසඳීමේ ක්‍රියාදාමය පුනරීක්ෂණය කිරීමේ පීඩනයට යටත්ව සිටී.

## 6. නිගමනය

2003 වසරේදී නිදහස් වෙළඳ කලාපය තුළ සංගමයේ නිදහස පිළිබඳ යහපත් වෙනස්වීම් යම් ප්‍රමාණයක් දක්නට ලැබිණ. ජැකලංකා හා පොලිටෙක්ස් නඩුවල ප්‍රතිඵල පිළිගන්නා අතරම නිදහස් වෙළඳ කලාපය තුළ ඇති වෘත්තීය සමිති පිළිගන්නා බව සහ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම රජයේ සහ සේව්‍යයන්ගේ බාහිර බලපෑම් වලින් තොරව නිදහස්ව සිදුකළ හැකි බව තීරණය කිරීම අනුවණ කමකි. MFA හි අවසානයත් සමඟම ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රය 2005 න් කෙළවර වන අතර එවිට එයට අනෙකුත් දියුණු වෙමින් පවතින රටවල් සමඟ දැඩි තරඟයකට මුහුණ පෑමට සිදුවනු ඇත. මේ සඳහා ගතයුතු එක් උපාය මාර්ගයක් වන්නේ,

21. 2004 ජනවාරි 05 ඩේලි නිව්ස්, 'කම්කරුවන් මිලියන 6 කට වඩා තර්ජනයට ලක් කරන ලද වෘත්තීන්' - ඉන්දීවර තිලකරත්න.

ගනුදෙනුකරුවන් සහ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට නිෂ්පාදකවරු දිරිමත් කරනු වස් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම කම්කරු ප්‍රමිතීන් අන්තර්ගත සාමාජීය වශයෙන් වගකිව යුතු චාරිත්‍ර ස්ථිර කිරීම මගිනි. මෙම ප්‍රමිතීන් හා ගැලපෙන බව තහවුරු කිරීම සඳහා සහ අනුමැතිය හා ක්‍රියාවට නැංවීම මත පදනම් වූ ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය ප්‍රවේශය ආරක්ෂා කිරීමට උපකාර කිරීමට සංක්ෂිප්ත ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට රජයට හැකියාවක් ඇත.

ජාත්‍යන්තර මූල්‍ය ආයතනයේ නිර්දේශය පිළිබිඹු කරන මෑත කාලීන නීති ප්‍රතිසංස්කරණ, සේවක අයිතිවාසිකම් හා රැකියා සුරක්ෂිතභාවය දුරු කරන සාධක වෙනස් කිරීමට පැහැදිලිව උත්සාහ කරයි.

නීති විශාරදයින් පෙන්වා දෙන්නේ මෙම ව්‍යවස්ථාමය ප්‍රවණතාවය පිළිබිඹු කරනුයේ ස්වේච්ඡාමය නොවන හා මහා පරිමාණ සේවා අවසන් කිරීම් වලට එරෙහි ආරක්ෂතා පියවර සුළු ගණන, වෘත්තීය සමිති යෝජනා කරන පරිදි පූර්ව ක්‍රියාත්මක වන කිසිදු ආකාරයක ආරක්ෂතා දලකින් තොරව නැති කිරීමේ බලාපොරොත්තුවයි. මෙම වර්ධනය සිදුවී ඇත්තේ, වෙළඳ සහ ආරක්ෂණ ප්‍රතිපත්තීන් ලිබරල්වාදී වීම මගින් වෙළඳපොළ බලාධිකාරයට සහ බාහිර බලවේග වලට ලක්වී රැකියා අසරණභාවයට පත් වීම ක්‍රමයෙන් වැඩිවන අවධියකදීය.

ශ්‍රී ලංකාව තුළ සේවකයින් හා පරිපාලනය දෙපාර්ශවයේ යුතුකම් හා වගකීම් පිළිබඳ කාර්යක්ෂම ලෙස තොරතුරු හුවමාරු කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවධානය අඩු බව පැහැදිලිය. මේ හේතුවෙන් කම්කරු පරිපාලන සබඳතා කෙළවර වන්නේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්ති 8 ම ශ්‍රී ලංකාව ස්ථිර කර තිබුණ ද මෙම ප්‍රමිතීන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී තවමත් බරපතල ගැටලු පවතී. ඒවා කාර්යක්ෂම ලෙස බලාත්මක කළහොත් ශ්‍රී ලාංකික සේවකයන් හඬ නැංවූ ප්‍රධාන මත බොහොමයක් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම කම්කරු අයිතිවාසිකම් මූල ධර්ම මගින් පැවසෙනු ඇති අතර එය තිරසාර ආර්ථික වර්ධනයකටද දායක වනු ඇත. එමනිසා මෙම මූල ධර්ම ක්‍රියාවට නැංවීම හා බලාත්මකවීම ඉහළ ප්‍රමුඛත්වයක් බවට පත් විය යුතුය.

# ඇමුණුම - 1

ශ්‍රී ලංකාව විසින් 1998 මූලික මූල ධර්ම සහ සේවා ස්ථානයන්හි අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි පිළිබිඹු වන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලික සම්මුති අටම අපරානුමත කර ඇත.

- 1930, අංක 29 දරණ බලහත්කාර කම්කරු සේවය පිළිබඳ සම්මුතිය (අපරානුමත කළ දිනය : 1950, අප්‍රේල් 05)
- 1948, අංක 87 දරණ සමාගමයේ නිදහස සහ සංවිධානය වීමේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය (අපරානුමත කළ දිනය : 1995, සැප්තැම්බර් 15)
- 1949, අංක 98 දරණ සංවිධානය වීමේ සහ සාමූහික කේවල් කිරීම පිළිබඳ සම්මුතිය (අපරානුමත කළ දිනය : 1972, දෙසැම්බර් 13)
- 1951, අංක 100 දරණ සමාන වැටුප් පිළිබඳ සම්මුතිය (අපරානුමත කළ දිනය : 1993, අප්‍රේල් 01)
- 1957, අංක 105 දරණ බලහත්කාර කම්කරු සේවය අහෝසි කිරීම පිළිබඳ සම්මුතිය (අපරානුමත කළ දිනය : 2003, ජනවාරි 07)
- 1958, අංක 111 දරණ වෙනස් කොට සැලකීම් පිළිබඳ සම්මුතිය (රැකියා සහ වෘත්තීමය) (අපරානුමත කළ දිනය : 1998, නොවැම්බර් 27)
- 1973, අංක 138 දරණ රැකියා සඳහා ප්‍රවේශයට ඇති අවම වයස පිළිබඳ සම්මුතිය (අපරානුමත කළ දිනය : 2000, පෙබරවාරි 11)
- 1999, අංක 182 දරණ ළමා කම්කරු සේවයේ දරුණුතම ආකාර පිළිබඳ සම්මුතිය (අපරානුමත කළ දිනය : 2001, මාර්තු 01)

V

# මානව හිමිකම් සඳහා වූ අධිකරණමය රැකවරණය

ආචාර්ය ජයන්ත ද අල්මේද ගුණරත්න*

## 1. හැඳින්වීම

මානව හිමිකම් එහි විවිධ ස්වරූපයන් හා මානයන් වලින් ජාත්‍යන්තර නියමයන් වල අන්තර්ගත කොට සංග්‍රහ කොට දක්වා ඇත. මෙහිලා ශ්‍රී ලංකාව විසින් අපරානුමත[1] කොට ඇති සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ සම්මුතියත්, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් පිළිබඳ සම්මුතියත් විශේෂ ස්ථානයක් ගනී. අනෙක් බොහොමයක් ජාත්‍යන්තර

* ජනාධිපති නීතිඥ, LL.B; M.A.(Int.Rel); LL.M; M.A.(Budd Studs); Ph.D. ශ්‍රී ලංකා නීති කොමිසමේ සාමාජික, නීතිය හා සමාජ භාරය - උපදේශක.

1. එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලයේ 1966.12.16 දින 2200A(xxi) ප්‍රඥප්තිය මගින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (ICCPR) අත්සන් කිරීමට, ස්ථිර කිරීමට විවෘත කරන ලදී. එම දිනයේදීම අත්සන් කිරීමට හා ස්ථිර කිරීමට ආර්ථික, සමාජීය හා සංස්කෘතිය (ICESCR) පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියද විවෘත කරන ලදී.

සම්මුතීන්, මෙම සම්මුතීන් දෙකෙහි අන්තර්ගත අයිතීන් වෙසෙසින් දක්වීමකි.[2]

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් හා නිදහස පරිච්ඡේදයේ මෙම අයිතීන්වල ගුණාත්මකභාවය[3] දක්වා ඇති අතර, බොහෝවිට මෙම අයිතීන්ගේ සීමාවන්[4] කවරේද යන්න නිරූපණය කිරීමේ කාර්යය පැවරී ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයටයි. මෙහිලා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ව්‍යවස්ථාමය බාධකයන්ට මුහුණ දීමට සිදු නොවුනද සමාජ, ආර්ථික අයිතිවාසිකම්වල වර්ධනයන් සිදුකොට ඇත්තේ 12 වන වගන්තිය: එනම්, සමානාත්මතා අයිතිය පිළිබඳ වගන්තිය පාදක කොට ගෙනය.

මෙම පරිච්ඡේදයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය 2003 වසරේ සිදුකරන ලද ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය හා සම්බන්ධ වැදගත් තීරණ කීපයක් පරීක්ෂණයට ලක් කරනු ලබයි. අධිකරණය මඟින් මෙසේ ලබාදුන් තීරණයන් වලින් ප්‍රතිසන්ධිය ලද නව මතයන් සහ එහි ධනාත්මක පස හුවා දක්වීමක් කරන අතර ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංකල්පය විහිදුවාලිය හැකි ප්‍රදේශයන් කවරේද යන්න සලකා බැලේ.

පරීක්ෂණයට ලක් කරන ලද මෙම තීරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් විෂයෙහි ලා අධිකරණමය ප්‍රතිචාරය සහ සමාජ, ආර්ථික අයිතිවාසිකම් ලෙස අතුරු කොටස් කොට දක්වා ඇත. ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ ඡන්දය දීමේ අයිතිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අදහස වෙන්ව පරීක්ෂාවට ලක් කොට ඇත.

---

2. උදාහරණ ලෙස, (ඉහත සඳහන් අංක 1 සඳහන්) එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මඟින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට විකල්ප කෙටුම්පතද අත්සන් කිරීමට හා ස්ථිර කිරීමට විවෘත විය. 1963 නොවැම්බර් මස 20 වන දින අංක 1904 (xviii) දරණ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල ප්‍රඥප්තියෙන් ප්‍රකාශිත සියලු ආකාරයේ වාර්ගික වෙනස්කම් තුරන් කිරීමේ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශය, 1967 නොවැම්බර් මස හත්වන දින අංක 2263 (xxii) දරණ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල ප්‍රඥප්තියෙන් ප්‍රකාශිත කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ ප්‍රකාශය.
3. 4 වන පරිච්ඡේදය
4. ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ 126 වගන්තිය ප්‍රකාරව.

## 2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් විෂයෙහි ලා අධිකරණමය ප්‍රතිචාරයන්

2003 වසරේදී මෙම විෂය මූලය සම්බන්ධ තීරණ කිහිපයක් එළි දක්වී ඇති අතර, ඉන් එක් තීරණයකදී "වධහිංසා සහ කෲර අමානුෂික සහ පහත්කොට සැලකීමේ ලා කරන ලද විශ්වාස කළ හැකි පැමිණිලි සංඛ්‍යාවේ අඩුවක් නොපෙන්වන"[5] බව දක්වා ඇත.

අමානුෂික පහරදීම් පිළිබඳ පැමිණිලි ද ගණනාවක් විය.[6] හමුදා රැඳවුම් කඳවුරකදී කම්කරුවෙකුට බැටන් පොලු සහ පොලු මගින් කරන ලද පහර දීමක්,[7] වෑන් රියක අත් උදව්කරුවකු ඇස් වසා පටියකින් බැඳ කරන ලද පහර දීමත්,[8] සිය රථයෙන් පිටතට ඇද නීතිඥයෙකුට කරන ලද පහර දීමත්,[9] උප සේවා උප පොලිස් පරීක්ෂකවරයෙකු, උප සේවා පොලිස් කොස්තාපල්වරයෙකුට කරන ලද පහර දීමත්,[10] වර්ජනයකට සහභාගී නොවූවත්, ඒ අසලක සිටි තවත් නීතිඥයෙකුට ආසන්නයේ සිට කරන ලද වෙඩි තැබීමත්,[11] හමුදාව හැරගිය බවට පැවසෙන අයෙකු පොලිස් අත්අඩංගුවේ දී මිය යාමට තරම් කරන ලද පහර දීමත් මෙහිලා ඇතුළත් වේ.[12] මෙවන් පහර දීම් සිදුකරන ලද අවස්ථාවන් බොහොමයක් පරීක්ෂා කිරීමේදී පැහැදිලි වූයේ ඒවා බොහෝ විට මූලික අයිතිවාසිකම් රැක ගැනීමට අපේක්ෂිත පුද්ගලයන් වන පොලිස් නිලධාරීන් හෝ රාජකාරි

---

5. *සංජීව එදිරිව වත්තල ස්ථානභාර නිලධාරී සුරවීර සහ තවත් අය* - එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමන් 2003.04.04 ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) අංක. 328/2002.
6. ඉහළ, කෝකියාට පහර දීම.
7. *කෝනේසලිංගම් එදිරිව මේජර් මුතාලිෆ් සහ තවත් අය.* 2003.02.10 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 555/2001.
8. *ශන්මුගරාජා එදිරිව වවුනියාව උප පොලිස් පරීක්ෂක දිල්රුක්* 2003.02.10 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 47/2002.
9. *අධිකාරි සහ අධිකාරි එදිරිව අමරසිංහ සහ තවත් අය.* 2003.02.14 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C.(FR) අංක 251/2002.
10. *ඒකානායක එදිරිව වීරවසම්* 2003.03.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 34/2002.
11. *සුජීව අර්ජුන සේනසිංහ එදිරිව කරුණාතිලක සහ තවත් අය* 2003.03.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 431/2000.
12. *ශ්‍රියානි සිල්වා එදිරිව පයාගල ස්ථානාධිපති* 2003.08.08 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 471/2000.

කටයුතුවල යෙදවූවන් කරන ලද ඒවා වීමයි. දහතුන් හැවිරිදි දරුවකු පවා මෙවන් පහරදීම් වලට බඳුන්ව ඇත.[13]

එවන් තත්ත්වයක් තුළ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ 79 වන සැසියේ අංක 2156 හා 2157 රැස්වීම් වලදී පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කර තිබීම පුදුමයට කරුණක් නොවේ.

> *"නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ හමුදා අංශවල සාමාජිකයන් සිදුකරන... දිගින් දිගටම ලැබෙමින් පවතින වධහිංසා සහ කෲර, අමානුෂික හෝ පහත්කොට සැලකීම් සම්බන්ධ පැමිණිලි පිළිබඳ අවධානය තවදුරටත් පවතී."*[14]

පහත දක්වෙන ඡේදයන්හි දී, ශ්‍රේෂ්ඨාධිකරණය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය විෂය මූලව කරන ලද තීරණ කීපයක්, 2003 වසරේද අධිකරණය කරන ලද කරුණු දක්වීම් හා අවතීර්ණ වීම් පිළිබඳ අවබෝධ වන අන්දමෙන් පරීක්ෂා කර බැලීමක් සිදු කරනු ලබයි.

## *ලියානි සිල්වා එදිරිව පයාගල පොලිස් ස්ථානාධිපති*[15]

මෙම නඩුකරයේ කරුණු අනුව, හමුදාව හැරගියැයි සලකා අත්අඩංගුවට ගත්තෙකු අත්අඩංගුවේ සිටියදී මිය ගියේ ය. මියගිය අයගේ වැන්දඹුව පැමිණිල්ලක් ගොනුකරමින් කියා සිටියේ රඳවා තබා ගන්නා ලද දීර්ඝ කාලය තුළ සිදුකරන ලද වධහිංසා වල ප්‍රතිඵලයක් ලෙස ඔහු මියගිය බවයි. තවද මේ හේතුව නිසා මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පැමිණිල්ලක් ගොනු කිරීමේ හැකියාවද ඇහිරී ගිය බව ප්‍රකාශ කළාය. මිය ගිය පුද්ගලයාගේ අකල් මරණය නිසා නොවන්නට ඔහුට ලැබීමට තිබූ වන්දිය ඇයටත් ඇගේ බාලවයස්කාර දරුවාටත් ලබාදෙන ලෙස මෙම පැමිණිල්ලෙන් ඇය ඉල්ලා සිටියාය.

පැමිණිලි පාර්ශවයෙන් ඉදිරිපත් කරන ලද එම සිද්ධිමය කරුණු පිළිබඳ පැහැදිලි කිරීම පිළිගත් අධිකරණය රජයටත් වගඋත්තරකාර පොලිස්

---

13. *හරින්ද්‍ර ශෂික කුමාර එදිරිව උප පොලිස්පති ද ෆොන්සේකා සහ තවත් අය* 2003.03.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 462/2001.
14. 2003.11.06 දින පැවැත්වූ මානව හිමිකම් කමිටු 2164 වන රැස්වීමේ අවසාන නිරීක්ෂණ (CCPR/C/SR, 2164).
15. *ඉහත*, 12 සටහන.

නිලධාරියාට පෞද්ගලිකවත් පැමිණිලිකාරියට සහ ඇගේ බාලවයස්කාර දරුවාට වන්දි ප්‍රදානය කරන ලෙස තීරණය නිකුත් කළේය. මෙම නඩුකරයෙන් උද්ගත වූ කරුණු හා නීතිමය සිද්ධාන්ත පහතින් දක්වා ඇත.

<u>මූලික අයිතිවාසිකමක් ලෙස ජීවත්වීමේ අයිතිය ව්‍යංගාත්මකව ඇඟවෙන බව ප්‍රකාශ කිරීම.</u>

ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ ජීවත් වීමේ අයිතිය ප්‍රකාශිතව දක්වා ඇති වගන්තියක් නොමැත. කෙසේ වුවත්, 13(4) වගන්තියේ සඳහන් පරිදි - "නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස කිසිම තැනැත්තෙකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තෙකු බන්ධනාගාරගත කිරීම හෝ නොකළ යුත්තේය." මෙම වගන්තිය අර්ථ නිරූපණය කිරීමේදී, "මිනිසෙකුගේ ජීවත් වීමේ අයිතිය ව්‍යංගාත්මකව පිළිගැනෙන බව දක්වීම ජීවිතයේ ගුණාත්මකභාවය පිළිබඳ නොවුවත් 'පැවැත්ම' යන අදහස මත පදනම්ව හෝ ජීවත්වීමේ අයිතිය හඳුනා ගැනීමත් එය අහිමි කළ හැක්කේ අධිකරණමය නියෝගයකින් පමණක් බවත් පිළිගැනීම සිදු කර ඇත."[16]

<u>මියගිය වූවකුගේ ජීවත් වීමේ අයිතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමේ අයිතිය පිළිගැනීම - නඩු පැවරීමේ හැකියාව ප්‍රසාරණය කිරීම.</u>

ඉදිරිපත් වූ කරුණු මත මියගිය පුද්ගලයාගේ 11 වගන්තිය හා 13(2) වගන්තිය යටතේ වූ අයිතිවාසිකම් බරපතල අත්දමින් උල්ලංඝනය වීමක් සිදු වී ඇති බව අධිකරණය තීරණය කරන ලදී. ඔහුට අයිතිවාසිකම් ඇති පරිදි 126(2) වගන්ති ප්‍රකාරව තමාම හෝ නීතිඥයෙකු මාර්ගයෙන් නඩුවක් ගොනුකළ හැකි තාක් කාලයක් ඔහු ජීවතුන් අතර නොවූ බවද අධිකරණය වටහා ගන්නා ලදී.

126(2) වගන්තිය පටු ලෙස අර්ථ නිරූපණය කළේ නම් වරදකරුවන්ට එරෙහි වූ නඩු පැවරීමේ හැකියාව අන් කිසිවෙකුට නොලැබෙන බව, අධිකරණය නිරීක්ෂණය කළේය. එහි ප්‍රතිඵලය වනු ඇත්තේ 13(4) වගන්තිය උල්ලංඝනය කරමින් කළ මරණයට කිසිදු ප්‍රතික්‍රියාවක් නොවීමයි. එහිදී

16. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරු (තීරණයේ 8 වන පිටුවේදී යාපා හා ද සිල්වා විනිසුරුවන් එකඟව), එම.

ජීවත්වීමේ අයිතිය ව්‍යංගයක්ව මායාවක් බවට පත්වනු ඇත. දෙවනුව, පූර්ව උල්ලංඝනයන්ට පිළියම් ලෙස බන්ධනාගාරගත කිරීම් සිදු කරනු ලැබුවත්, බරපතල වරදක් වන මරණය සිදු කිරීමට කිසිදු දඬුවමක් නොකිරීමෙන් දඬුවම් විෂයෙහි ලා විෂමතා පැන නැගිය හැකිය. 126(2) වගන්තියේ සඳහන් පුද්ගලයා යන වචනයට පුළුල් අර්ථකථනයක් දී යමෙකුගේ උරුමකරුවන්, ඔහුගෙන් යැපෙන්නන් ආදීන් ද ඊට ඇතුළත් කිරීමෙන් නීත්‍යානුකූලව නඩු පැවරීමේ හැකියාව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් විෂයෙහිලා ප්‍රසාරණයකට ලක්කර ඇත.

<u>මූලික අයිතිවාසිකම් යන සංකල්පය: හා එම උල්ලංඝනයන්ට ව්‍යවස්ථානුකූලව ලබාදිය හැකි ප්‍රතිකර්මයන්ගේ ස්වභාවය - නව සම්බන්ධතාවයක් ඇති කිරීම</u>

126(2) වගන්තිය අනුව සාමාන්‍යයෙන් සිදුවන්නේ අයිතිවාසිකම් උල්ලංඝනයට ලක්වූ පුද්ගලයා හෝ නීතිඥයෙකුගේ මාර්ගයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කර සුදුසු ව්‍යවස්ථානුකූල ප්‍රතිකර්ම ලබා ගැනීමයි. එවන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ අයිතියද ස්වාධීන මූලික අයිතිවාසිකමක් බව හඳුනාගෙන ඇත.[17] එවන් පදනමක් තුළ ප්‍රනාන්දු විනිසුරු පහත ප්‍රශ්නය නඟයි.

> *"එවන් පැමිණිල්ලක් කිරීමේ සහ පවත්වාගෙන යාමේ හැකියාව සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකුට තාවකාලිකව බාධාවක් වේ නම් 17 වන වගන්තිය යටතේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වූ බවට පැමිණිලි කිරීමේ අයිතිය තිරනුමානවම හිමිවේ. ඔහු එවන් පැමිණිල්ලක් කිරීමෙන් වැළකීම සම්පූර්ණයෙන් සහ ස්ථිරව වැළකීමේ අරමුණින් මරා දමුවේ නම් අන් අයෙකුට පැමිණිල්ල ඉදිරිපත් කළ නොහැකිද?"*

මෙම පැනයට පිළිතුර ඔව් නම් ඉන් ගම්‍ය වන්නේ යමෙකුගේ ජීවත් වීමට ඇති මූලික අයිතිවාසිකම හුදෙක් මායාවක් බවයි. පිළිතුර නැත යන්න නම් ව්‍යවස්ථානුකූල ප්‍රතිකර්මයන් වෙනත් පුද්ගලයෙකුගේ අතට පත් කිරීම අනිවාර්යයෙන් සිදු වේ. අයිතිවාසිකම් හි සීමා තදින් අර්ථ නිරූපණය නොකිරීමට කරන ලද තීරණය තුළින් සහ වඩා පුළුල් අර්ථකථනයක් ව්‍යවස්ථාමය ප්‍රතිකර්ම යන්නට යොදා ගැනීම තුළින් ව්‍යවස්ථාවේ 4(ඇ)

17. පෝරගේ ලක්ෂ්මන් එදිරිව ප්‍රනාන්දු 95.09.29 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 24/90 තීන්දුවේ 9 වන පිටුව.

වගන්තියේ පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේය; ආරක්ෂා කරනු ලැබිය යුත්තේය; වර්ධනය කරනු ලැබිය යුත්තේය.

<u>ජාත්‍යන්තර සම්මුතීන් හා අනුගතව අධිකරණමය අර්ථ නිරූපණ සිදු කිරීම.</u>

වධහිංසා සහ වෙනත් කෲර, අමානුෂික හෝ පහත්කොට සැලකීම් හෝ දඬුවම් වලට එරෙහි සම්මුතියේ 14(1) වගන්තියට අනුව,

> *"සියලු රාජ්‍යයන් ස්වකීය නීති පද්ධතිය තුළ වධහිංසා වලට ගොදුරුවන්නන්හට පිළියම් ලබාගත හැකි සහ සාධාරණ සහ ප්‍රමාණවත් වන්දි ලබාගත හැකි යාන්ත්‍රණයක්ද, ප්‍රතිශෝධනය කිරීමේ උපරිම උත්සාහයක් ද තහවුරු කළ යුතුය. වධහිංසාවනට ලක් වීමේ ප්‍රතිඵලයක් ලෙස මියගිය අයෙකුගේ යැපෙන්නන් මෙම වන්දි සඳහා හිමිකම් ලබයි."*[18]

මියගිය අයගේ වැන්දඹුව හා බාලවයස් දරුවා ලෙස නඩු පැවරීමටත්, වන්දි ලබා ගැනීමටත් පැමිණිලිකරුට හැකියාව ඇති බව පිළිගැනීම තුළින් අධිකරණය ඔවුන්ගේම වචනයෙන් පවසන පරිදි "රටේ නීතිය ජාත්‍යන්තර යුතුකම් හා ප්‍රමිතීන්ට අනුගත කර ඇත."[19]

<u>වරදකරුවන්ගේ වගකීම්වල ස්වභාවය - පෞද්ගලික සහ ප්‍රතිපුරුෂ වගකීම - සාවද්‍ය පැහැර හැරීම පිළිබඳ සංකල්පය</u>

මියගිය පුද්ගලයා අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරියා සෘජුවම නීති විරෝධී අත්අඩංගුවට ගැනීමකට වරදකරු විය. (ප්‍රථම අත්අඩංගුවට නොවූව ද) මෙහිලා 11 වන වගන්තිය යටතේ නඩුවේ පැවැත්මට අවස්ථාව සැලසිණි. අනෙක් අතට ස්ථානාධිපතිවරයා ස්වකීය රාජකාරි නිසිලෙස නොකිරීමෙන් අත්අඩංගුවේ පසුවන්නාට නීති ප්‍රකාරව මානුෂිකව සැලකීමට අවශ්‍ය පියවරයන් නොගැනීමත් නිසා සාවද්‍ය වරදට ලක්විය. තමා යටතේ සේවය කරන්නන්ගේ ක්‍රියාකාරීත්වයන් අධීක්ෂණයද ඔහුගේ රාජකාරියට ඇතුළත් බව ප්‍රකාශ කෙරිණි. අධිකරණය පැවසූ පරිදි,

---

18. 1984 දෙසැම්බර් 10 වන දින, අංක 39/46 දරණ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල ප්‍රඥප්තිය මඟින් අත්සන් කිරීමට හා ස්ථිර කිරීමට විවර විය.
19. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරු තීරණයේ 10 වන පිට, ඉහත.

*"එවන් නිසි ක්‍රියාමාර්ගයක් තුළ තව දුරටත් වධහිංසාවට ලක්වීම වැළකීමටත්, විමර්ශනය වේගවත් කිරීමටත්, පැමිණිලිකරුට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීමටත් හැකියාව තිබිණි. (පළවන වග උත්තරකරු)... මෙසේ හෙයින් කවර තත්ත්වයක වුවද පළමු වග උත්තරකරු සාවද්‍ය පැහැර හැරීමට වරදකරු වේ."* [20]

<u>යම් පුද්ගලයෙකුගේ ජීවිතයට ඇති අයිතිය හා ප්‍රකාශිත අපරාධ වාර්තාවට ඇති අදාළත්වය</u>

එන්දි ගෙවන්තෝ නම් මියගිය පුද්ගලයාගේ "අපරාධ වාර්තා" සැලකීමට ගෙන එන්දිය අඩු කරන ලෙස වග උත්තරකරුගේ නීතිඥයා ප්‍රකාශ කරන ලදී. මෙහිදී අපරාධයට ලක්වූ පුද්ගලයා නිරවද්‍ය බවට තීරණය කළ එහෙත්, පොලිසිය මෙම අත්තමිත්ම ක්‍රියාකළ නඩුකරයකින්[21] මෙම නඩුව වෙනස්කොට දක්වීමට උගත් නීතිඥතැන උත්සාහ දරිය. මෙම ප්‍රකාශය කරුණු දෙකක් හේතුවෙන් අදාළ නොවන බව අධිකරණය තීරණය කළේය. ප්‍රථමයෙන්,

*"අධිකාරිය ලත් අධිකරණයක් මගින් සාධාරණ නඩුකරයකින් මරණයට පත්වූ පුද්ගලයාට විරුද්ධව ඇති පැමිණිලි පිළිබඳ තීරණයක් ගත යුතුව තිබිණි. එතෙක් මියගිය අය නිදෙස් බව පූර්වානුමිතියට හිමිකම් ලබයි."*

දෙවනුව,

*"මෙම පුද්ගලයාට ඔහුගේ ජීවිතය අහිමිව ඇති හෙයින් ඔහුගේ නරක වාර්තාවන් නිදෙස් කර ගැනීමේ හැකියාවක් නොමැත."* [22]

මෙනයින් බලන කල ව්‍යවස්ථාවේ 13(5) වගන්තිය යටතේ නිදෙස් බව පිළිබඳ පූර්වානුමිතිය ද මූලික අයිතිවාසිකමක් ලෙස ගත හැකි හෙයින් නීතිඥ මහතා විසින් කරන ලද තර්ක නොතකා හැරිණි.

---

20. එම.
21. සංජීව එදිරිව සුරවීර නඩුකරයේ, මෙම ලිපියේ පසුව සාකච්ඡා කෙරෙන, ඉහත 5 වන සටහන.
22. ප්‍රනාන්දු විනිසුරු, ඉහත, 11 සටහන.

<u>සහන දීමනාව වෙනුවට වන්දිය</u>

අධිකරණය මගින් වන්දි සහ වියදම් සේ සමාන කොටස් ලෙස රු. 800,000/- පැමිණිලිකාරියට සහ බාලවයස්කාර දරුවාට ගෙවන ලෙස නියම කෙරිණි. මෙහිදී රු. 700,000/- රජයෙන් ද, වරදකාර පොලිස් නිලධාරීන් දෙදෙනා රු. 50,000/- බැගින් පෞද්ගලිකවද ගෙවිය යුතු විය. දිලික්ත නීතිය, ගිවිසුම් නීතිය, දේපල ආදී සාමාන්‍ය නීතිය මගින් ප්‍රකාශිත වන්දි සංකල්පය හේතුවෙන් සහන දීමනාව වෙනුවට මූලික අයිතිවාසිකම් කඩවීමකදී වන්දි ප්‍රදානය කිරීම වාදයට තුඩු දිය හැකිය. මන්ද මෙවන් අවස්ථාවන්හි දී විවිධ නිර්නායකයන් ප්‍රකාශ කළ යුතු බැවිනි.

අනෙක් අතින් බලන කල මූලික අයිතිවාසිකම් කඩවීමකදී කළ යුත්තේ සහන දීමනා ප්‍රදානය කිරීම නම් සම්මුඛ පරීක්ෂණයකට නොකැඳවීමටත්, යමෙකුගේ ජීවිතයට ඇති අයිතිය උල්ලංඝනය කිරීමටත් යන දෙ අන්තයටම ගෙවනු ලබන මුදල් ප්‍රමාණයේ වෙනසක් කළ නොහැකි වනු ඇත. එය අසංවේදී මෙන්ම අතාර්කික ප්‍රතිඵලයක් වනු ඇත. මෙසේ හෙයින් සෑහියක් ලබා දෙනු වෙනුවට වන්දි ලබා දීමේ සංකල්පය ආරක්ෂා කළ හැකි මතයකි. ගෙවනු ලබන ප්‍රමාණය තීරණය කිරීම අධිකරණය අත පවතින අතර, එහිදී ගුණාත්මක හා ප්‍රමාණාත්මක නිර්ණායක මත පදනම් විය යුතුය. එසේම එය වධහිංසා සහ වෙනත් කෲර, අමානුෂික සැලකීම් හෝ දඬුවම් වැළැක්වීමේ සම්මුතියේ 14.1 වගන්තියේ සඳහන් පරිදි වන්දි සම්බන්ධ කරුණු හා අනුගත විය යුතුය. එසේම එය සම්මුතියේ 14.2 වගන්තියට ද අනුරූප විය යුතුය.

> "මෙම වගන්තියේ සඳහන් කිසිදු කරුණක් අපරාධයට ලක්වන්නා හෝ වෙනත් පුද්ගලයෙකුගේ සිය රටේ පවතින නීතින් යටතේ වන්දි ලබා ගැනීමට ඇති අයිතියට බාධා නොවේ."[23]

සාමාන්‍ය ජාතික නීති තත්ත්වයන් තුළ සිදුවන කල්ගත වීම් සහ ව්‍යවස්ථානුකූලව 126(5) වගන්තිය මගින් මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් දක්වා ඇති කාලයන් පිළිබඳව ද වක්‍ර පිළිගැනීමක් මේ මගින් සිදු කර ඇත.

---

23. ඉහත, සටහන් 18.

## ජාතික පොලිස් කොමිසම හා අධිකරණමය සම්බන්ධය 4(ඇ) වගන්තිය

4(ඇ) වගන්තිය අනුව "මූලික අයිතිවාසිකම් සහ නිදහස සියලුම රජයේ ආයතන විසින් ගරු කරනු, ආරක්ෂා කරනු හා වර්ධනය කරනු ලැබිය යුතුය."

ඒ හා සමගම 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කළ ජාතික පොලිස් කොමිසමේ 155(උ)(2) අනුව පොලිස් නිලධාරියෙකු හෝ පොලිස් සේවය නිසා වන මහජන පැමිණිලි හා පීඩාවට පත් පුද්ගලයින්ගේ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හා විමර්ශනය කිරීමට පටිපාටියක් සැකසිය යුතුය. එසේම පාර්ලිමේන්තුව විසින් එම අරමුණ සාක්ෂාත් කරගැනීමට සකසා ඇති නීති අනුගතව යමින් සහන සැලසිය යුතුය. මෙවන් ප්‍රතිපත්තියක් මෙම ලිපිය සකස් කරන අවස්ථාව වනතෙක් ජාතික පොලිස් කොමිසම විසින් සකස් කර නොතිබිණි.[24]

මෙම ව්‍යවස්ථානුකූල වගකීම් හා යමින් අධිකරණය සිය තීන්දුවේ පිටපතක් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ජාතික පොලිස් කොමිසමට ඉදිරිපත්[25] කරන ලෙස ලේඛකාධිකාරීට දන්විය.

## අධිකාරි සහ අධිකාරි එදිරිව අමරසිංහ සහ තවත් අය [26]

මෙම නඩුකරයේ දී එක් නීතිඥ මහතෙක් ඔහුගේ බිරිඳත් දහඅට මසැති දරුවාත් සමඟ වාහන තදබදය ඇති, එහෙත් එය පාලනය කිරීමට පොලිස් නිලධාරියකු නොමැති මහක සිය මෝටර් රථයේ ගමන් කරමින් සිටියේය. බොහෝවේලා එකතැන සිටීමෙන් අනතුරුව වාහනය ඉදිරියට ගැනීමට පැමිණිලිකරු සැරසෙත්ම තමන් ඇමතිවරයෙකුගේ ආරක්ෂක නිලධාරීන් බව පවසාගත් වග උත්තරකරුවන්, පළවන පැමිණිලිකරු මෝටර් රථයෙන් පිටතට ඇද ඔහුට අතුල් පහරක් ගසා ඇත. මෙවිට ඔහු බේරා ගැනීමට පැමිණි බිරිඳට ද (දෙවන පැමිණිලිකාරිය) ඔවුන් මේ හා සමානවම සලකා අසභ්‍ය වචනයෙන් බැන වැදී ඇත. පළවන පැමිණිලිකරු තමා නීතිඥයෙකු බව ප්‍රකාශ කළ විට තත්ත්වය තවත් උග්‍ර විය.

---

24. ලේඛිකාවක හා නීතිඥවරියක වන කිශාලි පින්ටෝ ජයවර්ධන හා මෙම කර්තෘ කරන ලද අධ්‍යයනයකට පසු හොංකොං හි ආසියානු මානව හිමිකම් කොමිසම ඉදිරිපත් කළ යෝජිත පටිපාටිය තිබියදීත්.

25. ප්‍රනාන්දු විනිසුරු, ඉහත, 11 පිට.

26. ඉහත. සටහන, 9.

ශ්‍රී ලංකා නීතිඥ සංගමයට (සිද්ධිය හෙළා දුටු) හා ඇමතිවරුන්ට මේ පිළිබඳ පැමිණිලි කළ අනතුරුව පොලිස් අධිකාරිය විසින් වග උත්තරකරුවන් තිදෙනෙකු සේවයෙන් නෙරපා හරින ලදී. දෙදෙනෙකු පසුව පැමිණිලිකරුගෙන් සමාව ඇයදි අතර, අනෙක් වගඋත්තරකරුගේ සේවය අත් හිටුවන ලදී. පැමිණිලිකරු ව්‍යවස්ථාවේ 11 වන වගන්ති ප්‍රකාරව කෲර, අමානුෂික, පහත්කොට සැලකීමෙන් නිදහස් වීමට තමාට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව ප්‍රකාශ කරන ලදී. අධිකරණයට දෙපාර්ශවයෙන්ම ඉදිරිපත් කරන ලද කරුණු අනුව පැමිණිල්ලෙන් ප්‍රකාශිත කරුණු ඔප්පු වී ඇති බව පිළිගන්නා ලදී.[27] මෙම නඩුකරයෙන් ජනිත වූ සිද්ධාන්ත හා මතයන් පහත දක්වේ.

## <u>පහත් කොට සැලකීමක් බවට පත්වන්නේ කවරක්ද? - මානසික නිර්ණායකයන්</u>

ශාරීරිකව සිදු කරන ලද තුවාලයන් පිළිබඳ පැමිණිල්ලක් නොමැති වුවද, වෛද්‍ය ප්‍රතිකාරයක් ගත් බවට සාක්ෂි නොමැති වුවද 11 වන වගන්තිය තුළට මානසික නිර්ණායකයන් හා අපරාධයට ලක්වන්නා මුහුණ දෙන තවත් නොගිණිය හැකි පමණ තත්ත්වයන් අන්තර්ගත වන බව අධිකරණය තීරණය කළේය. මෙම මානසික නිර්ණායකයන් හා අන් තත්ත්වයන් වන්නේ කවරක්ද යන්න වටහා ගැනීමට අධිකරණය ලබා දෙන ඉඟි තුළ මෙම නඩුකරයේ නීති විද්‍යාත්මක වැදගත්කම පවතී.

වරදකරුවන්හට සාමාන්‍ය ජනතාව කෙරේ හික්මීමක්, ගරුත්වයක් නොමැති බවක් පෙන්නුම් කිරීම තුළින් ජනතාවගේ අයිතීන් ආරක්ෂා කරනු ඇතැයි අපේක්ෂිත අය කෙරෙහි වැදගත්කම අඩුවීමක් සිදුවන බවද නිරීක්ෂණය කරන ලදී.[28] අපරාධයට ලක් වූ පුද්ගලයා වරදකරුවන්ගේ නොහික්මුණු හැසිරීම නිසා පත්වූ තත්ත්වය 'පහත්කොට සැලකීම' යන සංකල්පය තෘප්ත කරන බවට ශිරාණි බණ්ඩාරනායක විනිසුරුතුමිය හඳුනා ගන්නා ලදී.

> *"වාහන තදබදය අවස්ථාවේ දෙවන පැමිණිලිකාරිය මුහුණ දුන් අපහසුකාරී වාතාවරණයක් සිය සැමියාගේ හා දරුවාගේ ආරක්ෂාව පිළිබඳ බියෙන් පසුවෙද්දීත්, සිය සැමියා පහර කෑමෙන් වැළකීමට සිය*

---

27. ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක විනිසුරුතුමිය (යාපා හා එදුස්සූරිය විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).

28. ව්‍යවස්ථාවේ 4(ඇ) වගන්තියේ සඳහන් කරුණු හා යා කරමින්.

> *18 මසැති දරුවාත් අතැතිව මැදිහත් වූ විට එවන් තැනැත්තියකට පහර දීමත්, එසේම සිය බිරිඳ හා දරුවා පහර කෑමෙන් බේරාගත නොහැකි වූ සැමියාට මුහුණ දීමට සිදු වූ මානසිකත්වයත්, කුඩා දරුවා පත් වූ මානසික තත්ත්වයත් ගත්කල තත්ත්වයේ බරපතලකම තවත් උග්‍ර වේ."*

අධිකරණය මෙහිදී වන්දි ලෙස රු. 20,000/- ද අධිකරණ වියදම් ලෙස රජයෙන් රු. 5000/- ද ගෙවීමට නියෝග කළේය. නිවර්තකයක් ලෙස විශාල ප්‍රමාණයේ වන්දියක් ගෙවීම පිළිබඳ අදහස අධිකරණය මගින් ප්‍රතික්ෂේප කළ අතර එහිලා අවසාන වශයෙන් බදු ගෙවන්නන් මත පැටවෙන බර පිළිබඳව තීරණය කළ නඩුකරයක්[29] ආධාරය ලබා ගන්නා ලදී. වන්දි ගෙවීමේ ප්‍රතිවිරුද්ධ පදනම් මේ වන විටත් සලකා[30] බලා තිබෙන අතර පසු භාගයේදී එකිනෙකා හා තරඟ වදින මතවාදයන් පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කිරීමට බලාපොරොත්තු වේ.

## <u>කෝනේසලිංගම් එදිරිව මේජර් මුතාලිෆ්</u>[31]

කම්කරුවෙකු වූ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ හේතු නොදක්වා අත් අඩංගුවට ගෙන හමුදා කඳවුරක මසකට ද වැඩි කාලයක් රඳවා තබා ගන්නා ලදී. බැටන් හා පොලු මගින් ඔහුට පහර දී ඇති අතර පසුව වවුනියා පොලිස් ස්ථානයට භාර දී ඇත. එහිදී ඔහු තවත් මාසයක කාලයක් රඳවා තබා ගෙන ඇත. අතුරු විමසීමේදී තමා එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු ලෙස ලිඛිතව පිළිගන්නා ලෙස බලකොට ඇති අතර, මේ චෝදනාව සම්බන්ධයෙන් සාක්ෂි පවා නොවීය. සිය නිරවද්‍යතාවය පැහැදිලි කිරීමට යාමේදී ඔහු නැවත වතාවක් පහරදීමට ලක්කොට ඇත. ඉන් පසුව ඔහුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද අතර, පසුව මහේස්ත්‍රාත් තුමා විසින් රිමාන්ඩ් බන්ධනාගාර ගත කරන ලදී.

වරදකරුවන් සිය අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කිරීමට උපයෝගී කරගත් හදිසි නීතිය සැබවින්ම ක්‍රියාත්මකව ඇත්තේ අත්අඩංගුවෙන් පසුව බව අධිකරණය සොයා ගන්නා ලදී. අධිකරණය ඉදිරියේ ප්‍රකාශිත වෛද්‍ය

---

29. තීන්දුවේ 6 වන පිට බලන්න.
30. ඉහත, 23 සටහන බලන්න.
31. 2003.02.10 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 555/2001.

වාර්තා අනුව පහර දීමේ ප්‍රතිඵල ලෙස ශාරීරික තුවාල සිදු වී ඇත. මෙම කරුණු මත (අධිකරණය පිළිගත්) 11 වගන්ති ප්‍රකාරව කෲර වධහිංසාවනට පැමිණිලිකරු ලක්ව ඇති බවත් 13(1) ප්‍රකාරව නීති විරෝධීව අත්අඩංගුවට ගෙන ඇති බවත් 13(2)[32] අනුව නීති විරෝධීව රඳවා තබාගෙන ඇති බවත් තීරණය කරන ලදී. ශිරාණී බණ්ඩාරනායක විනිසුරුතුමිය[33] විසින් දෙන ලද මෙම තීන්දුව සමාජ දේශපාලන මානයකින් පුළුල් කොට සැලකීමකට ලක් කර ඇත.

<u>ජනවර්ගයක් හිංසනයට ලක් කිරීම හා සංවිධානාත්මක ත්‍රස්තවාදය අතර වෙනස - අධිකරණ සංවේදීතාවය</u>

පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන ඇත්තේ හුදු සැකයක් මතය. ඔහු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු යැයි සාධනය කෙරෙන භෞතිකමය සාක්ෂියක් නොමැති වූ අතර, ඔහුගේ අත්අඩංගුවට ගැනීමට හා රඳවා තබා ගැනීමට හේතුව ලෙස පෙනී යන්නේ ඔහු ද්‍රවිඩ ජන වර්ගයට අයත් වීමය. මෙය වරදකරුවන් පැමිණිලිකරුගෙන් බලහත්කාරයෙන් ලබා ගන්නා ලද පාපොච්චාරණයෙන් පෙනී යයි.

සිය නිරවද්‍යතාවය ප්‍රකාශ කිරීමට යාමේ ප්‍රතිඵලයක් ලෙස පහරදීමට ලක්වීමට සිදුවීම තුළින් පෙනී යන්නේ පැමිණිලිකරු හුදෙක් ද්‍රවිඩ ජාතිකයෙකු වූ නිසාම ඔහු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු යැයි වරදකරුවන් පූර්ව නිගමනයකට පැමිණ සිටි බවය. මෙම ආකල්පය නීතිය ක්‍රියාත්මක කරන්නන්[34] බොහොමයක් අවස්ථා වලදී දරන්නකි. 4(ඈ) වගන්තිය යටතේ ස්වකීය අයිතීන් ආරක්ෂා කිරීමට බැඳී ඇති නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් තමන් හිංසනයට ලක් කරන බවට හැඟීමක් මේ හේතුවෙන් ද්‍රවිඩ ජනතාව තුළ ඇති වනු ඇත. අධිකරණ තීන්දුවේදී මෙවැනි ආකල්පයන් සම්බන්ධයෙන් පහත කරුණු දක්වා ඇත.

> *"රඳවා ගැනීමේ නියෝගයේ පැමිණිලිකරු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු ලෙස දක්වා තිබුණද එය පෙන්වීමට අවැසි සාධක අත්අඩංගුවට ප්‍රථම*

---

32. වලංගු රඳවා තබා ගැනීමේ අණක් නොමැතිව මසකට වැඩි කාලයක් රඳවා තබා ගැනීම.
33. අගවිනිසුරු එස්.එන්. සිල්වා හා එදුස්සූරිය විනිසුරු එකඟත්වයෙන්.
34. උදහරණ ලෙස, ඥණමුත්තු එදිරිව ආනන්ද-හමුද නිලධාරි සහ තවත් අය 1999(2) SLR 213 සහ විනයාගමූර්ති එදිරිව හමුද අණ දෙන නිලධාරි 1997(1) SLR 133 බලන්න.

> අත්අඩංගුවට ගත් නිලධාරියා සතුව වූ බව අධිකරණය හමුවේ දක්වා නොමැත...."[35]

## <u>ශන්මුගරාජා එදිරිව වවුනියාව උප පොලිස් පරීක්ෂක දිල්රුක් සහ වෙනත් අය</u>[36]

එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු ලෙස සැක පිට අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු පිළිබඳ නඩුකරයකි. මෙහිදී පැමිණිලිකරු වූයේ පස්යාල සිට මන්නාරම දක්වා දෛනිකව දිවෙන වෑන් රථයක අත් උදව්කරුවෙකි. හේතු දක්වීමකින් තොරව එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු බවට සැක පිට මොහු අත්අඩංගුවට (අධිකරණය ලද පිළිගත හැකි තොරතුරු මත) ගෙන ඇත. පසුව ඔහුගේ දෙනෙත පටියකින් බැඳ පහර දී ඇත. සිංහලයෙන් රචිත, ඔහුට වටහාගත නොහැකි ලේඛනයකට බලහත්කාරයෙන් ඔහුගේ අත්සන ලබාගෙන ඇත. අධිකරණය 13(1) හා (2) වගන්ති උල්ලංඝනය වීමක් සිදු නොවූ බව සොයා ගත්තද ඉදිරිපත් කොට තිබූ වෛද්‍ය සාක්ෂි මත 11 වන වගන්තිය යටතේ ගොනු කොට තිබූ පැමිණිල්ල ප්‍රකාශිත බව පිළිගත්තේය.

## <u>අත්අඩංගුවට ගැනීමේදී පිළිගත හැකි තොරතුරු සහ හුදු සැකය අතර වෙනස - පැමිණිල්ලේ වැදගත්කම</u>

වගඋත්තරකරුවන් පැවසූ පරිදි අත්අඩංගුවේ පසුවන වෙනත් සැක කරුවන්ගෙන් ලද තොරතුරු අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත. මෙහිලා අධිකරණය පැවසුවේ:

> "මෙහිදී පෙනී යන කරුණක් වන්නේ වගඋත්තරකරුවන් හට පැමිණිලිකරුගේ සම්බන්ධය පිළිබඳ පිළිගත හැකි තොරතුරු ලැබී ඇති බවයි. පසුව කරන ලද අත්අඩංගුව එම තොරතුරු මත කරන ලද විමර්ශන යේ ප්‍රතිඵලයකි..."[37]

---

35. තීන්දුවේ 4 වන පිටුවේ බණ්ඩාරනායක විනිසුරුගේ තීරණය.
36. 2003.02.10 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 47/2002.
37. එම. තීන්දුවේ 3 වන පිටුව.

අධිකරණය තවදුරටත්:,

> *"මෙහිදී පෙනී යන්නේ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම හුදු සැකයක් මත නොව විශ්වාස කළ හැකි තොරතුරු මත පදනම්ව කළ එකක් නිසා සාධාරණ බවය."*[38]

කෝනේසලිංගම් නඩුකරයෙන්[39] මෙම නඩුකරය වෙනස් ලෙස අධිකරණය පිළිගන්නේ වගඋත්තරකරුවන්හට සෙසු සැකකරුවන්ගෙන් ලැබුණු තොරතුරු හේතුවෙනි. මෙහිදී පැමිණිල්ලේ ඇති වැදගත්කම කවරේදයි පැහැදිලි වේ. කෙසේ වෙතත්, වගඋත්තරකරුවන්හට විශ්වාස කටයුතු තොරතුරු සැකකරුවන්ගෙන් ලැබුනේය යන්න පිළිගැනීම ප්‍රශ්න කිරීමට විවෘතය. මෙම තත්ත්වය ආරක්ෂක හේතූන් මත තොරතුරු ලබා දෙන්නාගේ අනන්‍යතාවය හෙළිදරව් නොකිරීම යන පදනම මත තර්කානුකූලව සාධාරණීකරණය කළ හැක. සමස්ථයක් ලෙස ගත් කල හුදු සැකය සහ විශ්වාස කටයුතු තොරතුරු අතර ඇති පටු වෙනස බුද්ධිමත් ලෙස පැමිණිල්ල සැකයීමෙන් නැති කළ හැකිය.

<u>අත්අඩංගුවට ගැනීමට හේතුව දනුම් දීමට හැකි තත්ත්වයක පසුවීම සහ අත්අඩංගුවට ගැනීමට හේතුව කවරේදයි දනුම් දීමේ වගකීම. 13(1) වගන්තිය පටු ලෙස අර්ථ නිරූපණය කිරීම.</u>

කෙසේ වෙතත්, උක්ත දක්වන ලද කරුණු අනුව අධිකරණය:

> *"මෙවන් අවස්ථා වලදී මාගේ ආකල්පය අනුව පළවන වගඋත්තරකරු පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට හේතුව දනුම් දීමට හැකි තත්ත්වයක සිටි අතර, එහෙයින්... පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීතිය මඟින් ප්‍රකාශිත පටිපාටියට අනුකූලව සිදු කර ඇත."*[40]

ව්‍යවස්ථාවේ 13(1) වගන්තිය පරිදි සඳහන් දෙවැදැරුම් අයිතීන් වලට අනුව,

> *"නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද එම හේතුව ඒ තැනැත්තාට දන්විය යුත්තේය."*

---

38. එම.
39. ඉහත, 31 සටහන.
40. ඉහත, 37 හා 38 සටහන.

කෙසේ වෙතත්, මෙම තීන්දුවේදී වගඋත්තරකරුවන් (සිය තොරතුරු මූලාශ්‍රය ආරක්ෂා කරන අතර) පැමිණිලිකරු හට ඔහු අත්අඩංගුවට ගැනීමට හේතුව සඳහන් කළ බවට වූ සාක්ෂි සම්බන්ධ සඳහනක් කර නොමැත. අවසානයේදී පෙනී යන්නේ 13(1) වගන්ති ප්‍රකාරව දෙවන කොටසේ ගර්හිත පැමිණිලිකරුගේ අයිතීන් උල්ලංඝනය වී ඇති බවයි.

## 15(7) හා (8) වගන්තිවල බලපෑම හා අධිකරණ තීරණයේ ප්‍රතිඵලය

15(7) වගන්තිය මගින් 13(1) වගන්තියේ සඳහන් වගන්ති ජාතික ආරක්ෂාව උදෙසා නීත්‍යානුකූල සීමාවනට ලක් කර ඇත. එසේම, අන්‍යයන්ගේ අයිතීන් හා නිදහස රැකීමටත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ සාමාන්‍ය ජනතාවගේ සුභසාධනයටත් මෙම සීමා කිරීම් යොදගත හැකි බව හඳුනාගෙන ඇත. 15(8) වගන්තිය මෙය තව දුරටත් පැහැදිලි කරයි.

"නීතිය" යන වචනය අර්ථ නිරූපණය කිරීමේදී අධිකරණ තීන්දු ද එයට අන්තර්ගත වන්නේ නම්[41] උක්ත තීන්දුවෙන් ගම්‍ය වන්නක් ලෙස විශ්වාස කටයුතු තොරතුරු මත ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන අයෙකු අත්අඩංගුවට ගැනීමේදී අත්අඩංගුවට ගැනීමට හේතුව දක්වීම අත්‍යවශ්‍ය කාරණයක් නොවේ. ඒ වෙනුවට අත්අඩංගුවට ගැනීම සිදු කරන **පුද්ගලයා** අත්අඩංගුවට ගැනීමට හේතු දක්විය හැකි තත්ත්වයක සිටීම සෑහේ. (ඔවුන් එම හේතු දක්වුවද නොදක්වුවද) මෙම එළඹීම විවාදයට තුඩු දිය හැකි අතර ව්‍යවස්ථානුකූල අයිතිවාසිකම් දුර්වල කිරීමටත් නීති ක්‍රියාත්මක කරන නිලධාරීන්ට බලවත් ලිහිල් බවක් ලබා දීමට හේතු වනු ඇත.

## *ඒකනායක (උපසේවා පොලිස් කොස්තාපල්) එදිරිව උපසේවා උප පොලිස් පරීක්ෂක වේවාවසම්*[42]

මෙම නඩුකරයේදී උපසේවා උප පොලිස් කොස්තාපල්වරයෙකු වන පැමිණිලිකරු උපසේවා උප පොලිස් පරීක්ෂකවරයෙකු විසින් නීති විරෝධීව අත්අඩංගුවට ගෙන පහරදීමට ලක් කර ඇත. අත්අඩංගුවට ගැනීමට හේතුව දක්වා නොමැත. පැමිණිලිකරු ගල්නෑව පොලිස් ස්ථානය පසු කර යද්දී ඔහු අසලින් පොලිස් ජීප් රථයක් නවතා ඇත. ප්‍රධාන වරදකරු ඉන් බැස අසභ්‍ය වචනයෙන් පැමිණිලිකරු යන්නේ කවර ස්ථානයකටදයි අසා

41. *වෝකර් සහ පුත්‍ර සමාගම එදිරිව ගුණතිලක සහ තවත් අය* (1978-79) SLR 231.
42. ඉහත, 10 සටහන.

පිළිතුරක් දීමටද පළමුව පැමිණිලිකරුට දතින් හා දෙපයින් පහර දී පපුවට පයින් ගසා ඇත. පැමිණිලිකරු තමා පොලිස් නිලධාරියෙකු බව පවසද්දීත් මෙසේ දිගටම පහර දී ඇත. ඉන්පසු ඔහුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් අතුල් පහරවල් දී ඇත. පැමිණිලිකරුට මෙලෙස පහත් අන්දමින් සැලකීම සිවිල් වැසියන් කිහිප දෙනෙකුම දක ඇත. පසුව පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඔහු උපසේවා පොලිස් නිලධාරියෙකු ලෙස හඳුනාගෙන පොලිස් ස්ථානයෙන් පිටතට එළවන ලදී. පසුව රෝහල් ගත වූ ඔහුගේ වෛද්‍ය වාර්තා අනුව, ඔහු බරපතල තුවාල ලබා ඇත. මෙවන් තත්ත්වයක් තුළ ව්‍යවස්ථාවේ 11, 13(1) යන වගන්ති යටතේ ආරක්ෂිත පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වී ඇති බව අධිකරණය තීරණය කොට ඇත.

සැලකිය යුතු හා තීරණය කළ යුතු කරුණු කීපයක් ම මෙම නඩුකරයෙන් පැන නැඟී ඇත. ඒවා පහත සාකච්ඡාවට ලක් කර ඇත.

<u>එකිනෙකට ප්‍රතිවිරුද්ධ විස්තර දක්වීම්වල සිදුවීමේ සම්භාවිතාවය පරීක්ෂා කිරීමේ න්‍යාය - වගඋත්තරකරුට පැවරෙන භාරයේ ස්වභාවය.</u>

මෙම නඩුකරයෙන් ප්‍රතිවිරුද්ධ විස්තර දක්වීම්වල, සිදුවීමේ සම්භාවිතාවයන් පිළිබඳ න්‍යායන් දෙකක් ඉදිරිපත් කර ඇත. පළමුව පැමිණිල්ල මඟින් කරනු ලබන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳ පැමිණිල්ල පරාජය කිරීමට නම් වරද කරන ලද බවට චෝදනා ලද්දන්ට සැලකිය යුතු නොගැලපීමක් හෝ පැමිණිලිකරුගේ ප්‍රකාශයේ සිදු නොවිය හැක්කක් පෙන්වා දීම කළ යුතුය. දෙවනුව වග උත්තරකරු ගේ ප්‍රකාශයේ නොසතුටුදායක අංගයන් පැමිණිලිකරුගේ ප්‍රකාශය වඩාත් භාව්‍ය බව පිළිගැනීමට හේතු පාදක වනු ඇත. මෙම අවස්ථාවේදී මෙම නඩුකරයේදී ප්‍රධාන වරදකරු වෙනුවෙන් ඉදිරිපත් කළ ප්‍රවේශයන් (In entry) සහ සහකාර දිවුරුම් ප්‍රකාශයන්හි බරපතල නොගැලපීම් ඇති බව සොයා ගන්නා ලදී. ඒවා අත්අඩංගුවට ගැනීමට පාදක වූ ප්‍රධාන සිදුවීම හා නොගැලපෙන සුළු අංගයන් නොවීය.[43]

---

43. පොලිස් පොතේ ඇති සටහන අනුව පැමිණිලිකරු ජීප් රියට යමක් විසි කිරීමට උත්සාහ දරා ඇත. නමුත් ප්‍රධාන වගඋත්තරකරුගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වූයේ පැමිණිලිකරු ගමන් ගන්නා වාහන වලට ගල්වලින් දමා ගැසූ බවයි. මෙය අන් දිවුරුම් ප්‍රකාශ වල දක්වා තිබුණේ නැත. එහෙත් පැමිණිලිකරුගේ තුවාල සිදුවූ අන්දම ගැන කිසිදු පැහැදිලි කිරීමක් දක්වා තිබුණේ නැත. එසේම පැමිණිලිකරුට තමාව රැක බලා ගත නොහැකි පමණට වෙරි මතින් සිටි බවට වූ පැමිණිල්ල, ඔහුව වෛද්‍ය පරීක්ෂණයකට ලක් කොට තහවුරු කළ යුතුව තිබුණත් එසේ කර නැත.

<u>පැමිණිලි කෙරෙහි 44(7) රීතියේ බලපෑම</u>

ශ්‍රේෂ්ඨාධිකරණ රීති[44] 44(7) පරිදි ඉදිරිපත් කරනු ලබන අවිධිමත් පැමිණිල්ලක් 126(2) වගන්ති ප්‍රකාරව පැමිණිල්ලක් ලෙස සැලකිය හැකිය. 44(7) වගන්තිය වෙසෙසින් ප්‍රථම පැමිණිල්ලේ සඳහන් කර නොතිබීම නිසා කළ ප්‍රාථමික විරෝධතා දක්වීම් ප්‍රතික්ෂේප කළ අධිකරණය පසුව කරන ලද පැමිණිලි ශ්‍රේෂ්ඨාධිකරණ රීති 44(7)[45] හා අනුගත බව ප්‍රකාශ කරන ලදී.

<u>පැමිණිලිකරුගේ ආර්ථික තත්ත්වය - විනිශ්චයක ආවේදන (Judicial Notice)</u>

පැමිණිලිකරු සිය පැමිණිල්ල ඉදිරිපත් කිරීමට නීති ආධාර අපේක්ෂා කරන ලද උපසේවා කොස්තාපල්වරයෙකි. එවන් තත්ත්වයක් යටතේ වන පුද්ගලයෙකුට මූලික අයිතිවාසිකම් නඩුකරයක වියදම් දැරිය නොහැකි බව සාධාරණය යන පදනම මත හිඳ සමාජයේ එක්තරා කොටස්වල සාමාජීය හා ආර්ථික මට්ටම් වලට ප්‍රතිචාරයක් ලෙස විනිශ්චයක ආවේදන ගනු ලැබිණ. මෙහිලා වඩාත් වැදගත් එළඹුමක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණ රීති 44(7) යටතේ පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකියාව සලසා දීම දක්විය හැකිය. නො එසේනම් පැමිණිලිකරුවන් (සැබවින්ම දිළිඳු තත්ත්වයේ පසුවන්නන් පවා) විධිමත් පැමිණිල්ලක අවශ්‍යතාවය හා ආර්ථික ශක්තිය නොමැති වීම හේතුවෙන් පැමිණිල්ල ප්‍රතික්ෂේප කිරීමේ අවදානමකට මුහුණ පායි.

***<u>හරින්ද්‍ර ශෂික කුමාර (ස්වකීය නඩු සහායක වන මව මාර්ගයෙන් පෙනී සිටින, හිමාලි රූපිකා රුවියල) එදිරිව උප පොලිස්පති ද ෆොන්සේකා සහ වෙනත් අය</u>***[46]

දූෂණ වැළැක්වීමේ කාර්ය බලකායේ පොලිස් නිලධාරීන් විසින් දහතුන් හැවිරිදි දරුවකු කෲර, අමානුෂික හා පහත්කොට සැලකීමට ලක් කර ඇත. මානව හිමිකම් කොමිෂන් සභාවට සහ දූෂණ මර්දන කාර්ය බලකායේ ප්‍රධාන

---

44. අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් අංක. 665/32 1991 ජූනි 31 දිනැතිව ප්‍රකාශයට පත් කළ ශ්‍රේෂ්ඨාධිකරණ රීති.
45. එම්.ඩී.එච්.ප්‍රනාන්දු විනිසුරු (ඉස්මයිල් හා විග්නේස්වරන් විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).
46. 2003.03.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, S.C. (FR) අංක. 462/2001.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත කරන ලද පැමිණිලි වලින් ප්‍රයෝජනයක් අත් නොවිණි. ඉදිරිපත් කරන ලද ප්‍රකාශ දෙක අතරින් පැමිණිලිකරුගේ පාර්ශවයේ කරුණු පිළිගත් අධිකරණය පැමිණිලිකරුගේ 11 වගන්තිය යටතේ සුරක්ෂිත මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව තීරණය කළේය.

මෙහිදී පරීක්ෂණයට ගත් කරුණු කීපයක් පහත දක්වා ඇත.

<u>පැමිණිලිකරුගේ කට උත්තරයේ සඳහන් නොගැලපීම වෛද්‍ය සාක්ෂි හා සංසන්දනය කිරීම - සංවේදී අධිකරණ එළඹීමක්.</u>

අධිකරණය ඉදිරියේ දක්වූ කරුණු වලට අනුව පැමිණිලිකරුට සිදුවූ තුවාල ගණනාවක් පිළිබඳ පැහැදිලි වෛද්‍ය සාක්ෂි ඉදිරිපත් විය. කෙසේ වුවත්, පැමිණිලිකරුගේ කට උත්තරය ප්‍රකාරව තුවාල සම්බන්ධයෙන් විෂමතා කීපයක් පැන නැගිණි. එහෙත් අධිකරණය මෙම සුළු විෂමතාවයන්හි වැදගත්කම එම කට උත්තරය දෙන අවස්ථාවේ පැමිණිලිකරුගේ ව්‍යාකූල මනෝභාවය හා සලකන කල නොගිණිය හැකි බව තීරණය කළේය.

<u>අධිකාරිය දරන්නන්ගේ ප්‍රතිපුරුෂ වගකීම</u>

මෙම පහරදීමට දූෂණ මර්දනය කිරීමේ කාර්ය බලකායේ සම්පූර්ණ බලය දරනු ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ සම්බන්ධයක් නොවීය. ඔහු ප්‍රකාශ කර සිටියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ මැදිහත්වීම මත අදළ පහරදීම පිළිබඳ පැමිණිල්ල තමා විසින් පරීක්ෂා කරන ලද බවත්, ඔහු ලද තොරතුරු අනුව එක් පුද්ගලයෙකු එම දරුවාගේ කණ මිරිකීමක් කළා විනා පහරදීමක් නොකළ බවයි. කෙසේ වෙතත්, පහරදීම පිළිබඳ පැමිණිල්ල ඔප්පු වීමත් සමඟ එම පහර දීම වැළැක්විය නොහැකි නම් අවම වශයෙන් එය වාර්තා කිරීමක් හෝ ඔහු කළ යුතුව තිබුණේය යන පදනම මත එම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා වගකීමට ලක් කෙරිණි. මේ තුළින් මූලික අයිතිවාසිකම් විෂයෙහිලා ප්‍රතිකාරී (ප්‍රතිපුරුෂ) වගකීමක් ඇත යන මතය පිළිගැනිණි.

<u>බණ්ඩාරනායක එදිරිව රාජගුරු නඩුකරයෙන් ඉදිරිපත් කරන ලද මූල ධර්මයන් ප්‍රතිශ්ඨාපනය කිරීම.</u>[47]

මෙම පහරදීම සිදු කර ඇත්තේ පදිංචිකරුවන් පවත්වාගෙන යන බවට සැක කෙරෙන නීති විරෝධී මත්පැන් ජාවාරමක් සම්බන්ධයෙන් පවත්වන ලද පොලිසියේ වැටලීමක ප්‍රතිඵලයක් වශයෙනි. තොරතුරු සපයන්නෙකුගෙන් හෝ වෙනත් මාර්ගයකින් තමනට විශ්වාස කටයුතු තොරතුරු ලද බව ඔප්පු කිරීමට පොලිසිය අසමත් විය. මෙවන් තත්ත්වයක් තුළ කරන ලද වැටලීමද නීත්‍යානුකූල නොවන බව තීරණය කළ අධිකරණය බණ්ඩාරනායක එදිරිව රාජගුරු නඩුකරයේ සඳහන් මූල ධර්ම නැවත ප්‍රතිශ්ඨාපනය කරන ලදී.

<u>11 වන ව්‍යවස්ථාවේ සන්දර්භය තුළ "සලකා බැලීමේ මායිම" පිළිබඳ සිද්ධාන්තය නැවත ස්ථාපිත කිරීම - මූලික අයිතිවාසිකම් නීති ක්ෂේත්‍රයේ දී සමානුපාතිකභාවය පිළිබඳ මූල ධර්මය අදාළ කර ගැනීම.</u>

පරිපාලන නීතිය තුළදී යම් මහජන ආයතනයකට උද්ගතව ඇති සිද්ධිමය අවස්ථාවක[48] එළඹ ඇති තීරණය හෝ ක්‍රියාමාර්ගය නිවැරදිදැයි තීන්දු කිරීම සඳහා යොදගනු ලබන සිද්ධාන්තයකි "සලකා බැලීමේ මායිම".

මේ හා සමානත්වයක් ඇති ප්‍රමාණාත්මකභාවය පිළිබඳ මූල ධර්මයන් වලට අනුව බලාපොරොත්තු වන ප්‍රතිඵලයන්ට අවශ්‍ය නොවන පමණට ප්‍රබල රාජ්‍ය හා පරිපාලන ක්‍රියාමාර්ගයන් අනුමත කිරීමක් සිදුනොවේ.[49] මෙම මූල ධර්මයන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය අධිකරණ නිරීක්ෂණයන්ට[50] අනුව බලන කල, හිංසාකාරී, අසහනකාරී හදිසි අවස්ථාවන් වලදී සිදුකරන පොලිස් පහරදීම් සම්බන්ධයෙන් සුළුවෙන් යෙදීමටත් එයට ප්‍රතිවිරුද්ධව යමෙකුට වේදනාවක් ගෙන දීමේදී එයට දක්වන අසංවේදීතාවය සම්බන්ධයෙන් වෙනස්වද යොද ගැනීමක් අපේක්ෂා කෙරේ.

47. 1999 (1) SLR 104.

48. වේඩ් සහ ෆෝසයිත් පරිපාලන නීතිය 8 වන වෙළුම ඔක්ස්ෆර්ඩ් - 185 පිටුව.

49. එම. 368 පිටුව.

50. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරු (ගුණසේකර හා විග්නේස්වරන් විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).

## සංජීව (නීතිඥ) එදිරිව සුරවීර[51] (ජෙරාඩ් පෙරේරා වෙනුවට)

මෙම නඩුකරයේදී අධිකරණය 11 වගන්තිය යටතේ වධහිංසාවට ලක් කිරීමක්, 13(1) යටතේ නීති විරෝධී අත්අඩංගුවට ගැනීම හා 13(2) යටතේ නීති විරෝධී රඳවා තබා ගැනීම යන කරුණු ඔප්පු කරන ලද බව පිළිගන්නා ලදී.

## 11 වන වගන්තිය යටතේ කෲර හා අමානුෂිකව සැලකීම සම්බන්ධ නව මානයක්

අධිකරණයට ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව අවම බලය යොදගත් බවට කළ ව්‍යතිරේකය නොපිළිගත් තත්ත්වයක් තුළ කඩිනම් ප්‍රතිකාර උදෙසා හෝ හැකිතාක් ඉක්මණින් පැමිණිලිකරු (අත්අඩංගුවට ගෙන රඳවා තබා ගත්) නිදහස් නොකිරීම කෲර හා අමානුෂික සැලකීමක් ලෙස ගන්නා ලදී.

## 13(1) යටතේ එන අත්අඩංගුවට ගැනීමක් - 2 වන කොටස අරභයා කරන ලද ප්‍රතික්‍රියාව

ජෙරාඩ් නැමැත්තෙකු මිනීමැරුමක් කරන ලද බවට ලද තොරතුරු මත පදනම්ව මොහුව අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගැනීමට හේතු දක්වීමක්ද කර නොමැත. 'ජෙරාඩ් නැමැත්තා' යැයි විශ්වාස කෙරෙන ඕනෑම අයෙකු අත්අඩංගුවට ගැනීමට තරම් සාධාරණ යැයි කිවහැකි තොරතුරුද ලැබී නොමැති අතර, එම ජෙරාඩ් නැමැත්තා ගැන සැනෙන් ලද ප්‍රකාශන පවා ගොනු කොට නොමැත. එනයින් අත්අඩංගුවට ගත් පුද්ගලයා මිනී මැරුමක් කළ බවට විශ්වාස කළ හැකි පදනමක් පවා නොවීය. මෙම අත්අඩංගුවට ගැනීම හුදෙක්ම යම් කරුණක් එළිදරව් වනු ඇතැයි බලාපොරොත්තුව මත කරන ලද්දකි.[52]

51. SC (FR) අංක. 328/2002.

52. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමාගේ කරුණු දක්වීම බලන්න. (එදුස්සූරිය හා විග්නේස්වරන් විනිසුරුවන්ගේ එකඟත්වයෙන්)

13(2) වගන්තිය යටතේ රඳවා තබා ගැනීම - කඩිනමින් මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ මූල ධර්මය පැහැදිලි කිරීම.

මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට ඉදිරිපත් නොකර මූලික අයිතීන් උල්ලංඝනයට ලක් වූ පුද්ගලයා පැය 24 ඉහළ සීමාවද ඉක්ම යන තුරු රඳවා තබාගෙන ඇත. පැයක් හෝ දෙකක් මෙසේ රඳවා තබා ගත්තේ නම් සාධාරණ බව ඒත්තු ගන්වමින් අධිකරණය පහත මූල ධර්මය පැහැදිලි කරන ලදී.

> "කඩිනමින් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියට ඉදිරිපත් කිරීමේ අරමුණ වන්නේ දිගුකලක් මෙසේ රඳවා තබාගත් විට පීඩාකාරී අන්දමින් සැලකීමේ හැකියාව මෙන්ම පීඩාකාරීව සැලකූ බවට ව්‍යාජ චෝදනා කිරීමටද අවස්ථාව සැලසෙන බැවිනි."

තවදුරටත් මෙම මූල ධර්මයට විශේෂණයක් ලෙස,

> "අයිතීන් උල්ලංඝනයට ලක් වූ පුද්ගලයාට එරෙහි සාක්ෂි නොමැති බව දැනුම් දුන් පසුත් යටත් නිලධාරීන් දිගින් දිගටම ප්‍රශ්න කිරීම නීති විරෝධී රඳවා තබාගැනීමක් ලෙස සලකන ලදී."

අධිකාරිය ලත් පුද්ගලයෙකුගේ ප්‍රතිපුරුෂ වගකීම

මෙහිලා අත්අඩංගුවට ගැනීමට අණ දුන් නිලධාරියාහට, සිය යටත් නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය පාලනය හා අධීක්ෂණය කිරීමටත්, මුදා හැරීමටත් බලය තිබූ බැවින් එම අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හා පසුව කරන ලද වධ හිංසාවට ලක් කිරීම උදෙසා වගකීමට බැඳෙන බව තීරණය විය.

නීතිඥයා ගොනු කළ පැමිණිල්ලේ බලපෑම - ඔහුට පෞද්ගලික දැනුමක් නොවූ බවට කරන ලද මූලික විරෝධතා - අධිකරණ ප්‍රතිචාරය

මූලික අයිතිවාසිකම් උල්ලංඝනයට ලක් වූ පුද්ගලයා පිළිබඳ පැමිණිල්ල ගොනු කළ නීතිඥයාට පෞද්ගලික දැනීමක් නොවූ බවට කරන ලද මූලික විරෝධතාවය අධිකරණය ප්‍රතික්ෂේප කරන ලදී. මෙහිදී අධිකරණයේ පිළිගැනීම වූයේ එම සිදුවීම පිළිබඳව පෞද්ගලික දැනීමක් ඇති අයිතිවාසිකම් උල්ලංඝනයට ලක්වූ පුද්ගලයාගේ බිරිඳ කරන ලද දිවුරුම් ප්‍රකාශය නීතිඥයාගේ දිවුරුම් ප්‍රකාශයට සහයක් ලෙස ප්‍රමාණවත් බවයි. මෙම කට

උත්තරය එම පුද්ගලයා හට සිය අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ පැමිණිලි කළ නොහැකි තත්ත්වයක් තුළ කරන ලද බවට වූ විශ්වාසදායී තොරතුරු මත පදනම් වූවකි.

<u>44(7) ව්‍යවස්ථාව යටතේ කරන ලද පළමු අවිධිමත් පැමිණිල්ලක බලපෑම</u>

අයිතිවාසිකම් උල්ලංඝනයට ලක් වූ පුද්ගලයාගේ බිරිඳගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක නොවූ තත්ත්වයක් තුළ) බාධාවක් නොවේ.

<u>වරදවා සඳහන් කළ වගඋත්තරකරුවකු - තීරණායකයක් ලෙස අගතියක් නොවේ.</u>

වගඋත්තරකරුවන්ගෙන් අයෙක් වූ එක් පොලිස් නිලධාරියෙකු වරදවා විස්තර කොට තිබිණි. නමුත් මෙය පැමිණිල්ලට ස්ථිර බාධාවක් නොවූයේ අදළ වගඋත්තරකරු තමන් වගඋත්තරකරු බව පිළිගනිමින් සහ තමන් මුලාවකට ලක් නොවූ බව පවසමින් දිවුරුම් ප්‍රකාශයක් නිකුත් කිරීම නිසාය. මෙහිදී ගත යුතු නිවැරදි පියවර ලෙස අධිකරණය දුටුවේ පැමිණිල්ලේ ශීර්ෂය වෙනස් කිරීමයි.

<u>ජාත්‍යන්තර නියමයන් යොදා ගැනීම - රෝහලක් තෝරා ගැනීමේ අයිතිය</u>

මෙහිදී පොලිසියේ වධහිංසාවට ගොදුරු වූ පුද්ගලයා හට වෛද්‍ය පහසුකම් සඳහා රජයේ රෝහලක් හෝ පෞද්ගලික රෝහලක් තෝරා ගැනීමේ හැකියාව සලකා බැලිණි. මෙහිදී පැමිණිලිකරු තමන් පෞද්ගලික රෝහලේ ප්‍රතිකාර ලබා ගැනීමට වැය කළ මුදල නැවත ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. පැමිණිලිකරුට රජයේ රෝහලකින් ප්‍රතිකාර ලබා ගත හැකිව තිබුණි යන තර්කය බැහැර කළ අධිකරණය කල්ගත වීම් ඉන් ප්‍රතිකාර ලබන පුද්ගලයන් සංඛ්‍යාව වැඩිවීම, වැඩ වර්ජන, උපකරණ හා ඖෂධවල ඌණතාවයන් ආදිය පිළිබඳ පවතින බිය හේතුවෙන් පුරවැසියන්හට[53] ප්‍රතිකාර ලබා ගැනීමේදී රජයේ හෝ පෞද්ගලික රෝහල් අතරින් යමක් තෝරා ගැනීමේ හැකියාව ඇති බව ප්‍රකාශ කෙරිණි. මෙම ස්ථාවරය

53. 11 වන වගන්තිය අනුව ගන්නා කල "පුරවැසියා" යන්න "පුද්ගලයා" ලෙස ගත යුතුය.

සාධාරණීකරණය කිරීමට ආර්ථික, සමාජීය හා සංස්කෘතික පිළිබඳ සම්මුතියේ 12 වන වගන්තිය යොදා ගන්නා ලදී. එහිදී ශාරීරික හා මානසික සෞඛ්‍යය සම්බන්ධයෙන් ලබාගත හැකි ඉහළම තත්ත්වය භුක්ති විඳීමට ඇති අයිතිය හඳුනාගෙන ඇත.

<u>පාලන වගකීම - කමා කිරීම සහ අනුමැතිය යන මූල ධර්ම හඳුනා ගැනීම.</u>

පොලිස්පතිට කරන ලද පැමිණිල්ලක් පිළිබඳ ක්‍රියාත්මක නොවීම සහ එවන් පැහැර හැරීමක් ව්‍යවස්ථාවේ 4(ඇ) වගන්තියේ සඳහන් ව්‍යවස්ථානුකූල අයිතීන් පැහැර හැරීමක් ලෙස තීරණය කරන ලදී. මෙහිදී අධිකරණය,

> *11 වගන්තියේ සඳහන් අයිතීන් උල්ලංඝනය නොවීම අරභයා සකසා ඇති ප්‍රබල නියෝගයන් දිගුකාලීනව ගැනීමට අපොහොසත් වීමත්, එසේම විනායානුකූල හෝ අපරාධමය පටිපාටීන්ට අනතුරුව ද එම උල්ලංඝනයන් පිළිබඳ විමර්ශන නිසියාකාරයෙන් කිරීමට අපොහොසත් වීමත් අවකමා කිරීම සහ අනුමැතිය යන සංකල්පය යොදා ගැනීම සාධාරණීකරණය කරයි. (නොඑසේනම් අනුමත කිරීම සහ බලය ලබා දීම)*[54]

<u>4(ඇ) වගන්තිය යටතේ සඳහන් වගකීම් ක්‍රියාත්මක කිරීමේලා මාර්ගෝපදේශ</u>

විනය හා අපරාධමය ක්‍රියාමාර්ගයන් හැරුණුකොට පොලිස්පති මෙවන් අවස්ථාවල මූලිකව ක්‍රියා කිරීමක් අපේක්ෂා කෙරේ. මෙම නඩුකරයෙන් පොලිස්පතිට ව්‍යවස්ථානුකූලව පවරා ඇති වගකීම් (4(ඇ) වගන්තිය යටතේ) නිරූපණයක් ද සිදු කරයි.

මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝජිතයන් හා විශේෂයෙන් පත් කළ පොලිස් නිලධාරීන්ද සහ/හෝ අත්අඩංගුවේ පසුවන රැඳවියන් ගේ තත්ත්වය හා ඔවුන්ට සලකන ලද ආකාරය පිළිබඳ වාර්තා කළ හැකි ජන සමාජයන්වල නායකයන්ගෙන් සමන්විත කණ්ඩායම් මගින් හදිසි පරීක්ෂා කිරීම් සඳහා කටයුතු සම්පාදනය කිරීමක් පොලිස්පතිගෙන් අවම වශයෙන් බලාපොරොත්තු වේ.[55]

---

54. ප්‍රනාන්දු විනිසුරුතුමන් තීරණයේ 9 වන පිටුව.
55. එම.

**<u>සෙනෙවිරත්න එදිරිව උප පොලිස් පරීක්ෂක රාජකරුණා සහ තවත් පස් දෙනෙක්</u>**[56]

මෙම නඩුකරයේදී පැමිණිලිකරුගේ ගමන් බලපත්‍රය ව්‍යාජ එකක්ය යන සැකය මත ඔහුව අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන ඇත. මෙහිලා ගමන් බලපත්‍රයේ පුද්ගල ඡායාරූපය ඇතුළත් කරන ලද බවට සාක්ෂි විමර්ශනයක් සිදුකළ යුතුව තිබුණි. මෙම සැකය සම්පූර්ණයෙන්ම ගොඩ නැගී තිබුණේ ගමන් බලපත්‍රය මත වන අතර, ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම නිකුත් කරනු ලබන මගී සේවා අත් පොතේ ඇති මාර්ගෝපදේශ අනුව ගමන් බලපත්‍රය යනු ගමන් ලේඛන ගණනාවක් අතරින් එකක් පමණි. ඡායාරූපය ඇතුළත් කළාය යන සැකයට සහයක් වූ එකම සාක්ෂිය යමක් මකන ලද බවට වූ සලකුණු පමණක් බව අධිකරණය සොයා ගන්නා ලදී. මෙම කරුණු මත පදනම්ව 'නීතිය මගින් ප්‍රකාශිත පටිපාටිය අනුව' යමින් බලන කල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) (2) වගන්තීන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ (1979 අංක 15 දරණ පනත) 32 වන වගන්තිය හා සම්බන්ධ කළ විට අත්අඩංගුවට ගැනීම් (හා රඳවා තබා ගැනීම්) සිදු විය යුත්තේ විශ්වාස කළහැකි පැමිණිල්ලක් හෝ "..... තොරතුරක්" හෝ "සාධාරණ සැකයක්" හෝ මතය. "හුදු සැකය" යන්න නීතියෙන් අනුමත කරන්නේ නැත. මෙහිදී පැමිණිලිකරු සිය විශ්වාසවන්තභාවය ඔප්පු කිරීමට ඔහුගේ වෙනත් ගමන් ලේඛන ගණනාවක් ඉදිරිපත් කර ඇත. එහෙයින් මෙම අත්අඩංගුවට ගැනීමත්, රඳවා තබා ගැනීමත් තුළින් පැමිණිලිකරුගේ 12(1), 13(1) 13(2) වගන්ති මගින් ප්‍රකාශිත මූලික අයිතිවාසිකම් කඩවූ බව තීරණය කරන ලදී. ශිරාණි බණ්ඩාරනායක විනිසුරුතුමිය මෙහිදී,

> *"අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ නිලධාරීන් සැකයකින් තොරවම අවශ්‍ය විමර්ශන කිරීමට බලය ලත් පුද්ගලයන්ය.... එසේ වුවත්, මෙම අවස්ථාවේදී පැමිණිලිකරුගේ විශ්වාසනීයත්වය සාධනය කිරීමට කරුණු තිබියදීත් වගඋත්තරකාර නිලධාරීන්ගේ ක්‍රියාවන් විදේශ රැකියාවට යන මගියෙකු කෙරේ ඇති ආකල්ප නිසා නොතකා හැරීමකට ලක් කර ඇති බව පෙනී යයි."*[57]

56. 2003.05.30 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) අංක. 646/2001.
57. ශිරාණි බණ්ඩාරනායක විනිසුරුතුමිය තීන්දුවේ 8 වන පිට (අගවිනිසුරු සරත් එන්. සිල්වා හා පී. එදුස්සූරිය විනිසුරුතුමාගේ එකඟත්වයෙන්).

<u>සුජීව අර්ජුන සේනාසිංහ එදිරිව ගාමිණී කරුණාතිලක සහ වෙනත් අය[58]</u>

ව්‍යවස්ථාවේ 70 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුව කල් තැබූ ජනාධිපති ඒ හා 86 වගන්තිය හා ජනමත විචාරණ පිළිබඳ පනතේ (1981 අංක 7 දරණ) දෙවන වගන්තිය අනුව නව ව්‍යවස්ථාවක් රටේ ජාතික අවශ්‍යතාවයද යන්න තීරණයට ජනමත විචාරණයක් යෝජනා කළාය.

ඉන්පසු පාර්ලිමේන්තුව කල් තැබීමට විරුද්ධව විපක්ෂයේ පුද්ගලයන් හා කණ්ඩායම් පාර්ලිමේන්තුව නැවත අරඹා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන ලෙසට විරෝධතා ව්‍යාපාර වල නියැලිණි. මෙම විරෝධතා රැලියේ දී රැලියට සහභාගී වූවන් විසුරුවා හැරීමට පොලිසිය තැත් කළ අවස්ථාවේ දී සිය මෝටර් රථයට යා ගත නොහැකි වූ පුද්ගලයෙක් පොලිසිය ගිති අවි පාවිච්චි කිරීමේ දී තුවාල ලැබීය. පසුව ඔහු රෝහල් ගත කෙරිණි.

කරුණු පරීක්ෂා කර බැලීමේදී අධිකරණය සොයාගනු ලැබුවේ මෙම වෙඩි තැබීම රැස්වූවන් විසුරුවා හැරීම අරමුණු කර හෝ යම් වරදක් වැළකීමට හෝ පසෙක වූවන්ගේ ආරක්ෂාව සලකා හෝ කරන ලද්දක් නොවන බවයි. එසේම එය පොලිස් දෙපාර්තමේන්තුවේ නීතින්ට ද පටහැනි වීමකි. මෙවන් තත්ත්වයක් තුළ එම විරෝධය නීති විරෝධී එකකැයි අවංකව පිළිගැනීම තුළින් පමණක් වෙඩි තැබීම සමා කිරීමක් හෝ එහි වගකීම් අඩු කිරීමක් සිදු නොවේ. පැමිණිලිකරු ඉහළ අණමත අත්අඩංගුවට ගෙන එසැණින්ම නිදහස් කරන ලදී. මෙම අධිකරණ තීරණයේ හරය රැදී පවතින්නේ විරෝධතාව නීති විරෝධී හා පැමිණිලිකරු එයට කැමැත්තෙන් සහභාගී වූවකු වුවත්,

> *"මෙවන් තත්ත්වයක් තුළ වුවද පතරොම් දමූ තුවක්කු පාවිච්චිය (විශේෂයෙන් දණහිසෙන් ඉහළට එල්ල කළ) අසාධාරණ, සාධනීය නොවී, ප්‍රමාණාත්මකභාවයෙන් පිට සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝගයන්ට පටහැනිව කරන ලද්දකි යන කරුණ මතය. (පොලිස් ආඥා පනතේ 78 හා 79 වගන්ති ප්‍රකාරව)"*[59]

පැමිණිලිකරු සිය මෝටර් රථයට යාම වැළකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (ඌ) ව්‍යවස්ථාව යටතේ සඳහන් නිදහසේ එහා මෙහා යාමේ අයිතිය

58. 2003.03.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) අංක. 431/2001.

59. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරු (ගුණසේකර හා විග්නේස්වරන් යන විනිසුරුතුමන්ලාගේ එකඟත්වයෙන්).

උල්ලංඝනය කිරීමක් වන බවයි. බලය ඇති ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියාගේ අණ මත අනෙකුත් නිලධාරීන් වෙඩි තැබීම ඇරඹීමත් ඉන් පැමිණිලිකරුට තුවාල සිදුවීමත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියේ සඳහන් පරිදි කෲර හා අමානුෂික වධ හිංසාවලින් වැළකීමේ නිදහස උල්ලංඝනය කිරීමකි. එසේම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට අණ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වගන්ති යටතේ වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.

අධිකරණය මගින් කරන ලද සෙසු වැදගත් විනිශ්චයන් පහතින් දක්වා ඇත.

1. ජනමත විචාරණ පනතේ 45 වන වගන්තියෙන් නීති විරෝධී විරෝධතා, රැස්වීම් සීමා කිරීමකට ලක් කර ඇත ද ව්‍යවස්ථාවේ 14(1) (අ) සහ 14(1) (ආ) 15 වන වගන්තිය හා සම්බන්ධ කොට සලකා බලන කල එම සීමාවන් සාධාරණ විය යුතු අතර 27(2) (අ) හි සඳහන් රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූල ධර්ම සහ මූලික යුතුකම් හා ජනතා පරමාධිපත්‍ය පිළිබඳ සඳහන් 3 වන වගන්තියත් 4(ඇ) වගන්තියත් ව යමින් උක්ත වගන්තීන් අර්ථ නිරූපණය කිරීම පටු විය යුතුය. මින් අදහස් කරන්නේ ජනමත විචාරණ පනතේ 45 වන වගන්තියේ සඳහන් සීමා කිරීම් අදාළ වන්නේ වලංගු ජනමත විචාරණ යෝජනාවක් පිළිබඳ වලංගු නිවේදනයක් කරන ලද අවස්ථා වලදී පමණි යන්නයි.
2. 35 වන වගන්ති ප්‍රකාරව ජනාධිපතිවරයා ලෙස ධූරය දරණ කවර වූ හෝ තැනැත්තකු විසින් පෞද්ගලික තත්ත්වයේ ලා හෝ නිල තත්ත්වයේ ලා හෝ කරන ලද්දක් සම්බන්ධයෙන් කිසිම අධිකරණයක නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු වුවත් ඔහුගේ රාජකාරීමය කටයුතු අධිකරණමය පරීක්ෂණයට විවෘතය. මෙහිදී පාර්ලිමේන්තුව කල් තැබීම නිවේදනය සහ ජනමත විචාරණය පිළිබඳ යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා ජනමත විචාරණ පනත හා අනුගතද යන්න සලකා බැලීමේ බලය අධිකරණයට පවතී.

3. පාර්ලිමේන්තුව කල් තැබීම හා සමගම ජනමත විචාරණයක් යෝජනා කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 හා 43 වගන්ති යටතේ පාර්ලිමේන්තුව සතු බලතල ක්‍රියාත්මක කිරීමේ හැකියාව පාර්ලිමේන්තුවට අහිමි විය. දේශපාලන ප්‍රශ්න යන තර්කය මත එම නිවේදනය පරීක්ෂා කිරීමෙන් අධිකරණය වැළකී සිටියේ නම් එය නීතියේ ආධිපත්‍යය හැල්ලුවට ලක් කිරීමකි.

4. ජනමත විචාරණයක් පැවැත්වීමේ යෝජනාව ජනමත විචාරණ පනතේ 2(2)(අ) යන වගන්තියේ සඳහන් කොන්දේසි තෘප්ත කළේ නැත. එහි සඳහන් විකල්ප පිළිතුරු අනාගත ආණ්ඩුවේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පැහැදිලි, විස්තරාත්මක, අර්ථාන්විත සැලැස්මක් නොවීය.

## 3. සමාජ-ආර්ථික අයිතිවාසිකම් විෂයෙහි ලා අධිකරණමය ප්‍රතිචාරයන්

මානව හිමිකම් විෂයෙහි ලා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් අවධාරණයක් කොට ඇත. කෙසේ වෙතත්, පුනරීක්ෂණ කාල පරාසයන් තුළ 12 වන වගන්තිය යටතේ, සමාජ ආර්ථික අයිතීන් පිළිබඳ ද මානව හිමිකම් විෂයේ වර්ධනයක් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දු කීපයකදීම පෙනී යයි.

***අධ්‍යාපන අයිතිය සහ සිය රුචිකත්වය අනුව රැකියාවක් කිරීමේ අයිතිය.***

***<u>නදීකා හේවගේ සහ තවත් අය එදිරිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් අය</u>***[60]

මෙම නඩුකරයේදී පැමිණිලිකරුවන්ගේ වාසියට දෙන ලද කැබිනට් තීන්දුවකටද පටහැනිව යමින් ඔවුන්ට ඔවුන්ගේ උසස් පෙළ ප්‍රතිඵල මත වෛද්‍ය හා පශු වෛද්‍ය පාඨමාලාවන්ට ඇතුළත් වීම ප්‍රතික්ෂේප කෙරිණි. කළ යුතු විෂයන් ගණන වෙනස් වීම, ශිෂ්‍යයන් ඇගයීමට ලක් කළ පදනම, ලියාපදිංචි වීමට අදාළ වර්ෂය කවරේද යන කරුණු සම්බන්ධයෙන්

60. 2003.08.08 ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 627/2000.

2001/2002 හා 2002/2003 අධ්‍යයන වර්ෂවල විශ්ව විද්‍යාල ඇතුළත් වීම් පටිපාටිය විෂයෙහි සංකීර්ණතා හා අස්ථිරතා ඇතිව තිබිණි. කෙසේ හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති මෙම කරුණු පැමිණිලිකරුවන්ට අවාසිදයක වන අන්දමින් අගය කිරීමට ලක් කොට තිබිණි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නීති අර්ථ නිරූපණය කිරීමේ අවස්ථාව එම කොමිෂන් සභාවට ලබා දී තිබුණද අධිකරණය,

> *"මෙහිදී උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය කුඩා ශිෂ්‍යයන් සංඛ්‍යාවක් දීර්ඝකාලීන මහන්සිය තුළින් ලබා ගන්නා ලද්දක් බවත්, වාසනාව හෝ අවස්ථාව යන කරුණු මත ලැබෙන්නක් නොවන බවත් අනිවාර්යයෙන්ම සිහි තබා ගත යුතුය"* යනුවෙන් ප්‍රකාශ කළේය.[61]

<u>ජාත්‍යන්තර න්‍යායන් හා රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූල ධර්මය හා මූලික යුතුකම්වල ආභාසය මත කරන ලද අර්ථ නිරූපණ.</u>

පැමිණිලිකරුවන්ට වාසිවන අන්දමේ අර්ථ නිරූපණයක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නීතිවලට ලබා දුන් එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමා එම තීරණයට පාදක කර ගත්තේ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන්[62] පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 13.2(ඇ) වගන්තියයි. එම වගන්තියේ ප්‍රකාරව "හැකි සෑම ක්‍රමයකින්ම හැකියාවන්ට අනුගතව උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ හැකියාව සැමට සමානව විවර කළ යුතුය". 29 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූල ධර්ම හා මූලික යුතුකම් පරිච්ඡේදයේ විධිවිධාන අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් මඟින් ක්‍රියාත්මක කරවා ගත නොහැකි වුවද 27(2) (ඌ) වගන්තිය අනුව නූගත්කම සහමුලින්ම තුරන් කිරීම සහ "සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකදීම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්ථා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම" රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූල ධර්ම හා මූලික යුතුකමින් මාර්ගෝපදේශ ලබාගෙන ඇත.

---

61. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමන් (වීරසූරිය හා ජයසිංහ විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).
62. ඉහත, 2 සටහන.

<u>අයිතිවාසිකම් ප්‍රදානය කිරීමේ මූල ධර්මය - (උසස්) අධ්‍යාපන විෂයෙහි ලා නිරූපණය කර දක්වීම</u>

උක්ත අගයන් මත පදනම්ව, උසස් අධ්‍යාපනය සම්බන්ධ අදළ නීතිත් අධිකරණය මෙසේ නිරූපණය කරන ලදී.

> "උසස් අධ්‍යාපන වරම් වඩාත් විවෘත කිරීමේ ශ්‍රී ලංකාවේ වගකීම යන කරුණ මත අර්ථ නිරූපණයන් කළ යුතුය. එසේම එම අවස්ථා විවර කිරීම අන් කරුණක් මත නොව ගුණාත්මක බව මත කළ යුතුය. එය ලියාපදිංචි සිසුවෙකුට උසස් අධ්‍යාපනය සඳහා පසු වසරකට අවස්ථාව විවර කිරීමට විකල්පයක් ලබා දීමේ අයිතියක් ලෙස සලකනු විනා සුදුවක් සේ සැලකීමෙන් වැළකිය යුතුය. මෙහිලා අවස්ථා විවර කිරීම සීමා කරනු වෙනුවට ගුණාත්මක බව මත පදනම්ව අවස්ථා විවර කිරීම වැඩි කළ යුතුය."[63]

උසස් අධ්‍යාපනයේ විධිවිධාන පිළිබඳ සාධාරණත්වය සලකා බැලීමේදී "විශ්ව විද්‍යාල ඇතුළත් කිරීම් සාධාරණ විය යුතුවා පමණක් නොව සාධාරණ බව පෙනීමද අවශ්‍ය බව" දක්වන ලදී.[64]

මෙයට ප්‍රථම නඩුකරයකදී ප්‍රකාශිතව තිබූ මෙම මූල ධර්මය ටී. බී. වීරසූරිය විනිසුරුතුමන් කනකරත්න සහ තවත් අය එදිරිව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය[65] යන නඩුකරයට යොදා ගන්නා ලදී. මෙහිදී වග උත්තරකාර ආයතනය පුනර් විභාගයක් සඳහා ප්‍රායෝගික පන්ති වලට සහභාගි වීමට පැමිණිලිකරුවන්ට නොදෙන බවට වූ ආකල්පය අසාධාරණ බව තීරණය කරන ලදී. එයට හේතුව වූයේ මෙවන් සමාන අවස්ථාවන් වලදී ප්‍රායෝගික පුහුණු පංතිවලට සහභාගී වීමට ඇතැමුන්ට අවස්ථාව දී තිබීමයි.

---

63. ප්‍රනාන්දු විනිසුරුතුමන්, 61 සටහන, 7 වන පිටුව, ඉහත.

64. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමන්, ඉහත, 60 වන සටහන.

65. 2003.12.03 හා 2003.10.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 263/2003 (එම්. ඩී.එච්. ප්‍රනාන්දු හා සී.වී. විග්නේස්වරන් විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).

ප්‍රමාණාත්මකභාවය පිළිබඳ මූල ධර්මය නැවත තහවුරු කිරීම

උක්ත සඳහන් පරිදි ප්‍රායෝගික පංතිවලට සහභාගි වීමට අවස්ථාව ප්‍රතික්ෂේප කර පැමිණිලිකරුවන්ගේ අධ්‍යයන වාර්තාවල "අසමත් ලකුණු" අන්තර්ගත කිරීම ගැටලු සහගත විභාගයට නොපැමිණි පැමිණිලිකරුවන් අරභයා ප්‍රමාණාත්මකභාවය ඉක්මවූ පියවරක් ලෙස සැලකිණි.

පද්මනාත් එදිරිව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය[66]

මෙම නඩුකරයේදී පැන නැගී කරුණ වූයේ පැමිණිලිකරු වගඋත්තරකාර ආයතනයේ මෙන්ම විශ්ව විද්‍යාලයකට ලියාපදිංචිව සිටීමයි.

ප්‍රතිවිරුද්ධ වරණයන් පිළිබඳ නීතියේ අදාළත්වය. Contra Preferentium

ඇතුල් වීමට අපේක්ෂිත සිසුන්ගෙන් අයදුම්පත් කැඳවූ වගඋත්තරකාර ආයතනයේ පුවත්පත් දැන්වීමට අනුව "විශ්ව විද්‍යාලයක, අනුබද්ධ විශ්ව විද්‍යාලයක හෝ කාර්මික විද්‍යාලයක අභ්‍යන්තර සිසුවකු ලෙස පාඨමාලාවක් හදාරණ අයෙකු වීම මෙම ආයතනයට ඇතුළත් වීමට නුසුදුසුකමක් වේ." පැමිණිලිකරු පළමුව වගඋත්තරකාර ආයතනයේ ලියාපදිංචි වී දෙවනුව රුහුණු විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වි ඇත. එහෙත් පැමිණිලිකරු විශ්ව විද්‍යාලයේ දේශන වලට සහභාගී වූ බවට සාක්ෂි නොමැත. "හුදෙක් ලියාපදිංචි වීමක්" පමණක් "පාඨමාලාවක් හැදරීමක්" ලෙස ගත නොහැකි බව ටී.බී.වීරසූරිය විනිසුරු[67] තීරණය කරන ලදී.

> "මෙහි සංදිග්ධතාවයක් පැවතුණද දැන්වීම සකස් කිරීමට වගකීම දරනු ලබන්නේ වගඋත්තරකරුවන් නිසා ප්‍රතිවිරුද්ධ වරණයන් පිළිබඳ රීතියට අනුව පැමිණිලිකරුගේ වාසියට අර්ථ නිරූපණය කළ යුතුය."[68]

අතිසි විධිවිධාන - ස්වාභාවික යුක්තිය උල්ලංඝනය කිරීමේ පැතිකඩයන්

ප්‍රථමයෙන් එසැණින් බලපැවැත්වෙන ලෙස පැමිණිලිකරුගේ ලියාපදිංචි වීම අවලංගු කළ (අධිකරණය මේ වනවිටත් මේ පියවර වැරදි බව තීරණය කර

---

66. 2003.12.03 හා 2003.10.17 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 273/2003.
67. එම්.ඩී.එච්. ප්‍රනාන්දු සහ විග්නේස්වරන් විනිසුරුවන්ගේ එකගත්වයෙන්.
68. තීන්දුවේ 5-6 පිටු වලදී.

ඇත.) වගඋත්තරකාර ආයතනය ඉන්පසු ඔහුට ප්‍රතිවිරුද්ධ කරුණු දක්වීමට පැවසීය. පැමිණිලිකරුගේ අයිතීන්ට බලපාන පරිදි කරණ ලද මෙම අවලංගු කිරීම ක්‍රියාකාරී තීරණය වූ අතර ඉන්පසු කරුණු දක්වීමට අවස්ථාව සැලසීම ස්වභාවික යුක්තිය උල්ලංඝනය කිරීමක් බව අධිකරණය තීරණය කළේය.[69] මෙහිදී වීරසූරිය විනිසුරු විවාදත්මක ක්‍රියාකාරීත්වය සහ පක්ෂග්‍රාහීත්වය පිළිබඳ සංකල්පය අතර සබඳතාව හඳුනා ගත්තේය.

> *"යම් තීරණයක් ගත් පසු සාධාරණ පදනමක් මත වුවද පූර්ව පක්ෂග්‍රාහීත්වයන්ගේ පැවැත්ම නිසා එය වෙනස් කිරීම අපහසුය."*[70]

*__සිරිමල් සහ තවත් අය එදිරිව සමුපකාර තොග වෙළඳ සංස්ථාව සහ තවත් අය.__*[71] __- සේවා දීර්ඝයන් ලබා ගැනීම පිළිබඳ අයිතිය.__

මෙම නඩුකරය සේවා දීර්ඝයක් ලබා ගැනීම සම්බන්ධ වූවකි. එය විශ්‍රාමික වයස වන අවුරුදු 55 න් පසු සේවා දීර්ඝයන් දීම සෞඛ්‍යමය හා විනයානුකූල පදනම් මත වන බවට වන චක්‍රලේඛනයක්ද ආයතන සංග්‍රහයේ වගන්ති මතද බැඳී පවතී. මෙහිලා සාමාන්‍යයෙන් සිදු කෙරෙන්නේ වසරක කාල සීමාවකට එම සේවා දීර්ඝයක් ලබා දීමයි. පැමිණිලිකරු මෙම නඩුකරය ඉදිරිපත් කළේ නෛතික අපේක්ෂාව පිළිබඳ න්‍යාය තුළ පිහිටාය.

__නෛතික අපේක්ෂාව පිළිබඳ න්‍යායේ අවකාශය-එහි හරවත් අන්තර්ගතයන්ට පිළිතුරක්__

මෙම මූල ධර්මයේ සීමාවන් විෂයෙහි එංගලන්තයේ පවතින ව්‍යාකූලතා සැලකිල්ලට ගත් ඒ.බී.වීරසූරිය විනිසුරුතුමන්[72] උපදේශයන්ගේ මද භාවයක් හේතුවෙන් පටිපාටියක සාධාරණත්වය බිඳ වැටුණු විටකදී පැමිණිලිකරුට ලද හැකිව තිබූ සේවා කාලයන් නොලැබී යාමෙන් වූ උල්ලංඝනය සැලකීමට ගෙන ප්‍රමාණාත්මක මුදලක් වන්දි වශයෙන් ගෙවීම කළ යුතු බව තීරණය කළේය. මෙය පැමිණිලිකරුගේ සාරාත්මක අන්තර්ගතයන්ගේ ද ඇතුළත්

69. වීරසූරිය විනිසුරු, 7 වන පිට, එම.
70. එම.
71. 2003.08.08 ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 445/2002.
72. එස්.එන්. සිල්වා, අගවිනිසුරුතුමන් හා අමීර් ඉස්මයිල් විනිසුරුතුමන් එකඟත්වයෙන්.

නීතිමය අපේක්ෂාවන් උල්ලංඝනයකට ලක් වූ බව ව්‍යංගයෙන් පිළිගැනීමකි. (මෙහිලා පැමිණිලිකරුගේ සේවය දීර්ඝ කිරීමට වගඋත්තරකරුට නියෝග නොකළද)[73]

විනිසුරුතුමාගේ තීරණයේ පූර්වභාගයේ ද මෙම එළඹීම පිළිබඳ ලකුණු දක්නට ඇත. එහිදී,

> "නෛතික අපේක්ෂාව සාරාත්මක නම් එහිදී තත්ත්වය වෙනස්ය. එවන් අවස්ථාවන්හි දී ප්‍රථම ප්‍රතිපත්තීන් යටතේ යමෙකුට හිමිවිය යුතු සාරාත්මක වාසි ඔහුට ලබාදෙන ලෙස රාජ්‍ය අධිකාරීන්ට පැවසීමේ හැකියාව අධිකරණයට විවෘතය."[74]

සාරාත්මක නෛතික අපේක්ෂාව පිළිබඳ න්‍යාය මෙම විනිසුරුතුමන් පහත අන්දමින් දක්වා ඇත.

> "රාජ්‍ය අධිකාරීන්හි නිදහස සීමා කිරීම හේතුවෙන් මෙම න්‍යාය යම්තාක් දුරකට විවාදයට තුඩු දෙන බවක් පෙනී යයි. කෙසේ වුවත්, නිලධාරීන් දුන් පොරොන්දු මත සිට විශ්වාසය තබා එම විශ්වාසයන් බිඳීමට ලක්වූ පුද්ගලයන්ට යම් සහනයක් ලබා දීමද ඒ හා සමානවම අවශ්‍ය කරුණකි. නෛතික අපේක්ෂාව හා අභිමතය සීමා කිරීම පිළිබඳ නීතිය අතර, කිසිදු විසංවාදී බවක් නොමැත. මන්දයත්, අභිමතය සීමා කිරීම පිළිබඳව සැලකීමේදී එය සිදු කරනු ලබන්නේ පොදු සුභසාධනය අන් අන්දමේ ක්‍රියාවක් බලාපොරොත්තු නොවනතාක් පමණක් වීම නිසාය."[75]

<u>තඩුකරය තුළින් පැන නගින වෙනත් කරුණු - විකල්ප පිළියම්වල ප්‍රයෝජනය.</u>

මෙහිදී සමූපාකාර තොග වෙළඳ සංස්ථා පනතේ 26 වන වගන්තිය යටතේ කම්කරු විනිශ්චය සභාවකට කරන ලද පැමිණිල්ලක් හෝ බේරුම්කරණයක්

---

73. තීරණය අනුව පැමිණිලිකරු සේවා දීර්ඝයක් වෙනුවට වන්දි ඉල්ලා ඇතද යන්න පැහැදිලි නොවේ.

74. ඉල්ලා සිටින ලද සහනය වූයේ සේවා දීර්ඝයකි. වන්දිය එම අපේක්ෂිත සහනයන්ට හිලව්වකි. (විකල්පයක් ලෙස වන්දි ඉල්ලා නැත්නම්) එවිට එය ගිවිසගත් සැහීමකට පත්වීමක් බවට පත්වනු ඇත.

75. තීරණයේ 11 වන පිටුව, ඉහත, 71 වන සටහන.

මගින් මෙය සඳහා පිළියම් ලද හැකිව තිබුණි යන කරුණ අභියෝගයට ලක් වූයේ නැත. එසේ වුවත් ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය හා 126(2) වගන්ති ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති බලතල යටතේ පිළියම් ලබා ගැනීමට පැමිණිලිකරුට මෙය බාධාවක් නොවේ. වීරසූරිය විනිසුරුතුමන් ප්‍රකාශ කළේ,

> *"සෙසු නීතීන් අභිබවා ඇති ඉහළම උත්තරීතර නීතිය ව්‍යවස්ථානුකූල වගන්තීන් වීම හේතුවෙන් වෙනත් පිළියම් ලබා ගත හැකි තත්ත්වයන් තුළදී පවා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ උල්ලංඝනය වීමට ආසන්න වීමක් පිළිබඳ සහන ඉල්ලීමේ හැකියාව පැමිණිලිකරුවන්ට ඇත."*[76]

<u>සතොස සේවකයන් කෙරේ ආයතන සංග්‍රහයේ අදාළත්වය - රාජ්‍ය සේවයේ විශ්‍රාම යාමේ වයස</u>

රාජ්‍ය සේවයේ සියලුම සේවකයන්ගේ විශ්‍රාම යාමට වයස ආයතන සංග්‍රහයේ පස්වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය ප්‍රකාරව තීරණය කරනු ලබන බවට ප්‍රකාශිත මූල ධර්මයක් පවතී. කෙසේ වෙතත්, වග උත්තරකරුවන් විශ්‍රාම යාමේ වයස සම්බන්ධයෙන් පළවන වගඋත්තරකරු හෝ අමාත්‍යංශය එළඹි තීරණයක් ක්‍රියාත්මක කිරීමට සැකසූ එකඳු චක්‍රලේඛනයක්[77] පවා ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුවන් අසමත් විය.

*<u>ද සිල්වා එදිරිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව</u>*[78]

කොළඹ දිස්ත්‍රික්කයේ උසස් පෙළ අපේක්ෂිකාවක් ව උසස් පෙළ විභාගයෙන් නීති පීඨයට ඇතුළත් වීමට අපොහොසත්ව කලා පීඨයට ඇතුළත් වූ පැමිණිලිකාරිය නීති පීඨ ශිෂ්‍යයකු හා ස්ථාන මාරු කිරීමට උත්සාහ දැරීය.

ඇය හා සමාන තත්ත්වයේ වූ තවත් සිසුවකුට එහෙත්, "කබඩි ක්‍රීඩාවේ අති දක්ෂ වීමේ" පදනම මත (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නීති මත පදනම්ව) පැමිණිලිකරුට වඩා අඩු ලකුණු සංඛ්‍යාවක් ලබා සිටියදීත්

---

76. එම, නඩු තීන්දුවේ 25 වන පිටුව.
77. කෙසේ හෝ වගඋත්තරකරුවන් වයස අවුරුදු 55 දී විශ්‍රාම යායුතු බව ප්‍රකාශ කළ චක්‍රලේඛනයක් මත පදනම් විය.
78. 2003.01.10 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR)133/2002.

මාරු කිරීම සිදු කර ගැනීමට අවස්ථාව සලසා දී තිබිණි. නීති පීඨයේ පීඨාධිපති තවත් සිසුවෙකුට අවස්ථාවක් ඇති බව පවසද්දීත් පැමිණිලිකාරියගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. අධිකරණය පැමිණිලිකාරිය වෙනස් අන්දමේ සැලකීමකට බඳුන් කරන ලද බව තීරණය කළේය. මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ අංග කීපයක් සඳහන් කිරීම වටී.

<u>රාජ්‍ය ආයතන වලට ප්‍රමාණවත් මාර්ගෝපදේශයන්ගෙන් තොරව අභිමතානුසාරී බලය පැවරීමේ ඇති භයානක බව.</u>

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අත් පොතේ 18(ආ) පරිච්ඡේදයේ, ජාතික හා අන්තර්ජාතික ක්‍රීඩාවන්වල දක්ෂතාවයන් ප්‍රදර්ශනය කළ එහෙත් සාමාන්‍ය පටිපාටිය යටතේ ලකුණු සුළු ප්‍රමාණයක් මදි වීම හේතුවෙන් ඇතුළත් වීමට නොහැකි වූ සිසුන් ප්‍රතිශතයක් පාඨමාලාවන් හැදෑරීමට ඇතුළත් කරගත හැකි බව දක්වා ඇත.

අධිකරණය තීරණය කළේ,

> *"මේ සඳහා ලබා දී ඇති නිර්ණායකයන් අපැහැදිලි වීම හේතුවෙන් සිය අභිමතය මත පමණක් තේරීම් සිදු කිරීමට ඇති හැකියාවක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට රඳවා ඇති බවයි. තවද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මෙසේ ලබා දී ඇති බලතල අසාධාරණ අන්දමින් පාවිච්චි නොකරනු ඇති බවට තහවුරු කරන මාර්ගෝපදේශ වගන්තීන් ද නොමැති බවයි."*[79]

මෙම බලතලවල අසාධාරණ ස්වරූපය වඩාත් පැහැදිලි වන්නේ ජාතික හා ජාත්‍යන්තර තලයේ කබඩි ක්‍රීඩා කළ සිසුවාට මෙම මාරුවීම කර ගැනීමට අවස්ථාව සලසා දුන්නේ කෙසේද යන්න පෙන්නුම් කර නොමැති වීමයි.

<u>විනිවිද පෙනෙනභාවය පිළිබඳ වගකීම සම්බන්ධ උපමාන</u>

නීති පීඨයේ පීඨාධිපති විසින් සිය දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සියලු වර්ෂයන්හිදී ඔවුන් අපේක්ෂකයන් තෝරා ගැනීමට යොදා ගත් නිර්නායක විවෘතව ප්‍රසිද්ධියට පත් කළ යුතුය යන යෝජනාව අධිකරණය සම්පූර්ණයෙන් පිළිගත්තේය.

79. තීන්දුවේ 4 වන පිටුවේදී (එදුස්සූරිය හා යාපා විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).

## සමාජ ආර්ථික අයිතිවාසිකම් විෂයෙහි ලා මූලික අයිතිවාසිකම්වල පරාසය පුළුල් කළ තවත් වැදගත් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු

මෙම පරිච්ඡේදයේ පරීක්ෂණයට ලක් කළ තීරණයන් මෙන්ම 2003 වසරේ කරන ලද තවත් තීරණ කීපයකින් සමාජ-ආර්ථික අයිතිවාසිකම් හි පරාසය පුළුල් කරන ලදී.

*අර්ජුන රණතුංග එදිරිව ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ තවත් අය*[80]

ගැසට් පත්‍රයේ පළකළ අමාත්‍යංශ රෙගුලාසියක් (ප්‍රථමයෙන් වූ රෙගුලාසියක් සංශෝධනය කරමින්) මගින් පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනවල සාමාජිකයන්ට ක්‍රීඩා සංගම්වල නිලයන් දැරිය නොහැකි බවට කළ තීරණය අසාධාරණ හා අයුතු අන්දමින් දැඩි බව තීරණය කෙරිණි. මෙම රෙගුලාසිවල අරමුණ ක්‍රීඩා අංශය දේශපාලන බලපෑමෙන් විමුක්ත කිරීම වුවත් එය ස්වයං විසංවාදීත්වයක් බව සොයා ගන්නා ලදී.[81] පැමිණිලිකරු (පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු)[82] ගොනු කළ අයිතිවාසිකම් පෙත්සමට 12(1) සහ 14(1)(උ) වගන්ති ප්‍රකාරව අවසරය ලැබිණි.

ස්ථාන මාරු කිරීමට හේතු දක්වීමේ වගකීම

***දයාසේන එදිරිව බින්දුසාර සහ තවත් අය***[83] නඩුකරයේදී හේතු ඉදිරිපත් නොකරමින් හුදෙක් පරිපාලන කරුණු මත (රාජ්‍ය සේවකයකු) පොත් තබන්නකු ස්ථාන මාරු කිරීම 12(1) වගන්තිය උල්ලංඝනය කිරීමක් බව තීරණය කරන ලදී. 12(1) වගන්ති ප්‍රකාරව ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් හේතු දක්වීම පසුව මූල ධර්මයක් ලෙස ප්‍රතිශ්ඨාපනය කෙරිණි.[84]

---

80. 2003.01.10 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 133/2002.
81. ජේ.ඒ.එන්. ද සිල්වා විනිසුරුතුමන්ගේ තීරණය (අගවිනිසුරු එස්.එන්. සිල්වා හා වීරසූරිය විනිසුරුමාගේ එකඟත්වයෙන්).
82. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු නායක.
83. 2003.01.29 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 583/2001.
84. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමාගේ තීරණය (ගුණසේකර හා යාපා විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).

<u>වැඩ බලන නිලධාරීන් (තත්ත්වාකාර) උසස්වීම් සඳහා සලකා බැලීමේ වගකීම</u>

***සේනානායක සහ අරුණ එදිරිව ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම සහ තවත් අය***[85] යන නඩු කරයේදී තමන් වැඩ බැලූ ඉහළ තනතුරු වලට පත්කිරීම් සිදු කිරීමේදී පැමිණිලිකරුවන් පිළිබඳ සැලකීමක් කර නොතිබිණි. ආයතනයේ පසුගිය ක්‍රියාකාරකම් (ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු පත්වීම සිදු කිරීම) වලට පටහැනිව යමින් පරිබාහිර පුද්ගලයන් පත්කරන ලදී. මෙම පුරප්පාඩු පිළිබඳ දැන්වීමක් පවා කරනු නොලැබිණ.

මෙය 12(1) වගන්තිය උල්ලංඝනය කිරීමක් බව තීරණය කරනු ලැබිණි. පසුගිය ව්‍යවහාරයන් තෝරා ගැනීමේ උපමානයන් විෂයෙහි මූල ධර්මයක් ලෙස මතුව ඇති බව සලකන ලදී.[86]

<u>කැබිනට් මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණයන් නැවත බැලීමට ඇති හැකියාව</u>

***ඔගස්ටින් පෙරේරා සහ තවත් පැමිණිලිකරුවන් දෙදෙනෙක් එදිරිව රිචඩ් පතිරණ සහ තවත් අය***[87] නඩුකරයේදී සිය වැටුප් තලවල පසුදතම් කරන ලද වෙනස්කමක් කරන ලෙස විදුහල්පතිවරුන් විසිපස් දෙනෙකු ඉල්ලා සිටින ලදී. මන්ද විශ්‍රාමික ගුරුවරුන් සම්බන්ධ වැටුප් විෂමතා පසුකාලීනව නිවැරදි කරන ලද පදනම මත.

කැබිනට් මණ්ඩලය මෙහිලා වගකියතු ලබන්නේ පාර්ලිමේන්තුවට පමණක් නිසා අතෘප්තියට පත් කොටසකට වැටුප්වල වෙනස්කමක් නොකිරීමට ගත් තීරණය කැබිනට් මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණයක් නිසා අධිකරණයට එම තීරණය නැවත සලකා බැලිය හැකි බවට වූ තර්කය ප්‍රතික්ෂේප කළ අධිකරණය,[88]

---

85. 2003.01.29 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 510/2001.
86. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමන්ගේ තීරණය (වීරසූරිය සහ ද සිල්වා විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).
87. 2003.01.30 ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 453/454/1997 හා 390/99.
88. එම්.ඩී.එච්.ප්‍රනාන්දු විනිසුරුතුමන්ගේ තීරණය (ගුණසේකර හා වීරසූරිය විනිසුරුතුමන්ගේ එකඟත්වයෙන්).

> "42 වගන්තිය යටතේ ජනාධිපතිත් 43 වන වගන්තිය යටතේ කැබිනට් මණ්ඩලයත් පාර්ලිමේන්තුවට වගකියන බව සැකයෙන් තොර සත්‍යයකි. කෙසේ වුවත්, ව්‍යවස්ථානුකූලව 'ප්‍රතිපත්ති' හා සම්බන්ධ වන විධායක තීරණයන් පවා, විශේෂයෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් නැවත සලකා බැලීමේ බලය ඇති එකම ආයතනය පාර්ලිමේන්තුව බව මින් අදහස් නොවේ"[89] යනුවෙන් තීරණය කළේය.

එක් අවස්ථාවක ගන්නා ලද තීරණ තුළින් "ප්‍රතිපත්ති" බිහි වීමක් සිදු නොවේ.

මෙම තීරණයේ තවත් වැදගත්කම් පවත්නේ අධිකරණය ඉදිරිපත් කරන ලද යෝජනා තුළය:

> "කෙසේ වෙතත්, මෙම නඩුකරයේ ප්‍රකාශිත තීරණය - එනම් 1 වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ට කළ නව වැටුප් තලයන් අතීතයට බලනොපාන බව එම අවස්ථාවට පමණක් අදාළ වන අතර කොපමණ නිර්මාණශීලීව පුළුල් කළ ද 'ප්‍රතිපත්තියක්' නොවේ".[90]

වීරසේකර එදිරිව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්[91]

මෙම තීරණය තුළින් 12(1) වගන්තිය තවදුරටත් පුළුල් වීමක් සිදු කරනු දකිය හැකි විය. බෙහෙත් පිළියෙල කරන්නකු උසස් වීමක් සඳහා අයදුම් කළේය. ඇය අයදුම් කරන අවස්ථාවේ සුදුසුකම් උපමානයන්හි සඳහන් කරුණු සපුරා නොතිබුණ ද ලිඛිත විභාගයට ඉදිරිපත් වන අවස්ථාව වන විට ඒවා සපුරා තිබිණි. ඇයට විභාගයට පෙනී සිටීමට අවස්ථාව සලසා දී තිබුණු අතර ඇගේ අයදුම්පතද සැලකීමට ගනු ලැබිණි. මෙහිලා අධිකරණ අර්ථ නිරූපණය තුළින් ව්‍යංග නියෝජනය, ප්‍රතිබන්ධනය හෝ සත්‍යාංජනය තුළින් නෛතික අපේක්ෂාවක් ඇති වීමේ අවස්ථාව පැහැදිලි කෙරේ. එම කාල පරාසයේදී පරිපාලනමය අපහසුතා හේතුවෙන් සියලු අයදුම්පත් සලකා

---

89. තීරණයේ 8 වන පිටුව.

90. එම.

91. 2003.04.04 ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 86/2002.

බැලිය නොහැකි වූ බවට වගඋත්තරකාර පාර්ශවයෙන් කරන ලද තර්කය අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිණි.[92]

## අබේරත්න එදිරිව සීමාසහිත ජනතා පොහොර සමාගම සහ තවත් තිදෙනෙක්.[93]

මෙය චෝදනා පත්‍රයක් හෝ විධිමත් විනය පරීක්ෂණයකින් තොරව සිය රාජකාරි අතහැර ගිය බවට සලකා සේවයෙන් පහ කරන ලදී. පැමිණිලිකරුට අවස්ථාවක් ලබා දුන්නේ නම් ඔහුට විරුද්ධ චෝදනා වලින් නිදහස් වීමේ හැකියාව ලද හැකිව තිබිණි. එනයින් ගත් කළ ඔහුව සේවයෙන් නෙරපීම වැරදි සහගත පටිපාටියක් මෙන්ම 12(1) වගන්තිය උල්ලංඝනය කිරීමකි. ශ්‍රේෂ්ඨාධිකරණය නැවත වතාවක් 12(1) වගන්තියේ සඳහන් පටිපාටිමය අන්තර්ගතය ප්‍රතිශ්ඨාපනය කළේය.

## ධනු ඉදිකිරීම් පුද්ගලික සමාගම සහ තවත් අයෙක් එදිරිව මාතලේ නගර සභාව සහ තවත් අය[94]– ප්‍රසිද්ධ ටෙන්ඩර් පටිපාටිය පිළිබඳ මූල ධර්මයන්

මෙම නඩුකරයේදී පැමිණිලිකරු කියා සිටියේ අවම ටෙන්ඩරය තමා ඉදිරිපත් කරද්දීත් අන් අයෙකුට එය ලබා දුන් බවත් එනිසා ඔහුගේ 12(1) වගන්තිය ප්‍රකාර මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත්ය. ඉදිරිපත් වූ කරුණු මත පැමිණිලිකරුගේ නඩුකරය ඔප්පු වූ බව අධිකරණය තීරණය කරනු ලැබූ අතර එහිදී මූල ධර්ම ගණනාවක් ද යොදගනු ලැබිණි. ඒවා පහත දක්වේ,

### නිශ්ප්‍රභ නොකරන ලද තීරණයකට ලැබෙන අවසානාත්මක බව

පළමුව මෙම ටෙන්ඩරය පැමිණිලිකරුට ලබාදී තිබුණි. (සීමිත වගකීම් සමාගම) එම තීරණය අවලංගු කොට හෝ සංශෝධනය කොට නොතිබූ බැවින්, එය අවසානාත්මක විය.

---

92. ජේ.ඒ.එන්. ද සිල්වා විනිසුරුතුමා (එම්.ඩී.එච්. ප්‍රනාන්දු සහ යාපා විනිසුරුතුමන්ලාගේ එකඟත්වයෙන්).

93. 2003.05.23 ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 311/2000.

94. 2003.10.13 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 461/2001. එම්.ඩී.එච්. ප්‍රනාන්දු විනිසුරුතුමන්ගේ තීරණය (යාපා හා විග්නේස්වරන් විනිසුරුවන්ගේ එකඟත්වයෙන්).

<u>සියලුම පාර්ශ්වයන්ට කන්දිය යුතු බවට වන නීතිය උල්ලංඝනය කිරීම</u>

ටෙන්ඩරය පැමිණිලිකරුට ලබා දීමට කරන ලද තීරණය වෙනස් කිරීමක් හෝ නැවත හැරවීමක් නොකර එය අනෙකෙකුට ප්‍රදානය කිරීමට ගන්නා ලද තීරණය එක් එක් පක්ෂයට කන් දිය යුතු බවට වූ නීතිය උල්ලංඝනය කිරීමකි.

<u>ප්‍රසිද්ධ ටෙන්ඩර් සම්බන්ධ මූල ධර්මයන් උල්ලංඝනය කිරීම</u>

තෝරාගත් එක් ටෙන්ඩර්කරුවකු හා එළඹි ගිවිසුමක් මගින් කිසිදු ආකාරයක තරඟයකට ඇති ඉඩ සම්පූර්ණයෙන්ම ඇහිරීම නිසා ප්‍රසිද්ධ ටෙන්ඩර් පාලනය කරන මූල ධර්මයන් උල්ලංඝනය වීමක් සිදු වේ.

## 4. ඡන්දය දීමේ අයිතිය තහවුරු කිරීම

***<u>තවනීදන් එදිරිව දිසානායක සහ තවත් අය, තංගවේල් සහ තවත් අයෙක් එදිරිව දිසානායක සහ වෙනත් අය, අලගසුන්දරම් සහ තවත් අයෙක් එදිරිව දිසානායක සහ තවත් අය</u>***[95]

මඩකලපුව සහ වන්නි දිස්ත්‍රික්කවල පිහිටි "මුද නොගත් ප්‍රදේශයන්හි" පදිංචි ඡන්ද දායකයන් (2001 පාර්ලිමේන්තු මැතිවරණයට ඡන්දය පාවිච්චි කිරීමට මෙම ප්‍රදේශ "මුද ගනු" ලැබිණ.) සිය ඡන්ද මධ්‍යස්ථාන වෙත යා නොහැකි පරිදි "හමුද බාධක" වලදී වළකන ලදී. මේ සඳහා හේතුව ලෙස සඳහන් කළේ 'එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් ඇතුල් වීම වැළකීමේ ආරක්ෂණ පියවරක් යන්නයි.' මෙය 2000 ඡන්දයේදී පාලක ජනතා සන්ධානය ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ලද ජයේ ඡන්දදායකයන්ට ලබා දුන් නිදහසට පටහැණිව ක්‍රියා කිරීමක් විය.

අධිකරණය කැඳවූ සහ ඡන්ද කොමිසමෙන් ඉදිරිපත් කළ වාර්තා, පත්තර වාර්තා, වගඋත්තරකරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ අනුව මෙම ඇතුල් වීමේ මාර්ගයන් වසා දැමීමේ තීරණය සඳහා සද්භාවී එකක් නොව බාහිර අවශ්‍යතා මත පදනම්ව ගන්නා ලද්දක් බව තීරණය විය. ව්‍යවස්ථාවේ සඳහන් වගන්ති අතරින් 15(1), (6), (7) හා 170 ද පොදු ආරක්ෂාව

95. 2003.03.25 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC (FR) 20/2002, 25/2002 සහ 26/2002 (ඒකාබද්ධ කොට අසන ලද).

පිළිබඳ ආඥාපනත, ත්‍රස්තවාදය වැළැක්මේ පනත (1979 අංක 48) සලකා බැලූ අධිකරණය මෙම ක්‍රියාවෙන් පැමිණිලිකරුවන්හට 14(1)(උ) වගන්තියේ සඳහන් නිදහසේ එහා මෙහා යාමේ අයිතිය උල්ලංඝනය වූ බව තීරණය කරන ලදී.

14(1) (උ) වගන්තිය යටතේ ප්‍රකාශිත මූල ධර්මයන්

ප්‍රථමයෙන් "පොදු ආරක්ෂාව" සහ "ජාතික ආරක්ෂාව" සහ "මහජන සාමය" යන දෙකරුණේ වෙනසක් ඇති බව ප්‍රකාශ කළ අධිකරණය පොදු ආරක්ෂාව යන්නෙන් පටු කරුණක් ගම්‍යමාන වන බව ප්‍රකාශ කළේය. මෙහිදී පොදු ආරක්ෂාව පිළිබඳ ආඥාපනත හෝ එම පනතේ ස්ථානය ගන්නා වෙනත් අණ පනත් ද ව්‍යවස්ථාවේ XVIII පරිච්ඡේදයේ සඳහන් කොට ඇති පාර්ලිමේන්තුවේ පාලනය ආරක්ෂා කිරීමේ කරුණු හා අනුගතය.

*"ව්‍යවස්ථානුකූල බවට ප්‍රථමයෙන් පරීක්ෂා කරන ලද පූර්ණ පනත්' වලින් හැරුණු කොට මූලික අයිතිවාසිකම් විෂයේ සීමා පැනවීමේ හැකියාව 15 වන වගන්තියෙන් වළකා ඇත. මෙහිලා විධායක ක්‍රියාවන් (රීතීන් මගින්) සීමා කිරීමේ අවකාශයන් නොමැත. 15(1) හා (7) වගන්ති වලට අවසරය ඇති එකම විකල්පය නම් ජාතික ආරක්ෂාව පිළිබඳ ආඥාපනත යටතේ කරන ලද හදිසි අවස්ථා නියෝගයන්ය. මන්ද ඒවා ව්‍යවස්ථානුකූල සීමා කිරීම් හා පාලනයට විෂයව ඇති හෙයිනි...."*

දෙවනුව, ජාතික ආරක්ෂාව අරභයා හෝ සාධාරණ ඡන්දයක් පැවැත්වීම වැළැක්මේ අරමුණින් මෙම "මුදගත් ප්‍රදේශ වලට" ඇතුළු වීමට තැත් කිරීම සද්භාවීව වැළැක්ම සහ මෙම අවස්ථාවේ වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකරකම්වල ඇති වෙනස පෙන්වා දුන් අධිකරණය එවන් සොයා ගැනීමකට සාක්ෂිද නැති බව තීරණය කළේය.

එසේම මෙම නඩුකරයේ කරුණු අනුව 14(1)(අ) වගන්තිය යටතේ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීම කතා කිරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියද උල්ලංඝනය කිරීමක් ලෙසද තීරණය කරන ලදී. මෙම අවසන් තීරණයට එළඹීමේදී 27(2)(අ) හා 27(4) වගන්තිවල සඳහන් රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූල ධර්ම හා මූලික යුතුකම්හි ආධාරයද ලබා ගන්නා ලදී.

එසේම කාරණා දෙකක් මත මෙය 12(1) වගන්තිය යටතේ සුරක්ෂිත සමානාත්මතාවයේ අයිතිය උල්ලංඝනය කිරීමක් බවද සොයා ගන්නා ලදී. පළමුව රටේ වෙනත් ප්‍රදේශවල ඡන්ද දායකයන් හා සසඳ බලන කල පැමිණිලිකරුවන්ට අසමානව සලකා ඇති බව සොයා ගන්නා ලදී. දෙවනුව, අතළොස්සක් ඡන්ද දායකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමටත් ආරක්ෂිතව නිවසට යාමටත් (නීතියෙන් ප්‍රකාශ නැති අන්දමින්) අවසර දී ඇති අතර පැමිණිලිකරුවන්ගේ ඡන්දය දීමේ අයිතිය සුරැකීමට කිසිදු පියවරක් ගෙන නැත.

ඡන්දය දීමේ අයිතිය විෂයෙහි ලා තවත් වැදගත් සැලකිය යුතු දියුණුවක් පුණරීක්ෂණ මට්ටමේදී ද සිදු කර ඇත. එම වර්ධනයන් *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ආචාර්ය සරවනමුත්තු හා රොහාන් එදිරිසිංහ එදිරිව දිසානායක*[96] නඩුකරයේදී සවිස්තරාත්මකව සිදු කර ඇත. එහිදී රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූල ධර්ම හා ඡන්දය දේශපාලන පක්ෂ ප්‍රධානත්වය යන මූල ධර්මයට වඩා ඉදිරියෙන් සිටින බව පිළිගෙන ඇත.

## 5. නිගමනය

ඉහත සඳහන් කරුණු අනුව ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ අන්තර්ගත වගන්තීන් තුළින් මානව හිමිකම් විෂය ක්ෂේත්‍රයෙහිලා අදාළ වන ප්‍රවර්ධනාත්මක නීති විද්‍යාත්මක මූල ධර්ම හා න්‍යායන් විශාල ප්‍රමාණයක් 2003 වසරේදී ඇති වූ බව පෙනී යයි.

මෙම ඇතැම් නඩුකරයන් වලදී රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූල ධර්ම, අන්තර්ජාතික සම්මුතීන් හා න්‍යායන් මානව හිමිකම් විෂය ක්ෂේත්‍රය වඩා පුළුල් කිරීමට ආධාර කරගෙන ඇත. ඇතැම් නඩුකරයන්වල සිය වගකීම් නිසියාකාරයෙන් ඉටු කිරීමට ආධාර කරගැනීමටත් එසේම අනාගත වගකීම් වලින් මිදීමටත් අවශ්‍ය මාර්ගෝපදේශ ඉදිරිපත් කර තිබුණි. අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවල වැඩි වන්දියක් ගෙවීම වෙනුවට සෑහියක් පිරිනැමීමේ මූල ධර්මය විවිධාත්මකය.

මෙවන් වර්ධනයන් පැවතුණද තවදුරටත් කථාබහට ලක්කළ යුතු අංශ ඉතිරිව පවතී. උදහරණ වශයෙන්, වැදගත් ගැටලු වන පැමිණිලි වල පවතින,

96. 2003.03.27 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, CA/487/99, ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචන 26/2002 සහ CA/488/99, ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචන 27/2002.

අඩුපාඩු නිසා ඒවා ඉවත ලිය යුතුද,[97] ඉදිරිපත් කරන ලද කරුණු වල මදබව[98] වරද නිවැරදි කිරීමේ අවස්ථාව හා අඩුපාඩුව සැපයීම ව්‍යවස්ථාවේ 3, 4(ඉ) 4(ඈ) එක්ව ගත් කල මූලික අයිතිවාසිකම් විෂයෙහි ව්‍යවස්ථානුකූල අරමුණු හා තාක්ෂණික විරෝධතාවයන් ආදිය දක්විය හැකිය. අනෙක් වඩා වැදගත් කරුණු වන්නේ ජීවිතයේ ගුණාත්මකභාවය පිළිබඳ අයිතිය[99] හඳුනා ගැනීමත් ළඟම ඥතියාට හෝ යැපෙන්නාට (උරුමකරුවන් නොවන) ජීවිත අයිතිය උල්ලංඝනය වූ පුද්ගලයා වෙනුවෙන් නඩු පැවරීමේ හැකියාව හඳුනා ගැනීමයි.

මෙහි ලා සැලකිය යුතු තවත් අංශයක් වන්නේ මානව හිමිකම් පුළුල් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් විෂයේ උසුලන බලතල හා 140 වගන්තිය යටතේ අභියාචනාධිකරණයට හිමි රිට් ආඥා සම්බන්ධ බලතල තුළ සම්බන්ධතාවය තුළින් විශේෂයෙන්ම සමාජ ආර්ථික හා සංස්කෘතික අයිතීන් විෂයෙහිලා පුළුල් කිරීම මෙම අංශය සම්බන්ධයෙන් මේ වනතුරුත් කිසිදු අවධානයක් යොමු වී නැත.

12(1) වගන්තිය පුළුල් කිරීමේ ශ්‍රේෂ්ඨාධිකරණ පියවරයන් හැරුණු කොට අභියාචනාධිකරණ නඩුකරයක් වූ දෙස්තර කුනනාදන් එදිරිව යාපනය විශ්ව විද්‍යාලය සහ තවත් අය[100] තුළින්ද අධිකරණයේ මුල් පිරීමක් පැහැදිලි වේ. මූලික ස්වභාවයේ විරුද්ධතාවයක් ප්‍රතික්ෂේප කළ පී. විජේරත්න විනිසුරුතුමා ගිවිසුම් සම්බන්ධ කරුණකදී පවා ව්‍යවස්ථාවේ 140 වගන්තිය යටතේ රිට් ආඥාවක් ලබා ගත හැකි බව දක්වීය. මෙය අගය කළ යුතු නැඹුරුවක් ලෙස සැලකිය යුතුය.

මෙරටේ මානව හිමිකම් ආරක්ෂා කිරීම පුළුල් කිරීමෙහි ලා අධිකරණය සතුව අනාගත අභියෝගයන් තවදුරටත් පවතින බව අවසානයේ සඳහන් කළ යුතුය.

---

97. කනේසපිල්ලෙයි එදිරිව ලංකා බැංකුව සහ තවත් අය 2003.06.23 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා, SC(FR) 186/2002.

98. ගෑස් කන්වර්ශන් පෞද්ගලික සමාගම සහ තවත් අය 2003 ජනවාරි 13.

99. ශ්‍රියානි සිල්වා නඩුකරයේදී අධිකරණය විසින් විවෘතව තබන ලදී. ඉහත, 15 සටහන.

100. 2003.12.09 දිනැති අභියාචනාධිකරණ වාර්තා CA/1559/2003, තීන්දුව.

# VI

# ජාතික පොලිස් කොමිෂන් සභාව

ජේ.සී. වැලිඅමුණ*

## 1. හැඳින්වීම

මේ පරිච්ඡේදය තුළ දී ජාතික පොලිස් කොමිෂන් සභාව (ජා.පො.කො.ස) සහ වර්ෂ 2003 දී එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. මෙහිදී ජා.පො.කො.ස වේ නීතිමය විධිවිධාන ගැන මෙන්ම 2002 නොවැම්බර් ජාතික පොලිස් කොමිසම ස්ථාපිත කිරීම පටන් මතු වූ ප්‍රධාන කාරණා පිළිබඳව විමසා බැලේ. කොමිසම පිළිබඳව මහජන අපේක්ෂාවන් ඉහළ මට්ටමක පැවතියද සාමාන්‍ය අවබෝධය අනුව ජා.පො.කො.ස හි ක්‍රියාකාරිත්වයේ විෂය ප්‍රමාණය සීමිතය. මේ පරිච්ඡේදයෙන් බලාපොරොත්තු වනුයේ මේ සම්බන්ධව අදාළ කාරණා පැහැදිලි කිරීමක් කිරීමටයි.

## 2. ව්‍යවස්ථාමය ඉතිහාසය

### 2.1 බස්නායක කොමිසම - 1970

විශිෂ්ට සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සැදී ගරු එච්.එච්. බස්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් ඇති කළ කොමිසමක් විසින් 1970 ජූලි මාසයේ ආණ්ඩුකාරයා වෙත ඉදිරිපත් කරන්නට යෙදුණු සිය අවසාන වාර්තාව

---

* නීතිඥ

තුළින් පොලිස් සේවය වඩා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව තුළ පොලිස් පනතක් හඳුන්වා දීමට නිර්දේශ කළ අතර එය කෙටුම්පත් කර වාර්තාවට අමුණා තිබිණි. එකී කෙටුම්පත් කළ පොලිස් පනතේ 7 සිට 27 දක්වා වූ වගන්ති ස්වාධීන පොලිස් කොමිසමක් ස්ථාපිත කිරීම පිළිබඳ විධිවිධාන අඩංගුව පැවතුණි.[1] මෙකී නිර්දේශය සාධාරණීකරණය කිරීම ආකාර දෙකකට කැටිකළ හැක. පළමුවැන්න වනුයේ, පත්කිරීම්, උසස්කිරීම්, මාරුකිරීම් හා විනයානුකූල කාරණා හා කටයුතු කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව තුළින් සැලකිය යුතු ප්‍රමාදයක් සිදුවීමයි.[2] දෙවැනි කරුණ වනුයේ, පොලිසියේ ස්වාධීනත්වයට බලපාන අයුරින් පත්කිරීම් සහ උසස්වීම් දේශපාලන බලපෑම් වලට නතු වීමයි.[3] කොමසාරිස්වරුන් පැවසූ පරිදි "කාර්යක්ෂම පොලිස් සේවාවක් ලබා ගැනීම සඳහා පත්කිරීම්, මාරුකිරීම්, දඬුවම් කිරීම්, ඉවත්කිරීම් හා විනය කටයුතු පාලනය සඳහා වූ බලය පැවැරූ වෙනම අපක්ෂපාතී ආයතනයන් තිබිය යුතුය."[4] කොමිසම තවදුරටත් නිර්දේශ කළේ, විධායකය විසින් පොලිස් ප්‍රධානියාව අත්තනෝමතිකව ඉවත්කළ නොහැක්කා සේම ඒ සඳහා ඔප්පු වූ වැරදි හැසිරීම සම්බන්ධයෙන් මණ්ඩල දෙකට ඇමතිය යුතු බවයි.[5] පසුව කාලය ගත වුනද මෙකී නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කිසිදු රජයක් විසින් ව්‍යවස්ථාදායක පියවරක් නොගන්නා ලදී.

## 2.2 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - 1987

1987 දී හඳුන්වාදුන් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් පළාත් අතර බලය විමධ්‍යගත කළ අතර ඒ තුළ විශේෂයෙන් නීතිය හා සාමය අරක්ෂා කිරීම පිළිබඳ විධිවිධාන අඩංගු විය. බෙදුනු බලතල අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ පළමුවන පරිශිෂ්ටය යටතේ දක්වෙන නීතිය හා යථා පැවැත්ම සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීමද අඩංගුය. එසේම පොලිස්පතිවරයා, ජනාධිපතිවරයා විමසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තෙකු හා අග්‍ර විනිශ්චයකාර වරයාගේ නාමිකයෙක් යන අයගෙන් සමන්විත ජාතික පොලිස් කොමිෂන් සභාවක්ද විය. පොලිස්පතිවරයා නොවන අනෙක් ජාතික අංශයේ පොලිස්

1. පොලිස් කොමිසමේ අවසාන වාර්තාව, XXI කාලීන පත්‍රය, 1970, පිටුව 162.
2. ඉහත පරිදිම., 32 පරිච්ඡේදය.
3. ඉහත පරිදිම., 35 පරිච්ඡේදය.
4. ඉහත පරිදිම., 36 පරිච්ඡේදය.
5. ඉහත පරිදිම., 37 පරිච්ඡේදය.

සාමාජිකයන්ගේ උසස්කිරීම්, මාරුකිරීම්, සහ විනය පාලනයන් පිළිබඳ වගකීම ජාතික පොලිස් කොමිෂන් සභාවට හිමිවිය. එසේම එහි වගකීම වනුයේ, පළාත්බද අංශවල සහ ජාතික අංශයේ පොලිස් නිලධාරීන් බඳවා ගැනීමේ දී හා උසස් කිරීම් වලදී ඒකාකාරී පිළිවෙතක් පවත්වාගෙන යාමයි.[6]

තවද 13 වන සංශෝධනයට අනුව, පළාත්බද පොලිස් සේවා කොමිෂන් සභා ස්ථාපිත කිරීමත් ඒවා පළාත් නියෝජ්‍ය පොලිස්පති වරයා, ජනාධිපති විමසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තෙක් සහ පළාතේ ප්‍රධාන ඇමතිගේ නාමිකයෙක් යන අය ගෙන් සැදුම්ලත් විය යුතුය.[7] පළාත්බද පොලිස් සේවා කොමිෂන් සභාවන්හි වගකීම වනුයේ, පළාත් අංශයන්හි නිලධාරීන්ගේ මාරුකිරීම්, උසස්කිරීම් සහ විනය පාලනයන් සිදු කිරීමයි.

මෙකී පොලිස් කොමිෂන් සභා ස්ථාපිත කිරීමට විශේෂ වූ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දී තිබුණත් මේවන විටත් පළාත්බද පොලිස් කොමිෂන් සභා ස්ථාපිත කර නැත.

## 2.3 1990 පොලිස් කොමිෂන් සභා පනත

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ආනුෂංගිකව පොලිස් සේවයට බලපෑමක් වනු සඳහා පාර්ලිමේන්තුව විසින් 1990 අංක 01 දරණ, පොලිස් කොමිෂන් සභා පනත පැනවූ අතර එය 1990 ජනවාරි 23 වන දින සහතික කරන්නට යෙදුණි. කෙසේ නමුත්, මෙම පනත තවම ක්‍රියාත්මක වීමට පටන් ගෙන නැත.[8]

## 2.4 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ පොලිස් කොමිෂන් සභාව

අවුරුදු 30 කින් පසුව වුවද 1970 ඉදිරිපත් කළ බස්නායක කොමිෂන් වාර්තාවේ සලකා බැලූ ගැටලු තවමත් වලංගුය. විශේෂ වැදගත්කමකින් යුත් අවශ්‍යතාවයක් වනුයේ පොලිස් සේවයේ කාර්යක්ෂමතාවය සඳහා

---

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 01 වන පරිශිෂ්ටයේ 03 වන විෂයාංකය.
7. ඉහත පරිදිම., 04 වන විෂයාංකය.
8. පනතේ 01 වන වගන්තිය., ජනාධිපති ගැසට් පත්‍රයේ පළකර ප්‍රකාශ කරන දිනයේ සිට මෙම නීතිය ක්‍රියාත්මක වේ.

පොලිස් සේවය දේශපාලනික බලපෑම් වලින් නිදහස් විය යුතුය. පොලිසිය ඇතුළු රාජ්‍ය සේවය ඉහළ මට්ටමකින් දේශපාලනීකරණය වී ඇති අතර මේ තත්ත්වයෙන් සහනයක් ලබා ගැනීමට නිදහස් පොලිස් සේවයක් ඇතුළු ස්වාධීන රාජ්‍ය සේවයක අවශ්‍යතාවය සඳහා 2001 දී දේශපාලනික පක්ෂ, සිවිල් සමාජ සංවිධාන සහ පුද්ගලයන් විසින් ආණ්ඩුවට පීඩනයක් එල්ල කළේය. මේ පසුබිමට එරෙහිව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මේ පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ජාතික පොලිස් කොමිෂන් සභාවක් හඳුන්වා දීමට විධිවිධාන සලසා තිබිණි. කලින් ව්‍යවස්ථා තුළ පොලිස් කොමිෂන් සභා පිළිබඳ අදහස් තිබුණද 17 වන සංශෝධනය යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. මින්මතු එය ජාතික පොලිස් කොමිෂන් සභාව ලෙස හැඳින්වේ.

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් රටේ පාලකයින් ආකෘතිමය නවීකරණයන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇතුළු පවත්නා ආයතනික ස්ථම්භයන්ට වැදගත් වෙනස්කම් හඳුන්වාදුණි. මෙකී විධිවිධාන අඩංගු යෝජිත පනත අතිශය වැදගත්කමකින් සලකා හදිසි පනත් කෙටුම්පතක් ලෙස කෙටි කාලයකින් මහජන විවාදය සඳහා තැබීය. දීර්ඝ දුෂ්කර සැසිවාරයක් වූ නමුදු මුළු පනතම එක් දිනකදී පාර්ලිමේන්තු විවාදයට ගෙන සම්මත වූයේ විරුද්ධත්වයක් නොමැතිවය.[9] ඊට හේතුව ජා.පො.කො.ස. සම්බන්ධයෙන් පනත් කෙටුම්පත හඳුන්වා දීමේ අවශ්‍යතාවය පාර්ලිමේන්තුව තේරුම් ගැනීම විය හැකිය.

පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී අගයන් සහ රටේ යහපත් පාලනය සහ රාජ්‍ය සේවය දේශපාලනීකරණයෙන් මුදවා ගැනීමට 17 වන සංශෝධනය හඳුන්වා දුන් බව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මතය විය. එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි රත්නසිරි වික්‍රමනායක මහතා පනත් කෙටුම්පත හඳුන්වා දෙමින් සඳහන් කළේ කෙටුම්පත් කළ "1997 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" තුළද පොලිස්

9. කෙසේ නමුත්, දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ (TULF) විරෝධය හා ඉවතට ගියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ප්‍රමාණවත් ද්‍රවිඩ නියෝජනයන් නැති නිසාවෙන් සහ උතුරු නැගෙනහිර යුද්ධය පවතිද්දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් සාධාරණීකරණය කළ නොහැකි බව පවසාය. සිහළ උරුමය පක්ෂයේ එකම සාමාජිකයාද සහභාගී වීමෙන් වැළකී සිටියේ ය. 2001 සැප්තැම්බර් 24 - හැන්සාඩ්, 129 වෙළුම.

කොමිසම ඇතුළු ස්වාධීන කොමිෂන් සභා පිළිබඳ විධිවිධාන අඩංගු බවයි.[10] විරෝන් ප්‍රනාන්දු මහතා ලියවිල්ලකින් දක්වූයේ ඔහු නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂය ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් හඳුන්වාදීම සඳහා වූ විධිවිධාන පළමුව යෝජනා කළ බවයි.[11] පොලිස් කොමිසම ස්ථාපිත කිරීම සඳහා තියුණු විවාදයන් නොපැවති අතර කිසිදු සමාජිකයෙක් විවාදය අතරතුර බස්නායක කොමිෂන් වාර්තාව ගැන සඳහන් කළේ නැත. අධිකරණ අමාත්‍ය බැටී වීරකෝන් මහතා දක්වූයේ, නීතිය සහ යථා පැවැත්ම පවත්වා ගෙන යාම විධායකයේ වැදගත් අංගයක් බවත් එමනිසා පොලිසියේ ක්‍රියාවන් සඳහා විධායකය වගකිව යුතු බවත්ය.[12]

විවාදය ආරම්භයේදී විරුද්ධ පක්ෂය පනතට පක්ෂව ඡන්දය ලබා නොදීමට තීරණය කර තිබුණි. නමුත් රාත්‍රී 8.00 ට පමණ විවාදය අවසානයට ළඟාවෙත්ම, ප්‍රධාන පක්ෂ 3 එකඟ වූයේ කෙටුම්පතට නවීකරණයන් අඩංගු කරණ ලෙසටය. එහි නවීකරණයන් සිදු කළේ විවාදය ඒ වනවිටත් පවතිද්දීය.[13]

## 2.5 වෙන් වෙන් වූ ජාතික පොලිස් කොමිෂන් සභා - ව්‍යාකූලතාවයන්

ඉහත දක්වූ පරිදි වෙනස් ආකාර ජාතික පොලිස් කොමිෂන් සභාවන් දෙකක් ස්ථාපිත කිරීමට නීතිමය විධිවිධාන පවතින අතර ඒ දෙකම ජාතික පොලිස් කොමිෂන් සභාව ලෙස හඳුන්වයි. මෙකී කොමිෂන් සභා දෙක තුළ පවතින වැදගත් සමානකම් හා වෙනස්කම් මෙහිදී සඳහන් කිරීම උචිතය.[14]

---

10. 1997 ඔක්තෝබර් මස ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත ව්‍යවස්ථාමය යෝජනා පෙළෙහි (පැකේජයෙහි) 216 වන කෙටුම්පත් කළ වගන්තිය, ජාතික පොලිස් කොමසාරිස් වරයෙකුගේ (වර්තමාන පොලිස්පතිවරයාට සමාන) ප්‍රධානත්වය යටතේ ජාතික පොලිස් කොමිසමක් පිහිටුවීම යෝජනා කරයි. මින් අරමුණු කෙරුණු බලතල වර්තමාන ජා.පො.කො.ස. ට සමාන ය.
11. *හැන්සාඩ්*, 2001 සැප්තැම්බර් 24 - වෙළුම 24 හා 25.
12. *ඉහත පරිදිම.*, වෙළුම 129.
13. *ඉහත පරිදිම.*, වෙළුම 164 සහ 165. (රනිල් වික්‍රමසිංහ මහතාගේ කථාව).
14. මෙහි විස්තරාත්මක විශ්ලේෂණයක් ලබා දී නැත. 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ (9 වන උපලේඛනයේ, 1 වන පරිශිෂ්ටය) ජාතික පොලිස් කොමිෂන් සභා පනතෙහි (2, 5, 7 සහ 8 වන වගන්ති) සහ 17 වන සංශෝධනයෙහි (155අ, 155උ, 155ඔ, 155ඌ සහ 155ඕ වගන්ති) විධිවිධාන සැසඳීමක් මීට පදනම් වී ඇත.

ජා.පො.කො.ස (17 වන සංශෝධනය යටතේ ස්ථාපිත කළ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරනු ලබන සාමාජිකයන් 7 දෙනෙකුගෙන් සමන්විත වන්නාසේම 13 වන සංශෝධනය සමඟ කියවිය යුතු 1990 අංක 01 දරණ පොලිස් කොමිෂන් සභා පනත යටතේ වූ කොමිසම පොලිස්පතිගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අග්‍ර විනිශ්චයකාරවරයාගේ නාමිකයන් දෙදෙනෙකුගෙන් සෑදී ඇත. 17 වන සංශෝධනය නිර්මාණය කළේ ජා.පො.කො.ස ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට වන නමුත් 13 වන සංශෝධනයේ හෝ පොලිස් කොමිෂන් සභා පනතේ එවැනි අරමුණු පැහැදිලි කර නොමැත. නමුත් 17 වන සංශෝධනය යටතේ දී මෙන්ම පොලිස් කොමිෂන් සභා පනත යටතේ ද කොමිසමේ ක්‍රියාකාරිත්වයට බලපෑම් කිරීම වරදකි. (නමුත් දඬුවම් එකිනෙකට වෙනස් වේ.)[15]

කොමිෂන් සභා දෙකම පොලිස් නිලධාරීන් පත්කිරීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ ඉවත්කිරීම් පිළිබඳව කටයුතු කරන අතරතුර පළාත්බද අංශයන්හි පොලිස් සේවාවන්හි ඒකාකාරී බවක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. 13 වන සංශෝධනය යටතේ වූ කොමිසමට පළාත්බද පොලිස් කොමිෂන් සභා තීරණ වල අභියාචනා බලය ඇති අතර ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණ අවසාන තීරණය වේ. 17 වන සංශෝධනය යටතේ ජා.පො.කො.ස. වේ තීරණයන්ට පරිපාලන අභියාචනා විනිශ්චය සභාව වෙත අභියාචනය කිරීමේ හිමිකම ඇත.

තවත් ප්‍රධාන වෙනස්කමක් වනුයේ, 13 වන සංශෝධනය යටතේ පොලිසිය සෘජුවම විධායකය යටතට පමුණුවා ඇති අතර එමනිසා පාර්ලිමේන්තුවට උත්තර දීමට කිසිදු විශේෂ විධිවිධානයක් නොමැත. අනෙක් අතට 17 වන සංශෝධනය යටතේ ජා.පො.කො.ස. සෘජුවම වාර්තා හරහා පාර්ලිමේන්තුවට උත්තර දිය යුතුය. තවත් ලක්ෂණයක් වනුයේ 17 වන සංශෝධනය යටතේ වූ ජා.පො.කො.ස. හි මහජන පැමිණිලි සඳහා වූ යාන්ත්‍රණයන් පැවතියද 13 වන සංශෝධනය යටතේ එවැනි යාන්ත්‍රණයන් නොපැවතීමයි.

අවසාන වශයෙන් දැක්විය යුත්තේ, ජාතික පොලිස් කොමිෂන් සභාවන්හි පවතින නීතිමය විධිවිධානයන්හි පරස්පර විරෝධීතාවයන් පවතින බවයි.

15. 17 වන සංශෝධනයෙහි සඳහන් උපරිම දඬුවම වසර 7 ක සිර දඬුවම් සහ රුපියල් 100,000/- නොඉක්මවන දඩයකි. නමුත් පොලිස් කොමිෂන් සභා පනතෙහි දක්වා ඇත්තේ දඬුවම වසරක සිර දඬුවමක් සහ රුපියල් 5000/- ක දඩයකි.

1990 අංක 01 දරණ පොලිස් කොමිෂන් සභා පනත ක්‍රියාත්මක වුවහොත් එහි විධිවිධාන සහ 17 වන සංශෝධනයේ ජා.පො.කො.ස. වේ විධිවිධාන අතර සැබෑ සම්මතයන් ඇති වේ. කෙසේවෙතත්, ජා.පො.කො.ස. 17 වන සංශෝධනය යටතේ පැවරූ බලය යටතේ ක්‍රියාත්මක වුවද පොලිස් කොමිෂන් සභා පනත එසේ අනුගමනය කිරීමක් නොකරයි.[16] පවතින්නාවූ නීති තත්ත්වයන් තුළ ශ්‍රී ලංකාවේ පාලකයින් අර්බුදය අවම වන ආකාරයෙන් යෝග්‍ය පරිදි ජාතික පොලිස් කොමිෂන් සභා පනත අහෝසි කිරීම හෝ එය 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුකූල වන අයුරින් සංශෝධනය කළ යුතුය.[17]

## 3. ජාතික පොලිස් කොමිෂන් සභාවේ විශේෂ ලක්ෂණ

### 3.1 ස්වාධීනත්වය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් ජා.පො.කො.ස. සමන්විත වේ. සමාජිකයින් වසර තුනක ධූර කාලයක් සඳහා පත් කරනු ලබන අතර නැවත වාරයක් පත් කිරීමටද හැකියාව ඇත. සමාජිකයින් අත්තනෝමතිකව ඉවත් නොකිරීමද සහතික වී ඇති අතර ඉවත් කිරීමක් කළ යුත්තේ ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ පරිදිය.

සභාපති සහ සමාජිකයන් පාර්ලිමේන්තුව විසින් තීරණය කරන දීමනාවකට හිමිකම් කියන අතර එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තා සේම එය නිල කාලය තුළදී අඩු කළ නොහැකිය.[18] කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ලේකම්වරයෙකු හා වෙනත් නිලධරයන් කොමිෂන්

---

16. ජා.පො.කො.ස. වේ සභාපති සමග 2004 ජනවාරි 27 දින ජා.පො.කො.ස. කාර්යාලයේ පැවති සාකච්ඡාව.

17. නිදසුනක් ලෙස, 1993 අංක 60 දරණ දුම්රිය අධිකාරි පනත පාර්ලිමේන්තුව විසින් 1993 දෙසැම්බර් 15 සම්මත කර තිබුණ ද එය වසර 10 ක් යන තුරු ක්‍රියාත්මක නොවීය. එනමුත් ඊට අදාළ නීතිය, පනතෙහි 1 වන වගන්තිය ප්‍රකාර 2003 ජූලි 23 දිනැති අමාත්‍යවරයා විසින් නිකුත් කළ ගැසට් නිවේදනය මගින් බලාත්මක කරන ලදී. එසේම ජනාධිපතිවරයෙකුට පොලිස් කොමිෂන් සභා පනතෙහි 1 වන වගන්තිය අනාගතයේ ඕනෑම දිනයක බලාත්මක කිරීමට බාධාවක් නැත.

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(7) වගන්තිය.

සභාව සඳහා සිටිය යුතුය.[19] ජා.පො.කො.ස. වේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේය.[20]

බාහිර මැදිහත්වීම් වලින් නිදහස ආරක්ෂා වීම සඳහා 155(ඒ) ව්‍යවස්ථාවට අනුව එවැනි මැදිහත්වීම් දණ්ඩනීය වරදක් ලෙස හඳුන්වා දී ඇති අතර එහිලා අධිකරණ බලය සතු මහාධිකරණය ඉදිරියේ එන අතර වරදකරු කරනු ලැබූ විට රු. 100,000/- දඩයක් හා අවුරුදු හතක් සඳහා බන්ධනාගාරගත කිරීමක් කළ හැක. යම් තැනැත්තෙකු කවර වූවද ආකාරයකින් බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට උත්සාහ කරන හෝ අයුතු ලෙස මැදිහත් වන හෝ ජා.පො.කො.ස. වේ සමාජිකයෙකු වෙත එසේ බලපෑමක් කරන හෝ කිරීමට තැත් කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකාරයෙකු වේ. කෙසේ වෙතත්, සඳහන් කළ යුතු වන්නේ 155 (ඒ) තුළින් ජා.පො.කො.ස. වේ හෝ ඕනෑම කමිටුවක් සඳහා වූ බලපෑම් ආවරණය වුවත් 155 (ඒ) යටතේ පැවරූ බලතල මත ක්‍රියාකරන විට පොලිස්පති (හෝ වෙන නිලධාරියෙකු) දක්වා එම රැකවරණය ව්‍යාප්ත වී නැත. බලතල පිළිබඳව පහත 3.2 පරිච්ඡේදය සාකච්ඡා කරයි. ඒ අනුව තර්ක කළ හැක්කේ ජා.පො.කො.ස. වේ විධිවිධාන තවම දේශපාලනික මැදිහත්වීම් සඳහා හිඩසක් තබා ඇත්තේ තම බලතල පොලිස්පතිට හෝ වෙනයම් නිලධාරියෙකුට පැවරුවහොත්ය.

## 3.1.1. ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍යමය නිදහස

ආරම්භයේ සිටම ජා.පො.කො.ස. කාර්යක්ෂමව ක්‍රියා කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ සම්පත් නොපැවති බවට වාර්තා පැවතුණි. කෙසේ නමුත්, ජා.පො.කො.ස. වේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේය,[21] යන හේතුව නිසා ජා.පො.කො.ස. ට අවශ්‍ය අරමුදල් සඳහා පාර්ලිමේන්තුවේ ඡන්දය විමසීම අවශ්‍ය නොවේ. එමනිසා සම්පත් මඳ බව ජා.පො.කො.ස. වේ ක්‍රියාකාරීත්වයට බාධාවක් නොවේ.

මැතිවරණ කොමිෂන් සභාව සහ විගණකාධිපති වරයාවත් භුක්ති නොවිඳින මූල්‍යමය නිදහසක් 17 වන සංශෝධනය යටතේ ජා.පො.කො.ස ට හිමි වීම අනෙකුත් ආයතනයන්ට වඩා ජා.පො.කො.ස ට මූල්‍යමය නිදහසක් ලබා

19. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඇ වගන්තිය.
20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඉ වගන්තිය.
21. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඉ වගන්තිය.

දීමකි. කෙසේ නමුත්, ස්වාධීන ආයතනයන්හි අයවැය විශේෂ පාර්ලිමේන්තු කමිටුවකින් තීරණය කළයුතු වීමත් ජා.පො.කො.ස. වේ මූල්‍ය භාණ්ඩාගාරය විසින් පාලනය කළයුතු වීමත් පිළිගත හැකි තත්ත්වයකි.

## 3.2. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල

පොලිස්පති හැර සියලුම පොලිස් නිලධාරීන්ගේ පත්වීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනයන් සහ සේවයෙන් ඉවත්කිරීම් පිළිබඳ බලය ජා. පො.කො.ස.ට හිමිව ඇත. මෙකී බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් සිදු කළ යුතුය.[22] ජා.පො.කො.ස. වේ කමිටුවක් විසින් හෝ පොලිස්පතිවරයා හෝ පොලිස් නිලධාරියෙකු විසින් කරනු ලැබූ නියමයකින් අතෘප්තියට පත් පොලිස් නිලධාරියෙකුට ජා.පො.කො.ස. වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක.[23] ජා.පො.කො.ස වේ නියමයකින් අතෘප්තියට පත් පොලිස් නිලධාරියෙකුට පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචනයක් කළ හැක.[24]

කෙසේ නමුත්, පළාත්බද පොලිස් සේවා කොමිෂන් සභා ස්ථාපිත කළ පසු පළාත්බද පොලිස් සේවා පිළිබඳ අදාළ බලතල පළාත්බද කොමිෂන් සභා විසින් සිදුකරනු ඇත.[25]

සැලැස්මවල් ක්‍රමවත් කිරීම, ස්වාධීනත්වය තහවුරු කිරීම, සේවයේ කාර්යක්ෂමතාවය නැංවීම සහ ජාතික සහ පළාත්බද කොට්ඨාසයන් සඳහා අවශ්‍ය ආයුධ සහ පතරොම් ඇතුළු අනිකුත් උපකරණයන්හි ස්වභාවය සහ වර්ගය තීරණය කිරීම ඇතුළු පොලිස් කළමනාකරණයෙහි සියලුම කාරණා ජා.පො.කො.ස. විසින් තීරණය කළ යුතුය.[26] මෙය අවශ්‍ය වන්නේ පරිපාලනයේ ඒකභත්වයක් පවත්වාගෙන යනවා සේම පළාත්බද පොලිස් සේවයන්හි විධායක කාර්යයන් අතර, සමානත්වයක් ඇති කිරීම පිණිසය.

---

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ වගන්තිය.
23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඒ(1) වගන්තිය.
24. තවද වැදගත් කරුණක් වන්නේ මෙම ප්‍රතිපාදන මානව හිමිකම් පිළිබඳ අධිකරණ බලය ඉවත් කොට නොමැති බවත්, එබැවින් පීඩාවට පත් පොලිස් නිලධාරීන්ට ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය ක්‍රියාත්මක කරවා ගැනීමට ඇති අයිතිය පවතින බවත් ය.
25. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ(ආ) වගන්තිය.
26. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ(3) වගන්තිය.

ජා.පො.කො.ස. වේ බලතල තුළ මහජන පැමිණිලි බාරගැනීම සහ ඒවාට විධිමත්ව ක්‍රියාකිරීම ද ඇතුළත්ය. එමනිසා මහජන පැමිණිලි බාරගෙන ඒවා විමර්ශනය කිරීමද පොලිස් නිලධාරීන්ගේ හෝ පොලිස් සේවයෙන් අතෘප්තියට පත් පුද්ගලයන්ගේ පැමිණිලි බාරගෙන ඒවා විමර්ශනය කිරීම සඳහාද කාර්ය පටිපාටියක් ස්ථාපිත කිරීම ජා.පො.කො.ස. වේ වගකීමකි.[27] පැමිණිලි සඳහා වූ වර්තමාන යාන්ත්‍රණයන් පහත 5.2 ඡේදයේ සාකච්ඡා කරයි.

### 3.2.1 ජාතික පොලිස් කොමිෂන් සභාව සහ පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචන කිරීම

යම් පොලිස් නිලධාරියකු ගේ උසස් වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ ඔහු සම්බන්ධ විනය කාරණයන් පිළිබඳව ජා.පො.කො.ස. විසින් බලය පැවරූ පොලිස්පතිවරයාගේ හෝ, කමිටුවේ හෝ පොලිස් නිලධාරියාගේ නියමයකින් එකී පොලිස් නිලධාරියා අතෘප්තියට පත් වේ නම් ජා.පො.කො.ස. ට අභියාචනා කිරීම කළ හැක. ජා.පො.කො.ස. විසින් එම ආරම්භක නියමයන් වෙනස් කිරීම, මද වශයෙන් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැක.[28] යම් නිලධාරියෙක් උසස් වීමක්, ස්ථාන මාරුවක්, හෝ ඔහු සම්බන්ධ විනය කාරණයන් පිළිබඳ ජා.පො.කො.ස. වේ නියමයකින් අතෘප්තියට පත් වේ නම් ඔහුට 17 වන සංශෝධනය යටතේ ස්ථාපිත කළ පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචනා කළ හැක.[29] 2002 අංක 04 දරණ පරිපාලන විනිශ්චයාධිකාරි පනතේ දක්වෙනුයේ, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් 3 දෙනෙකුගෙන් විනිශ්චයාධිකාරය සමන්විත වියයුතු අතර එම සාමාජිකයන් රාජ්‍ය සේවයේ අවුරුදු 20 කට වඩා පළපුරුද්ද තිබෙන අය විය යුතුය. එසේ නැත්නම් නීති වෘත්තියේ අවුරුදු 10 ට වඩා පළපුරුද්දක් තිබෙන අය විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජා.පො.කො.ස. විසින් සිදුකරනු ලබන නියමයන් සම්බන්ධයෙන් අවසාන අභියාචනා ආයතනය වන්නේ පරිපාලන අභියාචනා විනිශ්චයාධිකාරියයි.[30] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සැකැස්ම සහ 17

27. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ(2) වගන්තිය.
28. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඒ(1) සහ (2) වගන්තිය.
29. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 වන වගන්තිය.
30. කෙසේ වුවද, මූලික අයිතිවාසිකම් පිළිබඳ 126 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති අධිකරණ බලය ඉවත් කොට නැත.

වන සංශෝධනයේ සාරය අනුව අයදුම්කරුවන් අතරින් අවංක සහ ආදර්ශමත් සේවා වාර්තා තබා ඇති පුද්ගලයන් පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත තෝරා ගත යුතුය. එමනිසා ඔවුන් ඔවුන්ගේ කාර්යයන් කිරීමේදී, නිදහස්ව, කාර්යක්ෂමව සහ 17 වන සංශෝධනයේ මූල ධර්මයන්ට අනුව ක්‍රියා කළ යුතුය. මෙකී පත්කිරීම් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබීම පමණටම එම පත්වීම් නිවැරදි පත්කිරීම් ලෙස අදහස් කළ නොහැකි වන්නේ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයේ අවංකභාවය බරපතල ලෙස ප්‍රශ්නගත වී ඇති හෙයිනි. 2003 පෙබරවාරි 01 වන දින වර්තමාන විනිශ්චයාධිකාරය පත් කළ අතර එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ නිගමනය කිරීමට තරම් දත්ත සහ තොරතුරු ප්‍රමාණවත් නොවේ.[31]

## 3.3 පාර්ලිමේන්තුවට වගකිව යුතුවීම.

බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජා.පො.කො.ස. පාර්ලිමේන්තුවට වගකිව යුතු අතර කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වාර්තාවක් ඒ ඒ වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.[32] ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති මූලික අයිතිවාසිකම් අධිකරණ බලයට යටත්ව ජා.පො.කො.ස. නීති කෘත්‍ය වලින් මුක්තිය ලබයි.[33]

ජා.පො.කො.ස. වේ ස්වාධීනත්වය පිළිබඳ එය ස්ථාපිත කරන අවස්ථාවේදී විවිධ අදහස් ඉදිරිපත් විය. එහිදී ප්‍රකාශ වූයේ ජා.පො.කො.ස. අමාත්‍යවරයෙකු යටතට නොදම්මොත් පොලිසියේ අංගයන් පිළිබඳව ජා.පො.කො.ස. යෝග්‍ය පරිදි පාර්ලිමේන්තුවට වගකීමට නොහැකි වනු බවයි.[34] ජා.පො.කො.ස. පොලිසියේ ක්‍රියාකාරි අංගයන් පිළිබඳ බලතල භුක්ති විඳින්නේ නම් මෙම විවේචනය යම්තාක් දුරට වලංගුය. අනෙක් අතට ඇමතිවරයෙකු හරහා පාර්ලිමේන්තුවට වගකිව යුතුවීම පිළිවෙත නම් එහිලා කිසිදු ආයතනයකට

---

31. විනිශ්චය සභාවේ සමාජිකයන් කලින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු. එස්.ඩබ්ලිව්.බී. වඩුගොඩපිටිය (සභාපති) ඩී.එම්. ආරියරත්න මහතා (සාමාජික) එස්.එම්.එම්.ගපූර් මහතා (සාමාජික).
32. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ක වගන්තිය.
33. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වගන්තිය.
34. බැට් වීරකෝන් මහතා, හැන්සාඩ්, 2001 සැප්තැම්බර් 24 වෙළුම 129; වාසි සෙනෙවිරත්න 2003 අප්‍රේල් 13, සන්ඩේ අයිලන්ඩ්.

ස්වාධීන විය නොහැක. ඒ අනුව ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ පවතින නිදහස් ආයතනයන්ගේ විධිවිධාන හා සැසඳීමේ දී ජා.පො.කො.ස. පිළිබඳව පාර්ලිමේන්තුව සාපේක්ෂ වැදගත් මතයක් ඇති කර ගැනීම අවශ්‍ය වේ.[35] පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වලට අනුව ජා.පො.කො.ස. පාර්ලිමේන්තුවට වගකිව යුතු වනවා සේම, උත්තර දිය යුතුය.

## 3.4 බලතල අභිනියෝජනය

යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම සඳහා ජා.පො.කො.ස. සතු බලතල පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධරයෙකු වෙත ජා.පො.කො.ස. විසින් පවරනු ලැබිය හැක.[36] එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.[37] බලතල පැවරීම පිළිබඳ කාරණාවන් පහත 4.2 ඡේදයේ සාකච්ඡා කරයි.

## 3.5 නීති කෘත්‍ය වලින් මුක්තවීම

ජා.පො.කො.ස. නීති කෘත්‍ය වලින් මිදීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල මුක්තියන් භුක්ති විඳියි. 155 (ඇ) ව්‍යවස්ථාවට අනුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා ඇති මූලික අයිතිවාසිකම් අධිකරණ බලයට යටත්ව කොමිෂන් සභාව හෝ එහි යම් කමිටුවක් විසින් කරනු ලැබූ යම් නියමයන් හෝ ගනු ලැබූ යම් තීරණයන් පරීක්ෂා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට හෝ කවර වුවද ආකාරයෙන් ඒ ගැන ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකාරයකට බලය හෝ අධිකරණ බලයක් නොමැත.

---

35. මීට සමාන ප්‍රතිපාදන මැතිවරණ කොමිසමෙහි (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)(3) වගන්තිය), මානව හිමිකම් කොමිසම (1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 30 වන වගන්තිය), රාජ්‍ය සේවා කොමිසම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) වගන්තිය) සහ අල්ලස් හෝ දූෂණ කොමිසම (1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ විමර්ශන පනතෙහි 26 වන වගන්තිය) හි පවතියි.

36. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ. වගන්තිය.

37. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ(2) වගන්තිය.

## 4. 2003 දී වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාවට එරෙහිව පවතින ප්‍රධාන විවේචන

2002 නොවැම්බර් මාසයේ ජා.පො.කො.ස. ප්‍රතිෂ්ඨාපනයේ සිටම ඒ පිළිබඳව නොයෙකුත් විවේචන පැවතුණි. ඒවායින් සමහරක් පාදක කර ගන්නේ ව්‍යුහමය අඩුපාඩු ගැනය. පහත දක්වෙනුයේ වර්ෂ 2003 දී ඇතිවූ ප්‍රධාන විවේචනයන්ය.

### 4.1 සාමාජිකයෙකු ගේ ඉල්ලා අස්වීම

2003 සැප්තැම්බර් මාධ්‍ය වාර්තා කළ පරිදි ජා.පො.කො.ස. වේ සාමාජික ආචාර්ය බී.එස්.විජේවීර ඉල්ලා අස්වූයේ ජා.පො.කො.ස. වේ සාමාජික ඊබට් මහත්මියගේ පිළිගත නොහැකි ක්‍රියාවක් උපුටා දක්වමිනි. එහිදී සඳහන් වූයේ, යම් තීරණයක් සඳහා පොලිස් නිලධාරීන්ගෙන් සලකා බැලූ එක් අයෙකු ඊබට් මහත්මියගේ සොහොයුරෙකු බවත්, ඒ බව ජා.පො.කො.ස. ට අනාවරණය නොකොට එම තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වී ඇති බවයි.[38] වාර්තා වන අන්දමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඇයගේ ක්‍රියාව පිළිබඳ පරීක්ෂා කිරීමට කමිටුවක් පසුව පත්කළ[39] නමුත් ඒ සමගම ඊබට් මහත්මිය ඉල්ලා අස්වූ බවයි.

ජා.පො.කො.ස. ට සාමාජිකයින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ගැන මේ සිද්ධියත් සමඟම අභියෝගාත්මක ප්‍රශ්න ගණනාවක් මතුවිය.

### 4.2 බලතල පැවරීම හා සම්බන්ධ කාරණා හා වර්තමාන තත්ත්වය

#### 4.2.1. ප්‍රථම බලතල පැවරීම

ජා.පො.කො.ස. සතු පොලිස් නිලධාරීන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, මාරු කිරීම්, විනය පාලනයන් සහ සේවයෙන් පහකිරීමේ බලය පොලිස්පතිවරයා හෝ පොලිස්පති විමසා වෙනත් පොලිස් නිලධාරියෙකුට හෝ පැවරීමට ජා.පො.කො.ස. ට හැකිය. තමන්ට ලැබී ඇති බලතල අනුව, 2003 මාර්තු 23 වන දින චක්‍ර ලේඛනයක් මගින් ජා.පො.කො.ස. පොලිස් නිලධාරීන්ගේ

---

38. *අයිලන්ඩ්*, 2003 සැප්තැම්බර් 7.

39. *සන්ඩේ ටයිම්ස්*, 2003 සැප්තැම්බර් 28.

මාරුකිරීම් පිළිබඳව නිශ්චිත බලතල පොලිස්පතිවරයා වෙත පැවරිය. පැවරූ බලතල පහත අයුරු වේ.

- සියලුම ශ්‍රේණිවල පොලිස් නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීමේ බලය. එසේ වුවද ජ්‍යෙෂ්ඨ ගැසට් කළ නිලධාරීන්ගේ හා පොලිස් ස්ථානයන්හි ස්ථානභාර නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම් ජා.පො.කො.ස. සමග එකඟතාවය ඇතිව කළ යුතුය.
- අතිකුත් ස්ථාන මාරු කිරීම් කොමිසම අනුමත කළ ස්ථාන මාරු කිරීම් පටිපාටිය අනුව කළ යුතුය.[40]

ජා.පො.කො.ස. ස්ථාපිත කළේ, පොලිස්පතිවරයා සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සතුව තිබූ විශේෂ පරිපාලන බලතල ඉවත් කිරීම සඳහාය. එමනිසා පොලිස් පරිපාලනය දේශපාලනික පීඩනයන්ට යටත් වියයුතු නොවේ. ජා.පො.කො.ස. බලතල පැවරූ එම බලතල ක්‍රියාත්මක වීමක් තවම නැත.

බලතල නැවත පොලිස්පතිට ලබාදීම පිළිබඳ දැඩි විවේචන එල්ල විය. එසේ නමුත් විශාල පොලිස් බලකායක් බලය පැවරීමකින් තොරව ජා.පො.කො.ස. මඟින් පමණක් පාලනය කිරීම අසීරු කටයුත්තකි. නිදසුනක් ලෙස, එඩ්වඩ් ගුණවර්ධන මහතා පහත අදහස දක්වීය.

> *"සැබැවින්ම මෙම අසීරු තත්ත්වය තුළ වූ ජා.පො.කො.ස... එයට විකල්පයන් නොමැති නිසා නැවත වරක් පොලිස් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රණයේ පිහිට පැතීමට සිදුවේ. මෙයින් සැබැවින්ම අදහස් වන්නේ ආපසු මුලින් සිටි තැනටම යන බවයි. පොලිස් නිලධාරීන් යළිත් දේශපාලනඥයින්ගේ වුවමනා එපාකම් ඉටු කිරීමට පෙළඹෙනු ඇත."*[41]

### 4.2.2 වර්තමාන බලතල

බලතල සංශෝධනය තුළින් මෙම විවේචනයට විසඳුමක් සෙවීමට ජා.පො.කො.ස. උත්සාහ දැරිය. 2003 ජූලි 30 වන ද ප්‍රසිද්ධ කළ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පෙර බලතල ජා.පො.කො.ස. විසින් අවලංගු කරන ලදී.

---

40. චක්‍රලේඛන අංක. 1703 / 2003 මාර්තු 26, ඇමුණුම් අ, 3 වන වගන්තිය.
41. එඩ්වඩ් ගුණවර්ධන, 'Crime, Code of Ethics and the Police Commission', අයිලන්ඩ්, 2003 ජුනි 29.

ඒ වෙනුවට පොලිස්පතිවරයා වෙත පැවරූ බලතල සීමා කරන අතරතුර සිය බලතල මහාධිකරණ විනිශ්චයකරුවෙකුගේ ප්‍රධානත්වයෙන් සමන්විත ත්‍රි පුද්ගල කමිටුවකට ලබාදෙන ලදී.[42] වර්තමාන බලතල හි සාරාංශයන් පහත දක්වේ.

(අ) ජා.පො.කො.ස. අනුමත කළ සැලැස්මවල් අනුව උප පොලිස් පරීක්ෂක ඇතුළු සහ ඊට පහළ ශ්‍රේණිවල නිලධාරීන්ගේ පත්වීම්, උසස් කිරීම් සහ ස්ථාන මාරුකිරීම් උප කමිටුව විසින් කළ යුතුය. කෙසේ නමුත්, හදිසි උවමනාවක් සහ විනය පාලනය අරමුණු කරගෙන ප්‍රදේශයේ හා පළාත තුළ ස්ථාන මාරුකිරීම් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකුට කළ හැක.[43]

(ආ) පොලිස් පරීක්ෂක සහ ඊට පහළ ශ්‍රේණිවල විනය පාලකයන් (වැඩ තහනම් කිරීම හා අස් කිරීම ඇතුළුව) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් සහ ගැසට් නිවේදනයේ උපලේඛනයේ පෙළ ගස්වා ඇති පැවරුම් ලැබූ අයට කළ හැක. සේවයේ හදිසි උවමනාව සහ විනය පාලනය අරමුණු කරගෙන පොලිස් නිලධාරීන් ස්ථාන මාරුකිරීම තුළ මෙකී බලතල අන්තර්ගතය.

ජා.පො.කො.ස. විසින් සියලුම බලතල පවරා නොමැති අතර පැවරූ එකම අවස්ථාව මෙය වේ. වෙනත් වචන වලින් පැවසුවහොත් ජා.පො.කො.ස. ඍජුවම පොලිස් පරීක්ෂක සහ ඊට ඉහළ ශ්‍රේණිවල පත්කිරීම්, උසස්කිරීම්, විනය පාලනයන් සහ ස්ථාන මාරුකිරීම් සිදු කරයි. පොලිස්පති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මේ බලතල ක්‍රියාත්මක කරනුයේ උප පොලිස් පරීක්ෂක සහ ඊට පහළ ශ්‍රේණි සඳහාය.

### 4.2.3. බලතල පැවරීමේ අභිලාෂයන්

ජා.පො.කො.ස. සතු බලතල පොලිස්පතිට පැවරීමට එක් හේතුවක් වන්නේ, වර්තමාන ජා.පො.කො.ස. වේ සාමාජිකයන් තුළ තාක්ෂණික දැනුම ඇති

42. කමිටුවේ සාමාජිකයන් වූයේ, සරත් ගුණතිලක මහතා (සභාපති), ජී.එන්.පතිකිරිකෝරළේ මහතා (සාමාජික) සහ කේ. කනපතිපිල්ලේ මහතා (සාමාජික).

43. 2003 ජූලි 30, අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2 වන වගන්තිය.

පුද්ගලයෙකු නොමැති වීමයි.[44] මෙම ප්‍රශ්නය නිරාකරණය සඳහා "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විශ්වාස කරන විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු" මීට ඇතුළත් කළ යුතුය යනුවෙන් තර්ක කළ හැක.[45]

ජා.පො.කො.ස. බලතල පොලිස්පතිවරයාට හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට පැවරීමේ දී දේශපාලනික මැදිහත්වීම් වර්ධනය වීම පිළිබඳ දැවැන්ත ප්‍රශ්න පැන නැඟී ඇත. මේ පැවරීමත් සමඟම පැවරීමෙන් ආවරණය වන පත්කිරීම්, උසස්කිරීම්, ස්ථාන මාරුකිරීම්, විනයානුකූල ක්‍රියාවන් සහ අස්කිරීම් පිළිබඳ ඍජුව පොලිස්පති කටුයතු කරයි. 155 (ඒ) ව්‍යවස්ථාවෙන් හඳුන්වා දී ඇති යාන්ත්‍රණය (ජා.පො.කො.ස. ට හෝ එහි කමිටුවකට මැදිහත් වීම වරදකි.) පොලිස්පතිට හෝ වෙනත් පොලිස් නිලධාරීන්ට අදාළ නොවේ. පොලිසියට දේශපාලනික මැදිහත් වීම් වැළැක්විය යුතුය යන ජා.පො.කො.ස. වේ ප්‍රධාන අදහසට පොලිස්පතිවරයාට හෝ වෙනත් පොලිස් නිලධාරීන්ට බලතල පැවරීම තරමක් පටහැනිය. අනෙක් අතට තර්ක කළ හැක්කේ කිසිදු පද්ධතියකට සම්පූර්ණයෙන්ම දේශපාලනික මැදිහත් වීම් අවසාන කළ නොහැකි අතර පොලිස් සේවයේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාවයට අගතියක් නොවන අයුරින් සුදුසු තුලනයක් කළ යුතුය.

ව්‍යවස්ථා 155(ඒ), ට වෙනස් ආකාරයෙන් 155(ඌ) ව්‍යවස්ථාව ජා.පො.කො.ස. ට සිය බලතල උපකමිටු වලට පැවරීමට හැකියාව ලබා දී ඇත. (ජා.පො.කො.ස. වේ සාමාජිකයන් ඇතුළත් නොවන) ඒවා ජා.පො.කො.ස. විසින් ස්ථාපිත කළ ක්‍රියා පිළිවෙළ අනුව කටයුතු කළ යුතුය. ඉහත විස්තර කළ, වර්තමාන පැවරීම්, ජා.පො.කො.ස. වේ, කමිටු වලට කළේ නම් මැදිහත් වීම් පිළිබඳ විවේචනයන් පැන නොනඟිනු ඇත.

## 5. පොලිස්පතිවරයා පත්කිරීම

17 වන සංශෝධනය යටතේ, පොලිසියේ ප්‍රධානියා වූ පොලිස්පතිවරයා පත්කිරීම සම්බන්ධයෙන්, ජා.පො.කො.ස. ට කිසිදු බලතලයක් නොමැත. සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම කැබිනට් මණ්ඩලයට පැවරී ඇති අතර එහිලා සිය පත්කිරීමේ බලතල ක්‍රියාත්මක කිරීමේදී "රාජ්‍ය

44. ජා.පො.කො.ස. පිළිබඳ පැවැත් වූ මහජන සාකච්ඡාවක් ගැන සඳහන් කරමින් අයිලන්ඩ් පත්‍රයෙහි පළ වූ කතුවැකිය, 2003 මැයි 3 වන දින.

45. රංජිත් අබේසූරිය මහතා, ජා.පො.කො.ස. වේ සභාපති - උපුටා දක්වා ඇත්තේ - වාසි සෙනෙවිරත්න මහතා, 2003, අප්‍රේල් 13 දිනැති සන්ඩේ අයිලන්ඩ් පුවත්පත.

සේවා කොමිෂන් සභාවේ අදහස් විමසීමෙන් පසු" එය කළ යුතුය.[46] පොලිස්පතිවරයා පත්කිරීම ජනාධිපතිවරයා මත පැවරී ඇති අතර එහිදී ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිර්දේශ කළ යුතුය.[47]

ජා.පො.කො.ස. සිය ප්‍රධාන බලතල වන පත්කිරීම්, උසස්කිරීම්, විනය පාලනයන් සහ සේවයෙන් පහකිරීම් ආදිය ක්‍රියාත්මක කිරීමේ දී පොලිස්පතිවරයාගෙන් විමසා එය කළ යුතුය.[48] පොලිස්පතිවරයා පත්කිරීමේ ක්‍රියා පිළිවෙළ සම්බන්ධව එකී විමසීම් තුළින් පොලිස්පතිවරයා පත්කිරීමේ පටිපාටිය පිළිබඳ ගැටලු මතු වී ඇත. "පොලිස්පතිගේ අවංකත්වය ප්‍රශ්න සහගත නොවනතාක් පොලිස්පතිවරයාගෙන් විමසීමෙහි ගැටලුවක් නොමැත. නමුත් එය ජා.පො.කො.ස. හි ස්වාධීනත්වයට පටහැනිය."[49] පොලිස්පතිවරයාගේ ස්වාධීනත්වය සහ අවංකත්වය ඉතා වැදගත් වන නමුත් 17 වන සංශෝධනය යටතේ අප්‍රසන්න කරුණක් වනුයේ පොලිස්පති පත්කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ජා.පො.කො.ස. වේ අදහස් විමසීමක් කළ යුතු නොවීම ගැටලු සහගත තත්ත්වයකි.[50]

2003 ඔක්තෝබර් 14 වන දින එවකට සිටි පොලිස්පති ටී.ඊ. ආනන්දරාජා මහතා විශ්‍රාම ගියේ දරුණු චෝදනා රාශියක් මැදය. ඊළඟ පොලිස්පතිවරයා ලෙස, නියෝජ්‍ය පොලිස්පති ඉන්ද්‍රා ද සිල්වා මහතාව ජනාධිපති කුමාරතුංග විසින් නිර්දේශ කළ නමුත් මෙම යෝජනාව පළමුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ප්‍රතික්ෂේප කළේ ඉන්ද්‍රා ද සිල්වා මහතා වඩාත්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා නොවූ බැවිණි. එවිට ජනාධිපතිනිය ඉන්ද්‍රා ද සිල්වා වැඩ බලන පොලිස්පති ලෙස පත් කළාය. එහිදී වාර්තා වූයේ ජනාධිපතිනිය නැවතත් නියෝජ්‍ය පොලිස්පති ඉන්ද්‍රා ද සිල්වාගේ නම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කළ බවයි. ජ්‍යෙෂ්ඨත්ව කාරණය පැහැදිලි කර ගැනීමට ජා.පො.කො.ස. වේ සහාය පැතීය. කලින් සිටි

---

46. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(3) වගන්තිය.
47. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ වගන්තිය සමඟ කියවිය යුතු II උපලේඛනයේ 155උ (1) වගන්තිය බලන්න.
48. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ වගන්තිය.
49. රංජිත් අබේසූරිය මහතා, ජා.පො.කො.ස. හි සභාපති, උපුටා දක්වා ඇත්තේ වාසි සෙනෙවිරත්න මහතා, 2003 අප්‍රේල් 13 දිනැති සන්ඩේ අයිලන්ඩ් පුවත්පත.
50. මීට සමාන තත්ත්වයක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(3) වගන්තිය ප්‍රකාර කැබිනට් මණ්ඩලය (ආයතන ප්‍රධානීන් පත් කිරීමේ අධිකාරිය) දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීමට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවසරය ගත යුතුය.

පොලිස්පතිවරයාගේ විශ්‍රාම ගැනීමෙන් මාස 3 කට පසු 2003 දෙසැම්බර් 18 වන දින ඉන්ද්‍රා ද සිල්වා මහතාව පොලිස්පති ලෙස පත් කළාය.

පොලිස්පති තනතුර පිරවීමට ගත වූ ප්‍රමාදය තුළින් 17 වන සංශෝධනයේ දක්වා ඇති ක්‍රියාපටිපාටිය පිළිබඳව ප්‍රශ්න රාශියක් පැන නැගුණි. පොලිස් දෙපාර්තමේන්තුව මාස 3 ක් ප්‍රධානියෙකු නොමැතිව තිබිණි. අවාසනාවට අනාගතයේ මෙවැනි තීරණාත්මක මොහොතක් යළි මතුවීම වැළැක්වීමට නීතිමය ප්‍රතිපාදන නොමැත. ජනාධිපතිගේ නාමිකයා පත්කිරීම සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එකඟ නොවුනහොත් පොලිස් දෙපාර්තමේන්තුවට පොලිස්පති කෙනෙක් නොමැතිව ක්‍රියා කිරීමට සිදුවෙයි.[51] තීරණාත්මක අවස්ථාවන්හි දී වත් පොලිස්පතිවරයෙකු පත්කිරීම පිළිබඳව ව්‍යවස්ථාමය කාර්යයන් ජා.පො.කො.ස. නොමැති වීම තුළ නීතිය සහ යථා පැවැත්ම පවත්වාගෙන යෑමේ අවසාන වගකීම ජනාධිපතිවරයා මත පැවරේ.

## 6. ජාතික පොලිස් කොමිෂන් සභාවේ ජයග්‍රහණ

### 6.1 මහා පරිමාණ දේශපාලනික පෙළඹවීම් මත සිදුවන ස්ථාන මාරුකිරීම් අත්හිටුවීම

සුවිශාල අපේක්ෂා ලෝකයක් තුළ ජා.පො.කො.ස. උපත ලැබීය. පාලකයින්ගේ සෑම වැදගත් තීරණාත්මක මොහොතකම දේශපාලනික ස්ථාන මාරුකිරීම් වලට පොලිස් දෙපාර්තමේන්තුව මුහුණ දුණි. එසේම නිතරම දේශපාලනික පෙළඹවීම් මත ස්ථාන මාරුවීම් සිදුවිය. කෙසේ වෙතත්, ජා.පො.කො.ස. ස්ථාපිත කිරීමෙන් පසුවද දේශපාලනික පෙළඹවීම් මත සහ අත්තනෝමතිකව ස්ථාන මාරුවීම් සිදු කිරීමට උත්සාහ දරා ඇත. අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශයේ මෙහෙයවීම් මත පොලිස් දෙපාර්තමේන්තුව නිර්දේශ කළ සහකාර පොලිස් අධිකාරී සහ ස්ථානාධිපතිවරු 60 දෙනෙකුගේ ස්ථාන මාරුවීම් නියෝග 2002 දෙසැම්බර් මාසයේ දී ජා.පො.කො.ස. ඉවත දැමීය. ඩේලි මිරර් පුවත්පත පහත පරිදි එම සිද්ධිය වාර්තා කළේය.

---

51. මීට සමාන, කිසිවක් කළ නොහැකි තත්ත්වයක් මැතිවරණ කොමිෂන් සභාවට සාමාජිකයන් පත්කිරීම සම්බන්ධයෙන් ද පැනනැගී ඇත්තේ ව්‍යවස්ථා සභාව මගින් යෝජනා කළ අය ජනාධිපතිවරිය විසින් පත්කිරීම ප්‍රතික්ෂේප කිරීම මතය.

"අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශ ආරංචි මාර්ග සඳහන් කරන්නේ, ඇමතිවරුන්ගේ සහ ආණ්ඩු පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත සහකාර පොලිස් අධිකාරී හා පොලිස් ස්ථානාධිපතිවරු 60 දෙනෙකුගේ ස්ථාන මාරුවීම් ලැයිස්තු පිළියෙල කර ඇත. ඒට අමතරව ස්ථාන මාරුකිරීම් නියෝග වලින් සමහරක් UNP, SLMC, CWC සහ TNA යන පක්ෂ කළ ඉල්ලීමිය. කොමිසම විසින් කලින් පොලිස් දෙපාර්තමේන්තුවට ලබාදුන් නියෝග අවලංගු කළ පළමු අවස්ථාව මෙය වේ."[52]

දේශපාලනික පෙළඹවීම් මත කලින් සිදුවූ මේ මහා පරිමාණ ස්ථාන මාරුකිරීම් නැවත ජා.පො.කො.ස. විසින් අවලංගු කිරීම 17 වන සංශෝධනයේ අභිප්‍රායන් සඵල කර ගැනීමකි.

## 6.2 මහජන පැමිණිලි සලකා බැලීම සඳහා වූ යාන්ත්‍රණය

තවත් වර්ධනීය තත්ත්වයක් වනුයේ, පොලිසියට එරෙහිව ඇති පැමිණිලි සඳහා විමර්ශන කටයුතු ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගනුවස් ප්‍රතිපාදන සැලැස්වීමයි. පැමිණිලි බාරගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව කිරීමට ජා.පො.කො.ස. සම්බන්ධීකාර කමිටු 7 ක් දිස්ත්‍රික් මට්ටමෙන් ස්ථාපිත කර ඇත.

2003 ජූලි මාසයේ දී, ජා.පො.කො.ස. දන්වීමක් පළ කරමින් මහජනතාවගේ පැමිණිලි ඉදිරිපත් කරන ලෙස දන්විය. ඒ අනුව "කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල පොලිස් ස්ථානවල හෝ වෙනත් පොලිස් කාර්යාලයන්හි පොලිස් නිලධාරීන්ගේ වගකීම් සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකිය."[53] එම දන්වීම තවදුරටත් දක්වූයේ "ජා.පො.කො.ස. මෙම වැඩසටහන ආරම්භයේ දී කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් ඇරඹියත් අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා ද ව්‍යාප්ත කිරීමට යන බවයි. නුවර, අනුරාධපුර, පුත්තලම, කල්මුණේ දනටමත් හඳුනාගත් දිස්ත්‍රික්ක බවයි." ජා.පො.කො.ස. වේ සභාපති සැප්තැම්බර් මාසයේ පුවත්පත් සාකච්ඡාවකදී අනාවරණය කළේ දන්වීමෙන් සති 3 කට පසු ඒට ප්‍රතිචාර ලෙස මහජන පැමිණිලි 26 ක් ලැබුණු බවත් ඒ පැමිණිලි පිළිබඳව පක්ෂග්‍රාහී නොවී සහ දේශපාලන භේදයකින් තොරව විමර්ශන කටයුතු කරගෙන යන බවයි.[54]

52. 2002 දෙසැම්බර් 24, *ඩේලි මිරර්.*
53. 2003 ජූලි 18, *ඩේලි නිව්ස්.*
54. 2003 සැප්තැම්බර් 09, *ඩේලි නිව්ස්.*

155 උ (2) ව්‍යවස්ථාව පිළිබඳව සියුම්ව පිරික්සීමේ දී අනාවරණය වන්නේ, වධහිංසා සහ අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීම් හෝ රඳවා ගැනීම් හි වින්දිතයන්ට ජා.පො.කො.ස. ට පැමිණිලි කළ හැකි බවත් ඒ මහජන පැමිණිලි බාරගෙන විමර්ශනය කිරීමට ක්‍රියා පිළිවෙත් ස්ථාපිත කිරීමට ජා.පො.කො.ස. ට ව්‍යවස්ථානුකූල වගකීමක් පවතින බවයි. එකී නිර්වචනය තුළ අන්තර්ගත වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල වගකීමක් වන්නේ ආණ්ඩුවේ සියලූම අංග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් "ගරු කිරීම, ආරක්ෂා කිරීම සහ දියුණු කිරීමයි."[55] මෙම ප්‍රතිපාදනය ජා.පො.කො.ස. ට විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීමට බලය ලබා දී ඇති අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලදී පොලිස් නිලධාරීන් විසින් සිදුකරනු ලබන ඉතා දුෂ්ඨ ක්‍රියාවන් පිළිබඳ පැමිණිලි සඳහා වර්තමානයේ සහනයක් ලබාදිය නොහැකි වුවත්, විභාග කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීමට ඉඩ සලසා ඇත.[56]

155 (උ) වන ව්‍යවස්ථාව පැමිණිලි භාරගැනීමේ ක්‍රියාවලිය සහ ඒ අනුව සහන ලබාදීම පිළිබඳව වෙනසක් දක්වා තිබීම සටහන් කිරීම වැදගත්ය. මේ ව්‍යවස්ථාව යටතේ ලබාදී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල වගකීම යටතේ මහජන පැමිණිලි භාරගෙන විමර්ශනය කිරීමට ක්‍රියාපටිපාටියක් ස්ථාපිත කිරීමට ඇති තත්ත්වය සීමිතය. කොමිසමේ බලතල පිළිබඳව සියුම්ව පිරික්සීමේ දී පෙනී යන්නේ එයට පොලිස් නිලධාරීන්ගේ විනයානුකූල පාලනයන් පිළිබඳ බලතල පැවරී ඇති බවත් ඒ අනුව විනයානුකූල පියවර සඳහා මහජන පැමිණිලි සලකා බැලීමට සත්භාවමය අයිතියක් ඇති බවයි. කෙසේ වෙතත්, තර්ක කළ හැක්කේ 17 වන සංශෝධනය යටතේ ජා.පො.කො.ස. ට සහනයන් ලබා දීමට විශේෂ බලතල නොමැති අතර පනත තුළින් අත් හැරිය නොහැකි බලතල අනුමාන කළ නොහැකි බවයි. පොලිස් ක්‍රියාවන්ගෙන් අගතියට පත්වන අයට සහනයක් ලබා දීමට හැකිවනු වස් විශේෂ ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට පාර්ලිමේන්තුවේ විශේෂ අවධානය යොමුවිය යුතුය. නිශ්චිත නීතීන් හඳුන්වා දුන් පසු ජා.පො.කො.ස. පරිපාලනමය යාන්ත්‍රණය අනුගමනය කිරීමෙන් සහන ලබා දෙනු ඇත. ඒ තුළින් මහජනයාට ජා.පො.කො.ස. තුළින් සහනයක් ලබා ගත හැකි වනවා සේම අනිකුත් අධිකරණමය සහනද ලබා ගත හැක.

---

55. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ) වගන්තිය.

56. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(උ)(2) වගන්තිය අවසානයේ දක්වා ඇති පරිදි "... එවැනි කටයුතු සඳහා පාර්ලිමේන්තුව සම්මත කරන ලද පනත් වල ප්‍රතිපාදනයන්ට යටත්ව පිළියම් සැපයීම සිදු කරයි."

### 6.3 පොලිසියේ අවංකභාවය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයන්ගෙන් වඩාත් දූෂිත රාජ්‍ය ආයතනයක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුව මහජනයා විසින් හඳුන්වයි.[57] විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළු මහජනයා පොලිසිය දේශපාලනීකරණය වී ඇතැයි බොහෝවිට විවේචනය කරයි.[58] එමනිසා ජා.පො.කො.ස. වේ ප්‍රධාන අභියෝගය වන්නේ පොලිසියේ ගරුත්වය හා අවංකභාවය යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති සීමිත බලතල තුළින් වුවද මෙම අභියෝගය ජය ගැනීමට ජා.පො.කො.ස. අපේක්ෂා කරයි. මෑතකදී ජා.පො.කො.ස. වේ සභාපති පැහැදිලිව නිල වශයෙන් ප්‍රකාශ කළේ පොලිසිය 'කිසිම පුද්ගලයෙකුගේ බලපෑමට යටත් නොවිය යුතු බවයි.'[59]

2003 වසර තුළ ජා.පො.කො.ස. වේ කටයුතු වලට දේශපාලනික බලපෑම් හෝ බලපෑම් කිරීමට තැත් කිරීම් පිළිබඳ වාර්තාගත වූ සිද්ධීන් නොමැත. ජා.පො.කො.ස. වේ කාර්යයන් පිළිබඳ සැලකීමේ දී උපකල්පනය කළ හැක්කේ වසර 2003 කාලයේ පොලිසියේ පරිපාලනය ස්වාධීනව පැවතුණ බවයි.

## 7. ජාතික පොලිස් කොමිෂන් සභාවේ ව්‍යුහමය සීමාවන්

### 7.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලදී සීමාවන්

ජා.පො.කො.ස. තුළ පැහැදිලිවම ව්‍යුහමය අඩුපාඩුකම් පවතී. ප්‍රධාන සීමාවන් වනුයේ පොලිස් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධව බලපෑමක් කිරීමට නොහැකියාවයි. දේශපාලන බලපෑමක් පරීක්ෂණයේ විද්‍යමාන වන විට හෝ පොලිසියේ මෙහෙයුම් අංගයන් පිළිබඳ හෙළා දකිමින් චෝදනා ඇතිවන විටවත් ජා.පො.කො.ස. ට බලපෑමක් කළ නොහැක. 17 වන සංශෝධනය යටතේ ජා.පො.කො.ස. වේ බලතල විශ්ලේෂණයේ දී මේ නිගමනයට එළඹීම නොවැළැක්විය හැකිය. පොලිස් දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ, සියලුම වැරදි වැළැක්වීම, රඳවා තබා ගැනීම් සහ විමර්ශනය කිරීම වන අතර අදළ වැරදි සම්බන්ධයෙන් අදළ අධිකරණ වල නඩු කටයුතු සිදුකරන 1979 අංක 15 දරණ අපරාධ

57. 2002 දෙසැම්බර්, *ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් කලාපීය පොදු සමාලෝචන වාර්තාව.*

58. 2001 ඔක්තෝබර් 27, *අයිලන්ඩ්.*

59. 2003 ජූලි 13, *අයිලන්ඩ්.*

නඩුවිධාන යටතේ නීතිපතිට යටත්වන විෂයන් පිළිබඳවය. පළාත්බද කොට්ඨාසයන්හිදී ද මීට සමාන යාන්ත්‍රණයන් සපයා තිබේ. වෙනත් වචන වලින් දක්වුවහොත්, පොලිසියේ කාර්යාත්මක බලතල පැහැදිලිව පරිපාලනමය බලතල හා පොලිස්පතිට පැවරූ බලතල ලෙස වෙන්කර ඇත.

මේ දක්වා ක්‍රියාත්මක වීමට පටන් නොගත් 1990 අංක 01 දරණ පොලිස් කොමිෂන් සභා පනත වැරදි විමර්ශනය පිළිබඳව අවධානය ගන්නා යාන්ත්‍රණයන් සපයා ඇත. පළාත තුළ සිදුවන වැරදි පිළිබඳ විමර්ශනය කිරීමේ මූලික වගකීම පළාත්බද කොට්ඨාසයට හිමිවන අතර පහත දක්වෙන අවස්ථාවන්හි වැරදි සම්බන්ධ විමර්ශනය ජාතික පොලිස් කොට්ඨාසය විසින් කළ යුතුය.[60]

(අ) එකී වරද පිළිබඳව විමර්ශනය සිදු කිරීම ජාතික අංශය විසින් කළ යුතු බවට පළාතේ ප්‍රධාන ඇමතිවරයා ඉල්ලුම් කළහොත්; හෝ

(ආ) මහජන යහපත තකා එම වරද පිළිබඳව ජාතික අංශය විමර්ශනය කළ යුතු බවට පොලිස්පතිගේ මතය වන විටක ප්‍රධාන ඇමතිවරයාගේ අදහස් විමසා නීතිපතිවරයාගේ අනුමැතිය මත විමර්ශනය ජාතික අංශය විසින් කළ හැක.

ඉහත ප්‍රතිපාදන තුළ කාර්යාත්මක ක්‍රියාකාරකම් වලදී පොලිසියට සැලසුමක් තිබුණද විමර්ශන කටයුතු ජාතික අංශයට මාරු කිරීම පිළිබඳව දේශපාලනික බලධරයෙකු වන ප්‍රධාන ඇමතිට සුවිශාල කාර්යභාරයක් කිරීමට ඇති හැකියාව අවාසනාවන්ත තත්ත්වයකි. ප්‍රධාන ඇමතිගේ එකී මැදිහත් වීම පිළිබඳ හැකියාව අවංක හෝ බුද්ධිගෝචර නොවන තත්ත්වයකි.

## 7.2 කැඳවීම් නියෝග සඳහා බලතල නොවීම

ජා.පො.කො.ස. ට පොලිස් නිලධාරීන්ගේ විනය සම්බන්ධව කටයුතු කිරීමට බලය ඇත. මෙකී විනයානුකූල ක්‍රියාකාරකම් වලින් සැකයෙන් තොරව අදහස් කරන්නේ, විනයානුකූල පරීක්ෂණ පැවැත්වීමට ඇති බලය හා පරීක්ෂණය අනුව රාජ්‍ය නිලධාරීන් පරීක්ෂකයා ඉදිරියට කැඳවීමට ඇති බලයයි. එමනිසා ජා.පො.කො.ස. ට පැහැදිලිවම විනයානුකූල පරීක්ෂණ වලදී අදළ නිලධාරියාට හෝ වෙනත් පොලිස් නිලධාරියෙකුට කැඳවීම්

60. 1990 අංක 01 දරණ පනතේ 13 වන වගන්තිය.

නියෝග නිකුත් කිරීමට බලය ඇත.[61] කෙසේ නමුත්, පොලිසියෙන් පිටත සාක්ෂිකරුවෙකුව කැඳවීමට ජා.පො.කො.ස. අදහස් කරන්නේ නම් ඊට අදාළ නීතිමය බලධාරීත්වයක් නොමැත.[62]

මහජන පැමිණිලි බාරගෙන විමර්ශනය කිරීමට ජා.පො.කො.ස. සතු හැකියාව පිළිබඳව මෙම හිඩැස ගැටීමක් ඇති කරයි. පරීක්ෂණ සඳහා ලියවිලි කැඳවා ගැනීමට සහ සාක්ෂිකරුවන්ට කැඳවීම් නියෝග නිකුත් කිරීමට ජා.පො.කො.ස. ට බලයක් නොමැතිවීම තුළ මේ සම්පූර්ණ ක්‍රියාවලිය ශූන්‍ය කරයි. එමනිසා මහජන පැමිණිලි සම්බන්ධව කාර්යක්ෂමව විමර්ශනය කිරීමට ජා.පො.කො.ස. සතුව බලතල නොමැත.

## 8. නිගමන

ස්වාධීන පොලිස් පරිපාලනයක් ස්ථාපිත කිරීම බොහෝදෙනාගේ දීර්ඝකාලීන සිහිනයකි. එය යථාර්ථයක් කරමින් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්වාධීන කොමිසමක් ස්ථාපිත කළේය. එසේ වුවද පවත්නා සැකැස්ම පිළිබඳව දැඩි විවේචන පවතින අතරතුර පොලිස් පරිපාලනයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට නීතිමය ප්‍රතිපාදන දනටමත් ඇත. දීර්ඝ කාලයක් දේශපාලනීකරණය පැවති මේ දෙපාර්තමේන්තුව එයින් මිදවීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා දීර්ඝ කාලයක් ගත වෙයි. එමනිසා 17 වන සංශෝධනය යටතේ තමන්ට ලැබුණු වරම හැකි තරම් ඉක්මනින් ක්‍රියාත්මක කිරීම තුළින් ජා.පො.කො.ස. වේ සාමාජිකයන් තම කැපවීම ප්‍රදර්ශනය කළ යුතුය. අනෙක් අතට ජා.පො.කො.ස. වේ වරම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය සහයෝගය ලබාදිය යුතුය.

17 වන සංශෝධනය යටතේ වඩා කාර්යක්ෂම සහ නිදහස්ව ක්‍රියා කිරීමට ජා.පො.කො.ස. සැදුවාට අමතරව පහත නිර්දේශ කර ඇති ව්‍යවස්ථාමය හා පරිපාලන පියවර ගැනීමේ අවශ්‍යතාවයක් පවතී.

---

61. ආයතන සංග්‍රහයේ, XLVIII පරිච්ඡේදයේ 20:1 වගන්තිය. එම පරිච්ඡේදයේම 13.10 වගන්තිය යටතේ විමර්ශනය පිළිබඳව සම්බන්ධතා පැවැත්වීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම බරපතල වැරදි ක්‍රියාවකි.

62. මීට විරුද්ධව මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 18ඇ වගන්තිය මගින් මානව හිමිකම් කොමිසමට ඕනෑම පුද්ගලයෙක් කැඳවීමටත් අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමටත් බලය දී තිබේ.

- 1990 අංක 01 දරණ පොලිස් කොමිෂන් සභා පනත අවලංගු කිරීම හෝ එය 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුරූපී ලෙස සංශෝධනය කිරීම.

- ජා.පො.කො.ස. ට අයුතු ලෙස මැදිහත් වීම් පිළිබඳව පැහැදිලි කර ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 (ඊ) හි ප්‍රතිපාදන පොලිස්පති වරයාගේ සහ වෙනත් පොලිස් නිලධාරීන්ගේ පරිපාලනමය කාර්යයන් දක්වා වර්ධනය කළ යුතුය.

- පොලිස්පති පත්කිරීම ජා.පො.කො.ස. වේ අදහස් නිශ්චය කිරීමෙන් පසු සිදුවිය යුතුය. නීතිය ගිවිසගෙන ඇති අයුරින් පත්කිරීමේ ක්‍රියාවලිය ඉතා අඩු කාලයකින් අවසාන කළ යුතුය.

- විශේෂයෙන්ම පක්ෂග්‍රාහී වීම් සහ දේශපාලන බලපෑම් කිරීම් වැනි චෝදනා අවස්ථා වලදී ක්‍රියාකාරී කාර්යයන් සඳහා ජා.පො.කො.ස. අධීක්ෂණය ලබාදිය යුතුය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(උ)(2) ව්‍යවස්ථාවට අවශ්‍ය පරිදි සහනයක් ලබා ගැනීමේ යාන්ත්‍රණයක් දක්වෙන විශේෂ පනතක් පාර්ලිමේන්තුවට කඩිනමින් සම්මත කළ යුතුය.

- පරීක්ෂණ කටයුතු වඩා කාර්යක්ෂමව කිරීම සඳහා ලියකියවිලි කැඳවීමට සහ කැඳවීම් නියෝග නිකුත් කිරීමට ජා.පො.කො.ස. ට බලය ලබාදිය යුතුය. ඒසේම ඒවා ප්‍රතික්ෂේප කරන අය නීතිය අනුව දඬුවම් දිය හැකි සේ වරදක් කළා විය යුතුය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ෴ ව්‍යවස්ථාව යටතේ පත්කිරීම් සිදු කරනු ලබන විට ජා.පො.කො.ස. ට තම සාමාජිකයින් පත්කිරීම පිළිබඳව නිසි මිණුම්දඬු හඳුන්වා දිය යුතුය.

# VII

# බිඳුණුවැව: යුක්තිය ඉටු වූයේද?

*ආචාර්ය ඇලන් කීනන්**

## 1. හැඳින්වීම

බණ්ඩාරවෙල නගරයට කිලෝමීටර් 5ක් උතුරෙන් පිහිටි ආණ්ඩුවේ පුනරුත්ථාපන කඳවුරට 2000 ඔක්තෝම්බර් 25 කලහකාරීන් නිශ්චිත කළ නො හැකි පිරිසක් කඩා වැදුණි. ආරක්ෂාවට යොදවා සිටි ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් ගේ වළක්වාලීමකින් තොර ව හා ඔවුන් ගේ ම සැලකිය යුතු සහයෝගයක් සහිත ව මිනිත්තු තිහේ සිට පැයක් දක්වා කාලයක් පැවැති බියකරු වූත් ප්‍රචණ්ඩ වූත් ප්‍රහාරයකින් පසු දෙමළ රැඳවියන් 27 ක් මරණයට පත් වූහ. තවත් 14 ක් තුවාල ලැබූ හ. ඔවුන් ගෙන් සමහරකට බරපතල තුවාල සිදු විය. ප්‍රහාරයෙන් පසු ව දින තුනක් හෝ හතරක් තිස්සේ කඳුරට අවට ප්‍රදේශවල සිංහල සහ දෙමළ ජනයා අතර ප්‍රචණ්ඩ ක්‍රියා පැවතුණි.

මෙම ප්‍රචණ්ඩත්වයෙන් පසු ව බිඳුණුවැව ඝාතන ගැන ජාතික සහ ජාත්‍යන්තරව ඇති වූ උද්ඝෝෂණය නිසා ආණ්ඩුව ඒ පිළිබඳව පරීක්ෂණ මාලාවක් පවත් වන බව නිවේදනය කළේ ය. අභියාචනාධිකරණයේ විනිශ්චයකාර පී.එච්.කේ.කුලතිලක මහතා ගේ මූලිකත්වයෙන් 2001 මාර්තු

* දේශපාලන විද්‍යාව පිළිබඳ සහය මහාචාර්ය බ්‍රයන් මාර් විද්‍යාලය, එක්සත් ජනපදය.

8 ජනාධිපති කුමාරතුංග පරීක්ෂණ කොමිසමක් පත් කළා ය.[1] කොමිසම එම වසරේ මැයි සහ ඔක්තෝබර් මාස අතර කාල පරිච්ඡේදය තුළ ප්‍රසිද්ධ විභාග පැවැත් විය. 2001 නොවැම්බර් මාසයේ දී සම්පූර්ණ කරනු ලැබූ කොමිෂන් වාර්තාව 2002 මුල්භාගයේ දී ජනාධිපතිනියට නිල වශයෙන් භාර දෙනු ලැබී ය. නමුත් එය තවමත් නිල වශයෙන් ප්‍රසිද්ධ කර නැත.[2] කොමිසම සාක්ෂි රැස් කරන අතරතුර පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙහෙය වන ලද පරීක්ෂණවල දී සැකකරුවන් 41 කට විරුද්ධව[3] චෝදනා ගොනු කරනු ලැබී ය. ඔවුන් ගෙන් දස දෙනෙක් පොලිසියේ සාමාජිකයෝ වූහ. සැකකරුවන් 41 දෙනා පිළිබඳ නඩු විභාගය ත්‍රි පුද්ගල විනිශ්චයකාර මණ්ඩලයක් ඉදිරියේ (Trial-at-bar) 2002 ජූලි මාසයේ දී කොළඹ මහාධිකරණයේ දී ආරම්භ විය.[4] සාක්ෂි විමසීම 2003 ජනවාරි මාසයේ දී අවසන් වූ අතර නඩු විභාගය එම වසරේ මැයි මාසය මුල දී නිම විය. නඩු තීන්දුව 2003 ජූලි 01 ද ප්‍රකාශයට පත් කෙරුණි. අධිකරණය පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඇතුළු චූදිතයන් ගෙන් පස් දෙනෙකු චෝදනා වලට

---

01. පරීක්ෂණ කොමිසම: ජනාධිපති විසින් පරීක්ෂණ කොමිෂන් සභා පනත (1948 අංක 17) යටතේ පත් කරන ලදී. දෙන ලද කරුණු සම්බන්ධ තත්ත්වයක් ගැන තමා පත් කරන ලද අධිකාරයට පෙරළා වාර්තා කිරීමට කොමිසමට බලයක් පවරා ඇත. ඕනෑම රාජ්‍ය ආයතනයක් විසින් තබා ගෙන සිටින වාර්තා පරීක්ෂා කිරීමටත් සාක්ෂි දීම සඳහා ඕනෑ ම පුද්ගලයෙක් එය ඉදිරියට කැඳවීමටත් ඊට බලය පැවරී ඇත. එහෙත්, කොමිෂන් සභාවක් ඉදිරියේ දුන් සාක්ෂි හෝ එය විසින් එකතු කරන ලද සාක්ෂි පසුව පැවැත් වෙන අපරාධ නඩු විභාගයක දී නෛතිකව වලංගු නොවේ. "2000 ඔක්තෝබර් මස දී බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුරේ සිදු වූ සිද්ධීන් ගැන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව" ට කරන ලද බල පැවරුම වූයේ, "I. රැඳවියන් 27 දෙනෙක් මරණයට පත් කරවමින් ද 14 දෙනෙකුට තුවාල කරමින් ද 2000.10.25 දින බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුරේ හටගත් සිද්ධීන් ගැන පරීක්ෂා කිරීම," "II. ඉහත කී සිද්ධියට අදාළව බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුරේ පරිපාලනය සහ එහි මහජන නිලධාරීන් ගේ හැසිරීම පරීක්ෂා කිරීම," "III. තම ක්‍රියාවන් මගින් හෝ පැහැර හැරීම් මගින්, (1) එම සිද්ධීන් ඇති කිරීමට, (2) පුද්ගලයින්ට තුවාල සිදු කිරීම හෝ රැඳවියන් මරණයට පත් කිරීමට ඍජුව හෝ වක්‍රව වගකිව යුතු පුද්ගලයා හෝ පුද්ගලයන් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම," සහ "IV. එවැනි සිදුවීම් වැළැක්වීමටත් මේ සම්බන්ධයෙන් ප්‍රතිකර්ම ලෙසත් ගත හැකි පියවර යෝජනා කිරීමයි."

02. මෙම ලිපිය සකස් කිරීමේ දී මෙම ලේඛකයාට කොමිෂන් සභා වාර්තාවේ ඉංග්‍රීසි පිටපතක් පරිශීලනය කිරීමේ අවස්ථාව ලැබිණි. වාර්තාවේ සම්පූර්ණ ලේඛනය ද මහාධිකරණ තීන්දුවේ ඉංග්‍රීසි පරිවර්තනය ද දත් www.brynmawr.edu/peacestudies/srilanka/bindunuwewa. වෙබ් අඩවියෙහි ඇත.

03. පුදුමය දනවන්නක් නම් ප්‍රහාරය වූ දිනයේ දී බිඳුණුවැව කඳවුරෙහි දී මරණයට පත් වූ රැඳවියන් ගේ ගණන ද මීට සමාන වීම ය.

04. මහාධිකරණ නඩු අංක. 763/2002.

වැරදිකරුවන් බව නිගමනය කරමින් ඔවුන්ට මරණ දඬුවම නියම කළේ ය.

දිගු කාලයක් බලාපොරොත්තුව සිටි නඩු තීන්දුව, කොළඹ මහාධිකරණය විසින් 2003 ජූලි 1 ප්‍රකාශයට පත් කළ විට ක්ෂණික සහ භින්න ප්‍රතික්‍රියාවක් ඇති විය. යුක්තිය ඉටු කරනු ලැබූ බවට ඔවුන් ගේ සතුට ප්‍රකාශ කිරීමට සමහර මානව හිමිකම් නීතිඥයෝ සහ ක්‍රියාධරයෝ ඉක්මන් වූහ. නඩු විභාගය පිළිබඳ සමීපව විමසිලිමත් වූ එක් දෙමළ නීතිඥයෙකුට අනුව එය "නීතියේ පාලනය ලබා ගත් ජයග්‍රහණයකි" ඔහුට අනුව එය, උසාවිය ඉදිරියේ චෝදනා ඉදිරිපත් කර දඬුවම් නියම කෙරුණු මානව හිමිකම් හෝ සමූහ මනුෂ්‍ය ඝාතන සම්බන්ධ නඩු කිහිපයකින් එකකි.[5] තවත් දිගුකාලීන මානව හිමිකම් ක්‍රියාධරයෙකු මෙසේ පැවසී ය යි උපුටා දක්වනු ලැබී ය. "මෙම සමූහ මනුෂ්‍ය ඝාතනයේ දී, නීතිය තම සාමාන්‍ය ක්‍රියාපටිපාටිය ක්‍රියාවට නැගූ අතර නඩු විභාගයෙන් පසුව චූදිතයන්ට දඬුවම් නියම කරනු ලැබී ය. නමුත් අවාසනාවකට මෙන් ඒ හා සමාන වෙනත් නඩු ගණනාවක දී එසේ නො වීය... බිඳුණුවැව නඩුවේ දී මෙන් සමාන ආකාරයකට මේ සියල්ල කඩිනමින් තීන්දු කළ යුතු ය. ඔවුන් දේශපාලනඥයන්, සන්නද්ධ බලකායන් ගේ හෝ පොලිසියේ සාමාජිකයන් වුව ද වගකීම් විරහිත සෑම කෙනෙකුට ම විරුද්ධව නීතිය ක්‍රියාවේ යෙදිය යුතු ය."[6] ඇත්ත වශයෙන් ම සෙසු ඉහළ පොලිස් නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් නො කිරීම සම්බන්ධව සමහරු තම අප්‍රසාදය පළකළ නමුත් මෙම නඩු තීන්දුව, මානව හිමිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධව නිල වශයෙන් දඬුවම් කිරීමෙන් වැළකී සිටීමට දරන උත්සාහයන්ට එරෙහි දුර්ලභ ජයග්‍රහණයක් ලෙස බොහෝ දෙනෙකුට හැඟුණි.

එහෙත්, සමහරු පොදු සතුට ප්‍රකාශ කරද්දීම සෙසු අය කෝපයට පත් වූ හ. කම්පනය සහ බලාපොරොත්තු සුන් වීම නිසා එක් පොලිස් නිලධාරියෙක් වැලපෙන අයුරු ද දෙදෙනා ම තම නිර්දෝෂත්වය ප්‍රකාශ කරන අයුරු ද රූපවාහිනියේ ප්‍රදර්ශනය කෙරුණු අතර පසු දින සියලුම පුවත්පත්වල මුල්

---

05. 2003 ජූලි 1 වැනිද කතුවරයා සමග පැවැත් වූ පුද්ගලික සම්මුඛ සාකච්ඡාව. දඬුවම් ලබා දීමට සමත් වූ අභිචෝදනා දෙකක් නම් ක්‍රිෂාන්ති කුමාරස්වාමි දූෂණ හා ඝාතන නඩුව සහ ඇඹිලිපිටිය අතුරුදහන් වීමේ නඩුවයි. එහෙත් බිඳුණුවැව දී මෙන් ම මෙම නඩු දෙකෙහි දී ද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එක් අයකුවත් වැරදි කරුවෙක් වූයේ නැත.

06. Bindunuweva Massacre Judgement: Human Rights Groups Hail Quick Action", *Sunday Observer,* 6 July 2003.

පිටුවල ද පළ විය. සමූහ මනුෂ්‍ය ඝාතනය සිදු වන විට අපරාධය සිදු වූ ස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිටි බවත් තමන් අසාධාරණ ලෙස ඔවුන් ගේ දඩමීමුන් බවට පත් කෙරුණු බවත් පොලිස් පරීක්ෂක සේනක කරුණාසේන සහ උප පොලිස් පරීක්ෂක විරෝන් රත්නායක යන දෙදෙනා ම මහ හඬින් ප්‍රකාශ කළ හ. ඉංග්‍රීසි සහ සිංහල භාෂා ජනමාධ්‍යයෝ නිලධාරීන් දෙදෙනා ගේ තත්ත්වය සහ පීඩා විඳින ඔවුන් ගේ පවුල් ගැන ඉතා ඉහළින් ම සානුකම්පිත වූ මාධ්‍ය ආවරණයක් කළ හ. බිඳුණුවැව සිට කිලෝමීටර් තුනක දුරින් පිහිටි බණ්ඩාරවෙල සහ ඒ අවට ප්‍රදේශ තුළ නඩු තීන්දුව බලගතු බලපෑමක් ඇති කළේ ය. ඔවුන් ගේ නීතිමය අභියාචනයට සහ ඔවුන් ගේ පවුල් වලට උපකාර කිරීම සඳහා මුදල් එකතු කිරීමට පොරොන්දු වෙමින් ප්‍රධාන ව්‍යාපාරිකයෝ, නීතිඥයෝ සහ සෙසු ප්‍රාදේශීය නායකයෝ දඬුවම් නියම වූ පස්දෙනා වෙනුවෙන් වහාම ආරක්ෂක කමිටුවක් පිහිට වූහ. ප්‍රසිද්ධ රැස්වීම් පවත් වනු ලැබිණි. මුදල් එකතු කෙරිණි. අසාධාරණය පිළිබඳ කෝපය පුළුල් ලෙස ප්‍රකාශයට පත් විය.[7] ඔවුන් ගේ කණිෂ්ඨ නිලධාරීන් මත වගකීම පැටවුණු අතර, මූලස්ථාන පොලිස් පරීක්ෂක ජයන්ත සෙනෙවිරත්න සහ සහකාර පොලිස් අධිකාරි ඒ. ඩබ්ලිව්. දයාරත්න යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනා කවර හෝ දඬුවම් ලැබීමකින් ගැලවී ගත්තේ ය යන කාරණය නිතර සඳහන් කෙරුණි. සිංහල නිලධාරීන්ට මරණ දඬුවම පමුණුවනු ලැබූ අතර ආණ්ඩුව සටන් විරාම ගිවිසුමේ කොන්දේසි යටතේ "කොටි ත්‍රස්තවාදීන්ට" නිදහසේ හැසිරීමට ඉඩ දෙනු ලැබ ඇතැයි යන කරුණු ද නිතර කෙරුණු චෝදනාවක් වූයේ ය. මේ අනුව දඬුවම් දකිනු ලැබුවේ, අපරාධයකට දඬුවම් නො ලබා සිටීමට එරෙහි කිසියම් වර්ගයක පහරක් ලෙස නොව සුපුරුදු අසාධාරණත්වය ම තහවුරු වීමක් ලෙස ය.

අන්තිමේ දී බලන කල නඩුව සම්බන්ධව සමහර විට වඩාත් සිත් කාවදින කරුණ වන්නේ එකිනෙකට පරස්පර විරෝධී මෙම අස්ථානයන් එකක් වත් සරලව ම ප්‍රතික්ෂේප කළ නො හැකි බව ය. ආරම්භයේ දී සිට ම බහු අර්ථභාවයේ සහ ව්‍යාකූලත්වයේ ඝන වළාකුලකින් නඩුව වෙළා ගෙන තිබුණි. ඉන් සමහරක් නුදුරු අනාගතය දක්වා, සහ සමහර විට සදාකාලිකව ම පැවතිය හැකි ය. එහෙත් නඩුවේ අවසානයත් සමග ම, දේශපාලන සහ

---

07. මෙම වර්ධනයන් ගැන පුවත්පත් ආවරණය සඳහා බලන්න සිතාරා සේනානි: "බිඳුණුවැව වූදිතයින්ට සිහළ උරුමය නීති ආධාර දෙයි," දිනමිණ, 2003 ජූලි 6: පාලිත ආරියවංශ, "බිඳුණුවැව ඛේදවාචකයේ හදවත් වලින් කඳුළු වැගිරේ," ලංකාදීප, 2003 ජූලි 6.

නෛතික සිතියමට බිඳුණුවැව ඇතුල් කිරීමට සමත් වූ මෙම නඩුව හා සිද්ධීන් සම්බන්ධ කරුණු බොහොමයක් ම දන් පැහැදිලි වී ඇති අතර එක්තරා නිශ්චිතභාවයකින් යුක්තව දක්විය හැකි ය. ප්‍රසිද්ධ කළ සහ නො කළ නීතිමය ලියවිලි, පුවත්පත් ලිපි, සහ කඳවුර සහ නීතිමය සන්නතිය පිළිබඳ ව සමීප අවබෝධයක් සහිත පුද්ගලයන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා පිළිබඳව සමීප විශ්ලේෂණයක් හරහා නඩුවේ ප්‍රධාන මූලිකාංගයන් එකට පිරිද්දීමේ හැකියාව ලැබී තිබේ.[8] ලබාගත හැකි ලියවිලි සහ ප්‍රකාශන වලින් එකකවත් ඇති කරුණු ඒ හැටියෙන් ම පිළිගත නො හැකි බව සඳහන් කිරීම වැදගත් ය. බොහෝ කරුණු දන් පැහැදිලි කරනු ලැබ ඇති අතර දන් ඒවා ගැන යම් ප්‍රමාණයක නිශ්චිතභාවයකින් කථා කළ හැකිය. තම

08. මෙම ලිපිය පදනම් වන්නේ මාස ගණනාවක් තිස්සේ කරන ලද ක්ෂේත්‍ර පර්යේෂණ මත ය. එහි දී පහත සඳහන් පියවර ගන්නා ලදී. පරීක්ෂණ කොමිෂන් සභාවේ නඩු විභාග දින බොහොමයකට ම හා ත්‍රි පුද්ගල මහාධිකරණ නඩුවේ විභාග දින සමහරකට ද සවන්දීම: භාෂා තුනෙන් ම කරන ලද මාධ්‍ය ආවරණය ගැන කෙරුණු විග්‍රහයක්: මෙම නඩුවේ මූලික ලියවිලි ගැන කෙරුණු සමීප විග්‍රයක්: සිද්ධියට ගොදුරු වූවන් කිහිප දෙනෙක්, චූදිතයන් සමහර දෙනෙක් සහ ඔවුන් ගේ පවුල්වල සාමාජිකයින්, පැමිණිල්ලේ සහ විත්තියේ නීතිඥයින්, මානව අයිතීන් කොමිෂන් සභාවට අයත් වූත් ගොදුරු වූවන් හා සිද්ධියෙන් නො මැරී බේරුණු අය ගේ අවශ්‍යතා නියෝජනය කරන නීතිඥයින් බිඳුණුවැව සහ තෙලිපිලෙයි පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ හිටපු හා දන් සේවයේ යෙදෙන නිලධාරීන්: බණ්ඩාරවෙල ප්‍රදේශයේ මාධ්‍යකරුවන්, ප්‍රදේශවාසීන් සහ දේශපාලනඥයින්, නඩුව අධ්‍යයනය කළ ක්‍රියාකාරීන්, සහ ප්‍රහාරයට පෙර බිඳුණුවැව මධ්‍යස්ථානය ගැන පුද්ගලික අත්දකීමෙන් දන සිටි නොයෙකුත් පුද්ගලයින් ඇතුළු අය සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා පනහකට වැඩි සංඛ්‍යාවක්: මෙම සංකීර්ණ නඩුව තේරුම් ගැනීම සඳහා මට උදව් කිරීම සඳහා තම කාලය ලබා දුන් සියලු ම දෙනාට ම මගේ අවංක ස්තූතිය මෙයින් පුද කෙරේ. මා සමඟ කථා කළ අය ගෙන් වැඩි දෙනෙකු ගේ නිර්නාමිකත්වය මා ආරක්ෂා කර ලැබ ඇති නමුත් පහත සඳහන් ආයතන වලින් මා ලැබූ උදව්ව ගැන මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි. ඔවුන් ගේ උදව් හා ආධාරය නො වන්නට මෙම ලිපිය මීට වඩා බොහෝ සෙයින් අසම්පූර්ණ හා වැරදි සහගත විය හැකිව තිබිණි. ජාත්‍යන්තර ක්ෂමා ආයතනය, මානව අයිතීන් හා සංවර්ධන මධ්‍යස්ථානය, ජනවාර්ගික අධ්‍යයන සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, මානව අයිතීන් නිවාස සහ මානව අයිතීන් ආයතනය. පෙන්සිල්වේනියාවේ Solomon Asch Center for Study of Ethnopolitical Conflict, ආයතනය, මෙම අධ්‍යයනය සම්පූර්ණ කිරීම සඳහා මා හට විටින් විට මුදලින් කළ ආධාර සඳහා මගේ ස්තූතිය එයට විශේෂයෙන් පිරි නැමෙයි. කුලතිලක විනිශ්චයකාරතුමා සහ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ඔහු ගේ කාර්ය මණ්ඩලය ද නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥයින්ට ද මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි. තම ඉතා වටිනා කාලය සම්බන්ධයෙන් නොයෙක් අවස්ථාවන්හි පරිත්‍යාගශීලී වූ රජයේ නීතිඥ ප්‍රියන්ත නාවානට මම විශේෂයෙන් ම ස්තූතිවන්ත වෙමි. මෙම වාර්තාවේ ඇති කරුණු සම්බන්ධයෙන් ඇති ඕනෑ ම වැරැද්දක් මගේ ම වගකීම වන බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

කථා ඉදිරිපත් කිරීමට බොහෝ කාලයක් තිබුණු හෙයින් ද පැහැදිලිව ම තර්ජනවල ගොදුරු බවට පත් වූ හෙයින් ද මේ කරුණ පරීක්ෂණ කොමිසම සහ ත්‍රි පුද්ගල මහාධිකරණ නඩු විභාගය සම්බන්ධයෙන් විශේෂයෙන් ම සත්‍යයක් විය. මේ නිසා, නිල වාර්තාව කොතරම් වටින්නේ වුවත් ඇත්ත කථාව වැදගත් ආකාර වලින් මෙම ලියවිලි වලින් කියවෙන්නා වූ දෙයට වෙනස් විය හැකි ය.

## 2. ප්‍රහාරය

දින හතරක් කඳවුරෙන් පිටතට ගොස් සිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ස්ථානාධිපති වූ කපිතාන් වයි.කේ. අබේරත්න ඔක්තෝබර් 24 දා ආපසු පැමිණෙන විට කඳවුරෙහි උණුසුම් වාතාවරණයක් තිබුණි. වයස අවුරුදු දොළහේ සිට මැදි තිස්විය දක්වා වයස්ගත වූ දෙමළ පුරුෂයන් හා ළමයින් වූ රැඳවියන් හතලිස් එක් දෙනා ගෙන් බොහෝ දෙනෙක් නොයෙකුත් සුළු දුක්ගැනවිලි ගැන පැමිණිලි කිරීමට පටන් ගත් හ. මෙය වර්ධනය වූයේ රඳවා තැබීමෙන් තමන් නිදහස් කළ යුතු යැයි ඔවුන් සිතූ දිනයට පසුව පවා ඔවුන් රඳවා තැබීමට සාමූහිකව දක්වූ විරෝධතාවකිනි. මෙම විරෝධතාවය පසුව වහාම නිදහස් කිරීමේ ඉල්ලීමක් බවට හැරුණි. කෑගැසීම ඉක්මණින් ශාරීරික ගැටුමක් බවට පත් විය. කඳවුර ආරක්ෂා කිරීමට යොදවා සිටි පොලිස් හටයෙක් වෙඩිල්ලක් පත්තු කළ අතර එක් රැඳවියෙක් කඳවුරේ උපනායකයා වූ ලූතිනන් පී. අබේරත්නට (දෙදෙනා නෑදැයින් නොවේ) පහර දී තුවාල සිදු කළේය.[9] මෙහි දී මතු වූයේ ප්‍රාණ ඇපකරුවන් ගැනීමට සමාන තත්ත්වයකි. කපිතාන් අබේරත්නට කඳවුරෙන් ඉවත්ව යෑමට රැඳවියන් විසින් ඉඩ නො දෙන තත්ත්වයක් මතු වී තිබූ බව පෙනී යන අතර ලුතිනන් අබේරත්න කඳවුරින් බේරී පලා ගොස් "කොටින්" කඳවුරට පහර දුන් බවත් ඔවුන් ගමට පහර දෙනු ඇති බවත් අසල්වැසි ගැමියන්ට නිවේදනය කළේ ය. ඊළඟට ලුතිනන් බණ්ඩාරවෙල පොලිසියට ගොස් කඳවුර තුළ සිද්ධීන් ගැන දැනුම් දෙයි. පොලිස් පරීක්ෂක කරුණාසේන ද දොළොස් දෙනෙක් පමණ තවත් පොලිස් නිලධාරීන් ද

09. කඳවුරේ කාර්ය මණ්ඩලයේ සියලූ දෙනාම ජාතික තරුණ සේවා සභාවේ සේවකයෝ වූහ. එහෙත් එහි ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් දෙදෙනා වන කපිතාන් අබේරත්න සහ ලුතිනන් අබේරත්න හමුදාවේ තරුණ පුහුණු අංශයක් වන කැඩෙට් සේනාංකයේ සාමාජිකයෝ වූහ. ඔවුන්ට මිලිටරි තානාන්තරයක් තිබුණේ එහෙයිනි. එහෙත් සඳහන් කළ යුත්තක් නම් කපිතාන් අබේරත්න කිසි දිනක හමුදාවේ සේවය කර නැති බවයි. ඔහු ගුරුවරයෙක් ලෙස පුහුණු වී සිටි අතර කලින් විදුහල්පතිවරයෙක් ලෙස සේවය කර සිටියේ ය. ලුතිනන් අබේරත්න ගේ පසුබිම සම්බන්ධයෙන් තොරතුරු ලැබී නැත.

ඇතුළු කණ්ඩායමක් සමඟ මූලස්ථාන පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න ඉක්මණින් කඳවුර දෙසට යයි.[10] මූලස්ථාන පොලිස් පරීක්ෂක සෙනෙවිරත්නට නිරායුධව කඳවුරට ඇතුළු වීමට රැඳවියෝ අවසර දෙති. ඔහු රැඳවියන් සමඟ සාකච්ඡා කර කඳවුරු භූමියෙන් පොලිස් මුරපොළ ඉවත් කිරීමට එකඟ වීමෙන් රැඳවියන් සමඟ තත්ත්වය තාවකාලික ව සන්සුන් කර ගනියි. ගැටුම ආරම්භ වීමෙන් පසු කඳවුර අවට රැස්ව සිටි සිංහල ගැමි පිරිස් වලින් පොලිසිය කඳවුර ආරක්ෂා කරන තාක් දුරට සෑම දෙයක් ම පාලනය කර තබා ගත හැකි බවට කපිතාන් අබේරත්න මූලස්ථාන පරීක්ෂක සෙනෙවිරත්නට සහතික විය. අසල පිහිටි දියතලාව හමුද කඳවුරෙන් කුඩා හමුද භට කණ්ඩායමක් යවා කඳවුර අවට රැස්ව සිටි පිරිස් විසුරුවා හැරීම නිසා සවස් යාමයේ දී තත්ත්වය සන්සුන් වෙයි. කුඩා පොලිස් භට කණ්ඩායමක් රාත්‍රී කාලයේ කඳවුරේ ආරක්ෂාවට තබා හමුද භට කණ්ඩායම ආපසු බැරැක්ක වලට එයි.

පසු දින උදේ 6.45 වන විට හොඳින් ආයුධ සන්නද්ධ වූ පොලිස් බල ඇණි පැමිණීමට පටන් ගන්නා අතර කඳවුර අවට විවිධ ස්ථානවල රඳවනු ලබයි.[11] එම වෙලාවට ම යළි වතාවක් සෙනඟ එක් රැස්වීමට පටන් ගනියි. බස් රථයක් නතර කර කඳවුරට විරුද්ධ විරෝධතාවට එකතු වන ලෙස එහි මගීන්ට පැවසෙයි. සෙසු අය පයින්, කාර් වලින් සහ ලොරි වලින් පැමිණෙති. සමහර විට ඔවුන් කඳවුර සහ එහි රැඳවියන් ඉවත් කරන ලෙස ඉල්ලන වර්ගවාදී සටන් පාඨ සහිතව කලින් දින රාත්‍රියෙහි හදිසියේ මතු වූ පෝස්ටර් මගින් පොළඹ වනු ලැබූවන් විය හැකි ය. අවසානයේ දී විශාල පිරිසක් රැස්වෙති. එය 500 සිට 3000 පමණ වූ බව තක්සේරු කර ඇත. ඔවුන් ගෙන් බොහෝ අය පොලු, මුගුරු සහ පිහි වලින් සන්නද්ධ වී සිටියහ. (නමුත් කිසිවෙකු ගිනි අවි දරා නො සිටියහ). පෙරවරු 8.30 ට පමණ එක්

---

10. මූලස්ථාන පරීක්ෂක සෙනෙවිරත්න, බණ්ඩාරවෙල පොලිසියට සම්බන්ධව සිටි ජ්‍යෙෂ්ඨතම පොලිස් නිලධාරියා විය. මෙම සිද්ධියට කෙළින් ම සම්බන්ධ වූ තවත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් සිටියේ ය. ඔහු නම් උප පොලිස් අධිකාරී දයාරත්නයි. උප පොලිස් අධිකාරීවරයෙක් මූලස්ථාන පොලිස් පරීක්ෂකයෙකුට වඩා තනතුරින් ඉහළ වන අතර එක් පොලිස් ස්ථානයකට වඩා ඔහු ගේ බලතල පැතිරෙයි. උප පොලිස් අධිකාරී දයාරත්න ගේ කාර්යාලය පැවතියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ගේ කාර්යාලය සහ බණ්ඩාරවෙල පොලිසිය තිබූ ගොඩනැගිල්ලට වෙනස්ව ය. පහර දීම සිදු වූ කාලයේ දී තවත් විශේෂ පොලිස් අධිකාරීවරයෙක් ද මෙහි සිටියේ ය. බී. ඇම්. ප්‍රේමරත්න වන ඔහු 24 වැනිද සහ 25 වැනිද සිටියේ කොළඹ ය. එනිසා ඔහු ප්‍රහාරය සම්බන්ධයෙන් ඍජුව ම වගකීමට ලක් වූයේ නැත. 24 වැනිද සහ 25 වැනිද ප්‍රධානියා ලෙස ක්‍රියා කළේ උප පොලිස් අධිකාරී දයාරත්නය.
11. කඳවුර පිහිටා තිබුණේ තවත් ගොඩනැගිලි කිහිපයක් ද කුඩා ගම්මාන සමූහයක් ද පිහිටි කන්දක මුදුනේ ය.

අවස්ථාවක දී පිරිසෙන් එක් කොටසක් කඳවුර තුළට කඩා වදිති. විවිධ සහ බිහිසුණු ක්‍රම උපයෝගී කරමින් රැඳවියන්ට පහරදීම සහ ඝාතනය කිරීම සිදු වේ. කපා, කොටා මැරෙන තුරු පොලු වලින් ගැසීම, ශරීර කෑලි වලට වෙන් කර පිච්චීම සහ සමහරු පණ පිටින් පිච්චීම මෙහි දී සිදු විය. පොලිසිය පහර දීම වැළැක්වීමට අසමත් වූවා පමණක් නොව ඉන් සමහර අය ඝාතනයට ද සම්බන්ධ වූහ. ඔවුහු තමන් ව ලුහු බඳින්නන් ගෙන් බේරීමට පලා යමින් සිටි රැඳවියන් ගෙන් අඩුම වශයෙන් තුන් දෙනෙකුට වෙඩි තබා එක් අයෙකු මරණයට පත් කළහ. ආරක්ෂා සහිත ලෙස පෙනෙන්නට තිබුණ පොලිස් ට්‍රක් රථයක් තුළට රැඳවියන් ගණනාවක් ඇතුල් වූ පසු පොලිසිය බලා සිටිය දීම ඔවුන්ට පහර දුන් අතර ඔවුන් ගෙන් එක් අයෙකු ඝාතනය කරනු ලැබී ය. පොලිසියේ කිසිවෙකුට තුවාල සිදු නොවූ අතර ප්‍රහාරකයන් ගෙන් ඉතා ටික දෙනෙකුට පමණක් තුවාල සිදු විය. රැඳවියන් ගෙන් 27 ක් ඝාතනය කරනු ලැබීය. දහ හතර දෙනෙකු තුවාල ලැබූ අතර ඉන් සමහරෙකු ගේ තුවාල බරපතල විය. පෙරවරු 9.30 ට පමණ බණ්ඩාරවෙල පොලිසියෙන් කැරලි මර්දන හට කණ්ඩායම් සහ අසල පිහිටි දියතලාව හමුද කඳවුරෙන් හමුද හට කණ්ඩායම් පැමිණෙන විට ප්‍රචණ්ඩ ක්‍රියාව මුළුමනින් ම අවසන් වී හමාරය. තුවාලකරුවන් විවිධ රෝහල් වලට ගෙන යනු ලබයි.[12]

පහර දී අවසන් වූ ක්ෂණයෙහිම වාගේ විශ්වාසවන්ත මූලාශ්‍රයන් ගෙන් පැහැදිලි තොරතුරු ලබා ගැනීමේ අපහසුකම මත පෝෂණය වෙමින්, සිදු වූ දෙය ගැන එකිනෙකට පරස්පර වූ කථනයන් සහ විස්තර කිරීම් ගණනාවක් ප්‍රසිද්ධ තලයෙහි ආධිපත්‍යය ලබා ගැනීම සඳහා තරඟ කරයි. මුලින්ම ප්‍රචාරය වූ වඩාත් ජනප්‍රිය කථාන්තර අතර එකිනෙකට මුළුමනින් ම පරස්පර වූ විස්තර දෙකක් තිබුණි. එකකින් කියැවුනේ මෙම පහර දීම කඳවුරට පිටතින් පැමිණියා වූත් ඉක්මණින්ම ප්‍රකට වූත් "ඇන්තනී ජේම්ස්" විසින් උසි ගන්වන ලද එල්.ටී.ටී.ඊ. කුමන්ත්‍රණයක බලාපොරොත්තු වූ ප්‍රතිඵලයක් බවයි. ඔහු විසින් 24 සවස සහ 25 උදේ කඳවුරේ සිට මඩකලපුවේ තම සම්බන්ධකම් වලට දුරකථනයෙන් ඇමතීම එල්.ටී.ටී.ඊ. ය සමඟ ඔහුට තිබූ අන්තරායකාරී සම්බන්ධකම් සහ ප්‍රහාරයට මැදිහත් වීමට

---

12. මරණින් බේරුණු අය ගෙන් බොහෝ දෙනෙකුට සිදු වූයේ අත්අඩංගුවේ සිටිය යුතු කාලය සම්පූර්ණ කිරීම සඳහා තෙලිප්පලෙයි පුනරුත්ථාපන කඳවුරට යැවීමට පෙර මාස ගණනක් දියතලාවේ හමුද කඳවුරු රෝහලේ රඳවනු ලැබීමට ය. ඇසින් දුටු සාක්ෂි වලට අනුව, දියතලාවේ රඳවනු ලැබූ මුල් සති කිහිපය තුළ දී ඔවුන් මාංචු වලින් ඇඳට බැඳ දමා තිබුණි. මීට හේතුව ලෙස පැවසුනේ එය ඔවුන් ගේ ම ආරක්ෂාව සඳහා එනම්, කිසියම් "සිද්ධියක්" ඇති වීම වැළැක්වීම සඳහා කරන ලද්දක් බව ය.

සාක්ෂි ලෙස සමහරු විසින් අර්ථ කථනය කරන ලදී.[13] පොලිසිය, හමුදාව සහ සමහර විට ආණ්ඩුවේ දේශපාලනඥයින් විසින් සංවිධානය කර, කරන ලද කුමන්ත්‍රණයක දී රැඳවියන් තවත් බොහෝ දෙනෙකු ඝාතනය කර ඔවුන් ගේ සිරුරු සහ හැඳුනුම්පත් සැඟ වූ බව ප්‍රතිවිරුද්ධ විස්තරයකින් කියැවුණි. මෙම කුමන්ත්‍රණ න්‍යායන් දෙකම සඳහා කිසියම් විශ්වාසවන්ත සාක්ෂි තවමත් අනාවරණය කර ගත යුතුව ඇත.[14] ඇත්තනි ජේම්ස් 24 සවස පැවති ආරම්භක විරෝධතා වලට නායකත්වය දීමට උදව් කළ බව පෙනෙන්නට තිබෙන අතර ඔහු එල්.ටී.ටී.ඊ. ය විසින් කඳවුර තුළ පදිංචි කළ අයෙක් බවට සාක්ෂි නැත. එමෙන් ම වඩාත් පොදු ලෙස සඳහන් කළොත් රැඳවියන් ගේ උද්ඝෝෂණයට එල්.ටී.ටී.ඊ. ය සම්බන්ධ වීමක් හෝ උද්ඝෝෂණය කලින් අරමුණු කළ දනුවත් ප්‍රකෝපකරණයක් බවට සාක්ෂි නැත. ඒ හා සමානව ම පහර දීම සිදු වන අවස්ථාවේ 41 ට වඩා කඳවුර තුළ රැඳවියන් සිටි බවට හෝ ආණ්ඩුව විසින් නො පිළිගන්නා ලද අතිරේක සංඛ්‍යාවක් ප්‍රහාරයට ගොදුරු වූ බවට සාක්ෂි නැත.

අනෙක් අතට ගම්මුන් ගේ පහර දීම පිටුපසින් යම් ප්‍රමාණයක සංවිධානය කිරීමක් තිබූ බවට වැදගත් ඇඟවීම් ඇත. කඳවුර ප්‍රචණ්ඩ ආකාරයට විනාශ කිරීමට කැඳවුම් කරන පෝස්ටර් ලිවීමට සහ ඇලවීමට මිනිසුන් අවශ්‍ය කරනු ලැබූ අතර ප්‍රහාරයට සම්බන්ධවීම සඳහා අවට ගම්වලින් සහ බණ්ඩාරවෙල නගරයෙන් පිරිස් ගෙන ඒමට සමහරු දුරකථන ඇමතුම් දී තිබේ.[15] සිංහල ජාතිවාදී පක්ෂ විසින් 2000 ඔක්තෝබර් 10 පැවති

13. විශ්වාස සහගත අංශ වලට අනුව, මෙම දුරකථන ඇමතුම් වලින් අඩු වශයෙන් එකක්, ජාත්‍යන්තර රතු කුරුස කාර්යාලයේ මඩකලපුව කාර්යාලයට කළ එකක් විය. අනෙක, එවකට මඩකලපුවේ ද්‍රවිඩ පෙරමුණේ මන්ත්‍රීවරයාව සිටි ජෝසප් පරරාජසිංහම්ට කළ ඇමතුමකි.

14. එහෙත් කථාන්තර දෙකම අඛණ්ඩව පවතින අතර විවිධ වෙබ් අඩවි තුළ මෙය තාමත් සඳහන් වේ. උදහරණ වශයෙන් ප්‍රහාරය සිදු වන අවස්ථාවෙහි කඳවුරෙහි රැඳවියන් 83 ක් රඳවා සිටි බව ප්‍රකාශ කරන නඩුව සම්බන්ධ පශ්චාත් නඩු විභාග විස්තරයක් The Tamilnet වෙබ් අඩවිය තවමත් ප්‍රචාරය කරයි. එබඳු ප්‍රකාශ මෙතෙක් කිසිවකු තහවුරු කර නැත. බලන්න. www.tamilnet.org/art.html? catid=13 & artid=9329.

15. මෙම පෝස්ටර්වල වැදගත්කමත් ප්‍රහාරය සැලසුම් කිරීමට කඳවුරු උදව් කරන්නට ඇති දයි සොයා ගැනීමට ඒවායින් ලබා ගත හැකි උදව්වත් පිළිබඳව සොයා බැලීමේ වැදගත්කම පළමුව පෙන්වා දුන් එක් ආයතනයක් වූයේ මානව හිමිකම් කොමිසම ය. ඔවුන් ගේ වචන වලින් කියතොත්, මේ දක්වා අපට රැස්කර ගැනීමට හැකි වූ සියලු ම තොරතුරු වලට අනුව පෙනී යන්නේ 25 ද සිදු වූ සිද්ධිය කලින් අරමුණු නො කළ, හුදෙක් රැඳවියන් ගේ ප්‍රකෝපකරණය හේතු කොට ගෙන පුපුරා ගිය ප්‍රචණ්ඩ ක්‍රියාවක් නො වන බවයි. කලින් අරමුණු කර සැලසුම් කළ ප්‍රහාරයකට එය වඩාත් සමාන වෙයි. මෙම ප්‍රථම වාර්තාව ප්‍රහාරය සම්බන්ධ ව ප්‍රසිද්ධ කළ හොඳම විශ්ලේෂණය ලෙස පවතියි. බිඳුණුවැව සමූහ මනුෂ්‍ය ඝාතනය: මානව හිමිකම් කොමිසමේ අන්තර් වාර්තාව 2000 නොවැම්බර් 1, *Law and Society Trust Review* හි පළ කරන ලදී. වෙළුම 11, 158 වෙනි නිකුතුව, 2000 දෙසැම්බර්, පිටුව 11.

පාර්ලිමේන්තු මැතිවරණ උද්ඝෝෂණය තුළදී, කඳවුර වසා දැමීමට උද්ඝෝෂණය කිරීම තවදුරටත් සැකයට පසුබිම සකසයි. මෙම ඇඟවුම් ගැන තවදුරටත් සෙවීමට කොමිසම උනන්දුවක් නො පෙන්වීම සහ රහස් පොලිසියේ පරීක්ෂණවල දී මෙබඳු සම්බන්ධකම් ගැන සොයා ගත් යමක් වූයේ නම් ඒවා කිසිසේත් ම ප්‍රසිද්ධියට පත් නො කිරීම නිසා වර්ගවාදී කුමන්ත්‍රණ කථාව සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීම අපහසු ය. මෙම කාරණාවට අපි පසුව එළඹෙන්නෙමු.

## 3. කඳවුර සහ රැඳවියෝ

පහර දීම සම්බන්ධ හේතූන් සහ එහි ආදීනව ගැන සම්පූර්ණ විශ්ලේෂණයක් කිරීමට පෙරාතුව, බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුරේ ස්වභාවය සහ රැඳවියන් 41 දෙනා කඳවුරේ රඳවා තැබීමේ පදනම තේරුම් ගැනීම වැදගත් ය.

බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුර, පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් ගේ අනුග්‍රහය යටතේ මෙහෙය වනු ලැබූ පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙන් එකකි.[16] කෙසේ වුව ද, අනෙක් පුනරුත්ථාපන කඳවුරු දෙක මෙන් බිඳුණුවැව ද ඇත්ත වශයෙන් පාලනය කරනු ලැබුවේ 2000 වසරේ ක්‍රීඩා

16. යාපනය නගරයට උතුරෙන් තෙලිපිලෙයි හි අමාරුවෙන් පවත්වා ගෙන යන තවත් කුඩා කඳවුරක් තවමත් තිබේ. එල්.ටී.ටී.ඊ. කාන්තා කාඩර්වරු පුනරුත්ථාපනය කිරීම සඳහා සැලසුම් කළ මෙත් සෙවන නම් වූ ඉතා කුඩා මධ්‍යස්ථානයක් කොළඹ ප්‍රදේශයේ ගංගොඩවිල තිබේ. ඔවුන් ගේ ප්‍රථම ප්‍රචණ්ඩ කැරැල්ලේ දී අල්ලා ගත් හෝ යටත් වූ ජනතා විමුක්ති පෙරමුණේ සටන්කාමීන් පුනරුත්ථාපනය කිරීම සඳහා මේ වර්ගයේ කඳවුරු ප්‍රථමයෙන් ම පිහිටුවනු ලැබුවේ 1970 දශකයේ මුල් භාගයේ දී ය. 1980 දශකයේ අගභාගයේ සහ 1990 දශකයේ මුල් භාගයේ ඇති වූ ජ.වි.පෙ. දෙවන කැරැල්ලෙන් පසුව කඳවුරු ඒ ආකාරයෙන් ම යොදා ගනු ලැබී ය. සමහර විට මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ද කඳවුරු යොදා ගනු ලැබීණි. පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙස බිඳුණුවැව කඳවුර 1990 දී පිහිටුවනු ලැබී ය. පළමුවෙන්ම එල්.ටී.ටී.ඊ. සැකකරුවන් සහ යටත් වූවන් බාරගැනීම ආරම්භ කළේ 1993 දී ය. තෙලිපිලෙයි කඳවුරු 1998 නොවැම්බර් මාසයේ දී පිහිටුවන ලදි. බලන්න. "බිඳුණුවැව පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සිදු වූ සිද්ධිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ ජනාධිපති කොමිසමේ වාර්තාව, 2000 ඔක්තෝබර් 25", පිටුව 18. මින් මතු මෙම වාර්තාවේ පෙළ "කොමිෂන් වාර්තාව ලෙස මේ ලිපියෙහි සඳහන් කෙරුණු අතර කොමිෂන් වාර්තාව අන්තර්ජාලයේ w.w.w.brynmawr.edu/peacestudies/srilanka/bindunuwewa වෙබ් අඩවියෙන් මැත දී ලබා ගැනීමට හැකිව තිබේ.

සහ තරුණ කටයුතු අමාත්‍යංශයේ අනුග්‍රහය යටතට පැමිණි ජාතික තරුණ සේවා සභාව විසිනි.[17]

පුනරුත්ථාපනය සඳහා යෝග්‍යතාව සහ රැඳවියෙකු රඳවා තැබීමේ කාලවකවානුව යන දෙකම නිර්ණය කිරීමේ කටයුත්ත හදිසි අවස්ථා රෙගුලාසි මත ජනාධිපති විසින් පත් කරන ලද උපදේශක කමිටුවකට අයත් විය. ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් සමඟ කමිටුව ඉතා සමීපව වැඩ කළේ ය. කමිටුව මෙම තීන්දු වලට කෙසේ පැමිණියේ ද යන්න රඳ පවතින්නේ රැඳවියා බිදුණුවැවට පැමිණියේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) 9 වගන්තිය යටතේ "රඳවා තබන්නෙකු" ලෙස ද, නැතහොත් ඔහු එකල බලපැවැත් වූ හදිසි අවස්ථා රෙගුලාසිවල 17-19 රෙගුලාසි යටතේ "අත්අඩංගුවට ගත් අයෙක් ද" එසේත් නැතහොත් තමන් ම සිය කැමැත්තෙන් යටත් වී පොලිසියට හෝ ආරක්ෂක හමුදවකට බාර වූ අයෙක්

---

17. කඳවුරෙහි කාර්ය මණ්ඩලය ජාතික තරුණ සේවා සභාවේ සේවකයෝ වූහ. මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සහ රැඳවියන් සඳහා නිශ්චිත පුහුණු වැඩ සටහන් සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාමේ දී ජාතික ළමා ආරක්ෂක නියෝජිත ආයතනයේ මෙන් ම දේශීය සහ විදේශීය රාජ්‍ය නො වන සංවිධානවල සමහර මැදිහත්වීම ද සිදු විය. විශ්වාස කටයුතු ආරංචි මාර්ග වලට අනුව ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යංශය විසින් කඳවුරු පවරා ගනු ලැබුවේ 1997 දී ය. භාණ්ඩාගාරයට සෘජු සම්බන්ධතාවය සහිතව එය තිල වශයෙන් තිබුණේ සෘජුව ම ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ය. මෙම ආරංචි මාර්ගයට අනුව, යෞවන කටයුතු අමාත්‍යංශය යටතට ගැනීම නිසා කඳවුරට ලැබුණ අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීමට හේතු විය. කඳවුරට ආරක්ෂාව සම්පාදනය කළේ බණ්ඩාරවෙල පොලිසියට සම්බන්ධිත කුඩා පොලිස් භට පිරිසක් විසිනි. කපිතාන් අබේරත්න විසින් 1998 වසරේ අගභාගයේ සහ 1999 වසර මුල දී, කඳවුරට වඩා හොඳ ආරක්ෂාවක් බණ්ඩාරවෙල පොලිසියෙන් ඉල්ලා තිබුණි. නමුත් ඔවුන්ට අතිරේක ආරක්ෂාවක් කඳවුරට සම්පාදනය කළ නො හැකි බව බණ්ඩාරවෙල මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ගේ පිළිතුර විය. කොමිසම ඉදිරියේ දුන් සාක්ෂි වලට ඔවුන් හුවමාරු කළ ලිපි ඇතුළත් කරනු ලැබී ය. කොමිසම විසින් බාර ගත් ලිපි ලේඛන පිළිබඳ කොමිෂන් වාර්තාවේ උපග්‍රන්ථය තුළ මෙම ලිපි ලැයිස්තු ගත කරනු ලැබ ඇත. කෙසේ වුව ද, යම් හේතුන් නිසා මෙම ප්‍රශ්නය කොමිෂන් වාර්තාව තුළ සාකච්ඡා කර නැත.

ද යන කරුණු මත ය.[18] කිසිදු සැකකරුවෙකුට කවර හෝ වරදක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා හෝ චෝදනා ඉදිරිපත් කිරීමක්

---

18. 1947 අංක 26 දරණ මහජන ආරක්ෂක ආඥාපනතේ (සංශෝධිත) 5 වන වගන්තියේ විධිවිධාන යටතේ ස්වයංක්‍රියව නීතියේ බලය ලබා ගන්නා වූ හදිසි අවස්ථා රෙගුලාසි ප්‍රකාශ කිරීමට ජනාධිපතිට බලය තිබේ. (නමුත් ඒවා පාර්ලිමේන්තුව විසින් එක් එක් මාසයේ දී අනුමත කළ යුතු ය) චෝදනා හෝ නඩු නැති ව පුරවැසියන් සෝදිසි කිරීමේ, අත්අඩංගුවට ගැනීමේ සහ රඳවා තැබීමේ, ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් හෝ සෙසු බලධරයන් හරහා ක්‍රියාත්මක වන - සුවිශාල බලතල අණ්ඩුවට ලබා දී ඇත. ඊට අතිරේකව වෙනත් බොහෝ මූලික සිවිල් සහ දේශපාලන අයිතීන් මත සීමා පැනවීමේ බලය පැවරීමට ද පිළිවන. බිඳුණුවැව කඳවුරට පහර දෙන අවස්ථාවෙහි බල පැවැත් වූ හදිසි අවස්ථා රෙගුලාසි වූයේ ජනාධිපති කුමාරතුංග විසින් 2003 මැයි මාසයේ ප්‍රකාශයට පත්කළ 2000 අංක I දරණ හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) රෙගුලාසි ලෙස දක්නා ලද හදිසි අවස්ථා රෙගුලාසි ය රඳවා ගැනීමේ සහ රඳවා ගැනීමේ කාලය සම්බන්ධ එක් එක් වෙනස් ක්‍රියාපටිපාටීන් සහිත රඳවා ගැනීමට අවසර ලබා දිය හැකි විවිධ රූපාකාරයන් මාලාවක් රෙගුලාසි 17-20 මගින් දක්වන ලදී. හදිසි අවස්ථා 17 වැනි රෙගුලාසිය, නිවාරක රඳවා තැබීමට අවසර ලබා දෙයි. එය, ඕනෑ ම පුද්ගලයකු ජාතික ආරක්ෂාව/මහජන සාමයට හානිකර අන්දමින් ක්‍රියා කිරීම වැළැක්වීම සඳහා වසරක් දක්වා කාලයක් රඳවා තැබීමට ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්ට බලය පවරයි. 18-19 රෙගුලාසි වලින් ද සෙසු හදිසි අවස්ථා රෙගුලාසි උල්ලංඝනය කිරීමට යම් පුද්ගලයකු සම්බන්ධ වී ඇති හෝ සම්බන්ධ වීම පිළිබඳ සැක කරනු ලැබූ ඕනෑ ම අයෙක් පරීක්ෂණ පැවැත්වීම සඳහා අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තැබීමට ඉඩ සලසා ඇත. මෙබඳු සෝදිසි කිරීම් හා රඳවා තබා ගැනීම් චෝදනා වලින් තොරව මාස 9 ක් තරම් දිගු කාලයක් පුද්ගලයින් රඳවා තැබීමට අවසර දෙයි, හදිසි අවස්ථා රෙගුලාසි 17-19 යටතේ හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (1979) 9 කොටසේ නියමයන් යටතේ දනටමත් රඳවා සිටින කවරකුට හෝ යෙදිය හැකි "පුරුත්ථාපනය කිරීම සඳහා රඳවා ගැනීමේ" නියමයන් 20 රෙගුලාසිය මගින් නිර්දේශ කර ඇත. මෙහි තේරුම වූයේ කිසියම් පුනරුත්ථාපන නියෝගයක කාල ප්‍රමාණය රැඳවියා ඊට පෙර අත් විඳි කවර හෝ රඳවා ගැනීමකට අතිරේක කාලයක් වීමයි. හමුදාවට හෝ පොලිසියට යටත් වූවන් රඳවා තැබීම සිදු කරනු ලබන්නේ හදිසි අවස්ථා රෙගුලාසි 20 (ඇ) ට අනුවය. එහෙත් කලක් ඉහත කී එවැනි යටත් වූවන් සෝදිසි කර මුදා හැරිය හැකි වුවත් 1996 පසුව හදිසි නීති රෙගුලාසි වලින් නිර්දේශ කර ඇත්තේ යටත් වූ කවරෙකු වුව ස්වයංක්‍රීය ව පුනරුත්ථාපනය සඳහා යැවිය යුතු බවයි. ආරක්ෂාව සඳහා පොලිසිය වෙත පැමිණි තැනැත්තන්ට පවා මෙය යොදනු ලැබීය. බලන්න. ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානය, "ශ්‍රී ලංකාවේ නව හදිසි අවස්ථා රෙගුලාසිය මානව හිමිකම් ආරක්ෂාව බාදනය වීම" 2000 ජූලි (ASA 37/19/00) පිටු 7, 13 සහ INFORM "හදිසි අවස්ථා රෙගුලාසි (විවිධ විධිවිධාන සහ බලතල) පිළිබඳ සමාලෝචනය. 2000 අංක. 1," 2000 මැයි 15.

හෝ සිදු වී නො තිබුණි.[19] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හෝ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ පුද්ගලයන් රැඳවුම් භාරයේ තැබූ අවස්ථාවල දී පුනරුත්ථාපනය සඳහා දෙන ලද පුද්ගලයෙකු ගේ යෝග්‍යතාව සහ පුනරුත්ථාපන කාලවකවානුව තීන්දු කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් සිවි පුද්ගල උපදේශක කමිටුවේ[20] උපදෙස් ලබා ගත යුතු ය. මෙසේ නිකුත් කෙරෙන "පුනරුත්ථාපන නියෝගය" මගින් පුනරුත්ථාපනය කිරීමේ හෝ රඳවා තබා ගැනීමේ කාලය නිර්දේශ කළ යුතු නමුත් රැඳවියන් සම්බන්ධ කාරණයේ දී රඳවා තබා ගැනීමේ උපරිම කාලය එවන් පුනරුත්ථාපනය කිරීමේ නියෝගයක[21] තහවුරු කරන රෙගුලාසි මගින් සුවිශේෂව නියම කෙරෙන්නේ නැත. ඒ අනුව රැඳවියන් සම්බන්ධයෙන්

---

19. 2000 හදිසි අවස්ථා රෙගුලාසි සම්බන්ධ වාර්තාවක ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානය පෙන්වා දෙන ආකාරයට මෙය ශ්‍රී ලංකාව අත්සන් කරුවෙකු වන සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ නියමයන් උල්ලංඝනය කිරීමකි. අත්අඩංගුවට ගනු ලබන සියලු ම පුද්ගලයන්ට ඔවුන් ව අත්අඩංගුවට ගැනීමේ හේතූන් සහ ඔවුන්ට විරුද්ධ චෝදනා අප්‍රමාද ව දැනුම් දිය යුතු බව සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ප්‍රකාශ කරයි. සාපරාධී චෝදනාවක් මත අත්අඩංගුවට ගත් හෝ රඳවා ගත් කවරෙකු වුව විනිශ්චයකරුවෙකු වෙත අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු ය. එමෙන්ම සහේතුක කාලයක් තුළ නඩුවකට හිමිකම ලැබිය යුතු ය, නැතහොත් නිදහස් කළ යුතු බව ද එය සුවිශේෂව සඳහන් කරයි. බලන්න, ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානය "ශ්‍රී ලංකාව: නව හදිසි අවස්ථා රෙගුලාසි - මානව හිමිකම් ආරක්ෂාව බාදනය" වීම 2000 ජුලි (ASA 37/19/00) පි. 13.
20. 2000 වසරේ දී උපදේශක කමිටුවේ මුලසුන හොබවන ලද්දේ හිටපු විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර ආනන්ද ග්‍රේරෝ විසිනි.
21. ජනාධිපති කොමිසමේ පරීක්ෂණයට ඉදිරිපත් කළ ඉතා වටිනා ලියවිල්ලක දී සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය පෙන්වා දී ඇති ආකාරයට, "එමනිසා නියෝගය ඕනෑම දීර්ඝ කාලයක් සඳහා විය හැකි ය. පුද්ගලයෙකු පුනරුත්ථාපනය කරනු ලැබීම සඳහා එක් නියෝගයකට වඩා නියෝග පැනවීමට ඉඩ සලසන නියමයක් නැත. පුනරුත්ථාපන කාලය දීර්ඝ කිරීමේ නියමයක් ද නැත. කෙසේ වුව ද, ඔවුන්ගේ පුහුණුව අවසන් කළ තරුණයන් නිදහස් කිරීම සම්බන්ධයෙන් ලේකම්ට නිර්දේශ කිරීමට 20 (ආ) 2 (ඇ) වගන්තිය මගින් කොමසාරිස් ජෙනරාල්ට බලය පවරනු ලැබ ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ පුනරුත්ථාපන නියෝග තුළ විශේෂයෙන් නියම කරන ලද කාල පරිච්ඡේදය අවසානයෙහි නිදහස් කිරීම ස්වයංක්‍රීයව සිදු නො වන බව ය. (කොමිෂන් වාර්තාව පිටු 28-9) සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය විසින් ප්‍රසිද්ධ කළ රඳවා තැබීමේ රෙගුලාසි පිළිබඳ විශ්ලේෂණය, පුනරුත්ථාපනය සහ යටත් වීම සම්බන්ධ සංදර්භය තුළ රඳවා තැබීම *Weekend Express* හි යළි මුද්‍රණය කරන ලදී. 2001 ජනවාරි 13-14. එය කොළඹ 3 චාර්ල්ස් වටරවුම, අංක 4 දරණ ස්ථානයෙහි පිහිටි සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරයේ පුස්තකාල මධ්‍යස්ථානයෙන් ද කෙළින්ම ලබා ගත හැකි ය.

"පුනරුත්ථාපනය කිරීමේ" කාලය ගැන සැලකිය යුතු ප්‍රමාණයක අපැහැදිලිකමක් තිබුණි.[22]

‘‘බාරවූවන්’’ සම්බන්ධයෙන් හදිසි අවස්ථා රෙගුලාසිවල කොන්දේසි වඩා නිශ්චිත ය. බාරවූවන් පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්ට බාරදීම ඉල්ලා සිටිනු ලබන අතර ඔවුන් ගේ බාරවීමෙන් දින දහයක් ඇතුළත ඔවුන් ව පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට බාර දිය යුතු ය. එම දින දහයේ කාලවකවානුව තුළ දී ම, බාර වූ තැනැත්තා බාරගත් නිලධාරියා ඔහුව බාරගත් කාරණාව සහ කොමසාරිස් ජෙනරාල්ට බාරදුන් බව ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්ට දනුම් දිය යුතු ය. මෙම අවස්ථාවේ දී උපදේශක කමිටුව බාර වූ තැනැත්තා ගේ තත්ත්වය සැලකිල්ලට ගනිමින් නියමයන් පනවනු ලබන අතර ඔහු ගේ හෝ ඇය ගේ යෝග්‍යතාව සහ පුනරුත්ථාපන කාලවකවානුව යන දෙකම තීන්දු කරයි. සාමාන්‍යයෙන් මාස ගණනාවක් ගනු ලබන මෙම සන්තතිය බාර වූ තැනැත්තා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙන් එකක රඳවනු ලැබ සිටිය දී පවා සිදු වෙයි. පුනරුත්ථාපනය සඳහා නිර්දේශ කරනු ලැබුව හොත්, රැඳවියෙකු ගේ ආරම්භක රඳවා තබා ගැනීමේ කාලය මාස තුනේ සිට මාස 12 දක්වා කාල පරාසයක් අත්කර ගනී. අතිරේක මාස 12 ක් දක්වා මාස තුනේ අතිරේක පුනරුත්ථාපන වර්ධකයන් නිර්දේශ කිරීමට කොමසාරිස් ජෙනරාල්ට ඉඩ සලසන ලද කොන්දේසියක් ද ඊට සම්බන්ධ කර ඇත.[23] මේ අනුව රැඳවියන් උපරිම වශයෙන් වසර දෙකක කාලයක් රඳවා තැබිය හැකි ය. එමනිසා රැඳවියන් සම්බන්ධ අපැහැදිලිකම අඩු අවස්ථාවල දී පවා, රැඳවියෙකුට ඔහු හෝ ඇය නිදහස් කරනු ලබන්නේ කවර අවස්ථාවේ දී දැයි නිශ්චය කිරීමට දුෂ්කර වන තරමට මෙම සන්තතිය සංකීර්ණ සහ සැහෙන පමණ අස්ථිර විය.

ඔක්තෝබර් 24 සවස කපිතාන් අබේරත්නට කළ වඩාත් බැරෑරුම් පැමිණිලි ඔවුන් ගේ නිදහස් වීමේ දිනය ඉක්මවා රඳවා ගෙන සිටින බවට බොහෝ

22. “පුනරුත්ථාපනය කිරීම” සඳහා රඳවා තබා ගන්නන් හදිසි අවස්ථා රෙගුලාසි මගින් හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නියම කරන ලද “නිවාරක රඳවා තැබීම” හෙවත් “සෝදිසි කිරීම සඳහා රඳවා තැබීම” වැනි වෙනත් වර්ගයේ රඳවා තැබීම් යටතේ දිගු කාලයක දනටමත් රඳවා තබා ගෙන සිටි අය වීමට ඉඩ ඇති නිසා තත්ත්වය මෙය බව විශේෂයෙන් ම සිතිය හැකි ය. එල්.ටී.ටී.ඊ. ය සමඟ සම්බන්ධ වීම පිළිබඳ සැක කරනු ලැබූ රැඳවියන් නඩු විභාගයකින් තොරව (සහ නිරතුරුව චෝදනා රහිතව) රඳවා තබා ගැනීමේ මෙම විවිධ රූපාකාරයන් අතර එහෙට මෙහෙට ගෙන යනු ලැබීම නිරන්තරව සිදු විය.

23. කොමිෂන් වාර්තාව පිටුව 32.

රැඳවියන්ට පැවති විශ්වාසයට අදාළ ඒවා වීම පුදුමයක් නො වී ය. කිසියම් සුවිශේෂ රැඳවියෙකු සම්බන්ධ සිද්ධියක දී මෙම විශ්වාසයන් සත්‍ය බවට සාක්ෂි නැති අතර රැඳවියන් සම්බන්ධව නිදහස් කිරීමේ අවසාන දිනයන් පැහැදිලි කිරීමේ යාන්ත්‍රණයක් නො තිබුණේ ය යන කාරණාව නිශ්චිතව ම ඔවුන් ගේ සිත් තැවුලට සහ නො සන්සුන්තාවයට දායක විය. සත්තකින් ම බිඳුණුවැව දී ද සෙසු කඳවුරුවල දී ද මෙසේ පැමිණිලි කිරීමේ ඉතිහාසයක් පැවතුණි. පුනරුත්ථාපන නියෝජ්‍ය කොමසාරිස් ජෙනරාල් කර්නල් ඇම්. ඒ. විපුලගුණේ කොමිසම ඉදිරියේ දුන් සාක්ෂි වලට අනුව පහර දීමට පෙරාතු වර්ෂයේ යම් අවස්ථාවක දී, විවාහක රැඳවියන් හැකි ඉක්මණින් සහ සෙසු අය මාස හයකින් පසුව නිදහස් කරන ලෙස ඉල්ලමින් බිඳුණුවැව රැඳවියන් විසින් කර්නල් විපුලගුණේට සහ කඳවුරේ පාලකයන්ට පෙත්සමක් බාර දී තිබුණි. පෙත්සම ඔහු ආරක්ෂක අමාත්‍යංශයට බාර දී තිබූ බව විපුලගුණේ ඔහු ගේ සාක්ෂි දීමේ දී ප්‍රකාශ කළේ ය. රඳවා තැබීමේ කාලය වෙනස් කළ නො හැකි බවට අමාත්‍යංශය පිළිතුරු දී තිබුණි.[24] කාන්තාවන් ගේ මධ්‍යස්ථානයක් වන "මෙත් සෙවණ" ට ගිය අවස්ථාවක දී ඔවුන් ගේ නිදහස් වීමේ දින ඔවුන් නො දන්නා බවත්, ඔවුන් ගේ පවුල් වෙත ආපසු යා හැකි වන්නේ කවදා දැයි දැන ගැනීමට ඔවුන් ඉතා කැමැත්තෙන් සිටින බවත් එහි රැඳවියන් කීවේ යැයි කොමිෂන් වාර්තාව තවදුරටත් ප්‍රකාශ කරයි.

ප්‍රශ්නය තවත් අවුල් කළ සාධක ද පැවතියේ ය. පළමුව, "යටත් වූ තැනැත්තා ගේ ගණයට" "ත්‍රස්තවාදී ක්‍රියාකාරීත්වයන් සම්බන්ධ බිය නිසා" තමන් ම පොලිසියට හෝ ආරක්ෂක බලකායන්ට බාර වූ අය ඇතුළත් වෙති. කොමිසම පෙන්නුම් කරන ආකාරයට ඔවුන් යටත් වූවන් ලෙස සැලකීම වැරදි ය. මක්නිසාද යත් ඔවුන් කිසියම් වරදක යෙදීම හෝ ඒ සම්බන්ධයෙන් සැක කරනු ලැබීම හෝ චෝදනා කරනු ලැබීම යන දෙකෙන් එකකට වත් ඔවුන් සම්බන්ධ වී නැති හෙයිනි. ඔවුහු ආරක්ෂාව බලාපොරොත්තු වන තැනැත්තෝ වෙති. එමෙන් ම එම හේතුව නිසා රඳවා තබන්නන් හෝ යටත් වූවන් සඳහා වූ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ඔවුන් රඳවා නො තැබිය යුතු ය.[25] සත්තකින් ම බිඳුණුවැව ප්‍රහාරයෙන් දිවි ගලවා ගත් දහහතර දෙනා ගෙන් එක් අයෙකු මෙම ගණයට ඇතුළත් වන බව කොමිෂන් වාර්තාව පෙන්වා දෙයි. ඔහු වන්නියට ගිය තැ ගමනක දී එල්.ටී.ටී.ඊ. ය විසින් අත්අඩංගුවට ගනු ලැබීමෙන් පැහැර ගෙන යනු ලැබීමෙන් පසුව ඔවුන් ගෙන් බේරී පලා ආ අයෙකි. එල්.ටී.ටී.ඊ. පාලනයෙන්

24. එම., පිටුව 29.
25. එම., පිටුව 30.

මිදී පලා ඒමට උත්සාහ කළ අයෙක් ලෙස ඔහු, ඔහු ගේ අභිමතයට එරෙහිව රඳවා නො තැබිය යුතු යැයි කොමිසම තිවැරදි ලෙස තර්ක කරයි.

දෙවනුව, පැහැදිලිව ම ඉතා වෙනස් මට්ටම්වල සිටින "රැඳවුම් කරුවන්" සහ "බාර වෙන්නන්" පුනරුත්ථාපන මධ්‍යස්ථාන විසින් මිශ්‍ර කරනු ලැබීම වඩාත් මූලික ප්‍රශ්නයක් බව කොමිසම පෙන්වා දෙයි.[26] බාර වෙන්නන් එක් හෝ තවත් ආකාරයකින් එල්.ටී.ටී.ඊ. ය ප්‍රතික්ෂේප කරන අය වන අතර රැඳවුම්කරුවෝ නිතර ම එල්.ටී.ටී.ඊ. ය කෙරෙහි බලගතු පක්ෂපාතීත්වයක් පවත්වා ගෙන යති.[27] මෙම රැඳවියන් දෙවර්ගය සම්බන්ධයෙන් සුදුසු වූ "පුනරුත්ථාපනය" අර්ථයෙන් සහ ස්වභාවයෙන් අතිශයින් ම වෙනස් වන්නේ ය. මතු විය හැකි දුෂ්කරතාවයක ප්‍රභවය පිළිබඳව එනම්, කඳවුරේ වැඩ කටයුතු කඩාකප්පල් කිරීම සඳහා එල්.ටී.ටී.ඊ. ය බාරවූවෙක් ලෙස වෙස්වලා ගත් ඒජන්තයෙකු හෝ කාඩර්වරයෙකු කඳවුර තුළ පදිංචි කිරීමේ ඉඩකඩ මගින් පැන නගින අනතුර ගැන කොමිෂන් වාර්තාව සවිස්තරාත්මකව විස්තර කරයි. බාරවූවෙකු ගැන වාර්තාව උපදේශක කමිටුව මගින් සමාලෝචනය කරන තෙක් මාස ගණනාවක් ම කඳවුර තුළ සිටිය හැකි වීම සහ එවන් පසුබිම් පරීක්ෂණ පවා සැකයෙන් තොර නිවැරදි නො වීම යන කාරණාව විසින් මෙම අන්තරාය වැඩි කරනු ලබයි. තවදුරටත් කිවහොත් "රැඳවියා" නමැති ප්‍රවර්ගය තුළ පවා එකිනෙකට වෙනස් වූ විවිධ අත්දැකීම් සම්බන්ධ පුළුල් පරාසයක් සහිත තරුණ ජනයා සිටියහ. සමහරු සත්‍ය වශයෙන් ම එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ව සිට තිබුණි. නමුත් සෙසු අය සැකයට තුඩු දෙන සාක්ෂි සුලබ වශයෙන් ඇති ව නැතහොත් සාක්ෂි කිසිසේත් නොමැති ව "ත්‍රස්තවාදී ක්‍රියා" සම්බන්ධව "සැක පිට"

---

26. හදිසි අවස්ථා රෙගුලාසි සලකා බැලීමේදී දෙවර්ගයක රැඳවියන් සඳහා වෙනස් වර්ගවල පුනරුත්ථාපන මධ්‍යස්ථාන දෙකක් ඇත්ත වශයෙන් තිබිය යුතු බව කොමිෂන් වාර්තාව පෙන්වා දෙයි. එනම්, යටත් වූවන් සඳහා සැලසුම් කළ (ආරක්ෂක නවාතැන් සැපයීමේ මධ්‍යස්ථාන) සහ රැඳවියන් සඳහා සැලසුම් කළ (තරුණ සංවර්ධන සහ පුහුණු මධ්‍යස්ථාන) (කොමිෂන් වාර්තාව. පිටුව 30) බිඳුණුවැව එකම කාර්ය මණ්ඩලයක් යටතේ දෙ වර්ගය ම එක ස්ථානයක සම්බන්ධ කළේ ය.

27. ඇත්ත වශයෙන්ම බිඳුණුවැව සහ සෙසු කඳවුරු පැවතීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ.ය නො සතුටින් සිටි බවට සාක්ෂි තිබේ. එල්.ටී.ටී.ඊ. සහ ශ්‍රී ලංකා ආණ්ඩුව අතර 2001 දී සටන් විරාමයට පෙර ඔවුන් නිදහස් කිරීමෙන් පසු ව බිඳුණුවැව කලින් සිටි රැඳවියන්ට එල්.ටී.ටී.ඊ.ය විසින් හිරිහැර කෙරුණු බවට වරින් වර වාර්තා විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක වීම අත්හිට වූ සටන් විරාමයත් පසුව බිඳුණුවැව හිටපු රැඳවියන්ට එරෙහි එල්.ටී.ටී.ඊ. ප්‍රචණ්ඩ ක්‍රියා ඉහළ ගොස් ඇති බව පෙනේ. විශ්වාස කටයුතු ආරංචි මාර්ගයකට අනුව හිටපු රැඳවියන් බොහෝ ගණනකට තර්ජනය කිරීම, මරා දැමීම, අත්අඩංගුවට ගැනීම හෝ සැඟවෙන්නට බල කරනු ලැබීම එල්.ටී.ටී.ඊ.ය විසින් කර තිබේ.

සරලව ම අත්අඩංගුවට ගත් අය වූහ.[28] අවසාන වශයෙන්, වයස අවුරුදු දහයේ තරම් ලාබාල ළමුන් වයස අවුරුදු තිස් ගණන් මැදි වයසේ මිනිසුන් සමඟ රඳවා තැබීම. පුනරුත්ථාපනය සම්බන්ධ ප්‍රතිපත්තියට නො ගැලපෙනවා පමණක් නොව ළමා අයිතීන් පිළිබඳ සම්මුතියකට අත්සන් කළ රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව විසින් පැහැදිලිව ම ළමා අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය උල්ලංඝනය කිරීමකි.

කෙටියෙන් කියතොත්, පුනරුත්ථාපන ක්‍රමය පදනම් කරනු ලැබුවේ අඩු ප්‍රමිතියක් ඇති හෝ තාර්කික නො වන හෝ නීතිමය ක්‍රියාපටිපාටීන් පද්ධතියක් මත ය. අනෙක් අතට, මධ්‍යස්ථානවල යථා ක්‍රියාකාරීත්වය එල්.ටී.ටී.ඊ. ය ළමා සොල්දාදුවන් යොදා ගැනීමට එරෙහි එහි විදේශ අමාත්‍යාංශය කළ උද්ඝෝෂණයේ කොටසක් ලෙස ප්‍රසිද්ධ කළ "පුනරුත්ථාපනය පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත්" ආදර්ශයන්ට අනුකූල නො විය.[29] බිඳුණුවැව කඳවුරේ "පුනරුත්ථාපනය" කිරීමට, වෘත්තීය පුහුණුවීම්වල සම්මිශ්‍රණයක්, නිතිපතා කෙරෙන ආගමික වතාවත්, බාල රැඳවියන් සඳහා අංක ගණිතය, දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල භාෂා පිළිබඳ මූලික ඉගැන්වීම් සහ නිතිපතා කෙරෙන ප්‍රජා සේවාවන් ඇතුළත් විය. නමුත් නියම මනෝ විද්‍යාත්මක උපදේශනයක් නො විය.[30] කෙසේ වුව ද, රැඳවියන් ගේ රැඳවුම් කාලය අවසන් වූ වහාම ඔවුන්ට රැකියා පිළියෙල කර දීම සම්බන්ධයෙන්, කපිතාන් අබේරත්න, තෙලිපිලෙයි කඳවුරේ තම සම නිලධාරියා මෙන් ම නිතර ම ඔවුන්ට බොහෝ

28. කඳුරට සෙල වූ තෙදින ප්‍රචණ්ඩ ක්‍රියාවන් ලෙස පුපුරා ගිය මනුෂ්‍ය ඝාතනය කෙරෙහි සැබවින් ම කඳුරට දෙමළ ජනයා තුළ ඇති වූ කෝපය ඝාතනය කළ රැඳවියන් 27 දෙනා ගෙන් දෙදෙනෙකු කඳුරට වැසියන් වීම නිසා බව පෙනී යයි. ඝාතනයට ලක් වූ දෙදෙනා ගෙන් එක් අයෙකු ඔහු ගේ හැඳුනුම්පතට අදාළ ලියවිලි නිසි ලෙස නො තිබීම නිසා බිඳුණුවැවට යැවුණු අයෙකි. බිඳුණුවැව මනුෂ්‍ය ඝාතනයට උඩරට දෙමළ සහ සිංහල ජනයා ගේ ප්‍රතික්‍රියාව පිළිබඳව වැදගත් සහ ප්‍රයෝජනවත් සාකච්ඡාවක් සඳහා බලන්න. Jenneth Macan Makar, Dinesha Samararathna Amal de Chikera "Beyond Bindunuweva Rebuilding the Broken Tank", Faculty of Law, University of Colombo, Fall 2003.

29. උදාහරණ වශයෙන්, D.B.S Jeyaraj, "Bindunuweva Massacre: The Inside Story" *Tamil Times,* 15 October 2000. පිටුව 6, මුලින් පළවූයේ *Sunday Leader,* 29 Oct. 2000 කැනඩාවේ විනිපෙග් හිදී පවත් වන ලද 2000 සැප්තැම්බර් යුද්ධයෙන් අනතුරු ලැබූ දරුවන් ගැන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයෙහි දී බෙද හරින ලද විදේශ කටයුතු අමාත්‍යාංශයේ පත්‍රිකාවක් වූත් ශ්‍රී ලංකා ආණ්ඩුව බිඳුණුවැව සම්බන්ධයෙන් විශාල වැඩ කොටසක් කරන්නේ යැයි සඳහන් කරන්නා වූත් "Impact of Armed Conflict on Children: The Sri Lankan Case" මෙම ලිපිය විශේෂයෙන් ම සඳහන් කරයි.

30. කඳවුරේ අවසාන වසරේ දී කඳවුරේ කාර්ය මණ්ඩලය සඳහා උපදේශණ පුහුණුවීම් වැඩ මුළු ගණනාවක් පවත්වා ඇත. කොමිෂන් වාර්තාව, පි. 46.

උපකාරී විය. එසේ නම්, භාවිතය දෙස බලන විට "පුනරුත්ථාපනය" යනු එල්.ටී.ටී.ඊ. යෙන් හෝ ඔවුන් ව සැක පිට පොලිසිය හෝ හමුදාව විසින් අත්අඩංගුවට ගැනීමට තුඩුදුන් සෙසු ඕනෑ ම වෙනත් කවර සාධකයන් ගෙන් හෝ දුරස්ථ වීමේ සංක්‍රමණ කාලාන්තරයක් සපයන්නා වූත් ගැටුම තුළ ක්‍රියාකාරිව මැදිහත්වීමෙන් තොරව දිවි ගලවා ගැනීමේ හැකියා සමහර විට වැඩි දියුණු කිරීමේත් ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි ය.[31]

කෙසේ වෙතත්, "පුනරුත්ථාපනය කිරීමේ" මූලාශ්‍රයක් ලෙස සීමාසහිත කම් එහි පැවතුණ නමුත් එය නැරඹූ සහ එහි වැඩ කටයුතු නිරීක්ෂණය කළ අය ගේ පොදු අදහස වූයේ තරමක් හොඳ තත්ත්වයකින් එය පවත්වා ගෙන ගිය බවත් එහි රැඳවියන්ට සාපේක්ෂව හොඳින් සැලකූ බවත් ය. උදාහරණ වශයෙන් කොමිෂන් වාර්තාව 1999 නොවැම්බරයේ දී කඳවුරට ගිය එකල ශ්‍රී ලංකාවේ UNICEF නියෝජිතයා වූ කොලින් ග්ලෙනී ගේ සාක්ෂිය උපුටා දක්වයි. ග්ලෙනී ගේ වචන වලින් සඳහන් කළොත් "අත්‍යවශ්‍ය සම්පත්වල හිඟ බව නො තකා, මධ්‍යස්ථානය සමස්ථයක් ලෙස හොඳ ආරක්ෂාවක් සහ පුනරුත්ථාපනය කිරීමක් සම්පාදනය කරමින් සිටියේ ය... කපිතාන් අබේරත්න ගේ සැලකිලිමත් ආකල්ප විශේෂයෙන් අගය කළ යුතු ය."[32] කඳවුරේ වාතාවරණය සිරගෙයක මෙන් නො වී ය. ආරක්ෂක කටයුතු සැහැල්ලු විය. රැඳවියන් ගේ පවුල් සාමාජිකයෝ හෝ සැමියා හෝ බිරිඳ රැඳවියන් බැලීම සඳහා නිතර පැමිණ තිබුණි. රැඳවියන්ට ද කපිතාන් අබේරත්න ගේ අවසර ඇති ව කඳවුරෙන් පිටතට යාමට සහ ඒමට පිළිවන්කම තිබුණි. ඔවුන් ම ඔවුන් ගේ ආහාර පිස ගත් නිසා අවශ්‍ය දේවල් මිල දී ගැනීමට රැඳවියෝ බණ්ඩාරවෙල නගරයට ගිය හ. කඳවුරේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් පනවනු ලැබූ සීමාව ඉක්මවා ගිය සහ අසාධාරණ සමහර කායික දඬුවම් සම්බන්ධ සමහර වාර්තා ඉදිරිපත් වී ඇති නමුත් විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ නිල සිරකඳවුරු ක්‍රමයට සම්බන්ධිතව සැලකීමේ දී සුවිශේෂයෙන් සතුරු වාතාවරණයක් කඳවුර තුළ

---

31. තරුණ රැඳවියන් සමඟ වැඩ කළ හිටපු දෙමළ පුහුණුකරුවෙකුට අනුව, කඳවුරට පැමිණීම රැඳවියන් ගේ ජීවන කොන්දේසිවල වැදගත් වර්ධනයක් නියෝජනය කළේ ය. ද්‍රව්‍යමය වශයෙන් ගතහොත් ඔවුන් වඩා පොහොසත් වූ අතර රැඳවියන් සහ කඳවුරේ නිලධාරීන් අතර ද රැඳවියන් හා ප්‍රදේශයේ පදිංචිකරුවන් අතර ද සම්බන්ධතා උසස් මට්ටමක පැවති බව සාමාන්‍යයෙන් කියනු ලැබේ.

32. කොමිෂන් වාර්තා පිටුව 42.

නො වී ය.[33] එසේ වුවත් බලය කඳවුරේ ගතිකයන් ගෙන් පිටස්තර නො වී ය. කඳවුර පැහැදිලිව ම සැලසුම් කර තිබුණේ කැරලිකාර දෙමළ තරුණයන් රාජ්‍ය බලයේ වඩාත් කීකරු තැනැත්තන් බවට පරිවර්තනය කිරීමට ය. කඳවුර භාර නිලධාරියාට රැඳවියන් විසින් "ශාන්ති" යනුවෙන් ආමන්ත්‍රණය කිරීමේ නියමය සහ ඔවුන් ඉදිරියේ අත්ල බැඳ ගෙන සිටීම වඩාත් ම ප්‍රකට යටහත් පහත්භාවයේ වඩා ක්‍රමානුකූල සම්බන්ධතා මාලාවක් පමණි.[34] සමහර රැඳවියන්, විශේෂයෙන් වයස්ගත සහ විවාහක අය එවන් ගතිකයන් නින්ද සහගත බව සිතීම පුදුමයක් නො වනු ඇත.[35]

කොමිසමේ සාක්ෂි විභාග කිරීමේ දී ඉදිරිපත් කළ සාක්ෂි වලින් මෙන් ම සෙසු මූලාශ්‍ර වලින් ලැබුණ පශ්චාත්-ප්‍රහාර වාර්තා වලට අනුව, ප්‍රදේශයේ ජනයා සහ කඳවුරේ රැඳවියන් අතර සුහද සම්බන්ධතා පැවතුණ බව පැහැදිලිව දකින්නට තිබේ. රැඳවියෝ ඔවුන් ගේ අසල්වැසියන් වෙනුවෙන් නිතිපතා ප්‍රජා සේවාවන් හෙවත් ශ්‍රමදානවල යෙදෙන අතර ප්‍රදේශයේ

---

33. නිෂේධනීය වාර්තාවක් සඳහා බලන්න. "දෙමළ රැඳවියන් ඝාතන කිරීමෙන් පසුව ශ්‍රී ලංකාවේ 'පුනරුත්ථාපන' කඳවුර තුළ ඔහු සිටි කාලය පිළිබඳ සත්‍ය සාමාජිකයෙක් කථා කරයි" ලෝක සමාජවාදී වෙබ් අඩවිය (www.wsws.org/articles/2000/nov2000/sri-no3.shtml). 2000 නොවැම්බර් 3 මෙම ලිපිය 1997 දී මාස ගණනක් බිඳුණුවැව කඳවුරේ රඳවා සිටි සෙල්ලයියා රාජ්කුමාර් ගේ අත්දැකීම් විස්තර කරයි. ඔවුන් අකීකරු වූ විට රැඳවියන්ට තැළීමට සහ සාමාන්‍යයෙන් ඔහු ගේ රැඳවියන් බිය ගැන්වීමට ආශාවක් දක් වූ වඩාත් රළු, වර්ගවාදී පවා වූ කපිතාන් කෙනෙකු ඔහු චිත්‍රනය කර පෙන්වයි. කඳවුර පිළිබඳව වඩාත් සාධනීය කෙළින් ම ලබා ගත් තොරතුරු සඳහා බලන්න. එස්. මනෝරංජන් ගේ "බිඳුණුවැව මනුෂ්‍ය ඝාතනය" අමුදු *(Amudhu)* 2000. නොවැම්බර්/දෙසැම්බර්. මෙය රැඳවියන් හමුවීමට සහ රංගන කලා මධ්‍යස්ථානය විසින් මෙහෙය වූ නාට්‍ය වැඩමුළුවක් නිරීක්ෂණය කිරීමට ගිය ගමනක කථාන්තරය කියයි. රැඳවියන් හැකි ඉක්මණින් නිදහස් වීමට උත්සුකව සිටි බව ඔහු පවසන අතර රැඳවියන් නිදහස් කර ගැනීම සඳහා යම් දිනක කොටින් ගමට පහර දෙනු ඇතැයි ගම්මුන් තුළ තිබූ බිය ගැන කපිතාන් අබේරත්න ප්‍රකාශ කළ බව ද ඔහු සඳහන් කරයි. නමුත් රැඳවියන් සහ පරිපාලනය අතර ආතතියක් නො තිබූ බව ඔහු වාර්තා කරයි.

34. එබඳු යහපත් කොන්දේසි යටතේ ජීවත් වීමට ඉඩදීම මගින් කඳවුරේ සහ සෙසු ආණ්ඩු නිලධරයන් රැඳවියන්ට පක්ෂපාතකමක් දක් වූ බවට කඳවුරට නිතර යනෙන අමුත්තෙක් පැමිණිලි කළේය. මේ අමුත්තාට අනුව ඇත්ත තත්ත්වය එහි අනෙක් පැත්තයි. ආණ්ඩුව රැඳවියන්ට උදව් කළා නොවේ. කඳවුර තුළ රැඳී සිටීමින් රඳවා තැබීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ පද්ධතිය යුක්තිසහගත කිරීමට ආණ්ඩුවට උදව් කළේ රැඳවියෝය.

35. විශ්වාස කටයුතු එක් ආරංචි මාර්ගයකට අනුව, රැඳවියන් අතර පැවති ආතතිය පිළිබඳව සුපරික්ෂාකාරී වන ලෙස දැනුම් දෙමින් කපිතාන් අබේරත්න 2000 පෙබරවාරි මාසයේ දී ජාතික තරුණ සේවා සභාවට ලියා තිබුණි. මෙම අනතුරු හැඟවීම් සම්බන්ධයෙන් යම් පියවරක් ගත්තේ ද යන්න ගැන දැන ගැනීමට නො හැකි ය.

ආගමික උත්සව වලට සහභාගී වූහ. පහර දීම සිදුවන දිනවල කඳවුරේ කලින් සිටි රැඳවියන් දෙදෙනෙකු බණ්ඩාරවෙල නගරයේ වැඩ කරමින් සාමකාමීව ජීවත් වූහ. ප්‍රදේශයේ පදිංචිකරුවෝ කඳවුර තුළ ක්‍රීඩා වලට සහ උත්සව වලට සහභාගී වූ අතර ඔවුන් ගේ ආගමික කටයුතුවල කොටසක් හැටියට කඳවුරේ සිටි අයට දන්දීම ද කළහ. 1993 දී කඳවුරට එල්.ටී.ටී.ඊ. කාඩර්වරුන් හඳුන්වා දීම කෙරෙහි මූලික විරුද්ධත්වයක් හැරුණු විට ප්‍රදේශයේ සිහළ උරුමයට සම්බන්ධ පුද්ගලයන් කඳවුරට විරුද්ධව උද්ඝෝෂණය පටන්ගත් 2000 මැතිවරණ උද්ඝෝෂණයට පෙර ඔවුන් ගේ අසල්වැසි සිංහලයන් ගෙන් කඳවුරට විරුද්ධව බැරෑරුම් පැමිණිල්ලක් තිබුණු බවක් පෙනෙන්නට නැත.[36]

## 4. කොමිසමේ නිගමන

### 4.1 ඔක්තෝබර් 24 ද සිද්ධීන්

පරිපාලනය මෙන් ම කඳවුර සංකල්පගත කිරීම සම්බන්ධයෙන් ද ප්‍රහාරයට පෙර කඳවුරෙහි ප්‍රශ්න තිබුණු බව පැහැදිලි ය. නමුත් බරපතල අවහිරයකින් තොර ව වසර හතක් එය ක්‍රියාත්මකව තිබුණු බව ද විවාද රහිත ය. කඳවුර තුළ පුළුල් සිද්ධියක් පාලනය කළ නො හැකිව එබඳු ත්‍රස්ත සහ

36. රැඳවියන් ගේ සාපේක්ෂ සුඛෝපභෝගී සැලකිලි කෙරෙහි නො රිස්සීම ගැන ප්‍රහාරයෙන් පසුව පැතිරුණු සමහර කථාන්තර වලින් එළිදරව් විය. උදාහරණ වශයෙන්, නිදහ ගැනීමට මෙට්ට, බවුසර් මගින් ගෙනෙණු ලබන පිරිසිදු පානීය ජලය, එමෙන් ම කඳවුර අසලින් යන විට ප්‍රදේශයේ ගැහැණු ළමයින්ට සරදම් කිරීම හෝ හිංසා කිරීම. ප්‍රහාරයෙන් පසු ව පමණක් මෙම කථාන්තර පත්‍රවල පළ වූ නිසා ඒවායේ සත්‍යභාවය සහ වැදගත්කම තීන්දු කිරීම අසීරු ය. 2000 ඔක්තෝබර් මාසයේ පැවති මැතිවරණයේ දී සිංහල ස්වෝත්තමවාදීන් ගේ උද්ඝෝෂණාත්මක වැඩ කටයුතු මගින් මැතක දී එදිරිවාදිකම් අවුලුවා තිබුණු බව ඩී.බී.එස්. ජෙයරාජ් ඔහු ගේ "බිඳුණුවැව මනුෂ්‍ය ඝාතනය, අභ්‍යන්තර කථාන්තරය" ("Bindunuweva Massacre: The Inside Story") තුළ වාර්තා කරයි.

ප්‍රචණ්ඩ පිපිරීමක් බවට පත් වූයේ කෙසේ ද?[37] කොමිසම මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම ආරම්භ කරන්නේ ලුතිනන් අබේරත්න කඳවුර භාර නිලධාරියා ලෙස සිටි දින හතර තුළ කපිතාන් අබේරත්න පිටත ගොස් ආපසු පැමිණීමත් සමඟ රැඳවියන් කොටසක් ඔහුට පැමිණිලි කිරීමට පටන් ගත් විට ඔක්තෝබර් 24 ද සවස හටගත් සිද්ධීන් ගෙන් ය. අවසානයේ දී රඳවා තබා ගැනීමේ ඔවුන් ගේ කොන්දේසි පැහැදිලි කිරීමට හෝ කල් ඇතිව ඔවුන් ගේ නිදහස් වීම සහතික කිරීමට කපිතාන් අබේරත්න අසමත් වූ විට පැමිණිලි කිරීම ආවේගී විනාශකාරී ක්‍රියා බවට පත් විය. සමහර රැඳවියන් කඳවුරේ විදුලි බුබුළු කිහිපයක් බිඳීමට සහ කඳවුරේ ගොඩනැගිලි වලට අලාභහානි කිරීමට පටන් ගත් විට කඳවුරේ රඳවා සිටි පොලිස් නිලධාරීන් විසින් අනුමාන කළ හැකි අන්දමට, අහසට වෙඩි දෙකක් තබනු ලැබී ය. කොමිසමට අනුව වෙඩි තැබීම සිදු වූයේ ලුතිනන් අබේරත්නට පහර දීමෙන් ඔහු ගේ ඇලපතට සහ උරහිසට තුවාල සිදු වීමෙන් පසුව ය. කොමිසම මෙහි දී දෙවන අණදෙන නිලධාරී ලුතිනන් අබේරත්න ගේ සාක්ෂි පිළිගනියි. කපිතාන් අබේරත්න ගේ සහ රැඳවියෙකු ගේ සාක්ෂි වලට අනුව ලුතිනන් අබේරත්නට පහර දීම සිදු වූයේ වෙඩි තැබීමෙන් පසුව ය. කෙසේ වුව ද, කොමිසමට අනුව එතරම් ප්‍රචණ්ඩ ආකාරයට විරෝධය පෑම නිසා පැහැදිලිව ම වරදකරුවන් වන්නේ රැඳවියෝ ය. අහසට වෙඩි තැබීමට පොලිසියට අයිතිය තිබුණි. කොමිෂන් වාර්තාව රැඳවියන් ගේ කැරැල්ලට වගකීම සම්බන්ධව ප්‍රධාන කොටසක් ඇන්තනී (ඇන්ටන්) ජේම්ස් වෙත ද

---

37. මීට පසුව එන පිටු විනිශ්චයකාර කුලතිලක ගේ කොමිෂන් වාර්තා ව විසින් දෙන ලද විස්තර මත රැඳෙයි. එහෙත් මෙහි දී අවධාරණය කළ යුතු කරුණක් වන්නේ වාර්තාවේ අන්තර්ගතය පිරිසිදු සත්‍යය ලෙස සැලකිය නො හැකි බව යි. විනිශ්චයකාර කුලතිලක හෝ කොමිසමේ කාර්ය මණ්ඩලය තුළ වංක බවක් හෝ දේශපාලන පරමාර්ථ තිබූ බවක් මෙයින් අදහස් නො කෙරෙයි. ඒ වෙනුවට මා අවධාරණය කරන්නේ ඔවුන් ගේ නිගමන සූත්‍රගත කිරීමට ඔවුන් විශ්වාස කළ සාක්ෂිවල සැබෑ ස්වභාවය යි. 1) බොහෝ විට එකිනෙකට පටහැනි වූ සාක්ෂි පැවතුණු අතර ඒවායින් කුමක් නිවැරදි ද යන්න තීන්දු කළ යුතුව තිබිණ. එහෙත් මෙය සිදු වූයේ පැහැදිලි නිර්ණායකයන් මත පිහිටා නො වේ. 2) පොලිස් සාක්ෂිකරුවෝ තම ක්‍රියාවන් හෝ (අක්‍රියභාවය) ඉතා වාසිදයක ලෙස පෙන්වන්නා වූ ආකාරයට එකිනෙකට සමාන වෙන කථා ඉදිරිපත් කළහ. 3) ප්‍රහාරයෙන් දිවි ගලවා ගෙන ජීවත්වන රැඳවියන් ගේ සාක්ෂි ද මුළුමනින් ම විශ්වාස සහගත යැයි පැවසීමට ද නො හැකි ය. ඊට හේතු දෙකක් පවතී. පළමුවැන්න, රාජ්‍ය බලය සම්බන්ධයෙන් ඔවුන්ට මුහුණ දීමට සිදු වූ ක්ෂතිමය හෙවත් ට්‍රෝමැටික් අත්දැකීම සහ සත්‍ය පැවසීම මගින් පොලිස් නිලධාරීන් වරදට හසුවීමේ බිය නිසා සත්‍යය ප්‍රකාශ කිරීමට ඉහත කී අත්දැකීමේ බලපෑම මත අකැමැත්තක් ඇති වීම, දෙවැන්න නම්, සිද්ධීන් පාලනය කර නො ගත හැකි මට්ටමකට සේන්දු වීම ගැන තමාට ද පැවරුණු වගකීම අවම කර ගැනීමේ අවශ්‍යතාවය ඇති අවශ්‍යකම් සහිත වූ පාර්ශවයක් බවට ඔවුන් ද පත් වී සිටීමයි.

පවරයි. උද්ඝෝෂණයේ ප්‍රධාන නායකයා ලෙස ඔහු ව නම් කරනු ලබයි. එපමණක් නොව ඔහු කඳවුර තුළ සිටි අන්තරායකාරී පුද්ගලයෙක් ය යන කාරණාව සම්බන්ධ ව කොමිසම වැඩි අවධාරණයක් යොදයි. එල්.ටී.ටී.ඊ. ය වෙනුවෙන් වසර 13 ක් සේවය කර තිබූ සහ ශ්‍රී ලංකා පොලිසියට සහ හමුදාවට කළ අනේක පහරදීම්වල කොටස්කරුවෙකු වූ ඔහු ක්‍රියාකාරී එල්.ටී.ටී.ඊ. කාඩර්වරයෙක්ව සිටි අයෙකි. ඔහු කඳවුරේ සිටීම බරපතල ලෙස ආරක්ෂාව උල්ලංඝනය වීමක් යැයි ආරම්භයේ දී ම කොමිෂන් වාර්තාව තර්ක කරයි.[38]

කඳවුර තුළින් පොලිස් මුරපොළ ඉවත් කිරීමේ රැඳවියන් ගේ ඉල්ලීමට එකඟවීම ගැන බණ්ඩාරවෙල පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ කපිතාන් අබේරත්න මත කොමිසම වරද පටවයි. මෙයින් කඳවුරේ පාලනය සම්පූර්ණයෙන් ම වාගේ රැඳවියන් අතට යාමට ඉඩ සැලසුවා පමණක් නොව, එයින් දුර්වලකම පිළිබඳව ප්‍රදේශයේ ගැමියන්ට ඉතා අන්තරායකාරී සංඥාවක් ද නිකුත් විය. තමන් බල රහිත බව දක ගැනීමට පොලිසියම ඉඩ සැලසී ය. කඳවුර තුළ තත්ත්වය පාලනය වී ඇතැයි පොලිසියටත්, පසුව හමුදාවටත් කපිතාන් අබේරත්න විසින් අවධාරණය කිරීම කොමිෂන් වාර්තාවට අනුව ඒ හා සමානම ලොකු වරදකි. එක්කෝ අබේරත්න තමන් ම මෝඩ විය. නැතහොත් තමන් ගේ බල ප්‍රදේශයේ පාලනය අහිමි වීමෙන් අපහසුවට පත්වීම නිසා ආධාර ඉල්ලීමට නො කැමති විය. නමුත් එම සන්ධ්‍යාවේ, කොළඹ ඔහු ගේ ප්‍රධානියා පුනරුත්ථාපන නියෝජ්‍ය කොමසාරිස් කර්නල් විපුලගුණේ ගේ අවධානය සිද්ධිය කෙරෙහි යොමු කිරීමට ඔහු අසමත් වීම මගින් මැදිහත් වීමේ හැකියාවක් තිබූ එක මාවතක් වැසුණ බවට කොමිසම තර්ක කරයි. එමෙන් ම කඳවුර අවට රැස්ව සිටි

38. බිදුණුවැවට ඇන්ටන් ජේම්ස් ගේ පැමිණීම පිළිබඳව විස්තර කරන බොහෝ කථාන්තර තිබේ. නිතර අසන්නට ලැබුණ නමුත් ඔප්පු කිරීමට සාධක නැති එක් කථාවක් නම් ඔහු එල්.ටී.ටී.ඊ. ය විසින් පැළපදියම් කළ අයෙකු බව ය. ඒ වෙනුවට ඔහු එල්.ටී.ටී.ඊ. ය සමඟ නො සතුටෙන් සිටි බවත්, ආරක්ෂක බලකායන් සමග සහයෝගයෙන් වැඩ කිරීම වෙනුවෙන් හුවමාරුව සඳහා හෝ සමහර විට ප්‍රතිගෙවීමක් විදිහට බිදුණුවැවට යැවීමට ශ්‍රී ලංකා මිලිටරිය සමඟ වැඩපිළිවෙළක් යොද තිබුණ බව වෙනත් මූලාශ්‍රයන් ගණනාවක් මගින් කියැවෙයි. රාජන් හූල්ට අනුව 24 ද සවස ඔහු දුරකථනයෙන් කථාකර තිබූ මිනිසුන් ගෙන් එක් අයෙකු වූයේ මඩකලපුවේ පදිංචි ඔහුගේ සහෝදරයා ය. ජේම්ස් මුලින්ම බාර වූ ශ්‍රී ලංකා හමුදාවේ කර්නල් ෂැකී සමග මැදිහත් කරවීම සඳහා අමතන ලෙස තම සහෝදරයාගෙන් ඉල්ලා සිටින ලෙස ඔහු පවසා තිබුණි. කඳවුරෙන් පිටත තර්ජනය කරමින් සිටි පිරිසෙන් රැඳවියන් ආරක්ෂා කර ගැනීමට ඔහු ගේ උපකාරය ඉල්ලා සිටීමට ඔහුට (ජේම්ස්ට) අවශ්‍ය විය. බලන්න. *Sri Lanka: The Arrogance of Power,* (Colombo, 2001), පි. 462.

ගැමියන් විසුරුවා හැරි හමුද හට කණ්ඩායමේ ප්‍රධානියා කඳවුර තුළට ඇතුල් වී රැඳවියන් සමඟ "ආරාවුල බේරුම් කිරීමට" කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම තත්ත්වය පාලනය කර ඇතැයි ද සහ බිය වීමට හේතුවක් නැතැයි ද ගම්මුන්ට පෙන්වීමට තිබුණු තවත් අවස්ථාවක් අහිමි වීමකි.[39]

එසේ නම් කඳවුර තුළ සිදුවීම් සහ ඒවා කෙරෙහි පොලිසියේ සහ හමුදාවේ ප්‍රතිචාර ප්‍රදේශයේ ජනයා මත ඇති කළ බලපෑම් කවරේ ද? රැඳවියන් ගේ, ගම්මුන් ගේ පොලිසියේ සහ සෙසු අය ගේ සාක්ෂි මත පදනම් ව කොමිසම කියන කථාන්තරය මෙයයි. ලූතිනන් අබේරත්නට පහර දී තුවාල සිදු කර ඇතැයි යන ප්‍රවෘත්තිය "කොටින්" ගමට පහර දීමට සූදනම් වන බවට ඔහු ගේ අනතුරු ඇඟවීම සමඟ එකට සම්බන්ධ වෙමින් ප්‍රදේශය පුරා ක්ෂණිකව පැතිර ගියේ ය.[40] ලේ පැල්ලම් සහිත ඔහු ගේ කමිසය ඔහු දනුවත්ව ම අසල්වැසි නිවෙසක දමා ගොස් තිබුණි. කොටින් ගෙන් සමහරක් කඳවුරෙන් පලා ගොස් ඇතැයි යන සාවද්‍ය වාර්තාව සමඟ එකට සම්බන්ධ කරමින් මෙම කටකථාව එදින රාත්‍රියෙහි කඳවුරෙන් පිටත රඳවා සිටි පොලිස් නිලධාරීහු ක්‍රියාශීලීව අනුමත කිරීමත් පතුරුවාලීමත් කළහ.[41] මහජන භීතිය සහ එල්.ටී.ටී.ඊ. ය කෙරෙහි වෛරය ඇති කරන එබඳු කථාන්තර විශේෂ බලපෑමක් ඇති කරයි. (පෙර සතිවල පැවති මැතිවරණ උද්ඝෝෂණ බොහොමයක සහ ආසන්න දිනවල පැවති ප්‍රදේශයේ සොල්දාදුවන් තිදෙනෙකු ගේ සහ එක් මේජර්වරයෙකු ගේ අවමංගල්‍යයන්හි ද පැවති සිංහල ජාතිවාදී නැම්ම විසින් මැතක දී මෙම හැඟීම් ශක්තිමත් කර තිබුණි.) කඳවුර තුළින් පොලිස් මුරපොළ ඉවත් කර ගැනීම සහ එල්ල විය හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් පොලිසිය විසින් ම අනතුරු ඇඟවීම කඳවුර අවට වැසියන් ආරක්ෂා කිරීමට ඔවුනට ඇති හැකියාව පිළිබඳ අවිශ්වාසය ද පෝෂණය කළේ ය.

ඊට අතිරේකව කඳවුර තුළ ආරම්භක විරෝධතාවයත්, එය ප්‍රචණ්ඩව විනාශ කිරීමත් අතරතුර පැය දෙළහ සිට දහ හතර දක්වා කාලයක් තුළ ද

39. කොමිෂන් වාර්තාව පිටුව 86. කෙසේ වුව ද, ලූතිනන් බාලසූරිය විසින් කොමිසම ඔහු දුන් .සාක්ෂියේ දී පාවිච්චි කළ බවට වාර්තා වන "ප්‍රශ්නය විසඳමු" යන වාක්‍ය ඛණ්ඩයෙන් ප්‍රායෝගික ව අදහස් කෙරුණේ කුමක් දයි පැහැදිලි නැත. අනුමානයෙන් සිතෙන ආකාරයට එයින් ඔහු අදහස් කළේ රැඳවියන් සමඟ සාකච්ඡාවක් විය හැකිය. කෙසේ නමුත්, අතිශයින්ම දහනශීලී තත්ත්වයක් තුළ හමුද නිලධාරියෙකුට කඳවුරට ඇතුළු වීමට අවසර දීම ඥනවන්ත ම අදහස නො වන්නට ඉඩ තිබුණි.

40. කොමිෂන් වාර්තාව පිටු 94-95.

41. එම., පිටු 96.

සැලකිය යුතු සංවිධානය කිරීමක් සිදු වූ බවට කොමිසම පැහැදිලි සාක්ෂි සොයා ගනියි. පසු දින උදේ කඳවුරට විරුද්ධ ව පෙළපාලි යාමට ඔවුන් සැලසුම් කරමින් සිටි බව ගම්මුන් තමාට පැවසූ බවට 24 ද රාත්‍රියෙහි කඳවුර අවට රැස්ව සිටි පිරිස් විසුරුවාලීමට හමුදු භට කණ්ඩායම මෙහෙය වූ ලුතිනන් බාලසූරිය කොමිසම ඉදිරියේ සාක්ෂි දුන්නේ ය. එබඳු පෙළපාලියක් නිවේදනය කරමින් සපුගස් උල්පත ගම්මුන් ගේ නමින් අත්සන් කළ විදුලි පුවතක් 25 ද උදේ 8.00 ට දිස්ත්‍රික් ලේකම්ට ලැබුණි. 25 ද උදේ ඇල වූ පෝස්ටර් වලින් අඩුම තරමින් පහළොවක් කඳවුර අසල තවත් කුඩා ගමක් වූ අළුත්ගම නිවැසියන් විසින් සකස් කළ බව (එක් ගැමියෙකු ගේ අත් අකුරු පෝස්ටර්වල අත් අකුරු සමඟ ගැළපුණි.) තවත් සාක්ෂි වලින් එළිදරව් විය. වාහන මඟින් කඳවුර වෙත විරෝධතාකරුවන් ප්‍රවාහනය කෙරුණු බව අවසාන වශයෙන් කොමිසම තහවුරු කළේ ය. අවම වශයෙන් වාහන 10-15ක් (වෑන්, බස් සහ ත්‍රීරෝද රථ) කඳවුර සීමාවේ වූ විද්‍යාපීඨ කාර්මික විද්‍යාලයට ඇතුල් වන දෙරටුව ළඟ එදින උදේ දකින්නට තිබුණි. මෙම වාහන ගෙන ඒම තමන්ට වාසි වන අන්දමින් තත්ත්වය ගසා කෑමේ යෙදුණු අන්තවාදී කොටස්වල ක්‍රියාවක් වීමට ඉඩ ඇති බව කොමිෂන් වාර්තාව ඇඟවුම් කරයි.[42]

## 4.2 ඔක්තෝබර් 25 ද සිද්ධීන්

කොමිසම 25 ද උදේ සිද්ධීන් ගැන පැහැදිලිකමක් ඇති කර ගැනීමට තවදුරටත් උපකාරී වන සමහර ප්‍රයෝජනවත් කරුණු ද ඉදිරිපත් කරයි. පොලු සහ ඉස්කුරුප්පු නියන් රැගත් රැඳවියන් 15-20 ක් පමණ එදින උදේ ඔවුන් ගේ බැරැක්ක වලින් පිටත සිටිනු දුටු බව ප්‍රදේශයේ පදිංචිකරුවන් විසින් සාක්ෂි දීමේ දී තහවුරු කරනු ලැබ ඇති බව පෙනෙන්නට තිබේ.[43] මෙම කණ්ඩායම මරණ තර්ජන එල්ල කරමින් හඬ නඟනු රැස්ව සිටි පිරිසට අසන්නට ලැබී ඇත. එදින උදේ වන විට බණ්ඩාරවෙල සහ අවට ඇල වූ පෝස්ටර්වල "කොටින් ගේ මස් අපේ බල්ලන්ට" වැනි මිනීමරු සටන් පාඨ ලියනු ලැබ තිබූ නිසා, පිරිසෙන් සමහරක් පැමිණ තිබුණේ නිකම් ම පෙළපාලි යෑමට නොව මැරීමට බව පැහැදිලි වෙයි. කඳවුර තුළ රැඳවියන්ට ගල් ගැසීම මඟින් පිටත රැස්ව සිටි පිරිස ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ

42. එම., පිටු 101.

43. රැඳවියන් නිද ගෙන සිටිය දී ප්‍රහාරකයන් විසින් පහර දුන්නේය යන මෙම සාක්ෂිය සහ දිවි ගලවා ගත් පුද්ගලයන් විසින්මත් දුන් සාක්ෂි ඇතුළුව සෙසු සාක්ෂි වලින් නිවැරදි කෙරෙයි.

කළහ. කඳවුර තුළ ගෑස් සිලින්ඩරයක් පුපුරවා හැරීමෙන් රැඳවියෝ ප්‍රකෝප කිරීම් වලට ප්‍රතික්‍රියා කළහ. මෙය පිරිස බිය ගැන්වීමේ දී ආරම්භයේ දී සාර්ථක වූව ද එහි අවසාන ප්‍රතිඵලය වූයේ තත්ත්වය තවදුරටත් දරුණු අතට හැරීම බව පෙනෙන්නේ ඉන් මොහොතකට පසුව පොලිසිය බලා සිටිය දී ම පිරිස විසින් කඳවුර ගිනි තැබීම නිසා ය. සාක්ෂිකරුවන් ප්‍රකාශ කරන්නේ සන්නද්ධ පොලිසිය පිරිස මැද සිටිය දී ද පිරිස විසිර වීමට හෝ වළක්වාලීමට කිසිවක් නො කර සිටිය දී ද විශාල පිරිසක් කඳවුරේ ප්‍රධාන දොරටුවෙන් පිටත සිට ගෙන සිටි බවයි.

කඳවුර අවට රඳවා සිටි පොලිසිය සිය රාජකාරි ඉටු කිරීමට මුළුමනින් ම අසමත් වූ බව ගැන විවාදයක් නැත. අසාර්ථකත්වයන් ගණනාවක් සම්බන්ධයෙන් ප්‍රදේශයේ වඩාත් ම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු වූ සහකාර පොලිස් අධිකාරි දයාරත්න සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න කොමිෂන් වාර්තාව තුළ බරපතල ලෙස විවේචනයට ලක් වෙයි. මෙම විවේචනය ආරම්භ වන්නේ සාමය කඩවීම වැළැක්වීම සහ රැඳවියන් ආරක්ෂා කිරීම සඳහා පොලිස් නිලධාරීන් එදින රාත්‍රියෙහි කඳවුරෙහි නතර වීමට අසමත් වීම ගැන කෙරෙන සඳහනින් ය. එම පියවර ගත්තේ නම් එය ගම්මුන්ට පැහැදිලි සංඥවක් නිකුත් කිරීමක් විය හැකි ව තිබිණ. ඇත්ත වශයෙන් ම ඔවුන් දෙදෙනා ජනකාය විසුරුවා හැරීම සඳහා 24 වැනිදා යවනු ලැබූ හමුදා කණ්ඩායමෙන් ආපසු වාර්තාවක් ලබා ගැනීමට වත් නතර වී නො සිටිය හ. කඳවුරෙහි රාත්‍රී කාලයේ දී රාජකාරියෙහි යොදවා සිටි ඉහළම නිලධාරියා වන පොලිස් පරීක්ෂක කරුණාසේන විසින් විශාල පිරිසක් රැස්වෙමින් සහ කඳවුර අවට බස් රථ නවතා තිබූ බවට පසු දින උදේ අනතුරු හැඟවීමෙන් පසුව වත් බණ්ඩාරවෙල පොලිස් ස්ථානයෙන් වත් කැරලි මර්දන භට කණ්ඩායමක් නො යැවීමට ඔවුන් විසින් තීන්දු කිරීම මගින් ඔවුන් ගේ අසාර්ථකත්වයන් තවත් බරපතල කෙරෙයි. බණ්ඩාරවෙල පොලිසියෙන් කිසිදු අතිරේක පොලිස් නිලධාරියකු යැවීමට සහකාර පොලිස් අධිකාරි සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක අසමත් වූහ. අවසාන මොහොතේ දී පවා රැඳවියන් කඳවුරෙන් ඉවත් කර ගත හැකිව තිබුණි.

ප්‍රහාර ආරම්භ කිරීමෙන් අනතුරු ව ආක්‍රමණකාරි පිරිස් නතර කිරීමේ උත්සාහයක් දරා නො තිබුණි. කඳවුර අවට විවිධ ස්ථානවල රැඳී සිටි 60 කට වැඩි පොලිස් නිලධාරීන් ගෙන් එක් අයකු වත් කිසිම පුද්ගලයෙකු හෝ අත්අඩංගුවට ගැනීම හෝ ගැනීමේ උත්සාහයක් වත් කර නැත. කොමිෂන් සභාව තර්ක කරන්නේ, කඳවුර අවට රැස් වූ - සිය ගණනක් සමහර විට

දහස් ගණනක් වූ පිරිස ගෙන් හැම අයෙක් ම ආයුධ සන්නද්ධ ව නො සිටි හෙයින් ආයුධ අතැතිව සිටි සාපේක්ෂ කුඩා කණ්ඩායමට, එනම් "සාපරාධී කොටස්"[44] ලෙස නම් කෙරුණු ලැබූ කොටස් වලට වෙඩි තැබීම අවසාන උපාය ලෙස පොලිසියට කළ හැකි ව තිබුණු බවයි. ඒ වෙනුවට පෙනෙන්නේ වෙඩි තබා ඇත්තේ රැඳවියන්ට පමණක් බවයි. වෙඩි තැබීමෙන් මරණයට පත් වූ එක් අයෙකු ගේ සිරුරේ වෙඩි උණ්ඩ හතක් තිබූ නිසා රැඳවියන් ගේ මරණ පැහැදිලිවම අහඹු ඒවා නො වීය. ප්‍රහාරය ආරම්භ වන විට ඉහළ ම නිලධාරියා ලෙස කොමිසම විසින් සැලකෙන පොලිස් පරීක්ෂක කරුණාසේන වෙඩි තැබීමට අණ දීම ගැන කොමිෂන් සභාව විශේෂයෙන් ම විවේචනශීලි ය. "පොලිස් පරීක්ෂක කරුණාසේන වෙඩි තැබීමට අණ දීම සහ එම අණ දීමේ විපාකයක් ලෙස පොලිස් නිලධාරීන් තිදෙනෙකු විසින් වෙඩි තැබීමේ ක්‍රියාව මෙම අවස්ථාව හැටියට යුක්ති සහගත වූවක් නො වන බව කොමිසම ප්‍රකාශ කරයි.[45] වෙඩි තැබීමත් සමඟම නිශ්චිතව ම සිදු වූයේ කුමක් දයි අපැහැදිලි ය. ඔවුන්ව ලුහු බඳින්නන් ගෙන් ආරක්ෂා වීමේ උත්සාහයක් ලෙස ඔවුන් ගේ නිලධාරීන් දෙසට දිව එමින් සිටි රැඳවියන් ගණනාවක් දෙසට වෙඩි තැබීමට නියෝග කළ බව කරුණාසේන පිළි ගනියි. නමුත් ඔහු ගේ මෙම නියෝගයේ අරමුණ වූයේ කුමක් දයි පැහැදිලි නැත. කරුණාසේන ඇත්ත වශයෙන්ම රැඳවියන්ට වෙඩි තැබීමට ඔහු ගේ නිලධාරීන්ට නියෝග කළෙහි ද? ඔහු කොමිසමට දුන් සාක්ෂියේ දී හැඟ වූ පරිදි රැඳවියන් ලුහුබැඳ එන්නන්ට වෙඩි තැබීමට ඔහු නියෝග කළ නමුත් ඒ වෙනුවට රැඳවියන්ට වැදුණි ද? නැතහොත් ඔහු නඩුවේ දී ප්‍රකාශ කළ අන්දමට අහසට වෙඩි තැබීමට ඔහු නියෝග කළ අතර ඔවුන් ගේ සමහරෙකු රැඳවියන්ට වෙඩි තැබුවෝ ද? මෙම නිලධාරීන්ට එරෙහි ව ක්ෂණික ව ක්‍රියාත්මක නො වීම හෝ වෙඩි තැබීම සම්බන්ධයෙන් ඔවුන් ව හෙළා නො දැකීම අවම වශයෙන් කිවහොත් සැක සහිතය.[46]

---

44. එම., පිටු 190, 197.

45. එම., පිටුව 194, මෙය පැහැදිලි වටවංගු සූත්‍රගත කිරීමකි. වාර්තාව අදහස් කළේ රැඳවියන්ට වෙඩි තැබීමට නියෝග කිරීම පිළිබඳව කරුණාසේනට චෝදනා කිරීම නම් එය එසේ ප්‍රකාශ නො කළේ මන් ද?

46. ත්‍රි පුද්ගල මහාධිකරණ විනිශ්චය මණ්ඩලයේ නඩු තීන්දුව තර්ක කරන පරිදි, එසේ නොවේ යැයි කරුණාසේන පසුව කියා සිටියත් තම විධාන වලට ප්‍රතික්‍රියාවක් ලෙස රැඳවියන්ට වෙඩි තබන ලද බව කරුණාසේන අවම වශයෙන් දන සිටින්නට ඇත. මක්නිසාද යත්, තම නියෝග වලට පිටින් කිසි වෙඩි තැබීමක් සිදු වූ බවට කරුණාසේන පවසා හෝ පැමිණිලි කර නැති හෙයිනි. "නඩු අංක. 763/2002" පිටුව 54. පසුව මෙය "නඩු තීන්දුව" යනුවෙන් හැඳින්වේ. මුල් සිංහල පිටපත www.brynmawr.edu/peacestudies/srilanka/bindunuwewa හි අන්තර්ගත කර ඇත.

කෙසේ වුවද, ප්‍රහාරය සිදු වන අවස්ථාවේ පොලිස් පරීක්ෂක කරුණාසේන වගකීම් බාර නිලධාරියා ලෙස ඇත්ත වශයෙන් ම සිටියේ දැයි සැක සහිත ය. එදින රාත්‍රියෙහි කඳවුරේ රඳවා සිටි පොලිස් බල ඇණියේ වගකීම් බාර නිලධාරියා ලෙස හෝ 25 වැනිදා උදේ 6.45 ට පමණ ප්‍රදේශයේ විවිධ පොලිස් ස්ථාන වලින් එහි පැමිණි ආරම්භයේ දී අතිරේකව යොදවා තිබුණු පොලිස් බල ඇණිවල හෝ වගකීම් භාර නිලධාරියා කරුණාසේන වූ බවට කිසිවෙකුටත් විවාදයක් නැත. ඉන්පසු අවුල තවත් වියවුල් වෙයි. කරුණාසේනට අනුව සහකාර පොලිස් අධිකාරී දයාරත්න සහ මූලස්ථාන පරීක්ෂක සෙනෙවිරත්න යන දෙදෙනාම 7.30 සිට ඉදිරියට කඳවුරේ සිටිය හ.[47] ප්‍රහාරයට පෙර සහකාර පොලිස් අධිකාරිවරයා බැරැක්ක අසල සිටි බව තවත් පොලිස් නිලධාරියෙකු වූ උප පොලිස් පරීක්ෂක එන්.එස්. වල්පොල (පසුව මොහු කරුණාසේන සමඟ චූදිතයෙකු කර ඔහුට විරුද්ධව නඩු පවරන ලදී.) හඳුනා ගනී.[48] සිද්ධිය වූ ස්ථානයෙහි ඔවුන් ගේ ඉහළ නිලධාරීන් සිටි බව පිළිගෙන තිබුණා නම් කරුණාසේන සහ වල්පොල යන දෙදෙනා ගේ ම අවශ්‍යකම් වලට උදව් වනු ඇත. නමුත් අවම වශයෙන් ප්‍රහාරයේ උච්ච අවස්ථාවේ දී සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පරීක්ෂක එහි සිටි බවට සිද්ධිය ගැන විශේෂ උනන්දුවක් එතරම් නො තිබුණු අය ද හඳුනා ගතිති. කඳවුරු ගිනි තැබීමට කලහකාරී පිරිසට තවමත් අවස්ථාවක් ලැබීමට පෙර, ප්‍රහාරයේ ඉතා මුල් අදියරේ දී සහකාර පොලිස් අධිකාරී දයාරත්න එහි සිටි බව කපිතාන් අබේරත්න කොමිසම ඉදිරියේ දුන් සාක්ෂියේ දී ප්‍රකාශ කළේ ය. (රැඳවියන් බොහෝ දෙනෙකු ගිනි තබා මරණ ලදී. නැතහොත් මරණයට පත්වීමෙන් පසු ඔවුන් ගේ සිරුරු වලට ගිනි තබනු ලැබී ය.) එමෙන් ම වඩාත් විශ්වාසවන්ත සාක්ෂිකරුවකු වූ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් ඩබ්ලිව්.එන්.ආර්. විජේපාලට අනුව පවා ප්‍රහාරය ක්‍රියාශීලීව සිදු වන අවස්ථාවෙහි උදෑසන 8.30 පසු වීමත් සමග විජේපාල පැමිණෙන විට සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක යන දෙදෙනාම කඳවුර ඇතුළතම සිට ඇත.

මෙලෙස, සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පරීක්ෂක අඩු තරමින් කල් වේලා ඇතිව එහි සිටි බව කියැවෙන කපිතාන් අබේරත්න සහ ප්‍රාදේශීය ලේකම් ගේ සාක්ෂි නිවැරදි නම් සෙසු කවර හෝ නිලධාරියකු මෙන් ම රැඳවියන්ට වෙඩි තැබීම සහ මරණයට පත් කිරීම සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතු ය. ප්‍රහාරය සිදු වන අතරතුර සහකාර පොලිස් අධිකාරී

47. කොමිෂන් වාර්තාව, පිටුව 120.
48. එම., පිටුව 126.

සහ මූලස්ථාන පරීක්ෂක එම ස්ථානයේ සිටි බව සැබැවින් ම කොමිසම පිළිගනියි. "පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුළ අපරාධය තවමත් සිදු වෙමින් තිබිය දී සහ ඝාතකයින් අවි රැගෙන පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුළ නිදහසේ සැරිසරද්දී සහකාර පොලිස් අධිකාරි සහ මූලස්ථාන පරීක්ෂක යන දෙදෙනා ම එම ස්ථානයේ සිටි බව මට නිසැක ය"[49]

සහකාර පොලිස් අධිකාරි සහ මූලස්ථාන පරීක්ෂක ගේ අක්‍රියභාවය "රාජකාරිය පැහැර හැරීම"[50] ලෙස හඳුන්වන කොමිෂන් වාර්තාව එම අක්‍රිය භාවය ගැන බැරෑරුම් ලෙස විවේචනාත්මක වන නමුදු එය කඳවුර තුළ ප්‍රහාරය සම්බන්ධ ව ඔවුන් ගේ පූර්ව අවබෝධයක, පිළිගැනීමක් නැතහොත් දනුවත් හවුල්වීමක ප්‍රතිඵලයකට වඩා නො තැකීමක් සහ උදාසීනත්වයක් ලෙස හඳුන්වයි. "පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ අපරාධයක් සිදු වන තුරු සහකාර පොලිස් අධිකාරි දයාරත්න, මූලස්ථාන පරීක්ෂක ජයන්ත සෙනෙවිරත්න, පොලිස් පරීක්ෂක කරුණාසේන, උප පොලිස් පරීක්ෂකවරු වන වල්පොල, රත්නායක සහ අබේරත්න ඒ අසල සිටි බව මගේ වාර්තාව තුළ මා දනට මත් සාකච්ඡා කර ඇති සාක්ෂි මඟින් තහවුරු කරයි."[51] මෙම නිලධාරීන් ගැන කොමසාරිස් දිගට ම මෙසේ ලියයි., "සිද්ධිය වන අවස්ථාවෙහි ඔවුන් ගේ නිශ්ක්‍රීය වීම සහ ආකල්පය ආරක්ෂා කළ නො හැකි වීමේ හේතුව නිසා 2000.10.25 දින ඔවුන් ගේ හැසිරීම විනය පරීක්ෂණයකට යටත් කළ යුතු බව මම නිගමනය කරමි. සිද්ධිය වන අවස්ථාවෙහි ඔවුන් එහි සිටි අතර ප්‍රහාරය වැළැක්වීමේ හෝ මැර කණ්ඩායම විසුරුවා හැරීමට සහ වරදකරුවන් අත්අඩංගුවට ගැනීම සහ දෙකෙන් එකක් වත් කිරීමට උත්සාහ නො කළ බවට ප්‍රමාණවත් සාක්ෂි තිබේ.[52] කෙසේ වුව ද, වාර්තාව ආරම්භයේ සිට ම ඔවුන් ගේ ඉහළ නිලධාරීන් එහි සිටි බවට කරුණාසේන සහ වල්පොල කරන ප්‍රකාශයන් කිසිදු පැහැදිලි කිරීමකින් තොරව ම නො තකා හරියි. ඒ වෙනුවට ප්‍රහාරය

49. එම., පි. 143. සත්තකින්ම, උප පොලිස් පරීක්ෂක චින්තක අබේනාරායන ගේ සාක්ෂියට අනුව එක් රැඳවියෙක් තම ජීවිතය බේරාදෙන ලෙස ආයාචනා කරද්දීම උප පොලිස් අධිකාරීවරයා තමාගේ දෙපා ඉදිරිපිට වැටී සිටි එම රැඳවියාට පොලු වලින් පහර දීමට ඉඩ හැරියේ ය. පසුව එම රැඳවියා ඇදගෙන යන ලෙස පොලිසියට අණ දීම හැර උප පොලිස් අධිකාරීවරයා, රැඳවියාට උදව් කිරීමට කිසි පියවරක් නොගත්තේය. මෙම රැඳවියා අවසානයේ දී කුමන ඉරණමකට ලක් වූයේ ද යන්න අබේනාරායන ගේ සාක්ෂියෙන් පැහැදිලි වී නැත. කොමිෂන් සාක්ෂි විභාගය, 2001 සැප්තැම්බර් 14.

50. එම., පිටුව 190.

51. එම., පිටුව 190.

52. එම., පිටුව 205.

ගැන ප්‍රවෘත්තිය ලැබෙන විට ඔවුන් බදුල්ලේ විනය පරීක්ෂණයකට යමින් සිටිය බවත් ඔවුන් එම ස්ථානයට පැමිණෙන විට ප්‍රචණ්ඩත්වය නතර කිරීමට පරක්කු වූවා වැඩි බවත් යැයි සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පරීක්ෂක ගේ හේතු දැක්වීම පිළිගැනීමට ඔවුහු තීන්දු කළ හ.

එහෙත් මෙම සිද්ධීන් ගැන කොමසාරිස්වරයා සකස් කරන චිත්‍රයෙන් යමෙකුට පෙනෙනවාට වඩා දේවල් මේ වන විට සිදු වෙමින් පැවති බව හෙළිදරව් කෙරෙන පරිවේෂණීය සාක්ෂි පවතී.

රැඳවියන්ට එරෙහිව ද්වේෂ සහගත වීමේ ද ප්‍රහාරය ඇති වන බව ගැන කලින් දන ගෙන සිටීමේ ද ඉන් පසුව සාක්ෂි විකෘති කිරීමේ ද රටාවක් ගැන බණ්ඩාරවෙල පොලිසියේ ධූරාවලියට වගකීම පැටවෙන සාක්ෂි කන්දරාවක් ම පවතියි. ඒවා සමස්තයක් ලෙස ගත් විට කියැවෙන්නේ නො තැකීමට බොහෝ සේ වැඩි දෙයක් ඒ තුළ පැවති බවයි. උදහරණයක් ලෙස පොලිසියේ ක්‍රියාවන් සම්බන්ධ ගෞරවය පිළිබඳ එනම් 24 වන ද සවස කඳවුරට ගිය අවස්ථාවෙහි රැඳවියන් ඔහුට සැලකූ ආකාරය පිළිබඳව මූලස්ථාන පරීක්ෂක සෙනෙවිරත්න කෝපයට පත් වූ බවට බලගතු සාක්ෂි තිබේ. මූලස්ථාන පරීක්ෂක සහ සිද්ධිය වූ ස්ථානයේ සිටි සෙසු අය සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවල වීඩියෝ පටවලට අනුව නිරායුධව කඳවුරට ඇතුළු වීමට ඔහුට බල කරනු ලැබීම සහ සැක කරනු ලැබූ සහ සටන් කරනු ලැබූ එල්.ටී.ටී.ඊ. කාඩර් සමඟ සාකච්ඡා කිරීම නිසා තමන් අවමානයට ලක් වූයේ යයි මූලස්ථාන පරීක්ෂකට හැඟුණු බව පැහැදිලි ය. සිද්ධිය වූ ස්ථානයේ සිටි විශ්වාස කටයුතු පුද්ගලයෙකුට අනුව එදින සවස කඳවුරෙන් පිට වන විට මූලස්ථාන පරීක්ෂක රැඳවියන් හෙළා දුටුවේ ය. කඳවුර අවට රැස්ව සිටි පිරිසට ඇසෙන තරම් උස් හඬකින් "මුන් මහ නරක මිනිස්සු. උන් පොලිස් මුර පොළ විනාශ කළා. තුවක්කුවක් නැතුව උන් මට ඇතුළට එන්න කියලා අපේ බෙලිවලට පිහි තිබ්බා"[53] වැනි යමක් ඔහු ප්‍රකාශ කර ඇත. ඊට අතිරේකව, මිනීමරු සහ උග්‍ර දෙමළ විරෝධී සටන් පාඨ සහිත කඳවුර විරෝධී පෝස්ටර් ද කඳවුර අවට පමණක් නොව, බණ්ඩාරවෙල නගරයේත් අලවා තිබූ අතර පොලිසිය නිශ්චිතව ම ඒවා දකින්නට ඇති බව අපි දනිමු. කොටින් ගමට පහර දීමට ඉඩ ඇති

53. කතුවරයා සමඟ කළ පුද්ගලික සම්මුඛ සාකච්ඡාව. කොළඹ 2003 අගෝස්තු මෙම ප්‍රකාශ වලට සහාය පළවෙන අන්දමට මූලස්ථාන පොලිස් පරීක්ෂක ගෙන් උපුටා දක්වන පුවත් පත් ලිපියක් සඳහා බලන්න, පාලිත ආරියවංශ ගේ "බිඳුණුවැව බේදවාචකය පිළිබඳ හදවතෙන් ගලන කඳුළු" ලංකාදීප 2003 ජූලි 6.

බවට 24 වන ද රාත්‍රියෙහි කඳවුරෙහි රඳවා සිටි පොලිස් නිලධාරීන්මත් කටකථා පතුරුවමින් සිටි බව කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් ඇසින් දුටු සාක්ෂිකරුවන් ගෙන් අපි දැන ගත්තෙමු. එමෙන් ම ප්‍රහාරය සිදුවන අතරතුරේ දී කඳුළු ගෑස් ගැසූ බව ඔවුන් කියන විට සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පරීක්ෂක බොරු කිවූ බව කොමිසම ද තහවුරු කර තිබේ. (සැබැවින් ම සිද්ධිය වූ ස්ථානයෙහි සිටි ඔවුන් ගේ පොලිස් භටයින්ට කඳුළු ගෑස් කොහෙත් ම නො සැපයීමට ඔවුන් තීන්දු කර තිබිණ.[54] ඔවුන් පරීක්ෂණ මෙහෙය වූ බලධාරීන්ට බොරු කිව්වා පමණක් නොව, පහර දුන් මැර පිරිස විසුරුවා හැරීම සඳහා ඔවුන්ට කළ හැකි උපරිමය ද ඔවුන් කළ බවට සාක්ෂි පිණිස ප්‍රහාරයෙන් ක්ෂණික පසු දිනවල අසල පිහිටි ගල් වලකට කඳුළු ගෑස් යම් ප්‍රමාණයක් මුද හැරීමට ඔවුන් ඔවුන් ගේ මිනිසුන්ට අණ කර තිබූ බව රහස් පොලිසිය සොයා ගත්තේ ය. එමෙන් ම අවසාන වශයෙන් බණ්ඩාරවෙල පොලිසිය මානව හිමිකම් කොමිසමෙන් පැමිණි පරීක්ෂකයන් ගෙන් ඔවුන් ගේ රාජකාරි සටහන් පොත් වසන් කරනු ලැබූ බව ද අපි දනිමු.

ප්‍රහාරය සැලසුම් කරනු ලැබුවා නැතහොත් අඩු තරමින් අවට ගම්මුන් ගෙන් පිටස්තර බලවේග විසින් එයට උදව් කරනු ලැබීමේ ප්‍රත්‍යක්ෂ සත්‍යතාව ගැන පරීක්ෂා කිරීමට හෝ වාර්තා කිරීමට ද කොමිසම අසමත් විය. සමූහ මනුෂ්‍ය ඝාතන සිදු වූ උදසන කඳවුරට පැමිණි වාහන හිමිකරුවන් ගේ අනන්‍යතාවයන් පරීක්ෂා කිරීම කොමිසම අත හරියි. ප්‍රහාරයට මැදිහත් වූවන් ගේ දේශපාලන සම්බන්ධතාවන්හි වැදගත්කම කොමිසම ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂි විසින් පෙන්නුම් කරන නමුත් එය පරීක්ෂා කර නැත. වර්ගවාදී සහ කඳවුර විරෝධී සටන් පාඨ සහිත පෝස්ටර් වලින් බොහොමයක් ලියා තිබුණේ පොදුජන එක්සත් පෙරමුණ

54. ප්‍රහාරය සිදුවීමට පෙර කරුණාසේන සතුව කඳුළු ගෑස් සැපයුමක් තිබූ බව මහාධිකරණ තීන්දුව එක් අවස්ථාවක දී ප්‍රකාශ කරයි. කෙසේ වුව ද, තත්ත්වය එසේ නොවූ බවට කොමිෂන් වාර්තාවෙන් පැහැදිලි වෙයි. (කොමිෂන් වාර්තාව 186) ඇත්ත වශයෙන් ම සහකාර පොලිස් අධිකාරී දයාරත්නට කළ හැකි හොඳම ප්‍රකාශය නම් ඔහු කඳුළු ගෑස් ගෙන ඒම සඳහා නියෝග කළේ ප්‍රහාරයෙන් පසුව සහ ඒවා තවමත් මධ්‍යස්ථානය තුළ රැඳී සිටි පිරිස විසුරුවා හැරීමට යොද ගත් බවය (පිටුව 149). එහෙත් මෙම ප්‍රකාශය පවා සාවද්‍ය බව ඔප්පු කිරීමට කොමිසමට හැකිවිය (පිටු 154-8).

මැතිවරණ උද්ඝෝෂණ පෝස්ටර්වල පිටුපස ය.[55] සෙසු දේශපාලන බලවේග සමග තිබිය හැකි සම්බන්ධතාවය ගැන ද පරීක්ෂා කර නැත. උදහරණයක් ලෙස, බදුල්ල-බණ්ඩාරවෙල පාරෙන් කඳවුරට හැරෙන ස්ථානයට කෙළින්ම විරුද්ධ පැත්තේ පදිංචිව සිටි සිහළ උරුමයේ ප්‍රාදේශීය සංවිධායක ගේ කාර්යභාරය හෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යොදවා සිටි සමහර ග්‍රාම ආරක්ෂකයින් ගේ සිංහල ජාතිවාදී දේශපාලන පක්ෂපාතිකම් මීට ඇතුළත් වේ.[56]

ඒ වෙනුවට ප්‍රහාරය බාහිර බලවේග විසින් සැලසුම් කරනු ලැබූ බව කිව හැකි සාක්ෂි නැති බවට කොමිෂන් වාර්තාව පොදු සහතිකයක් ඉදිරිපත් කරයි. මෙම ප්‍රහාරය බාහිර බලවේග විසින් මෙහෙයවනු ලැබුවක් හෝ සැලසුම් කරන ලද්දක් හෝ පූර්ව සැලසුම් කරන ලද්දක් නොවන බවට වාර්තාවෙහි මම ප්‍රකාශ කර ඇත්තෙමි[57] යැයි ඔහු ගේ වාර්තාව අගදී කොමසාරිස් ප්‍රකාශ කරයි. එවැන්නක් සිදුවීමේ හැකියාව බැරෑරුම්ව පරීක්ෂාවට භාජනය කළ බවට වෙනත් කිසිම සාක්ෂියක් කොමිසමේ නො දක්වෙන හෙයින් එවැනි පොදු ප්‍රකාශයක් පැහැදිලිවම නො සැහෙයි.

---

55. එකල ඌව පළාත් මහ ඇමති වීරවන්නි ගේ කාර්ය මණ්ඩල සාමාජිකයෙක් ප්‍රහාරය සිදුවන කාලය තුළ කඳවුර තුළ සිටි බව දක ඇති නිසා මෙම පෝස්ටර් පිළිබඳ කුමන්ත්‍රණය සැලකිය යුතු ලෙස ගැඹුරු වෙයි. පරීක්ෂණයට සම්බන්ධ වූ විශ්වාස කටයුතු ආරංචි මාර්ගයකට අනුව ඔහු බිදුණුවැව ප්‍රදේශයට පෝස්ටර් වලින් බොහොමයක් රැගෙන විත් තිබුණ සහ 24-25 දිනවල රාත්‍රී කාලයෙහි අවස්ථා ගණනාවක් ම කඳවුර අසලට පැමිණ තිබුණේ වීරවන්නි ගේ රියදුරු ය. කතුවරයා සමග කළ පුද්ගලික සම්මුඛ සාකච්ඡාව: කොළඹ 2003 අගෝස්තු.

56. විජේ ඩයස් විසින් රචිත ලිපියක මෙම කරුණු ඉදිරිපත් කර තිබේ. "දෙමළ රැඳවියන් ඝාතනයට ශ්‍රී ලංකා මහාධිකරණය පුදු හුණු ගායි යැයි ලෝක සමාජවාදී වෙබ් අඩවිය. 2003 සැප්තැම්බර් 19 www.ws. ඊට සමාන ඉහි කිරීම් D.B.S. Jeyaraj ගේ The Bindunuweva Massacre: The Inside Story.

57. කොමිෂන් වාර්තාව, පිටු 197. කෙසේ නමුත්, විශේෂයෙන් ම වාර්තාවේ පූර්ව කොටසේ ඇති එක්තරා ඡේදයක් නිසා, නිශ්චිතව ම මේ සම්බන්ධයෙන් සඳහන් කෙරෙන්නේ කුමක් දයි අපැහැදිලිය. එහිදී කොමිසම ඊට සමාන ප්‍රකාශයක් කරයි. නමුත් ප්‍රහාරයකට කොටින් වගකිව යුතුවීමේ හැකියාව ගැන එහි සඳහන් කරන බවක් පෙනී යයි. "බාහිර බලවේග" පිළිබඳ ප්‍රශ්නය කොමිෂන් වාර්තාව බ්‍රිගේඩියර් ජයසූරිය ගේ සාක්ෂියට සම්බන්ධිතව ආමන්ත්‍රණය කරයි. බිදුණුවැව මෙම ප්‍රහාරයේ දී යම්කිසි ආකාරයකට අදළ නො වූ හෝ බාහිර බලවේග සම්බන්ධ වී තිබුණේ දයි දන ගැනීමේ අරමුණ ඇතිව ප්‍රහාරය සිදුවන අවස්ථාවෙහි රට තුළ යුධමය තත්ත්වය ගැන ඔහු ගෙන් විමසා තිබුණි. මෙම සිද්ධිය සිදු වූ අවස්ථාවෙහි සටන් බිමේ තත්ත්වය හමුදාවට ඉතාමත් ම වාසිදයකව පැවති බව ඔහු පැවසීය. කෙසේ නමුත්, මෙම කාරණය සම්බන්ධව වෙනත් පරිච්ඡේදයක දී මම අවධානය යොමු කර ඇති අතර බිදුණුවැව ප්‍රහාරය සංවිධානය කිරීමේ දී අදළ නො වූ හෝ බාහිර බලවේග හෝ පුද්ගලයන් මැදිහත් නො වූ බව නිගමනය කළෙමි. පිටුව 161.

සමූහ ඝාතනය සහ එයට තුඩු දුන් කොන්දේසි ගැන කොමිෂන් වාර්තාව අප ගේ අවබෝධයට බොහෝ දේ එකතු කරන අතර ම එය පුළුල් ජනතාවට ලබා ගැනීමට ඉඩ සැලසිය යුතු නමුදු ප්‍රහාරය අර්ථ කථනය කිරීමට එය යොදා ගන්නා සමස්ථ රාමුව, කඳවුර සහ පුනරුත්ථාපන ක්‍රමය තුළ ක්‍රියාත්මක වන ගැඹුරු දේශපාලන ගතිකයන් බොහොමයක් සඟවමින් ප්‍රහාරය මත් බොහෝ සෙයින් අදේශපාලනීකරණය කරයි. අවාසනාවකට මෙන් ජනාධිපතිතුමිය විසින් කොමිෂන් වාර්තාව තවමත් මහජනතාව අතට පත්කර නොමැති හෙයින් සිද්ධිය ගැන අපේ දැනුමට යම්කිසි එකතුවක් වාර්තාව විසින් කරන්නේ නම් එය ඉතා අතළොස්සකට හැර අන් සියලු දෙනාටම අහිමි කරනු ලැබ ඇත.[58]

## 5. ත්‍රි පුද්ගල නඩු විභාගය: 2002 මාර්තු 25-2003 ජූලි 01 වැනිද

### 5.1 අධිචෝදනය

අවාසනාවකට මෙන්, ජූරි සභාවක් රහිත නඩු විභාගය ඉදිරියට නීතිපති දෙපාර්තමේන්තුව විසින් ගොනු කරන ලද අධිචෝදනා තුළ කොමිසමේ වඩාත් වැදගත් තීන්දු වලින් බොහොමයක් සැලකිල්ලට ගෙන ඇති බවක් නො පෙනෙයි.[59] අධිචෝදනය විසින් යෝජිත කථාන්තරය, එහි අධිචෝදනා තුළ සහ නඩු විභාගය තුළ දී කොමිෂන් වාර්තාවේ දී සැපයූ පොදු ආකෘතිය අනුගමනය කරයි: එය, බිය සහ මංකොල්ලකාරී කොටින් පිළිබඳ කටකථා වලින් ක්‍රියාවට පොළඹ වනු ලැබූ සහ පොලිසිය තමා විසින් ඔවුන් පාලනය කළ යුතුව තිබූ මැර කණ්ඩායමක කොටසක් බවට පත් වෙමින් කඳවුර සහ එහි රැඳවියන් ආරක්ෂා කිරීමේ තම රාජකාරියේ දී දඩි ලෙස අසාර්ථකත්වය පිළිබඳ කථාන්තරය කියයි.[60] එහෙත් කොමිසම විසින් සියලූ සාක්ෂි ආවරණය නොකළ ද සහකාර පොලිස් අධිකාරී හෝ මූලස්ථාන පොලිස් පරීක්ෂක සම්බන්ධයෙන් තීරණාත්මක ව අධිචෝදනා

58. දෙවැනි සටහන බලන්න.

59. නියමිත පටිපාටියක් ලෙස කොමිසමේ වාර්තාව සහ නිර්දේශයන් නීතිපතිට යොමු කරනු ලැබී ය.

60. ප්‍රහාරය සාපේක්ෂ ස්වයං සිද්ධ ව සිදු වූවක් බව පැමිණිල්ලේ ලිඛිත ප්‍රකාශයේ භාෂා ශෛලිය මගින් ඇඟවුම් කෙරෙයි. උදාහරණ වශයෙන්, ඔවුන් තමන්ව නීති විරෝධී රංචු ගැසීමක තත්ත්වයට පත්කර ගැනීමේ දී පූර්ව සූදානමක් නැති ව ගම්මුන් ආයුධ ගත් බවට ලිඛිත ප්‍රකාශය තුළ දී පැමිණිල්ල දෙවරක් තර්ක කරයි. (පිටුව 50) "ප්‍රහාරකයන් විසින් හදිසියේ අසුලා ගත් බවක් පෙනෙන්නට තිබෙන විවිධ ආයුධ වලින් රැඳවියන්ට පහර දෙනු ලැබූ බව" මුල දී එය ලියයි (පිටුව 43).

ඉදිරිපත් කිරීමක් කරනු නො ලැබී ය. ප්‍රහාරය සැලසුම් කිරීම හෝ කලින් දැන ගෙන සිටීම සම්බන්ධයෙන් කිසිවෙකුට දඬුවම් නො කෙරිණි.[61] ඒ වෙනුවට ඉදිරිපත් කරනු ලැබූ කථාන්තරය වූයේ ක්ෂේත්තිය, ද්වේෂය හෝ බිය පාලනය කර ගත නො හැකි වීමත් පාලනය කළ යුතුව තිබූ ප්‍රචණ්ඩ බලවේග වලට පොලිසියමත් හසු වී පැටලීමත් ය.[62]

2002 මාර්තු මස දී ඉදිරිපත් කරන ලද අධිචෝදනා පත්‍රවලට අනුව ප්‍රදේශවාසීන් 31 කට ද පොලිස් නිලධාරීන් 10 දෙනෙකුට ද එරෙහිව එක් අයෙකුට චෝදනා 83 ක් බැගින් ඉදිරිපත් විය. චෝදනා 83 වර්ග පහකට බෙදුණි. 01. රැඳවියන්ට හානියක් කිරීමේ පොදු අරමුණින් නීති විරෝධී ජන රාශිය සම්බන්ධව චෝදනා (දණ්ඩ නීති සංග්‍රහයේ 140 වගන්තිය). 02. නීති විරෝධී ජන රාශිය පිළිබඳ පොදු අරමුණු ඉටු කිරීමේ දී සිදු වූ මිනීමැරීම සම්බන්ධ චෝදනා විසි හතක්. (දණ්ඩ නීති සංග්‍රහයේ 146 වගන්තිය සමඟ කියැවෙන 296 වගන්තිය). 03. නීති විරෝධී ජන රාශිය පිළිබඳ පොදු අරමුණු ඉටු කිරීමේ දී සිදු කරන ලද දිවි බේරා ගත් රැඳවියන් මැරීමට තැත් කිරීම සම්බන්ධ චෝදනා දහ හතරක් (දණ්ඩ නීති සංග්‍රයේ 146 වගන්තිය සමඟ කියැවෙන 300 වගන්තිය) 04. "වැරදි ක්‍රියාවන් කරන තැනැත්තන් අතර පැවති පොදු චේතනාව සම්බන්ධ පදනම මත" මිනීමැරීම සම්බන්ධ චෝදනා විසි හතක්. (දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමඟ කියැවෙන 296 වගන්තිය) 05. පොදු චේතනාව සම්බන්ධ

---

61. නීතිපති කාර්යාලයේ නිලධාරියෙකුට අනුව, ප්‍රහාරය සංවිධානය කිරීමේදී කිසියම් දේශපාලන කණ්ඩායම්වල හෝ සෙසු බලවේගවල මැදිහත්වීමකට ඇති හැකියාව පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට උපදෙස් දෙනු ලැබීය. සමහර පෝස්ටර් පිළිබඳව ප්‍රදේශයේ ගම්වැසියන් ගණනාවක ගේ සම්බන්ධතාවය ඔවුන්ට සොයා ගැනීමට හැකි විය. නමුත් කිසියම් සංවිධානවල හෝ දේශපාලනඥයන් ගේ සම්බන්ධතාවයක් සොයා ගැනීමට ඔවුහු අසමත් වූහ.

62. සිද්ධීන් පිළිබඳ මෙම අර්ථ කථනයට මහාධිකරණ තීන්දුවෙන් යළි සහතික කෙරෙයි. "බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුර පවත්වා ගෙන යාම සම්බන්ධව ගම්මුන් අතර නොසතුටක් තිබුණි. රැඳවියන් කොටින් ලෙස වඩා හොඳින් දන්නා ලද එල්.ටී.ටී.ඊ. සංවිධානයක සාමාජිකයන් වීම හේතුකොට ගෙන මෙම නොසතුට පැවති බව ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින් සනාථ වී තිබේ. පුනරුත්ථාපනය සඳහා කඳවුරේ රඳවා සිටි රැඳවියන් පිළිබඳව සැලකිය යුතු බියක් ගම්මුන් අතර තිබූ බව සාක්ෂි වලින් පෙන්නුම් කෙරෙයි. කඳවුර පසුකර යන තරුණ කාන්තාවන්ට අනවශ්‍ය විහිළු කිරීම නිසා රැඳවියන් කෙරෙහි ගම්මුන් තුළ කෝපයක් පැවැති බව ද අනාවරණය විය. කොටින් කඳවුරට ඇතුල් වී පොලිසිය සතු ආයුධ පැහැර ගෙන තිබූ බවත්, මෙම හේතුව නිසා මිනිසුන් පිරිසක් විසින් කඳවුරට පහර දුන් බවටත් ප්‍රහාරය සිදු වූ දිනට පෙර දින රාත්‍රියේ අසත්‍ය කටකථාවක් පැතිර යමින් තිබුණි." (පි. 18)

පදනම මත මිනීමැරීමට තැත් කිරීම ගැන චෝදනා දහහතරක් (දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමඟ කියැවෙන 300 වගන්තිය).

මූලික නීතිමය තර්කය දෙයාකාර ය. පළමුව, රංචුවක සාමාජිකයන් ලෙස සහ ආයුධ සන්නද්ධ ව සිටි අය ලෙස හඳුනා ගත් අය පහර දීමේ සහ මිනීමැරීමේ හෝ රැඳවියන්ට දරුණු ලෙස හිංසා කිරීමේ පොදු අරමුණක් විසින් පොළඹ වනු ලැබූ විශාල "නීති විරෝධී ජන රාශියක" කොටසක් වූවේ ය යන්නයි. පොදු අරමුණක් ඇති ව සිටීම යනුවෙන් මෙහි දී අවබෝධ කර ගනු ලබන්නේ සියලු දෙනාම හෝ සමූහයේ කිසියම් සාමාජිකයන් අතර එකඟතාවක් ඇති වීම නොව ක්‍රියාවේ යෙදී සිටි පුද්ගලයින් පොදුවේ කළ ක්‍රියාවක් හෝ ලීලාවේ තුබූ ස්වභාවය ගැන ගුණයක් තුළින් වටහාගත හැකිව තුබූ අභිමතාර්ථයකි. චූදිතයා විසින් නීති විරෝධී ජන රාශිය තුළ කළ නිශ්චිත මැදිහත් වීම තනි තනි ව ඔප්පු කළ යුතු අතර සෙසු සියලුම සාමාජිකයන් ගේ ක්‍රියාවන් සම්බන්ධ ප්‍රතිකාරී වගකීමක් සෑම චූදිතයෙකුට ම පැවරේ.[63] මෙලෙස පැමිණිල්ල තර්ක කළේ චූදිත "ගැමියන්ට" පළමුව නීති විරෝධී ජන රාශියක සාමාජිකයන් වීම ගැන ද චෝදනාවක අනතුරු ව සමූහය සමස්ථයක් ලෙස කළා වූ මිනී මැරීමේ සහ මැරීමට තැත් කිරීමේ (චෝදනා 242) සුවිශේෂ ක්‍රියාවක් ගැන ද දඬුවම් දිය යුතු බවයි. මිනී මැරීමේ හෝ මිනී මැරීමට තැත් කිරීමේ කිසියම් සුවිශේෂ ක්‍රියාවක් යම්කිසි චූදිතයෙකු විසින් කළ බව ඔවුන් පෙන් විය යුතුව නො තිබිණ.[64]

චූදිතයන් අතර වූ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් වෙනත් ආකාරයක තර්කයක් සහ සාක්ෂි එකතු කළ යුතු ව තිබුණි. කඳවුර ආරක්ෂා කිරීමට රඳවා සිටි පොලිසිය ඔවුන් විසින් ඉටු කළ යුතු ව තිබූ රාජකාරියට අනුව

63. අපරාධ නීති සංග්‍රහයේ 146 වැනි ඡේදයට අනුව, යම්කිසි නීති විරෝධී ජන රාශියක පොදු අරමුණ සිද්ධ කර ගැනීමේදී එම ජන රාශියට අයත් ඕනෑම සාමාජිකයෙක් විසින් වැරැද්දක් කරන්නේ නම් හෝ එම අරමුණ සිද්ධ කර ගැනීමේදී සිදු කිරීමට ඉඩ ඇතැයි එම ජන රාශියේ සාමාජිකයින් දන සිටියා වූ වැරැද්දක් කෙරෙන්නේ නම් හෝ එම වැරැද්ද කරන අවස්ථාවේ දී එම ජන රාශියේ සාමාජිකයෙක් වන්නා වූ සෑම පුද්ගලයෙක් ම එම වරද සඳහා වරදකරුවෙක් වෙයි. (පැමිණිල්ලේ ලිඛිත ප්‍රකාශයේ උපුටා දක්වා ඇත, පි. 36.)

64. මහාධිකරණ තීන්දුව, පිටුව 76. පොදු අරමුණ පිළිබඳ වෙනත් සිද්ධාන්තයක් මත පදනම් වූ 43-83 චෝදනා සම්බන්ධයෙන් පැමිණිල්ල තම අවසාන ලිඛිත ප්‍රකාශයේ දී පිළිගත්තේ අපරාධ පනතේ 32 වැනි වගන්තියේ අවශ්‍යතාවය පරිදි, ධනාත්මක නිශ්චිත ක්‍රියාවන් කරන විශේෂිත පුද්ගලයින් හඳුනා ගත යුතු වන හෙයින්, "පොදු අරමුණ" ඔප්පු කිරීමේ දී සැපිරිය යුතු සාක්ෂිමය කොන්දේසි සැපිරී නැති බව ය. ඒ අනුව, මෙම චෝදනාවන් නඩුව පිළිබඳ නිගමනයේ දී බලාත්මකව ඉවත දමිණි. එහි නඩු තීන්දුවේහි පිටු 79-80 දී මහාධිකරණය එය පිළි ගනියි.

ක්‍රියා කිරීමට අසමත් වීම මගින් නීති විරෝධී ජනරාශියක සාමාජිකයන් වූයේ ය යන තර්කය ගොඩ නඟන ලදී. ජනරාශිය කඳවුරට ඇතුළු වී එහි රැඳවියන් ඝාතනය කරද්දී පියවරක් නො ගෙන සිටීම මගින් ද ප්‍රහාරකයින් කිසිවෙකු පාලනය කිරීමට හෝ ඔවුන් ගෙන් කිසිවෙකු අත්අඩංගුවට ගැනීමට උත්සාහ නො කිරීම මගින් ද පොලිසිය නීති විරෝධී ජන රාශියේ පොදු අරමුණේ කොටස්කරුවෝ වූහ. මෙම සම්බන්ධතාවය ස්ථාපිත කිරීමට නම්, යමෙකු ගේ රාජකාරිය ඉටු කිරීමට අසමත් වීම මගින් "නීති විරෝධී පැහැර හැරීමක්" ඇති වී ඇතැයි සලකා බැලීම සඳහා නීතිමය පූර්වාදර්ශ බෙහෙවින් තිබුණ බවට අධිචෝදනය විසින් මුලින් ම තර්ක කළ යුතු ව තිබුණි. මෙම සිද්ධාන්තය මනුෂ්‍ය ඝාතනයේ දී විශේෂයෙන් ම මනාව තහවුරු කරනු ලැබ ඇතැයි ඔවුහු තර්ක කළ හ.[65]

ගම්මුන් අතරින් චූදිතයන් වූ සියලූ දෙනාම ආයුධ රැගෙන අපරාධය සිදු වූ ස්ථානයේ සිටි බවට ඇසින් දුටු සාක්ෂිකරුවන් විසින් හඳුනා ගෙන තිබුණි. අවාසනාවකට මෙන් අසල් වැසියෙකු විසින් අසල් වැසියෙකුට විරුද්ධව සාක්ෂි දීමට සිදු වන (සහ එක් අවස්ථාවක දී ඥාතියෙකුට එරෙහිව ඥාතියෙකු) මේ වර්ගයේ අපරාධ නඩුවල දී ඇසින් දුටු සාක්ෂි වලින් සැපයෙන්නේ අඩු විශ්වාසවන්තකමකින් යුක්ත වූ පදනමකි. ඇත්ත වශයෙන් පැමිණිල්ලේ සාක්ෂි මෙහෙය වීම අවසානයේ දී සාක්ෂි නැතැ යි පවසමින් චූදිතයන් 41 දෙනා ගෙන් 23 කට විරුද්ධ චෝදනා ඉවත දැමිය යුතු බව පැමිණිල්ල අධිකරණයෙන් ඉල්ලා සිටියේ ය. චෝදනා ඉවත් කර ගැනීමට හේතුව වූයේ රහස් පොලිසියට ඔවුන් කලින් දී තිබුණ ප්‍රකාශ වලට අනුරූපව තම අසල්වැසියන්ට එරෙහිව සාක්ෂි දීමට සාක්ෂිකරුවන් හතර දෙනෙකු අසමත් වීමයි.[66] චෝදනා ලැබූ පොලිස් නිලධාරීන් දහදෙනාගෙන් එක් අයකු ද මේ අවස්ථාවේ දී නිදහස් කරන ලදී.

---

65. පැමිණිල්ලේ ලිඛිත ප්‍රකාශන, පිටු 36-41.

66. විශ්වාස කටයුතු මූලාශ්‍රයන් ගණනාවකට අනුව, නිදහස් කළ චූදිතයන් විසිතුන් දෙනා අතර ප්‍රහාරයේ මූලික නායකයෝ සමහර දෙනෙක් වූහ. තම අසල්වැසියන්ට විරුද්ධව සාක්ෂි නො දෙන ලෙස ඔවුන්ට තර්ජනය කළ සහ අනතුරු ඇඟ වූ බව සාක්ෂිකරුවන් වීමට බලාපොරොත්තු වන හතර දෙනෙකු ප්‍රකාශ කළහ. පැමිණිලි පක්ෂය, කෝපයට පත් විනිශ්චයකරුවන් ගේ උද්යෝගිමත් එකඟතාවයක් ඇති ව අසත්‍ය සාක්ෂි දීමේ චෝදනාමත සාක්ෂිකරුවන් වහාම බන්ධනාගාර ගත කර තිබුණි. 2003 අගෝස්තු 28 දින ඔවුන් ගේ නඩුව අසනු ලැබූ අවස්ථාවෙහි එක් එක් පුද්ගලයාට බරපතල වැඩ ඇතිව ද අවුරුදු සිර දඬුවමක් නියම කළේය. විශ්වාස කටයුතු මූලාශ්‍රයන් ගණනාවකට අනුව ඔවුන් ප්‍රකාශ කළ ආකාරයට සාක්ෂි දීම සාක්ෂිකරුවන්ට ඇත්ත වශයෙන් ම තර්ජනය කරනු ලැබ තිබුණි. සමහර තහවුරු නො වූ වාර්තා වලට අනුව සාක්ෂි දුන් තැනැත්තන් ද එසේ තර්ජනය කර තිබුණි.

චෝදනා ලැබූ පොලිස් නිලධාරීන් සම්බන්ධ ව වෙනස් ස්වභාවයක ප්‍රශ්න තිබුණි. ප්‍රහාරය සිදු වන අවස්ථාවෙහි කඳවුරෙහි රාජකාරියෙහි යොදවා සිටි පොලිස් නිලධාරීන් 6 දෙනෙකු ගෙන් චෝදනා ඉදිරිපත් කෙරුණේ පොලිස් පරීක්ෂක, උප පොලිස් පරීක්ෂක වැනි මධ්‍යම තිලවල නිලධාරීන්ට පමණි. ඔවුහු කඳවුරෙහි මධ්‍යම දෙරටුවෙහි රාජකාරියෙහි යොදවා සිටිය වුත් හෝ කඳවුර අවට නොයෙකුත් විවිධ තැන් මුර කිරීමට යැවූ පොලිස් බලඇණි භාරව සිටිය වුත් ලෙස සාක්ෂිකරුවන් විසින් හඳුනා ගත් අය වූහ.

මෙම අධිචෝදනා මූලෝපාය සම්බන්ධයෙන් ප්‍රශ්න දෙකක් මතු වෙයි. පළමු සහ වඩාත් ප්‍රකට ගැටලුව නම් අපරාධයට සම්බන්ධ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනා ගෙන් එක් අයෙකුට වත් එරෙහි ව චෝදනා ඉදිරිපත් කිරීමට අසමත් වීම ය. කොමිෂන් වාර්තාවෙන් සහ සෙසු මූලාශ්‍රයන් ගෙන් ලබා ගත හැකි අපරාධාරෝපණ සාක්ෂි තිබිය දීම නඩුවේ පැමිණිල්ල සහකාර පොලිස් අධිකාරී දයාරත්න ගේ සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න ගේ ආස්ථානයන් (තර්කයන්) තහවුරු කළ අතර ඔවුන් රජයේ සාක්ෂිකරුවන් කරන ලදී.[67] දෙවනුව, පැමිණිල්ලේ පොලිස් චූදිතයන් තේරීමෙන් අදහස් කරන ලද්දේ අවම වශයෙන් කඳවුරට ඇතුල් වන ස්ථානයෙහි රාජකාරියෙහි යොදවනු ලැබ සිටිය වුත් සහ පලායමින් සිටි රැඳවියන්ට වෙඩි තැබීම සම්බන්ධ ව වගකිව යුතු අයට චෝදනා නො කිරීමය. අවසාන වශයෙන්, සහ වඩා පොදු ලෙස අධිචෝදනා මූලෝපායේ තවත් අඩුපාඩුවක් තිබුණි. එය තීන්දු කළේ මිනීමැරීම සහ මිනීමැරීමට තැත්කිරීම වැනි වඩාත් බරපතල චෝදනා පමණක් ඉදිරිපත් කිරීමයි. එහෙත්

---

67. අපරාධය සිදුවෙමින් තිබූ අවස්ථාවෙහි ක්‍රියාත්මක වීමට අසමත්වීම සම්බන්ධයෙන් අවම වශයෙන් පොලිසියේ නිලධාරීන් හයදෙනෙකු සහකාර පොලිස් අධිකාරී දයාරත්න, මූලස්ථාන පොලිස් පරීක්ෂක සෙනවිරත්න, පොලිස් පරීක්ෂක කරුණාසේන සහ උප පොලිස් පරීක්ෂකරුන් වන රත්නායක, අබේරත්න සහ වල්පොල යන සියලු දෙනාම වරදට සම්බන්ධ වුවන් බව කොමිෂන් වාර්තාව තහවුරු කර තිබුණි. මෙම හය දෙනා ගෙන් පහළ තිලයේ නිලධාරීන් හතර දෙනාම සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක සිද්ධිය වූ ස්ථානයේ සිටි බව කොමිසමට ප්‍රකාශ කළේය. සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක කනිෂ්ඨ නිලධාරීන්ට චෝදනා කළහ. මූලස්ථාන පොලිස් පරීක්ෂකට සහ සහකාර පොලිස් අධිකාරීට චෝදනා ඉදිරිපත් නො කළේ මන්දයි පෞද්ගලික සම්මුඛ සාකච්ඡාවක දී විමසූ විට ඔවුනට විරුද්ධව සාක්ෂි සොයා ගැනීමට නො හැකි වූ බව පැමිණිල්ල මෙහෙය වන ප්‍රධාන රජයේ නීතිඥ ප්‍රියනන්ද නැවත ප්‍රකාශ කළේය. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ වාර්තාව සහ එය අන්තර්ගත කරගත් ප්‍රකාශයන් අන් සාක්කිකරුවන් උසාවියේ දී දීමට එකඟ වූ සාක්ෂි මොනවා ද යි යන්නත් නොදත් අයට මෙම ප්‍රකාශය තිකම්ම ඉවත දමිය නො හැකිය.

එය ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දේ මූලස්ථාන පොලිස් පරීක්ෂක හා උප පොලිස් අධිකාරීවරයා වැනි සිද්ධිය ගැන සම්බන්ධයක් පැවති නිසා ප්‍රහාරයට සම්බන්ධයක් ඇති හෝ ලෙහෙසියෙන් බිය ගැන්විය හැකි වූ අය ගේ හෝ ඇසින් දුටු සාක්ෂි පමණකි.[68] මෙය විශාල අවදානමක් සහිත වූ මූලෝභයක් විය.

## 6. තීන්දුව

ඉකිරි චූදිතයින් දහ අට දෙනා ගෙන් නව දෙනෙක් ප්‍රදේශයේ පදිංචිකරුවන් වූ අතර එයින් තිදෙනෙක් උසාවිය මගින් වැරදිකරුවන් කරනු ලැබී ය. මොවුන් තිදෙනා ම නීති විරෝධී ජන රාශියක සමාජිකයින් වීම ගැන වැරදිකරුවන් කරනු ලැබූ අතර ජනරාශිය තුළ පැවති මිනීමැරීමේ සහ විනාශ කිරීමේ පොදු අරමුණ කරණ කොට ගෙන එක් එක්කෙනා මිනීමැරීමේ එක් චෝදනාවකට ද පහර දීම සම්බන්ධ බහුවිධ චෝදනා සඳහා ද වගකිව යුතු යැයි උසාවිය විසින් තීන්දු කරන ලදී.[69] එක් එක් අයට මරණ දණ්ඩනය පනවනු ලැබී ය. දඬුවම් නියම කරනු ලැබූ ප්‍රාදේශීය වැසියන් තිදෙනා කඳවුර වටකර සිටි වඩා විශාල වූ ජන සමූහයේ

68. ප්‍රහාරය අවසන් වූ හෝ අවසන් වෙමින් තිබූ අවස්ථාවේ දී, සමහර විට පෙරවරු 9.30 පමණ, පොලිස් ඡායාරූප ශිල්පියෙකු විසින් ගනු ලැබූ ඡායාරූප ගණනාවක් පැමිණිල්ල සාක්ෂි වලට ඇතුළත් කළේය. පොලු ලෙලවමින් සිටි ප්‍රහාරකයන් රාශියක් සමඟ - රත්නායක සහ කරුණාසේන ලෙස හඳුනා ගත් පොලිස් නිලධාරීන් ඇතුළුව - පොලිසිය පසෙකින් සිට ගෙන සිටි බව මෙම පින්තූර පැහැදිලිව පෙන්නුම් කරයි. සමහරවිට ඒවා ගෙන තිබුණේ (බොහෝ සෙයින්) ප්‍රහාරය අවසන් වන අවස්ථාවෙහි නිසා මහාධිකරණ තීන්දුවෙහි ඡායාරූප ගැන සඳහන් නො කරයි.

69. "4, 13, 21 යන විත්තිකරුවන් එම අවස්ථාවෙහි අපරාධයට සම්බන්ධ විය හැකි බව දැන දැනම නීති විරෝධී ජන රාශියක සාමාජිකයන් වීම නිසා ඒ අනුව 4, 13, 21 විත්තිකරුවන්, රුස්වූවන් විසින් කරන ලද අපරාධය සම්බන්ධයෙන් සාමූහික වගකීම දරන බව ඔප්පු කෙරී ඇති බව මෙම විනිසුරු මඩුල්ල නිගමනය කරයි." (නඩු තීන්දුව, පිටුව. 77.) එහෙත්, එක් එක් චූදිතයා වරදකරු කරනු ලැබුවේ මිනීමැරීමේ චෝදනා පහළොවකට පමණි. එසේ වූයේ, මළ සිරුරු විසි හතෙන් දෙළහක් හඳුනා ගැනීමට නොහැකි නිසා බැය ගතයුතු නිගමනය වන්නේ පැ59- පැ70 දක්වා පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා වලට සම්බන්ධ මළ සිරුරු 17-28 දක්වා චෝදනා වලට සම්බන්ධ මළ සිරුරු බවට පැහැදිලිව ඔප්පු කෙරී නැති බවය" යනුවෙන් විනිශ්චයකරුවන් විසින් නිගමනය කිරීමයි. එයට අතිරේකව, තුවාල ලැබූ තැනැත්තන් බොහෝ දෙනෙකු මිනීමැරීමට තැත් කිරීමට ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් ලෙස බරපතල තුවාල ලබා නො තිබුණ බව විනිශ්වයකරුවන් ගේ නිගමනය වූ හෙයින් මිනීමැරීමට තැත් කිරීම සම්බන්ධ චෝදනා දහ හතරෙන් තහවුරු කරනු ලැබුණේ එකක් පමණි. දිවි ගලවා ගත් තැනැත්තන් සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නො තිබූ නිසා චෝදනා වලින් තුනක් මුළුමනින් ම ඉවත දැමුණි.

කොටසක් වූවා නොව කඳවුර ඇතුළේ සිදු වූ ප්‍රහාරයට සහභාගී වීම ගැන ඒත්තු ගත හැකි සාක්ෂි යම් ප්‍රමාණයක් උසාවිය විසින් සොයා ගනු ලැබූ අය විය. උසාවිය තීන්දු කළේ හුදෙක් ජනරාශියේ සමාජිකයින් වීම පමණක් යමෙකු නීති විරෝධී ජනරාශියක සාමාජිකයෙක් බවට පත් කර වීම සඳහා ප්‍රමාණවත් නො වන බව ය. ඒ වෙනුවට ඔවුන් කළ නිගමනය වූයේ යමෙකු ගේ සාපරාධී අරමුණේ ඊට වඩා ක්‍රියාත්මක වීමක් අවශ්‍ය බව ය. මේ තුන් දෙනාම සම්බන්ධයෙන් අදාළ ක්‍රියාව වූයේ ආයුධ සන්නද්ධ ව සිටීමත් කඳවුර තුළට ඇතුල් වී සිටීම, දකීමත් ය.[70]

ඒ අනුව සිව්වන චූදිතයා වූ,[71] මුණසිංහ ආරච්චිගේ සැමී, ප්‍රථමයෙන්, කඳවුරෙන් පිටත, පුනරුත්ථාපන මධ්‍යස්ථාන සීමාවෙහි පිහිටි විද්‍යාපීඨ භූමියේ මුගුරක් අතැතිව සිට ගෙන සිටි ඇසින් දුටු සාක්ෂිකරුවෙකු විසින් දකින ලදී. පසුව ඔහු තවමත් මුගුරු අතැතිව කඳවුර තුළ සිටි බව එම සාක්ෂිකරු විසින් ම දක ඇත.[72] පසුව, සාක්ෂිකරු තරුණ රැඳවියෙකුව බේරා ගැනීමට උදව් කරමින් සිටිය දී පිටුපසින් ඔහුට මුගුරකින් පහර දෙනු ලැබී ය. ඔහු පිටුපස හැරී බලන විට මුගුරක් අතැති ව ඔහු අවට සිටි එකම පුද්ගලයා සැමී පමණි. ආයුධයකින් සන්නද්ධ ව කඳවුර තුළට ඇතුල්වීම මගින් නීති විරෝධී ලෙස රංචු ගැසීමේ පොදු අභිප්‍රාය තුළට සැමී ඇතුල් වී තිබූ බවට බලගතු සාක්ෂි තිබෙන බව විනිශ්චයකාරවරයා ඒ අනුව නිගමනය කළේ ය. ප්‍රදේශයේ පදිංචිකරුවන් තිදෙනා ගෙන් දෙවෙනියා, චූදිත අංක දහතුන, ඩී.එම්.එස්. දිසානායක බැරැක්ක ගිනි ගනිමින් සහ ප්‍රහාරය අවසන් වෙමින් තිබිය දී මුගුරක් අතැති ව මධ්‍යස්ථාන භූමියට පිටතින් මතු වනු තවත් සාක්ෂිකරුවෙකු විසින් දකින ලදී.[73] අවසාන වශයෙන්, බණ්ඩාරවෙල නගරයේ ටැක්සි රියදුරෙකු වූ විසි එක් වන චූදිත ආර්.එම්. ප්‍රේමානන්ද කාටත් වඩා පෘථුල සාක්ෂිවල පදනම මත වරදකරුවෙකු කරනු ලැබී ය. ප්‍රහාරය සිදු වෙමින් තිබිය දී ප්‍රේමානන්ද කඳවුරට ඇතුළු වී අනතුරුව අතක ලේ ගලමින් යළි මතු වූ බව ඔහු සමග ටැක්සියෙන් කඳවුරට ගමන් කළ සාක්ෂිකරුවන් දෙදෙනෙක් විස්තර කළහ. පසුව සාක්ෂිකරුවන් දෙදෙනෙකු ගෙන් එක් අයෙකු ඔහු ගේ අතට ප්‍රතිකාර

---

70. නඩු තීන්දුව, පිටුව 77.
71. චූදිතයන් හතලිස් එක් දෙනා ගෙන් එක් එක් තැනැත්තාට නඩු අංකයක් දෙන ලදී. එයට හේතුව පැමිණිල්ල සහ විත්තිය මෙන් ම මහාධිකරණ නඩු තීන්දුව විසින් කරනු ලබන ලිඛිත ප්‍රකාශයේ දී ද විත්තිකරුවන් හඳුන්වනු ලබන්නේ ඔවුන් ගේ නම් වලින් නොව, ඔවුන් ගේ අංකය පදනම් කර ගෙන නිසා ය.
72. නඩු තීන්දුව, පිටු 64-67.
73. එම., පිටු 17, 67-9.

කිරීමට පුද්ගලික සායනයට ඔහුව ගෙන ගියේ ය. ඔහුට ප්‍රතිකාර කළ සායනයෙහි වෛද්‍යවරයා ද සාක්ෂි දුන් අතර ඔහු වූදිතයා හඳුනා ගැනීමට සමත් විය.

ප්‍රහාරය තුළ පොලිසියේ භූමිකාව සම්බන්ධයෙන් ගත් කල, පොලිසියේ නිශ්ක්‍රීය වීම ඔවුන් නීති විරෝධී ජන රාශියකට කැමැත්තෙන් අයත් වුණු සාමාජිකයන් බවට පත් කෙරෙන්නා වූ නීති විරෝධී පැහැර හැරීමක් බවට පත් වෙන්නේ ය යන පැමිණිල්ලේ තර්කය උසාවිය පිළිගත්තේ ය. උසාවිය මෙසේ ප්‍රකාශ කළේ ය. "විශාල පිරිසකට කඳවුර අසල රැස්වීමට ඉඩ දීම මගින් ද ඔවුන්ට කඳවුර තුළට ඇතුළුවීමට සහ රැඳවියන් පදිංචි ව සිටි ශාලා ගිනි තැබීමට ඉඩ දීම මගින් ද ආයුධ සහිත ව සිටීමට ඔවුන්ට ඉඩ දීම මගින් ද රැඳවියන්ට පහර දී ඔවුන් ව මරණයට පත් කිරීමට ඔවුන්ට ඉඩ දීම මගින් ද සාක්ෂි යටපත් කිරීම සඳහා මළ සිරුරු දැවීමට උත්සාහ කිරීමට ඔවුන්ට ඉඩ දීම මගින් ද පොලිසිය මෙම ක්‍රියාවන්ට ආධාර කළ බව පෙන්නුම් කරයි."[74] මෙහි දී උසාවියේ නිගමනයට තීරණාත්මක වූයේ රැඳවියන් ගේ මළසිරුරු දවාලීම ප්‍රහාරයේ කොටසක් බවට පත් වූ හෙයින් ප්‍රහාරය මුල සිට අවසානය දක්වා පැයක් පමණ කාලයක් තුළ සිදු වූ බව ය. මෙයින්, අත්අඩංගුවට ගැනීම් කිහිපයක් කිරීමට හෝ අපරාධයට තම විරුද්ධත්වය වෙනත් ක්‍රියාවක් මගින් ප්‍රකාශ කිරීමට පොලිස් නිලධාරීන්ට ඇති තරම් කාලයක් ලබා දෙන ලදී.[75] දිවි ගලවා ගත් අය ගේ සාක්ෂි ඒ හා සමානව ම වැදගත් විය. රැස්ව සිටි පිරිස් තමන්ට පහර දෙනු ඇතැයි කඳවුරෙහි රාජකාරියෙහි යොදවා සිටි පොලිසියට දැනුම් දීමෙන් පසු, තමන් ගේ නවාතැන් පොළවල්වල රැඳී සිටින ලෙස ද ඔවුන් ආරක්ෂා කරන බව ද පොලිසිය පවසා ඇත. ඒ අනුව රාජකාරියෙහි යෙදී සිටි පොලිසියට විශාල පූර්ව අනතුරු ඇඟවීමක් තිබුණ නමුත් පිරිස විසුරුවා හැරීමට හෝ නැතහොත් ප්‍රහාරය වැළැක්වීමට ඔවුහු කිසිවක් නො කළහ. එවැන්නක් පහසුවෙන් කළ හැකි ව තිබුණේ යැයි උසාවිය තීන්දු කළේ ය. උදහරණ වශයෙන්, ඔවුන් ම රැඳවියන්ට පසු බැසීමට කියා තිබුණ බැරැක්ක සමහරක් හෝ සියල්ලම වටේට රැකවරණ යෙදීමට පොලිසියට හැකියාව තිබුණ බව උසාවිය අදහස් කරයි. ඒ වෙනුවට ප්‍රහාරය පටන් ගත් වහා ම පොලිසිය එය නැවැත්වීමට කිසිවක් නො කළා පමණක්

74. එම., පිටුව 22.

75. එමෙන් ම, අනතුරු ව කොමිසම විසින් රැස් කරන ලද සාක්ෂි වලට අනුව ප්‍රහාරය ආරම්භ වී මිනිත්තු දහයක් ඇතුළත සිද්ධිය වූ ස්ථානයෙහි සිටි නිසා සහකාර පොලිස් අධිකාරි සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක නීති විරෝධී පැහැර හැරීමක වරදකරුවන් කිරීම උසාවියේ තර්කය බව පෙනෙන්නට තිබේ.

නොව, පලා යන රැඳවියන්ට වෙඩි තැබීම මගින් ඇත්ත වශයෙන්ම එහි කොටස්කරුවෝ බවට පත් වූහ.[76]

තීන්දුව සඳහා නඩුව විනිශ්චකාර මණ්ඩල වලට ඉදිරිපත් කෙරුණ අවස්ථාවේ දී චෝදනා ලබා සිටි පොලිස් නිලධාරීන් නව දෙනා ගෙන් වරදකරුවන් කරනු ලැබුවේ දෙදෙනෙකු පමණි. ඔවුන් නම් පොලිස් පරීක්ෂක එස්.ජේ. කරුණාසේන (32 වැනි චූදිතයා) සහ ටී.ආර්. රත්නායක (41 වැනි චූදිතයා). ප්‍රහාරය සිදු වූ සම්පූර්ණ කාලය තුළ ම ඔවුන් ප්‍රධාන දෙරටුවෙහි රාජකාරියෙහි යෙදී සිටීම සහ ඒ නිසා ඔවුන් සිද්ධිය මධ්‍යයෙහි සිටි බව උසාවියට ඒත්තු යෑම නිලධාරීන් දෙදෙනා ම වරදකරුවන් වීමට ප්‍රධාන හේතුවකි. ඔවුන් ගේ අසමත් වීම ඉතා පැහැදිලි වූ වකි.

ඊට අතිරේකව, පුනරුත්ථාපන කඳවුරේ සේවයෙහි යොදවා සිටි පොලිස් බල ඇණිය පිළිබඳ සම්පූර්ණ වගකීම දරා සිටියේ යයි විශ්වාස කිරීමේ වගකීම ද කරුණාසේන මත පැටවිණි. ඒ අනුව, අණදෙන නිලධාරියා ලෙස ඔහු ගේ භූමිකාව යළි යළිත් අවධාරණය කරමින් සහ ආරක්ෂක පියවර ගැනීමට  මුළුමනින් ම අසමත් වීම සම්බන්ධ ව ඔහුට චෝදනා කරමින්, කරුණාසේන මත වගකීම පැවරෙන "අණ දීමේ වගකීම" පිළිබඳ සංකල්පයක් යම් ප්‍රමාණයකට උසාවියේ චින්තනය තුළ ගැබ් වෙයි.[77] "මෙම

76. කොමිසම හෝ පරීක්ෂණ පැවැත් වූවත් යන දෙපිරිසෙන් කවරෙකුවත් මෙම නිලධාරීන් කවුදැයි හඳුනා ගැනීමට අසමත් වන නමුත් රැඳවියන් ගණනාවක් පොලිස් නිලධාරීන් විසින් ආරක්ෂා කෙරුණු බව සටහන් කිරීම කෙසේ නමුත් වැදගත් ය. අවම වශයෙන් තරුණ රැඳවියන් දෙදෙනෙකු බේරා ගැනීමට නිර්භීත වූ ප්‍රදේශයේ පදිංචිකරුවන් ගණනාවක් ද සිටියහ.

77. "අණදීමේ වගකීම" නමැති හෞතික මූල ධර්මය මේ දක්වා ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානව හිතවාදී නීතිය තුළ වඩ වඩා පිළිගනු ලැබ ඇති නමුත් මේ දක්වා ශ්‍රී ලංකාවේ නීතිය තුළ පිළිගෙන නැත. තම පාලනය යටතේ සිටින තැනැත්තන් විසින් කරනු ලබන ක්‍රියාවක් සඳහා ඉහළ නිලධාරියෙකුට සාපරාධී උපවද්‍යභාවය (පුද්ගලික වගකීම) පැවරෙන බව මෙම මූල ධර්මය පිළිගනියි. අණ දෙන්නෙකු, සිදුවන්නේ යැයි ඔහු දැන සිටි හෝ දැන සිටියේ යැයි සිතිය හැකි අපරාධයක් වැළැක්වීමට අසමත්වීම, එම අපරාධ ඔහු ගේ ම අපරාධ බවට පත්කරනු ලබයි. මෙම මූල ධර්මය වඩා වඩා පිළිගැනීමට පත්වීම සහ යෙදවීම, බොහෝ විට සිදුවී ඇත්තේ පහළ නිලධාරීන් ගේ ක්‍රියාවන් සැලසුම් කළ හෝ අනුමත කළ ඉහළ නිලධාරීන්ට අත නො ගසා පහළ මට්ටමේ සොල්දදුවන් හෝ නිලධාරීන්ට දඬුවම් පැමිණවීමේ කණගාටුදයක සම්ප්‍රදයෙන් කැඩී වෙන්වීමට ඇති හැකියාව මත ය. වඩා මෑත දී පැරණි යුගෝස්ලෝවියාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර අපරාධ අධිකරණය ඉදිරියේ විභාග වූ නඩු ගණනාවක දී මෙම මූල ධර්මය ක්‍රියාවේ යොදවන ලදී. බිඳුණුවැව සම්බන්ධ මහාධිකරණ තීන්දුව තුළ අණ දීමේ වගකීම පිළිබඳ මූල ධර්මය ගැබ්ව ඇත්තේ ව්‍යංගර්ථමය වශයෙන් පමණි. ඒ ආකාරයෙන් එය නම් කරනු ලැබීමක් හෝ ඒ කෙරෙහි පදනම් වීමක් සිදුවී නැති අතර එය ක්‍රියාවේ යෙදවීමේ දී අණ දීම සම්බන්ධ දම්වැලේ ඉහළට ළඟා වීමට ප්‍රත්‍යක්ෂ ලෙස ම අසමත් වී ඇත.

තත්ත්වය පාලනය කිරීමේ හැකියාව ද හමුද සම්පත් ද 32 වන විත්තිකරුට තිබුණ බවත් එසේ කිරීමට අසමත් වීම මගින්, ඔහු සාපරාධී වගකීම දරන බවත් මෙම විනිශ්චකාර මණ්ඩලය නිගමනය කරයි."[78]

ඊට අතිරේකව, දිවි ගලවා ගැනීම සඳහා දුවමින් සිටි රැඳවියන්ට මාරක ව වෙඩි තැබීම සම්බන්ධ ව කරුණාසේන ව විශේෂයෙන් ම තදින් විවේචනය කරනු ලබයි. පිරිස විසුරුවා හැරීමට යම් පියවරක් ගනු ලැබූ බව පෙන්වීමට දරන උත්සාහයේ දී අහසට වෙඩි තැබීමට ඔහු තම මිනිසුන්ට අණ කළ බව නඩුව අවසානයේ විත්ති කූඩුවේ දී කරුණාසේන ප්‍රකාශ කළේ ය.[79] එය එසේ නම් රැඳවියන්ට වෙඩි වැදීම අහම්බෙන් සිදු වූ බව ඉන් අදහස් කෙරෙයි. එහෙත් කාරණය එය නම් කිසිදු ගම්වැසියෙකුට වෙඩි නො තබා රැඳවියන්ට පමණක් වෙඩි තබනු ලැබුවේ ඇයි දැයි උසාවිය අසයි. උසාවිය මෙසේ ලියයි. "අනෙක් අතට ඔහු ගේ අණකිරීම් වලට පිටින් කිසිවෙකු වෙඩි නො තැබූ බව 32 වන විත්තිකරු කියා ඇත. ඒ අනුව රැඳවියන්ට වෙඩි තැබීම 32 වන විත්තිකරු ගේ අනුදැනුම ඇතිව සිදු වූ බව මෙම විනිශ්චකාර මණ්ඩලය තීන්දු කළ යුතු ය".[80]

ප්‍රහාරය සිදු වන අවස්ථාවෙහි කරුණාසේන සමඟ උප පොලිස් පරීක්ෂක රත්නායක ද ප්‍රධාන දොරටුවෙහි සිටීමට ඉඩ ඇතැයි උසාවිය තර්ක කර ප්‍රධාන දොරටුවෙහි රත්නායක සිටි බවට දෙදෙනා ම පොලිස් කොස්තාපල්වරුන් වූ සාක්ෂිකරුවන් දෙදෙනෙකු සාක්ෂි දීමේ දී ප්‍රකාශ කළ බව උසාවිය උපුටා දක්වයි.[81] කරුණාසේන ගේ මෙන් ම ඔහු ගේ නිශ්ක්‍රීයභාවය, නීති විරෝධී රංචු ගැසීමක සම්පූර්ණ සාමාජිකයෙකු බවට ඔහු පත් කළ බව සහ ඒ අනුව සාපරාධී ලෙස වගකිව යුතු බව කියනු ලබයි.

ප්‍රහාරය ආරම්භයේ දී සහකාර පොලිස් අධිකාරි සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක එහි සිටි බවත් සහ ප්‍රහාරකයන්ට එරෙහි පියවර ගැනීමට අණ

---

78. නඩු තීන්දුව, පිටුව 50 "32 වන විත්තිකරුට කොදුම්ටි අතැතිව පොලිස් නිල ඇඳුමෙන් සැරසුණ කණ්ඩායමක් සිටියා නම්, ඔහුට මෙම අපරාධය වැළැක්විය හැකි ව තිබුණා" යැයි මුල දී උසාවියට ප්‍රකාශ කළේ ය.
79. එක් මූලාශ්‍රයකට අනුව වෙඩි තැබීම මගින් පළුදු වූ ගස් පිළිබඳ රජයේ රස පරීක්ෂකයෙක් සාක්ෂි හෙළිදරව් කළේ ය. එය කරුණාසේන ගේ ප්‍රකාශය තහවුරු කිරීමට තුඩු දෙයි. එහෙත් නඩු විභාගයේ දී මෙම සාක්ෂිය ඉදිරිපත් කර නො තිබුණේ මන්දැයි පැහැදිලි නැත.
80. නඩු තීන්දුව, පිටුව 54.
81. එම., පිටු 60-63.

කිරීම ඔවුන් ගේ ඉහළ නිලධාරීන් ගේ රාජකාරිය වුණ බවට කරුණාසේන සහ රත්නායක යන දෙදෙනා ම ප්‍රකාශ කළහ.

ඇඟ බේරාගැනීමට හා තමා ගේ වගකීමෙන් බේරීමට ගත් උත්සාහයක් ලෙස සහකාර පොලිස් අධිකාරි සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක කලින් ම ඔවුන්ට චෝදනා කළහ. ඔවුන් සාක්ෂි දෙන විට සහකාර පොලිස් අධිකාරි සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට විත්තිකරුවන්ට සහ ඔවුන් ගේ නීතිඥයන්ට ඇති තරම් කාලය තිබුණ නමුත් කිසිවෙකුත් එසේ නො කළ බව උසාවිය තීන්දු කළේ ය. ඔවුන් දෙදෙනාම හරස් ප්‍රශ්න ඇසිය නො හැකි ප්‍රකාශ වන විත්ති කූඩුවේ දී තමන් කළ ප්‍රකාශනවල දී පමණක් ප්‍රථම වතාවට මෙම ප්‍රශ්නය මතු කිරීම ඔවුන් ගේ ප්‍රකාශනවල වැදගත්කම අඩු කිරීමට තවදුරටත් හේතු වූ බවට උසාවිය තර්ක කරයි.[82]

සෙසු නිලධාරීන් හත්දෙනා සම්පූර්ණයෙන් ම නිදහස් කරනු ලැබී ය. කරුණාසේන ගේ අණ ප්‍රධාන දෙරටුවෙහි සේවයේ යොදවා සිටි 33 වන විත්තිකරු වන උප පොලිස් පරීක්ෂක ජයරත්න මෙයට ඇතුළත් විය. ඔහු සහ සහකාර පොලිස් අධිකාරි බදුල්ලට යමින් සිටිය දී කඳවුරට පහර දීම ගැන ඔහුට දුරකථනයෙන් දනුම් දුන්නේ ජයරත්න බව මූලස්ථාන පොලිස් පරීක්ෂක ගේ සාක්ෂියෙන් උසාවිය උපුටා දක්වයි. "මෙලෙස 33 වන විත්තිකරුට අනුව සිද්ධිය ආරම්භයේ සිට ම ඔහු සිද්ධිය ගැන ඉහළ නිලධාරීන්ට දනුම් දුන් අතර ආධාර ඉල්ලා සිටියේ ය. ඒ අනුව රැඳවියන්ව නැති කිරීමට එක් රැස් වූ සෙසු අය දරූ පොදු අභිප්‍රාය 33 වන සැකකරු දරූ බව සහ එම පොදු අභිප්‍රායන්ට අනුව ඔහු ක්‍රියා කළ බව නිගමනය කළ නො හැකි ය"[83]

82. එම., පිටු 52-3, 63. දිවුරුම යටතේ සාක්ෂි දෙනවා වෙනුවට ශ්‍රී ලංකාවේ නීතිය යටතේ චූදිතයෙකුට විත්ති කූඩුවේ සිට ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත. විත්ති කූඩුවේ සිට කරන ප්‍රකාශයක් හරස් ප්‍රශ්න ඇසීමට භාජනය නො කෙරෙයි; නමුත් සාධාරණ සැකයකින් තොරව චූදිතයා ගේ වරද ඔප්පු වී තිබේ දැයි තීන්දු කිරීමේ දී අධිකරණයේ සැලකිල්ලට ගත හැකි සාක්ෂි එයට අන්තර්ගත වෙයි. විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් කිරීමට ඇති අයිතිය ක්‍රියාවට යෙදවීමට අසමත් වීම ද වැදගත්කමක් අත් කර ගන්නා සිද්ධියකි.

83. එම., පිටු 56. විශාල පිරිසක් එක් රැස් වෙමින් සිටින බව සහ පියවරක් ගැනීමට අවශ්‍ය බව කරුණාසේන බොහෝ වේලාවකට පෙර මූලස්ථාන පොලිස් පරීක්ෂක ගේ අවධානය යොමු කර තිබූ බවට මුල දී කොමිසම තීන්දු කර තිබූ බව සැලකිල්ලට ගැනීම මෙහි දී වැදගත් ය. එවිට මහාධිකරණයේ ම තර්කය අනුව ම සලකා බලන කල කරුණාසේන ද චෝදනාවෙන් නිදෙස් වීමේ හැකියාව ඇති බව මෙයින් පෙන්නුම් කෙරෙයි. කෙසේ නමුත්, පැමිණිලි පාර්ශ්වය හෝ විත්තිය විසින් මහාධිකරණය ඉදිරියේ මෙම සාක්ෂි ඉදිරිපත් නො කළ අතර දිවුරුම් පිට කරුණාසේන කිසිසේත් ම සාක්ෂි දුන්නේ නැත.

ඉතිරි නිලධාරීන් සය දෙනාට සිදු වන්නේ කුමක් දැයි දැන ගැනීමට නො හැකි තරම් කඳවුරට ඈතින් සිටි බවට තීන්දු කරන ලදී. ඔවුන් රාජකාරියෙහි යෙදී සිටි තැනට 34, 35, 36, 38, 39, 40 යන විත්තිකරුවන්ට කඳවුර පැහැදිලිව නො පෙනුණ බව සනාථ වී ඇතැයි" විනිසුරුවෝ ලියති.[84] ඒ අනුව, ඔවුන් නීති විරෝධී ජන රාශියකට සම්බන්ධ වූ බව කිව නො හැකි ය.

කුතුහලය දනවන කරුණක්, නම් විශාල පිරිසක් කඳවුරට දිව ගිය ස්ථානයක් වූත් උසින් වැඩි වූත් පිහිටීම නිසා කඳවුරේ සිදු වන සෑම දෙයක්ම හොඳ හැටි පෙනෙන තැනක් වූත් විද්‍යාපීඨ ක්‍රීඩා භූමියේ සිටි බවට කොමිසම විසින් ම පැහැදිලිව ස්ථානගත කළ 38 වැනි සැකකරු වන උප පොලිස් පරීක්ෂක වල්පොල ද මෙම කණ්ඩායමට අයත් වීමයි.[85] කෙසේ වුව ද, යම් හේතුවක් නිසා පැමිණිල්ලේ ලිඛිත ප්‍රකාශයේ ඔහු රාජකාරියෙහි යෙදී සිටි ස්ථානය පිළිබඳව හෝ ඔහු ගේ සුවිශේෂ සාපරාධී භාවය පිළිබඳ ව සඳහන් කිරීමක් නැත. වෙනත් තැනක රාජකාරියෙහි යෙදී සිටි සෙසු නිලධාරීන් සය දෙනා සමඟ එකට වල්පොල සරල ව ම ඇතුළත් කරනු ලබයි. මෙයින් සමහර දෙනෙක් කිසිවක් කළ නො හැකි තරම් සිද්ධිය වූ ස්ථානයට බොහෝ දුරින් සිටි බවට ඇත්ත වශයෙන් ම කෙනෙකුට තර්ක කළ හැකි ය. (කෙසේ වුව ද, මේ කාරණය මගින් ඔවුන් සියලු දෙනාම වගකීමෙන් නිදහස් කෙරේ ද යන ප්‍රශ්නයට බඳුන් කළ හැක්කකි. මක්නිසාද යත්, පහර දීමේ හඬ සහ රැඳවියන් ගේ කෑගැසීම් ඇසී නො තිබීම ද ගිනි ගෙන දැවෙන ගොඩනැගිලි වලින් නැඟෙන දුම නො දැකීම ද යමක් සිදු වෙන බව නො දැන සිටීම ද නො සිදු විය හැක්කක් නිසා ය).

## 7. පිළිතුරු නො දුන් ප්‍රශ්න

නිල අප චර්යාවට සහ දෙමළ විරෝධී ප්‍රචණ්ඩත්වයට දඬුවම් පැමිණ වීම ගැන ඉතාමත් අවශ්‍යව තිබූ පූර්වාදර්ශයක් පිහිටු වන නිසා, තීන්දුව සහ සමස්ථයක් ලෙස නඩුව ද සාදරයෙන් පිළිගත යුතු නමුදු එය අනෙක් අතට පිළිතුරු නො දුන් ප්‍රශ්න රාශියක් හා නව ප්‍රශ්න මතු කරයි.

84. නඩු තීන්දුව, පිටුව 59.

85. කොමිෂන් වාර්තාව, පිටුව. 188. එමෙන් ම කොමිසම 35 වන විත්තිකාර උප පොලිස් පරීක්ෂක අබේනාරායන ප්‍රධාන දොරටුවෙහි සිටි බවට තහවුරු කරයි. පැමිණිල්ල අබේනාරායන ව නිශ්චිතව පිහිටුවන්නේ කොහිදැයි මෙම ලේඛකයාට ලබා ගත හැකි පියවිලි වලට අනුව පැහැදිලි නැත. නමුත් එය ප්‍රධාන දොරටුව නො වන බව පෙනෙන්නට තිබේ.

## 7.1 කරුණු සම්බන්ධ ප්‍රශ්න

1. පොලිස් නිලධාරීන් දෙදෙනා ගෙන් එක් අයෙකු වූ උප පොලිස් පරීක්ෂක රත්නායකට දඬුවම් නියම කිරීමේ පදනම පළමු ප්‍රශ්නය යි. මධ්‍යස්ථානයට ප්‍රහාරය එල්ල කළ කාලය තුළ ප්‍රධාන දෙරටුවේ රත්නායක රාජකාරියෙහි යෙදී සිටීම සම්බන්ධ අභිචෝදනයේ නඩුව ඇත්ත වශයෙන්ම විශ්මය ජනක ලෙස අවිනිශ්චිතය. රත්නායක හා දියතලාව පොලිස් ස්ථානයෙන් කඳවුර වෙත පැමිණි සෙසු පොලිස් නිලධාරීන් සමඟ පෙරවරු 6.45 ට පමණ කඳවුරට පැමිණි පොලිස් කොස්තාපල් එච්.එල්. කුසුම්පාල ගේ සාක්ෂියට අනුව ඔහු සහ කණ්ඩායමේ සෙසු අය කඳවුරට ඇතින් කඳවුරට මීටර් 50 ක් පමණ දුරින් පිහිටි කෘෂිකර්ම මධ්‍යස්ථානයට කඳවුරේ සිට දිවෙන මාර්ගයෙහි මැද රාජකාරියෙහි යොදවා සිටිනු ලැබී ය. කුසුම්පාල පවසන්නේ, කණ්ඩායමේ ඉතිරි අය සේවයේ යෙදවීමෙන් පසුව, කඳවුරට විරුද්ධ දිශාවෙන් පිහිටි එම මාවතේ ම දිගට ම බණ්ඩාරවෙල දිශාවට රත්නායක ගිය බවයි. කෘෂිකර්ම මධ්‍යස්ථානය අසල රාජකාරියෙහි යෙදී සිටිය දී කඳවුර දෙසින් කෑගැසෙන ශබ්දයන් ඇසුන බවත් රත්නායක "පහළට ගොස්" සිටි නිසා ඔහුව සම්බන්ධ කිරීමට නො හැකි වූ බවත් ඔහු අනතුරුව ප්‍රකාශ කළේ ය. නඩු වාර්තාවේ පිටපතට අනුව කුසුම්පාල මෙසේ ප්‍රකාශ කළේ ය. "රත්නායක" පාරේ පහළට ගියා. ඔහු ආපසු පැමිණෙතැයි මා බලාපොරොත්තු වුනා".[86] කෙසේ නමුත් "පාරේ පහළට ගියා" කීමෙන් අදහස් කරන්නේ කුමක් දයි අපැහැදිලි ය. ඉන් අදහස් කෙරෙන්නේ රත්නායක කඳවුර දිශාවට ගිය බව ද? කෑගැසීම් ඇසීමට පෙර? එසේ නම් ඇයි මෙය පැහැදිලිව ප්‍රකාශ නො කර ඇත්තේ? විද්‍යාපීඨ භූමියේ ඒ අවස්ථාවෙහි සිටි කරුණාසේන සහ රත්නායක යන දෙදෙනාම හමුවූ බිඳුණුවැව කඳවුරට ඔහු පෙරවරු 6.30 ට පමණ පැමිණි බව දෙවන සාක්ෂිකරු

86. මහාධිකරණ නඩු අංක. 763/2002, මුල් නඩු වාර්තාව, පිටු 860-886.

වන, පොලිස් කොස්තාපල් ටී.එම්. ගුණපාල ප්‍රකාශ කරයි.[87] ප්‍රහාරය සිදු වන අවස්ථාවෙහි රත්නායක සිටියේ කොහි දැයි ඔහු ප්‍රකාශ නො කරයි.[88]

අප නිශ්චිත ව දන්නා කරුණක් වන්නේ, ප්‍රහාරයෙන් පසු ව රත්නායක ප්‍රධාන දෙරටුවෙහි සිටි බවයි. සමහර විට පෙරවරු නවයෙන් පසු ව, තුවාලකරුවන් සහ සමහර විට මළසිරුරුත් පොලිස් ට්‍රක් රථයට පටවන අවස්ථාවෙහි ඔහු සිටියේ ය. පොලිස් ඡායාරූප ශිල්පියෙකු විසින් ගත් ඡායාරූප වලින් සහ ඇසින් දුටු සාක්ෂිකරුවෙකු වූ පොලිස් කොස්තාපල් ආර්.ඩී. මංගලසිරි විසින් රත්නායක සහ කරුණාසේන හඳුනා ගැනීම මගින් මෙය තහවුරු වූ බව අපි දනිමු. මෙම ඡායාරූප මගින් කොතරම් දරුණු ලෙස වැරැද්දට ඇඟිල්ල දික් කළේ වී නමුත් ගොදුරු වූවන් ගේ සිරුරු බිම පතිත වී තිබිය දී, පොලු මුගුරු ඔසවා ගත් විශාල ගම්වැසියන් පිරිසක් අසල පහසුවෙන් සිට ගෙන සිටින පොලිස් නිලධාරීන් ඒවායින් පෙන්නුම් කරයි. මෙම ඡායාරූප ගෙන ඇත්තේ ප්‍රහාරයෙන් පසුව ය. එම නිසා ප්‍රහාරය ආරම්භ වන විට රත්නායක සිටියේ කොහි දැයි සම්බන්ධයෙන් ඒවා අපට කිසිවක් නො කියයි. එමනිසා අපැහැදිලි කරුණ නම්, රත්නායක ප්‍රධාන දෙරටුවෙහි හෝ වෙනත් මූලෝපායාත්මක ස්ථානයක සිටීම සම්බන්ධ ව වඩා බලගතු නඩුවක් ඉදිරිපත් කිරීමට පැමිණිල්ල අසමත් වූයේ මන් දැයි යන්න ය. රත්නායක ප්‍රධාන දෙරටුවෙහි සිටි බව ගැන කොමිසම නිසැකව ම ඒත්තු ගෙන තිබුණි.[89] කොමිසමේ සාක්ෂි විමසීමේ දී රත්නායක ගේ සහායකයන් ගෙන් කෙනෙකු වූ උප පොලිස් පරීක්ෂක වල්පොල, ප්‍රහාරය ආරම්භයේ දී රත්නායක ප්‍රධාන දෙරටුවෙහි බව ප්‍රකාශ කළේ ය. මහාධිකරණ නඩුවේ දී අභිචෝදනයේ සාක්ෂි එතරම් ම නො පැහැදිලි වීම

---

87. එම., පිටු 886-929.

88. සාක්ෂිකරුවන් දෙදෙනා ගේ සාක්ෂිවල අවශ්‍යයෙන් ම භෞමික නො ගැලපීමක් සිදු වී නැත. කුසුම්පාල කෘෂිකර්ම මධ්‍යස්ථාන අසල තබා, බණ්ඩාරවෙල දෙසට ගොස්, පසුව විද්‍යාපීඨ භූමියට පැමිණි අතර එසේ කිරීමේ දී කුසුම්පාල පසු කර ගෙන නො ගිය බව කරුණාසේන සම්බන්ධයෙන් සිදුවීමට බොහෝ විට ඉඩ තිබේ. ගුණපාල ඔවුන්ව පිහිටු වන ප්‍රධාන දෙරටුවට විද්‍යාපීඨ භූමියේ සිට යාමට කරුණාසේන සහ රත්නායක යන දෙදෙනාට ම සෘජු මාර්ගයක් තිබෙන්නට ඇත. රැඳවියන්ට පහර දීමේ දී ඇත්ත වශයෙන් ම කලහකාරී පිරිසෙන් වැඩි දෙනෙකු පැමිණි මාවත මෙය යි.

89. එම.,

අවාසනාවන්තය. මක්නිසාද, යත් තමන්ට දඬුවම් කරනු ලැබීම ආසාධාරණ බව රත්නායක සහ ඔහු ගේ ආධාරකරුවන්ට පැවසීම සඳහා හේතු කොතරම් අවිනිශ්චිත වුවත් සැපයීම මගින් එය (සාක්ෂිවල අපැහැදිලිකම) දඬුවමේ මහජන නීත්‍යනුකූලත්වය සහ සමහර විට නීතිමය යුක්ති යුක්තභාවය ද ප්‍රශ්නයට භාජනය කරන හෙයිනි.

02. පැම්ණිල්ල විසින් මත් ඡායාරූප සාක්ෂි යොදා ගැනීම වැදගත් ප්‍රශ්න ගණනාවක් මතු කරයි. ප්‍රහාරය අවසාන වූ පසු ඡායාරූප ගෙන තිබූ බව මෙන් ම ඒවා සුවිශේෂ අපරාධයන්ට සම්බන්ධයක් නො පෙන්වන බව පැම්ණිල්ල පිළිගනියි. එහෙත් ඡායාරූප ඉදිරිපත් වීමේ පැහැදිලි අරමුණ වූයේ උසාවියට ඉදිරිපත් කරන ලද ඡායාරූපවල විශාල වශයෙන් දක්නට ලැබුණු ප්‍රහාරයකි. මැර කණ්ඩායම සම්බන්ධයෙන් කරුණාසේන සහ රත්නායක තුළ පැවති ආකල්පය ද ඔවුන් ගත් (හෝ නො ගත්) පියවරයන් ද ගැන උසාවියේ මතයට බලපෑම් ඇති කිරීමයි. ඔවුන් ගේ තීන්දුවේ දී, ඡායාරූප ගැන සඳහන් නො කෙරුණු නමුත් ඡායාරූප බැලීමෙන් රත්නායක රාජකාරියෙහි යෙදී සිටි ස්ථානය ගැන උසාවියේ නිගමන වලට බලපෑමක් ඇති කළා විය හැකි ය. මෙහි දී තවත් ප්‍රශ්න මාලාවක් මතු කෙරෙයි. සාක්ෂි වලට ඡායාරූප ඉදිරිපත් කළේ සන්නද්ධ ප්‍රහාරකයන් පොලිස් නිලධාරීන් අතර කඳවුර තුළ තවමත් නිදහසේ සැරිසරමින් සිටිය දී පවා ප්‍රහාරය තුළ දී පොලිසිය පියවරක් නො ගත් බව පෙන්වීමට නම්, මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ සහකාර පොලිස් අධිකාරි ඡායාරූප ගත් අවස්ථාවේ දී පැහැදිලිව ම සිටි බව ඔවුන් ගේ ම සාක්ෂි වලට අනුව ම වුව ද ඡායාරූප වලින් පැහැදිලිව ම ඇණවුම් කෙරෙයි. එපමණක් නොව, වඩා හොඳ මුල් ඡායාරූප සහිත දළ සේයා පට සම්පූර්ණ රෝල ම ඉදිරිපත් නො කළේ ඇයි? පොලිස් ඡායාරූප ශිල්පී පී.ඒ. කුරුකුලසූරිය ගේ සාක්ෂි මත පදනම්ව, ගනු ලැබූ ඡායාරූප සියල්ල ම සාක්ෂි ලෙස ඉදිරිපත් නො කළ බව අප දන්නා අතර ඉදිරිපත් කරනු ලැබූ ඡායාරූප මුල් ඡායාරූප වලින් කොපි කළ ඒවා මිස දළ සේයා පට වලින් ගත් මුල් පිටපත් නො වන බව ද අපි දනිමු. දෙවන තෙගට්ව් ඡායාරූප පට කපා, සමහර ඡායාරූප පමණක් සාක්ෂි වලට

ඉදිරිපත් කරනු ලැබී ය. නැති වූ තෙගට්ටි වලින් පෙන්වනු ලැබුයේ කුමක් ද නැතහොත් කවුද?[90]

03. කරුණු සම්බන්ධයෙන් ගත් කල වඩාත් තීරණාත්මක ප්‍රශ්නයට මෙ මගින් අප යොමු කරවයි. **මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ සහකාර පොලිස් අධිකාරීට එරෙහිව චෝදනා ගොනු නො කළේ ඇයි?** කොමිසමේ තීන්දු මත සහ පසු ගිය වසර දෙක පුරා කළ ස්වාධීන පරීක්ෂණයේ දී සාක්ෂිකරුවන් ගෙන් ලබා ගත් සම්මුඛ සාකච්ඡා මත පදනම් ව, ප්‍රහාරය ආරම්භයේ සිට ම සිද්ධිය වූ ස්ථානයෙහි සිටි බවට නිලධාරීන් දෙදෙනාට ම එරෙහිව බලගතු නඩුවක් ගොනු කළ හැකි ව තිබුණ බව පෙනෙන්නට තිබේ. නමුත්, අවම වශයෙන් ගත් කළ ප්‍රහාරය ආරම්භ වූ වහාම ඔවුන් විවිධ අපරාධ වලට සම්බන්ධ වූ බවට චෝදනා ඉදිරිපත් කිරීම සඳහා සාක්ෂි තිබේ. අත්අඩංගුවට ගැනීම් නො කිරීම මගින් පැහැදිලිව ම රාජකාරිය පැහැර හැරීම, ප්‍රධාන දොරටුවෙහි නවතා තිබූ පොලිස් ට්‍රක් රථයෙහි සිටි රැඳවියන් ඝාතනය වීමට ඉඩ හැරීම, සමහර රැඳවියන්ට වෙඩි තැබීමට ඉඩ හැරීම සහ මහේස්ත්‍රාත්වරයා පැමිණ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීමට පෙර මළ සිරුරු ඉවත් කිරීමට සම්බන්ධ වීම මගින් සාක්ෂි යටපත් කිරීම මෙයට ඇතුළත් වනු ඇත. විශේෂයෙන් මෙම අවසාන අපරාධය අධිකරණ තීන්දුවේ දී උපුටා දක්වන නමුත් මළ සිරුරු ඉවත් කිරීමට නියෝග කළේ ඔහු බවට සහකාර පොලිස් අධිකාරි ගේ පිළිගැනීම තිබිය දී ම ඒ වෙනුවට

90. අස්ථානගත වූ ඡායරූප මූලස්ථාන පොලිස් පරීක්ෂක හෝ සහකාර පොලිස් අධිකාරි ගේ පැමිණීම එළිදරව් කරනු ලැබිය යුතුව තිබුණේ යැයි කීමට කරුණාසේන සහ රත්නායක ගේ ආධාරකරුවෝ හදිසි වෙති. ඡායාරූප සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අසාමාන්‍ය වූ නිසා කාරණය මෙය දැයි නිශ්චිතව කිසිසේත්ම දත ගැනීමට නො හැකි වනු ඇත.

කරුණාසේනට චෝදනා කරයි.[91] ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට විරුද්ධ එලෙස චෝදනා ගොනු නො කළේ ඇයි? එය එසේ වූයේ රජයේ නීතිඥයින් ගෙන් අයෙක් සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රකාශ කළ පරිදි ඔවුන්ට විරුද්ධ ව චෝදනා නැති නිසා ද?[92] ඔවුන්ට එරෙහි ව කිසිවෙක් සාක්ෂි දී නො තිබුණි ද? කරුණාසේන සහ සෙසු අය කොමිසම ඉදිරියේ සාක්ෂි දීමේ දී නිශ්චිතව ම එසේ කර තිබුණි. දන් මූලස්ථාන පොලිස් පරීක්ෂක ජයන්ත සෙනෙවිරත්න කොයි අතින් බැලුවත් සැලකිය යුතු උසස්වීමක් වූ කොටුව පොලිසියේ රථවාහන අංශයේ සහකාර පොලිස් අධිකාරි වීම බණ්ඩාරවෙල ප්‍රදේශයේ බොහෝ දෙනා අතර සැකයට තුඩු දී තිබේ. (සහකාර පොලිස් අධිකාරී දයාරත්න දන් විශ්‍රාමිකය.)

මෙයට සමීපව ම අදළ වන්නේ, කරුණාසේන සහ රත්නායක වෙනුවෙන් පෙනී සිටි විත්තියේ නීතිඥයන් විසින් **හරස් ප්‍රශ්න ඇසීම මගින් මූලස්ථාන පොලිස් පරීක්ෂක ගේ සහ සහකාර පොලිස් අධිකාරි ගේ ස්ථාවරයට අභියෝග කිරීමට අසමත් වීම ය.** විත්ති කූඩුවේ දී ඔවුන් ගේ බොහෝ දුර්වල මැදිහත් වීම් අවසන් වන තුරු නො සිට දිවුරුම් දීම යටතේ ඔවුන් සම්බන්ධව සාක්ෂි දීමට සහ ප්‍රකාශ කිරීමට කරුණාසේනට සහ රත්නායකට ඉඩ නුදුන්නේ ඇයි? එය එසේ වූයේ ඔවුන් ගේ ඓතිහාසික වාර්තාව සහ ඔවුන් ගේ සේවා දයකයින්ට විරුද්ධ නඩු දුර්වල යැයි යන සිතුවිල්ල මත පදනම්ව, චෝදනා වලින් පොලිසිය නිදහස් කරනු ඇති බවත් එම නිසා එවන් සාක්ෂි දීම මගින් ඇති කෙරෙන ප්‍රතිඵලවල

---

91. විනිශ්චය සභාව මෙසේ ලියයි. "පොලිසිය, මළ සිරුරු ට්‍රක්වල පටවා ප්‍රවාහනය කර තිබිණ. මෙය විනිශ්චයකාර මණ්ඩලය තීන්දු කළේ නීති විරෝධී ක්‍රියාවන් ලෙස හා ඕනෑකමින් ම සාක්ෂි විකෘත කිරීමේ ක්‍රියාවක් ලෙස ය". පොලිසිය මෙම ක්‍රියාවලියට (එනම් සාමූහික මනුෂ්‍ය ඝාතනයට) සහයෝගය නුදුන්නේ නම් ඔවුන් කළ යුතුව තිබුණේ මහේස්ත්‍රාත්වරයා විසින් පශ්චාත් මරණ පරීක්ෂණය පවත් වන තුරු මළසිරුරු තිබුණ ආකාරයට තිබෙන්නට හැරීම යැයි උසාවිය ලිවිය. (පි. 21) මෙය කරුණාසේන පිළිබඳ අභිචෝදනාවේ කොටසක් බවට උසාවිය ප්‍රකාශයට පත් කරයි. නමුත් එය පැහැදිලිව ම ඊටත් වඩා හොඳට සහකාර පොලිස් අධිකාරිට සහ මූලස්ථාන පොලිස් පරීක්ෂකට අදළ වෙයි. මළ සිරුරු ඉවත් කිරීමේ ඔහු ගේ (මූ. පො. ප. - පරිවර්තක) තීරණය පිළිබඳව සහකාර පොලිස් අධිකාරී අවසර දීම සම්බන්ධයෙන් බලන්න. නඩු වාර්තාවේ පිටු 631-3 සහ පැමිණිල්ලේ ලිඛිත ප්‍රකාශය පිටුව 9. කෙසේ වෙතත්, අනෙකුත් මූලාශ්‍ර පවසා සිටින්නේ තුවාලකරුවන් රෝහලට ගෙන ගියේ ද මළ සිරුරු එකතු කර ඉවත් කළේ ද හමුදව පැමිණීමෙන් පසුව බව ය.
92. කතුවරයා සමඟ පුද්ගලික සම්මුඛ සාකච්ඡාව.

අවදානම (අඩුතරමින් පොලිස් නිලධාරීන් ලෙස ඔවුන් ගේ වෘත්තිය) නො ගත යුතු යැයි ඔවුන් ගේ නීතිඥයන් උපකල්පනය කළ නිසා ද? ප්‍රහාරය සිදු වූ දින බොහෝ කල්වේලා ඇතිව ම කඳවුර තුළ සහකාර පොලිස් අධිකාරී සිටි බවට කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම්, සාක්ෂිකරුවෙකු ලෙස ඔවුන් නො කැඳ වූයේ ඇයි? කරුණාසේන ගේ සහ රත්නායක ගේ නීතිඥයන්, කඳවුරේ මැර ප්‍රහාරය ගැන ඔහු ගේ අවධානය යොමු කළේ ජයරත්න බවට හුදෙක් මූලස්ථාන පොලිස් පරීක්ෂක දුන් සාක්ෂියේ පදනම මත වරදකරු කිරීමෙන් නිදහස් වූ ජයරත්න ගේ ද නීතිඥයන් වූයේ ය යන කාරණාව මෙම තීන්දු වලට එක් හේතුවක් ලෙස සැලකිය හැකි ද?[93]

04. **පලායමින් සිටි රැඳවියන්ට වෙඩි තැබීම** පිළිතුරු වලට වඩා ගැටලු ඉස්මතු කරන තවත් ප්‍රධාන කාරණාවකි. වෙඩි තැබීමෙන් මරණයට පත් වූ රැඳවියා ගේ සිරුරේ වෙන් වෙන් උණ්ඩ කුනකින් සිදුවූ උණ්ඩ තුවාල හයක් තිබිණ. ඉන් එකක්වත් සාක්කි වලට ඉදිරිපත් නො කළේ ඇයි? පශ්චාත් මරණ පරීක්ෂණය කළ උප අධිකරණ නිලධාරි වූ කේ. කේ. ජුව්සීර් ගේ සාක්කියට අනුව ඇය වෙඩි උණ්ඩ තුන පරීක්ෂණ නිලධාරියෙකුට දුන් අතර පසුව ඇයට ඔහු හඳුනා ගැනීමට නොහැකි විය.[94] මෙය නෛතික පටිපාටිය උල්ලංඝනය කිරීමකි. උණ්ඩ සොයා ගැනීමට නොහැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඒවා නිශ්චිත තුවක්කුවකින් නිකුත් වූ ඒවා යැයි හෝ මෙම තුවක්කු නියමිත පොලිස් නිලධාරියෙකු අත තිබූ තුවක්කු යැයි නිගමනය කිරීමට නොහැකි විය. නඩු විභාගය අවසාන වෙමින් තිබිය දී T 56 රයිපල් තුනක් සහ විවිධ වෙඩි උණ්ඩ සාක්ෂි වලට ඉදිරිපත් කිරීමට පැමිණිල්ල උත්සාහ කළේ ය. නමුත් විනිශ්චයකාරවරුන් ගේ හරස් ප්‍රශ්න ඇසීම යටතේ, සුවිශේෂ පොලිස් නිලධාරීන්ට සම්බන්ධ කරමින් රයිපල් සහ වෙඩි

---

93. මූලස්ථාන පොලිස් පරීක්ෂක පෙ.ව. 8 වන විට කඳවුරට පැමිණ සිටි බවට කරුණාසේන විත්ති කූඩුවේ දී කළ ප්‍රකාශය කරුණසේන සහ රත්නායක වෙනුවෙන් පෙනී සිටි නීතිඥයන් ඔවුන් ගේ ලිඛිත ප්‍රකාශයේ 12 වන පිටුවේ යළි සඳහන් කර තිබීම මෙහි දී සැලකිල්ලට ගැනීම වැදගත් ය. කඳවුරට ප්‍රහාරයක් එල්ල වෙමින් තිබෙන බවට පොලිස් පරීක්ෂක ජයරත්නගෙන් මූලස්ථාන පොලිස් පරීක්ෂකට දුරකථන පණිවුඩයක් ලැබුණේ 8.30 ට පමණක් ම යැයි මූ. පො. ප. දුන් සාක්ෂිය ඒ සමගම ඔවුන් විසින්ම යොදා ගැනීම සමඟ මෙය පරස්පර විරෝධී වෙයි.

94. කොමිෂන් වාර්තා, 17, 2001 මැයි.

උණ්ඩ සම්බන්ධව කිසිදු පැහැදිලි, පිරිසිදු සාක්ෂිදමයක් ආණ්ඩුවේ විශ්ලේෂකයාට පෙන්වීමට හැකි වූයේ නැත. එම නිසා සාක්ෂි ඉදිරිපත් කිරීමට අවසර දීම විතිශ්චයකාරවරු ප්‍රතික්ෂේප කළහ. කවුරු විසින් කවර තුවක්කුවක් පාවිච්චි කළේ දැයි ඔවුන්ට දැන ගැනීමට නො හැකි වූ බව පැමිණිල්ලේ ලිඛිත ප්‍රකාශයේ දී ප්‍රකාශ කරයි.[95] නමුත් මෙය සත්‍ය ද? එසේ නම් ඒ ඇයි? මේ සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් පැවතුණේ නැති ද? සිද්ධිය වූ ස්ථානයෙන් සොයා ගත් පාවිච්චි කළ වෙඩි උණ්ඩ සාමාන්‍ය වර්ගයේ තුවක්කු වලට මිස නිශ්චිත තුවක්කු වලට ගැලපීමට නො හැකි බව නීතිපති දෙපාර්තමේන්තුවේ එක් නිලධාරියෙකු විස්තර කළේ ය. නමුත් එය එසේ නම් මෙම තුවක්කු තුන සාක්ෂි වලට ඉදිරිපත් කිරීමට උත්සාහ කළේ ඇයි?[96] මේ සියල්ලම තීරණාත්මක ගැටලු ය. නමුත් කිසියම් පරීක්ෂණයක් සිදු කෙරුණා නම් ඒ කවර වර්ගයේ පරීක්ෂණ ද? ඒවා කරන ලද්දේ කවු ද යන්න ප්‍රසිද්ධියේ විස්තර කෙරී නැත.

## 7.2 නීතිය, පටිපාටිය සහ සාධාරණත්වය පිළිබඳ ගැටලු

1. **නීති විරෝධී ජන රාශිය පිළිබඳව ඔවුන් පාර්ශවකරුවන් කළ නීති විරෝධී පැහැර හැරීම සම්බන්ධ අධිචෝදනා ඉදිරිපත් කිරීමේ සාධාරණත්වය** කරුණාසේන සහ රත්නායක ගත් පොදු ආරක්ෂණ තර්කයයි. සහායකයන් විසින් ආරක්ෂාව පිළිබඳ ගත් පොදු පිළිවෙත අභියෝග කළ යුතු ව තිබුණි. යමෙකු මිනී මැරීම සහ මිනී මැරීමට තැත් කිරීම පිළිබඳ වරදකරුවෙකු කිරීමට නම් සුවිශේෂ පුද්ගලයන් විසින් කළ සුවිශේෂ ක්‍රියාවන් පිළිබඳ ඍජු සාක්ෂි අවශ්‍ය වෙයි. එසේ නො ව ඔවුන් හුදෙක් නියෝග පිළිපදිමින් සිටි බවට පළමුව තර්ක කෙරෙයි. දෙවනුව මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ සහකාර පොලිස් අධිකාරි ඔවුන්ට ප්‍රමාණවත් සම්පත්, කැරලි මර්දන උපකරණ, රබර් උණ්ඩ, කඳුළු

95. "පාවිච්චි කළ තැනැත්තා ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට නො හැකි වූ නිසා සැක කටයුතු ආයුධ වලට සම්බන්ධ කාරණය ලුහුබැඳ යාමට පැමිණිල්ලට ද නො හැකි විය." පැමිණිල්ලේ ලිඛිත ප්‍රකාශ පිටුව 34.

96. පොලිස් නිලධාරීන් තිදෙනෙකු ඔවුන් ගේ තුවක්කු වලින් වෙඩි තැබූ බව පරීක්ෂණ කොමිසමේ වාර්තාව ප්‍රකාශ කරයි. නමුත් එය මෙම කාරණාව තමා දන්නේ කෙසේදැයි හෝ ඒවා කාගේ තුවක්කු දැයි එය නො පවසයි.

ගෑස් හෝ අවශ්‍ය තරම් මිනිස්සු ලබා නො දුන් නිසා පිරිස පාලනය කිරීමට නො හැකි වූ බවට තර්ක කෙරෙයි.[97] පිරිස පාලනය කිරීමට ඔවුන්ට නො හැකි වූ බවට ඉදිරිපත් කරන තර්කයේ සත්‍යාසත්‍යභාවය තීන්දු කළ හැක්කේ එක්තරා ප්‍රමාණයකට පිරිසේ සිටි සංඛ්‍යා ව අනුව හා කීදෙනෙක් ඇත්ත වශයෙන් ම ආයුධ සන්නද්ධ ව සිටියේ ද යන්න මත ය. බොහෝ දෙනෙකු ගේ සාක්ෂි අනුව එහි සිටියේ මිනිසුන් 2000-3000 පමණ දෙනෙකි. එහෙත් අදාළ ස්ථානයේ ඉඩකඩත් පැහැදිලිව ම සම්පූර්ණ පිරිස ම කඳවුරට ඇතුල් නො වීමත් සියලු දෙනාම ආයුධ සන්නද්ධ නො වීමත් නිසා මෙම ගණන් හිලව් අතිශයෝක්තියක් බව පෙනෙන්නට තිබේ. එපමණක් ද නොව ප්‍රහාරකයින් ගෙන් කිසිවෙකු ගිනි අවි දරා සිටියේ ද නැත. තම සේවාදයකයින් වෙනුවෙන් ජනාධිපති නීතිඥ දයා පෙරේරා තර්ක කළේ මෙම නඩුවට අදළ එක් ස්ථාපිත නීතිමය සිද්ධාන්තයක් පවතින බවයි. එනම්, පොලිසියේ ක්‍රියාකාරීත්වය හෝ අක්‍රියාකාරීත්වය පිළිබඳ අධිචෝදනයේ අර්ථ කථනය,-එනම්, නීති විරෝධී ජන රාශිය පිළිබඳ පොදු අරමුණ පොලිසියට ද තිබූ බව - එවැනි අක්‍රියකාරීත්වය සැලකිල්ලට භාජනය කිරීමේ දී බැස ගත හැකි <u>එකම</u> සහ <u>අවශ්‍ය</u> වූ නිගමනය බවයි. ඔහු තර්ක කළේ මේ අවස්ථාවේ දී මෙම ප්‍රමිතිය නො පවතී. මක්නිසාද යත් බැස ගත හැකි වෙනත් විකල්ප නිගමන පවතින හෙයිනි. උදහරණ වශයෙන්, පොලිසිය බියෙන් පීඩිත ව සිටීම. එසේත් නැත්නම් තමන්ට ඇති තරම් සම්පත් නොමැතිකම නිසාත් විශාල ජන රාශිය තමන්ට පහර දේවි ය යන බිය නිසාත් ඔවුන් ට වෙඩි තැබීමට ඔවුහු බෙහෙවින් තැති ගත් හ. ඔවුන් හුදෙක් නියෝග පිළිපදිමින් සිටීම හෝ ඔවුන් ගේ අභිමතාර්ථය තිබිය දී ම පිරිස පාලනය කිරීමට ඔවුන් අසමත් වීම පිළිබඳ පොලිස් නිලධාරීන් ගේ ප්‍රකාශයන් දෙකින් එකක් සඳහා යුක්ති සහගත හේතු තිබේ නම් නීති විරෝධී රංචු ගැසීමක සාමාජිකයන් ලෙස ඔවුන්ට චෝදනා ඉදිරිපත් කිරීමේ සාධාරණත්වය සැලකිය යුතු ලෙස දුර්වල කරනු ලබයි.

---

97. පොලිසිය කඳුළු ගෑස් වලින් සන්නද්ධ ව සිටි බව තම තීන්දුවේ 42 පිටුවේ දී උසාවිය ප්‍රකාශ කරයි. නමුත් ප්‍රහාරයෙන් පසුව බණ්ඩාරවෙල පොලිස් ස්ථානයෙන් ගෙන්වා ගෙන පොලිස් බලඇණිය යළි ශක්තිමත් කරන තුරු කඳුළු ගෑස් ලබා ගැනීමට නො හැකි වූ බව කොමිෂන් වාර්තාවේ මතය බව පෙනෙන්නට තිබේ.

2. පළමු ප්‍රශ්නය දෙවැනි ප්‍රශ්නයත් හා ක්ෂණිකව ම සම්බන්ධ වෙයි. එනම්, මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ සහකාර පොලිස් අධිකාරි ගේ සම්බන්ධ වීමේ ප්‍රමාණය පරීක්ෂා කිරීමට අසමත් වීම සම්බන්ධ ප්‍රශ්නයයි. ඔවුන් මොන වෙලාවක සිද්ධිය වූ ස්ථානයට එන්න ඇතැයි යමෙකු විශ්වාස කළත් මූලස්ථාන පොලිස් පරීක්ෂක ගේ සහ සහකාර පොලිස් අධිකාරි ගේ පැහැදිලි සම්බන්ධ වීම හේතු කොට ගෙන නඩු තීන්දුවේ සාධාරණත්වය පැහැදිලිව ම අඩු කරයි. උසාවියේ අරමුණ වූයේ කඳවුර ආරක්ෂා කිරීම ක්‍රියාශීලීව භාර ව සිටි පුද්ගලයින්ට දඬුවම් කිරීම නම් මූලස්ථාන පොලිස් පරීක්ෂක සෙනෙවිරත්නට සහ සහකාර පොලිස් අධිකාරි දයාරත්නට දඬුවම් පැමිණ වීමේ විකල්පය ඔවුන්ට නො තිබීම එවිට පැහැදිලිව ම ගැටලුවකි. අනෙක් අතට අධිකරණයේ අරමුණ වූයේ මැර කණ්ඩායමට ඔවුන් ගේ කටයුත්ත කිරීමට ඉඩ සලසා දුන් පුද්ගලයින්ට දඬුවම් කිරීමට නම් එවිට මරණීය වෙඩි තැබීම් කළේ කවු ද නැතහොත් පොලිස් ට්‍රක් රථය තුළ දී ඝාතනයන් සිදු කිරීමට අවසර දුන්නේ කවුද වැනි, සිද්ධියකට සම්බන්ධිත නිශ්චිත ක්‍රියාවන් පිළිබඳව වඩාත් සුවිශේෂ සාක්ෂි ලබා ගැනීම වඩා සුදුසු විය හැකි ව තිබිණි. පොලිස් නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කිරීම ඒ ආකාරයට සිදු වීමට, එනම්, නීති විරෝධී ජන රාශියේ පොදු අභිප්‍රායෙහි කොටස්කරුවන් වීම මගින් ද වගකීම පැහැර හැරීම පිළිබඳව වීම මගින් ද පොලිසිය අන් අය ගේ වගකීම බෙද හද ගත්තේ යැයි චෝදනා කිරීම ලෙසට එය සිදුවීමට එක් හේතුවක් වූයේ නිශ්චිත පුද්ගලයින් නිශ්චිත අපරාධ වලට සම්බන්ධ කිරීමට සාක්ෂි නො තිබීම නිසා ය. එහෙත් යුක්තිය ඉටු කිරීමේ මාවත මෙය නම්, ඒ ඒ නිලධාරීන් ස්ථානගත වී සිටි ආකාරය ගැන වඩා බලවත් සාක්ෂි සතුව සිටීම වඩා උචිත විය හැකිව තිබිණි. අධිචෝදනය ඉදිරිපත් කළ සිද්ධි වාර්තාව සත්‍ය නම් පිරිසට කඳවුරට ඇතුල්වීමට ඉඩ දීම මගින් නීති විරෝධී අතපසු කිරීමක් කළේ කරුණාසේන සහ රත්නායක පමණක් නො වන බව පෙනී යයි.[98]

3 අවසාන වශයෙන්, බොහෝ චූදිතයින්ට එරෙහිව සාපේක්ෂ වශයෙන් දුර්වල සාක්ෂි ද සහිත ව නමුත් වඩාත් ම බරපතල අපරාධවලට මිනිමැරීම සහ මිනිමැරීමට තැත් කිරීම පමණක් නඩු පැවරීමේ අධික

98. උදහරණ වශයෙන්, වල්පොලට එරෙහි වඩා බලගතු සාක්ෂි ඉදිරිපත් නො කළේ ඇයි?

අවදනමක් සහිත වූ අභිචෝදනයේ මූලෝපාය ගැන මූලික ගැටලු මෙම කරුණු මගින් ඉස්මතු නො කෙරෙයි. පසු ව ඇති කර ගන්නා වැටහීම මගින් කිව හැක්කේ මෙය ඥණාත්මක ම මූලෝපාය නො විය හැකි බවයි. එලෙස ම සාක්ෂි යටපත් කිරීම, පිරිසට උපකාර කිරීම සහ අනුබල දීම, රාජකාරිය පැහැර හැරීම වැනි, ඉහත යෝජනා කළ අනෙකුත් සුළු චෝදනා ඉදිරිපත් කිරීම උචිත යැයි පෙනී නො ගියේ ද? මෙහි දී සමහර විට උසාවියට අවස්ථාවක් ලබා දුන හොත් මිනීමැරීම සහ මිනී මැරීමට තැත් කිරීම මත නොව මෙම අල්පතර චෝදනා මත දඬුවම් පැමිණ වීමට අධිකරණය නැඹුරු වනු ඇතැයි ඔවුන් බිය වූවා විය හැකි ය. චෝදනා ඉදිරිපත් කිරීමේ දී කරන ලද ගණන් බැලීම, දඬුවම් පැමිණවීමේ ස්වරූපයන් අධිකරණය තුළ දිනා ඇති නමුදු අභියාචනයේ දී එය එසේ ම තහවුරු වේ ද යන්න තාමත් අවිනිශ්චිත ය. මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ සහකාර පොලිස් අධිකාරී නිරුපද්‍රිත ව සිටිද් දී අනියම් සාක්ෂි මත සමහර නිලධාරීන්ට මරණ දඬුවම දීම මගින් නිකුත් කෙරෙන පණිවිඩය සාමකාමී ජනවාර්ගික සම්බන්ධතාවන්ට හෝ විධිමත් අධිකරණ පද්ධතියක් ගැන විශ්වාසයක් ඇති කිරීමට කිසිසේත් ම හිතකර වන්නක් නො වේ. එහෙයින් ඉහත කී මූලෝපායන් වෙනුවෙන් ගෙවීමට සිදු වී ඇති වන්දිය අධික ය.

## 8. දේශපාලන ආදීනව සහ පාඩම්

නවූ තීන්දුව පිළිබඳ මූලික ව්‍යාකූලත්වය ද, ආත්තික දඬුවම් සහ නවූ තීන්දුව අසාධාරණ බවට පළල් ව පැතිරුණු හැඟීම් ද ලබා ගත හැකි සියලු සාක්ෂි පිළිබඳ ව සම්පූර්ණ සහ සත්‍ය ප්‍රකාශයක් තහවුරු කිරීම වෙනුවට, ලබාගත හැකි සෑම සාක්ෂියක් ම පූර්ණ ව හා නිවැරදි ව ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා පරීක්ෂණාත්මක, අධිකරණමය සහ සිවිල් සමාජ යාන්ත්‍රණයකින් තොර ව මානව හිමිකම් පැමිණිලි ඉල්ලා සිටීමේ දේශපාලන අවදනම පෙන්වා දෙයි. විශේෂයෙන් ම පොලිසිය සහ උඩරට සිංහලයන් අතර නවූ තීන්දුව පිළිබඳ ව ඇති වූ බලගතු නිෂේධනීය ප්‍රතිචාරය කණගාටුදායක ය. සාධාරණ වේවා හෝ නො වේවා, නවූ තීන්දුව තුළ බොහෝ මිනිසුන් දුටු පණිවිඩය වූයේ, ලොකු තැන්වලට අත නො තබා (සහ කොටින් තමන්ට කැමති පරිදි සටන් විරාමය උල්ලංඝනය කරද්දී) සාමාන්‍ය සිංහල ගම්මුන් සහ පොලිසිය දඬමීමුන් බවට පත් කරනු ලැබ

තිබේ ය යන්නයි. ඒ අනුව, දේශපාලන හේතූන් නිසා සමහර පුද්ගලයන් මත වගකීම පැවරිය යුතු නමුත්, වෙනත් වර්ගයක දේශපාලන හේතූන් නිසා ඉහළ අය ඔවුන් අතරට අයත් නො වන බවටත් එය නිකුත් කරන අපැහැදිලි පණිවිඩය නිසා, ජනවාර්ගික සාධාරණත්වය පිළිබඳ නිකුත් කිරීමට බලාපොරොත්තු වූ පණිවිඩය කවරාකාරයේ සාධනීය එකක් වූවත් ඇත්ත වශයෙන් ම එය යටපත් කරනු ලබයි. බිඳුණුවැව නඩුවෙන් යමක් සනාථ කරයි නම්, කරන්නේ, හුදෙක් නඩු විභාගයක් කිරීම සඳහා නඩු විභාගයක් පැවැත් වීම ප්‍රමාණවත් නො වනවා පමණක් නොව, ඇත්ත වශයෙන් ම එය අනතුරුදායක වන බව ය.

බිඳුණුවැව හදවතෙහි තිබුණ ගැඹුරු සහ අව්‍යාජ ව්‍යාකූලතාවයන් නඩුව සම්බන්ධව ඉතා සමීපව දන්නා ආණ්ඩුවේ නිලධාරියෙකු සමඟ මෑත දී කළ සාකච්ඡා ව තුළ දක්නට ලැබුණි. "එක් අතකින් මා සතුටු වෙනවා. සාධාරණත්වය ඉෂ්ට වුණා" ඔහු පැවසී ය. "උදසීන, අක්‍රමවත්, නො තැකීම නො තිබුණා නම් පොලිසියට ප්‍රහාරය නතර කළ හැකි ව තිබුණ බව" ඔහු කීවේ ය. නඩු තීන්දුව රටට පැහැදිලි පණිවිඩයක් නිකුත් කළ බව ඔහු අදහස් කළේ ය. "ඔවුන්ට ඒ වගේ දේවල් නතර කරන්න බැහැ කියලා මීට පස්සෙ කියන්න බැහැ. ඔවුන්ට දන් වැළැක්වීමේ පැහැදිලි රාජකාරියක් තියෙනවා." අවාසනාවකට මෙන්, දඬුවම් ලැබූ පොලිස් නිලධාරීන් ගේ කඳුළු පිරි සම්මුඛ සාකච්ඡා, පුවත්පත් මුල් පිටු පුරා පළ කෙරුණ අතර මහජනයා ගේ රූපවාහිනීවල තිර ප්‍රදර්ශනය කෙරුණි. "දඬුවම් පැමිණ වීමේ සම්පූර්ණ උනන්දුව ම නැතිව ගියා. සාමාන්‍ය මහජනයා දන් කෝපයෙන්. තරඟකාරී ජනමාධ්‍යයන් විසින් ජනතාව වාර්ගිකව සිතන තැනකට තල්ලු කරලා ජනමාධ්‍යවල මැදිහත්වීම නො වුණා නම් මිනිස්සු ඉතා සාධාරණ වෙන්න ඉඩ තිබුණා". සත්තකින්ම, ඔහු පැවසූ ආකාරයට මෙම ජනප්‍රිය මහජන ආකල්පයන් අභියාචනය විභාග කළ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් ගේ සිත් තුළට ඉතා හොඳින් කාවැදී තිබෙන්නට පිළිවන. "සාධාරණ වීමට ඔවුන් උත්සාහ කළ හැකි ව තිබෙන නමුත් මහජන මතය ගැන නිතැතින් ම සැලකිලිමත් වීමෙන් ගැලවිය නො හැකි ය.

තවමත් ඔහු තීන්දුවේ සාධාරණත්වය ආරක්ෂා කළත් සමහර විට එබඳු ප්‍රහාරයක් නතර කිරීම පොලිස් පරීක්ෂකවරයෙකු ගෙන් ඇත්ත වශයෙන්ම බලාපොරොත්තු විය නො හැකි බව ද ඔහුට ඔහු ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගේ පැහැදිලි උපදෙස් නැතිව පිරිසට වෙඩි තැබිය නො හැකි බව ද ආණ්ඩුවේ නිලධාරියා පැවසී ය. මූලස්ථාන පොලිස් පරීක්ෂක ගේ ප්‍රකාශයට අනුව එදින උදේ ඔහු විනය පරීක්ෂණයක් සඳහා යා යුතුව තිබුණි. කඳවුරේ

තත්ත්වයට වඩා මෙයට මුල් තැනක් දුන්නේ යැයි ඔහු පැවසීම "හාස්‍යජනක" වූයේ ය. ඒ අනුව, "එක් අතකින් කණිෂ්ඨ නිලධාරීන් කියන්නේ ඇත්ත" නීතිපති දෙපාර්තමේන්තුව තම රාජකාරිය කරන්නේ "නීතියට අනුවයි. නමුත් ප්‍රායෝගික ව කථා කළොත් තවත් සාධක බලපානවා. එනම් පොලිසියට ප්‍රහාරය නතර කිරීමේ හැකියාවක් තිබුණා දැයි අපැහැදිලි ය. එමෙන්ම ඔවුන් මිනී මැරීම සඳහා ක්‍රියාශීලීව සහභාගී වී නැති බව ද පැහැදිලි ය. එහෙත් අභියාචනයේ දී දඬුවම අහෝසි වන තීන්දුවක් දීම නීති පද්ධතිය කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කරනු ඇතැයි අවබෝධයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත. ඒ අනුව සෙසු දේශපාලන ප්‍රශ්න අනිවාර්යෙන් ම ක්‍රියාත්මක වනු ඇත. කනිෂ්ඨ නිලධාරීන් එවිට "හුදෙක්ම ඉත්තෝ" බවට පත් වන්නාහු ය. ඔවුන් ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඉදිරියේ ඔවුන් පසෙකට වී බලා සිටිය දී සමහර විට වෙඩි තබන්නට ද ඇත. සිදු වූ මනුෂ්‍ය ඝාතනය පිළිබඳව අප දන්නා නිසා කරුණාසේන සහ රත්නායක වැනි කණිෂ්ඨ නිලධාරීන් කෙරෙහි මෙම නිලධාරියා සමහර විට තරමක් පරිත්‍යාගශීලී වී ඇති බව පෙනේ. කවුරු, කෙසේ සහ කවර ප්‍රමාණයකින් අසමත්වී ද යන්න පිළිබඳව නිශ්චිත තොරතුරු සඳහටම අප්‍රකට ව, හෙළිදරව් නො වී පැවතියත් සාමූහික ව සහ තනි තනි ව යන දෙයාකාරයකින් ම පොලිසිය ඉටු කළ යුතු රාජකාරිය සම්බන්ධයෙන් සම්පූර්ණ සදාචාරාත්මක සහ නීතිමය අසාර්ථකත්වයන් සිදු වූ බවට සැකයක් නැත.

එහෙත් මෙම නිලධාරියා නඩුව ගැන කළ විග්‍රහය තුළ පවතින ආතතිය සහ පරස්පර විරෝධී තත්ත්වය ප්‍රචණ්ඩත්වය හා නීතිය උල්ලංඝනය කිරීමෙන් පිරී ගියා වූ ඉතිහාසයක බර යටතේ සටන් කරන නෛතික සහ සමාජ ක්‍රමයක වඩා ගැඹුරු වූ පීඩාව පෙන්නුම් කරයි.[99]

ඇත්ත වශයෙන් ම, බිඳුණුවැව සිද්ධිය, විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර සිවිල් සමාජයේ තවදුරටත් පවතින දුර්වලතාවයක ලක්ෂණ ඉතා තියුණු ලෙස හෙළිදරව් කරයි. බිඳුණුවැව සිද්ධීන් වලින් පසු ව අඛණ්ඩව හා එලදායී ලෙස පියවර ගැනීම සඳහා යන්ත්‍රණයන් තාමත්

99. 2002 වසරේ මුල සිට ජනාධිපතිනි අත තිබෙන වාර්තාවක් වූද ඇය විසින් ම පත් කළා වූද පරීක්ෂණ කමිටුවේ වාර්තාව, ඇය විසින් මෙතෙක් ප්‍රසිද්ධ නො කිරීම පිළිබඳ කාරණාව ම හේතු දැක්වීමේ දී මෙම පීඩාවන් ද උපකාර වනු ඇත. ඔවුන් ගේ උත්සාහයන් ගේ ප්‍රතිඵල සරලව ම ජනාධිපතිනිය ගේ මේසය මත ලැග තිබීමට සහ ජාතික ලේඛනාරක්ෂණාගාරයෙහි මහජනයාට තහනම් අංශවල තබා තිබීමට නියමිත නම්, එවන් කොමිසමක නිශ්චිත අරමුණ කුමක් දැයි යන ප්‍රශ්නය ඉස්මතු වේ.

වර්ධනය කර ගත යුතු ව තිබේ. සිද්ධියෙන් පසුව ඇති වන ආරම්භක කෝපය, ස්වාධීන කොමිෂන් සභා, පූර්ණ පරීක්ෂණ හා අවශ්‍ය වෙනම් නඩු පැවරීම් ඉල්ලා සිටිනු ලැබෙයි. එහෙත් සිද්ධිය සම්පූර්ණයෙන් ම හෙළිදරව් කිරීම සඳහා පීඩනය පවත්වා ගෙන යැමටත් සිද්ධිය හොඳින් මෙහෙයවන බවට, නිවැරදි පරීක්ෂණ පවත්වන බවට, නිවැරදි වූ පුද්ගලයින්ට නඩු පවරන බවට, සියලුම සාක්ෂි ඉදිරිපත් කරන බවට හා ඊට ගොදුරු වූවන්ට ගෞරවනීය ලෙස සලකන බවට තහවුරු කිරීමටත් සහතික කිරීමට ජනමාධ්‍ය, දේශපාලන පක්ෂ, සිවිල් සමාජයේ සංවිධාන හෝ "ජාත්‍යන්තර ප්‍රජාව" විසින් සංවිධානාත්මක උත්සාහයක් කළේ නැත.[100]

## 9. ඉදිරි පියවරයන් ?

විශේෂයෙන් ම මරණ දඬුවම් පහක් පැමිණ වීම සම්බන්ධ දෘෂ්‍යමාන සමාප්තිය නිසා නඩුවේ තීන්දු දීම අවසන් වූ බවත් පෙනෙන්නට ඇති නමුදු, මෙය සත්‍යයක් නොවේ. **මරණ දඬුවම් පැමිණ වීමත් සමග ශ්‍රේෂ්ඨාධිකරණයට ස්වයංක්‍රිය අභියාචනයක් පැමිණෙයි.** අභියාචනයන්ගෙන් නීතිමය ලියවිලි ලබා ගැනීමෙන් පසු, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජේ.ඒ.එන්. සිල්වා විසින් මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරුන් පස් දෙනෙකු ගේ මණ්ඩලයක් විසින් දඬුවම් ලැබූ පස් දෙනා ගේ අභියාචනයන් විභාග කරන බව ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා විසින් 2004 ජූලි මුල දී නිවේදනය කරන ලදී. අභියාචනාවල තර්කවලට ඇහුම්කන් දීම 2004 ජූලි 10-11 දිනවලට නියමිත

100. දිවි ගලවා ගත්තවුන් ගේ සහ අපරාධයට ගොදුරු වූවන් ගේ පවුල් විසින් අත්විඳි පොදු පීඩාවන් බොහෝ සෙයින් නො කර අත්හරිනු ලැබූ කර්තව්‍යයන් ගේ ලැයිස්තුවට යමෙකුට එකතු කළ හැකි ය. කලින් සඳහන් කළ තැනැත්තන් ප්‍රහාරයෙන් සති ගණනාවක් ගත වනතුරු දියතලාව හමුදා කඳවුරේ රෝහල තුළ ඔවුන් ගේ ඇඳන් වලට තබා මාංචු දමා සිටිය හ. ඔවුන් දියතලාව කඳවුරේ සිටිය දී, මානව හිමිකම් ආයතනය විසින් මෙහෙය වූ කුඩා උපදේශක කණ්ඩායමක් ඔවුන් මුණ ගැසීමට දෙවතාවක් ගොස් ඔවුන්ව අස් වැසී ය. එල්.ටී.ටී.ඊ. යේ වර්තමාන අත්අඩංගුවට ගැනීම් ද නිදහස් කළ පුනරුත්ථාපන රැඳවියන් ඝාතනය කිරීම ද නිසා මතුවී ඇති භායනක අවිනිශ්චිත වාතාවරණයක් මධ්‍යයේ ඔවුන් මුදා හැරීමට පෙර ඔවුන්ව රඳවා තබා ගැනීමේ ඉතිරි කාලය සඳහා ඔවුහු තෙලිපිලෙයි කඳවුරට යවනු ලැබූහ. අපරාධයට ගොදුරු වූවන් ගේ පවුල් වලට සහ දිවි ගලවා ගත්තවුන්ට වන්දි ගෙවීමට ජනාධිපතිනිය එකඟ වූවා ය. කෙසේ නමුත්, මළ සිරුරු හඳුනා ගැනීමට නො හැකි වූ අපරාධයට ගොදුරුවූවන් ගේ පවුල් දෙළහකට කිසියම් මුදලක් ලැබීමට පෙර වසර තුනක් බලා සිටීමට සිදු විය. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට අනුව 2003 ජනවාරි වල දී පමණ සියලුම ලිපි ලේඛන අවසන් කර තිබුණි. එම නිසා මරණ සහතික සහ ඒ සමඟ අවසානයේ දී වන්දි ලබා ගත හැකි විය.

ය. නඩුව සම්බන්ධ ව්‍යාකූලතාවයන්, සහ සංකීර්ණ සහ තරඟකාරී දේශපාලන පීඩනයන් නිසා ප්‍රතිඵලය කුමක් වේ දැයි නිශ්චිතව ම දනගැනීම අසීරු ය. සහකාර පොලිස් අධිකාරී සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් ඉටු කළ භූමිකාවන් සම්බන්ධ කිසිදු විශාල විවේචනයක් ඉදිරිපත් වීමක් සිදු නො වන තත්ත්වයක් තුළ දී පොලිස් නිලධාරීන් සම්බන්ධ දඬුවම්වල වෙනසක් ඇති වීම මගින් එතරම් සාධනීය පණිවිඩයක් නිකුත් කරනු ඇතැයි පෙනෙන්නට නැත. එහෙත් විවිධ හේතු ගණනාවක් ම නිසා නඩු තීන්දුව සරලව ඒ හැටියට ම තිබෙන්නට ඉඩ හැරීම බොහෝ මිනිසුන් තුළ අප්‍රසාදයක් ඇති කරනු ඇත.

ඉස්මතු වී ඇති නීතිමය ගැටලු වලට අමතර ව, තම කීර්තිය රැක ගැනීම සඳහා අවස්ථා සිවිල් සමාජයට තාමත් තිබේ. සියල්ලට ම ප්‍රථම, **මූලස්ථාන පොලිස් පරීක්ෂක සහ දඬුවම් නො ලැබූ සෙසු පොලිස් නිලධාරීන් ගේ ක්‍රියා පටිපාටිය සම්බන්ධව විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා බල කිරීමේ** අවශ්‍යතාවය පවතී. (සහකාර පොලිස් අධිකාරී විශ්‍රාම ගෙන සිටින නිසා එවන් ක්‍රියාවලියකට ඇතුළත් කළ නො හැකි දුරකින් සිටින බව අනුමාන වශයෙන් සිතිය හැකි ය.) සහකාර පොලිස් අධිකාරී දයාරත්න, මූලස්ථාන පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න, පොලිස් පරීක්ෂක කරුණාසේන සහ උප පොලිස් පරීක්ෂක රත්නායක, ජයරත්න, වල්පොල සහ අබේනාරායනට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත් විය යුතු බවට කොමිසම දැඩිව නිර්දේශ කළේ ය. කපිතාන් සහ ලූතිනන් අබේරත්න ගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් ද පරීක්ෂණ කළ යුතු බවට එය නිර්දේශ කළේ ය. මේ දක්වා එබඳු පරීක්ෂා කිරීමක් හෝ විනය පරීක්ෂණ පැවැත්වීමක් සිදු වී නැත. එමෙන් ම මූලස්ථාන පොලිස් පරීක්ෂකට ජනප්‍රිය ඉහළ තනතුරක් ලැබී තිබේ. මෙම තත්ත්වය මහජන පීඩනය යෙදවීම ඉල්ලා සිටියි. **ගත හැකි මූලික පියවරක් වන්නේ කොමිෂන් වාර්තාව ප්‍රසිද්ධ කිරීමට ජනාධිපති ගෙන් ඉල්ලා සිටීමයි.** සියලුම ශ්‍රී ලාංකිකයන්ට කියවීම සඳහා මෙය සිංහලෙන් සහ දෙමළෙන් ප්‍රසිද්ධ කරනු යැයි ඉල්ලා සිටිය යුතු ය. මේ අරමුණු ඉටු වීමෙන් පසුව පොලිසියේ අව කල්ක්‍රියාව සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත් විය යුතු යැයි බලපෑම් කළ හැකි වනු ඇත. ඇත්ත වශයෙන් ම වාර්තාව ප්‍රසිද්ධ නො කර ඇත්තේ ද එමනිසා විය හැකි ය.

අවසාන වශයෙන්, එබඳු දෙයක් ඇත්ත වශයෙන් ම කළ හැකි නම්, **එල්.ටී.ටී.ඊ. යටත් වෙන්නන් සහ සැකකරුවන් සඳහා ඇති විය යුතු සාධාරණ සහ ඵලදයක "පුනරුත්ථාපන" ක්‍රමය කවර ආකාරයේ එකක් විය යුතු දැයි යළි සිතා**

බැලීම සඳහා බොහෝ දේවල් කළ යුතුය. 2004 මුල දී පුනරුත්ථාපන ක්‍රමය නොත්ඩි ගසන තත්ත්වයකට පත්ව තිබුණි. ප්‍රහාරයෙන් පසු ව බිදුණුවැව කඳවුර වසා දමා ඇති අතර තෙලිපිලෙයි කඳවුරට මුදල් නැති නිසා තවදුරටත් රැඳවියන් බාර ගැනීම නතර කර තිබුණි.[101] මේ අතර විශ්වාස කටයුතු ආරංචි වලට අනුව පුනරුත්ථාපනය කරනු ලැබූ තරුණ දෙමළ මිනිසුන් ක්‍රමානුකූල ව එල්.ටී.ටී.ඊ.ය විසින් දඩයම් කර එක්කෝ ඝාතනය කරනු ලබයි. නැතහොත් අත්අඩංගුවට ගෙන එල්.ටී.ටී.ඊ. බන්ධනාගාර වලට යවනු ලබයි. එසේත් නැතහොත් ඔවුන්ට සැඟ වී සිටින ලෙසට බල කරනු ලබයි. බිදුණුවැව කඳවුරට ආධාර කිරීමට කැමති ව සිටි සමහර විදේශ ආණ්ඩු අද එහි සිටි සමහර රැඳවියන් විදේශ රටවල ආරක්ෂිත රැකවරණය ඉල්ලා සිටිය දීත් කිසිවක් නො කර බලා සිටියි. යටත් වන්නවුන් සහ රැඳවියන් වෙන්කොට තැබීම ඇතුළුව පුනරුත්ථාපන ක්‍රමයේ ස්වරූපය වෙනස් කිරීමේ සමහර අර්ථවත් යෝජනා කොමිෂන් වාර්තාවේ තිබේ. නමුත් කලින් ක්‍රමයට සම්බන්ධිත ප්‍රශ්න මීට වඩා ගැඹුරු වන අතර, එක් අතෙකින් බිදුණුවැව විනාශය බලාපොරොත්තුව සිටි එකකි. එසේ වුව ද එය බිඳ වැටුණු විචිත්‍රාකාර භයානක ස්වරූපය සෑම කෙනෙක් ම කම්පාවට පත් කළේ ය. ආපසු හැරී බැලීමේ දී එහි අවසාන බිඳ වැටීම එතරම් ම පුදුමයට කරුණක් නො වේ. නීතිමය ව්‍යාකූලත්වය සහ අයිතීන් උල්ලංඝනය කිරීම, සම්පත් හිඟකම, පරිපාලන අවුල් සහගතභාවය සහ නො තැකීම, කඳවුර තුළ සහ කඳවුරෙන් පිටත පැවති වාර්ගික දේශපාලනය කෙරෙහි කඳවුරේ සිංහල කාර්ය මණ්ඩලය අන්ධව සිටීම සහ එල්.ටී.ටී.ඊ. විරෝධී ප්‍රචාරය සඳහා කඳවුර ගසා කනවාට වඩා වෙනත් දෙයක් කිරීමේ දේශපාලන අභිමතාර්ථයක් ආණ්ඩුව තුළ නො තිබීමේ අන්තරායකාරී සම්මිශ්‍රණයක් මත කඳවුර පවත්වා ගෙන යමින් තිබුණි. ඊට සම්බන්ධ ව සිටි සමහර අයට අවංකව තුබූ යහපත් චේතනාවන්ට කළ හැකි වූයේ එපමණකි.

අවසානයේ දී, බිදුණුවැව කඳවුරේ අසාර්ථකත්වය එම පුනරුත්ථාපන ක්‍රමයට ආධාර උපකාර ලබා දුන් ජාත්‍යන්තර ක්‍රමයේ අංශවල සැලකිය යුතු යම් ප්‍රමාණයක අසාර්ථකත්වයක් ද වූයේ ය. කඳවුරට සහ පළල් පුනරුත්ථාපන පද්ධතියට සීමිත වූ විදේශීය ආධාර ලැබීමෙන් ලැබෙන නීතියුක්තභාවය ලබා දීමට සූදානම් ව සිටි විදේශීය ආණ්ඩු සහ ජාත්‍යන්තර

101. ලිංගික සේවිකාවන් සහ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ කාන්තාවන් ගේ අවශ්‍යතාවයන් සපයන්නා වූත් එල්.ටී.ටී.ඊ. කාන්තා සටන්කරුවන් අතළොස්සකට පමණක් නිවහනක් වූත් මෙත් සෙවන බොහෝ සෙයින් තදබද වී පවතියි.

රාජ්‍ය නොවන සංවිධාන මෙම ක්‍රමය අර්ථවත් කිරීමට අවශ්‍ය වූ සම්පත් සහ එය ක්‍රියාත්මක වන දේශපාලන බලවේග සහ අන්තර්ගත වූ අන්තරායයන් ගැන බැරෑරුම් විවේචනාත්මක විග්‍රයක් මත පදනම් වන්නා වූ අඛණ්ඩ මැදිහත් වීමක් ලබා දීමට කැමතිව සිටියේ නැත. දන් ක්‍රියාත්මක වන යුනිසෙෆ් ආයතනයේ TRO Action Plan මගින් කෙරෙන හදිසි ක්‍රියා පටිපාටියට පිටින්[102] ක්‍රියාත්මක කළ හැකි පුනරුත්ථාපන ක්‍රමයක් තුළට තවදුරටත් ජාත්‍යන්තර සහභාගිත්වයක් ඇති කිරීම කළ යුත්තේ අඛණ්ඩ වූත්, විවේචනශීලී වූත්, 'ස්වයං' විවේචනශීලී වූත්, සැබෑ කැපවීමක් කිරීමෙන් පසුව පමණකි. මේ සඳහා, අනිවාර්යයෙන් සිදු විය හැකි වැරදි හා අසාර්ථක වීම් පවා ශ්‍රී ලාංකික කොටස්කරුවන් - විශේෂයෙන් ම රැඳවියන් ගේ අයිතීන්ට ගරු කරන්නා වූත් ඔවුන්ට වගකියන්නා වූත් කැපවීමක් මෙහි දී තිබිය යුතු ය.

102. ආයුධ බිම තැබීමට එකඟ අය, විශේෂයෙන් ම හිටපු, ළමා සොල්දාදුවන් යළි ඒකාබද්ධ කිරීම සහ ඔවුන්ට ආරක්ෂාව සැපයීම සඳහා දිගුකාලීන විසඳුමක සැලසුමක් මේ දක්වා සකස් කිරීමට නො හැකි වීම ආණ්ඩුව සහ එල්.ටී.ටී.ඊ. ය අතර සාම ක්‍රියාවලිය මේ දක්වා ගෙන ඇති සුවිශේෂ රූපාකාරය එක් අවාසනාවන්ත අතුරු බලපෑම් වලින් එකකි.

# VIII

# මානව හිමිකම් හා බුද්ධිමය දේපල අයිතිවාසිකම්

*අවන්ති ගුණතිලක**

## 1. හැඳින්වීම

මානව හිමිකම් හා බුද්ධිමය දේපල අයිතිවාසිකම් අතර ඇති සම්බන්ධතාවය මෑතකදී පැවැත්වුණු බොහෝ විවාද වලට මාතෘකාව විය. එක් අන්තයක් ලෙස බුද්ධිමය දේපල අයිතිය නිපදවන්නන්ට සුදුසු පිළිගැනීමක් ලබා දෙන මානව හිමිකමක් ලෙස අනෙකුත් මානව හිමිකම් හා සමාන ස්ථානයක් ලබා දීමට බුද්ධිමය දේපල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ක්‍රියා කරන පිරිස් උත්සාහ කිරීම දක්විය හැකිය. මෙම තර්කය ශක්තිමත් කරන මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ (UDHR) 27 වන වගන්තිය දක්වන්නේ 'තමන්ගේ කර්තෘත්වයෙන් නිෂ්පාදිත විද්‍යාත්මක, සාහිත්‍යමය හෝ කලාත්මක කෘතියකින් ජනිත වන ආධ්‍යාත්මික හා භෞතික ඵල ප්‍රයෝජන රැක ගැනීමේ අයිතිය සෑම පුද්ගලයෙකු සතුව ඇත.' යනුවෙනි. තව දුරටත් මෙම තර්කය තුළ බුද්ධිමය දේපල අයිතිය යනු අයිතිකරු විසින් සම්පූර්ණ වශයෙන්ම අයිතිවාසිකම් කියන පෞද්ගලික දේපල අයිතියක් හා පේටන්ට් අයිතිය ආරක්ෂා කිරීම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සමාජ සම්මුතියෙහි කොටසක් වේ යන අදහස ගැබ්ව ඇත.

---

* එල්.එල්.බී. (ගෞරව) [කොළඹ], නීතිඥ, පර්යේෂණ සහායක (නීතිය හා සමාජ භාරය).

තවත් අතකින් මානව හිමිකම් පිළිබඳ නීතිවේදීන්, බුද්ධිමය දේපල අයිතිය පිළිගැනීම එක්තරා මට්ටමක මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමකට විෂය වන බව පිළිගෙන තිබේ. මේ නිසා සෞඛ්‍යයට ඇති අයිතිය, පේටන්ට් අයිතිවාසිකම බලාත්මක කිරීම තුළින් ඉටු කිරීමට නොහැකි බවට තර්කයක් තිබේ. ආහාර, අධ්‍යාපනය හා සංවර්ධනය සම්බන්ධයෙන්ද මෙම තත්ත්වයම අදාළ වේ. බුද්ධිමය දේපල අයිතිවාසිකම සම්බන්ධ පනත් කෙටුම්පත පිළිබඳ මෑතකදීම ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්චය කළ කරුණු අනුව පුද්ගලයින්ට සෞඛ්‍යයට ඇති අයිතිය කෙරෙහි බුද්ධිමය දේපල අයිතිවාසිකමෙහි බලපෑම පිළිගන්නා අතර සෞඛ්‍යයට ඇති අයිතියට ශ්‍රේෂ්ඨත්වයක් ප්‍රදානය කළයුතු බව අධිකරණය දැඩිව දක්වන ලදී.

## 2. මානව හිමිකම් කෙරෙහි බුද්ධිමය දේපල අයිතිවාසිකම් හි බලපෑම

බුද්ධිමය දේපල අයිතිවාසිකම් ප්‍රධාන වශයෙන්ම පේටන්ට්, ප්‍රකාශන අයිතිය, වෙළඳ ලකුණ, කාර්මික සැලසුම් හා වෙළඳ රහස් යන ක්ෂේත්‍ර හා සම්බන්ධ වේ. මෙයින් වෙළඳ ලකුණ යන බුද්ධිමය දේපල අයිතිය වෙනස් තත්ත්වයක පවතින අතර වෙළඳ ලකුණක් ආරක්ෂා කිරීමේ ප්‍රධානම පරමාර්ථය වන්නේ පාරිභෝගිකයන් රැවටීමකින් ආරක්ෂා කිරීම සේම නිපදවන්නන්ට හෝ නිර්මාපකයන්ට සෙත සැලසෙන පරිදි පවත්නා බුද්ධිමය දේපල අයිතිවාසිකම් පිළිගැනීමට ඉඩ සැලසීමයි.

බුද්ධිමය දේපල පනතේ[1] 62 (2) වගන්තිය දක්වන්නේ "නව නිපැයුමක්, නිෂ්පාදිතයක් හෝ ක්‍රියාවලියක් හෝ විය හැකි" බවයි. මෙම වගන්තිය TRIPS ගිවිසුම[2] නමින් හඳුන්වනු ලබන වෙළඳමට සම්බන්ධ බුද්ධිමය දේපල අයිතිවාසිකම් ගිවිසුමේ වගන්තියට බලාත්මක බවක් ලබා දෙයි. TRIPS සම්මුතියෙහි 27 වන වගන්තිය මගින් පේටන්ට් හි විෂය වස්තුව විග්‍රහ කරනු ලබන්නේ "නව්‍යතාවය, පූර්ව කලාවක් තුළ නොතිබෙන බව

1. 2003 අංක 36 දරණ.
2. ලෝක වෙළඳ සංවිධානයේ පාලන කලාපය යටතේ TRIPS ගිවිසුම මගින් ලංකාව නෛතික බැඳියාවන්ට බැඳේ. උරුගුවේ සාකච්ඡා වලදී 1986-94 කාලය තුළදී TRIPS ගිවිසුම සාකච්ඡා කළ අතර පළමු වතාවට බහු පාර්ශවීය වෙළඳ ක්‍රමයකට බුද්ධිමය දේපල රීතීන් හඳුන්වා දෙන ලදී. වැඩිදුර විස්තර සඳහා URL: http://www.wto.org/english/tratop e/trips e/trips e.htm.

හා කාර්මික අංශයට යෙදීමේ හැකියාව යන අංග වලින් සමන්විත තාක්ෂණික ක්ෂේත්‍රයේ නිෂ්පාදනයක් හෝ ක්‍රියාවලියක් විය හැකි කුමන හෝ නිපදවීමක්" යනුවෙනි. මෙම සම්මුතිය මගින් තාක්ෂණික ක්ෂේත්‍රයේ කරන නව නිපැයුම දේශීය හෝ වේවා විදේශීය හෝ වේවා එය නිපදවන ලද ස්ථානය සම්බන්ධයෙන් කරන වෙනස් කිරීම් හෙළා දකී. TRIPS සම්මුතිය මගින් යම් රජයක් අවුරුදු 20 ක කාලයක් සඳහා පේටන්ට් බලපත්‍ර ලබා දීමට බැඳෙන අතර, ඒ අනුව ජානමය ඖෂධ නිර්මාණය හා වෙළඳම මෙ මගින් සීමා කරයි.[3] කෙසේ නමුත් සංවර්ධනය වන, ඌන සංවර්ධිත, එසේම මැදි ආදයම් ලබන රටවල් මුහුණපාන සෞඛ්‍ය අර්බුද වලට මෙය උපකාර නොවන බව දක්වයි.

මානව වර්ගයාගේ පූර්ණ සංවර්ධනයට ඉවහල් වන විශ්වමය කොන්දේසි මාලාවක් ලෙස, මානව අයිතිවාසිකම් ලිහිල්ව නිර්වචනය කළ හැකිය. දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලයේ ආරම්භ වුණු නියුරන්බර්ග් විභාග වලදී මිනිස් සිත් තුළට කාවද්දන ලද එක්සත් ජාතීන් විසින් වර්ධනය කරන ලද මානව හිමිකම්, වර්තමානයේ නෛසර්ගික හා නොබෙදිය හැකි, වර්ධනය වන රාජ්‍යය බැඳියාවන් සමූහයක් ලෙස දක්වයි.

සමාජ, ආර්ථික අයිතිවාසිකම් මානව හිමිකම් හි නොබෙදිය හැකි ක්ෂේත්‍රයක් ලෙස දිගින් දිගටම පිළිගැනීම බොහෝ රටවලට විසඳිය නොහැකි අභියෝගයක් බවට පත්ව තිබේ. සංවර්ධිත හා සංවර්ධනය වන රටවල් සම්පත් මදකම යන පදනම මත සමාජ හා ආර්ථික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම නොසලකා හරිනු ලබයි. කෙසේ නමුත්, මෙම සමාව වටිනාකමින් වැඩි යැයි පිළිගනු ලබන සිවිල් හා දේශපාලන අයිතීන් සහතික කිරීම උදෙසා භාවිතා නොකරන අතර මැතිවරණ පැවැත්වීම, අධිකරණයේ නඩත්තුව සඳහා විශාල වශයෙන් සම්පත් වැය කරනු ලැබේ.

මේ අනුව සාධාරණ ප්‍රමුඛත්වයක් දීම සැබෑ ප්‍රශ්නය බව පෙනී යයි. මැතිවරණ සඳහා කිසිදු දෙගිඩියාවකින් තොරව මුදල් වියදම් කරන සමහර රජයන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නඩත්තුව හා වර්ධනය සඳහා ලබා දෙන්නේ ඉතා අඩු ප්‍රමුඛත්වයකි. තවත් අතකින් බලන විට සමාජ, ආර්ථික අයිතීන්

3. වෙළඳ නාමයකින් තොර ඖෂධ එහි නියම නම හා සමාන වන අතරම එහි ප්‍රමාණය, ආරක්ෂාව, ශක්තිමත් බව, එය භාවිතා කරන ආකාරය, තත්ත්වය, ඉටු කිරීම හා භාවිතා කිරීමේ චේතනාවද එක සමාන වන බව ඇමරිකානු ආහාර හා ඖෂධ පරිපාලනය මගින් විග්‍රහ කරයි.

වර්ධනය සඳහා ඇති සීමා සහිත මුදල් නිවැරදිව බෙදා වෙන් කරයිද යන්න සැක සහිත වනවා සේම (උදා:- ලෙස ක්‍රීඩා පිට්ටනි හෝ වෙළඳ සංකීර්ණ සෑදීමට හෝ සිනමා ශාලා පවත්වාගෙන යාමට මුදල් වෙන් කරන රජයන් අළුත් වැඩියා කිරීමේ අවශ්‍යතාවය සඳහා රෝහල් වසා දමයි.) එය නිවැරදිව බෙදුවද යෝග්‍ය අයුරින් අල්ලස් හෝ දූෂණයෙන් තොරව භාවිතා කරනවාද යන්න ද සැක සහිතය.

මෙහිදී විශේෂයෙන්ම දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින අයෙකු සම්බන්ධයෙන් සමාජ, ආර්ථික තත්ත්වයන්ගේ පිරිහීම, යහපත් රාජ්‍ය පාලනයකට සේම පවත්නා මූල්‍යමය තත්ත්වය යන කරුණු දෙක කෙරෙහිම සම්බන්ධ වන බවට කෙනෙකුට තර්කයක් ගෙන ආ හැකිය. මෙම සාමාන්‍ය අභියෝගයන්ට අමතරව සමාජ, ආර්ථික අයිතීන් යථාර්ථවාදීව ක්‍රියාත්මක කිරීමේදී, බුද්ධිමය දේපල අයිතිය ඉතා ශීඝ්‍රයෙන් සමාජ, ආර්ථික අයිතීන් හා සංවර්ධනයට පටන් ගෙන ඇති අතර විශේෂයෙන්ම සෞඛ්‍යයට ඇති අයිතිය දක්විය හැකිය. පහත සඳහන් සාකච්ඡාව මඟින් තෝරාගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් මානව හිමිකම් කෙරෙහි බුද්ධිමය දේපල අයිතිවාසිකම්හි බලපෑම අනාවරණය කිරීමක් පෙන්නුම් කරයි.

## 2.1 ඖෂධ කර්මාන්තය හා සෞඛ්‍යයට ඇති අයිතිය

සෞඛ්‍යයට ඇති අයිතිය කෙරෙහි බුද්ධිමය දේපල අයිතියෙහි ප්‍රතිවිරුද්ධ බලපෑම 21 වන ශත වර්ෂයේදී පැවතුණු බොහෝමයක් මානව හිමිකම් විවාදවල ප්‍රමුඛස්ථානයක් හිමිවූ කරුණකි. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ සෞඛ්‍යයට ඇති අයිතිවාසිකම විග්‍රහ කර ඇත්තේ සෞඛ්‍ය සම්පන්නව සිටීමට ඇති අයිතිය ලෙසයි.[4] මෙ මඟින් "උසස්ම සෞඛ්‍යය තත්ත්වයකට නිදහස්ව ඇතුළත් වීමට ඇති හැකියාව පිළිගනී. සෞඛ්‍යයට ඇති අයිතිය සම්බන්ධයෙන් පැවතුණු පොදු පැහැදිලි කිරීම් හිදී[5] සෞඛ්‍යයට ඇති අයිතියෙහි අත්‍යවශ්‍ය මූලයන් කීපයක් පිළිගන්නා ලදී. ඒවා නම් පවත්නා බව, ආවේශ්‍යතාවය, පිළිගැනීම හා සෞඛ්‍යය රැකවරණයෙහි තත්ත්වය

4. ICESCR හි 12 වන වගන්තිය.
5. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සභාවෙහි, 14 වන පොදු පැහැදිලි කිරීම. උසස්ම සෞඛ්‍ය තත්ත්වයක් සඳහා ළඟා වීමට ඇති අයිතිය UN DOC E/C 12/2000/4 (2000).

යන්නයි. මෙම බැඳියාවන් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍යයන්ගේ සම්පත් මදකම ගැන සිතා බලා, මෙම සම්මුතියේ පිළිගෙන ඇති අයිතිවාසිකම් ප්‍රගතශීලී වශයෙන් පූර්ණ වශයෙන් ඉටුකරලීමේ අරමුණින් තමා සතු උපරිම සම්පත් යෙදීමට අවශ්‍ය සෑම උපායක්ම ගැනීම රාජ්‍යයන්ගේ යුතුකම බව ICESCR සම්මුතිය මගින් පිළිගනියි.[6]

සම්මුතියෙහි දක්වා ඇති අයිතිවාසිකම් වලට යථාර්ථවත්ව ළංවීම සඳහා ගන්නා වූ ඉක්මන් උපායන් හා තීරණ වලට අමතරව, සෞඛ්‍යය සඳහා ඇති අයිතිය සම්බන්ධයෙන් ඇති යම් යම් දෘෂ්ටීන් ඉක්මනින් හඳුනා ගත යුතුවේ. මේවා අවම බැඳියාවන් ලෙස හඳුන්වන අතර රාජ්‍යයන් විසින් අදාළ සම්මුතිය අනුමත කළ වහාම එම වගකීම් ඉටුකිරීම සඳහා බැඳීමකට ලක්වේ. මෙම අවම බැඳියාවන් මගින් අයිතිවාසිකමක අවම අත්‍යවශ්‍ය මට්ටම හෝ තෘප්තිකර කිරීම තහවුරු කරයි.[7] කාලයෙන් කාලයට ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් අත්‍යවශ්‍ය ඖෂධ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩසටහන් මගින් තහවුරු කර ඇති සෞඛ්‍ය පහසුකම්, භාණ්ඩ හා සේවාවන් සමානව බෙදා දිය යුතු යැයි විග්‍රහ වුණු අත්‍යවශ්‍ය ඖෂධ පිළිබඳ වගන්තියක් අවම බැඳියාවන් වලට, පසුව ඇතුළත් කළ බව සෞඛ්‍යයට ඇති අයිතිය සම්බන්ධයෙන් පැවති පොදු පැහැදිලි කිරීම් හිදී[8] දක්වන ලදී.

සමහර අවස්ථා වලදී මෙම බැඳියාවන් බුද්ධිමය දේපල අයිතිවාසිකම් යටතේ ඇති බැඳීම් හා ඝට්ටනය වේ. පේටන්ට් බලපත්‍ර සහිත බෙහෙත් ද්‍රව්‍ය (මිල අඩු වෙළඳ නාමයෙන් තොර බෙහෙත් වලට විරුද්ධව) සඳහා ලෝක ඖෂධ වෙළඳපොළෙහි දැවැන්තයින් දුප්පත් රටවල ජීවත්වන මිලියන සංඛ්‍යාත ජනතාවට ළඟා විය නොහැකි මිලක් නියම කරනු ලැබේ. අනෙක් අතට මෙම ඖෂධවල වෙළඳ නාමයකින් තොර ඖෂධ ඉන්දියාව, බ්‍රසීලය වැනි

---

6. ICESCR හි 2වන වගන්තිය. මෙමගින් සම්මුතියේ කිසිදු වගන්තියක් ප්‍රගතිශීලීව ඉටු කිරීම මග හැරිය නොහැකි බව දක්වයි. සෞඛ්‍යය සම්බන්ධ පොදු පැහැදිලි කිරීමෙහි 2 වන වගන්තිය දක්වන්නේ 'අර්ථ සහගත සෑම බැඳීමකම කාලයක් තිස්සේ සෞඛ්‍ය අයිතිය ප්‍රගතිශීලීව ඉටු කිරීම රාජකීය පාර්ශවයන්' ඉවත්කර ගන්නා ලෙස අර්ථ නොදක්විය යුතුය. තවද ප්‍රගතිශීලී ඉටුකිරීම 12 වන වගන්තිය (සෞඛ්‍යයට ඇති අයිතියේ මූලිකාංග) ඉටු කිරීම සම්බන්ධයෙන් විශේෂ හා දිගින් දිගටම පවතින බැඳියාවන් ශීඝ්‍ර හා ඵලදායී ලෙස එහා මෙහා කිරීමට හැකියාව රාජ්‍ය පාර්ශවයන් සතු වන බවට අර්ථ දක්වයි.

7. ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් සභාවේ 1990 අංක 03 දරණ පොදු පැහැදිලි කිරීම.

8. 43 වන වගන්තිය.

රටවල සමාගම් ඉතාම අඩු මිලට එනම් පේටන්ට් බලපත්‍ර සහිත ඖෂධවල මිලට වඩා පහෙන් පංගුවකටත් වඩා අඩු මිලකට විකුණනු ලබයි. සමහර සංවර්ධිත රටවල් හා බහුජාතික ඖෂධ සමාගම් විසින් මෙම ගෙනයනු ලබන පීඩනය නිසා සෞඛ්‍යය සඳහා සීමා සහිත ලෙස මුදල් වෙන්කර ඇති දුප්පත් රටවල් සාමාන්‍යයෙන් බුද්ධිමය දේපල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට වෙහෙසෙනවා විනා මිනිසුන්ගේ සෞඛ්‍ය අයිතීන් ආරක්ෂා කිරීමට නොවෙහෙසෙයි.

විශේෂයෙන්ම ඒඩ්ස් වසංගතය හා සම්බන්ධව ගත්කල උප සහරානු රටවල් බලවත් වියවුලට පත්වන තත්ත්වයක් වන්නේ යුරෝපීය ඖෂධ සමාගම් වලින් පේටන්ට් බලපත්‍ර සහිත නියම බෙහෙත් මිලදී ගන්නවා ද යන්න හෝ ලාභ බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගෙන රෝගීන්ගේ ජීවිත තවත් දික් කරනවා ද යන්නයි. සංවර්ධිත රටවල් හා සංවර්ධිත රටවල ඖෂධීය සමාගම් විසින් ඇති කරන ලද පීඩනයට එරෙහිව සංවර්ධනය වන රටවල රෝගීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් උඩුගම් බලා පිහිනීමට සිදුවී තිබේ. මෑතකදී බුද්ධිමය දේපල අයිතිවාසිකම් වලට ලබාදෙන ආරක්ෂාව ස්ථිර කරන ලෙස ඇමරිකානු රජය විසින් සංවර්ධනය වන රටවලට යොදන ලද පීඩනය තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. සංවර්ධිත රටවල්, පේටන්ට් බලපත්‍ර රහිත නිපදවන්නන්ගෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් ඖෂධ මිලදී ගැනීම වැළැක්වීම සඳහා විවිධ උපායන් මගින් පීඩනයක් ඇති කර තිබේ. Glaxo SmithKline (GSK) වැනි බහුජාතික ඖෂධ සමාගම් බොහෝ අවස්ථා වලදී සම්පත් හිඟ රටවල් අඩු මිලට වෙළඳ නාමයකින් තොර ඖෂධ ලබා ගැනීමට උත්සාහ කිරීමේදී නෛතික ක්‍රියාමාර්ගයන් යොදා ගැනීම මගින් ඔවුන් බියවද්දා ඔවුන්ගේ ගමන වෙනස් කර තිබේ.

නියම ඖෂධ හා වෙළඳනාමයකින් තොර ඖෂධ අතර මිලෙහි පුදුම සහගත වෙනසක් පවතින අතර විශේෂයෙන්ම ඒඩ්ස් රෝගීන්ගේ ජීවිත කාලය දීර්ඝ කිරීමට යොදා ගන්නා anti-retroviral ඖෂධය මෙයට උදහරණ ලෙස දක්විය හැකිය. Ranbaxi නම් ඉන්දියානු සමාගම විසින් නිපදවන anti-retroviral ඖෂධ තුනක් අඩංගු "triple cocktail" ඖෂධය අප්‍රිකානු රජයන්ට පවුම් 295 බැගින් විකුණන අතර අවශ්‍ය ප්‍රමාණයට එම බෙහෙත් මිලදී ගැනීමට පවා අප්‍රිකානු රජයන්ට තවදුරටත් උපකාර අවශ්‍ය වේ.[9]

9. TRIPS හා මහජන සෞඛ්‍යය: The Next Battle, Oxfam Briefing Paper, URL: http:/www.oxfam.org.uk/what we do/issues/health/bp 15 trips.htm.

Ranbaxi වැනි ඉන්දියානු සමාගම් වෙළඳ නාමයකින් තොර "triple cocktail" ඖෂධය නිපදවන තුරුම එම ඖෂධයෙහිම මුල් ඖෂධය ඇමරිකානු ඖෂධ සමාගම් එක් පුද්ගලයෙකුට පවුම් 10,000 බැගින් විකුණන ලදී.[10] එමනිසා මෙම වෙළඳ නාමයකින් තොර ඖෂධ නොතිබේ නම් මිලියන සංඛ්‍යාත ඒඩ්ස් වසංගත රෝගීන්ගේ ජීවිත අනතුරේ පවතින බව පැහැදිලිය.

මෙම වෙළඳ නාමයකින් තොර ඖෂධවල අනෙකුත් වැදගත් කරුණ වන්නේ ඔවුන් නියම බෙහෙත්වල මිල අඩු කිරීම සඳහා ඉතා ප්‍රයෝජනවත් තරඟකාරීත්වයක් ලබාදීමයි. සංවර්ධනය වන රටවල් නියම භාණ්ඩවල මිල අඩු කිරීමට හා කේවල් කිරීමට මෙම මතය භාවිතා කරයි. උදා:- ලෙස ඒඩ්ස් සම්බන්ධව විශාලම ඖෂධ සමාගම වන GSK සමාගම දුප්පත් රටවලට ඖෂධ විකිණීමේදී එය නියමිත මුදලෙන් භාගයකට විකුණයි. එනම් GSK සමාගම දුප්පත් රටවලට මෙම ඖෂධය දිනකට ශත 90 කට විකුණන අතර එම බෙහෙත් ද්‍රව්‍යයම ඇමරිකාව තුළ දිනකට පවුම් 18 ක මිලකට අලෙවි කරනු ලබයි.[11]

මේ මතය අනුව පේටන්ට් සඳහා සුවිශේෂ වැදගත් කමක් ඇති බව සැලකිය යුතුවේ. සාමාන්‍යයෙන් ඖෂධයක නිෂ්පාදන පිරිවැය ඉතා අඩුය. කෙසේ වුවද, මෙම සමාගම් මූලික පිරිවැය හෝ අතිරේක ආයෝජන එනම් පර්යේෂණයන් හා සංවර්ධනය සඳහා විශාල වියදමක් දරයි. තරඟකාරීත්වය හා සංවර්ධනය හා පර්යේෂණ සඳහා කරන වියදම් වලින් සිදුවන පාඩුව, මෙම ආයතන පිරිමසා ගනු ලබන්නේ පේටන්ට් මගින් තම ඖෂධ ආරක්ෂා කර ගැනීමෙනි. ඉන්දියාව මුල්කරගත් ඖෂධ සමාගම් වලට මෙම විශාල මූලික පිරිවැයක් නොමැති අතර නිෂ්පාදිත පිරිවැය පමණක් ඇති නිසා එම ඖෂධම ඉතා මිල අඩුවට විකුණනු ලබයි.

දුප්පත් පුද්ගලයන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා සපයා දීමේදී පේටන්ට් හෝ ලාභ ගැන සිතා නොබැලිය යුතු බව සෞඛ්‍ය අයිතීන් පිළිබඳ ක්‍රියාකරන්නන් ගේ අදහසයි. සෑම පුද්ගලයෙකුටම උසස්ම සෞඛ්‍යය තත්ත්වයක් ළඟා කර දීමට ඇති අයිතිය සම්බන්ධයෙන් මෙවැනිම තර්කයක් ගෙන ආ හැකිය. නමුත් මතු කළයුතු තත්ත්වය වන්නේ ඖෂධ සමාගම් වලට දුප්පත් රටවලට

10. පේටන්ට් අසාධාරණත්වය, වෙළඳ සාධාරණත්වය ඇති කිරීම, URL: http://www.maketradefair.com/en/index.php?file=05092003160059.htm.

11. AIDS ඖෂධයන්හි මිල 50% කින්ම අඩු කරයි, BBC ප්‍රවෘත්ති UK Ed. 2003 අප්‍රේල් 28 වන සඳුද URL: http://news.bbc.co.uk/I/hi/business/2981015.stm.

සෞඛ්‍ය අවශ්‍යතා සපයා දීමේ බැඳීමක් නැති බවයි. එය රජය සතු බැඳීමක් වන අතර රජය විසින් අඩුම තරමින් අවම බැදියාවන් හෝ සම්පූර්ණ කිරීම තහවුරු කළ යුතුය.

ඉතා තදබල පේටන්ට් නීති සම්පාදනය මගින් රජයන් දිගින් දිගටම ලාභ ලබා දෙනු ලබන්නේ ඖෂධ සමාගම් වෙතයි. යම් රටක සෞඛ්‍යය තත්ත්වය පිරිහීම සඳහා මෙම සමාගම් වලට ගෙවීමට ඇති මුදල් බල නොපා යුතුය. සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ වගන්ති අනුව රාජ්‍යය බැදියාවන්ගේ ප්‍රමාණය, දැඩි පේටන්ට් නීති සම්පාදනය මගින් වැඩි කරන අතර, මේ අනුව ඖෂධ සඳහා කරන වියදම ඉහළ දැමීම අවශ්‍ය වේ. දැඩි පේටන්ට් නීති හඳුන්වා දීම මගින් රජය විසින් සෞඛ්‍යය සඳහා දරන වියදම වැඩි කළ යුතු බව සැලකිය යුතුය. අවාසනාවකට මෙන් සංවර්ධනය වන රටවලට (දක්ෂිණාංශික ධනවාදීන් නිදහස් සෞඛ්‍ය රැකවරණයක් සපයා දෙන්නත් යන්න සම්බන්ධව බොහෝ විවේචන තිබේ.) ඖෂධ හා සෞඛ්‍යය රැකවරණය කරා ළඟා වීම තහවුරු කිරීම සඳහා මෙම බැඳීම් ඉෂ්ට කිරීමට නොහැකිවී තිබේ. මෙම ප්‍රතිඵල වලින් මෙම රටවල සෞඛ්‍යය සඳහා පෞද්ගලික අංශය දරන පිරිවැය ඉතා ඉහළ ප්‍රතිශතයක් පෙන්නුම් කරන බව පැහැදිලි කරන අතරම එමගින් යහපත් සෞඛ්‍ය සේවයක් කරා ළඟාවිය හැක්කේ ධනපති පන්තියට පමණක් බව පැහැදිලි වේ. පහත සඳහන් දත්ත වලින් පෙන්නුම් කරන්නේ ඉතා යහපත් සෞඛ්‍ය රැකවරණ ක්‍රමයක් ලබා දෙන සංවර්ධිත රටවල් හා සංවර්ධනය වන රටවල් අතර වෙනසයි.

| රට | දළ ජාතික නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස සෞඛ්‍යය සඳහා දරන වියදම* (2001) | සෞඛ්‍යය සඳහා දරන සම්පූර්ණ වියදමෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශය දරන වියදම** (2001) |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 3.6 | 51.1 |
| ඉන්දියාව | 5.1 | 82.1 |
| බංග්ලාදේශය | 3.5 | 55.8 |
| තායිලන්තය | 3.7 | 42.9 |
| එක්සත් රාජධානිය | 7.6 | 17.8 |
| ප්‍රංශය | 9.6 | 24.0 |
| කැනඩාව | 9.5 | 29.2 |
| ස්වීඩනය | 8.7 | 14.8 |

* *මූලාශ්‍රය:- 2003 ලෝක සෞඛ්‍යය වාර්තාව (සම්බන්ධ කර ඇති 5 වන ලැයිස්තුව)*

** සෞඛ්‍යය සඳහා පෞද්ගලික අංශය කරන වියදම් වලට රක්ෂකයන් හා සමාජ ආරක්ෂණයට අමතරව තුන්වන පාර්ශවයන් විසින් කරන වැය කිරීම්, සේවා යෝජකයන් ලබාදෙන සෞඛ්‍ය සේවය, සෞඛ්‍ය සේවයන් සම්පාදනය කරන වෙනත් ආයතන ලබා දෙන සේවය, ලාභ නොලබන ආයතන හා රාජ්‍යය නොවන සංවිධාන සෞඛ්‍ය රැකවරණ සඳහා වැය කරන මුදල්, සෞඛ්‍ය පහසුකම් සැලසීම සඳහා වෙනත් පෞද්ගලික ආයෝජන හා පෞද්ගලිකව පුද්ගලයන් තමන් විසින්ම සෞඛ්‍ය සඳහා කරන වියදම් යන ඒවා අඩංගු වේ.

මෙම දත්ත මඟින් සංවර්ධිත රටවල රාජ්‍යයන් මඟින් වැඩි ප්‍රතිශතයක් මුදල් සෞඛ්‍යය සඳහා වැය කරන බවත් පෞද්ගලික අංශය දරන්නේ ඉතා අඩු ප්‍රතිශතයක් බවත් පැහැදිලි කරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධිත රටවල පේටන්ට් බලපත්‍ර හිමි ඖෂධ නිෂ්පාදකයන් හේතුකොට ගෙන ඖෂධවල මිල වැඩිවීම සම්බන්ධයෙන් වැඩි ප්‍රතිශතයක පිරිවැයක් දරන්නේ රජය බව පැහැදිලිය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ ඖෂධ සම්බන්ධ මෙම තත්ත්වය දඩි විවේචනයට බඳුන් වේ. 1999 වසරේ නේවාසික නොවූ රෝගීන් ගේ ඖෂධ සඳහා රජය විසින් රුපියල් මිලියන 384 ක් වැයකර ඇති අතර පෞද්ගලික අංශය රුපියල් මිලියන 9,994 ක් වැය කර ඇත.[12] මෙ මඟින් ඖෂධ සඳහා වැයවූ සම්පූර්ණ වියදමෙන් 96% ක් පමණම රෝගීන් විසින්ම දරන ලද බව පැහැදිලි වේ. සංවර්ධිත රටවල මෙන් නොව, සංවර්ධනය වන රටවල බුද්ධිමය දේපල අයිතිවාසිකම් සම්බන්ධව ව්‍යවස්ථාවන් මඟින් ඇතිකර ඇති බලපෑමෙහි වැඩි බරක් ජනතාව විසින්ම දරනු ලබයි. එමනිසා ලංකාව වැනි රටවල රජය විසින් යොදන මුදල් හෝ අඩුම තරමින් අත්‍යවශ්‍යය බෙහෙත් ද්‍රව්‍යවල හෝ මිල ඉහළ නැගීම අනිවාර්ය බලපත්‍ර මඟින් පාලනය කිරීම සඳහා හොඳින් සැලසුම් කරන ලද ක්‍රමයක් අනුගමනය කිරීමට රජයට වගකීමක් තිබේ.

නමුත් ඉන්දියාව හා දකුණු අප්‍රිකාව[13] ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාදීම සඳහා රජය සතු බැඳීම් හඳුනාගෙන තිබේ. ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය *Paschim Banga Khet Mazdoor Samity Vs State of West Bengal*[14] නම් නඩුවේදී රජයේ රෝහල් මඟින් අවම සෞඛ්‍ය ආරක්ෂණයක් හෝ ලබා නොදීම ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති ජීවත් වීමට ඇති අයිතිය කඩ කිරීමක් බව දක්වමින් ප්‍රකාශ කළේ,

> *මෙම පහසුකම් සැලසීම සඳහා මූල්‍යමය ආධාර අවශ්‍ය බවට සැකයක් නැත. කෙසේ නමුත්, ඒ මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම රජය සතු බැඳීමක් ලෙස දක්වා ඇති ජනතාවට අවම හෝ සෞඛ්‍ය සේවයක්*

---

12. මූලාශ්‍රයඃ ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය ගිණුම් වැඩිදුර විස්තර සඳහා වෛද්‍ය කේ. බාලසුබ්‍රමනියම් මහතාගේ 'Towards Quality Medicines at Affordable Proces' නැමැති දේශනයේ ඉදිරිපත් කිරීම බලන්න. ලෝක සෞඛ්‍යය සංවිධානය/සෞඛ්‍යය ක්‍රියාකාරකම් සම්බන්ධ ජාත්‍යන්තර ඖෂධ මිල සම්බන්ධ වැඩසටහන (2004 මාර්තු).

13. *සෞඛ්‍ය අමාත්‍යවරයා හා අනෙකුත් අය එ. Treatment Action Compaign and others,* 2002 (5) SA 721 (CC), 2002 10 BCLR 1033, *සුබ්‍රමනි එ. සෞඛ්‍ය අමාත්‍යවරයා* KwaZulu-Natal 1998 (1) SA 765 (CC), 1997 (12) BCLR 1696 (CC).

14. 1996 SOL නඩු අංක. 169 (ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය).

ලබාදීමේ වගකීම නොසලකා හැරීමට නොහැකිය. එමනිසා මෙම අරමුණ සපුරා ගැනීම සඳහා අවශ්‍ය කුමන දෙයක් හෝ සිදුකළ යුතුය. මෙම අධිකරණයම දුගී චූදිතයෙකුට නොමිලේ නීති ආධාර ලබාදීම රජයේ බැඳීමක් බව දක්වන ලද තීරණයකදී කියා සිටියේ මූලිකමය හිමිකම මත රජයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය බැඳියාවන් ඉවතලිය නොහැකි බවයි. (බලන්න: *Khatri (ii) Vs. State of Bihar, 1981 (i) SCC 627* පිටුව 631.) මෙම නඩුවේ දක්වන ලද තත්ත්වයම මනුෂ්‍ය ජීවිතයක් ආරක්ෂා කිරීම සඳහා වෛද්‍ය ආධාර ලබාදීම පිළිබඳ රජය සතු බැඳියාවන් සම්බන්ධයෙන්ද අදාළ වේ.[15]

## 2.2 ප්‍රකාශන අයිතිය ආරක්ෂා කිරීම සහ අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම් සහ සංවර්ධනය

මානව අයිතිවාසිකම් හා බුද්ධිමය දේපල අයිතිවාසිකම් අතර ගැටුම් ඇතිවන තවත් ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යාපනයට ඇති අයිතිය[16] හා ප්‍රකාශන අයිතිය දැක්විය හැකිය. ICESCR මගින් සෑම කෙනෙකුටම අධ්‍යාපනයට ඇති අයිතිය දක්වා ඇති අතර එමගින් ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය හා නොමිලේ සෑම අයෙකුටම ලබාදිය යුතුබව දක්වයි. සෑම සුදුසු මාර්ගයකින්ම හා විශේෂයෙන් ප්‍රගාමී වශයෙන් නිදහස් අධ්‍යාපනය ඇති කිරීමෙන් සැමටම සමසේ උසස් අධ්‍යාපනයක් ලබාගත හැකි විය යුතු බව සම්මුතිය දක්වයි. අධ්‍යාපනය සඳහා යන වියදම අනිවාර්යයෙන්ම රජය විසින් දැරිය යුතු වේ. පුරවැසියන් විසින් මෙම බැඳීම් ආරෝපණය කර ගනී නම් මෙම අයිතිවාසිකම් සපුරාදීම තුළින් ජනතාව සතු අවම ජීවන මට්ටම හෝ තහවුරු කිරීම රජය සතු යුතුකමක් වේ.

තදබල ලෙස ප්‍රකාශන අයිතිය ආරක්ෂා කිරීම අධ්‍යාපනයට ඇති අයිතිය සපුරා ගැනීමට දුප්පත් ජාතීන්ට ඇති අවහිරයක් ලෙස දැක්විය හැකිය. තදබල රීතීන් මගින් ප්‍රකාශනයන්හි ඡායා පිටපත් ගැනීම තහනම් කරන අතර අන්තර්ජාල භාවිතයද සීමා කරනු ලබයි. මෙමගින් ඌන සංවර්ධිත රටවල් වෙත දැනුම ගලායෑම දැඩි ලෙස වළක්වා තිබේ. බුද්ධිමය දේපල සම්බන්ධයෙන් දකුණු ආසියානු රටවල ඉතාමත් දරුණු නීතීන් සම්පාදනය කරන අතර හොංකොංහි බුද්ධිමය දේපල ආඥාපනතට ගෙනා (අමතර

15. 16 වෙනි ඡේදය.

16. 13 වන වගන්තිය.

විධිවිධාන සංශෝධන පනත)[17] උදහරණයක් ලෙස දක්විය හැකිය. මෙම නීතිය මගින් අවධානය යොමුකර ඇත්තේ ප්‍රකාශන අයිතීන් ආරක්ෂා කිරීම පිළිබඳ පමණක් වන අතර *'යහපත් භාවිතය'* යන සංකල්පය පිළිබඳ සලකා බලා නොමැත. මෙම ඉහත දක්වෙන *යහපත් භාවිතය* යන සංකල්පය මගින් ප්‍රකාශන අයිතිය ආරක්ෂා කිරීම හා තොරතුරු නිදහස්ව ගලා යාමේ අවශ්‍යතාවය, පර්යේෂණ වැඩි දියුණු කිරීම හා ඉගැන්වීම් හා වාර්තා කිරීම් යනාදිය අතර සමබරතාවයක් ඇති කිරීමට උත්සාහ දරයි.

හොංකොං හි මෙම අත්දැකීම සෑම දෙනෙකුගේම දෙනෙත් විවර කිරීමක් වන අතර, එම නීතිය බලාත්මක කිරීම ප්‍රායෝගික නොවන බව එය හඳුන්වා දී දින දෙළහකින්ම අවලංගු කිරීම මගින් ඔප්පු වේ. අනුන්ගේ ග්‍රන්ථ කොල්ලකෑම භාවිතා කිරීම තහනම් කරමින් *'වෙළඳ අරමුණක් සඳහා'* යන්න *'යම් වෙළඳ කටයුත්තක් හෝ ව්‍යාපාර කටයුත්තක් කිරීමේදී හෝ එයට සම්බන්ධ වීමේදී'* ලෙසින් කියවිය යුතු බවට මුල් පනතට ගෙන එන ලද සංශෝධනය මගින් දක්වන ලදී. මෙම නීතිය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ආයතන වලට, ප්‍රවෘත්ති වාර්තා ආයතන වලට හා වෙනත් තොරතුරු සේවාවන් වලට විශේෂයෙන්ම බලපාන ලදී. ප්‍රකාශන අයිතියක් සහිත ද්‍රව්‍ය අන්තර්ජාලය තුළින් ඉගැන්වීමේ අරමුණක් සඳහා හෝ ලබා ගැනීම නීති විරෝධී වේ. පිකාසෝගේ හෝ බ්‍රැක් ගේ චිත්‍ර නැවත නිපදවනවාට වඩා 20 වන ශත වර්ෂයේ ප්‍රංශ ජ්‍යාමිතික කලා සම්ප්‍රදයන් නිරූපණය වන ආකාරය පැහැදිලි කිරීම සඳහා චිත්‍ර ආචාර්යවරයෙක් අඳින ලබන චිත්‍රයක් මෙයට උදහරණ ලෙස දක්විය හැකිය.[18] මෙම විහිළුව සම්බන්ධයෙන් සතුටුදයක ව්‍යාපාර ප්‍රවේශයක් හා ආකර්ශණීය ආයෝජනයක් සහිතව බලන අධි උද්යෝගිමත් නීති සාදන්නන් මේ සම්බන්ධයෙන් වගකිව යුතුබව බොහෝ අයගේ අදහසයි.

ශ්‍රී ලංකාවේ නව නීතිය මේ සම්බන්ධයෙන් බලන කල නව සංවර්ධනයකට මග පාදන්නක් සේ කෙනෙකුට සිතිය හැකිය. පැරණි නීතිය යටතේ ප්‍රකාශන අයිතිය ලබා දෙන කාලසීමාව වශයෙන් කර්තෘගේ ජීවිත කාලය හා ඉදිරියට තවත් වසර 50 ක් දක්වා තිබේ.[19] නව නීතිය මගින් මෙම අයිතිය තවදුරටත් දීර්ඝ කර ඇති අතර ඒ අනුව එය කර්තෘගේ ජීවිත

---

17. 2001 අප්‍රේල් 1 වන දින.
18. Colvert, Kieran, *'The inane life of Hong Kong's Shortest-lived ordinance'* Asiaweek, 2001 අප්‍රේල් 27 වන දින.
19. 1979 අංක 52 දරණ බුද්ධිමය දේපල නීති සංග්‍රහ පනතේ 19 (1) වගන්තිය.

කාලය හා තවත් වසර 70 ක් දක්වා දීර්ඝ කර තිබේ.[20] මෙම පනත මගින් ගෙන එන ලද තවත් වැදගත් තත්ත්වයක් වන්නේ පරිගණක වැඩසටහන්, ශ්‍රව්‍ය දෘෂ්‍ය කෘතියක් හෝ ශාබ්දික පටිගත කිරීමක් සම්බන්ධ ප්‍රකාශන අයිතිවාසිකම් සම්බන්ධයෙන් කාල සීමා සහිත පිළිගැනීමක් ලබාදීමයි.[21] එසේම එම පනතේ 12(7) (අ) වගන්තිය මගින් නීත්‍යානුකූල හිමිකරුහටද යම් පරිගණක වැඩසටහනක් ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ අනුවර්තනය කිරීම සීමා කර ඇති අතර විශේෂ අවස්ථා වලදී පමණක් එම වැඩසටහන් අනුවර්තනය කිරීම සඳහා නීත්‍යානුකූල හිමිකරුට අවසර දී තිබේ. නීත්‍යානුකූල හිමිකරුට ඇති මෙම අයිතිය එක් පිටපතකට පමණක් සීමාකර ඇති අතර එනම් එය එම පරිගණක වැඩසටහනෙහි භාවිතය සඳහා ප්‍රයෝජනවත් වන්නේ නම් හෝ ලේඛනාරක්ෂක කාර්ය සඳහා හා පරිගණක වැඩසටහනෙහි නීත්‍යානුකූල පිටපත නැති වුවහොත් එය නැවත ප්‍රයෝජනය කිරීමේ කාර්ය සඳහා පමණක් නීත්‍යානුකූල හිමිකරුට එක් පිටපතක් ගත හැකිබව දක්වා තිබේ. මෙම අවස්ථාවන්හිදී හැර වෙනත් අරමුණක් සඳහා එම පරිගණක වැඩසටහනේ පිටපතක් ළඟ තබා ගැනීම නීත්‍යානුකූල නොවන අතර එවැනි අනුවර්තනයක් හෝ පිටපතක් විනාශ කළයුතු බව පනත මගින් තවදුරටත් දක්වයි.[22] මෙම වගන්ති ක්‍රියාත්මක කිරීම හා ප්‍රායෝගික ප්‍රතිඵල එක්තරා අභියෝගාත්මක තත්ත්වයක් ඇති කරයි.

බුද්ධිමය දේපල පනතේ 12(5) වගන්තිය මගින් හඳුන්වා දී ඇති තවත් වැදගත් අංගයක් වන්නේ පුස්තකාල විසින් ප්‍රතිකෘත ශිල්පීය ප්‍රති නිෂ්පාදනයන් සහ ග්‍රන්ථවල ඡායා පිටපත් හෝ ලබා ගැනීම සීමා කිරීමයි.[23] සෘජුවම හෝ වක්‍රව වාණිජ්‍යමය ප්‍රතිලාභයක් සඳහා නොවන යම් පුස්තකාලයක් හෝ ලේඛනාගාරයක් විසින්, බලය දීමකින් තොරව, එම කෘතියක එක් පිටපතක් හෝ ලබාගත හැක්කේ,

(අ) එම පිටපත අධ්‍යයනය ශිෂ්‍යත්වයක් හෝ පෞද්ගලික පර්යේෂණ කටයුතු සඳහාම පමණක් ප්‍රයෝජනයට ගන්නා බවට එම පුස්තකාලය හෝ ලේඛනාගාරය සෑහීමකට පත් වන්නේ නම්: හා

---

20. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනතේ 13 (1) වගන්තිය.
21. බුද්ධිමය දේපල පනතේ 9 (1) වගන්තිය.
22. 12 (7) (ආ) වගන්තිය.
23. 12 (5) වන උප වගන්තිය නොමැති අවස්ථාවක 12 (5) උප වගන්තියේ දක්වන සීමා කිරීම් වලින් තොර වේ නම් පුස්තකාලයන්හි කරන ඡායා පිටපත් ගැනීම 11 වන වගන්තිය යටතේ සාධාරණ භාවිතයක් බවට දක්විය හැකිය.

එම ප්‍රතිනිෂ්පාදන ක්‍රියාව වෙන්කොට සැලකිය හැකි සිදුවීමක් වන්නේ නම්: සහ

(ආ) එම පිටපත ගනු ලබන්නේ සංරක්ෂණය පිණිස වන හා අවශ්‍ය වුවහොත් පිටපතක් ප්‍රතියෝජනය කිරීම පිණිස හෝ වෙනත් ඒ හා සමාන පුස්තකාලයක හෝ ලේඛනාගාරයක නිත්‍ය එකතුවකින් නැති වූ විනාශ වූ පාවිච්චියට ගත හොහැකි පිටපතක් ප්‍රතියෝජනය කිරීම සඳහා වන අවස්ථාවක හා එම ප්‍රතිනිෂ්පාදන ක්‍රියාව වෙන්කොට සැලකිය හැකි සිදුවීමක් වන්නේ නම් පමණි.

සංවර්ධිත මට්ටම නොසලකා ඕනෑම රටක ප්‍රකාශන අයිතිය ආරක්ෂා කිරීම අවශ්‍යතාවයක් ලෙස පිළිගත යුතු අතර මෙහිදී සිතේ තබාගත යුතු වැදගත් කරුණක් වන්නේ මෙම නීති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අවහිරතායි. ලංකාවේ බොහෝ පරිගණක භාවිතා කරන්නන් හා විශේෂයෙන්ම ගෘහස්ථ පරිගණක භාවිතා කරන්නන් පරිගණක වැඩසටහන් කොල්ලකෑමේ නියැලේ. පරිගණක භාවිතය සංවර්ධනයේ අනිවාර්ය කොන්දේසියක්ය යන කරුණ සිතා බැලීමේදී ශ්‍රී ලංකාව වැනි රටක ප්‍රකාශන අයිතිය සම්බන්ධ නීති බලාත්මක කිරීමේදී ඇතිවන අයහපත් බලපෑම් ගැන සිතා බැලීම වැදගත් වේ. මෙම වැඩසටහන්වල බලයලත් පිටපතේ අධික මිල නිසා එය පරිගණක භාවිතා කරන්නන්ගේ උද්යෝගය හීන කරන්නක් වේ. බොහෝ සංවර්ධිත රටවල සමාජයේ පහළම පන්තියට වුවද මහජන පුස්තකාලයකදී නොමිලයේ පරිගණක භාවිතය සඳහා ළඟාවිය හැකිය. මෙමගින් අන්තර්ජාලය සේම පරිගණක වලට මූලික වශයෙන් ළඟාවීම යම් තරමක මට්ටමකට තහවුරු කරයි. සංවර්ධනය වන රටවල මහජන පුස්තකාලයක නොමිලයේ පරිගණක භාවිතා කිරීමේ පහසුකම එළඹෙන අනාගතයක හෝ සිදුවිය නොහැකිය.

යම් ද්‍රව්‍යයක ඡායා පිටපත් ගැනීමේදී ඇතිවන තත්ත්වයද මීට වඩා වෙනස් නොවේ. විශ්ව විද්‍යාල පුස්තකාලවල මූලිකම පොත් සම්බන්ධයෙන් මෙම තත්ත්වය බැලීමේදී 12 (5) වගන්තිය ක්‍රියාත්මක කිරීම සත්‍ය වශයෙන්ම අභියෝගාත්මක බව කෙනෙකුට පැවසිය හැකිය. මෙ මගින් පැහැදිලිවන කරුණ නම් ප්‍රකාශන අයිතිය ආරක්ෂා කිරීම එක් අතකින්නුත් අධ්‍යාපනයට ඇති අයිතිය හා සංවර්ධනය සඳහා ඇති අයිතිය අනෙක් අතිනුත් සමබරව පවත්වා ගත යුතු බවයි.

සෑම මානව අයිතිවාසිකමකම මව ලෙස දක්වා ඇත්තේ සංවර්ධනයට ඇති අයිතිවාසිකමයි. එය 'නිදහස, යුක්තිය හා නිර්මාණාත්මක බව'[24] යන සංකල්ප වලට වඩා ඉහළින් තිබිය යුත්තක් සේ සලකන අතර මෙ මගින් සියලුම සිවිල් දේශපාලන, සමාජ, ආර්ථික හෝ සංස්කෘතික අයිතිවාසිකම්හි යථාර්ථවත් බව තහවුරු කරයි. සමහර ලේඛකයන් ස්වයං නිර්ණය අයිතිය හා සංවර්ධනය සඳහා ඇති අයිතිය අතර සමානත්වයක් ඇති බව ප්‍රකාශ කරයි. ස්වයං නිර්ණය අයිතිය නැතිකල සිවිල් හා දේශපාලන අයිතීන් වලට පැවතීමට පුළුවන්ද යන්න සිතාගත නොහැකි අතරම සංවර්ධනය සඳහා ඇති අයිතියෙන් තොරව සමාජ හා ආර්ථික අයිතිවාසිකම් තේරුම් ගත හැකි වන්නේ සාවද්‍ය ලෙසටයි.

සංවර්ධනය සඳහා ඇති අයිතිය ප්‍රථමයෙන්ම හුවා දක්වන ලද්දේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 55 හා 56 යන වගන්ති මගිනි. එමගින් වඩා උසස් ජීවන තත්ත්වයක්, සියල්ලන්ටම රැකියා හා ආර්ථික හා සමාජයීය අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අවශ්‍ය තත්ත්වයන් නහා සිටුවීම සඳහා රජය සතු බැදියාවන් පිළිගනියි.[25] මෙය තවදුරටත් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 28 වන වගන්තිය මගින් ශක්තිමත් කර ඇති අතර එමගින් දක්වන්නේ මෙම ප්‍රකාශනයෙහි සඳහන් අයිතිවාසිකම් සහ ස්වාධීනතාවන් පරිපූර්ණව සාක්ෂාත් කරගත හැකිවන සමාජ හා ජාත්‍යන්තර රටාවකට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇති බවයි.

සංවර්ධනය සඳහා ඇති අයිතිය සම්බන්ධයෙන් සැලකිය යුතු වැදගත්ම මූලාශ්‍රය වන්නේ සංවර්ධනය සඳහා ඇති අයිතිය සම්බන්ධයෙන් දැක්වූ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයයි.[26] එම ප්‍රකාශනයෙහි 1 වන වගන්තිය මගින් දක්වන්නේ 'මෙම මානව අයිතිය සත්‍ය වශයෙන්ම අහිමි කළ නොහැකි මානව අයිතියක් වන අතර සෑම මනුෂ්‍යයෙකුම හා සියලුම පුද්ගලයන් ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා දේශපාලන සංවර්ධනයන්ට සහභාගී වීමට, සම්මාදම් වීමට හා භුක්ති විඳීමට ඇතුළත් වන අතර එමගින් මානව

---

24. Bedjaoui, M., 'The right to Development', International Law: Achievements and Prospects (1991), පිටුව 1182. Excerpts in steiner and Alston, International Human Rights in Context (දෙවන මුද්‍රණය) Oxford University Press (2000) පිටුව 1321.

25. 55 (අ) වගන්තිය.

26. සංවර්ධනය සඳහා ඇති අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයේ 1 වන වගන්තිය, පොදු සභාවේදී ගන්නා ලද විසඳුම 41/128 1986 දෙසැම්බර් 4 වන දින.

අයිතිවාසිකම් හා මූලික නිදහස්කම් සම්පූර්ණ වශයෙන් හඳුනාගෙන ඇත' යන්නයි. එම ප්‍රකාශනය පැහැදිලිව දක්වන්නේ සංවර්ධනය වීමට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාසිවන අයුරින් ජාතික හා ජාත්‍යන්තර කොන්දේසි නිර්මාණය රජයක ප්‍රාථමික වගකීමක් වන බවයි.[27]

ප්‍රකාශන අයිතිය හෝ ඒ හා සම්බන්ධ වෙනත් අයිතීන් ආරක්ෂා නොකිරීම හෝ නොකළ යුතු බවට පූර්ව විග්‍රහයක් මඟින් ඇති කළ ව්‍යංග මාගීයක් හෝ නැත. සෑම මානව අයිතියකටම පදනම වන සාධාරණව ක්‍රියා කිරීම (fair play) හා යුක්තිය යන මතයන් වලට විරුද්ධව මෙම යෝජනාව ගමන් කරයි. මෙම එකිනෙකට විරුද්ධ හා එකිනෙකට සට්ටනය වන බුද්ධිමය දේපල අයිතිවාසිකම් හා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නිවැරදි සමබරතාවයක් ඇති කිරීම විශේෂයෙන්ම සංවර්ධනය වන රටවල් සම්බන්ධයෙන් වැදගත් වේ. සමහරක් සංවර්ධිත රටවල බලාත්මක කරන තදබල නීතින් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට සංවර්ධිත රටවල ඇති සුභසාධන හා සමාජ ආරක්ෂණ සේවාවන් සංවර්ධනය වන රටවල අඩු හෙයින් නොහැකි වේ. බුද්ධිමය දේපල අයිතිවාසිකම් ආරක්ෂා කරන පුද්ගලයන් විසින් 'වෙනත් රටක නීතියක් ඒ ආකාරයෙන්ම පිටපත් කිරීම' පිළිබඳ ලිහිල් ආකල්ප හඳුන්වාදීම මඟින් දුප්පත්කමින් පීඩා විඳින මිලියන ගණන් ජනතාවගේ මානව හිමිකම් කඩවීමක් හා සැලකිය යුතු සමාජ අසාධාරණයක් ඇති කරයි.

## 2.3 කුසගින්නෙන් තොරව ජීවත්වීමේ නිදහස හා පේටන්ට් ආරක්ෂා කිරීම

ආහාර හිඟයකින් හෝ කුසගින්නෙන් තොරව සිටීමේ මානව අයිතිවාසිකම මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ සේම ICESCR තුළද අන්තර්ගත කර තිබේ. ICESCR හි 11(1) වගන්තිය මඟින් 'සෑම අයෙකුටම ප්‍රමාණවත් ආහාර ලබා ගැනීමට අයිතියක් ඇති බව දක්වයි' 11(2) වගන්තිය මඟින් දක්වා තිබෙන්නේ 'කුසගින්නෙන් තොර වීමට ඇති මූලික අයිතිය පිළිගැනීම සඳහා රාජ්‍ය පාර්ශවයන් ගිවිස ගන්නා බවයි.' මෙම 'මූලික' යන වචනය මඟින් ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය යටතේ රාජ්‍ය පාර්ශවයන්ට පවත්නා සම්පත් තුළින් බැඳියාවන් වැඩි දියුණු කිරීමට, ආරක්ෂා කිරීමට

27. 3 වන වගන්තිය.

හා සපුරා දීමට අවශ්‍ය අත්‍යවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගැනීමට පුළුපුළුල් බැඳියාවක් පතවයි.[28]

මේ අනුව තවත් වැදගත් කරුණක් ලෙස 11(2) වගන්තියේ සඳහන් රාජ්‍ය පාර්ශවයන් විසින් ගත යුතු විශේෂ ක්‍රියා මාර්ගයන් පහත අයුරින් වේ:

> 11(2)(අ) වගන්තිය අනුව *ශිල්පීය හා විද්‍යාත්මක දැනුම උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගනිමින්ද* පෝෂණය සම්බන්ධ මූල ධර්ම පිළිබඳ දැනුම ව්‍යාප්ත කරමින්ද, ස්වාභාවික සම්පත්වල ඉතාම සාර්ථක සංවර්ධනය හා උපයෝගීකරණය අරභයා කෘෂිකාර්මික ක්‍රම වර්ධනය හෝ ප්‍රතිසංස්කරණය මගින්ද, ආහාර නිෂ්පාදන, සංරක්ෂණ හා බෙද හැරීම් ක්‍රම දියුණු කිරීම සඳහාත් ක්‍රියා කළයුතු බව දක්වයි.

වර්තමානයේ තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම බහුජාතීය ජීව තාක්ෂණ සමාගම් අතළොස්සකට සීමාවීම ඉහත වගන්තියට පටහැනිය. රාජ්‍යයන් විසින් මෙම නිපදවීම්වල 'උපරිම ප්‍රයෝජන ගැනීමට' ක්‍රියා කරනවාට වඩා එම භාවිතය මගින් බහුජාතික සමාගම් හි ලාභ වර්ධනය කර තිබේ. මෙම බහු ජාතික සමාගම් ජෛව තාක්ෂණයන් සඳහා පේටන්ට් ගැනීමට පුළුපුළුල් වන අතරම බොහෝ කාලයක් තිස්සේ සංවර්ධනය වන රටවල ගොවියන් අත තිබූ සාම්ප්‍රදයික පැලෑටි වර්ග සඳහාද පේටන්ට් ගැනීමටද මොවුහු උත්සුක වෙති. මේ සම්බන්ධයෙන් ගත හැකි ප්‍රකටම උදහරණය වන්නේ බාස්මතී හාල්, කොහොඹ පැල, කොතල හිඹුටු හා තවත් විවිධ ස්වදේශීය පැල සඳහා පේටන්ට් ගැනීමයි.

බීජ සඳහා පොහොර, කෘමිනාශක හා වෙනත් රසායන ද්‍රව්‍ය සඳහා ගොවියන් මෙම සමාගම් මත යැපීමේ ප්‍රතිඵලය ජෛව තාක්ෂණ සමාගම් මගින් බීජ සඳහා පේටන්ට් ගැනීම මගින් ඇති කරන අතරම එමගින් ජෛව විවිධත්වය දැඩි ලෙස අඩු කරයි. මෙම මාතෘකාව පිළිබඳ ඇති පුළුල් සාකච්ඡාවක් මෙම ලිපියෙහි අඩංගු කරුණු වලින් ඔබ්බට යන අතර: ගොවියන් විසින් අවුරුදු දහස් ගණනක් තිස්සේ වර්ධනය කරන ලද සිය ගණන් විවිධ ගොයම් වර්ග දැන් අතුරුදහන්ව ඇති අතර ඒ සඳහා පේටන්ට්

28. මෙම අයිතිවාසිකමෙහි ඇතුළත් දේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා Alston, Philip, 'International Law and the Right to Food' පිටුව 162 සහ Alston, Philip සහ Eide, Asbjon, 'Advancing the Right to food in International Law' පිටුව 249. ආහාර මානව හිමිකමක් ලෙස, එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලය (1984) සිංගප්පූරුව.

බලපත්‍ර ඇති ස්වල්ප සංඛ්‍යාවක් බීජ ස්ථාපිත කර තිබේ. මෙම බහු ජාතික තාක්ෂණික සමාගම් විසින් බීජ ස්ථිරසාරව පවත්වාගෙන යෑම සඳහා විවිධ තාක්ෂණ යොදා කෘමිනාශක පොහොර නිපදවීම මගින් ගොවියන් පාලනය කරන අතර විනාශකාරී තාක්ෂණය මගින් බීජ ස්වයං විනාශයට පමුණුවන අතර ඒවා නැවත නිපදවීමට නොහැකිය. මෙමගින් ගොවියන්, මෙම සමාගම් වලට යටත් පිරිසක් බවට පත්වන අතර, එමගින් ඔවුන්ගේ සමාගම් වලින් දිගටම බීජ ලබා ගැනීම සඳහා දුෂ්ට රාමුවක් තුළ ගොවියන්ට විලංගු දමයි.

එක්සත් ජාතීන්ගේ මහලේකම් කොෆි අනන් විසින් වරක් ප්‍රකාශ කරන ලද්දේ,

> *'භාණ්ඩ හා සේවාවන් උදසීනව සපයන්නන් ලෙස සමාගම් දක්විය හැකි අතර වෙළඳ බලයන් තුළ හැම දෙනාගේම යහපත ඇතිබව නිරන්තරයෙන්ම අපට උපකල්පනය කළ හැකිය. අන්තර්ජාතික සමාගම් විසින් ගෙන යන ආහාර ක්‍රමයෙහි ඒකාධිකාරය මගින් ඒකාධිකාරී ලාභයක්ම ඇති කිරීම, පැහැදිලිවම වේගවත්ව සිදුවන අතර එමගින් පාරිභෝගිකයන්ට වඩා සමාගම් වලට වාසි සැලසෙන බවයි.'*[29]

බුද්ධිමය දේපල නීතිය මගින් දෙන විශ්වීය නෛතික රැකවරණයත් සමගම ජෛව තාක්ෂණ සමාගම් හි මෙම අව්වාරවත් හැසිරීම කුඩා හා මධ්‍යම පාන්තික ගොවීන්ගේ ජීවිත වලට අවාසිදයක බලපෑමක් ඇති කරයි. කෘෂිකාර්මික ඉඩම් අතරින් 49% ක් පර්චස් 40 කට වඩා අඩු භූමි ප්‍රමාණයක සිය වගා කටයුතු කරන ලංකාව වැනි රටවලට එමගින් තවත් ප්‍රතිවිරුද්ධ බලපෑමක් ඇති කරන අතර නිවසේ පාරිභෝජනයට පමණක් මෙමගින් එලදවක් ගත හැකිය.[30]

## 3. බුද්ධිමය දේපල අයිතිවාසිකම් වලට එරෙහිව මානව හිමිකම් - සමබරතාවයන් ගොඩ නැංවීමේ අවශ්‍යතාවය

ඉහතදී සාකච්ඡා කළ පරිදි ඕනෑම රටක බුද්ධිමය දේපල නීතිය සම්බන්ධව නීති සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. එම නීති මගින් මානව හිමිකම්

---

29. ආහාර සඳහා අයිතිවාසිකම, එක්සත් ජාතීන්ගේ මහලේකම් විසින් දක්වන ලද, A/58/330, 2003 අගෝස්තු 28 වෙනි දින.

30. ශ්‍රී ලංකා ජන සංඛ්‍යා හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව (2002).

උල්ලංඝනය වීමක් සිදුවිය හැකි බැවින් මූලික වශයෙන්වත් එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස බුද්ධිමය දේපල නීතිය හා මානව අයිතිවාසිකම් අතර අවශ්‍ය සමබරතාවයන් තහවුරු කිරීම අභියෝගාත්මක කාර්යයක් වී ඇත. පේටන්ට් සම්බන්ධ නීතිය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන්ම ලිහිල් පිළිවෙත් දෙකක් අනුගමනය කර ඇත. එනම්: පළමුව, බුද්ධිමය දේපල නීතිය මඟින්ම මෙම අරමුණ ඉෂ්ට කිරීම සඳහා ඇතැම් විධිවිධාන ගොඩ නංවා ඇත. දෙවනුව, දැනට පවතින අන්තර් ජාතික මානව හිමිකම් නීතිය සහ සදාචාරාත්මක සාධාරණීකරණයන් මඟින් මහජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

## 3.1 බුද්ධිමය දේපල අයිතිවාසිකම් තුළ ඇති සහනයන්

TRIPS සම්මුතිය, 2003 බුද්ධිමය දේපල පනත සහ දෝහා ප්‍රකාශනය[31] වැනි සම්මුති තුළ අඩංගු ලිහිල් විධිවිධාන බොහෝ අවස්ථා වලදී මානව හිමිකම් ආරක්ෂා කර දීමට යොදගැනීමට හැකිවී ඇත. ලෝක වෙළඳ සංවිධානයෙහි TRIPS සම්මුතිය මඟින් මෑතකදී ගනු ලැබූ ඇතැම් තීරණ මඟින් එම තත්ත්වය තවදුරටත් පුළුල් කර ඇත. මෙම ලිහිල් විධිවිධාන බුද්ධිමය දේපල නීතිය පිළිබඳ පනතේ මූලිකවම අන්තර්ගතව නොතිබී අතර පසුව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වන ලද කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ඇතුළත් කරන ලදී.

බුද්ධිමය දේපල පනත[32] පිළිබඳ සලකා බැලීමේදී එය මිලියන සංඛ්‍යාත වූ ලාංකික ජනතාවට සහ අනාගත පරම්පරාවට ඉතා තදබල ලෙස බලපානු ලබන තීන්දුවක් ලෙස පැසසීමට හැකිවේ. ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටක දුප්පත් පාරිභෝගිකයන්ට හා කර්මාන්තකරුවන්ට බලපානු ලබන යෝජිත ව්‍යවස්ථාව විග්‍රහ කිරීමේදී අග්‍ර විනිශ්චයකාර සරත් එන්. සිල්වා දුර දක්නා පිවිසුමක් සකස් කරගෙන ඇත. එහිදී අධිකරණය පේටන්ට් හිමියන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව විශේෂ අවධානය යොමුකළ අතර පැළෑටි සහ ක්ෂුද්‍ර ජීවීන් සම්බන්ධ පේටන්ට් බලපත්‍ර කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. මෙම නඩු තීන්දුව ලාංකිකයන්ගේ පමණක්

31. 2001 දෝහා, කටාර් හිදී පැවති ලෝක වෙළඳ සංවිධානයේ හතරවන ඇමති මණ්ඩල රැස්වීමේදී මෙම ප්‍රකාශය එළි දක්වන ලදී. සියැට්ල් ඇමති මණ්ඩල රැස්වීමේදී කිරීමට අසමත් වූ දෙය අනුගමනය කරමින් සංවර්ධනය වන රටවල් මුහුණ පාන අභියෝගයන් මෙහිදී හඳුනා ගන්නා ලදී.

32. ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීන්දුව අංක. 14/2003.

නොව දියුණු වෙමින් පවතින හා අනාගතයේදී TRIPS සම්මුතිය ස්ථිර කිරීම සඳහා වූ බුද්ධිමය දේපල නීතීන් සම්පාදනය කිරීම තර්ජනයක් වී ඇති ඌන සංවර්ධිත රටවලද ජයග්‍රහණයකි.

ශ්‍රේෂ්ඨාධිකරණය දක්වූයේ,

> *"...12(1) ව්‍යවස්ථාවේ කියැවෙන පරිදි සමාන අයිතිවාසිකම් සේම සමාන රැකවරණය TRIPS සම්මුතියේ සඳහන් ලිහිල් කිරීමේ වගන්ති පිළිබඳ අවධානය යොමු නොකර සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවලට සමානව අදාළ කර ගත නොහැක යනුවෙනි."[33]*

> *"නිෂ්පාදනයට සහ නිෂ්පාදන ක්‍රියාවලියට පේටන්ට් ලැබූ නිර්මාණකරුවන් සහ ඔවුන්ගේ නියෝජිත ආයතන බොහෝ දුරට සංවර්ධිත ජාතීන් වන අතර එම නිපැයුම් ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල පාරිභෝගිකයන් පරිහරණය කරනු ලබන අතර එවැනි වාතාවරණයක් තුළ මෙම දියුණු සහ දියුණුවෙමින් පවතින රටවල තත්ත්වය සමාන ලෙස සැලකීමට නොහැකි වේ. මෙම කරුණ සාධාරණීකරණය කිරීමෙහිලා තිබෙන සාක්ෂි බොහෝය."[34]*

මෙම නඩු තීන්දුවෙහි දක්වා ඇති ලිහිල් විධිවිධාන TRIPS සම්මුතිය සේම දෝහා ප්‍රකාශනයේද සඳහන්ව ඇති බව, 'මහජනතාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා රජයන් විසින් ගන්නා ක්‍රියා මාර්ගයන් සම්බන්ධව TRIPS සම්මුතිය මගින් නොවළක්වයි' යනුවෙන් පිළිගැනීමෙන්ම පැහැදිලි වේ.[35] මෙම ලිහිල් විධිවිධාන රටවල්වල මහජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය ආරක්ෂා කිරීම හා දියුණු කිරීම සම්බන්ධව උපයෝගී කරගත හැකිවේ. එම නිසා බුද්ධිමය දේපල නීතිය ආරක්ෂා කිරීම හා මානව හිමිකම් අතර සමබරතාවය ඇති කිරීමට උත්සාහ කිරීම අත්‍යවශ්‍ය බව තේරුම් ගත යුතුය. 'TRIPS හා මහජන සෞඛ්‍යය' යන මාතෘකාව යටතේ රජයන්ගේ අයිතිවාසිකම් ලෙස පහත සඳහන් අවස්ථා හඳුනාගෙන තිබේ.

---

33. එම 7 පිටුව.

34. එම 7 පිටුව.

35. 'TRIPS සම්මුතිය හා මහජන සෞඛ්‍යය සම්බන්ධ ප්‍රකාශනයේ'-4 වන වගන්තිය. Doha WTO Ministerial, 2001 නොවැම්බර්, WT/MIN (01) / DEC/2.

- **අනිවාර්ය බලපත්‍ර**

අනිවාර්ය බලපත්‍ර දීම යනු පේටන්ට් බලපත්‍ර දරන්නාගේ කැමැත්තකින් තොරව පේටන්ට් අයිතිය ලබා දීමයි. එසේ වුවද මෙහිදී පේටන්ට් අයිතිය දරන්නාට ප්‍රමාණවත් වන්දි ලබාදීමක් සිදුකළ යුතුය. TRIPS සම්මුතියේ 21 වන වගන්තිය මගින් අනිවාර්ය බලපත්‍ර දීම සඳහා විශේෂ අවස්ථා වලදී අවසර දී ඇත. මේ අනුව, මෙවැනි ජාතික හදිසි තත්ත්වයක් යටතේ යෝජිත භාවිතා කරන්නා විසින් නිවැරදි අයිතිකරුගෙන් සාධාරණ වෙළඳ නියමයන් හා කොන්දේසි මත අදාළ බලය ලබා ගැනීමට උත්සාහයක් දරා තිබියදී ඔහුට එම උත්සාහය සාධාරණ කාලයක් තුළ සාර්ථක කරගත නොහැකි නම්, මෙවැනි බලපත්‍රයක් රජයකට හෝ තුන්වන පාර්ශවයකට ප්‍රදනය කරයි.

TRIPS සම්මුතිය මගින් මෙම තත්ත්වය දක්වන්නේ:

– අදාළ අධිකාරිමය නිපැයුමෙහි ආර්ථික අගය සලකා බලා එක් එක් සිද්ධියට අදාළ අවස්ථානුකූල කරුණු අනුව අයිතිවාසිකම් දරන්නාට වන්දි ගෙවීමක් සිදුකළ යුතුය.[36]

– පූර්ව භාවිතය යටතේ දේශීය වෙළඳපොළට එම භාණ්ඩ යැවීමට බලය තිබූ බව පැහැදිලිව පෙනේ නම් එහිදී බලයලත් පුද්ගලයාට ඒ සම්බන්ධයෙන් බලය ලැබේ.[37]

TRIPS සම්මුතිය පිළිබඳ ප්‍රකාශනය මහජන සෞඛ්‍යය පිළිබඳව වඩා නිදහස් ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලබන අතර එමගින් තවදුරටත් දක්වනු ලබන්නේ 'සෑම සාමාජික රටකටම අනිවාර්ය බලපත්‍ර ලබා දීමට සහ එවැනි අනිවාර්ය බලපත්‍රයක් ලබා දෙන්නේ කුමන පදනමක් මතද යන්න නිදහස්ව සිතා බැලීමට අයිතියක් දී ඇති බවයි'[38] මෙම තත්ත්වය දේශීය නීතියේ දක්වනු ලබන බුද්ධිමය දේපල පනතෙහි 86(2) වැනි වගන්තිය සහ TRIPS සම්මුතියෙහි 31 වැනි වගන්තියට අනුරූපී වන බව කෙනෙකුට සිතිය හැකිය.

86(2)(අ) මෙහි මින් ඉදිරියට විධිවිධාන සලස්වා ඇති ආකාරයට පේටන්ට් බලපත්‍රයක් උපයෝජනය කිරීමේ කාර්ය සඳහා යම්

36. 31 (ඌ) වගන්තිය.
37. 31 (ඉ) වගන්තිය.
38. 5 (ආ) වගන්තිය.

තැනැත්තෙකු, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැක.

86(2)(ආ) ඒ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, එම ඉල්ලුම්කරු සාධාරණ වාණිජමය නියමයන් හා කොන්දේසි මත අයිතිවාසිකම් දරන්නාගේ අනුමැතිය ලබා ගැනීමට උත්සාහ දරා ඇති බවට හා එම උත්සාහය සාධාරණ කාලසීමාවක් ඇතුළත සාර්ථක වී නොමැති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් එම උපයෝජනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය.

බුද්ධිමය දේපල නීතිය පිළිබඳ පනත් කෙටුම්පත අර්ථ නිරූපණය කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණය[39] විසින් අනිවාර්ය බලපත්‍ර හි ඇති වැදගත්කම අවධාරණය කර ඇත. මෙම පනත් කෙටුම්පතෙහි TRIPS සම්මුතිය මගින් පුළුල් කර දක්වන වගන්ති හෝ දෝහා ප්‍රකාශනය මගින් පිළිගත්තා ලද අනිවාර්ය බලපත්‍ර පිළිබඳ වගන්ති ඇතුළත් නොවේ. ශ්‍රේෂ්ඨාධිකරණය තවදුරටත් අවධාරණය කරණු ලැබුවේ මෙම ලිහිල් කිරීම බැහැර කළහොත් එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් තහවුරු කර ඇති ආරක්ෂාව සෑම දෙනාටම සමානව නොලැබී යා හැකි බවයි. තවදුරටත් අධිකරණය දක්වා සිටියේ සමාන ලෙස නොසැලකිය හැකි සංවර්ධිත, සංවර්ධනය වෙමින් පවතින හා ඌන සංවර්ධිත රටවල් සඳහා TRIPS සම්මුතිය එකසේ අදාළ වන බවයි. ඒ අනුව විවිධ රාජ්‍යයන්ගේ විශේෂ වූ සහ විවිධ වූ අවශ්‍යතා මත TRIPS සම්මුතිය බලාත්මක කරගත හැකි බවයි.

## ● ජාතික හදිසි අවස්ථාවන් සහ රජයේ භාවිතයන්

ජාතික හදිසි අවස්ථා වලදී පේටන්ට් බලපත්‍ර දරන්නාගේ අවසරයකින් තොරව බලපත්‍ර නිකුත් කිරීමට රජයට බලය ඇත. මෙය අප මෙයට ඉහතදී සාකච්ඡාවට බඳුන් කරනු ලැබූ TRIPS සම්මුතියේ 31 වැනි වගන්තියේ ඇති සීමා කිරීම් වලට විෂය නොවේ. බුද්ධිමය දේපල පනතෙහි 86(2)(ඇ) වගන්තිය අනුව දක්වන්නේ 86(2)(ආ) වගන්තිය යටතේ දක්වා ඇති අවශ්‍යතා බුද්ධිමය දේපල පිළිබඳ අධ්‍යක්ෂවරයා විසින් අත් හරිනු ලබන අවස්ථායි. ඒ අනුව 'ජාතික හදිසි තත්ත්වයක් පවතින බවට හෝ වෙනත් යම් අතිශය හදිසි අවස්ථාගත කරුණු පවතින බවට සෑහීමට පත්වීමෙන්

39. ඉහත 32 වන අංකය.

පසුව හෝ ජාතික ආරක්ෂාව, පෝෂණය, සෞඛ්‍යය හෝ ජාතික ආර්ථිකයේ වෙනත් අත්‍යවශ්‍ය අංග සංවර්ධනය යනාදී වාණිජමය නොවන මහජන කාර්යයක් සඳහා හෝ වන අවස්ථාවක, (ආ) ඡේදයේ දක්වෙන නියමයන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැකිය.'

86(1) (ඇ) වගන්තියෙහි පසු භාගය මගින් දක්වා ඇති, වානිජමය නොවන මහජන කාර්යය යන්න, එංගලන්තය, ඇමරිකා එක්සත් ජනපදය හා කැනඩාව වැනි සංවර්ධිත රටවල් අනිවාර්ය බලපත්‍ර නිකුත් කිරීමේදී ඉතාමත් නම්‍යශීලීව උපයෝගී කරගනී. සංවර්ධනය වන රටවල දුප්පත්කම සලකා බැලීමේදී මෙම 'රජයන්හි භාවිතය' හෝ 'වාණිජමය නොවන භාවිතය' යන්න එම රටවලට ඉතා වැදගත් වේ. පේටන්ට් භාවිතයේ අරමුණ හෝ ස්වභාවය මත රජයේ භාවිතය පිළිබඳ වගන්ති හා අනිවාර්ය බලපත්‍ර පිළිබඳ වගන්තිවල වෙනස මූලික වශයෙන් රඳා පවතී. රජයේ භාවිතයේදී එය "වාණිජමය නොවන මහජන කාර්යයක්" යන්නට සීමා විය යුතු අතර අනිවාර්ය බලපත්‍ර, මගින් පෞද්ගලික සේම වාණිජමය භාවිතයෙන්ද ආවරණය කළ යුතුය.[40]

රාජ්‍යය භාවිතය නම්‍යශීලි සංකල්පයක් බව මහජන යහපත උදෙසා වූ ලාභදායී නොවන පරමාර්ථ උදෙසා පේටන්ට් සම්බන්ධ අවසාන අධිකාරීමය බලය රජය වෙත තබා ගැනීමෙන්ම පැහැදිලි වේ. මෙහිදී මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ රජයේ භාවිතයන් පිළිබඳ වූ තත්ත්වයකදී වුවද පේටන්ට් බලපත්‍ර දරන්නන්ට වන්දි ලබා දීමයි. බුද්ධිමය දේපල පනතේ 86(1) (ඉ) වගන්තිය මගින් පේටන්ට් බලපත්‍රයෙහි ආර්ථික වටිනාකම පිළිබඳ සිතා බලා ප්‍රමාණවත් පාරිශ්‍රමිකයක් පේටන්ට් බලපත්‍ර හිමියාට ගෙවිය යුතුය. බුද්ධිමය දේපල නීතිය සම්බන්ධව සංවර්ධිත රටවල තත්ත්වය සැලකීමේදී වඩාත් නිදහස් (Liberal) නෛතික තත්ත්වයක් දකගැනීමට පුළුවන.[41] උදහරණයක් ලෙස, එක්සත් රාජධානියේ 1977 පේටන්ට් පනත පෙන්විය හැකිය. එම පනතේ දක්වා ඇත්තේ,

---

40. මහජන සෞඛ්‍යය සම්බන්ධ යහපත් ක්‍රියාකාරකම් පිළිබඳ සංග්‍රහය: Sensitive Policy Measures and patent Laws, Third World Network (2003) පිටුව 33.

41. රජයේ භාවිතයන් දක්වන අනෙකුත් නීති සඳහා බලන්න. ඇමරිකා එක්සත් ජනපදයේ 28 USCS 1998 (1997) 1970 ඕස්ට්‍රේලියාවේ පේටන්ට් නීතියේ 29 වන වගන්තිය. නවසීලන්තයේ පේටන්ට් පනතේ 55 (1) වගන්තිය සහ සිංගප්පූරුවේ පේටන්ට් පනතේ (1994) 65 වන වගන්තිය.

55 (1) වගන්තිය

*"මේ පනතේ කිසිවක් නොතකා රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍යය දෙපාර්තමේන්තුවක් විසින් බලය පවරනු ලැබූ පුද්ගලයෙක් විසින් හෝ රාජ්‍ය සේවය සඳහා මෙම වගන්තිය අනුව, අයිතිකරුගේ කැමැත්තකින් තොරව එක්සත් රාජධානියෙහි පේටන්ට් බලපත්‍ර ඇති නිමැවුමක් සම්බන්ධව පහත සඳහන් ද සිදු කළ හැකිය.*

*(අ) (i.) සෑදීමක්, භාවිතයක්, ආනයන කිරීමක් හෝ නිෂ්පාදනයක් තබා ගැනීමක්..."*

මෙය ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල නීතිය හා සම්බන්ධව සසඳ බැලූවිට පැහැදිලි සහ පුළුල් අධිකාරිත්වයක් රජයේ භාවිතයන් සම්බන්ධව ඉහත වගන්තිය මගින් එක්සත් රාජධානියේ ඇති කර තිබේ.

## ● සමගාමී ආනයනය

TRIPS සම්මුතිය සහ දෝහා ප්‍රකාශනය මගින් සමගාමී ආනයනයට අවසර ලබා දී ඇති අතර මෙමගින් සිදුවනුයේ පේටන්ට් නිෂ්පාදන ආනයනය කිරීම සහ නැවත විකිණීමයි.[42] එවැනි ආනයනකරුවකු හට වෙනත් රටක නිපදවනු ලබන පේටන්ට් බලපත්‍ර සහිත නිපැයුමක් නිදහසේ ආනයනය කිරීමට හැකියාව ඇත. පේටන්ට් බලය ඇති නිෂ්පාදන ආනයනය කිරීමට ඇති අයිතිය අනුමිත නොවන අතර එය රට තුළ වූ නීතියට අන්තර්ගත කළ යුතු වේ. "අයිතිවාසිකම්හි ජාත්‍යන්තර ශූන්‍යකරණය" යන මූල ධර්මය යටතේ සමගාමී ආනයනය සම්බන්ධ මූල ධර්මයන් පුළුල් හා ලිහිල් වන අතර එමගින් ඕනෑම රටක පේටන්ට් සහිත නිෂ්පාදනයක් ආනයනය කළ හැකි වේ. බොහෝ රටවල මෙම තත්ත්වය සමගාමී ආනයනයන් යටතේ පිළිගෙන තිබේ.

ශ්‍රේෂ්ඨාධිකරණය බුද්ධිමය දේපල නීතිය සම්බන්ධ පනත් කෙටුම්පත පිළිබඳ අදහස් දක්වීමේදී දියුණු වෙමින් පවතින රටවලට සමගාමී ආනයනයේ ඇති වැදගත්කම පිළිබඳ අවධාරණය කර ඇත. එම භාණ්ඩ පේටන්ට් බලපත්‍ර සහිත භාණ්ඩ වුවත්, එමගින් ලෝක වෙළඳපොළ තුළ භාණ්ඩ අඩු මිලට

42. TRIPS ගිවිසුමේ 6 වන වගන්තිය මගින් සමගාමී ආනයන සම්බන්ධ මූල ධර්මය යොදා ගැනීම සඳහා තීරණ ගැනීමට සාමාජිකයන්ට ඉඩ සලසයි. දෝහා ප්‍රකාශනයේ 5 (ඇ) ඡේදය මගින් මෙය නැවත තහවුරු කර තිබේ.

පැවතීමේ හැකියාව වාසිදයක කරුණක් ලෙස හැඳින්විය හැකිය. බුද්ධිමය දේපල පනතෙහි 86 (1) (iv) වගන්තිය මගින් සමගාමී ආනයනයට ඉඩ සලසන නමුත් අයිතිවාසිකම්හි ජාත්‍යන්තර ශූන්‍යකරණය හා සෘජුවම සම්බන්ධ නොවේ.[43] දෝහා ප්‍රකාශනය සහ TRIPS සම්මුතිය මගින් පැහැදිලි වනුයේ අයිතිවාසිකම්හි ජාත්‍යන්තර ශූන්‍යකරණය පුළුල් අර්ථයෙන් ගත් කල සමගාමී ආනයනයන් ස්ථාපිත කිරීම සඳහා ප්‍රමාණවත් වන බවයි. මේ සම්බන්ධව සැලකීමේදී දකුණු අප්‍රිකාව,[44] මැලේසියාව[45] වැනි රටවල බුද්ධිමය දේපල නීතිය මෑතකදී වඩා ප්‍රගතිශීලී විධිවිධාන ගෙන තිබේ.

## ● TRIPS සභාවේ මෑත කාලීන ප්‍රගතීන්

TRIPS සම්මුතිය යටතේ ඉහත සඳහන් කරන ලද සහනයන් අතරින් වඩාත් ආකර්ශණීය සහනය ලෙස අනිවාර්ය බලපත්‍ර ප්‍රදානය කිරීමට ඇති හැකියාව දක්විය හැකිය. එමගින් ඖෂධ දේශීය වශයෙන් වඩාත් සහනදයී මිලකට ලබා දීමට රජයකට අවසර දෙයි. කෙසේ වුවත්, අනිවාර්ය බලපත්‍ර මගින් *'විශේෂයෙන්ම දේශීය වෙළඳපොළ සඳහා'*[46] පමණක් නිෂ්පාදනය සීමා කරයි. මෙම තත්ත්වය මගින් ප්‍රබල දේශීය ඖෂධ කර්මාන්තයක් නොමැති සංවර්ධිත සේම සංවර්ධනය වන බොහෝ රටවලට දැවැන්ත අසාධාරණයක් සිදුවේ. ඉන්දියාව, බ්‍රසීලය හා චීනය යන රටවල් හැරුණු විට ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවලට දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය කිරීමට තාක්ෂණය හා සම්පත් ඇති සමාගම් නොමැති නිසා අනිවාර්ය බලපත්‍ර මගින් ලැබෙනුයේ අල්ප සහනයකි. මේ අනුව මෙම වගන්තිය මගින් දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණය සහ සම්පත් ඇති රටවලට ලාභදයී ලෙස ඖෂධ ගැනීමේ වාසි සහගත තත්ත්වය ඇතිවන අතර ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට ඉතා වැඩි මිලට නිෂ්පාදන ගැනීමට බල කිරීම සිද්ධිමය වෙනස් කිරීමකට භාජනය කිරීමකි. ලෝක වෙළඳ සංවිධානයේ TRIPS සභාව

---

43. වගන්තිය මගින් දක්වන්නේ 84 වගන්තියේ විධිවිධාන පේටන්ට් බලපත්‍ර හිමියා හෝ බලපත්‍ර ලත් නිෂ්පාදකයන් විසින් වෙළඳපොළට ඉදිරිපත් කර තිබෙන දේ සම්බන්ධයෙන් වූ ක්‍රියා වලට ව්‍යාප්ත නොවිය යුතුය.
44. 1965 අංක 101 දරණ ඖෂධ හා ඒ හා සම්බන්ධ ද්‍රව්‍යය පාලන පනතෙහි 15 (ඇ) වගන්තිය (1997) සංශෝධිතයි.
45. 1958 පේටන්ට් පනතෙහි 58 (අ) වගන්තිය (2000) සංශෝධිතයි.
46. 31 (ඉ) වගන්තිය.

විසින් මෙම කරුණ සාකච්ඡා කළ යුතු බවටත්, එම සභාවට මේ සම්බන්ධව විසඳුමකට එන ලෙසට උපදෙස් දිය යුතු බවටත් දෝහා සාකච්ඡා වටයේදී ඇමතිවරුන් විසින් හඳුනා ගන්නා ලදී.[47]

TRIPS සභාවට අනුව, TRIPS සම්මුතියේ 31(ඒ) වගන්තිය යටතේ අවශ්‍යතාවක් ලෙස දක්වා තිබූ ඖෂධීය නිෂ්පාදන සඳහා සමහර අවස්ථා වලදී අනිවාර්ය බලපත්‍ර ලබා ගැනීම 'දේශීය වෙළඳපොළ' සම්බන්ධයෙන් අත්හැරීමට තීරණය කිරීම බුද්ධිමය දේපල නීතියේ ඓතිහාසික අවස්ථාවක් නිර්මාණය කරන්නකි. එම තීරණය මගින් ආනයනික රටකට තම අවශ්‍යතාවයට යෝග්‍ය පරිදි ඖෂධ නිෂ්පාදනය සඳහා සුවිශේෂී අවස්ථා වලදී අපනයනික රටක් විසින් අනිවාර්ය බලපත්‍ර ප්‍රදානය කිරීම පිළිගනී.[48] මෙම පුළුල් කිරීම මගින් දේශීය වෙළඳපොළේ අවශ්‍යතාවයන් ඉවත් කෙරේ. ඉහත තීරණයට අනුව යම් රටක් අතිකුත් රටක භාවිතය සඳහා ඖෂධ නිෂ්පාදනයට බලය ලබනු අතර පසුව සඳහන් ආනයනික රට විසින් එම නිෂ්පාදනය මිලදී ගැනීමට බලය ලබයි. ආනයනික රටකට සේම අපනයනික රටකටද අදාළ පැහැදිලි නියමයන් හා රීතීන් ඉහත තීරණයේදී දෙවන වගන්තිය මගින් සනාථ කරයි.

TRIPS සභාවේ ඉහත තීරණය මගින් ඉන්දියාව වැනි අඩු මුදලකට ඖෂධ නිෂ්පාදනය කරන රටක රැකවරණය ලබන ශ්‍රී ලංකාව වැනි රටකට මුළු රටටම නොවූවත් අඩුම තරමින් සමහර ප්‍රදේශ සම්බන්ධයෙන් හෝ විශාල සහනයක් ලැබේ. ඉහත තීරණයේ ප්‍රතිඵලයක් ලෙස දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය සඳහා හැකියාව අඩු තත්ත්වයකදී වුවද යම් රටකට වෙනත් රටකින් ලාභදායී මිලට ඖෂධ ලබා ගත හැකිය.

කෙසේ වුවත්, මේ සම්බන්ධයෙන් සීමාවන් කිහිපයක් ද තීරණයේ දක්වා ඇත. (උදාහරණ වශයෙන් මෙම තීරණයේ වගන්ති යටතේ ඖෂධ ආනයනය කිරීම සඳහා බලය ලත් රටක්) හඳුනා ගැනීම සඳහා සුදුසු උපමානයක්

---

47. TRIPS සම්මුතිය යටතේ ඖෂධ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රමාණවත් හෝ නිෂ්පාදන හැකියාවක් නොමැති ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයන් විසින් අනිවාර්ය බලපත්‍ර නියම ලෙස භාවිතා කිරීමේදී මුහුණ දෙන ගැටලු අප හඳුනාගෙන තිබේ. අප විසින් මේ සම්බන්ධව ඉක්මන් විසඳුම් දෙන ලෙස TRIPS සභාවට උපදෙස් දී ඇති අතර එය 2002 අවසන් වීමට පෙර පොදු සභාවට වාර්තා කරන ලෙස අප විසින් දක්වා තිබේ.

48. 2 වන වගන්තිය, TRIPS සම්මුතියේ දෝහා ප්‍රකාශනයෙහි 6 වන වගන්තිය ක්‍රියාවේ යෙදවීම සහ 2003 අගෝස්තු 30 මහජන සෞඛ්‍ය සම්බන්ධ පොදු සභාවේ තීරණය WT/L/540.

යොදා ගත යුතුය.[49] ඕනෑම ඌන සංවර්ධිත රටක් 'යෝග්‍ය ආනයනික සාමාජිකයෙකු' ලෙස ඉබේම සැලකීමට ලක්වේ. TRIPS සභාව මගින් සොයා ගන්නා ලද මෙම ක්‍රමය භාවිතා කිරීම සඳහා ඌණ සංවර්ධිත රටවල් හැරුණු කල අනිකුත් රටවල් සම්බන්ධයෙන් ද TRIPS සභාව විමසිලිමත් විය යුතුය. මෙහිදී වැදගත් කරුණක් ලෙස 'මෙම තීරණය මගින් ගෙනහැර දක්වූ අදාළ ක්‍රමය භාවිතය පිළිබඳ විමසිලිමත් වීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ අනුමැතිය අවශ්‍ය නොවන බව තේරුම් ගත යුතුය.' යනුවෙන් අදාළ තීරණයේ 2 වන සටහන මගින් දක්වා තිබේ. තාක්ෂණය හුවමාරුව මගින් මෙම ඖෂධ කර්මාන්තයේ සංවර්ධනයේ ඇති වැදගත්කම මෙම තීරණය මගින් සලකා බලා ඇත. අත්‍යවශ්‍ය සංවර්ධන වැඩසටහන් හා පර්යේෂණයන්හි ස්වභාවය සලකා බලන කල සංවර්ධනය වන හා ඌණ සංවර්ධිත රටවල කාර්යක්ෂම ඖෂධ කර්මාන්තයක් ඇති කිරීම සමහරවිට ළඟා කරගත නොහැකි ඉලක්කයක් විය හැකිය. තවත් අතකට විශේෂයෙන්ම බෝවන රෝගයන්ට මුහුණ දීමේදී රට තුළ හෝ ලොව පුරා පැතිර පවතින තත්ත්වයක දී ජාතික යහපත උදෙසා අවම තරමින් සීමා සහිත ඖෂධ කර්මාන්තයක් හෝ රටතුළ තිබිය යුතුය. මේ තත්ත්වය එච්.අයි.වී/ඒඩ්ස් වලට එරෙහිව සටන් වදින විශාල වටිනාකමකින් යුත් දේශීය ඖෂධ කර්මාන්තයක් ඇති බ්‍රසීලය වැනි රටක් තුළ පැහැදිලිව දකගත හැකිය.

අත්‍යවශ්‍ය ඖෂධ දේශීය වශයෙන් නිපදවීමේ අවශ්‍යතාවය හඳුනාගෙන බ්‍රසීලයානු රජය විසින් දේශීය ඖෂධ නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහා බුද්ධිමය දේපල නීතියට ඉතා ප්‍රගතිශීලී වගන්ති හඳුන්වා දී ඇති අතර මෙය ඇමෙරිකා එක්සත් ජනපද රජයේ අසතුටට හේතුවී ඇත. 1996 බ්‍රසීල බුද්ධිමය දේපල පනතෙහි 68 (1) (1) වගන්තිය දක්වන්නේ පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීමෙන් වසර 03 ක් ඇතුළත එම නිෂ්පාදනය බ්‍රසීලය තුළ නිර්මාණය නොකරයි නම්, එය දේශීය වශයෙන් නිර්මාණය කිරීම සඳහා තරඟකාරියෙකුට අවසර දීමට පේටන්ට් බලපත්‍ර හිමියාට බලකිරීමට රජයට හැකි බවයි. මෙම වගන්තිය මගින් අනිවාර්ය බලපත්‍ර පිළිබඳ TRIPS සම්මුතියේ විෂය පථයෙන් එපිටට යන හඳුන්වා දීමක් සිදුකරන අතරම, එතකුදු වුවත් TRIPS සම්මුතිය මගින් දක්වා ඇති අදාළ නිෂ්පාදන දේශීය හෝ වේවා ආනයන කරන ලද ඒවා හෝ ඒ සඳහා පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවය මෙමගින් 'වෙනසකට භාජනය කිරීම'

49. තීරණයෙහි 1 වන වගන්තිය.

සම්බන්ධයෙන් විවේචන එල්ල වී තිබේ.[50] ඇමෙරිකානු රජය විසින් ලෝක වෙළඳ සංවිධානයේ ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රමයක් යෝජනා කළ නමුත් (කෙසේ වුවද, එම වගන්තිය බ්‍රසීලය තුළ කෙදිනකවත් භාවිතා වී නැත.) මෙම වගන්තිය ඇමෙරිකානු සමාගම් වලට එරෙහිව ක්‍රියා කිරීම මගින් ඇමරිකානු රජයට ඒ පිළිබඳ ප්‍රබල දනුම් දීමක් ලබාදෙන බව උපකල්පනය කර, පසුව වෙනත් රටවල් දෙකක් බ්‍රසීලය සම්බන්ධයෙන් කුළුපග විසඳීමකට පැමිණෙන ලදී.

## 3.2 ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ උත්තරීතරභාවය

එක්සත් ජාතීන්ගේ සාමාජිකයෙකු සේම අන්තර් ජාතික ප්‍රජාවේ සමාජිකයෙකු ලෙසද, ජනතාව සඳහා අවම මූලික රැකවරණයක් ලබා දීමට රාජ්‍යයන් බැඳී සිටී. මෙම නීතිමය බැඳීම් සහිත වූ රාජ්‍යයන්, ජනතාවගේ මූලික රැකවරණයට පටහැනි අයුරින් කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේද? මානව හිමිකම් සම්බන්ධ අයහපත් බලපෑමක් ඇති වෙනත් බැදියාවන්ට (කලාපීය, වෙළඳ හෝ වෙනත්) එළඹෙන රාජ්‍ය පාර්ශවයක තත්ත්වය කුමක්ද?

මෙම උභතෝකෝටිකය සම්බන්ධයෙන් 'ප්‍රථම වරට බලාත්මක ප්‍රකාශනයක්' ලබා දෙමින් වගන්තියක් ඇතුළත් කරන ලද්දේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගිනි. එහි 103 වැනි වගන්තිය දක්වන්නේ *'වත්මන් ප්‍රඥප්තිය යටතේ එක්සත් ජාතීන්ගේ සාමාජිකයන්ගේ වගකීම් හා වෙනයම් ජාත්‍යන්තර එකඟත්වයක් යටතේ ඔවුන්ගේ වගකීම් අතර ගැටුමක් ඇති වුවහොත් එවිට වත්මන් ප්‍රඥප්තිය යටතේ ඔවුන්ගේ වගකීම් බලපැවැත්විය යුතුය'* යනුවෙනි.

එමනිසා ප්‍රඥප්තිය යටතේ ඇති වගකීම් අනිකුත් සියල්ලටම වඩා උත්තරීතර බව එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය පැහැදිලි නියමයන් මගින් ප්‍රකාශ කරයි. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යටතේ ඇති වගකීම් කිහිපයක් අප දන් කෙටියෙන් සලකා බලමු. මූලික අයිතිවාසිකම්, සමාජ ප්‍රගතිය වැඩි දියුණු කිරීම සහ යහපත් ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා විශ්වාසය, එහි

---

50. ජාතික සැලකීම පිළිබඳ මූල ධර්මය ලෝක වෙළඳ සංවිධාන ක්‍රමය තුළ මූලික මූල ධර්මයක් වේ. මෙම මූල ධර්මයෙහි කෙටි අර්ථය වන්නේ යම් රටක ජාතිකයන්ට මෙන්ම විදේශ කොටස්කරුවන්වද වෙනස්කමකට භාජනය කළ නොහැකි බවයි. පේටන්ට් ලියාපදිංචි කිරීමේදීද මෙම මූල ධර්මයම අදළ වේ. බ්‍රසීලය තුළ කරනු ලබන නිෂ්පාදන පේටන්ට්හි වලංගුතාවය සම්බන්ධව උපමානයක් නොවිය යුතු බවට තර්කයක් මෙහිදී ගෙන එන ලදී.

පූර්විකාව මගින් නැවත තහවුරු කරයි. 56 වන වගන්තිය ඉතා වැදගත් වන අතර එමගින් එක්සත් ජාතීන්ගේ සමාජිකයන් සඳහා ඇති වගකීම දක්වා ඇත. ඒ අනුව '*55 වන ව්‍යවස්ථාවේ හතරෙහි දක්වා ඇති අරමුණු* මුදුන් පමුණුවා ගැනීම උදෙසා සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් ඒකාබද්ධව හා වෙන් වෙන් ක්‍රියාමාර්ග ගැනීමට සියලු සාමාජික රටවල් පොරොන්දු වෙති.' 'ජාතිය, ස්ත්‍රී පුරුෂ බව, භාෂාව හෝ ආගම් පිළිබඳ වෙනස්කමකින් තොරව මානව අයිතිවාසිකම් හා මූලික නිදහස පිළිබඳ සියලු දෙනාගේම ගෞරවය හා පිළිගැනීම' ඇති කිරීම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 55 වන ව්‍යවස්ථාවේ සඳහන් එක්සත් ජාතීන්ගේ ඉලක්කය මගින් ප්‍රවර්ධනය කර තිබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය දෙස බැලීමේදී මානව අයිතිවාසිකම් හා මූලික නිදහස පිළිපැදීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලට යුතුකමක් ඇති බව කෙනෙකුට සිතා බැලිය හැකිය. මෙම මානව හිමිකම් බැඳීම් සහිත සම්මුතියක් වන ICESCR හී ද අන්තර්ගත වන අතර ජාත්‍යන්තර අයිතිවාසිකම් පනතෙහි ඇතුළත් වී තිබේ. මෙම න්‍යාය සම්බන්ධයෙන් අවසානයේදී පැවසිය හැක්කේ ICESCR ප්‍රමුඛත්වය ලබාදෙන අතරම අනිකුත් සම්මුති ජාත්‍යන්තර නීතිය යටතේ සාධාරණීය කළ හැකි බවයි.

කෙසේ වුවද, යථාර්ථය මීට වඩා වෙනස්වේ. TRIPS සම්මුතිය හැරුණු විට TRIPS අමතර සම්මුති ලෙස හඳුන්වනු ලබන සම්මුති සඳහා ඇතුළත් වීමට සංවර්ධනය වන රටවල් වලට පීඩනයක් එල්ල වේ. ශ්‍රී ලංකාවද දනටමත් ඇමරිකා එක්සත් ජනපදය සමඟ මෙවැනි සම්මුතියකට අත්සන් කර තිබේ.[51]

මෙම සම්මුතීන් මගින් TRIPS සම්මුතියේ අඩංගු ලිහිල් කිරීමේ විධිවිධාන අඩු කරන අතරම (උදා:- අනිවාර්ය බලපත්‍ර සඳහා තව දුරටත් සීමා කිරීම් ප්‍රදානය කිරීම) බුද්ධිමය දේපල අයිතිවාසිකම් තව දුරටත් පුළුල් කරයි. මෙම සම්මුතීන් මගින් කෙටි කාලීන වාසි ලබා දුන්නද දිගු හා මධ්‍ය කාලීන හානි රටකට ගෙන ඒමේ තත්ත්වය හා සසඳ බැලීමේ දී ඇති වන අනර්ථකාරී ප්‍රතිඵල දෙස බැලූ කල මේවාට ඇතුළු වීම අනවශ්‍යය බව පැහැදිලි වේ. මෙම ස්වාභාවයේ සම්මුති වලට ඇතුළත් වීමේදී රජය විසින් ජනතාවගේ ආර්ථික හා සාමාජීය අයිතිවාසිකම් පිළිබඳව හෝ සලකා බලා නැත.

---

51. 1991 අනිවාර්ය පේටන්ට් බලපත්‍ර සම්බන්ධයෙන් ඇමරිකාව සහ ශ්‍රී ලංකාව අතර ඇති කර ගත් ගිවිසුම.

සංවර්ධනය වෙමින් පවතින හා ඌන සංවර්ධිත රටවල් ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන් සේම වෙළඳ යහපත ආරක්ෂා කිරීමේ ප්‍රායෝගික උභතෝකෝටිකය දෙස බැලීමේදී ජාත්‍යන්තර මානව හිමිකම් පනත භාවිතයට ගැනීමට තවදුරටත් ඉඩ ප්‍රස්ථා ඇති බව දක්විය හැකිය. සියල්ලටම පසුව, එක්සත් ජාතීන්ගේ සම්මුතීන් කඩකිරීම සම්බන්ධයෙන් කිසිදු රාජ්‍යය පාර්ශවයකට හෝ ජාත්‍යන්තර මූල්‍යමය ආයතනයකට සෘජුවම උපදෙස් දිය නොහැකිය. රජයන්ට බල කරන බොහෝ ප්‍රබල වෙළඳ රීතීන් මගින් ICESCR යටතේ ඇති සම්මුති වගකීම් නිතර හා බලෙන්ම වෙනත් අයෙකුගේ ආධාර ගැනීම මගින් අවම කරමින් හෝ අන්‍යයෙකුගේ කැමැත්තට යටත් වෙමින් ලිහිල් කිරීමක් කළ හැකියි.

## 4. නිගමන

මානව හිමිකම් සම්බන්ධ තත්ත්වය යටතේ පුද්ගලයන්ගේ ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් මානව හිමිකම්හි නොබෙදිය හැකි කොටසක් වන අතර රාජ්‍යයන් විසින් ඒවාට ගරු කිරීම, ආරක්ෂා කිරීම හා ඉටු කිරීම සිදුකළ යුතු බව පැහැදිලි කරුණකි. අනෙක් අතට වර්තමාන ආර්ථික යථාර්ථය මෙම අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවට ව්‍යවසායකත්වය හා වෙළඳම වර්ධනය කිරීම සඳහා රජයන්ට බල කරයි.

සමාජ සාධාරණත්වය හා තනි පුද්ගල (සමාගම්ද ඇතුළුව) සුභසාධනය යන ඉලක්කයන් දෙක සපුරා ගැනීම, සැමවිටම ගැටුම්කාරී නොවේ. ධනවාදී ආර්ථික ක්‍රමයක් තුළ ඉතා ඉහළ සුභසාධන ක්‍රමයක් ඇති සමහර ස්කැන්ඩිනේවියානු රටවල් හා වෙනත් සංවර්ධිත රටවල් මෙම ඉලක්කයන් දෙක අතර සාධාරණ, සමබරතාවයක් පවත්වා ගෙන යයි. ශ්‍රී ලංකාව මෙන් නොව මෙම රටවල් ආණ්ඩුවේ වියදම් වලින් ඉතා විශාල ප්‍රතිශතයක් සුභ සාධනය සඳහා වෙන් කරයි. ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන අවහිරතා පිළිබඳ සැලකීමේදී නව නීති සහ නිදහස් ප්‍රතිපත්ති හඳුන්වා දුන්නද, පුද්ගලයන්ගේ මානව හිමිකම් සම්බන්ධයෙන් මෙම ක්‍රියාවලියේ බලපෑම පිළිබඳ රාජ්‍යයන් සිය අවධානය යොමුකළ යුතුය යන මතයට දත් පැමිණ තිබේ. සංවර්ධනය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට හෝ වෙළඳ ශේෂයේ අතිරික්තයට සීමා නොවේ. සෑම පුද්ගලයෙකුටම සාධාරණ නීතීන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් ළඟාවිය හැකි උසස් ජීවන තත්ත්වයක් සංවර්ධනය යන්නෙන් අදහස් වේ.

# IX

# ශ්‍රී ලංකාව තුළ මුදල් විශෝධනය පිටුදැකීම

දප්පුල ද ලිවේරා*

## 1. හැඳින්වීම

කලාපයේ රටවල් කිහිපයක මුදල් විශෝධනය (Money Laundering) අපරාධ වරදක් වශයෙන් ස්ථාපිත වූවත් තවම ශ්‍රී ලංකාව තුළ එය අපරාධයක් ලෙස ස්ථාපනය වී නැත. කෙසේ වෙතත්, මේ පිළිබඳව නීතියක් කෙටුම්පත් කර ඇති අතර නොබෝ කලකින්ම මුදල් විශෝධනය පැරදවීම පිළිබඳව වූ එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරෙණු ඇතැයි අපේක්ෂා කළ හැකි බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කිරීම යුක්තියුක්තය. මෙම ලිපියේ වෙනත් ස්ථානයකදී එකී කෙටුම්පත් කර ඇති නීතිය පිළිබඳව සාකච්ඡා කෙරේ.

## 2. මුදල් විශෝධනය යනු කුමක්ද?

අපරාධකරුවන් විසින් තම සාපරාධී ක්‍රියාවන් කරණකොට උපදවාගත් ලාභය, එහි සැබෑ මූලයන් සහ හිමිකාරිත්වය සැඟවීම හෝ වෙනස් කිරීම මඟින් එකී අරමුදල් වෙනුවෙන් නඩු පැවරීමට භාජනය වීම, දඬුවම් නියම වීම හෝ ඒවා රාජසන්තක වීම වළක්වා ගැනීම උදෙසා කරනු ලබන ක්‍රියා මාර්ගය මුදල් විශෝධනය ලෙස හැඳින්විය හැක.

* එල්.එල්.එම්. (ලන්ඩන්), රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ

## 2.1 මුදල් විශෝධනය පිළිබඳ ඇතැම් නිර්වචනයන්:

1. නීති විරෝධී මූලයකින් උපයාගත් දේපලක් එසේ අපරාධයක් තුළින් උපයාගත් බව දනගෙන එය වසන් කිරීමට හෝ සැඟවීමේ අභිප්‍රායෙන් එකී දේපල වෙනයම් දේපලක් බවට හැරවීම හෝ දේපල මාරුකිරීම හෝ එසේ අපරාධයක් කිරීම තුළින් දේපල උපයාගත් අයෙකුට ඒ සම්බන්ධව නීතිය මගින් ලැබිය යුතුවූ ආනුශංගික ප්‍රතික්‍රියා ලැබීමෙන් වළක්වා ගැනීමට උපකාර කිරීම.
2. අපරාධයකින් උපයාගත් ලාභයන් එකී නීති විරෝධී මූලයන් සඟවා ගැනීමට භාජනය කිරීම (එනම් 'කළු මුදල්' එසේ නොවන යහපත් මුදල් බව පෙන්වීම).
3. නීත්‍යානුකූල ආකාරයෙන් උපයාගත් බව පෙන්වීම සඳහා අපරාධ වලින් උපයාගත් 'කළු මුදල්' වෙනත් දේපලක් හෝ මූල්‍යමය වටිනාකම් බවට හැරවීම.

වර්තමානයේ නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් හා බැඳුනු මුදල් විශෝධනය පිළිබඳව බොහෝ දෙනාගේ අවධානය යොමුවී ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන හේතු කාරණා දෙකක් මත කොටස් ප්‍රාග්ධන වංචාකරුවන්, සමාගම් ගනුදෙනු තුළ වංචා සිදුකරන්නන් සහ හොරබඩු ජාවාරම්කරුවන් යන විවිධ තලයේ අපරාධකරුවන් ඔවුන්ගේ මුදල් ප්‍රවාහයන් මුදල් විශෝධනයට ලක් කරයි. එකී හේතුනම්, පළමුව එකී විවිධ අපරාධ පිළිබඳව එම මුදල් විසින්ම හෝඩුවාවක් සැපයීමේ අවදනම පැවතීමයි. දෙවනුව, එකී මුදලම අපරාධය පිළිබඳ පරීක්ෂණයන් සහ දඬුවම් දීම සඳහා මුල්විය හැකි වීමයි.

මෙම මුදල් විශෝධකයන්ගේ අරමුණ නම් අපරාධ ක්‍රියා තුළින් ඔවුන් උපයා ගන්නා විශාල ලාභයන්ගේ මූලය සඟවා තබා ගැනීමත් එමෙන්ම එකී සැඟවුණු අපරාධ ක්‍රියාවන් තවදුරටත් වසන්කර තබා ගන්නා අතරම ඉන් උපදවාගත් ලාභය නීත්‍යානුකූල මාර්ග වලින් උපදවාගත් මුදලක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ සලසා ගැනීමත්ය.

මුදල් විශෝධනය පියවර තුනකින් යුත් ගතික ක්‍රියාවලියක් ලෙස හඳුන්වා දිය හැක. පළමුව, අපරාධය සමඟ ඍජු සබඳතාවයක් ඇති අරමුදල් වෙනත් ආකාරයකට හැරවීමත්; දෙවනුව, එකී මුදල් ලැබී ඇති ආකාරය පිළිබඳ සාධක/හෝඩුවාවල් සැඟවීමත්; තෙවනුව, එකී මුදල් ලැබී ඇති ආකාරය වසන් කිරීමෙන් පසු එම මුදල් අපරාධකරුවෙකුහට යළි ලැබීමට සැලැස්වීමත් ය. මේ අනුව බලන කල මුදල් විශෝධනය හුදු හොර ජාවාරම් හෝ 'අශුද්ධ

මුදල්' සැඟවීමකට වඩා පෘථුල ක්‍රියාවලියක් වන අතර ඉහත කී ආකාරයන්ද එකී ක්‍රියාවලිය තුළ ඇති අවශ්‍ය සාධකයන් බවටද පත්විය හැකි වේ.

## 2.2 මුදල් විශෝධනයේ පියවරයන්:-

- අ. ස්ථානගතකරණය
- ආ. ස්ථරීකරණය
- ඇ. ඒකානුකරණය

මුදල් විශෝධනය විවිධාංගීකරණය වූ එමෙන්ම බොහෝ විට සංකීර්ණ ක්‍රියාවලියකි. එය මූලික වශයෙන් ස්වාධීන පියවරයන් තුනකින් යුක්තවන අතර මේවා බොහෝ විට එකවරම සිදු කෙරේ.

ස්ථානගතකරණය යනු නීති විරෝධී ක්‍රියා වලින් උපදවාගත් ලාභය වන මුදල් භෞතික වශයෙන් ඉවත් කිරීමයි. මෙය මුදල් විශෝධන ක්‍රියාවලියේ පළමු පියවර වන අතර එය ඉහළම අවදානම සහිත අවධියයි. මෙම අවධියේ දී මූල්‍ය පද්ධතියට භෞතික මුදල් එකතුවන අතර නීති විරෝධී ලෙස උපදවාගත් ලාභය නීතියේ රැහැනට හසුවීමට ඇති ඉඩකඩ ඉතාම අධිකය. ස්ථානගතකරණයේ දී මුදල් ඒවා උපදවාගත් ක්‍රියාවේ සිට වෙනත් ස්ථානයක් කරා ගමන් කරවන අතර බොහෝ අවස්ථා වලදී මුදල් උපදවාගත් ක්‍රියාව/මූලය පහසුවෙන් සැඟවීමට හෝ වැරදි ලෙස පෙන්වා දීමට හැකියාව ලැබේ.

ස්ථරීකරණය තුළදී මුදල් ඉපැයූ ආකාරය සැඟවෙන සුළු ආකාරයෙන් සකස්කර ඇති මූල්‍ය ගනුදෙනු රාශියක් සිදුකරනු ලැබේ. මෙහි අරමුණ නම් මුදල් විශෝධන ක්‍රියාවලිය සිදුකර ඇති ආකාරය සොයා ගැනීම අපහසු කිරීමයි. ස්ථරීකරණය අශුද්ධ මුදල් මගින් තබාගොස් ඇති හෝඩුවාවල් මඟහරවා ගැනීම අරමුණු කරගත් ක්‍රියාවලියකි. ස්ථරීකරණ ක්‍රියාවලිය තුළදී මුදල් විශෝධනය කරන්නා මූල්‍ය ගනුදෙනු රැසක් සිදුකර එකී මුදලත් එය රැස්කරගත් නීති විරෝධී මාර්ගයත් අතර ස්ථර ගණනාවක් ඇති කරයි.

ඒකානුකරණය යනු නීති විරෝධී මුදල් නීත්‍යානුකූල මාර්ග වලින් උපයාගත් ලාභයක් ලෙස නැවතත් ආර්ථික ක්‍රියාවලිය තුළට එකතු කිරීමයි. මුදල් විශෝධන චක්‍රයේ අවසන් අවස්ථාව 'කළු මුදල්' ඒකාග්‍රකරණයයි. මෙම අවස්ථාවේදී විශෝධිත ධනය, නීත්‍යානුකූල මාර්ගයන්ගෙන් උපයාගත්

ආකාරයෙන් දක්වීමට කටයුතු කෙරෙයි. එහිදී ස්ථරිකරණ ක්‍රියාවලියේදී මිලදී ගත් දේපල විකිණීම වැනි දේ සිදු කිරීමට පුළුවන. ඒකාග්‍රකරණය තුළදී විශෝධිත මුදල් බොහෝවිට බැංකු ක්‍රමය මගින් ආර්ථිකයට එකතු කෙරෙන අතර එහිදී ඒවා නීත්‍යානුකූල වාණිජ කටයුතු මගින් උපයාගත් බවක් පෙන්නුම් කෙරේ.

## 3. ශ්‍රී ලංකාවේ තත්ත්වය

ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්විය යුතු වන්නේ දූපතක් ලෙස එහි පවතින දිගු සහ කඩතොළු සහිත එමෙන්ම ප්‍රමාණවත් පරිදි ආරක්ෂක විධිවිධාන යොදා නොමැති වෙරළ තීරයක් පැවතීම තුළින් අන්තර්ජාතික සොරබඩු ජාවාරම් කටයුතු සඳහා එහි පවතින යෝග්‍ය බව නිසාය. සැලකිය යුතු ප්‍රමාණයේ තොග වශයෙන් රත්‍රං, මත්ද්‍රව්‍ය, ආයුධ සහ වෙඩි උණ්ඩ මෙන්ම වෙනත් නීති විරෝධී ද්‍රව්‍යයන් රට තුළට ඇතුළු වන බවට සැක පහළ වී තිබේ. නීති විරෝධී ආකාරයෙන් පුද්ගලයන් ආගමනය හා විගමනය කරවීමද මෙයට අයත් වේ. එසේම දේශ සීමා හරහා සිදුවන නීති විරෝධී මුදල් ජාවාරමද සැලකිය යුතු ප්‍රමාණයෙන් සිදුවන බවට විශ්වාස කෙරේ. විශේෂයෙන්ම ප්‍රාග්ධන වෙළඳපොළ ජාත්‍යන්තරීකරණය වීම තුළ මෙකී නීති විරෝධී ලෙස උපයාගත් ලාභයන් කොටස් වෙළඳපොළ තුළත්, විදේශ ආයෝජන ව්‍යාපෘති තුළත් ආයෝජනය වීම් සිදුවිය හැක.

ශ්‍රී ලංකාව තුළ නීති විරෝධී ලෙස ධනෝපායන මාර්ග ලෙස දැකිය හැකි වන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම, නීති විරෝධී සූදු, නීති විරෝධී පුද්ගල ආගමන-විගමනය, වංචනික ක්‍රියා, මූල්‍ය වංචා, කොල්ලකෑම්, ගණිකා වෘත්තිය, අල්ලස් හා දූෂණ ක්‍රියා, නීති විරෝධී ආයුධ, පතරොම් හා පුපුරණ ද්‍රව්‍ය ජාවාරම්, සංවිධානාත්මක මෝටර් වාහන සොරකම් නීති විරෝධී මැණික් අපනයනය, පුරාවස්තු හා කලාත්මක ද සොරකම්කර විකිණීම, සංරක්ෂිත සත්ව විශේෂ හා පැලෑටි විශේෂ නීති විරෝධීව විකිණීම යනාදියයි. මෙකී ධනෝපායන මාර්ගයන් ශ්‍රී ලංකාවේ මුදල් විශෝධනයට අත්‍යවශ්‍යයෙන්ම දායක වනු ඇත.

නීති විරෝධීව උපයාගත් ලාභයන් යෙදවීම සඳහා වැදගත්ම යාන්ත්‍රණයන් ලෙස බැංකු පද්ධතිය සහ කොටස් වෙළඳපොළ සහ අනෙකුත් මූල්‍ය ආයතන පවතින බැව් පැවසිය හැක. මූල්‍ය වෙළඳපොළේ විශාලතම කොටස්කරුවා ලෙස පවතින බැංකු පද්ධතිය පුළුල් සේවාවන් රැසක් සිය පාරිභෝගිකයන්ට පිරිනමන හෙයින් එකී සේවා ඇතැම්විට මුදල් විශෝධනයන්ට

ද යොද ගන්නවා විය හැක. ස්වදේශිකයන් හෝ විදේශිකයන් තනි පුද්ගලයන් ලෙස මෙන්ම කණ්ඩායම් ලෙසද ක්‍රියා කරමින් කොටස් ප්‍රාග්ධන සහ සුරැකුම් ක්ෂේත්‍රවල ඉහත කී නීති විරෝධී ලෙස උපයාගත් ලාභයන් ආයෝජනය කිරීමේ තත්ත්වයද නොපවතින්නේ යැයි ප්‍රකාශ කළ හැකි නොවේ.

එසේම නීත්‍යානුකූල බැංකු පද්ධතියෙන් පරිබාහිරව රටවල් අතර පවතින ඊනියා "සැඟවුණු බැංකු පද්ධතිය" (හවාලා හෝ හුන්ඩි) ප්‍රයෝජනයට ගැනීමද බහුලව සිදු වේ. දේශ සීමා අතර සිදුවන මුදල් ජාවාරමද ඉතා පැරණි ජාවාරමක් ලෙස සැලකෙන අතර එය දැඩි විදේශ විනිමය නීති පිටු දැකීමට යොදගෙන ඇත.

පහත දක්වෙන ආකාරයේ ක්‍රම ශ්‍රී ලංකාව තුළ නීති විරෝධී ලෙස උපයාගත් ලාභයන් යෙදවීම සඳහා භාවිතා වන බැව් ප්‍රකාශ කළ හැක. දේශ සීමා හරහා මුදල් ජාවාරම් කිරීම හෝ ප්‍රවාහනය කිරීම, බැංකු අණකර හෝ විකල්ප ගෙවීමේ මාධ්‍යයන් යොද ගැනීම, අධික මිලෙන් යුත් සුඛෝපභෝගී භාණ්ඩ, රත්‍රං සහ සුඛෝපභෝගී වාහන මිලදී ගැනීම කොටස් මිලදී ගැනීම සහ ඉඩම් මිලදී ගැනීම බහුලව භාවිතා කරන උපක්‍රම වේ.

බොහෝ විට විශෝධනය කළ ලාභයන් ඉඩම් මිලදී ගැනීම් හෝ වෙනත් ව්‍යාපාරවල ආයෝජනය කිරීම් වලට යොදවන අතර බොහෝ විට මේවා සිදුකරන්නේ ආවරණ සමාගම් හරහා බව විශ්වාස කෙරේ. කෙසේ වෙතත්, තම ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ සාමාන්‍ය ක්‍රමෝපායයන් හරහා මූල්‍ය ආයතන වලට ඉහත කී ආකාරයේ ව්‍යාජ උපක්‍රමයන් හඳුනා ගැනීම අපහසු වී ඇත.

## 4. සාපරාධී ක්‍රියාවක් වන මුදල් විශෝධනය මානව හිමිකම් දෘෂ්ටිකෝණයෙන්

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට 'කළු මුදල්' සිදුකරන බලපෑම තේරුම් ගැනීමට උත්සාහ කළ යුතුයි. මෙකී නිල නොවන, සැඟවුණු හෝ සමාන්තර ආර්ථිකයන් බොහෝ විට නීත්‍යානුකූල බලධාරීන්ගේ අධීක්ෂණයෙන් ගැල වේ. මෙම නිල නොවන මූල්‍ය ක්ෂේත්‍රය නීත්‍යානුකූල රෙගුලාසිවල පාලනයෙන් මිදී ඇති අතර බදු සඳහා හෝ මූල්‍ය බලධාරීන්ගේ පරීක්ෂණයන්ට යොමු නොවේ.

නිල නොවන අංශයේ මූල්‍ය ප්‍රවාහයේ විශාලත්වය ගණන් බැලීමට නොහැකි වුවත් එය සැලකිය යුතු ප්‍රමාණයක එකක් බැව් විශ්වාස කෙරේ. මෙකී නිල නොවන වෙළඳපොළවල ඇති මූල්‍ය හැකියාව බරපතල වන අතර ඒවා මුදල් විශෝධකයන්ට පාරාදීසයක් වී ඇතිවාක් මෙන්ම සාමාන්‍ය මූල්‍ය පද්ධතියේ සංගතභාවයට හානියක් මෙන්ම තර්ජනයක් ද වී ඇත. එමගින් මූල්‍ය සහ බදු ප්‍රතිපත්ති අවතක්සේරු කර ඇත.

ශ්‍රී ලංකාවේ අධිකරණ තීරණය කර ඇත්තේ නීතියේ ආධිපත්‍යය යන සංකල්පය මූලිකම සිද්ධාන්තයක් බවත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා පදනම වී ඇති බවත්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව අනුව සෑම පුද්ගලයෙකුම නීතිය හමුවේ සමාන වන අතර නීතියේ පිළිසරණ සමානව ලැබීමේ අයිතිවාසිකම පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ) වගන්තියට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රකාශිතව පනවා ඇති මූලික අයිතිවාසිකම් ආණ්ඩුවේ සෑම ආයතනයක් විසින්ම ගරු කර ආරක්ෂා කර පෝෂණය කිරීමේ වගකීමෙන් බැඳී ඇති අතර ඒවා නොතැකීම, සීමා කිරීම හෝ පිළිනොගැනීම කළ නොහැක.

නීතියේ ආධිපත්‍යය සෑම දෙනාට ම එක හා සමානව බලපාන හෙයින් අපරාධයන්හි නියුතු වුවත් නීතිය හමුවට පැමිණවිය යුතුය. අපරාධ ක්‍රියාකරන්නන්ට මුදල් විශෝධකයන්ට නීතියේ රැහැනින් මිදී යෑමටත් නිදහස භුක්ති විඳීමටත් ඉඩ ලබාදිය යුතු නොවේ. එය සියලුම මානව හිමිකම් පරමාදර්ශයන්ට එරෙහිව යන්නකි.

තවදුරටත් පැවසිය හැක්කේ මුදල් විශෝධනය රටක ආර්ථිකය අවතක්සේරු කරන අතර එහි මූල්‍ය ක්‍රමයේ සංගතභාවයට තර්ජනයක් එල්ල කරන බවයි. ඒ අනුව එම ක්‍රියාදාමය රටක ආර්ථික සංවර්ධනයට පහරක් එල්ල කෙරෙන අතර එමගින් එරට පුරවැසියන්ගේ සුභසාධනය අඩාල කරවයි. මෙම සාපරාධී ක්‍රියාවන් ඒ අනුව රටක ආර්ථික දියුණුව උදෙසා පුරවැසියන්ට ඇති අයිතියට බලපෑම් සිදු කරයි.

## 5. බැංකු සහ මූල්‍ය ආයතන

මූල්‍ය ක්ෂේත්‍රයේ පැවැත්ම රඳා පවතින්නේ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන නීත්‍යානුකූල අරමුදල් ආකර්ෂණය කරවා ගැනීම හා රඳවා ගැනීම මතයි. මූල්‍ය ක්ෂේත්‍රය තුළ බැංකු සහ මූල්‍ය ආයතන පවත්වාගෙන යන ඉහළ පිළිගැනීම සහ ඒවා ගනුදෙනුකරුවන්ට සපයන සේවාවන්හි

ගුණාත්මක බව මත නීත්‍යානුකූල ගනුදෙනුකරුවන් සිය ආයතන වෙත ආකර්ෂණය කර ගැනීමට එකී ආයතන සමත් වේ. මුදල් විශෝධනය, වංචා සහ අපරාධකරුවන්ගේ නීති විරෝධී ක්‍රියාවන්ට සහාය වීමට ඇති වෙනත් ක්‍රියාකාරකම් මෙම මූල්‍ය ආයතනවල චිර පැවැත්මට බලවත් තර්ජනයකි.

මූල්‍ය ආයතනවල ගනුදෙනු සඳහා නීති විරෝධී අරමුදල් ඉදිරිපත්වීම තුළින් එකී ආයතන පිළිබඳව පවතින ගෞරවයට අත්‍යන්තයෙන්ම පහර වදින අතර පුළුල්ව සලකා බලන විට මුළු මූල්‍ය ක්ෂේත්‍රයට ම එය බලපායි. කෙසේ වෙතත්, මූල්‍ය ආයතනයක සිදු වන සෑම ගනුදෙනුවක්ම පරීක්ෂා කර එය නීති විරෝධී මුදල් හා සම්බන්ධ බව හෝ අපරාධකරුවන්ට සහාය වීම සඳහා කෙරෙන ගනුදෙනුවක්ද යන බව සොයා බැලීමට අපහසු වුවත් එකී මූල්‍ය ආයතනයන් තුළ සිදුවන ගනුදෙනු ආරක්ෂිත සහ නිසි ආකාරයෙන් සිදුවනවාද යන්න තහවුරු කර ගැනීමට ගතහැකි සෑම පියවරක්ම ගැනීමත්, තම ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට සහ ඔවුන් සිදුකරන නීත්‍යානුකූල ගනුදෙනු හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමත් මෙන්ම තම ගනුදෙනුකරුවන් සිදු කරන සැක සහිත ගනුදෙනු සහ අසාමාන්‍ය ගනුදෙනු පිළිබඳව විමසිලිමත් වීමත් සෑම මූල්‍ය ආයතනයක් විසින්ම සිදු කළ යුතුය. එවැනි ගනුදෙනු හඳුනා ගැනීම පමණක් නොව ඒවා 'සැක සහිත ක්‍රියාකාරකම් වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්' (SARS) ට අදාළවන ආකාරයෙන් එම ක්‍රියාකාරකම් වාර්තා කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමත් වැදගත් වේ. මෙමගින් මූල්‍ය ආයතන වලට තමන්ගේ කීර්තිනාමය ආරක්ෂා කරගැනීමටත් මෙන්ම බැංකු නියාමක බලධාරීන්ටත්, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ටත් මූල්‍ය ආයතන තුළ නීති විරෝධී ක්‍රියාකාරකම් අඩපණ කිරීමටත්, උපකාරී වීමට හැකියාවක් ලැබේ. බැංකු සහ මූල්‍ය ආයතන සැක කටයුතු මුදල් ගනුදෙනු හඳුනා නොගැනීම හා ඒවා පිළිබඳව පැමිණිලි නොකිරීම සිදු කළහොත් එකී ආයතන වලට දඬුවම් කළ යුතුය.

## 5.1 ඔබේ ගනුදෙනුකරුවා හඳුනාගැනීම සහ ගනුදෙනුකරුවා කෙරෙහි නිසි උද්යෝගිමත් වීම

බොහෝ රටවල් ඔබේ ගනුදෙනුකරුවා හඳුනා ගැනීම (KYC) මූල ධර්මය සහ සැක කටයුතු ගනුදෙනු පිළිබඳව දැනුම් දීම අනිවාර්ය කිරීමේ විධික්‍රම නීති විරෝධී අරමුදල් සංචරණයට සහභාගී වීමේ අවදානමෙන් මූල්‍ය ආයතන

ආරක්ෂා කර ගැනීම සඳහා යොදගනු ලැබේ. ඔබේ ගනුදෙනුකරුවා හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය මඟින් මූල්‍ය ආයතනයන්ට තම ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාවය ක්‍රියාත්මක කිරීමට ඇති ගනුදෙනුවේ ස්වභාවය සහ අනෙකුත් දේවල් අතර මුදල් ලබා ගැනීම පිළිබඳව ඔවුන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා බලය ලබා දෙනු ඇත. ඉහත මූල ධර්මය ක්‍රියාකාරිව භාවිතා කිරීමේදී මූල්‍ය ආයතන අනිවාර්යයෙන්ම තම ගනුදෙනුකරුවන් නීති විරෝධී විය හැකි හෝ සැක කටයුතු ගනුදෙනු සිදුකරන්නේද යන්න යථාර්ථවාදීව විමසීමක් සිදුකළ යුතුය.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතනයන් නව ගිණුම් ආරම්භ කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සිදුකළ යුතුය. ගනුදෙනුකරුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම එකී ක්‍රියාවලියේ ම කොටසක් වන අතර ගනුදෙනුකරුගේ අනන්‍යතාවය පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම මෙම ක්‍රියාවලියට අළුත් දෙයක් නොවේ. එසේම මේ වනවිටත් ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන තම ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාවයන් හඳුනා ගැනීම උදෙසා තොරතුරු රැස් කිරීමට සැලකිය යුතු අන්දමේ ක්‍රියා පිළිවෙත් අනුගමනය කරන බව පැවසිය යුතුය.

ගනුදෙනුකරුගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම අනන්‍යතා ලේඛන එනම් ජාතික හැඳුනුම්පත්, ගමන් බලපත්‍ර, රියදුරු බලපත්‍ර මෙන්ම ගනුදෙනුකරු සමාගමක් නම් සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය වැනි ලේඛන ලබා ගැනීමෙන් සිදුකළ හැක.

දත්ත රැස්කර තබා ගැනීම ශ්‍රී ලංකාවේ දී අනිවාර්යයෙන්ම යොදගනු ලැබේ. සියලුම බැංකු සහ මූල්‍ය ආයතන වසර පහක් තුළ සිදුකර ඇති සියලුම දේශීය හා විදේශීය ගනුදෙනු පිළිබඳ දත්ත රැස්කර තබාගත යුතුය. එසේම එම බැංකු සහ මූල්‍ය ආයතන වලට තම ගනුදෙනුකරුවාගේ නීත්‍යානුකූල පැවැත්ම සහ ගනුදෙනුකරුවාගේ ස්වභාවය තහවුරු කරගනුවස් එකී ගනුදෙනුකරුවාගෙන් තොරතුරු ඉල්ලා සිටිය හැක. ඔවුන්ට එම තොරතුරු ඉල්ලා සිටිය හැකි වන්නේ නිර්නාමික නෛතික පුද්ගලයන්, ගිණුම් පවත්වාගෙන යාම සඳහා භාවිතා කිරීම සාමාන්‍යයෙන් හුදු පුද්ගලික ගනුදෙනුකරුවන් විසින් නොකරන බැවිනි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය තුළ නිර්නාමිකව හෝ අන්වර්ථ නාමයන්ගෙන් ගිණුම් පවත්වාගෙන යාම පිළිබඳව ප්‍රතිපාදනයන් සලස්වා නොමැත. එසේම අංකයක් පමණක් සහිත ගිණුම් පවත්වාගෙන යා හැකි

නීතියද දන් පරිච්ඡින්න කර ඇත. කෙසේ වෙතත්, රැගෙන එන්නාට ගෙවීමේ බැඳුම්කර තවමත් පවතී.

යම්කිසි අවස්ථාවකදී ගනුදෙනුකරුගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු බැංකුවක් විසින් ඉල්ලා ඇති විටක එය ලබා නොදේ නම් එම ගනුදෙනුකරුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හෝ ඔහුට ගිණුමක් ඇත්නම් එම ගිණුමේ ගනුදෙනු පිළිබඳව සුපරීක්ෂාකාරී වීමට පුළුවන.

මූල්‍ය ආයතන හරහා මුදල් විශෝධනය සිදුවීම රැහැන් සහ ටෙලිග්‍රාෆ් හුවමාරු, ණයවර කාඩ්පත් භාවිතය, බැංකු අණකර හා චෙක්පත් භාවිතය, සංචාරක චෙක්පත් භාවිතය යනාදිය මඟින් ව්‍යාජ හෝ වැරදි නම් යොද ගනිමින් සිදුවිය හැක.

## 5.2 සැක සහිත ගනුදෙනු රපෝර්තු කිරීම

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින විශාල මූල්‍ය ආයතන වලට ඕනෑම සැක සහිත ගනුදෙනුවක්, නීති ක්‍රියාත්මක කරන ආයතනයන්ට පරීක්ෂණ කටයුතු ඇරඹීම සඳහා දන්වම් දිය හැක. කෙසේ වෙතත්, දනට රටේ භාවිතා වන බැංකු කටයුතු වල රහස්‍යභාවය සුරැකීමේ නීති යටතේ මෙවැනි තත්ත්වයක් නිතර නිතර බලධාරීන්ට රපෝර්තු කිරීමක් සිදු නොවේ.

මුදල් විශෝධනයට එරෙහිව ඵලදයි ලෙස පියවරයන් ගැනීම අතිශයෝක්තියෙන් පැවසිය නොහැක. ජාත්‍යන්තර පොලිසියේ හිටපු සභාපති කනේමොටෝ කොෂිනෝරි මහතා වරක් පැවසූ පරිදි 'ජාත්‍යන්තර අපරාධ වල අරමුණ මුදල් උපයා ගැනීම වනතාක් අපරාධකරුවා සහ එම අපරාධයෙන් උපයාගත් ලාභය එකිනෙක වෙන්කිරීම එකී අපරාධ මර්දනය සඳහා ඇති ප්‍රමුඛතම උපක්‍රමය වේ.'

මුදල් විශෝධනය නැවැත්වීම සඳහා යොද ගතහැකි ඵලදායී ක්‍රියා මාර්ගයක් නම් සැකසහිත මූල්‍ය ගනුදෙනු අනාවරණය කර ගන්නා යාන්ත්‍රණයක් සකසා ගැනීමයි. ශ්‍රී ලංකාවේ මේ තත්ත්වය අරමුණු කරගත් නීති කෙටුම්පත් කිහිපයක් පැවැතුනද බලධාරීන්ට මෙවැනි මූල්‍ය ගනුදෙනු පිළිබඳ පෘථුල පරීක්ෂණයන් පැවැත්වීම මඟපෙන්වන නෛතික ප්‍රතිපාදනයන් දනට නොමැත.

ශ්‍රී ලංකාව මේ වනතෙක් මුදල් විශෝධනය පිළිබඳ පරීක්ෂණ පවත්වා නොමැති අතර එයට හේතුවී ඇත්තේ මේ පිළිබඳ නෛතික ප්‍රතිපාදනයන් තවම නොමැති වීමයි.

## 6. මුදල් විශෝධන ක්‍රමෝපායන්

### 6.1 මුදල් තැන්පතු ව්‍යුහගතකරණය

ව්‍යුහගතකරණය අර්ථ නිරූපණය කර ඇත්තේ ආණ්ඩු විසින් මූල්‍ය ආයතන වෙත පනවා ඇති මූල්‍ය ගනුදෙනු පිළිබඳ රපෝර්තු කිරීමේ නීති රීති වලට ස්වයංක්‍රීයව හසු නොවන ආකාරයෙන් මුදල් තැන්පත් කිරීම් සිදුකළ හැකි ව්‍යුහයන් හෝ තැන්පතු ක්‍රමයන් තුළින් සාපරාධීව රැස්කළ ධනය තැන්පත් කිරීම ලෙසටයි. මෙම තත්ත්වයන් තුළ මුදල් විශෝධකයන් එකී රටවල් වල මුදල් විශෝධනයට එරෙහි නීති මගින් පනවා ඇති දනුම්දිය යුතු මුදල් තැන්පතු ප්‍රමාණයන්ට වඩා අඩු අගයන්ගෙන් යුතුව මුදල් තැන්පත් කරයි.

ව්‍යුහගතකරණය සිදුකරන්නේ මුදල් විශෝධනයට එරෙහි රපෝර්තු කිරීමේ අවශ්‍යතාවයන්ට පිටුපා, එකී වෙළඳ ගනුදෙනුවේ සැකසහිතභාවය සඟවා අපරාධයෙන් ඉපැයූ ධනය විශෝධනය කිරීමටයි.

### 6.2 දෙරටුපල්ලන් භාවිතය

මුදල් විශෝධනය නීතිඥවරුන් හරහා මූල්‍ය නොවන ගනුදෙනු ආකාරයෙන් ද සිදු කෙරේ. උදහරණයක් වශයෙන්, වැරදි නමකින් දේපලක් මිලදී ගැනීමට නීතිඥවරයෙකු උපයෝගී කර ගත හැක. විකල්ප වශයෙන් ගණකාධිකාරීවරුන් සම්බන්ධයෙන් සැලකූවිට, ආවරණ සමාගම් නමින් හෝ ගනුදෙනුකරු වෙනුවෙන් ඇතිකර ඇති භාරයක් වෙනුවෙන් ඉඩකඩම් මිලදී ගැනීම සඳහා එකී ගණකාධිකාරීවරයා වෙත මුදල් තැන්පතුවක් කිරීම සැලකිය හැක. දේපල වෙළඳම් නියෝජිතයන්ද මේ ආකාරයෙන් මුදල් විශෝධනය සඳහා යොද ගැනෙන්නේ ඉඩකඩම් මිලදී ගැනීමට ඔවුන්වෙත මුදල් තැන්පත් කිරීමෙනි. නීතිඥවරුන්, ගණකාධිකාරීවරුන්, විගණකවරුන් සහ වෙනත් වෘත්තීයවේදීන්, මෙවැනි ගනුදෙනු සිදුකිරීම සඳහා තම සේවාවන් සපයන්නේ නම් සහ ඔවුන් එකී ගනුදෙනු නීති විරෝධී බවට සැක පහළ කළ හැකි නම්, එකී වෘත්තීයවේදීන්ගේ ක්‍රියාකලාපයන් සම්බන්ධව මුදල් විශෝධනයට එරෙහි නීතිය යටතේ දඬුවම් කළ හැකිය.

## 6.3 අක් වෙරළ මූල්‍ය මධ්‍යස්ථානය

අක් වෙරළ මූල්‍ය මධ්‍යස්ථානයන්ද මුදල් විශෝධකයන් තම නීති විරෝධී ඉපැයීම විශෝධනයට යොදා ගනී. විශේෂයෙන්ම අක් වෙරළ මූල්‍ය මධ්‍යස්ථානයන් හි පවතින නීතිරාමු ඉහළ මට්ටමක බැංකු සහ සමාගම් රහස්‍යභාවයක් රකින අතර අනේවාසික ගනුදෙනුකාර පිරිසට සැලකිය යුතු ප්‍රමාණයේ රහස්‍යභාවය සුරැකීම් සපයයි. මේවා මූල්‍ය හා ව්‍යාපාර සේවාවන් සැපයීමේදී නේවාසික ගනුදෙනුකරුවන්ට වඩා අනේවාසික ගනුදෙනුකරුවන්ට වැඩි රහස්‍යභාවයක් සපයයි. ආදායම් බදු ගෙවීමෙන් මඟහැරීමට උත්සාහ ගන්නා පුද්ගලයන් ස්වකීය දේපල සඟවා තබා ගැනීමට අක් වෙරළ මූල්‍ය මධ්‍යස්ථාන යොදවා ගනී. තනි පුද්ගලයන්ටත්, ව්‍යාපාර වලටත් ගැලපෙන සේවා රැසක් මෙම මධ්‍යස්ථාන තම ගනුදෙනුකරුවනට සපයයි. අර්ථලාභී හිමිකරුවන් වෙනුවෙන් ක්‍රියාකරන තුන්වැනි පාර්ශ්වයන් බොහෝවිට මෙම බැංකුවල පවතින ගිණුම් පවත්වාගෙන යයි. මෙම අක් වෙරළ මූල්‍ය මධ්‍යස්ථාන ජාත්‍යන්තර වෙළඳ සමාගම් පිහිටුවීමට ආකර්ෂණය කර ගත හැකි ස්ථාන වේ. ජාත්‍යන්තර වෙළඳ සමාගම් ලෙස අර්ථ දක්වෙන්නේ එය සංස්ථාපනය කළ රටේ අධිකරණ බලයට සම්පූර්ණයෙන්ම පරිබාහිරව ක්‍රියාත්මක වෙන, පුළුල්ව පැතිර ගිය, රහස්‍යභාවය, පුළුල් බලතල, ඇරඹීමට සහ ක්‍රියාත්මක වීමට අඩු වියදමක් ඇති, සම්පූර්ණ බදු සහනයක් හෝ අඩු බදු අයකිරීමකට භාජනය වන අවම ලේඛන ගනුදෙනු හා රපෝර්තු කිරීම් පවතින ආයතනයක් වශයෙනි. මේවා සංස්ථාපනය කර ඇත්තේ ඒවායේ මව් සමාගම් වලින් ස්වායක්ත ආයතන ලෙස වන අතර එහි ඇත්තේ සීමිත මූල්‍ය වගකීම්ය. එසේම මෙම ජාත්‍යන්තර වෙළඳ සමාගම්වල දක්නට හැකි පොදු ලක්ෂණයක් වන්නේ දරන්නා සතු කොටස් සහ නාමික කොටස්කරුවන්, අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන් සිටීමයි. මෙම කාරණා හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳ සමාගම් මුදල් විශෝධනයට බෙහෙවින් යොදා ගැනේ. මුදල් විශෝධකයින් බොහෝ විට මෙම මාර්ගය ආවරණ සමාගම් ඇති කර ගැනීමට භාවිතා කරයි. මෙම ජාත්‍යන්තර වෙළඳ සමාගම් මූල්‍ය අපරාධයන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට හේතුපාදක වී ඇති අනෙක් කරුණු නම් සමාගමේ අර්ථලාභී හිමිකරුවන්ගේ ප්‍රධාන නිලධාරීන්ගේ, කොටස්කරුවන්ගේ රහස්‍යභාවය සහ වෙනත් තොරතුරුවල රහස්‍යභාවය රැකෙන නීතීන් පැවතීමයි.

තවත් මෙම අක් වෙරළ මූල්‍ය ආයතන සම්බන්ධව ඇති ජනප්‍රිය දක්මක් නම් වත්කම් සුරැකීමේ නීතියයි. එනම් මූල්‍ය ආයතනයක් හෝ නීතිඥවරයෙකු

තනි පුද්ගලයෙකුගේ වත්කම් කළමනාකරණය කිරීම පිළිබඳව ඇති නීතිමය ක්‍රම වේදයකි. මෙහිදී සේවාදායකයා සහ සේවාදායකයාගේ වත්කම් සෘජු නීතිමය නිරාවරණ වලින් ආරක්ෂා කර ඇත.

## 6.4 වෙනත් ක්‍රම

මුදල් විශෝධනයට යොදා ගන්නා තවත් ක්‍රමයක් ලෙස දක්විය හැක්කේ කැසිනෝ ක්‍රීඩාවේදී යොදා ගන්නා කැසිනෝ කාසි මුදල් වර්ගයක් ලෙස යොදා ගැනීමයි. උදාහරණයක් වශයෙන්, මත්ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා කැසිනෝ කාසි යොදාගෙන එකී කැසිනෝ කාසි පසු අවස්ථාවක දී කැසිනෝ ශාලාවකට ඉදිරිපත් කර ක්‍රීඩාවෙන් දිනූ මුදලක් ලෙස සටහන් කර එම වටිනාකම සඳහා චෙක්පත් ලබා ගැනීම සඳහන් කළ හැක.

විකල්ප බැංකු සහ තැන්පත් තැරැව්කරුවන් ද ජාත්‍යන්තර අරමුදල් හුවමාරු කිරීම සඳහා යොදවා ගැනේ. මෙම මුදල් හුවමාරු ක්‍රමය විශ්වාසය මත පදනම් ව ඇති අතර සාමාන්‍යයෙන් සිදුවන්නේ අර්ථලාභියාගේ තොරතුරු විකල්ප බැංකුකරුට ලබාදී යැවිය යුතු මුදල සහ බැංකුකරුගේ කොමිස් මුදල ඔහුට ලබා දීමයි. විකල්ප බැංකුකරු මෙම මුදල තමා ගිණුමක් පවත්වාගෙන යන මූල්‍ය ආයතනයක තැන්පත් කරයි. ඉන්පසු විකල්ප බැංකුකරු අර්ථලාභියාගේ රටේ සිටින හඳුනන අයෙකුට උපදෙස් ලබාදෙයි. මෙම උපදෙස් සාමාන්‍යයෙන් දුරකථන මගින් හෝ ෆැක්ස් පණිවුඩ මගින් ලබා දේ. 'හවාලා' සහ 'හුන්ඩි' ක්‍රමයන් විකල්ප තැන්පත් ක්‍රමයන් ලෙස බොහෝ දකුණු ආසියාතු රටවල, විශේෂයෙන්ම ඉන්දියාවේ සහ පාකිස්ථානයේ ජනප්‍රියව පවතී. හවාලා නැමති වචනය හුවමාරුව යන අරාබි වචන මූලාශ්‍රයෙන් බිඳුනක් වුවද හින්දි සහ උර්දු භාෂාවල එම වචනයට මුදල් හුවමාරුව නැතහොත් විශ්වාසය යන තේරුම ද ගෙන දෙන අතර මෙම ක්‍රමය පවත්වාගෙන යැමට විශාල විශ්වාසයක් පැවතිය යුතුය. එය බටහිර බැංකු ක්‍රමයට සමාන්තරව පවතින මුදල් තැන්පතු හුවමාරු ක්‍රමයකි. හවාලා තැරැව්කරුවන් හවාලා ගනුදෙනු සිදුකරයි. හවාලා ගනුදෙනුව පිළිබඳ සංක්ෂිප්ත අර්ථ නිරූපණය නම් මුදල් සංචරණයක් නොමැතිව මුදල් හුවමාරු වීමයි. හවාලා තැරැව්කරුවෙකු හවාලා ගනුදෙනුවක් සිදු කරද්දී තම සම්බන්ධතාවයන් උපයෝගී කර ගනිමින් මුදල් ගෙනයැම හෝ මුදල් වර්ග මාරුකිරීම හෝ රත්‍රං වැනි වටිනා ලෝහ ගෙන යැම සිදු කරවයි. හවාලා තැරැව්කරු යැවිය යුතු මුදල් එක් ස්ථානයකදී බාගෙන ඔහුගේ සබඳතා ජාලය උපයෝගී කර

ගනිමින් එම මුදල් වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කරවයි. සත්‍ය වශයෙන්ම මුදලක් ගමන් නොකරන අතර ඒ පිළිබඳ තොරතුරු වාර්තාගත වීමක් ද නොමැත. හවාලා ක්‍රමය බොහෝ අවස්ථාවල දී බැංකු ක්‍රමය සමඟ ද සම්බන්ධය. හවාලා ක්‍රමය බොහෝ මුදල් විශෝධන විධි ක්‍රමයන්වල කොටසක් ලෙස දකිය හැකිය.

රන් කුට්ටි විකුණන්නන්ද මුදල් විශෝධනයේදී යොදවා ගත හැක. වාර්තාවන අවම මිලට වඩා සුළු වශයෙන් අඩු මිලකට රන් මිළදී ගැනීමට රන් කුට්ටි විකුණන්නන් යොදවා ගැනීම විවිධ ආයතන විසින් සිදු කරනු ලබයි. එසේම නවීන ගෙවීමේ තාක්ෂණයන් සහ අන්තර්ජාලය ඔස්සේ ගනුදෙනු කෙරෙන ඉලෙක්ට්‍රොනික මූල්‍ය උපකරණ හරහාද මුදල් විශෝධනය සිදුවන බවට සැක පළවී තිබේ. මුදල් විශෝධකයන් දනට පවතින මුදල් හුවමාරු ක්‍රමවේද වල විවිධ අවස්ථාවන් ස්ථානගතකරණය, ස්ථරීකරණය සහ ඒකාග්‍රකරණයට යොද ගනී.

## 7. මුදල් විශෝධනයට එරෙහි ක්‍රමවේදය

මුදල් විශෝධනයට එරෙහි ක්‍රමවේදයේ මූලිකාංග පහත පරිදි විය යුතුය.

1. නෛතික - අදළ නීති සහ රෙගුලාසි.
2. නිවාරණ - මූල්‍ය බුද්ධි අංශයක්, මූල්‍ය පරිපාලන සහ නීති ක්‍රියාත්මක කරන ආයතන ඇති කිරීම සහ මූල්‍ය ආයතන පරිපාලනය සහ බලධාරීන්ට වාර්තා කිරීමේ පටිපාටියක් ඇති කිරීම ඇතුළුව එළැදයී ආයතන රාමුවක් පිහිටුවා ගැනීම.
3. පරීක්ෂණ - මූල්‍ය බුද්ධි තොරතුරු විශ්ලේෂණය සහ නීති ක්‍රියාත්මක කරවීම.
4. ජාත්‍යන්තර සහයෝගය - එකඟ වූ නෛතික සහාය වීම.

මුදල් විශෝධනය අපරාධ වරදක් බවට පත්කිරීම සඳහාත්, එවැනි ද පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය බලතල ලබාදීම සඳහාත් එවැනි සාපරාධී කටයුතු වලින් උපයාගත් ධනය ආයෝජනය නැවැත්වීමට, එකී අරමුදල් පවරා ගැනීමට හා රාජසන්තක කිරීමට බලතල ලබාදෙන ආකාරයේ නෛතික රාමුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වී ඇත. එසේම ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි තක්සේරුව සිදුකිරීමටත්, මූල්‍ය බුද්ධි අංශ ඇති කිරීමටත් අදළ නීති කෙටුම්පත් කිරීම් වැදගත් වී ඇත.

මූල්‍ය බුද්ධි අංශ වල ක්‍රියාකාරිත්වය මත පදනම් වුණු ක්‍රියාශීලී නිවාරණ ආයතන රාමුවක් පිහිටුවීම වැදගත් වී ඇත. මහ බැංකුව සහ මූල්‍ය පරිපාලකයන්ට නිවාරණ උපක්‍රම වැඩිදියුණු කළ හැකි අතර, නීතිය ක්‍රියාත්මක කරන ආයතන එනම්, පොලිසිය, රේගුව සහ ආගමන විගමන සේවාවන් නිවාරණ යාන්ත්‍රණයේ අත්‍යවශ්‍ය අංගයන් ස්ථාපනය කරන බැව් සැලකිය යුතුය. එසේම දෙරටුපල්ලන් ලෙස ක්‍රියා කරන්නන්ගේ සවිස්තරාත්මක ලැයිස්තුවක් සකස් කිරීමත් ඔවුන් වෙත ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම, තොරතුරු එක්රැස් කිරීම සහ කිසියම් අසාමාන්‍ය ගනුදෙනු සිදුවන්නේ දැයි සොයා ගැනීම සඳහා ගිණුම් නිරීක්ෂණය කිරීම සහ මුදල් වර්ග හුවමාරු හා ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු හඳුනා ගැනීම යනාදී වගකීම් පවරාදීමත් අත්‍යවශ්‍ය වේ. එසේම මෙකී වගකීම් නිසි ලෙස ඉටු කරනවාදැයි පිරික්සීමත් අවශ්‍ය ය.

අපරාධ පරීක්ෂණයන්ට මූල්‍ය බුද්ධි තොරතුරු ලබාදිය යුතු අතර ඔවුන්ට ඒ තුළින් මුදල් විශෝධනය පිළිබඳ ඉලක්ක හඳුනා ගැනීමටත්, අපරාධ පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීමටත් හැකි විය යුතුය.

ජාත්‍යන්තර සහයෝගීතාව යන පදනම තුළ එකඟ වූ නෛතික සහාය වීම්, මුදල් විශෝධන පරීක්ෂණ සඳහා අත්‍යවශ්‍ය වූ අංගයකි. ජාත්‍යන්තර සහයෝගය හැකිතාක් පුළුල් විය යුතු අතර, එය අවම වශයෙන් පරිපාලකයින්, මූල්‍ය බුද්ධි අංශ සහ නීතිය ක්‍රියාත්මක කරන අංශ සමඟවත් සම්බන්ධතා පැවැත්විය යුතු අතර කිසියම් රටක් තුළ පවතින පරිපාලකයන් හා මූල්‍ය බුද්ධි අංශ, මූල්‍ය බුද්ධි අංශ හා නීතිය ක්‍රියාත්මක කරන අංශ, පරිපාලකයන් හා නීතිය ක්‍රියාත්මක කරන අංශ අතර අන්තර් සහයෝගයක් ද තිබිය යුතුය.

ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි තක්සේරු සිදු කිරීමේ ක්‍රමයට මූල්‍ය කටයුතු පිළිබඳ කාර්යසාධක බලකාය විසින් සිදුකර ඇති නිර්දේශ එනම්, නිර්නාමික ගිණුම් තහනම් කිරීම, ව්‍යාජ නම් වලින් ගිණුම් පවත්වාගෙන යාම තහනම් කිරීම, දේශපාලනිකව හෙළිදරව් වුණු පුද්ගලයන් පිළිබඳ නිසි තක්සේරුව වැඩි කිරීම සහ අනතුරුදායක ගනුදෙනුකරුවන් හා අසාමාන්‍ය ගනුදෙනු පිළිබඳ අවධානයත් යනාදිය වේ. ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි තක්සේරු කිරීම් සඳහා ගනුදෙනුකරුගේ අනන්‍යතාවය සහ එම අනන්‍යතාවය ස්වාධීන දත්ත, තොරතුරු සහ ලේඛන යනාදිය මඟින් තහවුරු කරගැනීමත් මෙන්ම අර්ථලාභියා පිළිබඳව අනන්‍යතාව හඳුනා ගැනීම සහ සාධාරණ තක්සේරුවක් සිදුකිරීමත් වැදගත් වේ. තවදුරටත් ප්‍රකාශ කළ යුත්තේ,

හේතුව සහ ව්‍යාපාර සම්බන්ධතාවය පිළිබඳව ඇති අරමුණ පිළිබඳව තොරතුරු ලබා ගැනීමත් වැදගත් බවයි.

අනතුරුදායක ගනුදෙනුකරුවන් පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ නිසි තක්සේරු ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය. ගනුදෙනුකරුවන් සිදුකරන ව්‍යාපාරවල ස්වභාවය, ගනුදෙනුවල ස්වභාවය සහ ඒවායේ පිහිටීම පිළිබඳ තක්සේරුවක් තුළින් මූල්‍ය ආයතන තම ගනුදෙනුකරුවන්ගේ අවදානම් සහගත තත්ත්වය තක්සේරු කළ යුතුය. අධි-අවදානම් සහගත ගනුදෙනුකරුවන් පිළිබඳව වැඩිදුර තොරතුරු ලබාගත යුතු අතර එවැන්නක් සමඟ ව්‍යාපාර සබඳතා ගොඩනඟා ගැනීමේදී අදාළ මූල්‍ය ආයතනයේ වඩාත්ම ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරණයේ අනුමැතිය ලබාගත යුතුය. මූල්‍ය ආයතන ව්‍යාපාර සබඳතාවය අවසන් වීමෙන් පසු හෝ ගනුදෙනුව සිදුකිරීමෙන් පසු අවම වශයෙන් වසර 5 ක් වත් ගතවන තෙක් ඒ සම්බන්ධ වාර්තා තබාගත යුතුය.

## 7.1 මූල්‍ය බුද්ධි අංශය

මූල්‍ය බුද්ධි අංශය මුදල් විශෝධනයට එරෙහි ක්‍රමෝපායේ අනිවාර්ය අංගයකි. මූල්‍ය බුද්ධි අංශයක් යනු සැක සහිත අපරාධ ඉපැයුම් සම්බන්ධ මූල්‍ය තොරතුරු නිසි බලධාරී ආයතනයක් වෙත යොමු කිරීමේ අරමුණින් එකී තොරතුරු එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම පිළිබඳව වගකිවයුතු ජාතික මධ්‍යම කාර්යාංශයකි.

මූල්‍ය කටයුතු පිළිබඳ කාර්යසාධක බලකාය විසින් පළකළ 26 වැනි නිර්දේශය අනුව සැක කටයුතු ගනුදෙනු වාර්තා සහ වෙනත් මුදල් විශෝධනය වීම් විය හැකි අවස්ථා සම්බන්ධව තොරතුරු ලබාගන්නා, විශ්ලේෂණය කරන සහ ඒවා යොමු කරන ජාතික මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන මූල්‍ය බුද්ධි අංශයක් ස්ථාපිත කිරීමට රටවල් වලට නිර්දේශ කර ඇත. සැක කටයුතු ගනුදෙනු වාර්තා විශ්ලේෂණය කිරීම ඇතුළු මූල්‍ය බුද්ධි අංශයේ කර්තව්‍යයන් නිසි ආකාරයෙන් සිදු කිරීම සඳහා එයට ඍජුව හෝ වක්‍රව පරිපාලන සහ නීතිය ක්‍රියාත්මක කරලීම සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ඉඩකඩ ලැබිය යුතුය. මූල්‍ය බුද්ධි අංශය පිළිබඳ අර්ථ නිරූපණයට අත්‍යවශ්‍ය අංග පහක් පවතී. එනම්, මූල්‍ය බුද්ධි අංශයන්:

(අ) එහි කටයුතු මධ්‍යගත ආකාරයකින් සිදුකළ යුතුයි.

(ආ) ගබඩාකර තැබීමේ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළ යුතුයි.

(ඇ) විශ්ලේෂණාත්මක ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය.

(ඈ) නිරන්තර තොරතුරු හුවමාරු කරගැනීමේ ක්‍රමයක් පවත්වාගෙන යා යුතුය.

(ඉ) මෙම සියලු කටයුතු පවත්වාගෙන යා යුත්තේ අපරාධයක හේතුව අනාවරණය කර ගැනීමේ නිශ්චිත අවශ්‍යතාවය ටයි.

මීට පෙර සඳහන් කර ඇති ආකාරයට මූල්‍ය බුද්ධි අංශයක් යනු වෙනත් ආකාරයකින් පවසතොත් නීතියෙන් ස්ථාපිත ජාතික ආයතනයක් වන අතර එය:

(අ) විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබාගනී.

(ආ) එම තොරතුරු විශ්ලේෂණය කරයි.

(ඇ) එකී තොරතුරු යොදගත හැකි බුද්ධි තොරතුරක් (ඔත්තුවක්) බවට සංවර්ධනය කරයි.

(ඈ) නිසි බලධාරී සහ ප්‍රාදේශීය ආයතන වලට එම තොරතුරු බෙදහරියි.

(ඉ) මුදල් විශෝධනය සහ සමහර අවස්ථා වලදී වෙනත් අපරාධ පිළිබඳ පරීක්ෂණ වලට සහය වේ.

(ඊ) වෙනත් රටවල (ප්‍රදේශවල) පවතින සමරූපී ආයතන සමඟ සබඳතා පවත්වාගෙන යයි.

මූල්‍ය බුද්ධි අංශයක අරමුණ වන්නේ මුදල් විශෝධනය නිවාරණය සහ සොයා ගැනීමත්, වරදකරුවන් නීතියේ ග්‍රහණයට ගැනීම සහ ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරලීමත්, අපරාධ තුළින් උපදවාගත් ධනය හඳුනා ගැනීමත්, අපරාධ පරීක්ෂණය සඳහා උපකාරී වීමත්, අංශ අතර සහ ගනුදෙනුකාර ආයතන අතර සාධනීය සම්බන්ධතා වර්ධනය කරලීමත් සහ වෙනත් රටවල පවතින සමාන්තර ආයතන සමඟ සාධනීය සම්බන්ධතා ආරම්භ කර පවත්වාගෙන යාමත්ය.

මූල්‍ය බුද්ධි අංශයක බුද්ධි ක්‍රියාවලිය වනුයේ: දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය සහ සංස්ලේෂණය, ඒවා විභාග කිරීම, පතුරවා හැරීම සහ එකී දත්ත යළි විශ්ලේෂණය කිරීමයි. මූල්‍ය බුද්ධි අංශයක් වෙත ලැබෙන තොරතුරු සහ

වාර්තා මුදල් හුවමාරු වාර්තා, සැකකටයුතු හුවමාරු වාර්තා, දේශ සීමාන්තර හුවමාරු වාර්තා, ඉලෙක්ට්‍රොනික් අරමුදල් හුවමාරු වාර්තා, ජාත්‍යන්තර අරමුදල් හුවමාරු වාර්තා සහ වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රභවයන්ගෙන් ලැබෙන සාමාන්‍ය වාර්තා සහ වාර්තාවන් ලෙස හඳුනාගත හැක.

## 8. ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින මුදල් විශෝධනයට එරෙහි නීති කෙටුම්පත.

ශ්‍රී ලංකාවේ මුදල් විශෝධනයට එරෙහිව කෙටුම්පත් කර ඇති නීතිය ශ්‍රී ලංකාව තුළ මුදල් විශෝධනය පරාජය කිරීම සඳහා සකස් කර ඇත. එය බැංකු රහස් නීති අතික්‍රමණය කරන අතර එය මූල්‍ය ආයතන වෙත වර්ධිත සැලකිල්ලක් සපයයි. නව නීතිය යටතේ මූල්‍ය ආයතන වලට සියලුම සංකීර්ණ, අසාමාන්‍ය, විශාල ගනුදෙනු සහ පෙනෙන පරිදි ආර්ථික හෝ නීත්‍යනුකූල හේතුවක් නොමැතිව සිදුකෙරෙන අසාමාන්‍ය ගනුදෙනු ආකාරයන් පිළිබඳව විශේෂ අවධානයකින් සිටිය යුතු වේ. එවන් ගනුදෙනු වල පසුබිම සහ අරමුණ හැකිතාක් දුරට විභාග කර එහි ප්‍රතිඵල පරිපාලකයින්, විගණකවරුන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලට ලබා දිය යුතු වේ.

මූල්‍ය ආයතන ඕනෑම සැක කටයුතු ගනුදෙනුවක් පිළිබඳව මූල්‍ය බුද්ධි අංශයට හරියාකාරව වාර්තා කළ යුතු අතර එම අංශය සියලුම බැංකු සහ මූල්‍යායතන විසින් වාර්තා කෙරෙන සියලුම සැක කටයුතු ගනුදෙනු පිළිබඳව පරීක්ෂාකාරිව පසුවී, බොහෝ විට ඒවා විශ්ලේෂණය කර, සිදුවන ඕනෑම සැක කටයුතු ගනුදෙනුවක් වැඩිදුර පරීක්ෂණ පැවැත්වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලට වාර්තා කළ යුතුය.

නව නීති කෙටුම්පතට අනුව මුදල් විශෝධනය වරදක් වන අතර මුදල් විශෝධන පරීක්ෂණ අධිකාරියක් එනම් මූල්‍ය බුද්ධි අංශයක් ලෙස ක්‍රියා කරන සියලුම සැක කටයුතු ගනුදෙනු වාර්තා කෙරෙන මධ්‍යම කාර්යාංශයක් ස්ථාපනය කෙරේ. නව නීතිය අනුව මුදල් විශෝධන වරදට අදළ දේපල තහනමට ගැනීම, රඳවා තබා ගැනීම හා රාජ සන්තක කිරීමට බලය පැවරේ. ඒ තුළ අවබෝධාත්මක නෛතික සහනයක් ලබා දීමටත් අපරාධ පරීක්ෂණ සිදු කිරීමේ ක්‍රමෝපායයන් සැලැස්වීමටත් ප්‍රතිපාදන පවතී. ඉහත ආකාරයේ අපරාධ පරීක්ෂණයකට සම්බන්ධ වී සිටින අයවලුන්ට හෙළිදරව්

කිරීම්, සාක්ෂි දීම් වැනි කාරණා සම්බන්ධව නෛතික රැකවරණයක් ද මෙමගින් ලැබී ඇත.

තමන්ට ඇති ජාත්‍යන්තර වගකීම් ඔස්සේ ශ්‍රී ලංකාව අපරාධ පරීක්ෂණ වලදී අවබෝධාත්මක නෛතික සහයයන් ලබාදීම සම්බන්ධව වෙනත් නීති රීතිද පනවා ඇත. මෙම පනතේ අරමුණ වන්නේ චූදිතයන් සහ සාක්ෂිකරුවන් සොයා ගැනීමටත් ඔවුන් හඳුනා ගැනීමටත් එමෙන්ම ලේඛන යැවීම, සාක්ෂිකරුවන් විභාග කිරීම, ලේඛන සහ වෙනත් ලිපිද්‍රව්‍ය සම්බන්ධව සාක්ෂි ලබාගැනීම, සෙවීම් සහ රඳවා ගැනීම් ක්‍රියාත්මක කරලීම, අත්අඩංගුවේ සිටින අයෙකුව සාක්ෂිකරුවෙකු ලෙස ක්‍රියා කිරීමට තාවකාලිකව ලබා ගැනීමට පහසුකම් සැලසීම, සාක්ෂිකරුවෙකුට පෙනී සිටීමට පහසුකම් සැලසීම, ලේඛන සහ වෙනත් වාර්තා පිළිබඳ ප්‍රතිපාදක, අපරාධ වරදකින් ඉපැයූ ලාභයක් පවතින ස්ථානය සොයාගැනීම, දඩ ගෙවීමේ නියෝග ක්‍රියාත්මක කරලීම සහ දේපල තහනමට හා රාජ්‍ය සන්තක කරලීමට භාජනය කරවීම පිළිබඳ ප්‍රතිපාදන අඩංගුය.

ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උනන්දුවක් දක්වීම සහ සැකකටයුතු ගනුදෙනු වාර්තා කිරීම මගින් මුදල් විශෝධනය වැළැක්වීම සහ සොයා ගැනීම අරමුණු කර ගත් මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත නීතිගත කිරීමටද අවධානය යොමුකර ඇත.

## 9. වත්මන් තත්ත්වය

මෑතකදී ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මාලදිවයින, පකිස්ථානය හා ශ්‍රී ලංකාව සම්බන්ධ කර ගනිමින් පැවැත්වූ ලෝක සංවාද වැඩ පිළිවෙළෙහි එක් සමුළුවකදී ශ්‍රී ලංකාවේ අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශයේ ලේකම් ධරණී විජේතිලක මහත්මිය විසින් සිදුකරන ලද පහත සඳහන් ප්‍රකාශය දීර්ඝ වශයෙන් මෙහි සඳහන් කරමි.[1]

"මුදල් විශෝධනයට එරෙහි කාර්යක්ෂම ක්‍රමවේදයක් ඇති කර ගැනීමේ වුවමනාවෙන් යුත් ශ්‍රී ලංකාව මේ වන විට වැඩපිළිවෙළ රැසක් අරඹා ඇත. මෙම ගැටලුව පිළිබඳ ක්‍රියාත්මක වීම සඳහා දිනෙන් දින වැඩිවන

1. මුදල් විශෝධනයට එරෙහි වීම සහ ත්‍රස්තවාදය පරාජය කිරීම ලෝක බැංකු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝක සංවාද වැඩපිළිවෙළ 2003.

අවශ්‍යතාවය සහ එහි විවිධ පැතිමානයන් පිළිබඳව ඇතිවන අනතුරු හැඟවීම් පිළිබඳව ශ්‍රී ලංකාව අවබෝධයෙන් සිටියි. එසේම ශ්‍රී ලංකාව සමාන්තර ආර්ථිකයන් හරහා මහා ධනස්කන්ධයක් උපයාගෙන ඒ තුළින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන අවතක්සේරුවට ලක්කර සිටින ලෝක ත්‍රස්තවාදී සංවිධාන විසින් සිදුකරන තර්ජනය පිළිබඳ වැඩි අවධානයක් සහ යොමුවීමක් සිදුවිය යුතුයැයි අවබෝධ කරගෙන සිටියි.

මුදල් විශෝධනයෙන් මතුවන තර්ජනය පාලනය කළ යුතු බව ශ්‍රී ලංකාව විශ්වාස කරයි. මෙම අරමුණ සඳහා වැඩපිළිවෙළ කිහිපයක් අරඹා ඇත.

- මුදල් විශෝධනයට එරෙහි පරිපූර්ණ යාන්ත්‍රණයක් පිහිටුවා ගැනීම සඳහා වූ නීති කෙටුම්පත් පිළියෙල කරමින් තිබේ.
- ශ්‍රී ලංකාවේ අල්ලස් හෝ දූෂණයට විරුද්ධව පවතින නීතිය අනුව දනටමත් එවැනි ක්‍රියා තුළින් උපදවාගත් ධනය රාජසන්තක කිරීම සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත.
- දනට සකස් කෙරෙමින් පවතින විෂ සහ අන්තරායකර ඖෂධ පිළිබඳව වූ පනත් කෙටුම්පතේ මත්ද්‍රව්‍ය වරදවල් හරහා උපදවාගත් මුදල් විශෝධනය කිරීම වැළැක්වීම සඳහා පරිපූර්ණ ප්‍රතිපාදන අඩංගු පරිච්ඡේදයක් එක් කර ඇත.
- පැල්මෝ ප්‍රඥප්තියට සහ එහි උපලේඛන දෙකටම අත්සන් තබා ඇත. ජාත්‍යන්තර සංවිධිත අපරාධ මැඩලීම සඳහා වූ නීති කෙටුම්පත් කරමින් පවතී.
- අපරාධ හරහා උපදවාගත් දේපල රාජසන්තක කළ හැකි සංවිධානාත්මක අපරාධ පිළිබඳව වූ, පනත් කෙටුම්පතක්.
- වර්ෂ 2003 දී අවසන් කරන ලද සයිබර් අපරාධ පිළිබඳව පනත් කෙටුම්පත - එමගින් අපරාධ සඳහා සූදනම් වීමේදී නූතන තාක්ෂණය යොද ගැනීම තහනම් කර ඇත. මෙමගින් සංකීර්ණ තාක්ෂණය තම කටයුතු සඳහා යොද ගන්නා මුදල් විශෝධකයින් නීතියේ රැහැනට හසුකරවා ගැනීමට පවතින නීතිමය රාමුව පුළුල් කර ඇත.
- 2002 අපරාධ මර්දන කටයුතු සඳහා සහයෝගය ලබාගැනීම සඳහා පනත වර්ෂ 2002 අගෝස්තු 15 දින පාර්ලිමේන්තුවේදී සම්මත විය. මෙය පොදු රාජ්‍ය මණ්ඩලීය ආදර්ශය අනුව සකස් කර ඇති අතර එමගින් අපරාධ වලින් උපදවාගත් ලාභයන්

පිළිබඳව සෙවීමටත්, පරීක්ෂණ පැවැත්වීමටත්, ඒවා තහනමට ගැනීමටත්, සහ අධිකරණ නියෝග ක්‍රියාත්මක කරලීමටත් වෙනත් රටවලින් සහයෝගය ලබාගැනීම සඳහා පූර්ණ ප්‍රතිපාදන රාමුවක් සලස්වා ඇත.

- මුදල් විශෝධනයට එරෙහි පනත් කෙටුම්පත මේ වන විට කෙටුම්පත් කිරීම අවසන් කෙරෙමින් පවතින අතර නොබෝ දිනකින්ම එය ආණ්ඩුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙනු ඇත. එමගින් මත්ද්‍රව්‍ය, ත්‍රස්තවාදය, අල්ලස් හෝ දූෂණ, ගිනිඅවි භාවිතය, පුපුරණ ද්‍රව්‍ය හා අන්තරායකර ආයුධ, සංවිධානාත්මක අපරාධ, සයිබර් අපරාධ, මිනිසුන් ජාවාරම, අශීලාචාර ඡායාරූප ද ඇතුළුව ළමා ලිංගික අපයෝජනය යනාදී අපරාධ මර්දනය සඳහා පූර්ණ ප්‍රතිපාදන සලස්වා ඇත.

- මූල්‍ය ආයතන පිළිබඳව වූ පුළුල් අර්ථ නිරූපණය තුළින් පුළුල් පරාසයක ක්‍රියාකාරකම් ආවරණය වේ.

- මූල්‍ය කටයුතු පිළිබඳ කාර්යසාධක බලකායේ නිර්දේශ සමඟ සමාගමී වන සමාගම් හැසිරවීමක හඳුන්වා දීම දනටත්, මහ බැංකුව මගින් නිකුත් කරන උපදෙස් තුළින් පරිපාලනමය වශයෙන් මෙවැනි පාලනයක් සිද්ධ කිරීම අපේක්ෂා කෙරේ.

- මුදල් විශෝධනය වෙනත් අපරාධයක් හේතුවෙන් ව්‍යුත්පන්න වූවක් ලෙස සැලකීම. මෙම පනත් කෙටුම්පතේ ඍජුව අර්ථ නිරූපණය කෙරෙන අපරාධ හඳුන්වා නොමැත. නීති විරෝධී ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ගිණුම්ගත කිරීම වළක්වාලන නියෝගයක් හඳුන්වා දීමට නියමිතයි.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1373/2001 දරණ යෝජිත සම්මුතිය අනුව ශ්‍රී ලංකාව විසින් 2001 ඔක්තෝබර් 16 වන දින ගැසට් පත්‍රය මගින් රෙගුලාසි පනවා ප්‍රකාශයට පත් කරන ලදී. මෙම රෙගුලාසි මගින් කිසිදු වාණිජ බැංකුවකට ත්‍රස්තවාදී හෝ කඩාකප්පල්කාරී ක්‍රියා සිදුකරන සංවිධාන සමඟ කිසිදු ආකාරයේ ගනුදෙනුවක් පවත්වාගෙන යෑම තහනම් කරන ලදී.

ශ්‍රී ලංකාව ත්‍රස්තවාදයට මූල්‍යාධාර දීම වැළැක්වීම සඳහාවූ ජාත්‍යන්තර සම්මුතියේ පාර්ශවකරුවෙකි.

ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි යොදවා ගැනීම පිළිබඳ මහපෙන්වීම් සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම වාණිජ හා විශේෂ බැංකු වලට චක්‍රලේඛනයන් මගින් උපදෙස් දී ඇත. මෙහි අරමුණ නම් ත්‍රස්තවාදී හා කඩාකප්පල්කාරී ක්‍රියා සඳහාත්, මුදල් විශෝධනය සඳහාත් මූල්‍ය ආයතන යොද ගැනීමේ තත්ත්වය පරීක්ෂාවකින් තොරව පැවතීම වැළැක්වීමයි.

ශ්‍රී ලංකාව බැංකු නොවන මූල්‍ය ආයතන නියාමනය කිරීම සඳහා එක් ආයතනයක් පිහිටුවීම පිළිබඳව නීති සම්පාදනය කරමින් සිටියි. මෙම ආයතනය ඇතැම් විට මුදල් විශෝධනයට එරෙහි ක්‍රියාපටිපාටීන් පිළිබඳ සුපරීක්ෂාකාරී ද වනු ඇත.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමත් මුදල් විශෝධනයත් මර්දනය කිරීමේදී මතුවන ප්‍රධාන අභියෝගයන් නම්:

- නිරීක්ෂණ සහ පරීක්ෂණ කටයුතුවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- අපරාධකරුවන් යොදගන්නා උපායයන් පිළිබඳව ඒ පමණටම අවබෝධයෙන් සිටීම. අපරාධකරුවන් යොදගන්නා ක්‍රමවේදයන් වඩාත් දියුණු සංකීර්ණ වන අතර අපරාධ පරීක්ෂණයන් සැම විටම ඔවුන්ට වඩා පියවරක් පිටුපසින් සිටින බව පෙනේ.
- අපරාධ පරීක්ෂකයින් පුහුණු කිරීම.
- මුදල් විශෝධනයට එරෙහි කටයුතුවල පවතින වර්ධනයන් සහ ජාත්‍යන්තර පරිශ්‍රමයක් පිළිබඳව දැනුවත්භාවයක් ඇති කිරීම.

## 10. මුදල් විශෝධනයට එරෙහි අන්තර්ජාතික වැඩසටහන්

1. කැරිබියානු මූල්‍ය ක්‍රියාකාරකම් කාර්ය සාධක බලකාය: මෙහි ආරම්භයේ සිටම කැරිබියානු ප්‍රදේශයේ රටවල් 25 ක් දක්වා මෙම කාර්යසාධක බලකායේ සාමාජිකත්වය ලබාගෙන ඇත. මෙම කාර්යසාධක බලකාය එකී බලකාය මගින්ම සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධක බලකාය (FATF) මගින් සිදු කර ඇති නිර්දේශයන් ඵලදයි ලෙස ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීම සඳහා ක්‍රමවේදයන් දියත් කර ඇත. මෙම සාමාජික රටවල් ඉහත කී නිර්දේශයන් සමඟ සහ වියනා සම්මුතිය සමඟ සමපාත වන පරිදි තම රටවල ක්‍රියාකාරීත්වයක් සිදු වන්නේ ද

යන්ත්‍ර විශ්ලේෂණය කරන වාර්තා අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කරගැනීමට දැඩිව බැඳී සිටියි.

2. මුදල් විශෝධනය පිළිබඳ ආසියානු පැසිපික් කණ්ඩායම: මෙම කණ්ඩායම, තම සාමාජික රටවල මුදල් විශෝධනයට එරෙහි ඵලදායී නීති කෙටුම්පත් ඇතිකර ගැනීමේ අවශ්‍යතාවය තහවුරු කරමින් වැඩමුළු පවත්වා ඇත. එසේම එය තම සාමාජික රටවල තත්ත්වය විශ්ලේෂණය කිරීමක් සහ කලාපය පිළිබඳව ස්ව - අධ්‍යයන සහ අන්‍යෝන්‍ය විශ්ලේෂණ ක්‍රියාදාමයක් සිදු කර ඇත.

3. යුරෝපා කවුන්සිලයේ අමාත්‍ය කමිටුව විසින් 1977 සැප්තැම්බර් මාසයේදී මුදල් විශෝධනයට එරෙහිව ක්‍රමවේදයන් විශ්ලේෂණය කිරීම පිළිබඳව විශේෂඥයන්ගෙන් සමන්විත තේරීම් කාරක සභාවක් පත්කරන ලදී. එමගින් මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධක බලකායට අයත් නොවන්නා වූ යුරෝපානු රටවල් කවුන්සිලයේ සාමාජික රටවල පවත්වාගෙන යන මුදල් විශෝධනයට එරෙහි ක්‍රමවේදයන් පිළිබඳව අන්‍යෝන්‍ය විශ්ලේෂණයක් සිදු කර ඇත.

4. බැංකුකරණ සුපරීක්ෂණය පිළිබඳ අක්වෙරළ කණ්ඩායම: මෙම කණ්ඩායමේ සාමාජිකත්වය පිළිබඳව ඇති කොන්දේසි වලට ඇතුළත් වෙන්නේ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධක බලකායේ නිර්දේශයන් හතළිහ ක්‍රියාත්මක කරවීමට ඇති දෘඪ දේශපාලනික කැපවීමයි. එසේම මෙම කණ්ඩායම කැරිබියානු මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධක බලකායේත්, මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යසාධක බලකායේ සාමාජිකයන් නොවන රටවල අන්‍යෝන්‍ය විශ්ලේෂණයන් දාමයක් ක්‍රියාත්මක කර ඇත.

5. මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳව කාර්යසාධක බලකාය: මෙම කාර්යසාධක බලකායේ නිර්දේශයන් හතළිහ තුළ මුදල් විශෝධනය මර්දනය කිරීම සඳහා වූ ක්‍රමවේදයන් අඩංගු වන අතර මෙම නිර්දේශයන් අනුගමනය කිරීමට හා ඒවා අන්තර්ගත නීති සම්පාදනය කිරීමට අපොහොසත් වන රටවල් අකුසලතා ලැයිස්තුවකට ඇතුළත් කෙරේ. මෙම කාර්යසාධක බලකාය වැනි ලෝක සංවිධාන ඒ හා සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන රටවල් සහ රාජ්‍යයන් එනම් මුදල් විශෝධනයට එරෙහි නීති

රෙගුලාසි පනවන්නේ නැති රටවල් ප්‍රතික්ෂේප කිරීමටත්, ඔවුන් අකුසලතා ලැයිස්තුගත කිරීමටත් ක්‍රියාත්මක වේ.

## 11. සමාප්තිය

ශ්‍රී ලංකාව තුළ මුදල් විශෝධනය සිදුවන පරිමාණය පිළිබඳව අවබෝධයක් නොමැත. කෙසේ වෙතත්, බුද්ධි තොරතුරු මගින් හෙළි වන්නේ ලෝකයේ ඇතැම් කලාප වලට අයත් රටවල මෙන් එය රට පුරා පැතිරී නොමැති වුවත් යම් පමණකට එය ශ්‍රී ලංකාව තුළ පවතින බවයි. කෙසේ වෙතත්, ලෝක පරිමාණය සලකන කල මුදල් විශෝධනය නම් ගැටලුවේ ස්වරූපය පැහැදිලි වන අතර ලෝකයේ සෑම කලාපයක්ම විශෝධකයන් විසින් භාවිතා කරනු ලැබේ. මත්ද්‍රව්‍ය ජාවාරම ප්‍රධානතම ගැටලුව ලෙස පවතින අතර එසේම මින් පෙර සාකච්ඡා කළ අනෙකුත් සාපරාධී ක්‍රියාවන් තුළින් ද විශාල ලාභයන් උපයා ගැනීම සිදුවේ. ශ්‍රී ලංකාව ප්‍රමාදයකින් තොරව, මුදල් විශෝධනයට එරෙහිව දියත් කර ඇති ලෝක පරිමාණ සංග්‍රාමයට එක්විය යුතුව ඇත.

# 1. උපලේඛනය

**2003 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකාව විසින් අපරානුමත කොට ඇති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මුතීන් හා ත්‍රස්තවාදය පිළිබඳ වූ ජාත්‍යන්තර සම්මුතීන්***

- වර්ග ඝාතනය වැළැක්වීම හා ඊට දඬුවම් කිරීම පිළිබඳ සම්මුතිය.
  **1950 ඔක්තෝබර් 12 වැනි දින අත්සන් තබන ලදී.**

- ආර්ථික සාමාජික හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය.
  **1980 ජුනි 11 වැනි දින අත්සන් තබන ලදී.**

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය.
  **1980 ජුනි 11 දින අත්සන් තබන ලදී.**

- කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ ප්‍රභේදනයන් මුලිනුපුටා දැමීමේ සම්මුතිය.
  **1981 ඔක්තෝබර් 5 දින අත්සන් තබන ලදී.**

- සියලුම ආකාරයේ වර්ගවාදය මත පදනම් වූ වෙනස්කම් මුලිනුපුටා දැමීමේ අන්තර් ජාතික සම්මුතිය.
  **1982 පෙබරවාරි 18 දින අත්සන් තබන ලදී.**

---

* සම්මුතියකින් බැඳී සිටීමට රාජ්‍ය පාර්ශවයක කැමැත්ත ප්‍රකාශ කරනුයේ රාජ්‍යයේ නියෝජිතයාගේ අත්සන මගිනි. කෙසේ නමුත් බොහෝ අවස්ථා වලදී, සම්මුතියෙහි වගන්තියක් මගින් හෝ සම්මුතියෙහි අන්තර්ගතය පිළිබඳව සාකච්ඡා කරනු ලබන අවස්ථාවේදී සම්මුතියෙන් බැඳී සිටීම සඳහා වන කැමැත්ත නියෝජිතයාගේ අත්සන තුළ පමණක් ප්‍රකාශ නොවන බවටත් සම්මුතියෙන් බැඳී සිටීම සඳහා රාජ්‍ය විසින් සම්මුතිය අපරානුමත කළ යුතු යයි පාර්ශවයන් එකඟතාවයට එළඹේ. මෙම පිළිවෙත අනුගමනය කරන සම්මුතීන් සම්බන්ධයෙන් නියෝජිතයාගේ අත්සන ප්‍රකාශ කරනුයේ සම්මුතියේ අන්තර්ගත අනුමත කිරීම පමණි. අපරානුමත කිරීමේ අරමුණ වනුයේ අදළ රාජ්‍යයට සම්මුතියෙන් බැඳී සිටිනවා ද නැද්ද යන්න පිළිබඳව සලකා බැලීමට තවත් අවස්ථාවක් ලබා දීමයි. මූලික සාකච්ඡා වලට සහභාගී නොවූ රාජ්‍යයන්ට ද සම්මුතිය අපරානුමත කිරීම මගින් සම්මුතියට බැඳී සිටීමට එකඟතාවය පළ කළ හැකිය. යම් රාජ්‍යයක් සම්මුතියකට පාර්ශවයක් වූ ආකාරය කුමක් වුවත් සම්මුතිය යටතේ ඇති සියලු අයිතීන් රාජ්‍යයට හිමිවනවා මෙන්ම සම්මුතිය යටතේ ඇති සියලු වගකීම් වලින් රාජ්‍ය පාර්ශවයන් බැඳී සිටී.

- වර්ණ භේද වාදය පිටුදැකීමට සහ දඬුවම් පැමිණවීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය.
  **1982 පෙබරවාරි 18 දින අත්සන් තබන ලදී.**

- තානාපති නියෝජිතයන් ඇතුළු අන්තර්ජාතික වශයෙන් ආරක්ෂිත පුද්ගලයින්ට එරෙහිව සිදුකරන අපරාධයන්ට එරෙහි සම්මුතිය.
  **1991 පෙබරවාරි 27 දින අත්සන් තබන ලදී.**

- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය.
  **1991 ජූලි 12 දින අත්සන් තබන ලදී.**

- වධ හිංසාව සහ අනෙකුත් අමානුෂික හා පහත් අන්දමේ සැලකීම් වලට හා දඬුවම් කිරීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය.
  **1994 ජනවාරි 3 දින අත්සන් තබන ලදී.**

- විදේශ සේවා නියුක්තිකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය.
  **1996 මාර්තු 11 දින අත්සන් තබන ලදී.**

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සඳහා වන 1 වන වෛකල්පික මූලපත්‍රය.
  **1997 ඔක්තෝබර් 3 වන දින අත්සන් තබන ලදී.**

- ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර පිටුදකීමේ ජාත්‍යන්තර සම්මුතිය.
  **1999 මාර්තු 23 වන දින අත්සන් තබන ලදී.**

- සන්නද්ධ අරගලයන්ට මැදිවූ ළමයින් පිළිබඳ ළමා අයිතිවාසිකම් සම්මුතියේ 1 වන වෛකල්පික සන්ධානය.
  **2000 වර්ෂයේ සැප්තැම්බර් 6 වන දින අත්සන් තබන ලදී.**

- ප්‍රාණ ඇපකාරත්වයට ගැනීමට එරෙහිව ජාත්‍යන්තර සම්මුතිය.
  **2000 වර්ෂයේ සැප්තැම්බර් 6 වන දින අත්සන් තබන ලදී.**

- ආරක්ෂිත නැව් ගමනාගමනය හා සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවන්ට එරෙහි සම්මුතිය.
  **2000 සැප්තැම්බර් 6 වන දින අත්සන් තබන ලදී.**

- ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මූල්‍ය සැපයීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය.
  **2000 සැප්තැම්බර් මස 6 වන දින අත්සන් තබන ලදී.**

- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය.
  **2000 දෙසැම්බර් 15 වන දින අත්සන් තබන ලදී.**

- විශේෂයෙන් කාන්තාවන් හා ළමුන් ඇතුළු පුද්ගලයින් පැහැර ගැනීම පිටුදැකීම මැඩලීම හා දඬුවම් කිරීම සඳහා වූ මූලපත්‍රය ජාත්‍යන්තරව සංවිධානය වූ අපරාධ වලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි අතිරේකය.
  **2000 දෙසැම්බර් 15 වන දින අත්සන් තබන ලදී.**

- ගොඩබිමින්, මුහුදෙන් සහ ගුවනින් සංක්‍රමණිකයින් ජාවාරම් කිරීමට එරෙහි මූල ධර්මය-ජාත්‍යන්තරව සංවිධානය වූ අපරාධ වලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි අතිරේකය.
  **2000 දෙසැම්බර් 15 වන දින අත්සන් තබන ලදී.**

- ළමා වෙළඳම, ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීම හා ළමයින් අසභ්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීමට එරෙහි ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පික මූලපත්‍රය.
  **2002 මැයි 9 වන දින අත්සන් තබන ලදී.**

## ශ්‍රී ලංකාව විසින් අපරානුමත කොට ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන්

| සම්මුති අංකය | සම්මුතියේ නම | අපරානුමත කළ දිනය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| C4 | රාත්‍රී වැඩමුර (කාන්තා) සම්මුතිය 1919 | 1951.10.08 | අහෝසි කොට ඇත |
| C5 | අවම වයස (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය 1919 | 1950.09.27 | අහෝසි කොට ඇත |
| C6 | තරුණ පුද්ගලයින් රාත්‍රී වැඩෙහි යෙදීම (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය 1919 | 1950.10.26 | අහෝසි කොට ඇත |
| C7 | අවම වයස් සීමා (සාගර) සම්මුතිය 1920 | 1950.09.02 | අහෝසි කොට ඇත |
| C8 | සේවා වියුක්ති වන්දි (මුහුදු බත්වීම) සම්මුතිය 1920 | 1951.04.25 | |
| C10 | අවම වයස් සීමා (කෘෂි පිළිබඳ කර්මාන්තය) සම්මුතිය 1921 | 1991.11.29 | අහෝසි කොට ඇත |
| C11 | සමාගමයේ නිදහස (කෘෂි පිළිබඳ කර්මාන්තය) සම්මුතිය 1921 | 1952.08.25 | |
| C15 | අවම වයස් සීමා (අතරමැදියෝ සහ ව්‍යාපාර වස්තු කරුවෝ) පිළිබඳ සම්මුතිය 1921 | 1951.04.25 | අහෝසි කොට ඇත |
| C16 | තරුණ පුද්ගලයින් සඳහා වෛද්‍ය පරීක්ෂණ (සාගර) පිළිබඳ සම්මුතිය 1921 | 1950.04.25 | |

| සම්මුති අංකය | සම්මුතියේ නම | අපරානුමත කළ දිනය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| C18 | කම්කරු වන්දි (වෘත්තීමය රෝගාබාධ) පිළිබඳ සම්මුතිය 1925 | 1952.05.17 | |
| C26 | අවම වේතන නියම කිරීම පිළිබඳ (උපක්‍රමික) සම්මුතිය 1928 | 1961.06.09 | |
| C29 | බලහත්කාර ශ්‍රමය පිළිබඳ සම්මුතිය 1930 | 1950.04.05 | |
| C41 | රාත්‍රී වැඩ මුර (කාන්තා) සම්මුතිය (සංශෝධිත) 1934 | 1950.09.02 | අහෝසි කොට ඇත |
| C45 | පතල් වැඩ (කාන්තා) සම්මුතිය 1935 | 1950.12.20 | |
| C58 | අවම වයස් සීමා (සාගර) සම්මුතිය (සංශෝධිත) 1936 | 1959.05.18 | |
| C63 | වේතන සහ වැඩමුර සඳහා වන සංඛ්‍යාලේඛන පිළිබඳ සම්මුතිය 1938 | 1952.08.25 | |
| C80 | අවසන් ගිවිසුම් වගන්ති සංශෝධන සම්මුතිය 1946 | 1950.09.10 | |
| C81 | කම්කරු විමර්ශන සම්මුතිය 1947 | 1950.04.03 | |
| C87 | සමාගමයේ නිදහස සහ සංවිධානය වීමේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය 1948 | 1995.11.15 | |

| සම්මුති අංකය | සම්මුතියේ නම | අපරානුමත කළ දිනය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| C89 | රාත්‍රී වැඩමුර (කාන්තා) සම්මුතිය (සංශෝධිත) 1948 | 1966.03.31 | අහෝසි කොට ඇත |
| C90 | තරුණ පුද්ගලයින් රාත්‍රී වැඩෙහි යෙදීම (කර්මාන්ත) පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1948 | 1959.05.18 | |
| C95 | වේතන සුරක්ෂිත කිරීම පිළිබඳ සම්මුතිය 1949 | 1983.10.27 | |
| C96 | පූර්ව ගෙවීමේ සේවායෝජන ආයතන පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1949 | 1958.04.30 | |
| C98 | සංවිධානය වීම සහ සාමූහික කේවල් කිරීම පිළිබඳ සම්මුතිය 1949 | 1972.12.13 | |
| C99 | අවම වේතන නියම කිරීමේ උපක්‍රමික (කෘෂිකර්මාන්තයේ) සම්මුතිය 1951 | 1954.04.05 | |
| C100 | සමාන වැටුප් සම්මුතිය | 1993.04.01 | |
| C103 | මාතෘ රැකවරණය පිළිබඳ සම්මුතිය (සංශෝධිත) 1957 | 1993.04.01 | |
| C105 | කම්කරු ශ්‍රමය සූරාකෑම තහනම් කිරීමේ සම්මුතිය 1957 | 2003.01.07 | |
| C106 | සති විවේක (වාණිජ හා කාර්යාල) සම්මුතිය 1957 | 1983.10.27 | |
| C108 | මුහුදු ගාමීන්ගේ අනන්‍යතා ලේඛන පිළිබඳ සම්මුතිය 1958 | 1995.11.24 | |

| සම්මුති අංකය | සම්මුතියේ නම | අපරානුමත කළ දිනය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| C110 | වතු කම්කරුවන්ගේ සේවා කොන්දේසි පිළිබඳ සම්මුතිය 1958 | 1995.04.24 | |
| C111 | වෙනස් කොට සැලකීම (සේවා හා වෘත්තීන්) පිළිබඳ සම්මුතිය 1958 | 1998.11.27 | |
| C115 | විකිරණ ආරක්ෂාව පිළිබඳ සම්මුතිය 1960 | 1986.06.18 | |
| C116 | අවසන් වගන්ති සංශෝධනය පිළිබඳ සම්මුතිය 1961 | 1974.04.26 | |
| C131 | අවම වේතන නියම කිරීම පිළිබඳ සම්මුතිය 1970 | 1975.03.17 | |
| C135 | කම්කරු නියෝජිතයන් පිළිබඳ සම්මුතිය 1971 | 1976.11.16 | |
| C138 | සේවයට ඇතුළත් කිරීමේ අවම වයස් සීමා පිළිබඳ සම්මුතිය 1973 | 2000.02.11 | |
| C144 | ජාත්‍යන්තර කම්කරු සංවිධාන සම්මුතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ත්‍රෛපාක්ෂික සාකච්ඡා පිළිබඳ සම්මුතිය 1976 | 1994.03.17 | |
| C160 | කම්කරු සංඛ්‍යාලේඛන පිළිබඳ සම්මුතිය 1985 | 1993.04.11 | |
| C182 | ළමා කම්කරු සේවයේ අයහපත් පැතිකඩ පිළිබඳ සම්මුතිය 1999 | 2001.03.01 | |

## ශ්‍රී ලංකාව විසින් අපරානුමත කොට ඇති මානවවාදී නීතිය හා සම්බන්ධ සම්මුතීන්

යුධ භූමියේ දී තුවාල ලැබූ හා රෝගාතුර වූ සොල්දාදුවන් පිළිබඳ ජිනීවා සම්මුතිය 1949.
**1959 පෙබරවාරි 28 දින අපරානුමත කරන ලදී.**

සාගරයේ දී තුවාල ලැබූ හා රෝගාතුර වූ සොල්දාදුවන් පිළිබඳ ජිනීවා සම්මුතිය 1949.
**1959 පෙබරවාරි මස 28 දින අපරානුමත කරන ලදී.**

යුධ සිරකරුවන්ට සැලකීම පිළිබඳ ජිනීවා සම්මුතිය 1949.
**1959 පෙබරවාරි මස 28 වෙනි දින අපරානුමත කරන ලදී.**

යුධ කාල සීමාව තුළදී සිවිල් වැසියන් ආරක්ෂා කිරීම පිළිබඳ ජිනීවා සම්මුතිය 1949.
**1959 පෙබරවාරි මස 28 වෙනි දින අපරානුමත කරන ලදී.**

# 11. උපලේඛනය

**ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර නොමැති ඇතැම් මානව හිමිකම් ලේඛන**

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ II වන වෛකල්පික මූලපත්‍රය.
- යුධ අපරාධකරුවන්ට හා මානව වර්ගයාට එරෙහි අපරාධයක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත සීමාවන් නොපැනවීමේ සම්මුතිය 1968.
- ඉහත සම්මුතියේ 21 වගන්තිය පිළිබඳ ප්‍රකාශය (එක් රාජ්‍ය පාර්ශවයක් තවත් රාජ්‍ය පාර්ශවයකට එරෙහිව කරනු ලබන පැමිණිලි).
- ඉහත 22 වගන්තිය පිළිබඳ ප්‍රකාශය (තනි පුද්ගලයින්ගේ පැමිණිලි බාර ගැනීම පිළිබඳ).
- සමාජ ආරක්ෂාව පිළිබඳ අවම ප්‍රමිතීන් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 102).
- විදේශ සේවා නියුක්තිකයන් අපයෝජනයට ලක් වීමේ තත්ත්වයන් හා විදේශ සේවා නියුක්තියන්ට සමාන අවස්ථා ලබා දීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 143).
- රැකී රක්ෂා ප්‍රතිපත්ති පිළිබඳ ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය (අංක 122).
- ග්‍රාමීය කම්කරුවන් සහ ආර්ථික හා සමාජ සංවර්ධන ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ කාර්ය භාරය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 141).
- රාජ්‍ය සේවයේ කොන්දේසි තීරණය කිරීමේ කාර්ය පටිපාටිය හා සංවිධානය වීමේ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතිය (අංක 151).
- සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ සම්මුතිය 1951

- 1951 සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ සම්මුතියෙහි මූලපත්‍රය 1967

- 1949 අගෝස්තු 12, අන්තර්ජාතික යුධ ගැටුම් මගින් පීඩාවට පත් වන්නන් පිළිබඳ ජිනීවා සම්මුතියෙහි අතිරේක මූලපත්‍රය (I වන මූලපත්‍රය)

- 1949 අගෝස්තු 12, අන්තර්ජාතික නොවන යුධ ගැටුම් මගින් පීඩාවට පත්වන්නන්ගේ ආරක්ෂාව පිළිබඳ ජිනීවා සම්මුතියෙහි අතිරේක මූලපත්‍රය (II වන මූලපත්‍රය)

# 111. උපලේඛනය

## 2003 වර්ෂයේදී තීන්දු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් නඩු තීන්දු

### 11, 13(1) සහ 13(2) යන ව්‍යවස්ථා

දේවාලමුල්ල පතිරණගේ අමරසේන එ. පොලිස් පරීක්ෂක ජයරත්න, ගල්කිස්ස පොලිසියේ ස්ථානාධිපති සහ තවත් හතර දෙනෙක්. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 290/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.04.04.

ආර්.එම්.කේ. ඒකනායක එ. අතිරේක උප පොලිස් පරීක්ෂක හේවාවසම්. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 34/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.17.

ෆාරුක් අබ්දුල් ලතිෆ් එ. නියෝජ්‍ය පොලිස්පති, නුවර එළිය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 244/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.12.15.

හරිත අධිකාරි සහ තවත් අය එ. කෝට්ටගේ සුමිත් අමරසිංහ. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 251/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.02.14.

හරින්ද ශෂික කුමාර් එ. නියෝජ්‍ය පොලිස්පති, ඩී.ඒ. ද ෆොන්සේකා සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 462/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.17.

එච්.ඒ. නාලක එරන්ද හෙට්ටිආරච්චි එ. ගාමිණී මීගහකුඹුර. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 340/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.17.

ඉන්දිකා චතුරානි ඩයස් එ. හර්ෂ අමරසිංහ, පොලිස් පරීක්ෂක. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 444/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.12.19.

කන්දසාමි. කෝනේසලිංගම් එ. මේජර් මුතාලිෆ්, *OIC Joossp* යුධ හමුදා කඳවුර, ශ්‍රේෂ්ඨාධිකරණ *(මූ.අයි.)* ඉල්ලුම්පත් අංක. *555/2001*, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.02.10.

කොටාබදු දුරුගේ ශ්‍රියානි සිල්වා එ. චානක ඉද්දමල්ගොඩ, පොලිස් ස්ථානාධිපති සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 471/2000, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.08.

මානිමුක්කු කන්කානම්ගේ හියුබට් සෙනෙවිරත්න එ. උප පොලිස් පරීක්ෂක රාජකරුණා, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 646/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.05.30.

ප්‍රියන්ත අතුකෝරල එ. පොලිස් පරීක්ෂක එම්.ඒ.ඩී.ඩී.එස්. මල්ලවාරච්චි. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 395/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.17.

ආර්.එම්.පී. ප්‍රසන්න එ. අතිරේක පොලිස් කොස්තාපල් ජුඩ් (මූ.අයි.) ඉල්ලුම්පත් අංක 106/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.12.11.

රංජිත් කුමාර කාරියවසම් එ. බී.එල්.ඩී. ද කොඩිතුවක්කු, පොලිස්පති සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක 492/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.21.

සුජීව අර්ජුන සේනාසිංහ එ. ගාමිණී කරුණාතිලක සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 431/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.17.

සෙල්ලතුරෙයි ෂන්මුගරාජා එ. දිල්රුක්, උප පොලිස් පරීක්ෂක සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 47/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.02.10.

වන්නිආරච්චිලාගේ දෙන් නිහාල් විජේසිරි එ. බෙනරගම විදනලාගේ උපාලි කුමාර මුණසිංහ, පොලිස් පරීක්ෂක ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 623/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.12.16.

ඩබ්ලිව්. ආර්. සංජීව, නීතිඥ එ. සේන සුරවීර, ස්ථානාධිපති සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 328/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.04.04.

**12 වන ව්‍යවස්ථාව**

අසංකා සුභාෂිණී පතිරණ සහ තවත් අය එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 618/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.05.

ඒ.එම්.ඊ. ප්‍රනාන්දු එ. නීතිපති සහ තවත් සය දෙනෙක්. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 55/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.07.17.

ඒ.එම්.ඒ. ජයසිංහ සහ තවත් අය එ. වී.කේ. නානායක්කාර සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 94/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.09.23.

අර්ජුන රණතුංග එ. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 133/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.09.23.

වෛද්‍ය මහින්ද බාලසූරිය එ. අලවි මව්ලානා, බස්නාහිර පළාතේ ආණ්ඩුකාර සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 45/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.12.19.

දර්ශන් නයනකාන්ත සේනානායක එ. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 510/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 29.01.2003.

ඊ. දෙන් මහින්ද හෙට්ටිආරච්චි එ. චන්ද්‍රානන්ද ද සිල්වා, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 450/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.04.03.

ගෑස් කන්වර්ශන්ස් (පෞද්ගලික) සමාගම සහ තවත් අය එ. ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 91/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.13.

එච්. තිරාණගම එ. මහින්ද මඩිහහේවා, කම්කරු කොමසාරිස් සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 28/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.02.11.

හේවා කනත්තගේ ආරියසේන එ. ලංකා බැංකුව. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 282/98, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.27.

කළුවැල්ල මුදලිගේ චම්පා නාලනී අලස් එ. මිහිඳු රත්නායක. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක 538/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.30.

කහ ගාල්ලගේ අබේරත්න එ. ජනතා පොහොර සීමාසහිත සමාගම සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 311/2000, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.05.23.

එම්.ජේ.යී. රුස්තා ෆර්වින් එ. ඩබ්ලිව්.ජේ. මහින්ද විජයසිරි, විභාග කොමසාරිස් සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 536/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.09.12.

මුදුන්පිටගේ ගනංග ප්‍රභාත් එ. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 86/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.04.04.

මලගොඩ ගමගේ චතුර කාංචන අමරසිංහ සහ තවත් අය එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 54/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.09.22.

එම්.ටී.එස්. පද්මනාත් එ. ශ්‍රී ලංකාවේ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 273/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.17.

එම්. සමීන් මොහොමඩ් මුබාරක් එ. ගරු ජෝන් අමරතුංග, අභ්‍යන්තර කටයුතු අමාත්‍ය සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 583/2002.

මානික්කු කන්කානම්ගේ හියුබට් සෙනෙවිරත්න එ. උප පොලිස් පරීක්ෂක රාජකරුණා, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 646/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.05.30.

නදීකා හේවගේ සහ තවත් අය එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 627/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.08.

පෙරමුණේ මුණසිංහ මුදියන්සේලාගේ පාලිත කුමාරසිරි මහෝතේගම එ. පේරාදෙණිය විශ්ව විද්‍යාලය සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 540/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.05.22.

ආර්.අයි.කේ. ද සිල්වා එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 642/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.30.

සින්නතම්බි සින්නම්මා එ. එස්. නවනීදන් සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 109/03, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.12.16.

එස්.පී.වී. කනකරත්න එ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 263/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.17.

සේපාල චන්ද්‍රසිරි සේමගේ ප්‍රනාන්දු එ. එන්.එම්. ජුනයිඩ් සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 233/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.08.

එස්. ජී. රන්දෙණි එ. කේ. වික්නරාජා සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 243/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.08.

සුබ්‍රමනියම් කනේසපිල්ලෙයි එ. ලංකා බැංකුව. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 186/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.06.23.

සෙමන් මෙරූ පතිරණගේ දයාසේන එ. ආර්.එම්. බින්දුසාර. ජාතික ලේ දන්දීමේ සේවාවේ අධ්‍යක්ෂ සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 583/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.29.

ටී.ජ්.ඩී. සිරිමල් සහ තවත් අය එ. සමූපකාර තොග ගබඩා අධ්‍යක්ෂ මණ්ඩලය සහ තවත් අය ශ්‍රේෂ්ඨාධිකරණ ඉල්ලුම්පත් අංක. 445/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.08.

වේළුපිල්ලෙයි තවරාජා එ. එස්. තවනීදන් සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 108/03, 109/03, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.12.16.

ඩබ්ලිව්.ජ්.කේ.ඩී. ජීවා ප්‍රියන්ත, එ. ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 103/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.09.12.

**14 වන ව්‍යවස්ථාව**

ප්‍රියන්ත අතුකෝරළ එ. පොලිස් පරීක්ෂක එම්.ජ්.ඩී.ඩී.එස්. මල්ලවාරච්චි. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 395/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.17.

සෝදිලිංගම් තවනීදන් එ. දයානන්ද දිසානායක, මැතිවරණ කොමසාරිස් සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 20/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.25.

සුජීව අර්ජුන සේනසිංහ එ. ගාමිණී කරුණාතිලක සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 431/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.17.

# නඩු ලැයිස්තුව

අබේරත්න එ. සීමාසහිත ජනතා පොහොර සමාගම සහ තවත් තිදෙනෙක්, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 11/2000, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.05.23.

අධිකාරී සහ අධිකාරී එ. අමරසිංහ සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 251/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.02.14.

අර්ජුන රණතුංග එ. ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 133/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.10.

ඔගස්ටින් පෙරේරා සහ තවත් සම්බන්ධිත ඉල්ලුම්පත් දෙකක් එ. රිචඩ් පතිරණ සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 453/454/1997 සහ 390/99, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.30.

බණ්ඩාරනායක එ. රාජගුරු 1999 (1) ශ්‍රී.ලං.නී.වා. 104.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ආචාර්ය සරවනමුත්තු සහ රොහාන් එදිරිසිංහ එ. දිසානායක, ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා අංක. 26/2002 අභියාචනාධිකරණ අංක. 487/99 සහ ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා 27/2002 අභියාචනාධිකරණ අංක. 488/99, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.27.

දයාසේන එ. බින්දුසේන සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 583/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.20.

ද සිල්වා එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 133/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.10.

සීමාසහිත ධනු කොන්ත්‍රාත් පෞද්ගලික සමාගම සහ තවත් අය එ. මාතලේ නගර සභාව සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 461/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.13.

ඒකනායක (අතිරේක පොලිස් කොස්තාපල්) එ. උප පොලිස් පරීක්ෂක වේවාවසම්, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 34/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.17.

හරින්ද්‍ර ශශික කුමාර එ. නියෝජ්‍ය පොලිස්පති ද ෆොන්සේකා සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 462/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.17.

බුද්ධිමය දේපල පිළිබඳ පනත් කෙටුම්පත, ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ සිතා බැලීම් අංක 14/2003.

දෙනමුත්තු එ. මිලිටරි නිලධාරි ආනන්ද සහ තවත් අය, 1999 (2) ශ්‍රී.ලං.නී.වා. 213.

කුනනාදන් එ. යාපනය විශ්ව විද්‍යාලය සහ තවත් අය, අභියාචනාධිකරණ අංක. 1559/2003, අභියාචනාධිකරණ සටහන් 2003.12.09.

*Khatri (II)* v. *State of Bihar, 1981(1) SCC 627.*

කනකරත්න සහ තවත් අය එ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 263/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.17 සහ 2003.12.03.

කනේසපිල්ලන් එ. ලංකා බැංකුව සහ තවත් අය. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 186/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.06.26.

කෝර්නේසලින්ගම් එ. මේජර් මුතාලිෆ් සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 555/2001 ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.02.10.

සෞඛ්‍ය අමාත්‍ය සහ තවත් අය එ. ප්‍රතිකාර ක්‍රියා කඳවුර සහ තවත් අය, 2002(5) SA 721 (CC), 2002 10 BCLR 1033.

නාදීකා හේවගේ සහ තවත් අය එ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 627/2000, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.18.

පෝරගේ ලක්ෂ්මන් එ. ප්‍රනාන්දු, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 24/90, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 1995.09.29.

පද්මනාත් එ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 273/2003, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.10.17 සහ 2003.12.03.

*Paschim Banga Khet Mazdoor Samity* v. *State of West Bengal, 1996* SOL Case No. 169 (Supreme Court of India).

සංජීව එ. සුරවීර, පොලිස් ස්ථානාධිපති, වත්තල සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 328/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.04.04

සෙනෙවිරත්න එ. උප පොලිස් පරීක්ෂක, රාජකරුණා සහ තවත් පස් දෙනෙක්, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 646/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.05.30.

සේනානායක සහ අරුණ එ. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සීමා සහිත සමාගම, සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 510/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.01.29.

ෂන්මුගරාජා එ. දිල්රුක්, උප පොලිස් පරීක්ෂක, වව්නියා, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 47/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.02.10.

*Soobramoney* v. *Minister of Health, Kwazulu Natal.* 1998(1) SA 765(CC), 1997 (12) BCLR 1696 (CC)

ශ්‍රියානි සිල්වා එ. පොලිස් ස්ථානාධිපති පයියාගල, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 471/2000, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.08.

සුජීව අර්ජුන සේනසිංහ එ. ගාමිණී කරුණාතිලක සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 431/2001, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.12.

සිරිමල් සහ තවත් අය එ. සී.ඩබ්.ඊ. සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 445/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.08.08.

තවනීදන් එ. දිසානායක සහ තවත් අය, තංගවේල් සහ වෙනත් අය එ. දිසානායක සහ තවත් අය සහ අලගසුන්දරම් සහ වෙනත් අය එ. දිසානායක සහ තවත් අය, ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) ඉල්ලුම්පත් අංක. 20/2002, 25/2002 සහ 26/2002. ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.03.25.

විනයාගමූර්ති එ. හමුද කොමදෝරු 1997(1) ශ්‍රී.ලං.නී.වා. 113.

වෝකර් සහ පුත්‍රයෝ සීමාසහිත සමාගම එ. ගුණතිලක සහ තවත් අය, (1978-79) ශ්‍රී.ලං.නී.වා. 231.

වීරසේකර එ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක සහ තවත් අය, ඉල්ලුම්පත් අංක. ශ්‍රේෂ්ඨාධිකරණ (මූ.අයි.) 86/2002, ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් 2003.04.04.

# ශ්‍රී ලංකාව:
# මානව හිමිකම් තත්ත්වය
# 2004

මෙය, 2003 වර්ෂය තුළ ශ්‍රී ලංකාවෙහි සිදුවූ සිදුවීම් අළලා මෙරට මානව හිමිකම් තත්ත්වය පිළිබඳව කෙරුණු සවිස්තරාත්මක විග්‍රහයකි.

මෙම වාර්තාව, ළමා අයිතිවාසිකම්, නීති විරෝධී සංක්‍රමණ: මානව තිරුරහෝනය සහ පුද්ගල වෙළඳම, කම්කරු අයිතිවාසිකම්, මානව හිමිකම් සඳහා වූ අධිකරණමය රැකවරණය, ජාතික පොලිස් කොමිසම, බිඳුණුවැව: යුක්තිය ඉටු වූයේද?, මානව හිමිකම් හා බුද්ධිමය දේපල අයිතිවාසිකම් මෙන්ම ශ්‍රී ලංකාව තුළ මුදල් විශෝධනය පිටුදැකීමද ඉලක්ක කර ඇත. එමනිසා මෙම වාර්තාව, ශ්‍රී ලංකාවෙහි මානව හිමිකම් සම්බන්ධයෙන් වැදගත් පැතිකඩක් නියෝජනය කරයි.


**නීතිය හා සමාජ භාරය**

3, කින්සි ටෙරසය

කොළඹ 08

ශ්‍රී ලංකාව

දු.ක: 2691228, 2684845 ෆැක්ස්: 2686843

ඊමේල්: lst@eureka.lk

වෙබ් අඩවිය: http://www.lawandsocietytrust.org

ISBN 955-9062-96-4

මුද්‍රණය කරුණාරත්න සහ පුත්‍රයෝ